බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 26–27




සූත්‍රාන්ත පිටකයෙහි

සවිසිවන, සත්විසිවන ග්‍රන්ථද්වය

ඛුද්දකනිකායෙ

# විමානවත්ථුපාළි
# පෙතවත්ථුපාළි

---

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින් කරන ලද

පාඨසංශෝධන පූර්වක සංස්කරණයෙන් යුත්

සිංහල අනුවාදය.

---

ශ්‍රී ලඞ්කා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
ප්‍රකාශිත යි.

ශ්‍රී බු. ව. 2524
රාජ්‍ය ව. 1982

Buddha Jayanti Tripitaka Series-Volume 26 & 27.

THE TWENTYSIXTH AND TWENTYSEVENTH BOOKS

# IN THE SUTTANTA PITAKA

# VIMĀNAVATTHU PĀLI

AND

# PETAVATTHU PĀLI

OF

KHUDDAKA NIKAYA

WITH

THE SINHALESE TRANSLATION

REVISED AND EDITED

BY

THE TRIPITAKA EDITORIAL BOARD

---

PUBLISHED

UNDER THE PATRONAGE

OF

DEMOCRATIC SOCIALIST REPUBLICAN
GOVERNMENT OF SRI LANKA

B.E. 2524

C.E. 1982

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායෙ

# විමානවත්ථුපාළි

# සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකායාන්තර්ගත

# විමානවත්ථුපාළි

(සිංහලානුවාදය)

සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ මැතිතුමා**

කළ ඉල්ලීම අනුව

**ඉඩම් හා ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍ය**

**ගරු ගාමිණී දිසානායක මැතිතුමා**

දුන් උපදෙස් පරිදි

**රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති**

**ගාමිණී කන්නන්ගර මහතා**

සංස්ථාවේ අරමුදලින් පරිත්‍යාග කළ

රුපියල් දෙලක්ෂ පනස් දහසක මුදලින්

මෙම කාණ්ඩයේ පිටපත් 3000 මුද්‍රණය කරවන ලදී.

මෙයින් ජනිත කුසලසම්භාරය දයක කාරක සියලු දෙනා

අනුමෝදන් වෙත්වා.

At the request of the

**Hon'ble E. L. B. HURULLE**
Minister of Cultural Affairs

and on the advice of the

**Hon'ble GĀMINĪ DISSĀNĀYAKE**
Minister of Lands, Land Development and
Mahaveli Development

**MR. GĀMINĪ KANNANGARA**
Chairman of the State Timber Corporation

has donated out of the funds of the Corporation

Rupees 2,50,000.00

being the full cost of the printing of

3000 copies of this volume of

**THE BUDDHA JAYANTI TRIPITAKA SERIES**

May the Kusala Kamma accrued by this

noble act be shared by everyone concerned.

''තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.''

''මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි.''

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTENTS

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සව්සිවන (26) ග්‍රන්ථය වශයෙන් සම්මත කරන ලදුයේ 'විමානවත්ථුපාළි' යි. පඤ්ච මහානිකාය ග්‍රන්ථයන් කෙරෙහි 'ඛුද්දකනිකායෙහි' ලා සඞ්ගීත වූ "විමානවත්ථු පාළිය" එමැ කුදුගත්සඟියේ **සවැනි ග්‍රන්ථය** ද වෙයි.

ලංකා බෞද්ධමණ්ඩලය මගින් දෙදහස්පන්සියවැනි සම්බුද්ධ මඞ්ගලය සිහිකිරීම සඳහා සම්මත කළ සත්ක්‍රියාවලියෙහි ප්‍රමුඛ-ස්ථානයට පැමිණියේ ත්‍රිපිටක බුද්ධවචනය සිංහල භාෂායෙන් තබාලීම යැ. එහි ලා විමානවත්ථුපාළිය සියබසට නඟාලීම සඳහා ආරාධිත වූවාහු මහනුවර **මහාවිහාරපරිවෙණාධිපති රාජකීයපණ්ඩිත විද්‍යාවිශාරද හාල්යාලේ සුමනතිස්සාභිධාන** සියම් මහනිකායේ අස්ගිරි විහාරපාර්ශ්වයේ අනුනායකස්ථවිරයන් වහන්සේ යැ. උන්වහන්සේ විසින් යථාකාලයෙහි පරිවර්තනකාර්‍ය්‍යය නිමහම් කරන ලද්දේ යැ.

යළි වර්තමාන ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයෙහි ධර්මධර පණ්ඩිත මහතෙරවරුන් විසින් පාඨශොධන පූර්වක වැ පරිවර්තනය ද මැනැවින් සංස්කරණය කොට මුද්‍රණය සඳහා සකස් කරනලද්දේ ය. හිඟුල, මාකඩවර 'රෙවත' පරිවෙණාධිපති **රාජකීයපණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ** විසින් 'විමානවත්ථු, පෙතවත්ථු' යන ග්‍රන්ථද්වය මැ පිළිබඳ කොට දතයුතු හැම කරුණක් මැ අලළා වෙන වෙන මැ ලියනලද **සංඥාපන** දෙකක් ද මෙහි ඇත. එය මේ ග්‍රන්ථයන් පිළිබඳ වැ අධ්‍යයනයක් ලබනුවනට මහත් පිටුවහලක් බව කියැයුතු වේ.

මෙ අධිකාරයෙහි අනුග්‍රාහක වූ **අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්** හා **ගරු අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස** මැති-තුමාණන් ද **ගරු සංස්කෘතික අමාත්‍ය** තැන්පත් **ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන්** හා ත්‍රිපිටක ග්‍රන්ථ ඉක්මනින් පළකරවාලීම සඳහා ඉමහත් උද්‍යොගයෙන් ක්‍රියා කරන සංස්කෘතික අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් තැන්පත් **සෝමපාල ජයවර්ධන මහතාණන්** ද කෘතවෙදී වැ මෙහි ලා සඳහන් කරම්හ.

තවද ආරම්භක බෞද්ධමණ්ඩලයෙහි සත්පුරුෂයන් හා ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයට හැම ලෙසින් පහසුකම් සලසන මහානායක වාරිකාරාමයෙහි නියුක්ත ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතා හා තිසර මුද්‍රණාලයාධිකාරීන් ඇතුළු සේවක මණ්ඩලය ද මෙහි ලා සිහිපත් කරන අතර මෙ හැම දෙන පර්‍ය්‍යාප්තිශාසනප්‍රවර්තන කුශල හෙතුයෙන් සුබභාගී වෙත්වා' යී ආශංසනය කරම්හ.

මේ වගට, ශාස්ත්‍රශාසනොදයකාරී,

**ලබුගම ලඞ්කානන්ද**

මහානායකස්ථවිර.

1982 ජනවාරි 30 වැනි දින
ත්‍රිපිටකකාර්‍ය්‍යාලයේ දී යැ.
115, විජේරාම මාවත
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝද්දගොඩ ශ්‍රී ඥානාලොක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දොල්ලේ ශ්‍රී ප්‍රඥාලොක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ — මාකඩවර, රේවත පරිවෙණාධිපති රාජකීයපණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීයපණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීයපණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය උඩුවේ ඥානානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥාපනය

සූත්‍රාන්තපිටකයෙහි ඛුද්දකනිකායයෙහි සඞ්ග්‍රහයට ගිය විමානවත්ථු වූකලි දෙවියන් විසින් පූර්වජන්මයෙහි කරනලද පින්කම් ද එහි ඵල ප්‍රත්‍යක්‍ෂ කරන දිව්‍යවිමානාදි සම්පත් ද ප්‍රකාශ වන, එහෙයින් මැ හුදී ජනයාගේ සිත්සතන් සුචරිතයට නමාලන ජනකාන්ත කථා සඞ්ග්‍රහයෙකි. නවාඞ්ගශාස්තෘශාසනයෙහි ගාථාඞ්ගයෙහි ඇතුළු වන මෙහි ගාථා පෘච්ඡා විසර්ජන විසින් ද්විවිධ වෙයි. විසර්ජන ගාථා ඒ ඒ දෙව්දූන් විසින් ද දෙව්පුතුන් විසින් ද ප්‍රකාශිත යැ. පෘච්ඡා අතුරෙහි ඇතැම් ගාථා බුදුරදුන් විසින් ද සක්දෙව්රජු ආදීන් විසින් ද ශ්‍රාවකයන් විසින් ද අසනලද යැ. එහි දු බහුතර සඞ්ඛ්‍යාව ද්විතීය ශ්‍රාවක මහමුගලන් මහරහතුන් වහන්සේ විසින් අසනලද ගාථා යි.

උන් වහන්සේ දෙව්ලොව සැරිසරා ඒ ඒ දෙවියන් ලද සම්පත් බලා එයට හෙතු විසින් ඔවුන් කළ පින්කම් අසාගෙන අවුත් බුදුරදුන් හමුවෙහි ප්‍රකාශ කෙරෙති. බුදුහු පින්පල පසක් කරවන පිණිස සිවුපිරිසෙහි දෙශනා කෙරෙති. ඒ අසා සැදැහැතියෝ පින්කම්හි උත්සුක වෙති, දුසිරිතින් මිදී සුසිරිතට නැමෙති. එහෙයින් මේ දෙශනා බෙහෙවින් ඵලවත් ද ජනකාන්ත ද වී. ධර්මදෙශකයෝ පුණ්‍යඵලනිදර්ශනයෙහි ලා විමානවත්ථු උපයොග කරගනිති. ඒ මැ දෙසුම් උවසුළුවැසියන්ගේ මන වඩයි. විමානවත්ථු සියබසට නැඟූ **ගම්මුල්ලේ රතනපාල** තෙරණුවනට **කීර්ති ශ්‍රී රාජසිංහ** රජ සතමුණක කෙත් සහිත වැ හිඟුලවිහාරය පිදූ බව සිංහල විමානවස්තු ප්‍රකරණයෙහි සඳහන් වෙයි.

**'විමානවත්ථු'** යන මෙහි 'විමාන' නම් දෙවියන්ගේ ක්‍රීඩානිවාස ස්ථාන යැ. ඒවා උන්ගේ සුචරිතකර්මානුභාවයෙන් නිපන් ප්‍රමාණ විශෙෂයෙන් යුක්ත බැවින් විශෙෂයෙන් මානනීය වන බැවින් 'විමාන' යි කියනු ලැබෙත්. විමානයන්ගේ 'වත්ථු' විමානවත්ථු යැ. 'වත්ථු' ශබ්දය කාරණ පර්‍යාය යි. ඒ ඒ දෙවියන්ගේ රූප භොග පරිවාරාදි සම්පත් ද එය උපදවන කර්ම ද ඇසිරි කොට මේ දෙශනා ප්‍රවෘත්ත බැවින් විපාකමුඛයෙන් හෝ කර්මචිත්තයට කාරණ භාවයෙන් 'විමානවත්ථු' නමැ යි දතයුතු.

ඒ මේ විමානවස්තු වර්ග විසින් පීඨවර්ග යැ චිත්තලතාවර්ග යැ පාරිච්ඡත්තකවර්ග යැ මඤ්ජෙට්ඨකවර්ග යැ මහාරථවර්ග යැ පායාසි-වර්ග යැ සුනික්ඛිත්තවර්ග යැ යි වර්ග සතෙකින් පරිමිත යැ. පළමු වැන්නෙහි වස්තු සතළොසෙකැ දෙ වැන්නෙහි එකොළොසෙකැ තෙවැන්නෙහි දසයෙකැ සතර වැන්නෙහි දෙළොසෙකැ පස් වැන්නෙහි තුදුසෙකැ සවැන්නෙහි දසයෙකැ සත් වැන්නෙහි එකොළොසෙකැ යි පසාසූ වස්තුයෙක් වෙයි. එහි දු පළමු සතරවගෙහි ස්ත්‍රීවිමානවස්තු පනසෙක් ද ඉතිරි තුන්වගෙහි පුරුෂවිමානවස්තු පන්තිසෙක් ද දක්වන ලද්දේ යි.

මොවුනතුරෙහි කිහිපයක් හැර බහුතර සඞ්ඛ්‍යාව බුදුරදුන් ධරමාන කාලයෙහි භාරතීය සමාජයෙහි පහළ වූ කථා යි. **මල්ලිකා-විමාන වස්තු** යැ **විසාලක්ඛිවිමාන වස්තු** යැ **පීතවිමාන වස්තු** යැ **චූළරථවිමාන වස්තු** යැ **උත්තරවිමාන වස්තු** යැ **සෙරිස්සකවිමාන වස්තු** යැ යන මොහු **සම්බුද්ධ** පරිනිර්වාණයෙන් පසු පහළ වූවාහු වෙති. එහි දු සෙරිස්සකවිමාන වස්තුව හැර අවශෙෂ සියලු කථා ප්‍රථමසඞ්ගායනා අවස්ථායෙහි සඞ්ගීතියට නැඟුණාහු වෙති. සෙරිස්සක විමාන වස්තු **ද්විතීය සඞ්ගායනායෙහි** දී සම්භව තෙරුන් විසින් සඞ්ගීතිකාරක මහතෙරවරුනට ආරොචන කරනලදු වැ සඞ්ගීත විය. **ගුත්තිලවිමාන** යැ **චතුරිත්ථිවිමාන** යැ **පඨමනාගවිමාන** යැ **මහාරථ-විමාන** යැ **අනෙකවණ්ණවිමාන** යැ **සූනික්ඛිත්තවිමාන** යැ යන මේ විමානකථා **අතීත** බුදුවරයන්ගේ කාල හා සම්බන්ධ යි.

**විශෙෂතා:**

බොහෝ කථාවන්හි පාළිය සමානස්වරූපයෙන් තිබීම මෙහි දක්නා විශෙෂ ලක්‍ෂණයෙකි. ඇතැම් කථාවන්හි පාළිය පමණක් නොවැ නිදන ද එකස්වරූපයෙන් හෝ මඳ වෙනසෙකින් යුතු වැ දක්නාලැබේ. (3–1) උළාරවිමාන (3–2) උච්ඡුදායිකාවිමාන (4–10) උච්ඡුවිමාන එබඳු තැනි. මේ කථා තුනෙහි මැ නිදන ද පාළි ද සමාන වෙයි. වස්තු පුද්ගල නානාත්‍වය ඇත. උළාරවිමානවස්තුයෙහි නැන්දණියෝ තමාගේ පූප කොටස පිඬුසිඟා වැඩි මහණක්හට පිදූ ලේලියට කිපී මොහොලකින් පහර දී ඇය මරති. උච්ඡුදායිකාවිමාන වස්තුයෙහි නැන්දණියෝ උක්දඬුවක් මහණක්හට දුන් ලේලියට පුටුවෙකින් පහර දී ඇය මරති. උච්ඡුවිමානයෙහි නැන්දණියෝ උක්දඬුවක් මහණක්හට දුන් ලේලිය ගලෙකින් පහර දී මරති.

**නාවාවිමාන වස්තු** තුනෙකි. පඨම, දුතිය, නාවාවිමාන වස්තුයෙහි පාළි සමාන වෙයි. නිදන වෙනසි. පඨමනාවාවිමාන වස්තුයෙහි වස් නිමවා බුදුන් දක්නට වඩනා භික්‍ෂුහු සොළොස් දෙනෙක් නිරුදක කාන්තාරයෙහි ගිමින් තැවී පිපාසිත වැ සිටියාහු පැනට ළිඳකට යන ස්ත්‍රියක දැක ඇය පසුපස ළිඳ වෙත ගොස් පැන් ලබාගනිති. **දුතියනාවාවිමාන** වස්තුයෙහි රහත් මහණ කෙනෙක් වස් වසනු පිණිස පිටිසර ආවාසයකට වඩනාහු අතරමඟ පවසින් පෙළී ගෙදෙරකට වඩිති. එහි ස්ත්‍රියක් උන් වහන්සේට අසුන් පනවා දී පාදෝනා දිය එළවා පය ගල්වන තෙල් දී තල්වැට පවන් සලා ගිමන් නිවා මිහිරි සිහිල් සුවඳපැනක් පිළිගන්වයි. **තතියනාවාවිමාන** වස්තුයෙහි ද පළමු දෙවැනි වස්තුයෙහි පාළිය සපුරා දක්නට ඇත. අතිරෙක ගාථා දෙකෙක් ද වෙයි. නිදන බෙහෙවින් වෙනස් වෙයි. එහි බුදුන් මහසඟුන් පිරිවරා දනවු සැරිසරා 'ථූණ' නම් බමුණු ගමට වඩිති. ගම්වැසියෝ ඔබට පැන් නොදෙනුව කතිකා කෙරෙති, ළින් තණරොඬු පිදුරු දහවියා ලා වසාලති. පැන් ගෙනයන ස්ත්‍රියක් බුදුපාමොක් මහසඟනට පැන් පිළිගන්වයි. එපවත් ඇසූ ස්වාමිපුරුෂයා ඇය තළාපෙළා මරාදමයි. මෙසේ පාළි විසින් ද නිදන විසින් ද වස්තු විසින් ද සමානතා දක්නා නොයෙක් කථා විමානවත්‍ථුයෙහි ඇත.

**ගුත්තිලවිමාන** වස්තුව (2. 5) ස්ත්‍රීවිමාන කොටසෙහි ලා සඞ්ග්‍රහ කරන ලද්දෙ යැ. එහි අනන්තරවිමාන සතිසෙක් වෙයි. එ හැම ස්ත්‍රීවිමාන යැ. අනන්තරවිමාන දැක්වීම මැ මුඛ්‍යකාරණ වූ බැවින් අප්‍රධාන වූ ගුත්තිලවිමාන කථාව ස්ත්‍රීවිමාන අතුරෙහි ලා සඞගෘහීත යැ. අනන්තරවිමාන සියල්ල පාළි විසින් සමාන යැ. නිදන පුද්ගල වස්තු විසින් වෙනස් වෙයි.

**රෙවතීවිමාන** වස්තුව (5. 2) පුරුෂවිමාන කොටසෙහි ලා සඞ්ග්‍රහ කරන ලද්දෙ යැ. එහි දු මුඛ්‍ය වනුයේ රෙවතියගේ ස්වාමිපුරුෂ වූ නන්‍දියගේ වස්තුව යැ. රෙවතියට විමානයෙක් නැත. ඕ පච්කම් කොට නිරැවත් එකකි. ඇයගේ කථාව ප්‍රෙතවස්තුයෙහි සඞ්ග්‍රහ කරන ලද්දෙ යි.

**විශෙෂ ශබ්දප්‍රයොග:**

පාළියෙහි විරල වූ විශෙෂ ශබ්දප්‍රයොග ද විමානවත්‍ථුයෙහි දක්නා ලැබේ. පහත පළ වනුයේ එබඳු තැනි.

**සුවිම්හිතා:**

දසිවිමානවත්‍ථු (2. 1) මහාරථවිමානවත්‍ථු (5. 14) යන දෙතන්හි ‘සුවිම්හිතා’යි පදරූපයෙක් ඇත. දසිවිමාන අටුවායෙහි ‘‘සුවිම්හිතාති සුඨ්‍ඨම්හිතා’’ යි ද මහාරථවිමාන අටුවායෙහි ‘‘සුවිම්හිතාති සුටඨු සිතකරණා’’ යි ද ව්‍යාඛ්‍යාත යැ. ‘සිත’ යනු ද ‘මිහිත’ යනු ද හාසපර්‍යාය වෙයි. එයින් ‘සුවිම්හිත’ යනු ‘සුවිස්මිත’ යන සංස්කෘත ශබ්ද රූපයෙහි ප්‍රාකෘතස්වරූපය බව පෙනේ.

**සෙයාසා:**

දසිවිමානවත්‍ථුයෙහි (2. 1) මුද්‍රිත පෙළෙහි ද අටුවාහි ද ‘සෙය්‍යාසෙ’ යන ශබ්දරූපයෙක් ඇත. ‘‘සෙය්‍යාසෙති සෙය්‍යතරා’’ යනු එහි අටුවා යි. ධම්මපදයෙහි ‘‘මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ’’ යන්නෙහි ශුක්ලපක්‍ෂය ‘‘සම්මා පණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙ’’යි දක්වනලද්දෙ යැ. එයින් ‘සෙය්‍යසො’ යනු ‘පාපියො’ යන්නෙහි විරුද්ධවචනය බව පෙනෙයි. එහි ලිඞ්ගරූපය ‘සෙය්‍යස’ යනු යි. ඒ වූකලි සංස්කෘතයෙහි ‘ශ්‍රෙයස්’ ශබ්දයෙහි ප්‍රාකෘතස්වරූප යි. එසේ වත් මැ ‘සෙය්‍යසො’ යන්නෙහි ස්ත්‍රීරූපය ‘සෙය්‍යසා’ වියයුතු යැ. ‘සෙය්‍යසී’ කියා හෝ වියැහෙයි. එහි සංස්කෘතශබ්දරූපය ‘ශ්‍රෙයසී’ යනු යි. ‘සෙය්‍යාසෙ’ යනු ලිපි දෙෂයෙකැ යි සිතම්හ.

**වියාකාසි:**

‘‘පඤ්හං පුට්ඨො වියාකාසි’’ යනු ප්‍රශ්නවිසර්ජන කථාවක් පාසා දක්නාලැබෙන වාක්‍යඛණ්ඩයෙකි. එහි ‘වියාකාසි’ යනු ‘ව්‍යාකාසි’ යන ආඛ්‍යාතයෙහි ප්‍රාකෘතස්වරූප යි.

**අනුකම්පයා:**

ගොපාලවිමානවත්ථුයෙහි (7. 6) ''අභාසි කුම්මාසං මමානුකම්පයා''යි 'අනුකම්පා' ශබ්දයෙහි තෘතීයාවිභක්තිරූපය 'අනුකම්පයා'යි දක්වෙයි. ඒ වූකලි සංස්කෘතභාෂාසවරූපය ගත් ශබ්දප්‍රයොගයෙකි. එහි පාළි සවරූපය 'අනුකම්පාය' යනු යි.

**සිංසරෙ:**

මහාරථවිමානවත්ථුයෙහි (5. 14) ''මනො තවස්සය තථෙව සිංසරෙ''යි 'සිංසරෙ' යන ආඛ්‍යාතරූපයෙක් ඇත. ''සිංසරෙති සංසප්පරෙ, පවත්තරෙති අත්ථො'' යනු එහි අටුවා යි. ගමනාර්ථ 'සිංස' ධාතුප්‍රයොගයෙකි.

**අහුවාසිං:**

අනෙකවණ්ණවිමානවත්ථුයෙහි (7. 8) ''අහං භද්දනෙත්ත අහුවාසිං පුබ්බෙ''යි 'හු–සත්තායං' ධාතුයෙහි අතීතකාලික උත්තමපුරුෂෛක වචනය 'අහුවාසිං' යි දක්වනලද්දෙ යැ. ''අහුවාසින්ති අහොසිං'' යනු එහි අටුවා යි.

**සමුස්සිතාසෙ:**

සෙරිස්සකවිමානවත්ථුයෙහි (7. 10) ''වෙළුරියත්ථම්භා සමුස්සිතා-සෙ''යි. 'සමුස්සිත' ශබ්දයාගේ ප්‍රථමාබහුවචනරූපය 'සමුස්සිතාසෙ'යි කියනලද්දෙ යැ. මේ වූකලි ''දෙවාසඃ'' බ්‍රාහ්මණාසඃ'' ආදි වෛදික ශබ්දප්‍රයොගයෙහි ප්‍රාකෘත සවරූප වෙයි එහි මැ ''ථම්භා ඉමෙ ජොතිරසාමයාසෙ'' ''තස්මා ධම්මං පසසථ වාණිජාසෙ'' යන තන්හි **'ජොතිරසාමයාසෙ' 'වාණිජාසෙ'** යන ශබ්දප්‍රයොග ද මෙ මැ නියරි.

**අපිලන්ධන:**

මහාරථවිමානවත්ථුයෙහි (5. 14) ''රථස්ස සොසො අපිලන්ධනාන ච''යි ආභරණපර්‍යායය වූ 'අපිලන්ධන' ශබ්දයෙක් ඇත. ''අපිලන්ධනාන චාති අකාරො නිපාතමත්තං, පිලන්ධනානං ආභරණානං අපිලන්ධනන්ති ච ආභරණපරියායොති වා වදන්ති'' යනු අටුවා යි.

බුද්ධකාලීන භාරතයෙහි සමාජතත්ත්වගවෙෂණයෙහි ලා විමානවත්ථු ඉතා අගනා ග්‍රන්ථයෙකි. සමකාලීන සමාජයෙහි විවිධ කරුණු ඉන් අනාවරණ වෙයි.

(1) **සමයවිරොධී සංවිධාන:** බුදුසමයෙහි ව්‍යාප්තියට එරෙහි වැ බමුණන් සංවිධාන වැ නැඟීසිටි අයුරු තතියනාවාවිමාන වස්තුයෙහි නිදානකථායෙන් අනාවරණ වෙයි. ගමන්විධායෙහි පවසට පැන් අත්‍යවශ්‍ය දෑයෙකි. 'ථූණ' ගම්වැසි බමුණෝ චාරිකායෙහි වඩනා බුදුපාමොක් මහසඟනට පැන් නොදෙනුව කතිකා කොටගෙන ළින් වසාලූහ. පැන් දුන් ස්ත්‍රිය මරාදැමූහ.

(2) **රජුන්ගේ නගරප්‍රදක්ෂිණා:** ජනරඤ්ජනය පිණිස රජුන් මහසෙනඟ පිරිවරා පෙරහරින් නගරප්‍රදක්ෂිණා කරන සිරිතක් එකල දඹදිවැ පැවැති සැටි **'කුඤ්ජරවිමානවත්ථු'** නිදනයෙන් හෙළි වෙයි. එහි මගධෙශ්වර 'බිම්බිසාර' රජු විසින් කරනලද එවන් නගර ප්‍රදක්ෂිණාවක් සඳහන් වෙ.

(3) **උද්භිදවිද්‍යා:** වෘක්ෂලතාවන් අකාලයෙහි මල්පල ගැන්වියැ හැකි ශිල්පීය ක්‍රම බුද්ධකාලීනභාරතයෙහි උද්‍යානපාලකයන් දැනැසිටි බව **ඵලදයකවිමාන** වස්තු නිදනයෙන් අනාවරණ වෙයි. අකාලයෙහි අඹපල බුදින රිසියෙක් මගධයේ බිම්සර රජහට උපදී. හෙ එපවත් උයන්පල්ලාට දන්වයි. "උයනෙහි අඹ නැත, මඳකලක් ඉවසන්නෙ යැ, නොබෝකලෙකින් අඹපල ලබාදෙමී" උයන්පල්ලා කියයි. හෙ අඹරුක්මුල පියවි පස් බැහැර කර කිසි යම් පසක් යොද ජලමිශ්‍රණයක් ඉසී. නොබෝකලෙකින් පත් සැලිණ. යළි ඒ පස ඉවත් කොට බොරළුදමුණුකසට මුසු පියවිපස් යොද දිය ඉසී. නොබෝ කල්හි අඹරුක් දලුලා මල්ගෙන පලදැරී.

(4) **කර්ණශූලයට කකුළුරස:** කකුළුරස කර්ණශූලාබාධයට ඔසුවක් බව **'කක්කටරසදයකවිමාන වස්තු** නිදනයෙන් අනාවරණ වෙයි. "විදර්ශනා භාවනායෙහි යෙදීසිටි මහණක්හට කර්ණශූලපීඩායෙන් සිත් සමාහිත කරනු නොහැකි වෙයි. බුදුහු එපවත් අසා එයට කකුළුරස බොජුන් සත්ප්‍රාය සේ දැනැ 'මගධක්ෂෙත්‍රයෙහි පිඬුසිඟා යව' යි වදළහ. ඔබ එසේ කළහ. එහි දී ලද කකුළුරස මුසු බොජුන් වළඳා රොග සන්හිඳුවාගෙන විදසුන් වඩා රහත් වූහ."

(5) **පිනට ළැදි උවැසියක්:** බැළයට ගත් එකක ස්වාමියාගේ උපස්ථානයට තබා පින්කමට අවසරගත් උවැසියක් පිළිබඳ පහන් සංවෙග දනවන සිද්ධියක් **'උත්තරාවිමානවත්ථු'** නිදනයෙන් හෙළි වෙයි. "පළමු රජගහනුවර මහසිටුහුගේ සෙවක වැ සිට පසු කලෙකැ බිම්සර මහරජු කෙරෙන් මහධන සිටු තැන් ලද 'පුණ්ණ' සිටුහුගේ දුහිතෘ 'උත්තරා' රජගහනුවර සිටුහුගේ පුතුහට භාර්‍ය්‍යා වෙයි. පින්කමට අවකාශ නොලත් ඕ පියසිටුහුගෙන් ලද කහවණු පසළොස් දහසක් දී 'සිරිමා' නම් අභිරූපී නගරසොභිනිය පසළොස් දවසකට බැළයට ගෙන සිය සැමියාගේ උපස්ථානයට තබා අවකාශ ගෙන අඩමසක් සිටුගෙහි දී බුදුපාමොක් මහසඟනට මහදනක් පැවැත්වූ."

මෙවන් රසබර පවතින් සැරැසුණු 'විමානවත්ථු' මානවචරිත සංස්කරණයෙහි ලා අතිශයොපකාරී වන, එහෙයින් මැ බෞද්ධ සංස්කෘතිය හා දැඩි ලෙස බැඳීසිටුනා අගනා ග්‍රන්ථරත්නයෙකි.

**චිරං තිට්ඨතු ලොකස්මිං සම්මා සම්බුද්ධසාසනං.**

**කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර**

රෙවත පිරිවෙන
මාකඩවර,
හිඟුල.
1982 ජනවාරි 1 දින.

## සංකේත නිරූපණය

සී: ලිඛිත පුස්කොළ විමානවත්ථුපාළි

සිමු: සිංහල මුද්‍රිත විමානවත්ථුපාළි

මජසං: මරම්ම ඡට්ඨ සංගීතියෙන් ශෝධිත විමානවත්ථුපාළි

සයා: සයාම (තායි) අක්ෂර මුද්‍රිත ,, ,,

PTS. ඉංග්‍රීසි අක්ෂර මුද්‍රිත ,, ,,

ප. පරමත්ථදීපනී–විමානවත්ථු අට්ඨකථා

විමානවත්ථුපාළි

# ශුද්ධාශුද්ධතා දර්ශනය

| පිට | පෙළ | ශුද්ධ | අශුද්ධ |
|---|---|---|---|
| 2 | 19 | භික්ඛු | භික්ඛ |
| 5 | 25 | සමෘද්ධ | සමෘද්ධි |
| 9 | 9 | දෙව්දුව | දෙව්දුව |
| 10 | 3 | සන්තානං | සත්තානං |
| 11 | 29 | පිපුණු | පිපිණු |
| 36<br>37 | 24<br>27 | අතිචාරුණී | අතිදරුණී |
| 53 | 3 | හෙතුවකින් | හෙ වකින් |
| 64 | 1 | න්විදං | නවිදං |
| 67 | 4 | පතිව්‍රතාවක් | පතීතව්‍රාවක් |
| 114 | 2 | වධූකෙ | වධකෙ |
| 118 | 15 | අබ්භිංගතමානසො | අබ්භිගත්මානසො |
| 133 | 7 | මාණවක | මානවක |
| 135 | 8 | රතින් | රුවතින් |
| 135 | 21 | රන්පෝරු (මෙය සෙසු තැන්හි ද මෙසේ මැ ගත යුතු) | රුවන්පෝරු (රුචක තථා |
| 144 | 9 | අභිරුයහ | අභිරුයහං |
| 148 | 17 | සන්ථතස්මිං | සත්ථතස්මිං |
| 150 | 14 | විකසන්ත | විකසත්ත |
| 154 | 5 | භනෙත | භනෙතා |
| 187 | 20 | වෙරළුමිණියෙන් කළ වැම් ඇති රන් පෝරු අතුළ බිම් ඇති උදර වූ | වෙරළුමිණියෙන් කළ වැම් ඇති උදර වූ |
| 196 | 28 | අනවබොධොහම්සමි | අනවබොධොහම්සමිං |
| 199 | 19 | රත්මිණි | රත්මිණී |
| 202 | 9 | අජ්ජෙව | අජ්ජව |
| 208 | 1 | පබොධකො | පබොධතො |

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

## VOWELS

අ a     ආ ā     ඉ i     ඊ ī     උ u     ඌ ū     එ ē     ඔ ō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

## CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | ත්‍ර tra | මඵ mpha |
| කඛ kkha | ණහ ṇha | දද dda | මබ, ඹ mba |
| ක්‍ය kya | ඤච ñca | දධ ddha | මභ mbha |
| ක්‍රි kri | ඤ ඡ ñcha | ද්‍ර dra | මම mma |
| ක්ව kva | ඤජ ñja | දව, ද්ව dva | මහ mha |
| ඛ්‍ය khya | ඤඣ ñjha | ධ්ව dhva | යය, ය්‍ය yya |
| ඛ්ව khva | ටට ṭṭa | නත nta | යහ yha |
| ගග gga | ටඨ, ට්ඨ ṭṭha | නථ ntha | ලල lla |
| ගඝ ggha | ඩඩ ḍḍa | නද nda | ල්‍ය lya |
| ඞක ṅka | ඩඪ ḍḍha | නධ ndha | ලහ lha |
| ග්‍ර gra | ණණ ṇṇa | නන nna | වහ wha |
| ඞඛ ṅkha | ණට ṇṭa | නහ nha | සස ssa |
| ඞග ṅga | ණඨ ṇṭha | පප ppa | සම sma |
| ඞඝ ṅgha | ණඩ, ඬ ṇḍa | පඵ ppha | සව sva |
| චච cca | තත tta | බබ bba | හම hma |
| චඡ ccha | තථ ttha | බභ bbha | හව hva |
| ජජ jja | ත්ව tva | බ්‍ර bra | ළහ ḷha |
| ජඣ jjha | | මප mpa | |

ා ā     ි i     ී ī     ු ු u     ූ ූ ū     ෙ ē     ො ō

# විමානවත්ථුපාළි - විසය සූචි

## විසය සූචි

### 3. පාරිච්ඡත්තකවග්ගො 60 – 89



### 4. මඤ්ජෙට්ඨකවග්ගො 90 – 121



### 5. මහාරථවග්ගො 122 – 163

# විසය සූචි

සුත්තන්තපිටකෙ

# විමානවත්ථුපාළි

# සුත්තන්තපිටකෙ

# විමානවත්ථුපාළි

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 1. පීඨවග්ගො

### 1. 1

1. පීඨං තෙ සොවණ්ණමයං උළාරං
මනොජවං ගච්ඡති යෙන කාමං,
අලඞ්කතෙ මාල්‍යධරෙ[1] සුවත්ථෙ
ඔභාසසි විජ්ජුරිවබ්භකූටං.

2. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

3. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

4. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

5. අහං මනුස්සෙසු මනුස්සභූතා
අබ්භාගතානාසනකං[2] අදාසිං,
අභිවාදයිං අඤ්ජලිකං අකාසිං
යථානුභාවඤ්ච අදාසි දානං.

6. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

7. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

පඨමපීඨවිමානං.

### 1. 2

8. පීඨං තෙ වෙළුරියමයං උළාරං
මනොජවං ගච්ඡති යෙන කාමං,
අලඞ්කතෙ මාල්‍යධරෙ සුවත්ථෙ
ඔභාසසි විජ්ජුරිවබ්භකූටං.

---

1. මල්‍යධරෙ – සීමු.
2. අබ්භාගතානං ආසනකං – සීමු.

# සූත්‍රාන්තපිටකයෙහි

# විමානවස්තු පාලි

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

## 1. පීඨවර්ගය

### 1. 1

1. අලඞ්කාර වූ දිවසළු හැඳගත් දිවමලින් බර වූ සැරැසුණු සිරුරු ඇති එම්බා දෙව්දුව, තිගේ රුවන්මුවා උදර වූ පීඨය මනසට බඳු වෙගයෙන් රිසි සේ යයි. තෝ විදුලිය වැළඳගත් සැඳෑ වලාකුළක් මෙන් බබළව.

2. කවර හෙතුයෙකින් තිට එබඳු පැහැසටහනෙක් වී ද? කවර පිනෙකින් මෙහි තිගේ සුචරිත ඵලය සමෘද්ධ වේ ද? මනවඩන යම් කිසි සම්පත්තිහු වෙත් නම් කවර පිනෙකින් තිට ඒ භොගයෝ පහළ වෙත් ද?

3. මහත් අනුභාව ඇති දෙව්දුව, තී පුළුවුස්මි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද? තිගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

4. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි පුළුවුස්නා ලද්දී මෙසේ ප්‍රකාශ කළා:

5. (වහන්ස) මිනිස්ලොව මිනිසක් වූ මම් ආගන්තුක වැ පැමිණි පැවිදි කෙනකුන්ට අසුනක් දුනුමු. අභිවාදනය ද කළමු. අඤ්ජලිකර්ම ද කළමු, ශක්ති පරිදි දන් දුන්මු.

6. ඒ පිනින් මට එබඳු වර්ණසම්පත් වෙයි. ඒ පිනින් මට මෙහි සම්පත් සමෘද්ධ වෙයි. මනවඩන යම් භොග කෙනෙක් වෙත් නම් ඒ භොගයෝ උපදිත්.

7. මහත් අනුභාව ඇති යතිවරයන් වහන්ස, මම මිනිස් වැ ඉපිද යම් පිනක් කෙළෙම් නම් එය ඔබට කියමි. ඒ පිනින් මෙසේ දිලියෙන අනුභාව ඇති වීමි. මාගේ වර්ණය ද සියලු දිගුන් බබුළුවා යි.

**පළමු වැනි පීඨවිමාන යි.**

### 1. 2

8. යහපත් දිවසළු හැඳගත් දිවමලින් බර වූ සැරැසුණු සිරුරු ඇති (එම්බා) දෙව්දුව, තිගේ වෙරළුමිණිමය වූ මේ උදර වූ පීඨය මනසට බඳු වෙගයෙන් රිසි සේ යයි. තෝ විදුලිය වැළඳගත් සැඳෑ වලාකුළක් මෙන් බබළව.

9. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

10. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

11. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

12. අහං මනුස්සෙසු මනුස්සභූතා
අබ්භාගතානාසනකං අදාසිං,
අභිවාදයිං අඤ්ජලිකං අකාසිං
යථානුභාවඤ්ච අදාසි දානං.

13. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

14. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසිපුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතියපීඨවිමානං.

## 1. 3

15. පීඨං තෙ සොවණ්ණමයං උළාරං
මනොජවං ගච්ඡති යෙන කාමං,
අලඞ්කතෙ මාල්‍යධරෙ සුවත්ථෙ
ඔභාසසි විජ්ජුරිවබ්භකූටං

16. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

17. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

18. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

9. කවර හෙතුයෙකින් තිට මෙබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් නම් ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

10. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලිසෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වූ ද?

11. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටු සිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි විචාරන ලද්දී (මෙසේ) පැවසූ ය.

12. වහන්ස, මම පෙර මිනිසුන් අතර මිනිස් දුවක් වූවා එක් ආගන්තුක මහණක්හට ආසනයක් දුනිමි, වැන්දෙමි, ඇඳිලි කෙළෙමි, ශක්ති පරිදි දන් ද දුනිමි.

13. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

14. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ද්විතීය පීඨවිමාන යි.**

## 1. 3

15. යහපත් දිවසළු හැඳගත් දිවමලින් බරවූ සැරසුණු සිරුරු ඇති (එම්බා) දෙව්දුව, තීගේ රුවන්මුවා මේ උදර වූ පීඨය මනසට බඳු වෙගයෙන් රිසි සේ යයි. තෝ විදුලිය වැළඳ ගත් සැඩ වළාකුළක් මෙන් බබළව.

16. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධි වේ ද? මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් නම් ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

17. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වවූ ද?

18. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි පුළුවුස්නා ලද්දී (මෙසේ) පැවැසූ ය.

19. අප්පස්ස කම්මස්ස ඵලං මමෙදං[1]
යෙනම්හි[2] එවං ජලිතානුභාවා,
අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ

20. අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං,
තස්ස අදාසහං පීඨං පසන්නා සෙහි පාණිහි

21. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

22. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**තතියපීඨවිමානං.**

## 1. 4

23. පීඨං තෙ වෙළුරියමයං උළාරං
මනොජවං ගච්ඡති යෙන කාමං,
අලඞ්කතෙ මාල්‍යධරෙ සුවත්ථෙ
ඔභාසසි විජ්ජුරිවබ්භකූටං.

24. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

25. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

26. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

27. අප්පස්ස කම්මස්ස ඵලං මමෙදං
යෙනම්හි එවං ජලිතානුභාවා
අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ.

28. අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං,
තස්ස අදාසහං පීඨං පසන්නා සෙහි පාණිහි.

---

1. මමෙතං – කත්ථචි
2. තෙනම්හි – කත්ථචි

19. (වහන්ස,) මම පෙර අත්බැව්හි මිනිසුන් අතර මිනිස් දූවක් වූවා යම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙම් ද? මෙය (පෙර කළ) මාගේ ස්වල්ප කුශල කර්‍මයක්හු පිළිබඳ විපාකයෙකි.

20. පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ කෙලෙස් කිලුටෙන් නො කැළැඹුණු සිත් ඇති මහණක්හු දිටිමි. (දැක) පහන් වූ මම උන් වහන්සේට සියතින් පුවුවක් දුනිමි.

21. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

22. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දූවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන අනුභාව ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**තෘතීය පීඨවිමාන යි.**

## 1. 4

23. යහපත් දිවසළු හැඳගත් දිවමලින් බර වූ සැරැහුණු සිරුරු ඇති (එම්බා) දෙව්දුව තිගේ රුවන්මුවා මේ උදර වූ පීඨය මනසට බඳු වේගයෙන් රිසි සේ යයි. තෝ විදුලිය වැළඳගත් සැඳෑ වලාකුළක් මෙන් බබළව.

24. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද, කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද, මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් නම් ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

25. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද, තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වවු ද?

26. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ නොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කර්‍මයක්හු ගේ දැ යි පුළුවුස්නා ලද්දී (මෙසේ) පැවසූ ය.

27. (වහන්ස,) මම (පෙර) අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් අතර මිනිස් දූවක් වූවා යම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙම් ද මෙය (පෙර කළ) මාගේ ස්වල්ප කුශල කර්‍මයක්හු පිළිබඳ විපාකයෙකි.

28. පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ කෙලෙස් කිලුටෙන් නො කැළඹුණු සිත් ඇති මහණක්හු දුටිමි. (දැක) පහන් වූ මම උන් වහන්සේට සියතින් පුවුවක් දුනිමි.

29. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

30. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

චතුත්ථපීඨවිමානං.

## 1. 5

31. කුඤ්ජරො තෙ වරාරොහො නානා රතනකප්පනො,
රුචිරො ථාමවා ජවසම්පන්නො[1] ආකාසම්හි සමීහති.

32. පදුමී පදුමපත්තක්ඛී[2] පදුමුප්පලජුතින්ධරො,[3]
පදුමචුණ්ණාභිකිණ්ණඞ්ගො සොණ්ණපොක්ඛරමාලවා[4]

33. පදුමානුසටං මග්ගං පදුමපත්තවිභූසිතං,
ඨිතං වග්ගුමනුග්ඝාති මිතං ගච්ඡති වාරණො

34. තස්ස පක්කමමානස්ස සොණ්ණකංසා රතිස්සරා,
තෙසං සූයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා

35. තස්ස නාගස්ස ඛන්ධස්මිං සුචිවත්ථා අලඞ්කතා,
මහන්තං අච්ඡරාසඞ්ඝං වණ්ණෙන අතිරොචසි[5]

36. දානස්ස තෙ ඉදං ඵලං අථො සීලස්ස වා පන,
අථො අඤ්ජලිකම්මස්ස තං මෙ අක්ඛාහි පුච්ඡිතාති.

37. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති.

38. දිස්වාන ගුණසම්පන්නං ඣායිං ඣානරතං සතං,
අදාසිං පුප්ඵාභිකිණ්ණං ආසනං දුස්සසන්ථතං.

39. උපඩ්ඪපදුමමාලාහං ආසනස්ස සමන්තතො,
අබ්භොකිරිස්සං පත්තෙහි පසන්නා සෙහි පාණිහි.

1. ථාමසම්පන්නො – කත්ථචි
2. පදුමපත්තක්ඛී – මජසං.
3. පදුමුප්පලජුතින්ධරො – මජසං.
4. සොණ්ණපොක්ඛරමාලධා – මජසං.
5. අතිරොචති – කත්ථචි

29. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

30. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**චතුර්ථ පීඨවිමාන යි.**

## 1. 5

31-32. පියුම් පෙති වැනි ඇස් ඇති දෙව්දුව, නොයෙක් රුවනින් කළ සන්නාහ ඇති සිත්කලු වූ ශක්තිමත් වූ ශීඝ්‍ර ජව ඇති පියුම් පැහැයෙන් යුක්ත වූ පියුම් උපුල් පැහැ දරන්නා වූ පියුමකෙසුරෙන් ගැවසී ගත් සිරුරු ඇති රනින් කළ පියුම් මල්දම් දරන්නා වූ තිගේ මේ උතුම් ඇත්වාහනය අහසෙහි (පිට සිටියවුන් නො සල්මින්) යයි.

33. ඒ ඇත්වාහනය පියුම්වලින් ගැවසීගත්තා වූ තන්පැහැති පියුම් පෙත්තෙන් වෙසෙසින් බබළමින් සිටියා වූ මාර්ගයෙහි මැනැවින් පමණින් යුතුව පා තබමින් ගමන් කරයි.

34. යන්නා වූ ඒ ඇත්වාහනය දෙපස කන්කලු නද ඇති රන්මුවා ඝණ්ටාවෝ (එල්බෙමින් සැලෙත්) ඔවුන්ගේ නාදය පසඟතුරු නද මෙන් ඇසේ.

35. ඒ ඇත්වාහනයාගේ කඳෙහි පිවිතුරු සළුපටින් සැරසීසිටි තෙපි මහත් වූ දිව්‍යකන්‍යා සමූහයා රූපයෙන් ඉක්මවා බබළව.

36. තිගේ මේ පුණ්‍යවිපාකය දනයක්හුගේ ද, නැතහොත් ශීලයක්හුගේ ද, එසේත් නැතහොත් අඤ්ජලිකර්මයක්හුගේ දැ යි මා විසින් විචාරන ලද්දී එය කියව.

37. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටු සිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි පුළුවුස්නා ලද්දී (මෙසේ) පැවැසූ ය.

38. සියලු (ශ්‍රමණ) ගුණයෙන් යුක්ත වූ ධ්‍යාන කරන සුලු වූ සත්පුරුෂ වූ දැහැනෙහි ඇලුණු මහණක්හු දැක (උන්වහන්සේට වැඩහිඳීම පිණිස) මලින් ගැවසුණු අළුත් පිළී අතුළ අසුනක් දුනිමි.

39. ඒ අසුන හාත්පස (බිමැ) මම අඩක් පමණ පියුම් මල්මාලා තබා සියතින් ම මල්පෙති විසිරවීමි.

40. තස්ස කම්මස්ස කුසලස්ස[1] ඉදං මෙ ඊදිසං ඵලං,
සක්කාරො ගරුකාරො ච දෙවානං අපචිතා අහං.

41. යො වෙ සම්මාවිමුත්තානං සන්තානං බ්‍රහ්මචාරිනං,
පසන්නො ආසනං දජ්ජා එවං නන්දෙ යථා අහං.

42. තස්මා හි අත්ථකාමෙන මහත්තමභිකඞ්ඛතා,
ආසනං දාතබ්බං හොති සරීරන්තිමධාරිනන්ති.

කුඤ්ජරවිමානං.

## 1. 6

43. සුවණ්ණච්ඡදනං නාවං නාරි ආරුය්හ තිට්ඨසි,
ඔගාහසි පොක්ඛරණිං පදුමං ඡින්දසි පාණිනා.

44. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

45. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

46. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති.

47. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
දිස්වාන භික්ඛූ තසිතෙ කිලන්තෙ
උට්ඨාය පාතුං උදකං අදාසිං.

48. යො වෙ කිලන්තාන පිපාසිතානං
උට්ඨාය පාතුං උදකං දදාති,
සීතොදකා තස්ස භවන්ති නජ්ජො
පහූතමාල්‍යා බහුපුණ්ඩරීකා.

49. තමාපගා අනුපරියන්ති සබ්බදා
සීතොදිකා වාලුකසන්ථතා නදී,
අම්බා ච සාලා තිලකා ච ජම්බුයො
උද්දාලකා පාටලියො ච ඵුල්ලා.

1. කම්මකුසලස්ස - මජසං.

40. මා කළ ඒ කුශල කර්‍මයාගේ විපාකය මේ ය, මෙබඳු ය (දෙවි-යන්ගේ) සත්කාරය හා ගෞරවය (මා කෙරෙහි) විය. මම දෙවියන් විසින් පුදන ලද්දී වෙමි.

41. යමෙක් එකාන්තයෙන් මොනොවට කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ ශාන්ත කායවාග්මනස් කර්‍ම ඇති බ්‍රහ්මචාරීන්ට සැදැ සිතැත්තේ අසුනක් දේ නම් හෙතෙමේ මා මෙන් දිව්‍ය සම්පත් ලබා සතුටු වන්නේ ය.

42. එබැවින් තමාට හිත කැමැති මහත් පින්ඵල කැමැත්තහු විසින් රහතුන් වහන්සේට අසුන් දියයුතු වේ.

කුඤ්ජරවිමාන යි.

## 1. 6

43. (එම්බා) දෙව්දුව, තෝ රනින් කළ පියසි ඇති නැවකට නැගී සිටිනෙහි. (එසේ ම දිව කුසුමෙන් ගැවසුණු) පොකුණට බැස සිටිනෙහි අතින් පියුම් නෙළනෙහි.

44. කවර හෙතුවකින් තට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන යම්කිසි සම්පත්තීහු වෙත් ද? ඒ සම්පත්තීහු (කවර පිනෙකින්) තට පහළ වෙත් ද?

45. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස්වූවා කවර පිනක් කළහු ද? තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වවු ද?

46. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි පුළුවුස්නා ලද්දී (මෙසේ) පැවැසූ ය.

47. මම (පෙර) අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් කෙරෙහි මිනිස් දුවක් වූවා හටගත් පවස් ඇති ක්ලාන්ත වූ භික්ෂූන් දැක වහා නැගී සිට වළඳන්නට පැනිත්තක් දුනිමි.

48. යමෙක් එකාන්තයෙන් කලාන්ත වූ හටගත් පවස් ඇත්තවූනට වහා නැගී සිට පැන් දේ ද, ඕහුට සිහිල් දිය පිරුණු බොහෝ මලින් ගැවසී ගත් බොහෝ සුදු පියුම් ඇති නදීහු පහළ වෙති.

49. හැමකල්හි ම සිහිල් දිය ගලා බස්නා සිහිල් දිය පිරුණු සුදුවැලි අතුරන ලද ගඞ්ගාවෝ ඒ විමන වටකොට සිටිති. පිපිණු මල් ඇති අඹ සල් තිලක දඹ ඇසළ පළොල් රුක්හු ද (එහි) වෙති.

50. තං භූමිභාගෙහි උපෙතරූපං
විමානසෙට්ඨං භුසසොභමානං,
තස්සීධ[1] කම්මස්ස අයං විපාකො
එතාදිසං කතපුඤ්ඤා[2] ලභන්ති.

51. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

52. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං;
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**පඨමනාවාවිමානං.**

## 1. 7

53. සුවණ්ණච්ඡදනං නාවං නාරී ආරුය්හ තිට්ඨසි,
ඔගාහසි පොක්ඛරණිං පදුමං ඡින්දසි පාණිනා.

54. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

55. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

56. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

57. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
දිස්වාන භික්ඛුං තසිතං කිලන්තං
උට්ඨාය පාතුං උදකං අදාසිං.

58. යො වෙ කිලන්තස්ස පිපාසිතස්ස
උට්ඨාය පාතුං උදකං දදාති,
සීතොදකා තස්ස භවන්ති නජ්ජො
පහූතමාල්‍යා බහුපුණ්ඩරීකා.

59. තමාපගා අනුපරියන්ති සබ්බදා
සීතොදකා වාලුකසන්ථතා නදී,
අම්බා ච සාලා තිලකා ච ජම්බුයො
උද්දාලකා පාටලියො ච ඵුල්ලා.

---

1. තස්සෙව – ස්‍යා.
2. පුඤ්ඤකතා – මජ්සං.

50. එවැනි (පොකුණු ගඞ්ගා හා උයන්වලින් යුත්) භූමිභාගයන් ගෙන් පැසසියයුතු බැවින් යුක්ත වූ බෙහෙවින් බබළන ශ්‍රේෂ්ඨ වූ දිව්‍ය විමාන ලබත්. (එද මා විසින් කළ) ඒ කර්‍මයාගේ මෙහි මේ විපාකය වෙයි. කළ පිනැත්තෝ මෙබඳු සම්පත් ලබත්.

51. එ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. එ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩනා යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

52. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ප්‍රථම නාවාවිමාන යි.**

## 1. 7

53. (එම්බා) දෙව්දුව, තෝ රනින් කළ පියයි ඇති නැවකට නැඟී සිටිනහු. (එසේ ම දිව කුසුමෙන් ගැවසුණු) පොකුණට බැස සිටිනහු. අතින් පියුම් නෙළන්නහු.

54. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

55. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කළහු ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. (කවර පිනෙකින්) මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වවු ද?

56. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්ති මේ පුණ්‍යඵලය යම් කර්‍මයක්හුගේ දැ යි මෙසේ පැවසූ ය.

57. මම පෙර, අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූවා හටගත් පවස් ඇති ක්ලාන්ත වූ මහණක්හු දැක නැඟී සිට පිමට පැන් දුනිමි.

58. යමෙක් එකාන්තයෙන් කලාන්ත වූ හටගත් පවස් ඇති මහණක්හට නැඟී සිට වළඳන්නට පැන් දේ ද ඔහුට සිහිල් දිය පිරුණු බොහෝ මල් ඇති බොහෝ සුදු පියුම් ඇති නදීහු පහළ වෙත්.

59. හැම කල්හි ම සිහිල්දිය ගලාබස්නා සිහිල්දිය පිරුණු යුදුවැලි අතුරන ලද ගඞ්ගාවෝ ඒ විමන වටකොට සිටිත්. පිපුණු මල් ඇති අඹ සල් තිලක දඹ ඇසළ පළොල් රුක්හු ද (එහි) වෙති.

60. තං භූමිභාගෙහි උපෙතරූපං
විමානසෙට්ඨං භුසසොභමානං,
තස්සීධ කම්මස්ස අයං විපාකො
එතාදිසං කතපුඤ්ඤා ලභන්ති.

61. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

62. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,*
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතියනාවාවිමානං.

## 1. 8

63. සුවණ්ණච්ඡදනං නාවං නාරි ආරුය්හ තිට්ඨසි,
ඔගාහසි පොක්ඛරණිං පද්මං ඡින්දසි පාණිනා.

64. කූටාගාරා නිවෙසා තෙ විභත්තා භාගසො මිතා;
දද්දල්ලමානා ආභන්ති සමන්තා චතුරො දිසා.

65. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

66. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

67. සා දෙවතා අත්තමනා සම්බුද්ධෙනෙව පුච්ඡිතා
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති.

68. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
දිස්වාන භික්ඛු තසිතෙ කිලන්තෙ
උට්ඨාය පාතුං උදකං අදාසිං.

69. යො වෙ කිලන්තාන පිපාසිතානං
උට්ඨාය පාතුං උදකං දදාති,
සීතොදකා තස්ස භවන්ති නජ්ජො
පහූතමල්‍යා බහු පුණ්ඩරීකා.

*එත්ථ දීඝාගතෙ මරම්මඡට්ඨ සඞ්ගීති පොත්ථකෙ ''අක්ඛාමි තෙ බුද්ධ මහානුභාව මනුස්සභූතා යමකාසි පුඤ්ඤා'පි පාදත්තයං.

60. එවැනි භූමිභාගයන් ගෙන් පැසසියයුතු බැවින් යුක්ත වූ අතිශයින් බබළන ශ්‍රෙෂ්ඨ වූ දිව්‍යවිමාන ලබත්. (එද මා විසින් කළ) ඒ කර්‍මයාගේ මෙහි මේ විපාකය වෙයි. කළ පිනැත්තෝ මෙබඳු සම්පත් ලබත්.

61. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

62. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ද්විතීය නාවාවිමාන යි.**

## 1. 8

63. (එම්බා) දෙව්දුව, තෝ රනින් කළ පියසි ඇති නැවකට නැඟී සිටිනහු. (එසේ ම දිව කුසුමෙන් ගැවසුණු) පොකුණට බැස සිටිනහු. අතින් පියුම් නෙළනහු.

64. කොටස් වශයෙන් බෙදනලද ප්‍රමාණවත් වූ, කූළුගෙවල් ඇති බබළන්නා වූ තීගේ නිවෙස්හු හාත්පස සිවුදිගුන් බබුළුවත්.

65. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

66. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කළහු ද, තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වූ ද?

67. සම්බුදු රදුන් විසින් ම පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දූ යි (මෙසේ) පැවැසූ ය.

68. මම පෙර අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් අතර මිනිස්දුවක් වූවා හටගත් පවස් ඇති ක්ලාන්ත වූ භික්ෂූන් දක නැඟී සිට පීමට පැන් දුනිමි.

69. යමෙක් එකාන්තයෙන් හටගත් පවස් ඇති ක්ලාන්ත වූවන්ට නැඟී සිට පීමට පැන් දේ ද, ඔහුට සිහිල් දිය පිරුණු බොහෝ මල් ඇති බොහෝ සුදුපියුම් ඇති නදීහු පහළ වෙති.

70. තමාපගා අනුපරියන්ති සබ්බද
සීතොදකා වාලුකසන්ථතා නදී,
අම්බා ච සාලා තිලකා ච ජම්බුයො
උද්දාලකා පාටලියො ච ඵුල්ලා.

71. තං භූමිභාගෙහි උපෙතරූපං
විමානසෙට්ඨං භුසසොභමානං,
තස්සීධ කම්මස්ස අයං විපාකො
එතාදිසං කතපුඤ්ඤා ලභන්ති.

72. කූටාගාරා නිවෙසා මෙ විභත්තා භාගසො මිතා,
දද්දල්ලමානා ආභන්ති සමන්තා චතුරො දිසා.

73. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

74. තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසති,
එතස්ස කම්මස්ස ඵලං මමෙදං
අත්ථාය බුද්ධො උදකං අපායීති[1].

තතියනාවා විමානං.

## 1. 9

75. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

76. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

77. කෙන ත්වං විමලොභාසා අතිරොචසි දෙවතෙ[2],
කෙන තෙ සබ්බගත්තෙහි සබ්බා ඔභාසරෙ[3] දිසා.

78. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

79. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1. අපායිති – සී, ස්‍යා, PTS.
2. දෙවතා – මජ්ඣං.
3. ඔභාසතෙ – මජ්ඣං.

70. හැම කල්හි ම සිහිල්දිය ගලාබස්නා සිහිල්දිය පිරුණු සුදුවැලි අතුරනලද ගඞ්ගාවෝ ඔහුගේ විමන වටකොට සිටිත්. පිපුණු මල් ඇති අඹ සල් තිලක දඹ ඇසළ පළොල් රුක්හු ද (එහි) වෙත්.

71. එවැනි භූමිභාගයන්ගෙන් පැසසියයුතු බැවින් යුක්ත වූ අතිශයින් බබළන දිව්‍යවිමාන ලබත්. (එද මාවිසින් කළ) ඒ කර්‍මයාගේ මෙහි මේ විපාකය වෙයි. කළ පිනැත්තෝ මෙබඳු සම්පත් ලබත්.

72. කොටස් වශයෙන් බෙදනලද ප්‍රමාණවත් වූ කුළුගෙවල් ඇති බබළන්නා වූ මාගේ නිවෙස්හු හාත්පස සිවුදිගුන් බබුළුවත්.

73. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තීහු වෙත් ද? ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

74. මෙසේ මම ඒ පිනෙන් දිලියෙන පුණ්‍යර්ධි ඇත්ති වෙමි. ඒ මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. බුදුරජාණන් වහන්සේ මාගේ ප්‍රයොජනය පිණිස පැන් වැළඳූසේක් ද ඒ කුසල කර්‍මයාගේ මේ විපාකය වේ.

**තෘතිය නාවාවිමාන යි.**

## 1. 9

75. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිවූ ද,

76. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

77. (එම්බා) දෙව්දුව, නිර්‍මල වූ ශරීරාලොකයක් ඇති තෙපි කවර පිනෙකින් (අන් හැම සුරන් මැඩ) බබළන්නහු ද? කවර පිනෙකින් තිගේ සියලු ශරීරාවයවයන්ගෙන් සියලු දිගුහු බබළත් ද?

78. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කළහු ද? තීගේ (මේ) සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. (කවර පිනෙකින්) මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වූ ද?

79. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම කවර කර්‍මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසූ ය.

80. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
තමන්ධකාරම්හි තිමීසිකායං
පදීපකාලම්හි අදං පදීපං[1]

81. යො අන්ධකාරම්හි තිමීසිකායං
පදීපකාලම්හි දදාති දීපං,
උපපජ්ජති ජොතිරසං විමානං
පහූතමාල්‍යං බහුපුණ්ඩරීකං.

82. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

83. තෙනාහං විමලොභාසා අතිරොචාමි දෙවතා,
තෙන මෙ සබ්බගත්තෙහි සබ්බා ඔභාසරෙ දිසා.

84. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දීපවිමානං.

## 1. 10

85. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

86. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

87. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

88. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

89. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ.
අද්දසං විරජං බුද්ධං විප්පසන්නමනාවිලං

1. අදය දීපං – මජසං.

80. මම පෙර අත්බැව්හි මිනිස්ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූවා පහන් දැල්වීමට සුදුසු බොල් ගන අඳුරෙහි පහන් උපකරණ දුනිමි.

81. යමෙක් පහන් දැල්වීමට සුදුසු බොල් ගන අඳුරෙහි පහන් දේ ද, (ඒ පිනෙන් හේ) බොහෝ උපුල් මල් ඇති බොහෝ සුදුපියුම් ඇති ජොතිරස විමානයට පිළිසඳ විසින් පැමිණෙයි.

82. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

83. නිර්මල වූ ශරීරාලොක ඇති මම ඒ පින කරණකොට ගෙන අන් හැම දෙවියන් ඉක්මවා බබළමි. ඒ පිනින් මාගේ සියලු ශරීරාවයවයන් ගෙන් සියලු දිගුහු බබළත්.

84. මහත් ආනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

දීපවිමාන යි.

## 1. 10

85. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිවු ද,

86. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද,

87. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කළහු ද, තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. (කවර පිනෙකින්) මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වවු ද?

88. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුයිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි පැන පුළුවුස්නා ලද්දී (මෙසේ) පැවසූ ය.

89. මම පෙර අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූමු. (එකල මම) පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නොකැළඹුණු සිත් ඇති බුදුන් දුටිමි.

90. ආසජ්ජ දානං අදසිං අකාමා තිලදක්ඛිණං
දක්ඛිණෙය්‍යස්ස බුද්ධස්ස පසන්නා සෙහි පාණිහි.

91. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

92. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

තිලදක්ඛිණාවිමානං.

## 1. 11

93. කොඤ්චා මයූරා දිවියා ච හංසා
වග්ගුස්සරා කොකිලා සම්පතන්ති,
පුප්ඵාභිකිණ්ණං රම්මමිදං විමානං
අනෙකචිත්තං නරනාරිසෙවිතං.

94. තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
ඉද්ධි[1] විකුබ්බන්ති අනෙකරූපා,
ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති[2].

95. දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

96. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

97. අහං මනුස්සෙසු මනුස්සභූතා
පතිබ්බතා නාඤ්ඤමනා[3] අහොසිං,
මාතාව පුත්තං අනුරක්ඛමානා
කුද්ධාපහං[4] නප්ඵරුසං අවොචං.

98. සච්චෙ ඨිතා මොසවජ්ජං පහාය
දානෙ රතා සඞ්ගහිතත්තභාවා,
අන්නං ච පානං ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදසිං.

1. ඉද්ධිං – කත්ථචි
2. පමොදයන්ති ච – මජසං.
3. පතිබ්බතා නඤ්ඤමනා – මජසං.
4. කුද්ධාපිහං – මජසං.

90. (දුක දෙය ධර්මය නොවටින්නක් හෙයින් ඒ ගැන) නොකැමැත්තෙන් ඉදිරියට පැමිණ දක්ෂිණාවට සුදුසු වූ බුදුරජාණන් වහන්සේට පහන්සිත් ඇති ව සියතින් ම තලදෙහොනක් දුනිමි.

91. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

92. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**තිලදක්ෂිණාවිමාන යි.**

## 1. 11

93. නන් වැදෑරුම් රුවන් මලින් ගැවසුණා වූ නොයෙක් සිතියමින් විසිතුරු වූ දෙවියන් හා දෙවඟනන් විසින් නිති සෙවුනා ලද රමණීය වූ මේ විමනට දිව්‍යමය වූ කොස්වාලිහිණියෝ ද දිව්‍යමය වූ මොනරු ද දිව්‍යමය වූ හංසයෝ ද මිහිරිනද ඇති කොවුලෝ ද නිතර අවටින් පැමිණෙති.

94. මහානුභාව ඇති දෙව්දුව අනෙක ස්වරූප වූ ඍද්ධි විකුර්වණය කරමින් සිටිහු. තිගේ මේ දිව්‍යාප්සරාවෝ හාත්පස නටති, ගයති, සතුටු කරවති.

95. මහත් අනුභාව ඇති දෙව්දුව, (තෝ) දිව්‍යර්ධියට පැමිණියා වහු. මිනිස්දුවක් වූවා කවර පිනක් කළහු ද? තිගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වවූ ද?

96. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි (මෙසේ) පැවසූ ය.

97. මම පෙර අත්බැව්හි මිනිසුන් අතර මිනිස්දුවක් වූවා අන් පුරුෂයකු නොපතන්නී පතිව්‍රතා වීමි. පුතකු රකින මවක් මෙන් තමහිමි රැක්කෙමි. (අනුන් කළ වරදකට) කිපුණී නමුදු පරොස් බස් නො කීමි.

98. මුසාවාදය හැර සත්‍යයෙහි පිහිටියා වෙමි. දීමෙහි ඇලුණා වූ මම සතර සඞ්ග්‍රහ වස්තුවෙන් අනුන්ට සඞ්ග්‍රහ කරන ස්වභාව ඇත්තී පසන් සිතැත්තී අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් දුනිමි.

99. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

100. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**පතිබ්බතාවිමානං.**

## 1. 12

101. වෙළුරියථම්භං රුචිරං පභස්සරං
විමානමාරුය්හ අනෙකචිත්තං
තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
උච්චාවචා ඉද්ධිවිකුබ්බමානා
ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති[1]

102. දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

103. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

104. අහං මනුස්සෙසු මනුස්සභූතා
උපාසිකා චක්ඛුමතො අහොසිං
පාණාතිපාතා විරතා අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං

105. අමජ්ජපා නො ච[2] මුසා අභාසිං[3]
සකෙන සාමිනාව[4] අහොසිං තුට්ඨා
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදාසිං

106. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

107. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

**දුතිය පතිබ්බතාවිමානං.**

1. පමොදයන්ති ච – මජසං,
2. නාපි – සයා.
3. අභාණිං – මජසං.
4. සාමිකා – මජසං.

99. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

100. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ය, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

පතිව්‍රතාවිමාන යි.

## 1. 12

101. මහත් අනුභාව ඇති දෙව්දුව, වෙරළුමිණි මුවා ටැම් ඇති සිත්කලු වූ අතිශයින් බබළන නොයෙක් සිතියමින් විසිතුරු වූ විමනට නැඟ කුදු මහත් සෘද්ධිවිකුර්වණය කරමින් එහි සිටුනාව. තිගේ මේ දෙවඟනෝ හාත්පස්හි නටති ගයති සතුටු කරවත්.

102. මහත් අනුභාව ඇති දෙව්දුව, තෝ දිව්‍යර්ධියට පැමිණියා වෙහි. මිනිස් දුවක් වූවා කවර පිනක් කළහු ද? තිගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්ති වවු ද?

103. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවසූ ය.

104. මම පෙර අත්බැව්හි මිනිසුන් අතර මිනිස්දුවක් වූවා පසැස් ඇති බුදුරදුන්ගේ උවැසියක් වීමි. පණිවාමයෙන් දුරු වූවා වෙමි. ලොකයෙහි නුදුන් දෙය ගැනීම හැම ලෙසින් ම දුරු කෙළෙමි.

105. මත්පැන් නො බීමි, බොරු නො කීමි, සිය සැමියා සමග ම සතුටු වූවා වෙමි. පහන් සිත් ඇත්තී අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් දුනිමි.

106. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

107. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

ද්විතීය පතිව්‍රතා විමාන යි.

## 1. 13

108. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

109. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

110. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

111. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

112. අහං මනුස්සෙසු මනුස්සභූතා
සුණිසා අහොසිං සසුරස්ස ගෙහෙ[1]
අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං

113. තස්ස අදාසහං පූවං පසන්නා සෙහි පාණිහි
භාගඩ්ඪභාගං දත්වාන මොදමි නන්දනෙ වනෙ

114. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

115. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**සුණිසාවිමානං.**

## 1. 14

116. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

117. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

1. ඝරෙ, — ස්‍යා.

## 1. 13

108. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

109. කවර හෙතුවකින් තිට මෙබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිණෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

110. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිණෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

111. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුයිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මෙසේ පැවසූ ය.

112. මම පෙර අත්බැව්හි මිනිසුන් අතර මිනිස් දුවක් වූවා ඔයිලණුවන්ගේ ගෙහි ලේලියක් වූමු. පහ වූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නො කැලඹුණු සිත් ඇති මහණක්හු දුටිමි.

113. (දැක) උන්වහන්සේට පහන් වූවා සියතින් කැවුමක් දුනිමි. තමා ලත් කොටසින් අඩක් දී නඳුන් වෙනෙහි සතුටු වෙමි.

114. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

115. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්නී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ප්‍රථම සුණිසාවිමාන යි.**

## 1. 14

116. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

117. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

118. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

119. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

120. අහං මනුස්සෙසු මනුස්සභූතා
සුණිසා අහොසිං සසුරස්ස ගෙහෙ.
අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං

121. තස්ස අදාසහං භාගං පසන්නා සෙහි පාණිහි
කුම්මාසපිණ්ඩං දත්වාන මොදමි නන්දනෙ වනෙ.

122. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

123. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතිය සුණිසාවිමානං.

## 1. 15

124. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

125. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

126. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

127. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

118. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුත් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

119. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටු සිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මෙසේ පැවසූ ය.

120. මම පෙර අත්බැව්හි මිනිසුන් අතර මිනිස්දුවක් වූවා ඔයිලංණුවන්ගේ ගෙහි ලේලියක් වූමු.

121. පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නො කැළඹුණු සිත් ඇති මහණක්හු දුටිමි. (දැක) උන්වහන්සේට පහන් වූවා සියතින් යව ධාන්‍යයෙන් කළ කොමු පිඬෙකින් භාගයක් දුනිමි. ඒ කොමුපිඩු දී නඳුන් වෙනෙහි සතුටු වෙමි.

122. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

123. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලිසෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වෙමි. මගේ සිරුරුපැහැය ද සියලු දිගුත් බබුළුවයි.

**ද්විතීය සුණිසාවිමාන යි.**

## 1. 15

124. එම්බා දෙව්දුව, යම්බඳු වූ නෝ මනා රුසිරින් සියලු දිගුත් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි?

125. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

126. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුත් බබුළුවයි. කිවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්ති වෙහි ද?

127. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටු සිත් ඇත්ති මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසූ ය.

128. ඉස්සා ච මච්ඡෙරමථො පළාසො,
නාහොසි මය්හං සරමාවසන්තියා
අක්කොධනා භත්තුවසානුවත්තිනී
උපොසථෙ නිච්චහමප්පමත්තා.

129. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං

130. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සංයමා සංවිභාගා ච විමානං ආවසාමහං[1]

131. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

132. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

133. සාහං සකෙන සීලෙන යසසා ච යසස්සිනී,
අනුභොමි සකං පුඤ්ඤං සුඛිතා චම්හි අනාමයා.

134. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

135. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

මම ච භන්තෙ වචනෙන භගවතො පාදෙ සිරසා වන්දෙය්‍යාසි, **උත්තරා** නාම භන්තෙ උපාසිකා භගවතො පාදෙ සිරසා වන්දතීති අනච්ඡරියං ඛො පනෙතං භන්තෙ යං මං භගවා අඤ්ඤතරස්මිං සාමඤ්ඤඵලෙ ව්‍යාකරෙය්‍ය. තං භගවා සකදාගාමිඵලෙ ව්‍යාකාසීති.

**උත්තරාවිමානං.**

## 1. 16

136. යුත්තා ච තෙ පරම අලඞ්කතා හයා
අධොමුඛා අඝසිගමා බලී ජවා
අභිනිම්මිතා පඤ්චරථා සතා ච තෙ
අන්වෙන්ති තං සාරථිචොදිතා හයා.

137. සා තිට්ඨසි රථවරෙ අලඞ්කතා
ඔභාසයං ජලමිව ජොතිපාවකො
පුච්ඡාමි තං වරතනු[2] අනොමදස්සනෙ
කස්මා නු කායා අනධිවරං උපාගමීති.

1. ආවසාමිමං – සී.
2. වරචාරු – කත්ථචි.

128. ගිහිගෙයි වසන මට ඊර්ෂ්‍යායෙක් හෝ මසුරුබවෙක් හෝ නැවත යුගග්‍රාහයෙක් හෝ නො වී ය. ක්‍රොධ නැත්ති සිය සැමියාගේ අදහස් අනුව පවත්නී පෙහෙවස් රැකීමෙහි නිරතුරු ව අප්‍රමත්ත වූවා වෙමි.

129-130. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද යම්බඳු අටවක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද (යන පොහෝ දිනයන්හි) අටඟින් යුත් පෙහෙවස් විසීමි. සියලු කල්හි නිති සිල්හිද කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වූවා මොනවට බෙද දෙන්නී ගෙහි විසීමි.

131. (එකල මම) පණිවායෙන් දුරු වීමි, මුසවායෙන් සංයත වීමි, අයිනාදනින් මීසහසරින් රෑමෙර පීමෙන් දුරු වීමි.

132. පස් සිකපද රැක්මෙහි ඇලුණුවතුරාර්‍ය්‍ය සත්‍යයෙහි දක්ෂ වූ මම යසස් ඇති පසැස් ඇති ගෞතම බුදුරදුන්ගේ උපාසිකාවක් වීමි.

133. (එසේම) ඒ මම ස්වකීය සීලයෙන් ද කීර්තියෙන් ද යසස් ඇතියා සිය පින්පල විඳිමි. නිරොග වූවා සැප ඇතියා ද වෙමි.

134. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

135. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලිසෙන පූණ්‍යර්ද්ධි ඇත්ති වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

වහන්ස, උත්තරා නම් උපාසිකා තොමෝ භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රී පාදයන් මස්තකයෙන් වඳී. වහන්ස, මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයන් වඳිනු මැනැවි. වහන්ස, යම් හෙයෙකින් භාග්‍ය-වතුන් වහන්සේ මා එක්තරා මාර්ගඵලයෙක්හි ලා වදරන සේක් නම් ඒ පුදුමයෙක් නො වේ. භාග්‍යවතුන් වහන්සේ ඒ (මා) සකෘදගාමි ඵලයෙහි ලා ප්‍රකාශ කළ සේක.

**උත්තරාවිමාන යි.**

## 1. 16

136. (එම්බා දෙව්දුව) තීගේ රියෙහි යොදන ලද අශ්වයෝ උතුම් වූ දිව්‍යමය වූ අශ්වාභරණයෙන් සරසන ලදහ, යටිහුරු කළ මුව ඇතියහ, ආකාශචරියහ, බල ඇත්තාහ, ජව ඇත්තාහ. ඒ රිය පන්සියය තීගේ පිනෙන් නිපන. රියැදුරන් විසින් මෙහෙයන ලද්දවුන් වැනි අශ්වයෝ තී අනුව යෙත්.

137. දිව බරණින් සැරැසුණු සඳහිරු තරු සේ බබළන ගිනි සේ දිලියෙන ඒ කී උතුම් රියෙහි සිටිනෙහි ය. අලාමක දර්ශන ඇති උතුම් සිරුරු ඇත්තී ය, කිනම් දිව්‍ය නිකායෙකින් බුදුරදුන් වෙත පැමිණියෙහි දූ යි තී විචාරමි.

138. කාමග්ගපත්තානං යමාහුනුත්තරං[1]
නිම්මාය නිම්මාය රමන්ති දෙවතා
තස්මා කායා අච්ඡරා කාමවණ්ණිනී
ඉධාගතා අනධිවරං නමස්සිතුන්ති.

139. කිං ත්වං පුරෙ සුචරිතමාචරීධ
කෙනච්ඡසි ත්වං අමිතයසා සුඛෙධිතා
ඉද්ධී ච තෙ අනධිවරා විහඞ්ගමා
වණ්ණො ච තෙ දසදිසා විරොචති.

140. දෙවෙහි තං පරිවුතා සක්කතා චසි
කුතො චුතා සුගතිගතාසි දෙවතෙ
කස්ස වා ත්වං වචනකරානුසාසනිං
ආචික්ඛ මෙ ත්වං යදි බුද්ධසාවිකාති.

141. නගන්තරෙ නගරවරෙ සුමාපිතෙ
පරිචාරිකා රාජවරස්ස සිරීමතො
නච්චෙ ගීතෙ පරමසුසික්ඛිතා අහුං
සිරිමාති මං රාජගහෙ අවෙදිසුං.[2]

142. බුද්ධො ච මෙ ඉසිනිසභො විනායකො
අදෙසයී සමුදයදුක්ඛනිච්චතං
අසඞ්ඛතං දුක්ඛනිරොධසස්සතං
මග්ගඤ්චිමං අකුටිලමඤ්ජසං සිවං.

143. සුත්වානහං අමතපදං අසඞ්ඛතං
තථාගතස්සනධිවරස්ස සාසනං
සීලෙස්වහං පරමසුසංවුතා අහුං
ධම්මෙ ඨිතා නරවරබුද්ධභාසිතෙ.[3]

144. ඤත්වානහං විරජපදං අසඞ්ඛතං
තථාගතෙන නධිවරෙන දෙසිතං
තත්ථෙවහං සමථසමාධිමාඵුසිං
සා යෙව මෙ පරමනියාමතා අහු.

145. ලද්ධානහං අමතවරං විසෙසනං
එකංසිකා අභිසමයෙ විසෙසිය
අසංසයා බහුජනපූජිතා අහං
ඛිඩ්ඩාරතිං[4] පච්චනුභොමනප්පකං.

146. එවං අහං අමතදසම්හි දෙවතා
තථාගතස්සනධිවරස්ස සාවිකා
ධම්මද්දසා පඨමඵලෙ පතිට්ඨිතා
සොතාපන්නා න ච පන මත්ථිදුග්ගති.

1. යමාහුනුත්තරා – ස්‍යා.
2. අවෙදිංසු – සීමු. ප.
3. නරවරබුද්ධදෙසිතෙ – මජසං.
4. ඛිඩ්ඩංරතිං – ස්‍යා.

138. දෙවියෝ කැමැති පරිදි කම්සැප මවා ගනිමින් ඇලෙත් ද, කාමසුඛයෙන් අගතැන් පැමිණි තැන් අතුරෙන් යම් දෙව්ලොවක් ශ්‍රෙෂ්ඨ යයි කියත් ද ඒ දෙව්ලොවින් කැමැති රූ දරන අප්සරාවක් වූ මම බුදුරදුන් වඳින්නට මෙහි ආමි.

139. එම්බා දෙව්දුව, තෝ පෙර කවර පිනක් කෙළෙහි ද? අපමණ පිරිවර ඇති සැපෙන් වැඩුණු තෝ කවර පිනෙකින් මෙහි (සැනසී) සිටිනෙහි ද? තිගේ අත්‍යුත්තම වූ ආකාශචාරී වූ දිව්‍යානුභාවය ද වෙයි. තිගේ සිරුරු පැහැය ද දස දිගුන් බබුළවයි.

140. එම්බා දෙව්දුව, තෝ දෙවියන් විසින් පිරිවරන ලද්දී සත්කාර ද කරන ලද්දී වෙහි. කිනම් භවයෙකින් ච්‍යුත වූවා සුගතියට පැමිණියා වෙහි ද? තෝ කිනම් ශාස්තෘවරයකුගේ අවවාදනුශාසනා පිළිගැනීමෙන් වචන කරන්නී වෙහි ද? ඉදින් තෝ බුද්ධශ්‍රාවිකා වූවා නම් මට කියව.

141. (ඉසිගිලි ඈ) පවු අතර මැනැවින් පිහිටුවන ලද උතුම් (රජගහ) නුවර නැටුම් ගැයුම් මැනැවින් පුහුණු වූ මම සිරිමත් (බිම්සර) රජුගේ පරිචාරිකාවක් වීමි. ඒ මා රජගහ නුවර **සිරිමා** යැ යි දනගත්හ.

142. ඍෂි ශ්‍රෙෂ්ඨ වූ විනායක වූ බුදුරජ සමුදය දුඃඛ සත්‍යයන්ගේ අනිත්‍යතාව ද අසංස්කෘත වූ ශාශ්වත දුඃඛනිරොධය වූ නිර්වාණය ද අකුටිල වූ කෙලෙස් නසන ආර්‍ය්‍යමාර්ගය ද මට පැවසී ය.

143. මම උතුම් වූ තථාගතයන් වහන්සේගේ අසංස්කෘත නිර්වාණයට කරුණු වූ සද්ධර්මය අසා නරශ්‍රෙෂ්ඨ වූ බුදුරදුන් විසින් දෙසනලද ප්‍රතිපත්තියෙහි පිහිටියා වූ මම ශීලයෙහි මැනැවින් සංවෘත වූමු.

144. මම උතුම් වූ තථාගතයන් වහන්සේ විසින් දෙනස ලද අසංස්කෘත වූ නිර්වාණ පදය දැන මම ඒ අත්බැව්හි ලොකොත්තර සමාධිය අවබොධ කෙළෙමි. ඒ ලොකොත්තර සමාධි ස්පර්ශය ම මට උතුම් මාර්ග නියාමය විය.

145. මම විශිෂ්ටභාව සාධක වූ උතුම් වූ නිර්වාණය ලැබ සත්‍ය ප්‍රතිවෙධයෙහි විශෙෂයට පැමිණ තුනුරුවන්හි නිසැක වූවා වෙමි. පහවූ සැක ඇති මම බොහෝ දෙනා විසින් පුදන ලදුයෙමි ස්වල්ප නොවූ ක්‍රීඩාරතිය වළඳමි.

146. මෙසේ දෙව්දුවක් වූ මම තථාගතයන් වහන්සේගේ ශ්‍රාවිකාවක් වූවා නිවන දක්නී වෙමි. පළමු පෙලෙහි පිහිටියා වූ සිවුසස් දහම් දක්නා මම සෝවාන් වීමි. මට දුගතියෙක් නැත් ම ය.

147. සා වන්දිතුං අනධිවරං උපාගමිං
පාසාදිකෙ කුසලරතෙ ච භික්ඛවො
නමස්සිතුං සමණසමාගමං සිවං
සගාරවා සිරිමතො ධම්මරාජිනො.

148. දිස්වා මුනිං මුදිතමනම්හි පීණිතා
තථාගතං නරවරදම්මසාරථිං
තණ්හච්ඡිදං කුසලරතං විනායකං
වන්දාමහං පරමහිතානුකම්පකන්ති.

**සිරිමාවිමානං.**

## 1. 17

149. ඉදං විමානං රුචිරං පභස්සරං
වෙළුරියත්ථම්භං සතතං සුනිම්මිතං
සොවණ්ණරුක්ඛෙහි[1] සමන්තමොත්ථතං
ඨානං මමං කම්මවිපාකසම්භවං.

150. තත්‍රූපපන්නා පුරිමච්ඡරා ඉමා
සතං සහස්සානි සකෙන කම්මුනා
තුවංසි අජ්ඣූපගතා යසස්සිනී
ඔභාසයං තිට්ඨසි පුබ්බදෙවතා.

151. සසී අධිග්ගය්හ යථා විරොචති
නක්ඛත්තරාජාරිව තාරකාගණං
තථෙව ත්වං අච්ඡරාසඞ්ගමං[2] ඉමං
දද්දල්ලමානා යසසා විරොචසි.

152. කුතො නු ආගම්ම අනොමදස්සනෙ
උපපන්නා ත්වං භවනං මමං ඉදං
බ්‍රහ්මංව දෙවා තිදසා සහින්දකා
සබ්බෙ න තප්පාමසෙ දස්සනෙන තන්ති.[3]

153. යමෙතං සක්ක අනුපුච්ඡසෙ මමං
කුතො චුතා ත්වං ඉධ ආගතාති[4]
බාරාණසී නාම පුරත්ථි කාසිනං
තත්ථ පුරෙ අහොසිං කෙසකාරිකා.

154. බුද්ධෙ ච ධම්මෙ ච පසන්නමානසා
සඞ්ඝෙ ච එකන්තගතා අසංසයා
අඛණ්ඩසික්ඛාපදා ආගතප්ඵලා
සම්බොධිධම්මෙ නියතා අනාමයාති.

---

1. සුවණ්ණරුක්ඛෙහි – මජසං
2. අච්ඡරාසඞ්ඝනං – මජසං
3. දස්සනාතනන්ති – සී.
4. ආගතා තුවං – ස්‍යා.
කුතො චුතාය ආගතිකච PTS.

147. ගෞරව සහිත වූ ඒ මම බුදුරදුන් වැඳීමට ද පැහැදීම ඇති කරන නිවනෙහි ඇලුණු භික්ෂූන් වැඳීමට ද ශ්‍රීමත් වූ බුදුරජාණන් වහන්සේගේ නිර්භය වූ ශ්‍රමණ සමාගමය (ඇසුරු කිරීමට ද) එළඹියෙමි.

148. නරශ්‍රේෂ්ඨ වූ පුරුෂදම්‍යසාරථි වූ තථාගත වූ බුදුරදුන් දක පිනා ගියා වූ මම සතුටු සිත් ඇත්තී වෙමි. ඒ මම තෘෂ්ණාව සිඳගළ නිවනෙහි ඇලුණු උතුම් වූ හිතයෙන් සත්ත්වයන්ට අනුකම්පා කරන විනායක වූ තථාගතයන් වහන්සේ වඳිමි.

**සිරිමාවිමාන යි.**

## 1. 17

149. මනාව මැවුණු වෛරොඩිමිණිමුවා වැම් ඇති රන්රුකින් හාත්පසින් වැසුණු සියලු කල්හි සිත්කලු වූ පැහැසර වූ මේ විමාන ස්ථානය මාගේ කර්‍ම විපාකයෙන් පහළ වීය.

150. ඒ විමන්හි උපන් මේ ප්‍රථම දිව්‍යාප්සරාවෝ ලක්ෂයක් පමණ වෙති. පිරිවර ඇත්තා වූ තෝ ස්වකීය කර්‍මානුභාවයෙන් මෙහි උපන්නී වෙහි, ඒ ප්‍රථම දිව්‍යාප්සරාවන් බබුළුවමින් සිටිනෙහි.

151. ශසලපින් යුත් සඳු යම් සේ තුරුරැස මැඩගෙන බබළා ද එසේ ම තෝ යසසින් මේ දිවසර මුළුව අතිශයින් බබළවමින් බබළහි.

152. අලාමක දකුම ඇත්තිය, තෝ කොතැනකින් නොහොත් කවර පිනෙකින් අවුත් මාගේ මේ විමන්හි උපනිහි ද? ඉන්ද්‍රයා සහිත වූ තව්තිසා වැයි දෙවියෝ බඹගු දක යම්සේ සෑහීමට නො පැමිණෙත් ද, එසේ ම (අපි) සියලු දෙන තී දැකීමෙන් සෑහීමට නො පැමිණියෙමු.

153. ශක්‍රය, කවර භවයෙකින් ච්‍යුත ව මෙහි ආයෙහි දැ යි යම් ඒ පැනයක් මා අතින් විචාරහි. කසී රට බරණැස් නම් පුරයෙක් ඇත. මම පෙර ඒ නුවර කෙසකාරිකා නම් වීමි.

154. බුදුන් කෙරෙහි ද දහම් කෙරෙහි ද සඟුන් කෙරෙහි ද පහන් සිත් ඇතියා නියතගතික වූවා සැක නැතියා නොකඩ සිකපද ඇත්තී පැමිණි ඵල ඇතියා නිවිනෙහි නියත වූවා නිදුක් වූවා වෙමි.

155. තන්ත්‍යාභිනන්දමසෙ සාගතඤ්ච[1] තෙ
ධම්මෙන ච ත්වං යසසා විරොචසි
බුද්ධෙ ච ධම්මෙ ච පසන්නමානසෙ
සඞ්ඝෙ ච එකන්තගතෙ අසංසයෙ
අඛණ්ඩසික්ඛාපදෙ ආගතප්ඵලෙ
සම්බොධිධම්මෙ නියතෙ අනාමයෙති.

කෙසකාරිවිමානං.

**පීඨවග්ගො පඨමො.**

**තස්සුද්දානං:–**

පඤ්ච පීඨා තයො නාවා දීපතිලදක්ඛිණා ද්වෙ
පති දෙව සුණිසා උත්තරා සිරිමා කෙසකාරිකා
වග්ගො තෙන පවුච්චතීති.

1. ස්වාගතඤ්ච – මජසං.

155. බුදුන් කෙරෙහි ද දහම් කෙරෙහි ද සඟුන් කෙරෙහි ද පහන් සිත් ඇති නියතගතික වූ නිසැක වූ නොකඩ සිකපද ඇති පැමිණිඵල ඇති නිවනෙහි නියත වූ එම්බා දෙව්දුව, තෝ ධර්ම සම්පත්තියෙන් ද පරිවාර සම්පත්තියෙන් ද බබළහි. තිගේ ඒ ද්විවිධ සම්පත්තිය පිළිගනිමු. තිගේ මෙහි පැමිණීම ද මනා පැමිණීමෙකි.

කෙසකාරිවිමාන යි.

## ප්‍රථම පීඨවර්ග යි.

**එහි උද්දානය:—**

පඤ්චපීඨ යැ තයො නාවා යැ දීපතිල දක්ඛිණා දෙක යැ පතිබ්බතා දෙක යැ සුණිසා දෙක යැ උත්තරා යැ සිරිමා යැ කෙසකාරිකා යැ යි එයින් වර්ගය කියනු ලැබේ.

# 2. චිත්තලතාවග්ගො

## 2. 1

156. අපි සක්කො'ව දෙවින්දො රම්මෙ චිත්තලතා වනෙ
සමන්තා අනුපරියාසි නාරීගණපුරක්ඛතා
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

157. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

158. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

159. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

160. අහං මනුස්සෙසු මනුස්සභූතා දසී අහොසිං පරපෙස්සියා කුලෙ
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො
තස්සා මෙ නික්ඛමො ආසි සාසනෙ තස්ස තාදිනො.

161. කාමං භිජ්ජතු'යං කායො නෙව අත්ථෙත්ථ සණ්ඨනං[1]
සික්ඛාපදානං පඤ්චන්නං මග්ගො සොවත්ථිකො සිවො.

162. අකණ්ටකො අගහනො උජු සබ්භි පවෙදිතො
නික්කමස්ස ඵලං පස්ස යථිදං පාපුණිත්ථිකා.

163. ආමන්තනිකා රඤ්ඤොම්හි සක්කස්ස වසවත්තිනො
සට්ඨිතුරියසහස්සානි පටිබොධං කරොන්ති මෙ.

164. ආලම්බො ගග්ගරො[2] භීමො සාධුවාදී ච සංසයො,
පොක්ඛරො ච සුඵස්සො ච වීණාමොක්ඛා ච නාරියො.

165. නන්දා චෙව සුනන්දා ච සොණදින්නා සුචිම්හිතා[3]
අලම්බුසා මිස්සකෙසී ච පුණ්ඩරීකාතිදරුණී.

166. එණිඵස්සා සුඵස්සා ච සුභද්දා මුදුවාදිනී,
එතා චඤ්ඤා ච සෙය්‍යසා[4] අච්ඡරානං පබොධිකා.

---

1. සණ්ඨනං – මජසං.
2. ගග්ගමො – ස්‍යා.
3. සුචිම්හිකා – ස්‍යා.
4. සෙය්‍යාසෙ – සීමු. ප.

# 2. චිත්තලතා වර්ගය

## 2. 1

156. එම්බා දෙව්දුව, තෝ සක්දෙව් රජු මෙන් සිත්කලු සිතුලිය වෙනෙහි දෙවඟනන් විසින් පිරිවරන ලදුව දවහත්තරුව සේ සියලු දිගුන් බබුළුවමින් හාත්පස හැසිරෙහි ද?

157. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

158. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වෙහි ද?

159. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්ති මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මෙසේ පැවැසූ ය.

160. (වහන්ස,) මම (පෙර) මිනිසුන් අතර මිනිස්දුවක් වූවා පරහට මෙහෙ කරන කුලයෙක්හි දාසියක් වීමි. පසැස් ඇති යසස් ඇති ගෞතම බුදුරජුන්ගේ උපාසිකාවක් වීමි. තාදී ගුණ ඇති ඒ බුදුරජුන්ගේ ශාසනයෙහි ඒ මාගේ සම්‍යග්ව්‍යායාමයෙක් විය.

161-162. ඒකාන්තයෙන් මේ කය බිඳේවා. මේ කර්මස්ථානානුයොග-යෙහි වීර්‍ය්‍යයාගේ ලිහිල් බවෙක් නැත් ම යැ. පස් සිකපදයන්ගේ (පිරිපුන් බැවින්) සැපවත් බව සිදු කෙරෙන නිර්භය වූ රාගාදි කටු රහිත කෙලෙස් ලැහැබින් තොර සෘජු වූ බුද්ධාදි සත්පුරුෂයන් විසින් ප්‍රකාශ කරන ලද යම් ආර්‍ය්‍ය මාර්ගයෙක් වේ ද, (දැහිලි නුවණැති) ස්ත්‍රියක් වූ මම යම්බඳු උපායමාර්ගයෙකින් මෙයට පැමිණියෙම් ද, ඒ වීර්‍ය්‍යයාගේ මේ ඵලය බලව.

163. වශවර්ති වූ සක්දෙව් රජහුගේ අල්ලාප සල්ලාපය සඳහා අමතන්-නියක් වීමි. සැට දහසක් තූර්‍ය්‍යයෝ මාගේ ප්‍රීතිය පුබුදුවත්.

164-166. ආලම්බ, ගග්ගර, භීම, සාධුවාදී, සංසය, පොක්ඛර, සුඵස්ස යන දිව්‍ය පුත්‍රයෝ ද, වීණාමොක්ඛා, නන්ද, සුනන්ද, සොණදින්නා, සුචිම්හිතා, අලම්බුසා, මිස්සකෙසි, පුණ්ඩරීකා, අතිදරුණි, එණිඵස්සා, සුඵස්සා, සුභද්ද, මුදුවාදිනී යන මේ දෙවඟනෝ ද, අප්සරාවන් අතුරෙන් සංගීතයෙහි ඉතා පැසසිය යුතු වූ පුබුදු කරවන මෙයින් අන්‍ය වූ අප්සරාවෝ ද වෙති.

167. කාමං කාලෙනුපාගන්ත්වා අභිභාසන්ති දෙවතා,
හන්ද නච්චාම ගායාම හන්ද තං රමයාමසෙ.

168. නයිදං අකතපුඤ්ඤානං කතපුඤ්ඤානමෙවිදං
අසොකං නන්දනං රම්මං තිදසානං මහාවනං.

169. සුඛං අකතපුඤ්ඤානං ඉධ නත්ථි පරත්ථ ච,
සුඛඤ්ච කතපුඤ්ඤානං ඉධ චෙව පරත්ථ ච.

170. තෙසං සහව්‍යකාමානං කත්තබ්බං කුසලං බහුං
කතපුඤ්ඤා හි මොදන්ති සග්ගෙ භොගසමඞ්ගිනොති.

දසිවිමානං.

## 2. 2

171. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

172. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

173. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

174. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

175. කෙවට්ටද්වාරා නික්ඛම්ම අහු මය්හං නිවෙසනං,
තත්ථ සඤ්චරමානානං සාවකානං මහෙසිනං.

176. ඔදනං කුම්මාසං සාකං[1] ලොණසොවීරකඤ්චහං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

177. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං

178. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං

1. ඩාකං මජසං.

167. ඒ දෙවනාවෝ සුදුසු කාලයෙහි මා වෙත එළඹ "දැන් නටමු ගයමු දැන් නී සතුටු කරවමු"යි ඉදිරියට පැමිණ කියත්.

168. (මා විසින් ලැබූ) මේ දෙව් විමන පින් නො කළවුන්ට නො ලැබේ. සොක නැති තව්තිසාවැසි දෙවියන්ගේ රම්‍ය වූ මේ නන්දන මහාවනය පින් කළවුන්ට ම ලැබේ.

169. පින් නො කළවුන්ට මෙලොව් හා පරලොව සැපයෙක් නැත. පින් කළවුන්ට ම මෙලොව හා පරලොව සැප ලැබේ.

170. ඒ තව්තිසාවැසි දෙවියන් හා සහභාවයට යනු කැමැත්තන් විසින් බොහෝ කුසල් කළයුතු වේ. කළ පිනැත්තෝ ම සඬගියෙහි පස්කම් සැපතින් යුක්ත වූවාහු සතුටු වෙත්.

**දසිවිමාන යි.**

## 2. 2

171. එම්බා දෙව්දුව යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි?

172. කවර හෙතුවකින් නිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්හු වෙත් ද, ඒ සම්පත්හු (කවර පිනෙකින්) නිට පහළ වෙත් ද?

173. මහත් අනුභාව ඇති දෙවිදුව, නී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

174. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මෙසේ පැවැසූ ය.

175–176 (බරණැස) කෙවුල් ගම්දෙරින් නික්මෙන තැන මාගේ නිවාසය වී ය. එහි පිඬු පිණිස හැසිරෙන මහර්ෂීන්ගේ සවුවනට බත් ද කොමු පිඩු ද ඵලාකොළ (එළවලු) ද ලොණසොවීරකය ද සෘජු සිතැත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් පිදීමි.

177–8. මම පක්ෂය පිළිබඳ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය පක්ෂය ද (යන පොහෝදිනයන්හි) අටඟින් යුත් පෙහෙවස් විසීමි. සියලු කල්හි නිති සිල්හි කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනා කොට බෙද දෙන්නී ගෙහි විසීමි.

179. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා

180. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො

181. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

182. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

මම ච භන්තෙ වචනෙන භගවතො පාදෙ සිරසා වන්දෙය්‍යාසි, **ලඛුමා** නාම භන්තෙ උපාසිකා භගවතො පාදෙ සිරසා වන්දතීති. අනච්ඡරියං ඛො පනෙතං භන්තෙ යං මං භගවා අඤ්ඤතරස්මිං සාමඤ්ඤඵලෙ ව්‍යාකරෙය්‍ය තං භගවා සකදාගාමිඵලෙ ව්‍යාකාසීති.

ලඛුමාවිමානං.

## 2. 3

183. පිණ්ඩාය තෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දලිද්දා කපණා නාරී පරාගාරං අවස්සිතා[1]

184. යා තෙ අදාසි ආචාමං පසන්නා සෙහි පාණිහි,
සා හිත්වා මානුසං දෙහං කන්නු සා දිසතං ගතා

185. පිණ්ඩාය මෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දලිද්දා කපණා නාරී පරාගාරං අවස්සිතා

186. යා මෙ අදාසි ආචාමං පසන්නා සෙහි පාණිහි,
සා හිත්වා මානුසං දෙහං විප්පමුත්තා ඉතො චුතා

187. නිම්මාණරතිනො නාම සන්ති දෙවා මහිද්ධිකා,
තත්ථ සා සුඛිතා නාරී මොදතාචාමදායිකාති

188. අහො දානං වරාකියා කස්සපෙ සුපතිට්ඨිතං,
පරාභතෙන දානෙන ඉජ්ඣිත්ථ වත දක්ඛිණා

189. යා මහෙසිත්තං කාරෙය්‍ය චක්කවත්තිස්ස රාජිනො
නාරී සබ්බඞ්ගකල්‍යාණී භත්තු චානොමදස්සිකා
එකස්සාචාමදානස්ස කලං නාග්ඝති සොළසිං.

1. අපස්සිතා-මජසං

179. (එකල්හි මම) පණිවායෙන් දුරු වීමි. මුසවායෙන් සංයත වීමි. අයිනාදනින් ද මිසගසරින් ද රහමෙර පීමෙන් ද දුරු වීමි.

180. පස් සිකපද රැක්මෙහි ඇලුණු චතුරායසීසත්‍යයෙහි දක්ෂ වූ මම යසස් ඇති පසැය් ඇති ගෞතම බුදුරදුන්ගේ උපාසිකාවක් විමි.

181. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

182. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

වහන්ස, ලඛුමා නම් උපාසිකා තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මස්තකයෙන් වඳී. වහන්ස, මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මස්තකයෙන් වඳිනු මැනැවි. වහන්ස, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ මා එක්තරා මාර්ගඵලයෙක්හි ලා වදරන සේක් නම් එය පුදුමයෙක් නො වේ. භාග්‍යවතුන් වහන්සේ ඒ මා සකෘදගාමී ඵලයෙහි ලා ප්‍රකාශ කළසේක.

ලඛුමාවිමාන යි.

## 2. 3

183–4. වහන්ස, පිඬු පිණිස හැසිරෙන්නා වූ ඔබ නිහඬව සිටිය දී මෙරමා ගෙය ඇසුරු කළ දිළිඳු වූ දීන වූ යම් ස්ත්‍රියක් පහන් වූවා සියතින් ඔබ වහන්සේට දඹුබතක් පිදි ද ඕ තොමෝ මිනිස්සිරුර හැර (උපත් විසින්) කිනම් දිශාවකට ගියා ද?

185–6. (සක්දෙව් රජුනි,) නිහඬ ව මා පිඬු පිණිස හැසිරෙමින් සිටිය දී මෙරමා ගෙය ඇසුරු කළ දිළිඳු වූ දීන වූ යම් ස්ත්‍රියක් පහන් වූවා සියතින් මට දඹුබතක් පිදීද, ඕ තොමෝ මිනිස්සිරුර හැර මිනිස් දුබග බැවින් මිදුණී මෙයින් ච්‍යුත වූවා ය.

187. මහත් සෘද්ධි ඇති නිර්මාණරති නම් දෙවි කෙනෙක් ඇත. දඹුබත් දුන් ඒ ස්ත්‍රී තොමෝ ඔවුනතර සුවපත් වූවා සතුටු වෙයි.

188. මහසුප් තෙරුන් කෙරෙහි පිහිටුවන ලද ඒ දීන වූ ස්ත්‍රියගේ දනය අනේ පුදුමයි. සිහිමෙන් මෙරමා ගෙයින් ගෙනෙනලද දියයුතු දෙයින් දක්ෂිණාව සමෘද්ධ වූවා ය. පුදුමයි.

189. සියලු අඟපසඟින් සොබනා වූ සැමියාට ලමු නො වූ දකුම් ඇති යම් ස්ත්‍රියක් තොමෝ සක්විති රජක්හට අගමෙහෙසිබව කරන්නී ද, මෙ දඹුබත් දනඵලයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවටත් එය නො අගී.

190. සතං නික්ඛා සතං අස්සා සතං අස්සතරීරථා
සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එතස්සාචාමදනස්ස කලං නාග්ඝන්ති සොළසිං

191. සතං හෙමවතා නාගා ඊසා දන්තා උරූළ්හවා
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා[1]
එතස්සාචාමදනස්ස කලං නාග්ඝන්ති සොළසිං

192. චතුන්නම්පි[2]ච දීපානං ඉස්සරං යොධ කාරයෙ,
එතස්සාචාමදනස්ස කලං නාග්ඝති සොළසින්ති

**ආචාමදයිකාවිමානං.**

## 2. 4

193. චණ්ඩාලි වන්ද පාදනි ගොතමස්ස යසස්සිනො,
තවෙව[3] අනුකම්පාය අට්ඨාසි ඉසිසත්තමො[4]

194. අභිප්පසාදෙහි මනං අරහන්තම්හි තාදිනි[5],
ඛිප්පං පඤ්ජලිකා වන්ද පරිත්තං තව ජීවිතන්ති

195. චොදිතා භාවිතත්තෙන සරීරන්තිමධාරිනා,
චණ්ඩාලි වන්දි පාදනි ගොතමස්ස යසස්සිනො

196. තමෙනමවධී ගාවී චණ්ඩාලිං පඤ්ජලිං ඨිතං,
නමස්සමානං සම්බුද්ධං අන්ධකාරෙ පභඞ්කරන්ති

197. ඛීණාසවං විගතරජං අනෙජං
එකං අරඤ්ඤම්හි රහො නිසින්නං
දෙවිද්ධිපත්තා උපසඞ්කමිත්වා
වන්දාමි තං වීර මහානුභාවාති[6]

198. සුවණ්ණවණ්ණා ජලිතා මහායසා
විමානමොරුය්හ අනෙකචිත්තා
පරිවාරිතා අච්ඡරානං ගණෙන[7]
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමන්ති.

---

1. හෙමකප්පනිවාසසා – ස්‍යා,
2. චතුන්නම්පි – මජ්සං.
3. තමෙව – මජ්සං.
4. ඉසිසුත්තමො – සීමු.
5. තාදිනෙ, – ස්‍යා,
6. මහානුභාවනති – මජ්සං, කත්ථචි
7. අච්ඡරාසංගණෙන – මජ්සං.

190. සියක් දහසක් රන් නික ද සියක් දහසක් අස්සු ද සියක් දහසක් අස්වෙළෙඹුන් යෙදූ රිය ද පැළැඳි මිණි කොඩොල් ඇති සියක් දහසක් කන්‍යාවෝ ද මේ දමුබත් දනඵලයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවකුදු නො අගිත්.

191. ශ්‍රේෂ්ඨ වූ රියහිස් වැනි දළ ඇති ථාමජව පරාක්‍රමයෙන් වැඩෙන රුවන්මුවා ගෙළබරණින් සැරැසූ රන් එබූ ඇත්අබරණින් හොබන සියයක් හෙමවත ඇත්හු මෙ දමුබත් දනඵලයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවකුදු නො අගිත්.

192. මෙලොව යමෙක් සිවුමහදිවයිනට අධිපති සක්විති රජබව කෙරේ ද, එය මේ දමුබත් දනඵලයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවකුදු නො අගී.

ආචාමදායිකාවිමාන යි.

## 2. 4

193. එම්බා සැඬොලිය, යසස් ඇති ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාදයන් වඳුව. ශෛක්ෂ-අශෛක්ෂ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ සෘෂිනට වඩා උතුම් වූ නොහොත් විපස්සී ආදී බුදුවරයන් අතර සත්වැනි වූ සෘෂි ශ්‍රේෂ්ඨයන් වහන්සේ තිට අනුකම්පා පිණිස ම මෙහි වැඩ සිටීසේක.

194. තාදී වූ රහතුන් වහන්සේ කෙරෙහි සිත පහදුව බඳැඳිලි ඇත්ති වහා වඳුව, තීගේ ජීවිතය ඉතා ස්වල්ප ය.

195. පැසුළු සිරුරු දරන වැඩූ සිතැත්තහු විසින් මෙහෙයන ලද සැඬොලී යසස් ඇති ගෞතම බුදුරදුන්ගේ පා වැන්ද ය.

196. ගවදෙනක් නොමෝ අවිද්‍යාන්ධකාරයෙන් අඳුරු වූ ලොකයෙහි නැණලු දෙන බුදුරජුන් බඳැඳිලි ව වඳිමින් සිටි ඒ සැඬොලිය ඇණ මැරුවා ය.

197. වීරයන් වහන්ස, දිව්‍යර්ධියට පැමිණි මම මහත් අනුභාව ඇති ක්ෂය කළ ආසවයන් ඇති පහවූ කෙලෙස් රජස් ඇති තෘෂ්ණා රහිත වෙනෙහි එකලාව විවේකී ව වැඩහුන් ඔබ වහන්සේ වඳිමි.

198. සොඳුරු දෙව්දුව, රන්වන් පැහැ ඇති සිය සිරුරුපැහැයෙන් දිලෙන පිරිවර ඇති නොයෙක් ලෙසින් විසිතුරු වූ දිව්සරන් විසින් පිරිවරනු ලැබූ කිනම් දෙවඟනක් වූ තෝ විමනෙන් බැස මා වඳනෙහි ද?

199. අහං භදන්තෙ[1] චණ්ඩාලි තයා වීරෙන පෙසිතා,
වන්දිං අරහතො පාදෙ ගොතමස්ස යසස්සිනො

200. සාහං වන්දිත්ව[2] පාදානි චුතා චණ්ඩාලයොනියා,
විමානං සබ්බතො භද්දං උපපන්නම්හි නන්දනං[3]

201. අච්ඡරානං සතසහස්සං පුරක්ඛත්වාන[4] තිට්ඨති,
තාසාහං පවරා සෙට්ඨා වණ්ණෙන යසසා යුතා.

202. පහූතකතකල්‍යාණා සම්පජානා පතිස්සතා,
මුනිං කාරුණිකං ලොකෙ තං භන්තෙ වන්දිතුමාගතාති.

203. ඉදං වත්වාන චණ්ඩාලී කතඤ්ඤූ කතවෙදිනී,
වන්දිත්වා අරහතො පාදෙ තත්ථෙවන්තරධායථාති.[5]

චණ්ඩාලිවිමානං.

## 2. 5

204. නීලා පීතා ච කාළා ච මඤ්ජෙට්ඨා[6] අථ ලොහිතා,
උච්චාවචානං වණ්ණානං කිඤ්ජක්ඛපරිවාරිතා.

205. මන්දාරවානං පුප්ඵානං මාලං ධාරෙසි මුද්ධනි,
නයිමෙ අඤ්ඤෙසු කායෙසු රුක්ඛා සන්ති සුමෙධසෙ.

206. කෙන කායං උපපන්නා තාවතිංසං යසස්සිනී,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵල'න්ති

207. භද්දිත්ථිති[7] මං අඤ්ඤිංසු කිම්බිලායං උපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

208. අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා

209. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

210. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං.

---

1. භද්දන්තෙ – මජසං.
2. වන්දිත්වා – මජසං.
3. නන්දනෙ – මජසං
4. පුරක්ඛිත්වා – ස්‍යා,
5. තත්ථෙවන්තරධායතීති – ස්‍යා,
6. මඤ්ජිට්ඨා – මජසං.
මඤ්ජට්ඨා – PTS
7. භද්දිත්ථිකාති මං අඤ්ඤංසු – මජසං.

199. පින්වතුන් වහන්ස, වීර වූ ඔබ වහන්සේ විසින් මෙහෙයන ලද සැඬොලියක් වූ මම යසස් ඇති රහත් වූ ගෞතම බුදුරදුන්ගේ පා වැන්දෙමි.

200. ඒ මම බුදුරදුන්ගේ පා වැඳ සැඬොල් බවෙන් ච්‍යුත ව නඳුන් වෙනෙහි හැමලෙසින් සොඳුරු වූ විමනෙක උපන්නි වෙමි.

201. දෙවසරන් සිය දහසෙක් මා පෙරටු කොට සිටී. ඔවුනතුරෙන් මම වර්ණයෙන් යසසින් හා ආයුෂයෙන් ද ඒ දිවසරනට වඩා උතුම් වෙමි, ශ්‍රේෂ්ඨ වෙමි.

202. වහන්ස, බොහෝ කළ පින් ඇති මනා නුවණැති මනා සිහි ඇති මම ලොකයෙහි මහාකාරුණික වූ ඒ බුදුරදුන් වැඳීම සඳහා පැමිණියා වෙමි.

203. කෘතඥ වූ කෘතවෙදිනී වූ ඒ සැඬොල් දෙවඟන මෙය කියා අරහත් වූ මුගලන් මහතෙරුන්ගේ පා වැඳ එහි ම අතුරුදහන් වූවා ය.

**චණ්ඩාලිවිමාන යි.**

## 2. 5

204–5. මනා නුවණැති දෙව්දුව, නිලාදී නන් වැදෑරුම් පැහැ ඇති කෙසුරින් පිරිවැරුණු මදරා මල්දමක් (තෝ) හිසෙහි දරහි. නිල්වන් වූ ද රන්වන් වූ ද කළුවන් වූ ද මදටියවන් වූ ද ලේවන් වූ ද සෙසු සුදුවන් ඈ පැහැ ඇත්තා වූ ද මේ වෘක්ෂයෝ අන්‍ය දිව්‍යනිකායයන්හි නො වෙත්.

206. යසස් ඇති දෙව්දුව, (තෝ) කවර පිනෙකින් මේ තව්තිසා දෙව්ලොවැ උපනෙහි ද? විචාරන ලද්දී වූ තෝ මෙ විපාකය කිනම් කර්‍මයක්හුගේ ද යි කියව.

207. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන්දීමෙහි ඇලුණු මම කිම්බිලනුවර උපාසිකාවක් වීමි. එසේ වූ මා **භද්දිත්ථි** යයි අන්‍යයෝ දත්හ.

208. (එකල මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් හා පහන් ද සෘජුගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දුනිමි.

209–10. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන පොහෝ දිනයන්හි අටඟින් යුත් පෙහෙවස් විසීමි. හැම කල්හි නිති සිල්හි ද කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනා කොට බෙදා දෙන්නී ගෙහි විසීමි.

211. පාණාතිපාතා විරතා මුසාවාද ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

212. පඤ්ච සික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිද,
උපාසිකා චක්ඛුමතො අප්පමාදවිහාරිණී.

213. භික්ඛූ චහං පරමහිතානුකම්පකෙ
අභොජයං තපස්සියුගං මහාමුනිං
කතාවාසා කතකුසලා තතො චුතා
සයංපභා අනුවිචරාමි නන්දනං.

214. අට්ඨඞ්ගිකං අපරිමිතං සුඛාවහං
උපොසථං සතතමුපාවසිං අහං
කතාවාසා කතකුසලා තතො චුතා
සයංපභා අනුවිචරාමි නන්දනන්ති.

**භද්දිත්ථිවිමානං.**

## 2. 6

215. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

216. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

217. කෙන ත්වං විමලොභාසා අතිරොචසි දෙවතෙ,
කෙන තෙ සබ්බගත්තෙහි සබ්බා ඔභාසරෙ දිසා.

218. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති.

219. *සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්සකම්මස්සිදං ඵලං.

* නාගතාප්‍යයං ගාථා සීහලක්ඛරවිමානවත්ථුම්හි, තස්සං අට්ඨකථායං ආගතා, තස්මා සා ඉධ පක්ඛිත්තා.

211. (එකල්හි) මම පණිවායෙන් දුරු වීමි. මුසවායෙන් සංවෘත වීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පිමෙන් ද දුරු වීමි.

212. පස් සිකපද රැක්මෙහි ඇලුණු චතුරාය්‍ය්‍යසත්‍යයෙහි දක්ෂ වූ අප්‍රමාද විහරණ ඇත්තා වූ මම පසැස් ඇති බුදුරදුන්ගේ උපාසිකාවක් වීමි.

213. මම බිඳහළ සියලු කෙලෙස් ඇති ඉතා උතුම් වූ හිතානුකම්පා ඇති මහා නුවණැති අගසවු දෙනම මනා කොට වැළඳවීමි. කරන ලද සුචරිතාවාස ඇති කරන ලද කුසල් ඇති ඒ මම එයින් ච්‍යුත ව සිය සිරුරු රැසින් බබළන්නී නඳුනුයනෙහි එක්වන් හැසිරෙමි.

214. මම නිතර අපරිමිත සැප එළවන අටඟින් යුත් පෙහෙවස් විසීමි. කරන ලද සුචරිතාවාස ඇති කරන ලද කුසල් ඇති ඒ මම එයින් ච්‍යුත ව සිය සිරුරු රැසින් බබළන්නී නඳුනුයනෙහි එක්වන් හැසිරෙමි.

**භද්දිත්ථිවිමාන යි.**

## 2. 6

215. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

216. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

217. එම්බා දෙව්දුව, නිර්මල ශරීරාලොකයක් ඇති තෝ කවර පිනෙකින් (අන් හැම සුරන් මැඩ) බබළන්නෙහි ද? කවර පිනෙකින් තිගේ සියලු ශරීරාවයවයන්ගෙන් සියලු දිශාවෝ බබළත් ද?

218. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

219. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටු සිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දෑ යි මෙසේ පැවසූ ය.

220. සොණදින්නාති මං අඤ්ඤිංසු[1] නාලන්දායං උපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

221. අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා

222. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

223. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං.

224. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා;
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

225. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

226. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

227. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති.

**සොණදින්නා විමානං.**

## 2. 7

228. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

229. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

230. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති.

231. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1. අඤ්ඤංසු, - මජසං.

220. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන් දීමෙහි ඇලුණු (මම) නාලන්දවෙහි උපාසිකාවක් වීමි. එසේ වූ මා සොණදින්නා යයි (අන්‍යයෝ) දත්හ.

221. (එකල මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් හා පහන් ද ඍජු ගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දුනිමි.

222–23. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන පොහෝදිනයන්හි පෙහෙවස් විසීමි. හැම කල්හි නිති සිල්හි කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනා කොට බෙදා දෙන්නී ගෙහි විසීමි.

224. එකල්හි මම පණිවායෙන් දුරු වීමි. මුසවායෙන් සංයත වීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පීමෙන් ද දුරු වීමි.

225. පස් සිකපද රක්මෙහි ඇලුණු චතුරාර්‍ය්‍යසත්‍යයෙහි දක්ෂ වූ මම යසස් ඇති පසැස් ඇති ගෞතම බුදුරදුන්ගේ උපාසිකාවක් වීමි.

226. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

227. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**සොණදින්නාවිමාන යි.**

## 2. 7

228. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රූසිරින් සියලු දිගුන් බබුළුවමින් අවහත් තරුව සේ සිටිනෙහි.

229. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

230. මහත් අනුභාව ඇති දෙව්දුව, ති විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

231. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හු ගේ දැයි මෙසේ පැවසූ ය.

232. උපොසථාති මං අඤ්ඤිංසු සාකෙතායං උපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

233. අච්ඡාදනං ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

234. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

235. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං.

236. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

237. පඤ්ච සික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

238. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

239. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

240. අභික්ඛණං නන්දනං සුත්වා ඡන්දො මෙ උදපජ්ජථ[1]
තත්ථ චිත්තං පණිධාය උපපන්නම්හි නන්දනං.

241. නාකාසිං සත්ථුවචනං බුද්ධස්සාදිච්චබන්ධුනො,
හීනෙ චිත්තං පණිධාය සාම්හි පච්ඡානුතාපිනීති.

242. කීව චිරං විමානස්මිං ඉධ වච්ඡසුපොසථෙ,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ යදි ජානාසි ආයුනොති.

243. සට්ඨිවස්සසහස්සානි තිස්සො ච වස්සකොටියො
ඉධ ඨත්වා මහාමුනි ඉතො චුතා ගමිස්සාමි
මනුස්සානං සහව්‍යතන්ති.

244. මා ත්වං උපොසථෙ භායි සම්බුද්ධෙනාසි ව්‍යාකතා
සොතාපන්නා විසෙසයි පහීනා තව දුග්ගතීති.

උපොසථා විමානං.

---

1. උපපජ්ජථ-සීමු, ප. උපපජ්ජති - කත්ථචි

232. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන්දීමෙහි ඇලුණු (මම) සාකෙත නුවර උපාසිකාවක් වීමි. (අන්‍යයෝ) මා **උපොසථා** යැ යි දත්හ.

233. (එකල මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් හා පහන් තෙල් ද ඍජුගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දිනිමි.

234–235. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන පොහෝ දිනයන්හි අටඟින් යුත් පෙහෙවස් විසීමි. හැම කල්හි නිති සිල්හි ද කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනා කොට බෙදා දෙන්නී ගෙහි විසීමි.

236. (එකල්හි මම) පණිවායෙන් දුරු වීමි, මුසවායෙන් සංයත වීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පීමෙන් ද දුරු වීමි.

237. පස් සිකපද රැකීමෙහි ඇලුණු චතුරාර්‍ය්‍යසත්‍යයෙහි දක්ෂ වූ මම යශස් ඇති පසැස් ඇති ගෞතම බුදුරදුන්ගේ උපාසිකාවක් වීමි.

238. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත් මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

239. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

240. නිතර නඳුනුයන ගැන අසා (එහි උපත පිණිස) ඡන්දය උපන. එහි සිත පිහිටුවා නඳුනුයනෙහි උපන්නී වෙමි.

241. ශාස්තෘ වූ සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන්ගේ වචනය නො කෙළෙමි. ඒ මම හීන වූ භව සැපතෙහි සිත පිහිටුවා පසුතැවිලි වූවා වෙමි.

242. එම්බා උපොසථා දෙව්දුව, මෙ විමනෙහි කොපමණ දිගුකලක් වසහි ද? විචාරන ලද්දීවූ තී ඉදින් ආයුෂය දන්නෙහි නම් එය කියව.

243. මහාමුනිවරය, තුන් කෙළ සැටදහසක් හවුරුදු මෙහි සිට මෙයින් ච්‍යුත ව මිනිසුන්ගේ සහභාවයට යන්නෙමි.

244. එම්බා උපොසථාව, තෝ නො බව. සෝවන් වූ තෝ මාර්ගඵල සංඛ්‍යාත විශෙෂයට පැමිණියා යයි සම්බුදුරදුන් විසින් ප්‍රකාශ කරන ලද්දී වෙහි. තිගේ දුගතිය ප්‍රහීණ විය.

**උපොසථා විමාන යි.**

## 2. 8

245. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

246. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

247. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

248. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

249. සද්ධාති මං අඤ්ඤාසිංසු රාජගහස්මිං උපාසිකා,
සද්ධාසීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

250. අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

251. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

252. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං.

253. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

254. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

255. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

256. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

සද්ධාවිමානං.[1]

1. නිද්දවිමානං – මජසං.

## 2. 8

245. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රූසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

246. කවර හෙ වකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

247. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

248. මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මෙසේ පැවැසූ ය.

249. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන්දීමෙහි ඇලුණු (මම) රජගහනුවර උපාසිකාවක් වීමි. (අන්‍යයෝ) මා **සද්ධා** යැ යි දත්හ.

250. (එකල මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් හා පහන්තෙල් ද ඍජුගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දුනිමි.

251–252. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන පොහෝ දිනයන්හි අටඟින් යුත් පෙහෙවස් විසීමි. හැම කල්හි නිති සිල්හි ද කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනා කොට බෙදා දෙන්නී ගෙහි විසීමි.

253. (එකල්හි මම) පණිවායෙන් දුරු වීමි. මුසවායෙන් ද සංයත වීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පීමෙන් ද දුරු වීමි.

254. පස්සිකපද රක්මෙහි ඇලුණු චතුරාර්‍ය්‍යසත්‍යයෙහි දක්ෂ වූ මම යසස් ඇති පසැස් ඇති ගෞතම බුදුරදුන්ගේ උපාසිකාවක් වීමි.

255. එම පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

256. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇතියා වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**සද්ධා විමාන යි.**

## 2. 9

257. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

258. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

295. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

260. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

261. සුනන්දාති මං අඤ්ඤිංසු[1] රාජගහස්මිං උපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

262. අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

263. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

264. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං.

265. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

266. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

267. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

268. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**සුනන්දා විමානං[2].**

1. සුනිද්දති මං අඤ්ඤංසු – මජසං.
2. සුනිද්දා විමානං – මජසං.

## 2. 9

257. එම්බා දෙව්දුව යම්බඳු වූ තෝ මනා රූසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

258. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

259. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද, තිගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

260. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හු ගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටුසිත් ඇත්තී මෙසේ පැවැසූ ය.

261. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන්දීමෙහි ඇලුණු (මම) රජගහනුවර උපාසිකාවක් වීමි. (අන්‍යයෝ) මා **සුනන්‍ද** යැ යි දත්හ.

262. (එකල මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් හා පහන්තෙල් ද සෘජුගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දුනිමි.

263–264. මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන පොහෝ දිනයන්හි අටඟින් යුත් පෙහෙවස් විසීමි. හැම කල්හි නිති සිල්හි ද කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා මනාකොට බෙදා දෙන්නී ගෙහි විසීමි.

265. (එකල්හි මම) පණිවායෙන් දුරු වීමි. මුසවායෙන් ද සංයත වීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පීමෙන් ද දුරු වීමි.

266. පස් සිකපද රැක්මෙහි ඇලුණු චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි දක්ෂ වූ (මම) යසස් ඇති පසැස් ඇති ගෞතම බුදුරදුන් ගේ උපාසිකාවක් වීමි.

267. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

268. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලිසෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**සුනන්ද විමාන යි.**

## 2. 10

269. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

270. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

271. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

272. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

273. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
අද්දසං විරජං බුද්ධං විප්පසන්නමනාවිලං
තස්ස අදාසහං භික්ඛං පසන්නා සෙහි පාණිහි

274. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

275. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**භික්ඛාදායිකා විමානං.**

## 2. 11

276. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා

277. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

278. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

## 2. 10

269. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

270. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

271. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

272. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ ද යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දු තොමෝ තුටු සිත් ඇත්තී මෙසේ පැවැසූ ය.

273. මම පෙර අත්බැව්හි මිනිස්ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූවා වෙමි. (එකල මම) පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නො කැළඹුණු සිත් ඇති බුදුන් දිටිමි. මම ඒ බුදුරජාණන් වහන්සේට පහන් වූවා සියතින් භික්ෂාව දුනිමි.

274. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

275. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**භික්ඛාදයිකා විමාන යි.**

## 2. 11

276. එම්බා දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි.

277. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

278. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද, තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

279. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

280. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං
තස්ස අදසහං භික්ඛං පසන්නා සෙහි පාණිභි.

281. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

282. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතියභික්ඛාදයිකා විමානං.

## චිත්තලතාවග්ගො දුතියො.

තස්සුද්දානං :

දසී චෙව ලඛුමා ච අථ ආචාමදයිකා
චණ්ඩාලී භද්දිත්ථී චෙව[1] සොණදින්නා උපොසථා
නන්ද චෙව සුනන්ද ච[2] දෙව ච භික්ඛාය දයිකා
වග්ගො තෙන පවුච්චතීති.

භාණවාරං පඨමං.

1. භද්දිත්ථිකා ච – ස්‍යා
2. නිද්දචෙව සුනිද්ද ච – මජසං.

279. මේ පුණ්‍යඵලය කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මෙසේ පැවැසූ ය.

280. මම පෙර අත්බැව්හි මිනිස් ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූවා පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නො කැළඹුණු සිත් ඇති රහත් නමක් දිටිමි. මම උන් වහන්සේට පහන් වූවා සියතින් භික්ෂාව දුනිමි.

281. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

282. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවා යයි.

**දුතියභික්ඛාදයිකා විමාන යි.**

## දෙවෙනි චිත්තලතා වර්ග යි.

**එහි උද්දානය:**

දසී යැ, ලඛුමා යැ, ආචාමදයිකා යැ, චණ්ඩාලි යැ, භද්දිත්ථී යැ, සොණදින්නා යැ, උපොසථා යැ, නන්ද යැ, සුනන්ද යැ, භික්ඛදයිකා දෙක යැ යන මෙයින් වර්ගය කියනු ලැබේ.

**පළමුවන බණවර යි.**

# 3. පාරිච්ඡත්තකවග්ගො

## 3. 1

283. උළාරො තෙ යසො වණ්ණො සබ්බා ඔභාසතෙ දිසා,
නාරියො නච්චන්ති ගායන්ති දෙවපුත්තා අලඞ්කතා.

284. මොදෙන්ති පරිවාරෙන්ති තව පූජාය දෙවතෙ,
සොවණ්ණානි විමානානි තවිමානි සුදස්සනෙ.

285. තුවංසි ඉස්සරා තෙසං සබ්බකාමසමිද්ධිනී,
අභිජාතා මහන්තාසි දෙවකායෙ පමොදසි,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

286. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

287. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ,
මනුස්සලොකෙ කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා,
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

288. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

289. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
දුස්සීලකුලෙ සුණිසා අහොසිං
අස්සද්ධෙසු කදරියෙසු අහං.

290. සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා,
පිණ්ඩාය චරමානස්ස අපූවං තෙ අදාසහං.

291. තදහං සස්සුයාචික්ඛිං සමණො ආගතො ඉධ,
තස්ස අදාසහං පූවං පසන්නා සෙහි පාණිභි.

292. ඉති සා සස්සු පරිභාසි අවිනීතා[1] තුවං වධූ,
න මං සම්පුච්ඡිතුං ඉච්ඡි සමණස්ස දදාමහං.

293. තතො මෙ සස්සු කුපිතා පහාසි මුසලෙන මං,
කූටඞ්ගච්ඡි අවධි මං නාසක්ඛිං ජීවිතුං චිරං

1. අවිනීතාසි ත්වං – මජසං.

# 3. පාරිච්ඡත්තකවර්ගය

## 3. 1

283–284. (එම්බා) දෙව්දුව, තිගේ පිරිවර මහත් ය. උදර වූ සිරුරු පැහැය සියලු දිගුන් බබුළුවයි. දිවබරණින් සැරසුණු දිව්‍යස්ත්‍රීහු ද දිව්‍ය පුත්‍රයෝ ද තිට පුද පිණිස නටති. ගයති. (තී) සතුටු කරවති. (තී) පිරිවරා සිටිත්. මනා දකුම් ඇත්තිය, තිගේ මේ විමානයෝ රන්මුවා වූහ.

285. සියලු පස්කම් ගුණයෙන් සමෘද්ධ වූ තී ඔවුනට අධිපති වෙහි. මනාකොට උපත් තී මහත් අනුභාව ඇත්ති වෙහි. මේ දිව්‍යනිකායෙහි ප්‍රමුදිත වෙහි. (එම්බා) දෙව්දුව, විචාරනලද්ද වූ තී මෙ විපාකය කිනම් කර්මයක්හුගේ දැ යි කියව.

286. කවර හෙතුවකින් තිට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

287. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් ලො වැ කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්ති වෙහි ද?

288. මේ පුණ්‍යඵලය කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී (මෙසේ) පැවැසූ ය.

289. මම පෙර අත්බැව්හි මිනිස්ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වීමි. මම සැදැහැ නැති තද මසුරු බැව් ඇතියන් අතර දුසිල් කුලයෙක ලෙහෙළියක් වීමි.

290. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුක්ත වූ නිතර දන්දීමෙහි ඇලුණු (මම) පිඩු පිණිස හැසිරෙන මුබ වහන්සේට කබලුපූවක් පිදුවෙමි.

291. එකල් හි මම "ශ්‍රමණයන් වහන්සේ නමක් මෙහි වැඩිසේක, පහත් වූ මම උන්වහන්සේට සියතින් පූවක් පිදුවෙමි යි" නැන්දණියට කීයෙමි.

292. ඒ නැන්දණියෝ "තෝ අවිනීත ස්ත්‍රියක, 'මම මහණහට (කබලුපූ) දෙමැ'යි මා විචාරන්නට නොකැමැති වූ" යයි මට පරිභව කළහ.

293. ඉක්බිති කිපියා වූ මාගේ නැන්දණියෝ මට මොහොලින් පහර දුන්හ. උරහිස සිඳලූහ. මා නසාලූහ. කලක් ජීවත්වන්නට නො හැකි වීමි.

294. සා අහං කායස්ස භෙදා විප්පමුත්තා තතො චුතා,
දෙවානං තාවතිංසානං උපපන්නා සහබ්‍යතං.

295. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

296. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

උළාර විමානං.

## 3. 2

297. ඔභාසයිත්වා පථවිං සදෙවකං
අතිරොචසි චන්දිමසූරියා විය
සිරියා ච වණ්ණෙන යසෙන තෙජසා
බ්‍රහ්මා ච දෙවෙ තිදසෙ සඉන්දකෙ.[1]

298. පුච්ඡාමි තං උප්පලමාලධාරිණී
ආවෙළිනී කඤ්චනසන්නිභත්තචෙ
අලඞ්කතෙ උත්තමවත්ථධාරිණී
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං.

299. කිං ත්වං පුරෙ කම්මමකාසි අත්තනා
මනුස්සභූතා පුරිමාය ජාතියා
දානං සුචිණ්ණං අථ සීලසඤ්ඤමං
කෙනූපපන්නා සුගතිං යසස්සිනී.
දෙවතෙ පුච්ඡිතාචික්ඛ
කිස්ස කම්මස්සිදං ඵලන්ති.

300. ඉදානි භන්තෙ ඉමමෙව ගාමං[2]
පිණ්ඩාය අම්හාක ඝරං උපාගමි
තතො තෙ උච්ඡුස්ස අදසි ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියා.

301. සස්සු ච පච්ඡා අනුයුඤ්ජතෙ මමං
කහන්නු[3] උච්ඡුං වධුකෙ අවාකිරි[4]
නච්ඡඩ්ඩිතං න ච පන ඛාදිතං[5] මයා
සන්තස්ස භික්ඛුස්ස සයං අදසහං.

1. සඉන්දකෙ – මජසං.
2. ගාමෙ – ස්‍යා.
3. කහං මෙ – PTS
4. අවාකරි – ස්‍යා,
5. නො පන ඛාදිතං – මජසං.

294. ඒ දුකින් මිදුණු මම කය බිඳීමෙන් එයින් ච්‍යුත වූවා තව්තිසා දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමි.

295. එම පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම් කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

296. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇතියා වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

## උළාරවිමාන යි.

## 2. 3

297. (තෝ) සඳ හිරු මෙන් අහස සහිත පොළොව එකලු කොට අතිශයින් බබළහි. ශොභාවෙන් ද ශරීර වර්ණයෙන් ද පරිවාරයෙන් ද ස්වකීය අනුභාවයෙන් ද ඉන්ද්‍රයා සහිත තව්තිසා වැසි දෙවියන් ඉක්මවා බබළන බ්‍රහ්මයා මෙනි.

298 උපුල් මල්දම් දරන රුවන්මුවා මලින් නැගුණු රැළි ඇති රන්වන් සිවි ඇති උතුම් වත් දරන සැරසුණු සොඳුරු දෙව්දුව, මා වඳින තී කවරැ යි විචාරමි.

299. තෝ පෙරැ අත්බැව්හි මිනිස්දුවක් වූවා කිනම් කර්‍මයක් කෙළෙහි ද? මැනැවින් දන් දෙන ලද ද? නැතහොත් සිල් රක්නා ලද ද? කුමකින් යසස් ඇතිව සුගතියෙහි උපන්නී වෙහි ද? එම්බා දෙව්දුව, විචාරන ලද්දී මේ විපාකය කවර කර්‍මයක්හුගේ දැ යි කියව.

300. වහන්ස, මෙකල්හි මෙගම්හි ම (භික්ෂුනමක්) පිඬු පිණිස අප ගෙට එළඹියේ ය. ඉක්බිති උන්වහන්සේට පහන් සිතැත්තී ඉමහත් ප්‍රීතියෙන් උක් දඬු කඩක් පිදුවෙමි.

301. පසුව නැඳි තොමෝ, ලෙහෙලිය උක්දඬුකඩ කොහි දැමුවෙහි දැ යි මා විචාළා ය. එය මා විසින් බැහැර නො දමන ලදී. නො ද අනුභව කරන ලදී. මම සන්හුන් කෙලෙසුන් ඇති භික්ෂුනමක්හට පිදුවෙමි.

302. තුය්හං නච්ඡං[1] ඉස්සරියං අථො මම
ඉත්ථියා සස්සු පරිභාසතෙ මමං,
පියං ගහෙත්වා පහාරං අදාසි මෙ
තතො චුතා තාලකතාමනි දෙවතා.

303. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා,
දෙවෙහි සද්ධිං පරිචාරයාමහං
මොදමහං කාමගුණෙහි පඤ්චහි.

304. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
දෙවින්දගුත්තා තිදසෙහි රක්ඛිතා
සමප්පිතා කාමගුණෙහි පඤ්චහි.

305. එතාදිසං පුඤ්ඤඵලං අනප්පකං
මහාවිපාකා මම උච්ඡුදක්ඛිණා,
දෙවෙහි සද්ධිං පරිචාරයාමහං
මොදමහං කාමගුණෙහි පඤ්චහි.

306. එතාදිසං පුඤ්ඤඵලං අනප්පකං
මහාජුතිකා මම උච්ඡුදක්ඛිණා,
දෙවින්දගුත්තා තිදසෙහි රක්ඛිතා
සහස්සනෙත්තො ඉව නන්දනෙ වනෙ.

307. තුවඤ්ච භන්තෙ අනුකම්පකං විදූං
උපෙච්ච වන්දිං කුසලඤ්ච පුච්ඡිසං
තතො තෙ උච්ඡුස්ස අදාසිං ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියාති.

උච්ඡුදායිකාවිමානං.

## 3. 3

308. පල්ලඞ්කසෙට්ඨෙ මණිසොණ්ණචිත්තෙ
පුප්ඵාභිකිණ්ණෙ සයනෙ උළාරෙ
තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
උච්චාවචා ඉද්ධි විකුබ්බමානා.

309. ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති
දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1. තුය්හ නු ඉධං – සයා,

302. ගෙහි මේ අධිපතිභාවය තිගේ ද නැතහොත් මාගේ දැ යි මෙසේ නැඳි තොමෝ මට පරිභව කළා ය. නැවැත පුටුවක් ගෙන මට පහර දුනි. කලුරිය කළා වූ මම එයින් සැව දෙව්දුවක් වූවා වෙමි.

303. මා විසින් ඒ කුශල කර්‍මය පමණක් කරන ලදී. තමා විසින් (කරන ලද) ඒ කුශල කර්‍මය කරණ කොට ගෙන (මේ) සැප විඳිමි. මම දෙවියන් සමග හැසිරෙමි. මම පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

304. මා විසින් ඒ කුශල කර්‍මය පමණක් කරනලදී. තමා විසින් (කරන ලද) ඒ කුශල කර්‍මය කරණ කොට ගෙන (මේ) සැප විඳිමි. සක් දෙවිඳු විසින් ගොපිත වූ තව්තිසා වැසි දෙවියන් විසින් රක්නාලද මම පස්කම් ගුණයෙන් යුක්ත වූවා වෙමි.

305. මාගේ උක්දඬු පූජාව මහත් විපාක ඇත. එයින් මෙබඳු අනල්ප වූ පුණ්‍යඵලයෙක් වෙයි. මම දෙවියන් සමග හැසිරෙමි. මම පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

306. ඒ මාගේ උක්දඬු පූජාව මහත් අනුභාව ඇත. මෙබඳු අනල්ප වූ පුණ්‍යඵලයෙක් වෙයි. සක් දෙවිඳුන් විසින් ගොපිත වූ තව්තිසා වැසි දෙවියන් විසින් රක්නාලද මම නඳුන් වෙනෙහි සක්දෙව්රජු මෙන් (ප්‍රීත වෙමි)

307. වහන්ස මම කාරුණික වූ නුවණැත්තා වූ ඒ ඔබ වෙත පැමිණ වැන්දෙමි. නිරොග බව ද විචාළෙමි. ඉක්බිති පහන්සිත් ඇති මම ඉමහත් ප්‍රීතියෙන් ඔබ වහන්සේට උක්දඬුකඩක් පූජා කෙළෙමි යි.

**උච්ඡුදයිකා විමාන යි.**

## 3. 3

308. මහත් අනුභාව ඇති දෙව්දුව, මිණියෙන් හා රනින් විසිතුරු වූ මලින් ගැවසීගත් මහත් යහනක් වූ උතුම් පළඟෙහි කුදුමහත් ඍද්ධි විකුර්වණය කරන්නී එහි සිටිනෙහි ය.

309. තිගේ මේ අප්සරාවෝ හාත්පස නටති, ගයති, සතුටු කරවත්. මහත් අනුභාව ඇති දෙව්දුව, දිව්‍යර්ධියට පැමිණියා වෙහි. මිනිස් වූවා කිනම් පිනක් කෙළෙහි ද? කවර හෙතුවකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද? තිගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

310. අහං මනුස්සෙසු මනුස්සභූතා
අඩ්ඪෙ කුලෙ සුණිසා අහොසිං
අක්කොධනා භත්තුවසානුවත්තිනී
අහොසිං අප්පමත්තා උපොසථෙ.

311. මනුස්සභූතා දහරාස'පාපිකා[1]
පසන්නචිත්තා පතිමාභිරාධයිං
දිවා ච රත්තො ච මනාපචාරිණී
අහං පුරෙ සීලවතී අහොසිං.

312. පාණාතිපාතා විරතා අචොරිකා
සංසුද්ධකායා සුචිබ්‍රහ්මචාරිණී
අමජ්ජපා නො ච මුසා අභාණිං
සික්ඛාපදෙසු පරිපූරකාරිණී.

313. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී
පාටිහාරියපක්ඛඤ්ච පසන්නමනසා අහං
අට්ඨඞ්ගුපෙතං අනුධම්මචාරිණී
උපොසථං පීතිමනා උපාවසිං.

314. ඉමඤ්චාරියට්ඨඞ්ගවරෙහුපෙතං[2]
සමාදියිත්වා කුසලං සුඛුද්‍රයං
පතිම්හි කල්‍යාණී වසානුවත්තිනී
අහොසිං පුබ්බෙ සුගතස්ස සාවිකා

315. එතාදිසං කුසලං ජීවලොකෙ
කම්මං කරිත්වාන විසෙසභාගිනී
කායස්ස භෙදා අභිසම්පරායං
දෙවිද්ධිපත්තා සුගතිම්හි ආගතා.

316. විමාන පාසාදවරෙ මනොරමෙ
පරිවාරිතා අච්ඡරාසඞ්ගණෙන
සයංපභා දෙවගණා රමෙන්ති මං
දීඝායුකිං දෙවවිමානමාගතන්ති.

පලලඩකවිමානං.

## 3. 4

317. ලතා ච සජ්ජා පවරා ච දෙවතා
අච්චිමුතී[3] රාජවරස්ස සිරීමතො
සුතා ච රඤ්ඤො වෙස්සවණස්ස ධීතා
රාජීමතී ධම්මගුණෙහි සොභථ.

318. පඤ්චෙත්ථ නාරියො අගමංසු නහායිතුං
සීතොදිකං උප්පලිනිං සිවං නදිං
තා තත්ථ නහායිත්ව රමෙත්ව දෙවතා
නච්චිත්ව[4] ගායිත්ව[5] සුතා ලතං බ්‍රැවී.

---

1. දහරා අපාපිකා – මජසං.
2. ඉමඤ්ච අරියං අට්ඨඞ්ගවරෙහුපෙතං, – මජසං.
3. අච්චිමතී – මජසං. අච්ඡිමුතී-සයා.
4. නච්චිත්වා – මජසං.
5. ගායිත්වා – මජසං.

310. මිනිසුන් කෙරෙහි මිනිස්දුවක් වූ මම ආඪ්‍යකුලයෙක ලේලියක් වීමි. ක්‍රොධ නො කරන සුලු ස්වාමියාගේ වසයෙහි පවත්නාසුලු මම පෙහෙවස්හි අප්‍රමත්ත වීමි.

311. මිනිස්දුවක් වූ තරුණ වූ මම පතිතව්‍රාවක් වීමි. පහන්සිත් ඇත්ති ස්වාමියා සතුටු කෙළෙමි. දවරු දෙක්හි මනවඩන්නියක් ව හැසුරුණු මම පෙර සිල් ඇත්ති වීමි.

312. (ඒ මම) සතුන් මැරීමෙන් වෙන් වීමි. සොරකම් නො කරන්-නියක් වීමි. පිරිසිදු කායකර්‍මි ඇත්තියක් ද පිවිතුරු බඹසර ඇත්තියක් ද මත්පැන් නො බොන්නියක් ද වීමි. බොරු නො ද කීමි. ශික්ෂාපදයන් සම්පූර්ණ කරන්නියක් වීමි.

313. මෙසේ ආයර්‍ය ධර්‍මානුගත වූ ප්‍රීතිසිත් ඇති ඒ මම පක්ෂය පිළිබඳ වූ තුදුස්වක ද පසළොස්වක ද අටවක ද ප්‍රාතිහාර්‍ය පක්ෂය ද (යන පොහෝ දිනයන්හි) පහන් සිත් ඇත්ති අටඟින් යුත් පෙහෙවස් විසීමි.

314. මෙ උතුම් ආයර්‍ය අෂ්ටාංගයෙන් යුක්ත වූ සැප විපාක ඇති කුශලය සමාදන් ව යහපත් තැනැත්තියක් වූවා ස්වාමියා අනුව පවත්නී පෙර. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවිකාවක් වීමි.

315. දිව්‍ය සම්පත්තියට හිමි වූ මම මිනිස් ලොවැ මෙබඳු කුශල කර්‍මයක් කොට මරණින් මතු පරලෙව්හි දිව්‍යර්ධියට පැමිණියා සුගතියට ආයෙමි.

316. සිත්කලු වූ උතුම් වූ විමානයෙකැ අප්සරා සමූහයෙන් පිරිවරන ලද මම ස්වකීය ශරීරාලොක ඇත්තියක් වීමි. දීර්ඝායුෂ ඇති දිව්‍ය විමානයට පැමිණි මා දිව්‍ය සමූහයෝ රමණය කෙරෙත්.

**පල්ලඞ්කවිමාන යි.**

## 3. 4

317. සිරිමත් වූ සක්දෙව් රජහුගේ (පිරිවර වූ ද) වෙසවුණු රජුගේ දූවරු වූ ද වෙසෙසින් බබළන සිරුරු ඇති ලතා–සජ්ජා–පවරා–අච්චිමුඛී–සුතා යන දෙවඟනෝ දැහැමි ගුණයෙන් බබළන්නාහු ය.

318. එම දිව්‍යස්ත්‍රීහු පස්දෙන හිමවත් පෙදෙසෙහි සිහිල්දිය පිරුණු උපුල් මලින් ගැවසීගත් යහපත් ගඟට දියනෑමට ගියාහු ය. ඒ දෙවඟනෝ එහි ස්නානය කොට සිත් අලවා නටා ගී ගයා ක්‍රීඩා කළහ. (ඔවුනතුරෙන්) සුතා දෙව්දූතොමෝ ලතා දෙව්දූවට මෙසේ කීවා ය.

319. පුච්ඡාමි තං උප්පලමාලධාරිණී
ආවෙළිනී කඤ්චනසන්නිභත්තචෙ
තිමිරතම්බක්ඛි නභෙව සොභනෙ
දීඝායුකී කෙන කතො යසො තව.

320. කෙනාසි භද්දෙ පතිනො පියතරා
විසිට්ඨකල්‍යාණිතරස්සු රූපතො
පදක්ඛිණා නච්චනගීතවාදිතෙ
ආචික්ඛ නො ත්වං නරනාරිපුච්ඡිතා ති.

321. අහං මනුස්සෙසු මනුස්සභූතා
උළාරභොගෙ කුලෙ සුණිසා අහොසිං
අක්කොධනා භත්තුවසානුවත්තිනී
උපොසථෙ අප්පමත්තා අහොසිං.

322. මනුස්සභූතා දහරාස'පාපිකා
පසන්නචිත්තා පතිමාභිරාධයිං
සදෙවරං සස්සසුරං සදාසකං
අභිරාධයිං තම්හි කතො යසො මම.

323. සාහං තෙන කුසලෙන කම්මුනා
චතුබ්භි ඨානෙහි විසෙසමජ්ඣගා
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච
ඛිඩ්ඩාරතිං පච්චනුභොමනප්පකං.

324. සුතං නු තං භාසති යං අයං ලතා
යං නො අපුච්ඡිම්හ අකිත්තයී නො
පතිනො කිරම්හාකං විසිට්ඨනාරිනං
ගතී ච තාසං පවරා ච දෙවතා.

325. පතීසු ධම්මං පචරාම සබ්බා
පතිබ්බතා යත්ථ භවන්ති ඉත්ථියො
පතීසු ධම්මං පචරිත්ව සබ්බා
ලච්ඡාමසෙ භාසති යං අයං ලතා.

326. සීහො යථා පබ්බතසානු ගොචරො
මහින්ධරං පබ්බතමාවසිත්වා
පසය්හ හන්ත්වා ඉතරෙ චතුප්පදෙ
ඛුද්දෙ මිගෙ ඛාදති මංසභොජනො.

227. තථෙව සද්ධා ඉධ අරියසාවිකා
භත්තාරං නිස්සාය පතිං අනුබ්බතා
කොධං වධිත්වා අභිභුය්‍ය මච්ඡරං
සග්ගම්හි සා මොදති ධම්මචාරිනීති.

ලතාවිමානං.

319. උපුල්මල්දම් දරන රුවන්මුවා මලින් නැඟුණු රැළි ඇති රන්වන් සිවි ඇත්තිය, තී විචාරමි. මිදෙල්ල මලක රොන් වැනි තඹවන් රොදින් ගැවසීගත් ඇස් ඇති ශරදාකාශය වැනි පිරිසිදු අඟපසඟින් බබළන දීඝායු ඇති ලතාවෙනි, තීගේ මේ පරිවාර සම්පත්තිය හා කීර්තිය කවර පිනෙකින් උපනූ ද?

320. සොඳුර, කවර පිනෙකින් සැමියාට අතිශයින් ප්‍රිය වූවා වෙහි ද? රූපයෙන් උතුම් වූ ඉතා සොඳුරු බැව් ඇත්තී වෙහි ද? නැටුම් ගැයුම් වැයුම්හි දක්ෂ වූවා වෙහි ද? (දිව්‍ය) ස්ත්‍රී පුරුෂයන් විසින් විචාළ තී අපට කියව.

321. මිනිසුන් අතර මිනිස් දුවක් වූ මම මහත් සම්පත් ඇති කුලයෙකැ ලේලියක් වීමි. ක්‍රොධ නො කරන සුලු ස්වාමියාගේ වශයෙහි එක්වන් පවත්නා සුලු මම පෙහෙවස්හි අප්‍රමත්ත වීමි.

322. මිනිස් දුවක් වූ තරුණ වූ මම පතිව්‍රතාවක් වීමි. පහන්සිත් ඇත්තී සුහුරුබඩු සහිත වූ නැදිමයිලන් ද දාසි දසුන් ද සහිත වූ සැමියා සතුටු කෙළෙමි. එහි දී (ඒ කුලයෙහි හෝ කාලයෙහි හෝ) මා විසින් මේ පින කරන ලදී.

323. ඒ මම ඒ කුශලකර්මයෙන් ආයුෂ–වර්ණ–සැප–බල යන කරුණු සතරින් විශිෂ්ටත්වය ලැබීමි. අපමණ කෙළිසුව ද විඳිමි.

324. මේ ලතා තොමෝ යමක් කියා ද එය (තොප විසින්) අසන ලද්දේ නො වේ ද, අපගේ යම් සැකයෙක් වේ ද, එය අපි ඇසූවෙමු. (ඕ තොමෝ) අපට එය ඇති සැටි ප්‍රකාශ කළා යැ. උතුම් ස්ත්‍රීන් වූ අපට ස්වාමි පුරුෂයන්ගේ පිහිට උතුම් ය. අපට (ඔහු) උතුම් දෙවියෝ ද වෙත්.

325. සිය සැමියන් කෙරෙහි යම් ඒ හැසිරීමක් නිසා සියලු ස්ත්‍රීහු පතිවත ඇත්තෝ වෙත් ද, අපි සියලු දෙනා ද එම පතිවත රකිමු. මේ ලතා තොමෝ යම් සැපතක් ලබා ය යි කියා ද, ඒ පතිව්‍රතා ධර්මයෙහි හැසිර අපි සැපත ලබමු.

326. කඳු වනලැහැබ් ඇසුරු කළ මාංසාහාර කොට ඇති සිංහයා (මහීධර) පර්වතය ආශ්‍රය කොට වෙසෙමින් අන් සිවුපා සතුන් මැඩ නසා බල විසින් හීන වූ සතුන් යම්සේ මරා කයි ද.

327. එසේ ම මේ ලොකයෙහි ධර්මචාරී වූ සැදැහැති යම් ආර්ය ශ්‍රාවිකාවක් වී ද, ඕතොමෝ සිය සැමියා නිසා වසන්නී ඕහු අනුව පතිවත රකින්නී ක්‍රොධය මසුරුමල මැඩ ස්වර්ගයෙහි සතුටු වෙයි.

ලතාවිමාන යි.

## 3. 5

328. සත්තතන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං,
සො මං රඞ්ගම්හි අව්හෙති සරණං මෙ හොහි කොසියාති.

329. අහං තෙ සරණං හොමි අහමාචරියපූජකො,
න තං ජයිස්සති සිස්සො සිස්සමාචරිය ජෙස්සසීති.

330. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

331. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

332. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ,
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

333. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

334. වත්ථුත්තමදායිකා නාරී
පවරා හොති නරෙසු නාරීසු
එවං පියරූපදායිකා මනාපං
දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං.

335. තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාමවණ්ණිනීහමස්මි
අච්ඡරා සහස්සස්සාහං[1]
පවරා පස්ස පුඤ්ඤානං[2] විපාකං.

336. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

337. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

---

1. අච්ඡරාසහස්සාහං පවරා - ස්‍යා.
2. පුඤ්ඤස්ස - කත්ථචි.

## 3. 5

328. සක්දෙව් රජතුමනි, සත්තතක් ඇති ඉතා මිහිරි වූ සිත්කලු වූ වීණාවාදනය (මූසිලයාට) ඉගැන්වීමි. ඒ මූසිල තෙමේ රඟමඬලෙහි තරඟ වශයෙන් මා කැඳවයි. මට පිහිට වනු මැනැවි.

329. ඇදුරුතුමනි, මම ඔබට පිහිට වෙමි. මම ඇදුරන් පුදන්නෙක්මි. ශිෂ්‍ය වූ මූසිල තෙමේ තොප නො දිනන්නේ ය. (තෙපි) සිසුහු දිනන්නහුය.

330. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනාරුසිරෙන් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටියෙහි.

331. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම් කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

332. මහත් අනුභාව ඇති දෙව්දුව තා විචාරමි. මිනිස් වූවා කවර පිනක් කළාද? තිගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

333. මේ පුණ්‍යඵලය කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මෙසේ පැවසූ ය.

334. උතුම් වස්ත්‍ර දෙන්නා වූ ස්ත්‍රී තොමෝ ස්ත්‍රීපුරුෂයන් අතුරෙහි උතුම් වෙයි. මෙසේ ප්‍රිය වස්තු දෙන්නා වූ ඕ තොමෝ දෙව්ලොවට පැමිණ මන වඩන්නා වූ දිව ඉසුරු ලබන්නී ය.

335. ඒ මාගේ විමානය බලනු මැනැවි. මම කැමැති සේ රූ දරන්නා වූ අප්සරාවක් වෙමි. මම අප්සරාවන් දහසකට උතුම් වෙමි. පිනෙහි විපාකය බලනු මැනැවි.

336. එම පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. එම පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

337. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස්දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එස) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

(යථා ච එත්ථ එවං උපරි සබ්බවිමානෙසු විත්ථාරෙතබ්බං.)

338-341. අභික්කන්තෙන වණ්ණෙන -පෙ-
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති.

342. පුප්ඵුත්තමදායිකා නාරී
පවරා හොති නරෙසු නාරිසු
එවං පියරූපදායිකා මනාපං
දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං

343. තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාමවණ්ණිනීහමස්මි
අච්ඡරා සහස්සස්සාහං
පවරා පස්ස පුඤ්ඤානං විපාකං.

344-349. තෙන මෙ තාදිසො වණ්ණො -පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති.

350-373. ගන්ධුත්තමදායිකා නාරී
පවරා හොති නරෙසු නාරිසු -පෙ-
ඵලුත්තමදායිකා නාරී -පෙ-
රසුත්තමදායිකා නාරී -පෙ-

374-381. ගන්ධපඤ්චඞ්ගුලිකං අහමදාසිං
කස්සපස්ස භගවතො ථූපස්මිං[1] -පෙ-
තස්සා මම පස්ස විමානං -පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති.

382-389. භික්ඛූ චහං භික්ඛුනියො ච
අද්දසාසිං පන්ථපටිපන්නෙ
තෙසාහං ධම්මං සුත්වාන
එකූපොසථං උපවසිස්සං
තස්සා මෙ පස්ස විමානං -පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති

390-397. උදකෙ ඨිතා උදකමදාසිං
භික්ඛුනො චිත්තෙන විප්පසන්නෙන
තස්සා මෙ පස්ස විමානං -පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති.

398-405. සස්සුඤ්චා'හං සසුරඤ්ච
චණ්ඩිකෙ කොධනෙ ච ඵරුසෙ ච
අනුස්සූයිකා සූපට්ඨාසිං
අප්පමත්තා සකෙන සීලෙන -පෙ-

406-413. පරකම්මකරී[2] ආසිං
අත්ථෙනාතන්දිතා දසී
අක්කොධනා අනතිමානී[3]
සංවිභාගිනී සකස්ස භාගස්ස -පෙ-

1. ථූපම්හි - මජසං.
2. පරකම්මකාරී - සීමු. පරකම්මකාරිනී - සයා.
3. අනතිමානිනී - මජසං.

(මේ විමානයෙහි යම්සේ ද එසෙයින් මතුයෙහි හැම විමානයන්හි විස්තරකටයුතු.)

338-41. විශිෂ්ට වූ ශරීරප්‍රභායෙන් ... තොපගේ සිරුරුපැහැය ද, හැම දිගුන් බබුළුවයි.

342. (සමන්මල් ආදි) උත්තමපුෂ්පයක් දෙන ස්ත්‍රී තොමෝ නරනාරීන් කෙරෙහි උත්තම වෙයි. මෙසේ ප්‍රිය ස්වභාව ඇති වස්තු දෙන ඕ තොමෝ දිව්‍යවිමානාදි ස්ථානයට පැමිණ මනවඩන දෑ ලබයි.

343. ඒ මාගේ විමානය බලව. මම කැමති සේ රූප ධරන අප්සරාවක් වෙමි. මම අප්සරාවන් දහසකට උතුම් වෙමි. පුණ්‍ය-විපාකය බලව.

344.-49. එයින් මට එබඳු සිරුරුපැහැ වෙයි. ... මාගේ සිරුරු පැහැ ද හැම දිගුන් බබුළුවා යි.

350-73. (චන්දනාදි) උත්තමගන්ධදාන කරන ස්ත්‍රී තොමෝ නරනාරීන් කෙරෙහි උත්තම වෙයි. ... උතුම් පලවැළ දෙන ස්ත්‍රී උතුම් රස දෙන ස්ත්‍රී ...

374-81. මම කසුප් බුදුන්ගේ දාගැබ්හි ගඳ පසඟුල් දුනිමු. ... ඒ මාගේ විමන බලව .. මාගේ සිරුරුපැහැ ද හැම දිගුන් බබුළුවා.

382-89. මම මඟට පිළිපන් භික්පුන් ද භික්ෂුණීන් ද දුටුමු. මම උන්වහන්සේගේ දහම් අසා එක් දවසක් පෙහෙවස් වුසුමු. ඒ මාගේ විමන බලව. ... මාගේ සිරුරුපැහැ ද හැම දිගුන් බබුළුවා.

390-97. මම දියෙහි සිටියා පහන් සිතින් මහණක්හට පැන් දුනිමු. ඒ මාගේ විමන බලව. ... මාගේ සිරුරුපැහැ ද හැම දිගුන් බබුළුවා.

398-405. මම චණ්ඩ වූ ක්‍රොධ කරන පරුෂ වූ නැන්දණියන්ට ද මයිලණුවනට ද දොස් පහළ කිරීම් රහිත වැ සිහි ඇති වැ ස්වකීය ශීලයෙන් යුතු වැ මැනැවින් උපස්ථාන කළමු ...

406-13. මම දසි වැ ක්‍රොධ නැති වැ අතිමාන නැති වැ ධන හෙතුයෙන් නො මැලි වැ මෙරමාගේ බැළමෙහෙ කරන්නක් වූමු. තමා ලද කොටස අන්‍ය ඇතියනට බෙදාදෙන සැහැවි ඇතියක් වූමු ...

414-421. ඛීරොදනං අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එවං කරිත්වා කම්මං
සුගතිං උපපජ්ජ මොදාමි -පෙ-

422-609. ඵාණිතං අහමදාසිං -පෙ-
උච්ඡුඛණ්ඩකං අහමදාසිං -පෙ-
තිම්බරුසකං අහමදාසිං -පෙ-
කක්කාරිකං අහමදාසිං -පෙ-
එළාලුකං අහමදාසිං -පෙ-
වල්ලිඵලං අහමදාසිං -පෙ-
ඵාරුසකං අහමදාසිං -පෙ-
හත්ථප්පතාපකං අහමදාසිං -පෙ-
සාකමුට්ඨිං අහමදාසිං -පෙ-
පුප්ඵකමුට්ඨිං අහමදාසිං -පෙ-
මූලකං අහමදාසිං -පෙ-
නිම්බමුට්ඨිං අහමදාසිං -පෙ-
අම්බකඤ්ජිකං අහමදාසිං -පෙ-
දොණිනිම්මජ්ජනිං අහමදාසිං -පෙ-
කායබන්ධනං අහමදාසිං -පෙ-
අංසවට්ටකං අහමදාසිං -පෙ-
ආයොගපට්ටං අහමදාසිං -පෙ-
විධූපනං අහමදාසිං -පෙ-
තාලවණ්ටං අහමදාසිං -පෙ-
මොරහත්ථං අහමදාසිං -පෙ-
ඡත්තං අහමදාසිං -පෙ-
උපාහනං අහමදාසිං -පෙ-
පූවං අහමදාසිං -පෙ-
මොදකං අහමදාසිං -පෙ-

610. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

611. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

612. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

613. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

614. සක්ඛලිං අහමදසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එවං කරිත්වා කම්මං
සුගතිං උපපජ්ජ මොදමි.

414–21. මම පිඩු සිඟා යන මහණක්හට කිරිබතක් දුන්මු. මෙසේ පින්කම් කොට සුගතියට පැමිණ තුටු වෙමි ...

422–609. මම උක්සකුරු කඩක් දුන්මු ... මම උක්දඬු කඩක් දුන්මු ... මම තියඹරා ඵලයක් දුන්මු. ... මම සිහින් කැකිරි ඵලයක් දුන්මු ... මම මහකැකිරි ඵලයක් දුන්මු. ... මම වැල්ඵලයක් දුන්මු ... මම බොරළුදමුණු ඵලයක් දුන්මු. ... මම ගිනිකබලක් දුන්මු. ... මම පළාමිටක් දුන්මු. ... මම මල්මිටක් දුන්මු ...මම මුලපළාමිටක් දුන්මු. ... මම කොසඹකොළ මිටක් දුන්මු. ... මම ඇඹුල්කැඳක් දුන්මු. ... මම තලමුරුවටක් දුන්මු .. මම කාබහනක් දුන්මු ... මම අංසකඩක් දුන්මු.... මම ආයොග-පට්ටයක් දුන්මු ... මම සියුරැස් විජිනිපතක් දුන්මු. මම තල්වටක් දුන්මු ... මම මොනරපිලින් කළ මකසවිජනියක් දුන්මු. ... මම ඡත්‍රයක් දුන්මු ... මම වහන්සඟළක් දුන්මු. ... මම පූපයක් (කැවුමක්) දුන්මු ...මම අග්ගලාවක් දුන්මු. ..

610. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරින් සියලු දිගුන් බබුළුවමින් දවහත් තරුව සේ සිටිනෙහි,

611. කවර හෙතුවකින් තිට එබඳු සිරුරුපැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

612. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

613. මේ පුණ්‍යඵලය කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව් දූ තොමෝ තුටු සිත් ඇත්තී (මෙසේ) පැවසූ ය.

614. පිඬු පිණිස හැසිරෙන්නා වූ භික්ෂුනමක්හට මම සකබලික නම් කැවිලි වෙසෙසක් දුනිමි. මෙබඳු (කුශල) කර්මයක් කොට සුගතියට පැමිණ සතුටු වෙමි.

615. තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාමවණ්ණිනීහමස්මි
අච්ඡරා සහස්සස්සාහං
පවරා පස්ස පුඤ්ඤානං විපාකං.

616. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

617. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

618. ස්වාගතං වත මෙ අජ්ජ සුප්පභාතං සුහුට්ඨිතං[1]
යං අද්දසං[2] දෙවතායො අච්ඡරා කාමවණ්ණියො

619. ඉමාහං[3] ධම්මං සුත්වා[4] කාහාමි කුසලං බහුං
දානෙන සමචරියායං සඤ්ඤමෙන දමෙන ච
ස්වාහං තත්ථ ගමිස්සාමි[5] යත්ථ ගන්ත්වා න සොචරෙති.

ගුත්තිල විමානං පඤ්චමං.

## 3. 6

620. දද්දල්ලමානා වණ්ණෙන යසසා ච යසස්සිනී,
සබ්බෙ දෙවෙ තාවතිංසෙ වණ්ණෙන අතිරොචසි.

621. දස්සනං නාභිජානාමි ඉදං පඨමදස්සනං,
කස්මා කායා නු ආගම්ම නාමෙන භාසසෙ මමන්ති.

622. අහං භද්දෙ සුභද්දාසිං පුබ්බෙ මානුසකෙ භවෙ,
සහ භරියා ච තෙ ආසිං භගිනී ච කණිට්ඨිකා.

623. සා අහං කායස්ස භෙදා විප්පමුත්තා තතො චුතා,
නිම්මානරතීනං දෙවානං උපපන්නා සහව්‍යතන්ති.

624. පහූතකතකල්‍යාණා තෙ දෙවෙ යන්ති පාණිනො,
යෙසං ත්වං කිත්තයිස්සසි සුභද්දෙ ජාතිමත්තනො.

625. කථං[6] ත්වං කෙන වණ්ණෙන කෙන වා අනුසාසිතා,
කීදිසෙනෙව දානෙන සුබ්බතෙන යසස්සිනී.

626. යසං එතාදිසං පත්තා විසෙසං විපුලමජ්ඣගා,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

---

1. සුහුට්ඨිතං – මජසං.
2. අද්දසාමි – මජසං.
අද්දසාසිං PTS
3. තාසාහං – ස්‍යා.
4. සුත්වාන – ස්‍යා.
5. තත්ථෙව ගච්ඡාමි – කත්ථචි.
6. අථ – මජසං.

615. ඒ මාගේ විමානය බලනු මැනවි. මම කැමති සේ රූ දරන්නා වූ අප්සරාවක් වෙමි. මම අප්සරාවන් දහසකට උතුම් වෙමි. පිනෙහි විපාකය බලනු මැනවි.

616. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

617. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇතියා වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුව යි. (සඝබලිකදායිකා) 36.

618. ආශ්චය්‍ර්‍යයෙකැ, මාගේ ඊම සුන්දර යැ. අද මට මනා උදයෙකි. යහතින් නැඟීම ද යහපති. යම් හෙයෙකින් කැමැති රූ දරන දෙවසරන් දුටුයෙම් ද එහෙයිනි.

619. මම මොවුන්ගේ දහම් අසා බොහෝ කුසල් කරන්නෙමි. දන් දීමෙන් ද සමව හැසිරීමෙන් ද සීලසංවරයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද (අන්‍යයෝ) යම් තැනකට ගොස් ශොක නො කෙරෙත් ද, ඒ මම ද එහි යන්නෙමි.

**ගුත්තිල විමාන යි.**

## 3. 6

620. යසස් ඇති දෙව් දුව, රූප සම්පත්තියෙන් ද පරිවාර සම්පත්තියෙන් ද අතිශයින් බබළන තෝ තව්තිසා වැසි සියලු දෙවියන් ඒ වර්ණාදි සම්පත්තියෙන් අබිබවා බබළනෙහි.

621. (මම මින් පෙර තී) දුටු බවක් නො දනිමි. මෙය පළමු දැකීමය. කිනම් දිව්‍යනිකායෙකින් ච්‍යුත ව අවුත් නමින් මා අමතනෙහි ද?

622. භද්‍රාවෙනි, මම පෙර මිනිසත් බවෙහි සුභද්‍රා නම් වීමි. තීගේ කනිටු බුහුන වූ මම (තොප සැමියාගේ) සම බිරියක් ද වීමි.

623. ඒ මම කාබුන් මරණින් මතු මිනිසත් බැවින් මිදුණී එයින් ච්‍යුත ව නිර්මාණරති නම් දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමි.

624. මහ පින්කම් කළ ඒ සත්ත්වයෝ යම් නිර්මාණරති නම් දෙවියන් වෙත යෙත් ද. සුභද්‍රාවෙනි තෝ ද එම නිර්මාණරති දෙවියන් මැද තම උපත ප්‍රකාශ කෙරෙහි.

625-626 යසස් ඇත්තිය, කවරක්හු විසින් අනුශාසිත වූ තෝ කෙසේ කිනම් කරුණෙකින් කෙබඳු දනෙකින් කිනම් මනා ව්‍රතයකින් මෙබඳු යසසකට පැමිණියා මහත් වූ වෙසෙසක් ලැබුයෙහි ද, (එම්බා) දෙව් දුව, විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක්හුගේ දැ යි කියව.

627. අථෙය්ව පිණ්ඩපාතානි යං දානං අදදං පුරෙ,
දක්ඛිණෙය්‍යස්ස සඞ්ඝස්ස පසන්නා සෙහි පාණිහි.

628. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

629. අක්ඛාමි තෙ දෙවි මහානුභාවෙ
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති..

630. අහං තයා බහුතරෙ භික්ඛූ සඤ්ඤතෙ බ්‍රහ්මචාරිනො[1]
තප්පෙසිං අන්නපානෙන පසන්නා සෙහි පාණිහි
තයා බහුතරං දත්වා හීනකායූපගා අහං[2]

631. කථං ත්වං අප්පතරං දත්වා විසෙසං විපුලමජ්ඣගා,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ යස්සකම්මස්සිදං ඵලන්ති.

632. මනොභාවනීයො භික්ඛු සන්දිට්ඨො මෙ පුරෙ අහු,
තාහං භත්තෙන නිමන්තෙසිං රෙවතං අත්තනට්ඨමං.

633. සො මෙ අත්ථපුරෙක්ඛාරො අනුකම්පාය රෙවතො,
සඞ්ඝෙ දෙහීති මං අවොච[3] තස්සාහං වචනං කරිං.

634. සා දක්ඛිණා සඞ්ඝගතා අප්පමෙය්‍යෙ පතිට්ඨිතා,
පුග්ගලෙසු තයා දින්නං න තං තව මහප්ඵලන්ති.

635. ඉදානෙවාහං ජානාමි සඞ්ඝෙ දින්නං මහප්ඵලං
සාහං ගන්ත්වා මනුස්සත්තං වදඤ්ඤූ වීතමච්ඡරා
සඞ්ඝෙ දානානි දස්සාමි[4] අප්පමත්තා පුනප්පුනන්ති.

636. කා එසා දෙවතා භද්දෙ තයා මන්තයතෙ සහ,
සබ්බෙ දෙවෙ තාවතිංසෙ වණ්ණෙන අතිරොචතීති.

637. මනුස්සභූතා දෙවින්ද පුබ්බෙ මානුසකෙ භවෙ
සහභරියා ච මෙ ආසි භගිනී ච කනිට්ඨිකා
සඞ්ඝෙ දානානි දත්වාන කතපුඤ්ඤා විරොචතීති.

1. බ්‍රහ්මචාරයො – මජසං.
බ්‍රහ්මචාරියෙ, – PTS.
2. අහුං – කත්ථචි.
3. මංවොච – මජසං.
4. දානං දස්සාමිහං – ස්‍යා,

627. (භද්‍රාවෙනි) යම් හෙයෙකින් පෙර අත්බැව්හි පහන් සිතැත්තී සියතින් දක්ෂිණාර්හ සඞ්ඝයාට පිඬු පා අටක් දන වශයෙන් දිනිම් ද,

628. එම පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. එම පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්හු වෙත් ද, ඒ සම්පත්හු මට පහළ වෙත්.

629. මහත් අනුභාව ඇති දෙව් දුව, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇතියෙම් වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

630. (සුභද්‍රාවෙනි, එකල) පහන් සිතැති මම ද සන්හුන් ඉඳුරන් ඇති බ්‍රහමචාරි වූ බොහෝ භික්ෂූන් තිට වඩා සියතින් ම අහර පැනින් සැතැප්පවීමි. මම තිට වඩා ඉතා වැඩියක් දී පහත් දෙව්ලොවට (තව්තිසාවට) පැමිණියෙම් වෙමි.

631. තෝ ඉතා සවල්පයක් දී කෙසේ මහත් වූ වෙසෙසකට පැමිණියෙහිද? (එම්බා) දෙව් දුව විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක් හුගේ දැ යි කියව.

632. පූර්ව කාලයෙහි (උදර ගුණ ඇති බැවින්) මනවඩවන (රෙවත නම්) භික්ෂුනමක් මා විසින් නිමතන ලද්දේ විය. මම ඒ රෙවත තෙරුන් තමන් සහිත අට නමක් කොට බතින් පැවරීමි.

633. ඒ රෙවත තෙරණුවෝ මා හිතයෙහි පෙරටුවූවෝ අනුකම්පා පිණිස සඟනට දෙවයි මට වදළහ. මම උන්වහන්සේගේ වචනය කෙළෙමි.

634. ඒ සඞ්ඝගතදක්ෂිණා තොමෝ අපමණ ගුණ ඇති සඟන කෙරෙහි පිහිටියාය. තී විසින් පුද්ගලයන් කෙරෙහි දෙන ලද ඒ දනය තිට මහත්ඵල නො වී.

635. සඟුන් කෙරෙහි දුන් දනය මහත්ඵල යයි මම දූන් දනිමි. ඒ මම මිනිසත් බවට ගොස් (ප්‍රතිග්‍රාහකයන්ගේ) වදන් දන්නී පහ වූ මසුරුමල ඇත්තී අප්‍රමත්ත ව පුන පුනා සඟනට දන් දෙන්නෙමි.

636. භද්‍රාවෙනි, (යම් දෙව් දුවක්) තව්තිසා වැසි සියලු දෙවියන් ශරීරවර්ණයෙන් ඉක්මවා බබළා ද තී සමග කථා කෙරේ ද මේ කවර දෙව්දුවක් ද?

637. සක්දෙව්රජුනි, පෙර මිනිසත් බැව් හි මිනිස් දුවක් වූ ඕ තොමෝ මාගේ කනිටු බුහුන වූවා සැමියාගේ සම බිරිය වූවා ය. කළ පින් ඇත්තී සඟනට දන් දී වෙසෙසින් බබළා යැ යි.

638. ධම්මෙන පුබ්බ භගිනි තයා භද්දෙ විරොචති,
යං සඞ්ඝස්මිං අප්පමෙය්‍යෙ පතිට්ඨාපෙසි දක්ඛිණං.

639. පුච්ඡිතො හි මයා බුද්ධො ගිජ්ඣකූටම්හි පබ්බතෙ,
විපාකං සංවිභාගස්ස යත්ථ දින්නං මහප්ඵලං.

640. යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතං ඔපධිකං පුඤ්ඤං යත්ථ දින්නං මහප්ඵලං.

641. තං මෙ බුද්ධො වියාකාසි ජානං කම්මඵලං සකං,
විපාකං සංවිභාගස්ස යත්ථ දින්නං මහප්ඵලං.

642. චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො.

643. යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතං ඔපධිකං පුඤ්ඤං සඞ්ඝෙ දින්නං මහප්ඵලං.

644. එසො හි සඞ්ඝො විපුලො මහග්ගතො
එසප්පමෙය්‍යො උදධීව සාගරො
එතෙහි සෙට්ඨා නරවීරසාවකා
පභඞ්කරා ධම්මමුදීරයන්ති[1].

645. තෙසං සුදින්නං සුහුතං සුයිට්ඨං,
යෙ සඞ්ඝමුද්දිස්ස දදන්ති දානං
සා දක්ඛිණා සඞ්ඝගතා පතිට්ඨිතා
මහප්ඵලා ලොකවිදූහි වණ්ණිතා.

646. එතාදිසං යඤ්ඤමනුස්සරන්තා[2]
යෙ වෙදජාතා විචරන්ති ලොකෙ
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

දද්දල්ල විමානං.

## 3. 7

647. ඵලිකරජතහෙමජාලඡන්නං
විවිධවිචිත්‍රතලමද්දසං සුරම්මං
ව්‍යම්හං සුනිම්මිතං තොරණූපපන්නං
රුචකුපකිණ්ණමිදං සුභං විමානං.

648. භාති ච දසදිසා නභෙව සුරියො
සරදෙ තමොනුදෙ සහස්සරංසි
තථා තපතිමිදං තව විමානං
ජලමිව ධූමසිඛො නිසෙ නභග්ගෙ.

1. ධම්මකරං උදීරයන්ති – සයා.
2. පුඤ්ඤමනුස්සරන්තා – සයා.

638. භද්‍රාවෙනි (තිගේ) බුහුන පෙර අපමණ ගුණ ඇති සඟන කෙරෙහි යම් දක්ෂිණාවක් පිහිටුවා ලූ ද, ඒ කාරණයෙන් තිට වඩා වෙසෙසින් බබළා යැ යි.

639. යම් සඟ රුවනක් කෙරෙහි දුන් දෙය මහත්ඵල වේ නම් දනයේ විපාකය මා විසින් ගිජුකුළු පව්වෙහි දී බුදුරජාණන් වහන්සේ විචාරන ලද්දේ (උන්වහන්සේගෙන් අසා දැනගන්නා ලද්දේ) ය.

640. පින් කැමැති ව දන් දෙන්නා වූ මිනිස්නට යම් සඟරුවනක් කෙරෙහි දුන් දෙය මහත් ඵල වේ ද, එබඳු ප්‍රතිසන්ධි – ප්‍රවෘත්ති විපාක දෙන පින් කෙරේවා.

641. යම් සඟරුවනක් කෙරෙහි දුන් දෙය මහත් ඵල වේ ද. සත්ත්වයන්ගේ සිය කම්පල දන්නා වූ බුදුරජාණන් වහන්සේ දනයෙහි ඒ විපාකය මට වදළ සේක.

642. මාර්ගසථයෝ සිවු දෙනෙක, ඵලසථයෝ සිවු දෙනෙකැ යි මේ සඞ්ඝ තෙමේ ඍජු වූයේ යැ. (ආර්‍යවූ) ප්‍රඥා ශීල සමාධි ඇත්තේ යැ.

643. පින්පල කැමැති ව දන් දෙන්නා වූ මිනිසුනට යම් සඟරුවනක් කෙරෙහි දුන් දෙය මහත් ඵල වේ ද (එබඳු) ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන පින් කෙරේවා.

644. මෙ සඞ්ඝ තෙමේ ගුණයෙන් මහත් බවට ගියේ ය. (ඵල-විපුලත්වයට හෙතුභාවයෙන්) විපුල වූයේ ය. මෙ සඞ්ඝ තෙමේ උදධි නම් සාගරය සේ ගුණයෙන් පමණ නො කොට හැක්කේ ය. ශ්‍රේෂ්ඨ වූ ලොවට නැණලු කරන්නා වූ නෙල නරවීරශ්‍රාවකයෝ ම නිවන්මඟ දක්වත්.

645. යම් කෙනෙක් සඟුන් උදෙසා දන් දෙත් ද, ඔවුන් විසින් (එය) මැනැවින් දෙන ලද ය. ගෙනවුත් පුදන ලද ය. (මහදන් විසින්) යාග කරන ලද ය. සඟුන් කෙරෙහි පිහිටියා වූ ඒ සඞ්ඝගත වූ දක්ෂිණා තොමෝ මහත්ඵල ඇතැ යි බුදුරජුන් විසින් වර්ණනා කරන ලද.

646. මෙබඳු (සඟුන් උදෙසා දුන්) දන සිහිකරන්නා වූ හටගත් සොම්නස් ඇති යම් කෙනෙක් මුල් සහිත ව මසුරුමල දුරු කොට ලොකයෙහි හැසිරෙද්ද, ඔහු නින්ද නො කරන ලද්දෝ සගලොවට පැමිණෙත්.

දද්දල්ල විමාන යි.

## 3. 7

647. පළිඟුමිණිමුවා බිතින් හා රන්රිදී දැලින් හාත්පස වසන ලද නන්වැදැරුම් විසිතුරු තල ඇති ඉතා රම්‍ය වූ තොරණින් සැදුම් ලත් රුවන් වැල්ලෙන් ගැවසුණු මිදුල් ඇති මැනැවින් බබළන මේ විමන දිටිමි.

648. අඳුරු දුරලන දහස් ගණන් රස් ඇති හිරු සරා කල්හි යම්සේ අහස දසදෙස බබළා ද, එසේම රෑ ගිනිසිළ අහස් පෙදෙස යම්සේ බබළා ද, එමෙන්ම තී ගේ මේ විමන අතිශයින් බබළ යි.

649. මුසත්ථිව නයනං සතෙරතාව[1]
ආකාසෙ ඨපිතමිදං මනුඤ්ඤං
වීණාමුරජසම්මතාලඝුට්ඨං
ඉද්ධං ඉන්දපුරං යථා තවෙදං.

650. පදුම කුමුදුප්පල කුවලයං
යූථික[2] බන්ධුකනොජකා ච සන්ති
සාලකුසුමිත පුප්ඵිතා අසොකා
විවිධ දුමග්ග සුගන්ධ සෙවිතමිදං.

651. සළල ලබුජ භුජක[3] සඤ්ඤුතා[4]
කුසකසුඵුල්ලිත ලතාවලම්බිනීහි
මණිජාල සදිසා යසස්සිනී
රම්මා පොක්ඛරණී උපට්ඨිතා තෙ.

652. උදකරුහා ච යෙත්ථි පුප්ඵජාතා
ථලජා යෙ ච සන්ති රුක්ඛජාතා
මානුසකාමානුසකා ච දිබ්බා
සබ්බෙ තුය්හං නිවෙසනම්හි ජාතා.

653. කිස්ස සංයමදමස්සයං[5] විපාකො
කෙනාසි කම්මඵලෙනිධූපපන්නා
යථා ච තෙ අධිගතමිදං විමානං
තදනුපදං අවචාසු'ළාරපම්හෙති.[6]

654. යථා ච මෙ අධිගතමිදං විමානං
කොඤ්චමයූරචකොර සඞ්ඝචරිතං
දිබ්බපිලවහංසරාජචිණ්ණං
ද්විජකාරණ්ඩව කොකිලාභිනදිතං.

655. නානා සන්තානක පුප්ඵරුක්ඛවිවිධා
පාටලි ජම්බු අසොක රුක්ඛවන්තං
යථා ච මෙ අධිගතමිදං විමානං
තන්තෙ පවදිස්සාමි[7] සුණොහි භන්තෙ.

656. මගධවරපුරත්ථිමෙන
නාළකගාමො නාම අත්ථි භන්තෙ
තත්ථ අහොසිං පුරෙ සුණිසා
සෙසවතී[8] තත්ථ ජානිංසු මමං.

---

1. සතෙරිතා – සයා.
2. යොධික – මජසං.
   යොථිකා භණ්ඩිකා නොජකා – සයා
3. භුජක – සි, සයා,
4. සංයුත්තා – මජසං.
5. ස්මදමස්සයං – සීමු.
6. අවචාසිළාරපම්හෙනාති – මජසං.
7. පවෙදයාමි – මජසං.
8. සෙවසතී ඉති – මජසං

649. අහසෙහි තිබූ තිගේ මේ මනරම් විමන විදුලියක් සේ ඇස මුසපත් කෙරේ. (එසේම) මේ විමන වෙණබෙර මිහිඟුබෙර අත්තල කස්තල නදින් සොභිත වූ සුදසුන්පුරය සේ දෙව්සැපතින් සමෘද්ධ ය.

650. (මෙහි) පියුම් හෙලපුල් රතුපුල් නිලුපුල් යන ජලජ පුෂ්පයෝ වෙති. සිනිද්ද බඳුවද අනොජ වෘක්ෂයෝ ද වෙති. පිපිමල් ඇති සල් හෝපලු වෘක්ෂයෝ ද වෙති. (තිගේ) මේ විමන මෙසේ නන්වැදෑරුම් උතුම් ගස්වල සුවඳින් සුවඳ කැවුණේ ය.

651. යසස් ඇති දෙව්දුව, ඉවුරෙහි පිහිටි හොර දෙල් බුජඟ රුක්වලින් යුක්ත වූ තල් පොල් ඈ තෘණ ජාතීන්ගෙන් හා මනා සේ පිපි මල් ඇති එල්බෙන වැල්වලින් යුත් මිණිදූල් බඳු දිය ඇති මනරම් පොකුණු තිට පහළව ඇත.

652. දියෙහි හටගන්නා යම් (පදුමාදි) පුෂ්පජාතයෝ වෙත් ද, ගොඩ හටගන්නා යම් සිනිද්ද ආදි වෘක්ෂ ජාතයෝ වෙත් ද, (එයින් අන්‍යවූත්) යම්බඳු මල්රුක් පලරුක්හු වෙත් ද, මිනිසුන් අයත්වූත් නො මිනිසුන් අයත් වූත් දෙවියන් අයත් වූත් ඒ සියලු ම වෘක්ෂයෝ තිගේ විමන් සමීපයෙහි ඇත්තාහු මැ යි.

653. මනහර ඇස්පිය ඇත්තිය, මේ විපාකය කිනම් කායාදි සංයමයක්හුගේ ද? කිනම් ඉන්‍ද්‍රිය දමනාදි දමයක්හුගේ ද, (විපාක දෙන්නට ඇරැඹූ) කිනම් කර්මබලයෙකින් මෙහි උපන්නී වෙහි ද? තී විසින් මේ විමන යම් සේ ලබන ලද ද, ඒ කර්මය (මට) අනුරූප පද විසින් කියව.

654. කොස්වාලිහිණි මොනර ඇටිකුකුළු සමූහයා හැසුරුණු දිව්‍යමය වූ දියකාවුන් හා හස්රජුන් විසින් සෙවුනා ලද විලිකුළු කොවුල් ඈ විහඟුන් විසින් නිතර නද දෙන ලද මේ විමන මා විසින් යම්සේ ලබන ලද ද,

655. නන්වැදෑරුම් අතුපතරින් ගැවසිගත් මල්රුක්වලින් විසිතුරු වූ පළොල් දඹ හෝපලු රුක් ඇති මේ විමන මා විසින් යම් සේ ලබන ලද ද, වහන්ස එය ඔබවහන්සේට කියන්නෙමි. අසනු මැනවි.

656. වහන්ස, මගධරට නැගෙනහිරදිග **නාළක** නම් ගමෙක් ඇත. මම පෙර ඒ නාළක ගමෙහි (එක් ගැහැවි කුලයෙකැ) ලෙහෙළියක් වීමි. ඒ මා **සෙසවතී** යන නමින් අන්‍යයෝ දත්හ.

657. සාහං අපචිතත්ථධම්මං කුසලං
දෙවමනුස්සපූජිතං මහන්තං
උපතිස්සං නිබ්බුතං අප්පමෙය්‍යං
මුදිතමනා කුසුමෙහි අබ්භොකිරිං[1].

658. පරමගතිගතඤ්ච පූජයිත්වා
අන්තිමදෙහධරං ඉසිං උළාරං,
පහාය මානුසකං සමුස්සයං
තිදසගතා ඉධමාවසාමි ඨානන්ති.

**සෙසවතී විමානං.**

## 3. 8

659. පීතවත්ථෙ පීතධජෙ පීතාලඞ්කාරභූසිතෙ,
පීතන්තරාහි වග්ගූහි අපිළන්ධාව සොභසි.

660. කා කම්බුකෙයූරධරෙ[2] කඤ්චනාවෙළභූසිතෙ,
හෙමජාලක පච්ඡන්නෙ[3] නානාරතනමාලිනි.

661. සොවණ්ණමයා ලොහිතඞ්ගමයා ච[4]
මුත්තාමයා වෙළුරියමයා ච
මසාරගල්ලා සහ ලොහිතඞ්කා
පාරාවතක්ඛීහි[5] මණීහි චිත්තිතා.

662. කොචි කොචි එත්ථ මයූරසුස්සරො
හංසස්සරකොඤ්ඤ කරවීකසුස්සරො
තෙසං සරො සූයති වග්ගුරූපො
පඤ්චඞ්ගිකං තුරියමිවප්පවාදිතං.

663. රථො ච තෙ සුභො වග්ගූ නානාරතනචිත්තිතො[6]
නානාවණ්ණාහි ධාතූහි සුවිභත්තො ච සොභති.

664. තස්මිං රථෙ කඤ්චනබිම්බවණ්ණෙ
යා ත්වං ඨිතා[7] භාසසිමං පදෙසං
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

1. අබ්භුකිරිං - මජසං.
2. කාකම්බුකායූරධරෙ - මජසං.
   කාකම්බුකායූරධරෙ - සයා.
3. හෙමජාලකසඤ්ඡන්නො - මජසං.
4. ලොහිතඞ්ගමයාච - මජසං.
5. පාරෙකකක්ඛීහි - මජසං.
   පාරාවටක්ඛීහි - අට්ඨකථා.
6. නානා රතන චිත්තඞ්ගො - සයා.
7. යත්ථට්ඨිතා - සී.

657. ඒ (සෙසවතී නම් වූ) මම සතුටුසිත් ඇත්තී ධර්මාර්ථයන්හි දක්ෂ වූ බුදුරජුන් විසින් බුහුමන් කරන ලද දෙව්මිනිසුන් විසින් පුදන ලද ගුණයෙන් පමණ නොකට හැකි ශීලාදී ගුණයෙන් මහත් වූ පිරිනිවියා වූ සැරියුත් තෙරණුවන් මලින් පිදුවෙමි.

658. (ඒ මම) නිරුපධිශෙෂ නිර්වාණයට පැමිණි පැසුළු සිරුරු දරූ උදර ගුණවත් (සැරියුත්) මහතෙරුන් වහන්සේ පුද මිනිස් සිරුර හැර තව්තිසාවට පැමිණියෙමි මෙහි වෙසෙමි.

**සෙසවතී විමාන යි.**

## 3. 8

659. රන්වන් වත් ඇත්තිය, රන්වන් ධ්වජ ඇත්තිය, රන්වන් අබරණින් බබළන්නිය, තී සිත්කලුවූ මනරම්වූ රන්වන් උතුරුසළුයෙන් නො සැරසුනී ම හොබනෙහිය.

660. රන්වන් වළලු දරන්නිය, රන්මුවා මුදුන්මල්කඩින් සැරසුනිය, රත්දූලින් වැසුණු සිරුරු ඇත්තිය, නන් රුවන් මල්දම් ඇත්තිය, තී කවරක් ද?

661. (තිගේ කෙස් කලඹෙහි හා අත්හි) රනින් කළ මල්මාලා පියුම්රා මිණියෙන් කළ මල්මාලා, මැසිරිගල් මිණියෙන් කළ මල්මාලා, රත්පැහැ මිණියෙන් කළ මල්මාලා, පරෙවි ඇස් වැනි මිණියෙන් විසිතුරු වූවාහු ද වෙත්.

662. මේ මල්දම්හි මොනරුන්ගේ නාදය මෙන් හස් රදුන්ගේ හඬ මෙන් කුරවි කෙවිල්ලන්ගේ කූජන මෙන් මනහර නද ඇසෙයි. ඔවුන්ගේ නාදය වැයූ පසඟතුරුනද මෙනි.

663. නන් රුවනින් විසිතුරු කරන ලද තිගේ රථය ද යහපත් ය. මනහරය. නන්වැදෑරුම් රිය අවයවයෙන් මොනවට බෙදන ලද්දේ ම හොබනේ ය.

664. රන්බිඹුවන් රියෙක් හි සිටියා වූ යම්බඳු තී මේ පෙදෙස බබළවහිද, (එම්බා) දෙව්දුව, විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක්හුගේ දැයි කියව.

665. සොවණ්ණජාලං මණිසොණ්ණචිත්තිතං[1]
මුත්තාචිතං හෙමජාලෙන ඡන්නං[2]
පරිනිබ්බුතෙ ගොතමෙ අප්පමෙය්‍යෙ
පසන්නචිත්තා අහමාභිරොපයිං.

666. තාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදමනාමයා'ති.

මල්ලිකා විමානං.

## 3. 9

667. කා නාම ත්වං විසාලක්ඛි රම්මෙ චිත්තලතාවනෙ,
සමන්තා අනුපරියාසි නාරිගණපුරක්ඛතා.[3]

668. යද දෙවා තාවතිංසා පවිසන්ති ඉමං වනං,
සයොග්ගා සරථා සබ්බෙ චිත්‍රා හොන්ති ඉධාගතා.

669. තුය්හඤ්ච ඉධ පත්තාය උය්‍යානෙ විචරන්තියා,
කායෙ න දිස්සති චිත්තං කෙනරූපං තවෙදිසං
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

670. යෙන කම්මෙන දෙවින්ද රූපං මය්හං ගති ච මෙ,
ඉද්ධි ච අනුභාවො ච තං සුණොහි පුරින්දද.

671. අහං රාජගහෙ රම්මෙ සුනන්දනාමුපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.

672. අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනං පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

673. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

674. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
සඤ්ඤමා සංවිභාගා ච විමානං ආවසාමහං

675. පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.

676. පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො.

677. තස්සා මෙ ඤාතිකුලා දසි[1] සදා මාලාභිහාරති,
තාහං භගවතො ථූපෙ සබ්බමෙවාභිරොපයිං.

1. මණිසොණ්ණචිත්තං – සී, ස්‍යා.
2. හෙමජාලකසඤ්ඡන්නං – ස්‍යා.
3. පුරක්ඛිතා – ස්‍යා.
4. ඤාතිකුලං ආසි – ස්‍යා.

665. මම පහන් සිත් ඇතියා රන්රුවනින් විසිතුරු කළ ඔබ්බන ලද මුතුපෙළ ඇති රන්මුවා කැලුම් රැසින් වැසුණු රන් දූලක්, පමණ නොකට හැකි ගුණ ඇති පිරිනිවි ගොයුම් බුදුරදුන් කෙරෙහි පිදුවෙමි.

666. මම බුදුරජුන් වර්ණනා කළ ඒ කුශලකර්මය කොට පහ වූ ශොක ඇත්තී සැප ඇත්තී නිරොගවූවා වෙසෙසින් සතුටු වෙමි.

මල්ලිකාවිමානය යි.

## 3. 9

667. මහත් ඇස් ඇති දෙව්දුව, තී (පෙර අත්බැව්හි) කවර නමැත්තියක් වූවා ද? දිවසරන් සමූහයෙන් පිරිවරන ලද්දී සිත්කලු සිතුලිය වෙනෙහි හාත්පස හැසිරෙහි.

668. යම් කලෙක තව්තිසා වැසි දෙවියෝ මෙ සිතුලිය වනයට පිවිසෙත් ද, (එකල) මෙහි පැමිණියා වූ යාන සහිත වූ රිය සහිත වූ ඒ සියල්ලෝ ම විසිතුරු අයුරු ඇත්තෝ වෙත්.

669. මෙහි පැමිණි මේ උයනෙහි හැසිරෙන තීගේ සිරුරෙහි (පුෂ්පාදීන්) අමුතු විසිතුරෙක් නොපෙනේ. තීගේ රූපය මෙබඳු (පැහැපත්) වූයේ කවර පිනෙකින්ද? (එම්බා) දෙව්දුව, විචාරන ලද්දී මේ විපාකය කවර පුණ්‍යකර්මයක්හුගේ දැයි කියව.

670. දෙව්දුනි, යම් පිනෙකින් මාගේ මේ රූපයත් දිව්‍යගතියත් දිව්‍යර්ධියත් දිව්‍යානුභාවයත් වී ද, සක්දෙව්දුනි, එය අසනු මැනවි.

671. මම පෙර මනරම් වූ රජගහනුවර ශ්‍රද්ධායෙන් හා ශීලයෙන් යුක්ත වූ සියලු කල්හි දන්දීමෙහි ඇලුනු සුනන්‍දා නම් උපාසිකාවක් වීමි.

672. (එකලැ මම) වස්ත්‍ර ද ආහාර ද සෙනසුන් ද පහන් ද සෘජුගුණ ඇත්තවුන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් දුනිමි.

673–74. මම පක්‍ෂය පිළිබඳ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය පක්‍ෂය ද යන පොහෝ දිනයන්හි අටඟින් යුත් පෙහෙවස් විසීමි. සියලු කල්හි නිති සිල්හි ද පිහිටියෙමි. කයින් හා වචනයෙන් සංවෘත වූවා ඉන්‍ද්‍රිය සංවරයෙන් යුක්ත වූවා බෙද දෙන්නී ගෙහි විසීමි.

675. (එකල්හි මම) පණිවායෙන් දුරුවීමි, මුසවායෙන් සංයතවීමි. අයිනාදනින් ද මිසහසරින් ද රහමෙර පිමෙන් ද දුරුවීමි.

676. පස් සිකපද රැක්මෙහි ඇලුණු චතුරාර්‍යසත්‍යයෙහි දක්‍ෂවූ මම යසස් ඇති පසැස් ඇති ගෞතම බුදුරජුන්ගේ උපාසිකාවක් වීමි.

677. ඒ මට දිනපතා නෑ කුලයෙන් දැස්සක් මල්මාලා ගෙන එයි. මම ඒ සියල්ලම බුදුරජාණන් වහන්සේගේ ධාතුචෛත්‍යයට පූජා කෙළෙමි.

678. උපොසථෙ චහං ගන්ත්වා මාලාගන්ධවිලෙපනං,
ථූපස්මිං අභිරොපෙසිං පසන්නා සෙහි පාණිහි.

679. තෙන කම්මෙන දෙවින්ද රූපං මය්හං ගති ච මෙ,
ඉද්ධි ච අනුභාවො ච යං මාලං අභිරොපයිං.

680. යඤ්ච සීලවතී ආසිං න තං තාව විපච්චති,
ආසා ච පන මෙ දෙවින්ද සකදාගාමිනී සියන්ති.

විසාලක්ඛී විමානං.

## 3. 10

681. පාරිච්ඡත්තකෙ කොවිළාරෙ රමණීයෙ මනොරමෙ,
දිබ්බං මාලං ගන්ථමානා ගායන්තී සම්පමොදසි.

682. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්දා නිච්ඡරන්ති සවණීයා මනොරමා.

683. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුචිගන්ධා මනොරමා.

684. විවත්තමානා කායෙන යා වෙණීසු පිළන්ධනා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා.

685. වටංසකා වාතධූතා වාතෙන සම්පකම්පිතා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා.

686. යාපි තෙ සිරස්මිං මාලා සුචිගන්ධා මනොරමා,
වාති ගන්ධා දිසා සබ්බා රුක්ඛො මඤ්ජූසකො[1] යථා.

687. ඝායසෙ තං සුචිං ගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

688. පභස්සරං අච්චිමන්තං වණ්ණගන්ධෙන සංයුතං[2],
අසොකපුප්ඵමාලාහං බුද්ධස්ස උපනාමයිං.

689. තාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදාමනාමයාති.

පාරිච්ඡත්තක විමානං.

### පාරිච්ඡත්තකවග්ගො තතියො.

තස්සුද්දානං:–

උළාරං[3] උච්ඡුපල්ලඞ්කං[4] ලතා ච ගුත්තිලෙන ච
දද්දල්ල සෙසවතී මල්ලි[5] විසාලක්ඛි පාරිච්ඡත්තකො
වග්ගො තෙන පවුච්චතීති.

---

1. මඤ්ජුසකො – මජ්සං.
2. සංයුතං – මජ්සං.
3. උළාරො – මජ්සං.
4. උච්ඡුපල්ලඞ්කො – මජ්සං.
5. සෙසවතිමල්ලිකා – මජ්සං.

678. පොහෝ දිනයෙහි ගොස් මම පහන් සිත් ඇත්ති සියතින් ම මල් ගඳ විලවුන් සෑයට පිදුවෙමි.

679. දෙවිඳුනි, යම් මාලාවක් පූජා කෙළෙම් ද, ඒ (කුශලකර්මයෙන්) මාගේ රූපයත් දිව්‍යගතියත් දිව්‍යර්ධියත් දිව්‍යානුභාවයත් විය.

680. යම් හෙයකින් මම සිල්වත් වීම් ද ඒ ශීලය මෙතෙක් විපාක නො දෙයි. දෙවිඳුනි, කෙසේ නම් මම සෙදගැමිනියක් වන්නෙම් දැයි මාගේ පැතුමෙක් ද වන්නේ යි.

**විසාලක්ඛි විමාන යි.**

## 3. 10

681. (එම්බා දෙව්දුව) තී රමණීය වූ සිත්කලු වූ පරසතු නම් කොබෝලීල මල් රැගෙන දිව්කුසුම් දම් ගොතන්නී ගයන්නී මැනැවින් සතුටු වෙහි.

682. නටන්නා වූ ඒ තීගේ අඟපසඟින් කන්කලු වූ මනරම් දිව්‍ය ශබ්දයෝ සර්වප්‍රකාරයෙන් නික්මෙති.

683. නටන්නාවූ ඒ තීගේ අඟපසඟින් පිරිසිදු සුවඳැති මනරම් වූ දිව්‍යගන්‍ධයෝ සර්වප්‍රකාරයෙන් හමත්.

684. (තීගේ) ශරීරය සැලෙන කල්හි කෙස් වෙණියෙහි යම් පළඳනාවෝ වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරු නද සේ ඇසේ.

685. මද සුළඟින් සැලෙන සුළඟින් වෙසෙසින් සැලෙන මුදුන් මල්කඩහු වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරු නද සේ ඇසේ.

686. තීගේ හිසෙහි පිච්තුරු සුවඳැති මනරම් වූ යම් මල්දමක් වේ ද, එහි සුවඳ (සුපිපි) මඤ්ජුසක වෘක්‍ෂය සේ සියලු දිගුන් පැතිර හමයි.

687. ඒ පිච්තුරු සුවඳ ආඝ්‍රාණය කෙරෙහි. ඒ දිව්‍යමය වූ රූපය දකිහි. (එම්බා) දෙව්දුව, (මා විසින්) විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක්හුගේ දැ යි කියව.

688. මම පබසර කැලුම් ඇති පැහැයෙන් හා සුවඳින් යුක්ත වූ හෝපලු මල්දමක් බුදුරජුන්ට පිදුවෙමි.

689. මම බුදුරදුන් විසින් පසස්නා ලද ඒ කුශල කර්මය කොට පහ වූ ශොක ඇතියා සුව ඇතියා නිරෝග වූවා වෙසෙසින් සතුටු වෙමි.

**පාරිච්ඡත්තක විමාන යි.**

## තෙවෙනි පාරිච්ඡත්තක වර්ගය නිමි.

**එහි උද්දානය:-**

උළාර යැ, උච්ඡුදායිකා යැ, පල්ලඞ්කා යැ, ලතා යැ ගුත්තිල ය සමග යැ, දද්දල්ලමානා යැ, සෙසවතී යැ, මල්ලිකා යැ, විසාලක්ඛි යැ, පාරිච්ඡත්තකයැ යි එයින් වර්ගය කියනු ලැබේ.

## 4. 1

690. මඤ්ජෙට්ඨකෙ[1] විමානස්මිං සොණ්ණවාලුක සන්ථතෙ,
පඤ්චඞ්ගිකෙන තුරියෙන රමසි සුප්පවාදිතෙ.

691. තස්මා විමානා ඔරුය්හ නිම්මිතා රතනාමයා,
ඔගාහසි සාලවනං පුප්ඵිතං සබ්බකාලිකං

692. යස්ස යස්සෙව සාලස්ස මූලෙ තිට්ඨසි දෙවතෙ,
සො සො මුඤ්චති පුප්ඵානි ඔනමිත්වා දුමුත්තමො

693. වාතෙරිතං සාලවනං ආධූතං දිජසෙවිතං,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛො මඤ්ජූසකො යථා

694. සායසෙ තං සුචිං ගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති

695. අහං මනුස්සෙසු මනුස්සභූතා දසී අයිරකුලෙ අහුං,
බුද්ධං නිසින්නං දිස්වාන සාලපුප්ඵෙහි ඔකිරිං

696. වටංසකං ච සුකතං සාලපුප්ඵමයං අහං,
බුද්ධස්ස උපනාමෙසිං පසන්නා සෙහි පාණිහි.

697. තාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදමනාමයාති.

මඤ්ජෙට්ඨක විමානං.

## 4. 2

698. පභස්සර වරවණ්ණනිභෙ
සුරත්තවත්ථ නිවාසනෙ[2]
මහිද්ධිකෙ චන්දනරුචිරගත්තෙ
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං

699. පල්ලඞ්කො ච තෙ මහග්ඝො
නානාරතනචිත්තිතො රුචිරො
යත්ථ ත්වං නිසින්නා විරොචසි
දෙවරාජාරිව[3] නන්දනෙ වනෙ

700. කිං ත්වං පුරෙ සුචරිතමාචරි භද්දෙ
කිස්ස කම්මස්ස විපාකං අනුභොසි දෙවලොකස්මිං
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති

1. මඤ්ජිට්ඨකෙ – මජ්සං.
2. සුරත්තවත්ථවසනෙ – මජ්සං.
3. දෙවරාජාව – සී.

## 4. 1

690. රන් වැලි අතුළ රතුපළිඟුමිණිමුවා විමන්හි මැනැවින් වැයූ පසඟතුරු රැවින් ඇලෙහි.

691. (පෙර පිනෙන්) නිර්මිත රුවන්මුවා ඒ විමනින් බැස සියලු කලට සුදුසු සැප ඇති හැම කල්හි පිපී සිටි සල්වනයට පිවිසෙහි.

692. (එම්බා) දෙව්දුව, (තෝ) යම් යම් සල් රුකක්මුලැ සිටිහි ද, ඒ ඒ උතුම් රුක නැමී මල් මුදලයි.

693. සුළඟින් සැලෙන මඳ සුළඟින් සෙමෙන් කම්පා කරන ලද සල්වනය (මොනර කොවුල් ආදි) විහඟුන් විසින් සෙවුනේ වෙයි. (එහි) සුගන්ධය මඤ්ජූසක රුක සේ සියලු දිගුන් පැතිර හමයි.

694. ඒ පිවිතුරු සුවඳ ආඝ්‍රාණය කෙරෙහි. ඒ දිව්‍යමය රූපය දකිහි. (එම්බා) දෙව්දුව, මා විසින් විචාරනලද්දී මේ විපාකය කිනම් කර්‍මයක්හු ගේ ද යි කියව.

695. මම පෙර මිනිසුන් කෙරෙහි මිනිස් දුවක් වූවා සැමි කුලයෙහි දැස්සක් වීමි. (ඒ මම) වැඩහුන් බුදුරජුන් දැක සල්මලින් විසිරැවීමි.

696. මම පහන් සිත් ඇත්තී මැනැවින් කළ සල්මල් බහුල කොට ඇති මුදුන්මල්කඩක් බුදුරජුන්ට සියතින් පිදීමි.

697. මම බුදුරදුන් විසින් පසස්නාලද ඒ කුශලකර්‍මය කොට පහවූ ශොක ඇතියා සුව ඇතියා නීරොගවූවා වෙසෙසින් සතුටු වෙමි.

මඤ්ජෙට්ඨක විමාන යි.

## 4. 2

698. ප්‍රභාස්වර වූ උතුම් වූ වර්‍ණයෙන් බබළන අතිරක්ත වූ වස්ත්‍ර හැඳි මහත් ඉදුහ ඇති සඳුන් අලෙව් කළාක් වැනි මනරම් සිරිරි අවයව ඇති (එම්බා) හොබනා දෙව්දුව, මා වඳනෙහි. ති කවරක් ද?

699. නඳුනුයනෙහි සක්දෙව් රජු සේ තී යම් අස්නෙකැ හුන්නි බබළන්නෙහි ද, තීගේ (මේ) පලඟ මහඟු ය, නන් රුවනින් විසිතුරු කරන ලද්දේ මනහර ය.

700. සොඳුර, පෙර තී කිනම් සුචරිතයක් කෙළෙහි ද? දෙව්ලොවැ කිනම් කර්‍මයක්හුගේ විපාකය (මෙසේ) අනුභව කෙරෙහි ද? (එම්බා) දෙව්දුව, විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්‍මයක්හුගේ ද යි කියව.

701. පිණ්ඩාය තෙ චරන්තස්ස
මාලං ඵාණිතඤ්ච අදදං භන්තෙ
තස්ස කම්මස්සිදං විපාකං
අනුභොමි දෙවලොකස්මිං

702. හොති ච මෙ අනුතාපො
අපරද්ධං[1] දුක්කතඤ්ච මෙ භන්තෙ
සාහං ධම්මං නාස්සොසිං
සුදෙසිතං ධම්මරාජෙන

703. තං තං වදමි භද්දන්තෙ
යස්ස මෙ අනුකම්පියො
කොචි ධම්මෙසු තං සමාදපෙථ[2]
සුදෙසිතං ධම්මරාජෙන

704. යෙසං අත්ථි සද්ධා බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝරතනෙ ච,
තං[3] තෙ මං අතිවිරොචන්ති ආයුනා යසසා සිරියා

705. පතාපෙන වණ්ණෙන උත්තරිතරා
අඤ්ඤෙ මහිද්ධිකතරා මයා දෙවාති

**පභස්සර විමානං.**

## 4. 3

706. අලඞ්කතා මණිකඤ්චනාචිතං
සුවණ්ණජාල විතතං[4] මහන්තං
අභිරුය්හ ගජවරං සුකප්පිතං
ඉධාගමා වෙහාසයං[5] අන්තලික්ඛෙ

707. නාගස්ස දන්තෙසු දුවෙසු නිම්මිතා
අච්ඡොදිකා පදුමිනියො සුඵුල්ලා
පදුමෙසු ච තුරියගණා පභිජ්ජරෙ
ඉමා ච නච්චන්ති මනොහරායො

708. දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1. අපරාධං – ස්‍යා.
2. සමාදපෙථ – ස්‍යා.
3. තං ඉතිපදං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සතෙ.
4. සොවණ්ණජාලචිතං – මජ්සං.
5. වෙහායසං මජ්සං.

701. වහන්ස, පිඬු පිණිස හැසිරෙන ඔබවහන්සේට දැසමන් මල්දමක් ද උක්හකුරුපැනක් ද දුනිමි. (මම) ඒ කර්‍මයෙහි මේ විපාකය දෙව්ලොවැ විඳිමි.

702. වහන්ස, මට විපිළිසරෙක් ද වෙයි. මට ම වැරැදිණි. නපුරෙක් ද කරන ලදි. ඒ මම ධර්‍මරාජන් වූ බුදුරජුන් විසින් මැනවින් දෙසූ ධර්‍මය නො ඇසීමි.

703. වහන්ස, එහෙයින් එය ඔබට කියමි. යම් කිසිවෙක් මට අනුකම්පා කරන්නේවේ ද (හෙතෙම) ඒ මා ධර්‍මරාජයන් වහන්සේ විසින් මනාකොට දෙසනලද (සීලාදි) ධර්‍මයන්හි සමාදන් කරවනු මැනව.

704. බුදුරුවන්හි ද දමුරුවන්හි ද සඟුරුවන්හි ද යම් දෙව් කෙනෙකුන්ගේ සැදැහැ ඇත්තේ නම් ඒ දෙවියෝ ආයුෂයෙන්, යසසින් හා සිරියෙන් ඒ මා ඉක්මවා බබළත්.

705. අන්‍ය දෙවියෝ අනුභාවයෙන් වර්‍ණයෙන් මට වඩා උත්තරීතරයහ. මහත් ඉදුහ ඇතියහ.

පහසසර විමාන යි.

## 4. 3

706. සියලු අබරණින් සැරසුණු තෙපි මිණි කසුනෙන් කරන ලද රුවන් දැලින් ගැවසීගත් මහත් වූ (ගමන සන්තාහයෙන්) සන්නද්ධ වූ අහස්ගත උතුම් ඇතකු මත නැගී අහසින් මෙහි පැමිණියහු.

707. ඇත් රජුගේ දෙදළෙහි, පැහැදි දිය ඇති සුපිපි පියුම් ඇති පොකුණු දෙකෙක් පහළ විය. පියුම් මත පසහතුරු සමූහයෝ ප්‍රභෙදයට යෙත් (වාදනය වෙත්). මේ මනහර දෙවඟනෝ ද නටත්.

708. මහත් අනුභාව ඇති දෙව්දුව, (තී) දිව්‍යර්ධියට පැමිණියා වෙහි. මිනිස් දුවක් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ සිරිරි පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?

709. බාරාණසියං උපසඞ්කමිත්වා
බුද්ධස්සහං වත්ථයුගං අදසිං
පාදානි වන්දිත්වා ඡමා නිසීදිං
විත්තා චහං අඤ්ජලිකං අකාසිං

710. බුද්ධො ච මෙ කඤ්චනසන්නිභත්තචො
අදෙසයී සමුදයදුක්ඛනිච්චතං
අසඞ්ඛතං දුක්ඛනිරොධසස්සතං
මග්ගං අදෙසෙසි[1] යතො විජානියං

711. අප්පායුකී කාලකතා තතො චුතා
උපපන්නා තිදසගණං යසස්සිනී
සක්කස්සාහං[2] අඤ්ඤතරා පජාපතී
යසුත්තරා නාම දිසාසු විස්සුතා'ති

නාග විමානං.

## 4. 4

712. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා

713. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

714. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

715. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵල'න්ති

716. අහං ච බාරාණසියං බුද්ධස්සාදිච්චබන්ධුනො,
අදසිං සුක්ඛකුම්මාසං පසන්නා සෙහි[3] පාණිහි

717. සුක්ඛාය අලොණිකාය ච පස්ස ඵලං කුම්මාසපිණ්ඩියා,
අලොමං සුඛිතං දිස්වා කො පුඤ්ඤං න කරිස්සති

1. අදෙසයී – මජසං.
2. සක්කස්සහං – මජසං.
3. සකෙහි – PTS.

709. මම බරණැසට එළඹ බුදුරජුන්ට වස්ත්‍ර යුග්මයක් දුනිමි. පා වැඳ බිම හිඳගතිමි. තුටු වූ මම ඇඳිලි ද කෙළෙමි.

710. යම් ධර්මදෙශනාවකින් (මම) සිවුසස් දහම් පිළිවිදුයෙම් ද, කසුන්වන් සිවි ඇති බුදුරජාණන් වහන්සේ සමුදය දුඃඛ සත්‍යයන්ගේ අනිත්‍යතාව මට දෙශනා කළසේක. තවද, අසංස්කෘත වූ ශාශ්වත දුඃඛ නිරොධය වූ නිර්වාණය ද කෙලෙස් නසන ආර්‍ය්‍යමාර්ගය ද දෙශනා කළසේක.

711. මඳ ආයු ඇති ඒ මම කලුරිය කළා එයින් ච්‍යුත වූවා දෙවියන් අතර උපන්නී යසස් ඇත්තී වීමි. සක්දෙව් රජහුගේ එක්තරා භාර්‍ය්‍යාවක් වූ මම (දෙදෙව්ලොවැ) දිගුන්හි පතළා වූ **යසුත්තරා** නම් වෙමි.

**නාගවිමාන යි.**

## 4. 4

712. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී දවහත් තරුව සේ සිටීනෙහි.

713. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තීගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

714. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?

715. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසූ ය.

716. මම ද බරණැස දී සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන්ට පහන් වූවා සියතින් වියළි කොමු පිඩුවක් දුනිමි.

717. වියළි ලුණු නැති කොමුපිඩු දනයෙහි විපාකය ද බලනු මැනවි. (වියළි කොමුපිඩු පමණක් දී) සුඛිත වූ අලොමාව දැක කවරෙක් පින් නො කරන්නේ ද?

718. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

719. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාවෙ
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති

**අලොමා විමානං[1].**

## 4. 5

720. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා

721. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

722. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

723. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

724. අහං අන්ධකවින්දස්මිං බුද්ධස්සාදිච්චබන්ධුනො,
අදාසිං කොලසම්පාකං කඤ්ජිකං[2] තෙලධූපිතං

725. පිප්ඵල්‍යා ලසුණෙන ච මිස්සං ලාමඤ්ජකෙන ච,
අදාසිං උජ්ජුභූතස්මිං[3] විප්පසන්නෙන චෙතසා

726. යා මහෙසිත්තං කාරෙය්‍ය චක්කවත්තිස්ස රාජිනො
නාරී සබ්බඞ්ගකල්‍යාණී භත්තුචානොමදස්සිකා
එතස්ස කඤ්ජිකදානස්ස කලං නාග්ඝති සොළසිං

727. සතං නික්ඛා සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එතස්ස කඤ්ජිකදානස්ස කලං නාග්ඝන්ති සොළසිං

1. අලොම විමානං – මජසං.
2. කඤ්ජියං – කත්ථචි
3. උජුභූතෙසු – කත්ථචි

718. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

719. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

අලෝමාවිමාන යි.

## 4. 5

720. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී ඳවහත් තරුව සේ සිටිනෙහි.

721. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළවෙත් ද?

722. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මෙ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි, කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

723. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මෙ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි (මෙසේ) පැවසූ ය.

724. මම අන්‍ධකවින්ද රටදී සූර්යබන්ධු වූ බුදුරජුන්ට තෙලින් දුහුන් කරනලද කොලසම්පාක නම් බෙහෙත් කැඳක් දුනිමි.

725. තිප්පිලි සුදුලූනු සුවඳ හොටින් මිශ්‍ර වූ බෙහෙත් කැඳක් ඍජු වූ බුදුරජුන් වෙත වෙසෙසින් පහන් සිතින් දුනිමි.

726. සියලු අඟපසඟින් සොබනා වූ සැමියාහට නො ලමු දැකුම් ඇති යම් ස්ත්‍රියක් තොමෝ සක්විති රජකුට අගමෙහෙසි බව කරන්නී ද, එය මේ හඹුදනෙහි සොළොස්වන කලාවෙන් කලාවටත් නො අගී.

727. සියක් දහසක් රන්නික ද සියක් දහසක් අස්සු ද සියක් දහසක් අස් වෙළෙඹුන් යෙදූ රිය ද පැළැඳි මිණි කොඬොල් ඇති සියක් දහසක් කන්‍යාවෝ ද මෙ කැඳ දුන් ඵලයෙහි සොළොස්වැනි කලාවෙන් කලාවකුදු නො අගිත්.

728. සතං හෙමවතා නාගා ඊසාදන්තා උරූළ්හවා
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පන වාසසා[1]
එතස්ස කඤ්ජිකදනස්ස කලං නාග්ඝන්ති සොළසිං

729. චතුන්නමපි[2] දීපානං ඉස්සරං යොධ කාරයෙ,
එතස්ස කඤ්ජිකදනස්ස කලං නාග්ඝති සොළසි'න්ති.

**කඤ්ජිකදායිකා විමානං.**

## 4. 6

730. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති[3] දිසා සබ්බා ඔසධී විය තාරකා

731. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්දා නිච්ඡරන්ති සවණීයා මනොරමා

732. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුචිගන්ධා මනොරමා

733. විවත්තමානා කායෙන යා වෙණීසු පිළන්ධනා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා

734. වටංසකා වාතධූතා වාතෙන සම්පකම්පිතා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා

735. යාපි තෙ සිරස්මිං මාලා සුචිගන්ධා මනොරමා,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛො මඤ්ජූසකො යථා

736. ඝායසෙ තං සුචිං ගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵල'න්ති

737. සාවත්ථියං මය්හං සඛී භදන්තෙ
සඞ්ඝස්ස කාරෙසි මහාවිහාරං
තත්ථප්පසන්නා අහමනුමොදිං
දිස්වා අගාරඤ්ච පියඤ්ච මෙතං

738. තායෙව මෙ සුද්ධනුමොදනාය
ලද්ධං විමානං අබ්භුතං දස්සනෙය්‍යං
සමන්තතො සොළස යොජනානි
වෙහාසයං ගච්ඡති ඉද්ධියා මම

739. කූටාගාරා නිවෙසා මෙ විභත්තා භාගසො මිතා,
දද්දල්ලමානා ආභන්ති සමන්තා සතයොජනං

1. හෙමකප්ප නිවාසසා -- PTS
2. චතුන්නම්පි ච – කත්ථචි.
3. ඔභාසන්ති – කත්ථචි.

728. ශ්‍රේෂ්ඨ වූ රියහිස් වැනි දළ ඇති ඒාමජව පරාක්‍රමයෙන් වැඩෙන රුවන් මුවා ගෙල බරණින් සැරසූ රන්එබූ ඇත් අබරණින් හොබනා සියයක් හෙමවත ඇත්හු මේ කැඳදුන් ඵලයෙහි සොළොස්වැනි කලාවෙන් කලාවකුදු නො අගිත්.

729. මෙලොව යමෙක් සිවුමහදිවයිනට අධිපති සක්විතිරජබව කෙරේද, එය මේ කැඳ දුන් ඵලයෙහි සොළොස්වැනි කලාවෙන් කලාවකුදු නො අගී.

**කඤ්ජිකදායිකා විමාන යි.**

## 4. 6

730. (එම්බා) දෙව්දුව, යම්බඳුවූ නෝ මනා රුසිරෙන් සියලු දස දිගුන් බබුළුවන්නී දවහන් තරුව සේ සිටිනෙහි.

731. නටන්නා වූ ඒ තීගේ අඟපසඟින් කත්කලු වූ මනරම් දිව්‍ය ශබ්දයෝ සර්වප්‍රකාරයෙන් නික්මෙති.

732. නටන්නාවූ ඒ තීගේ අඟ පසඟින් පිරිසුදු සුවඳැති මනරම් වූ දිව්සුවඳ සර්වප්‍රකාරයෙන් හමයි.

733. තීගේ ශරීරය සැලෙන කල්හි කෙස් වෙණියෙහි යම් පළඳනාවෝ වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරුනද සේ ඇසේ.

734. මඳ සුළඟින් සැලෙන සුළඟින් වෙසෙසින් සැලෙන මුදුන් මල්කඩහු වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරුනද සේ ඇසේ.

735. තීගේ හිසෙහි පිවිතුරු සුවඳැති මනරම වූ යම මල්දමෙක් වේද, එහි සුවඳ (සුපිපි) මඤ්ජුසක වෘක්ෂය සේ සියලු දිගුන් පැතිරැ හමයි.

736. ඒ පිවිතුරු සුවඳ ආඝ්‍රාණය කෙරෙහි, ඒ දිව්‍යමය වූ රූපය දකිහි. (එම්බා) දෙව්දුව, මා විසින් විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක්හුගේ දැයි කියව.

737. වහන්ස, මාගේ යෙහෙළි (වූ විසාඛා) තොමෝ සැවැත්නුවරැ සඞ්ඝයා උදෙසා මහවෙහෙරක් කරවූ ය. එහි පහන් වූ මම ඒ මහත් වූ ප්‍රාසාදය ද මට ප්‍රිය වූ බුද්ධප්‍රමුඛ සඞ්ඝයා උදෙසා කළ එබඳු මහාධනපරිත්‍යාගය ද දැක පින් අනුමෝදන් වීමි.

738. ඒ මාගේ පිරිසුදු අනුමොදනායෙන් දැකුම්කලු අසිරිමත් මේ විමන ලබන ලදි. මාගේ පුණ්‍යර්ධියෙන් (ඒ විමන) අහසෙහි හාත්පස සොළොස් යොදුන් තැන් පැතිරැ පවතී.

739. කොටස් විසින් බෙදූ ප්‍රමාණවත් කරන ලද කුළුගෙවල් ඇති බබළන මාගේ නිවෙස්හු හාත්පස සියක් යොදුන් තැන් බබළත්.

740. පොක්ඛරඤ්ඤො ච මෙ එත්ථ පුථුලොමනිසෙවිතා,
අච්ඡොදිකා විප්පසන්නා සොණ්ණවාලුකසන්ථතා

741. නානාපදුමසඤ්ඡන්නා පුණ්ඩරීකසමොතතා,
සුරභි සම්පවායන්ති මනුඤ්ඤා මාලුතෙරිතා

742. ජම්බුයො පනසා තාලා නාළිකෙරවනානි ච,
අන්තො නිවෙසනෙ ජාතා නානා රුක්ඛා අරොපිමා

743. නානා තුරියසඞ්ඝුට්ඨං අච්ඡරාගණඝොසිතං,
යො'පි මං සුපිනෙ පස්සෙ සො'පි විත්තො සියා නරො

744. එතාදිසං අබ්භුතං දස්සනියං[1] විමානං සබ්බසො පභං,
මම කම්මෙහි නිබ්බත්තං අලං පුඤ්ඤානි කාතවෙති

745. තායෙව තෙ සුද්ධානුමොදනාය
ලද්ධං විමානං අබ්භුතං දස්සනීයං.
යා චෙව සා දානමදාසි නාරී
තස්සා ගතිං බ්‍රෑහි කුහිං උප්පන්නා සා ති

746. යා සා අහු මය්හං සකී භරියා
සඞ්ඝස්ස කාරෙසි මහාවිහාරං
විඤ්ඤාතධම්මා සා අදාසි දානං
උප්පන්නා[2] නිම්මාණරතීසු දෙවෙසු

647. පජාපතී තස්ස සුනිම්මිතස්ස
අචින්තියො කම්මවිපාකො තස්සා
යමෙතං පුච්ඡසි කුහිං උප්පන්නා සා'ති
තං තෙ වියාකාසිං අනඤ්ඤථා අහං

748. තෙනහි අඤ්ඤෙපි[3] සමාදපෙථ
සඞ්ඝස්ස දානානි දදාථ විත්තා
ධම්මඤ්ච සුණාථ පසන්නමානසා
සුදුල්ලභො ලද්ධො මනුස්සලාභො

749. යං මග්ගං මග්ගාධිපතානුදෙසයි[4]
බ්‍රහ්මස්සරො කඤ්චන සන්නිභත්තචො
සඞ්ඝස්ස දානානි දදාථ විත්තා
මහප්ඵලා යත්ථ භවන්ති දක්ඛිණා

---

1. අබ්භුත දස්සනෙය්‍යං - මජසං.
2. උපපන්නා - සීමු
3. තෙනහඤ්ඤෙපි - මජසං.
4. මග්ගාධිපති අදෙසයි - මජසං.

740. මෙහි මට දිව්‍යමසුන් විසින් සෙවුනා නො කැළඹුණු පිරිසුදු දිය ඇති රන්වන් වැලි ඇතුරු පොකුණු ද වෙති.

741. නොයෙක් පියුමෙන් වැසුණු හෙල පියුමෙන් හාත්පස පැතුරුණු මනරම වූ පවනින් කම්පිත වූ පිරිසුදු සුවඳ හමයි.

742, දඹ කොස් තල් පොල් වනයෝ ද රොපණය නොකළාවූ ම නොයෙක් වෘක්ෂයෝ ද නිවෙස් තුළ හටගත්තාහ.

743. නන්තුරු රැවින් හඬ නැගුණු දෙවඟනන් විසින් සොභිත වූ මා යමෙක් සිහිනෙන් දකින්නේ ද, ඒ මිනිස් තෙමේ ද ප්‍රීත වන්නේය.

744. මෙබඳු අසිරිමත් දැකුම්කලු වූ සියලු ලෙසින් පැහැපත් වූ විමානය මාගේ කුශලකර්මයෙන් උපන්නේ ය. එහෙයින් පින් කිරීම සුදුසු ය.

745. තිගේ ඒ පිරිසිදු අනුමොදනාවෙන් ලත් විමන අසිරිමත් ය. දැකුම්කලු ය. යම ඒ ස්ත්‍රියක් තොමෝ දන් දුන්නි ද, ඕ තොමෝ කොහි උපන්නි දැයි ඇගේ ගතිය කියව.

746. වහන්ස, ඒ මාගේ යම් යෙහෙළියක් තොමෝ සඞ්ඝයා උදෙසා මහවෙහෙරක් කරවූ ද, පිළිවිදි සිවුසස් දහම් ඇත්ති දන් දුන්නී ද, ඕ තොමෝ නිර්මාණරතී නම් දෙවියන් අතර උපන්නී ය.

747. (ඕතොමෝ) ඒ සුනිර්මිත දෙවිඳුන්ගේ බිරිඳ වූවා ය. ඇයගේ කර්මවිපාකය නො සිතිය හැකි ය. ඕතොමෝ කොහි උපන්නී දැ යි මේ යමක් විචාරහි ද, එය නොපට වම ඇති සැටියෙන් පැවැසීමි.

748. එ කරුණෙන් සෙස්සන් ද කුසල් දහම්හි සමාදන් කරවූ: සතුටු වූවාහු සඞ්ඝයාට දන්දෙවු. පැහැදුණු සිතැත්තෝ දහම් ද අසවු. අතිශයින් දුර්ලභ වූ මනුෂ්‍යත්වය ලද්දේ (ද එහෙයිනි).

794. බ්‍රහ්මස්වර ඇති රන්වන්සිවි ඇති බුදුරජාණන් වහන්සේ යම් සුගතිගාමී මාර්ගයක් ශ්‍රෙෂ්ඨ යයි වදාළසේක් ද, යමකු විෂයෙහි දක්ෂිණා තොමෝ මහත්ඵල වන්නී ද (තෙපි) සතුටු වූවාහු ඒ සඟනට දන් දෙවු.

750. යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි

751. චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො

752. යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතං ඔපධිකං පුඤ්ඤං සඞ්ඝෙ දින්නං මහප්ඵලං

753. එසො හි සඞ්ඝො විපුලො මහග්ගතො
එසප්පමෙය්‍යො උදධීව සාගරො
එතෙහි සෙට්ඨා නරවීරසාවකා
පභඞ්කරා ධම්මමුදීරයන්ති

754. තෙසං සුදින්නං සුහුතං සුයිට්ඨං
යෙ සඞ්ඝමුද්දිස්ස දදන්ති දානං
සා දක්ඛිණා සඞ්ඝගතා පතිට්ඨිතා
මහප්ඵලා ලොකවිදූන වණ්ණිතා

755. එතාදිසං යඤ්ඤමනුස්සරන්තා
යෙ වෙදජාතා විචරන්ති ලොකෙ
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති

විහාරවිමානං.

භාණවාරං දුතියං.

4. 7

756. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා

757. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

758. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

750. බුද්ධාදි සත්පුරුෂයන් විසින් පසස්නාලද යම් ආයර්‍ය පුද්ගලයෝ වෙත් ද, ඔහු අටදෙනෙකි. තෙල යුගයෝ සතර දෙනෙකි. බුදුරදුන්ගේ ශ්‍රාවක වූ ඒ ආයර්‍ය පුද්ගලයෝ දක්ෂිණාවට නිස්සහ. මුන්වහන්සේ කෙරෙහි දෙනලද දනයෝ මහත්ඵල වෙත්.

751. මාර්ගස්ථයෝ සිවුදෙනෙක, ඵලස්ථයෝ සිවු දෙනෙක, මේ සඞ්ඝ තෙමේ ඍජු වූයේ යැ. (ආයර්‍ය වූ) ප්‍රඥාශීලසමාධි ඇත්තේ යැ.

752. යම් සඟරුවනක් කෙරෙහි දුන් දෙය පින්පල කැමැති ව දන් දෙන්නා වූ මිනිසුන්ට මහත්ඵල වේ ද, (එබඳු) ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන පින් කෙරේවා.

753. මේ සඞ්ඝ තෙමේ ගුණයෙන් මහත්බවට ගියේ ය. (ඵලවිපුල-ත්වයට හෙතුභාවයෙන්) විපුල වූයේ ය. මේ සඞ්ඝ තෙමේ උදධි නම් සාගරය සේ ගුණයෙන් පමණ නොකටහැක්කේ ය. ලොවට නැණලු කරන්නා වූ තෙල ශ්‍රේෂ්ඨ වූ නරවීරශ්‍රාවකයෝ ම නිවන්මඟ දක්වත්.

754. යම් කෙනෙක් සඟුන් උදෙසා දන් දෙත් ද, ඔවුන් විසින් (එය) මැනැවින් දෙනලද ය. ගෙනවුත් පුදනලද ය. මහදන් විසින් යාග කරනලද ය. සඟුන් කෙරෙහි පිහිටියා වූ ඒ සඞ්ඝගත වූ දක්ෂිණා තොමෝ මහත්ඵල ඇතැ යි බුදුරජුන් විසින් වර්ණනා කරන ලදු.

755. හටගත් සොම්නස් ඇති යම් කෙනෙක් මුල් සහිත ව මසුරු මල දුරු කොට ලොකයෙහි හැසිරෙත් ද, ඔහු නින්ද නො කරන ලද්දෝ සගලොවට පැමිණෙත්.

විහාරවිමාන යි.

## දෙවන බණවර යි.

## 4. 7

756. (එම්බා) දෙව්දුව, යම්බඳු වූ ති මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී දවහත් තරුව සේ සිටිනෙහි.

757. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘඬ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත්ද?

758. මහත් අනුභාව ඇති දෙව්දුව, ති විචාරමි මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්ති වෙහි ද.

759. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

760. ඉන්දීවරානං හත්ථකං අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එසිකානං උන්නතස්මිං
නගරවරෙ පණ්ණකතෙ රම්මෙ

761. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

762. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති (ඉන්දීවරදායිකා)

763. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා

764. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

765. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

766. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

767. නීලුප්පලහත්ථකං අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එසිකානං උන්නතස්මිං
නගරවරෙ පණ්ණකතෙ රම්මෙ

768. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

769. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති (නීලුප්පලදායිකා)

770. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා

759. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවසූ ය.

760. මම එසිකා රට උස්බිම් පෙදෙසක පිහිටි මනරම් වූ උතුම් **පණ්ණකත** නම් නුවර පිඬු පිණිස හැසිරෙන භික්ෂුනමක්හට ඇසළ මල් කලඹක් දුනිමි.

761. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

762. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද? (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. (ඉන්දීවරදයිකා)

763. (එම්බා) දෙව්දුව, යම්බඳුවූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී ඳවහත් තරුව සේ සිටිනෙහි.

764. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු(කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

765. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ සිරුරු පැහැය ද සියලුදිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

766. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවැසූ ය.

767. මම එසිකාරට උස් බිම් පෙදෙසක පිහිටි මනරම් වූ උතුම් **පණ්ණකත** නම් නුවර පිඩු පිණිස හැසිරෙන භික්ෂු නමක්හට නිලුපුල් කලඹක් දුනිමි.

768. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

769. මහත් අනුභාව ඇති ශ්‍රමණයන්වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. (නීලුප්පලදයිකා)

770. (එම්බා) දෙව්දුව, යම්බඳුවූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී ඳවහත් තරුව සේ සිටිනෙහි?

771. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

772. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා,
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

773. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

774. ඔදාතමූලකං හරිතපත්තං
උදකස්මිං සරෙ ජාතං අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එසිකානං උන්නතස්මිං
නගරවරෙ පණ්ණකතෙ රම්මෙ

775. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

776. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති (ඔදාතමූලදායිකා)

777. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ.
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා

778. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

779. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

780. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵල'න්ති

781. අහං සුමනා සුමනස්ස සුමනමකුළානි
දන්තවණ්ණානි අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
එසිකානං උන්නතස්මිං
නගරවරෙ පණ්ණකතෙ රම්මෙ

771. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධවේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු කවර පිනෙකින් තිට පහළ වෙත් ද?.

772. මහත් අනුභාව ඇති දෙව්දුව, ති විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහිද? තිගේ මෙ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?

773. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී වෙ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගෙ දූ යි (මෙසේ) පැවසූ ය.

774. මම එසිකා රට උස්බිම් පෙදෙසක පිහිටි මනරම් වූ උතුම් වූ **පණ්ණකත** නම් නුවර පිඩු පිණිස හැසිරෙන භික්ෂුනමක්හට විළ්දියෙහි හටගත් පලාවන් පිණිපත් ඇති සුදුමුල් ඇති පියුම් කළඹක් දුනිමි.

775. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි, ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද; ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

776. මහත අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද. (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. (ඔදනමූලදයිකා)

777. (එම්බා) දෙව්දුව; යම්බඳු වූ තෝ මිනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී දවහත් තරුව සේ සිටිනෙහි.

778. කවර හෙතුවකින් තිට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු කවර පිනෙකින් තිට පහළ වෙත් ද?.

779. මහත් අනුභාව ඇති දෙව්දුව, ති විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?.

780. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්ති මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවසූය.

781. **සුමනා** නම් වූ මම **එසිකා** රට උස්බිම් පෙදෙසක පිහිටි මනරම් වූ උතුම් **පණ්ණකත** නම් නුවර පිඩු පිණිස හැසිරෙන මනා සිතැති භික්ෂුනමක්හට ලියූ ඇත්දළ පැහැඇති දැසමන් මල්කැකුළු දුනිමි.

782. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

783. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති (සුමනමකුළදායිකා)

**චතුරිත්ථිවිමානං.**

## 4. 8

784. දිබ්බං තෙ අම්බවනං රම්මං පාසාදෙත්ථ මහල්ලකො,
නානා තුරියසඞ්ඝුට්ඨො අච්ඡරාගණ ඝොසිතො

785. පදීපො චෙත්ථ ජලති නිච්චං සොවණ්ණමයො මහා,
දුස්සඵලෙහි රුක්ඛෙහි සමන්තා පරිවාරිතො

786. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

787. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'ති

788. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵල'න්ති

789. අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
විහාරං සඞ්ඝස්ස කාරෙසිං අම්බෙහි පරිවාරිතං

790. පරියොසිතෙ විහාරෙ කාරෙන්තෙ නිට්ඨිතෙ මහෙ,
අම්බෙ අච්ඡාදයිත්වාන[1] කත්වා දුස්සමයෙ ඵලෙ

791. පදීපං තත්ථ ජාලෙත්වා භොජයිත්වා ගණුත්තමං,
නියාදෙසිං තං සඞ්ඝස්ස පසන්නා සෙහි පාණිහි

792. තෙන මෙ අම්බවනං රම්මං පාසාදෙත්ථ මහල්ලකො,
නානාතුරිය සඞ්ඝුට්ඨො අච්ඡරාගණ ඝොසිතො

1. අම්බෙහි ඡදයිත්වාන – මජසං.

782. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

783. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දුවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්ති වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. (සුමනමකුළදායිකා)

**චතුරිත්ථිවිමාන යි.**

## 4. 8

784. (එම්බා දෙව්දුව) තිගේ දිව්‍යමය වූ අඹවනය සිත්කලු ය. මෙහි නොයෙක් තුරු රැවින් සොපිත වූ අප්සරා සමූහයා විසින් හඬ නැගුණු මහත් වූ පහයෙක් වෙයි.

785. මෙහි රන්මුවා මහපහනෙක් නිතර දිලෙයි. හාත්පස වස්ත්‍රමය ඵලඇති වෘක්ෂයන්ගෙන් පිරිවරන ලද්දේ ය.

786. කවර හෙතුවකින් තිට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නාවූ සම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?

787. මහත් අනුභාව ඇති දෙව්දුව, ති විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තිගේ මේ සිරුරු පැහැයද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?

788. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූ තොමෝ තුටුසිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසූ ය.

789. මම පෙර අත්බැව්හි මිනිස්ලොවැ මිනිසුන් අතර මිනිස් දුවක් වූවා අඹරුක්වලින් පිරිවැරුණු විහාරයක් සඟුන් උදෙසා කරවීමි.

790. විහාරය නිමි කල්හි පූජාව නිමි කල්හි වස්ත්‍රමයඵල කොට අඹරුක් සරසා,

791. එහි පහනක් දල්වා උතුම්වූ සඞ්ඝයා වළඳවා පහන් වූවා සියතින් එය සඞ්ඝයාට පිළිගැන්වීමි.

792. (වහන්ස) එයින් මාගේ අඹවනය සිත්කලු ය. මෙහි නොයෙක් තුරු රැවින් හඬ නැගුණු දිව්‍යප්සරා සමූහයෙන් සොභිත වූ මහත් පහයෙක් වෙයි.

793. පදීපො චෙත්ථ ජලති නිච්චං සොවණ්ණමයො මහා,
දුස්සඵලෙහි රුක්ඛෙහි සමන්තා පරිවාරිතො

794. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

795. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී'ති

**අම්බවිමානං.**

## 4. 9

796. පීතවත්ථෙ පීතධජෙ පීතාලඞ්කාරභූසිතෙ,
පීතචන්දනලිත්තඞ්ගෙ පීතඋප්පලමාලිනි[1]

797. පීතපාසාදසයනෙ පීතාසනෙ පීතභාජනෙ,
පීතඡත්තෙ පීතරථෙ පීතස්සෙ පීතබීජනෙ.

798. කිං කම්මමකරී භද්දෙ පුබ්බෙ මානුසකෙ භවෙ,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵල'න්ති.

799. කොසාතකී නාම ලතත්ථි භන්තෙ තිත්තිකා අනභිජ්ඣිතා,[2]
තස්සා චත්තාරි පුප්ඵානි ථූපං අභිහරිං අහං.

800. සත්ථු සරීරමුද්දිස්ස විප්පසන්නෙන චෙතසා,
නාස්ස මග්ගං අවෙක්ඛිස්සං තදග්ගමනසා[3] සතී.

801. තතො මං අවධී ගාවී ථූපං අපත්තමානසං,
තඤ්චාහං අභිසඤ්චෙය්‍යං භීයො නූන ඉතො සියා.

802. තෙන කම්මෙන දෙවින්ද මඝවා දෙවකුඤ්ජර,
පහාය මානුසං දෙහං තව සහව්‍යතමාගතා,ති[4]

803. ඉදං සුත්වා තිදසාධිපති මඝවා දෙවකුඤ්ජරො,
තාවතිංසෙ පසාදෙන්තො මාතලිං එතදබ්‍රවී,ති.

---

1. පීතුප්පලමධාරිනී, – ස්‍යා,
පීතුප්පලමාලිනී – PTS.
2. තිත්තිකා අනභිච්ඡිතා – මජසං.
3. තතග්ගමනසා – ම ජ සං.
තදඞ්ගමනසා – ස්‍යා,
4. සහබ්‍යමාගතාති – මජසං.

793. මෙහි රන්මුවා මහ පහනෙක් නිතර දිලෙයි. හාත්පස වස්ත්‍රමය ඵල ඇති වෘක්ෂයන්ගෙන් පිරිවැරුණේ ය.

794. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නාවූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

795. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දූවක් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

අම්බවිමාන යි.

## 4. 9

796. රන්වන් වත් ඇති රන්වන් ධද ඇති රන්වන් අබරණින් සැරසුණු රන්සඳුන් අලෙවිදූන් සිරුරු ඇති රන්උපුල්මල් පැළඳි,

797. රන් පහයෙන් හා රනින් පිරිකෙව් කළ යහනින් හෙබි රන් ආසන ඇති රන්වනබඳුන් ඇති රන්සත් ඇති රන්රිය ඇති රන්අසුන් ඇති රන් වල් විදුනා ඇති.

798. සොඳුර, තී පෙර මිනිස්ලොවැ කිනම් කුශලකර්මයක් කෙළෙහි ද? (එම්බා) දෙව්දූව, විචාරනලද්දී මේ කිනම් කර්මයක්හුගේ විපාකයක් දැ යි කියව.

799. යක්රජතුමනි, කොසාතකී (වැටකොළු) යි ප්‍රසිද්ධ වැලක් ඇත්තේ ය. බලාපොරොත්තු රහිත වූ මම ඒ වැලේ මල් සතරක් බුදුරදුන්ගේ ධාතු චෛත්‍යය කරා ගෙන ගියෙමි.

800. ශාස්තෘන් වහන්සේගේ ධාතුශරීරය උදෙසා වෙසෙසින් පහන් සිතින් ඒ සෑය කෙරෙහි ගිය සිත් ඇත්තී ඒ දෙන ආ මග නො දැක්කෙමි.

801. එහෙයින් (ඒ) දෙන සෑය වෙත නො ගියසිත් ඇති (අසම්පූර්ණවූ පූජාමය මනදෙළ ඇති) මා මැරී ය. ඉදින් මම ඒ පින් රැස් කෙළෙම් නම් මෙයට වඩා උතුම සැපතක් වන්නේ යයි සිතමි.

802. දෙවේන්ද්‍රය, මඝවත් නම් දෙවොත්තමය, ඒ කර්මයෙන් මිනිස් සිරුර හැරපියා ඔබගේ සහභාවයට පැමිණියා වෙමි.

803. තිදස් පුරට අධිපති වූ මඝවත් නම් දෙවශ්‍රෙෂ්ඨයා මේ මෙබස් තව්තිසා වැසියන් පහදවනුයේ මාතලි දෙව්පුත්හට මෙය කීයේ ය.

804. පස්ස මාතලි අච්ඡෙරං චිත්තං කම්මඵලං ඉදං,
අප්පකම්පි කතං දෙය්‍යං පුඤ්ඤං හොති මහප්ඵලං.

805. නත්ථි චිත්තෙ පසන්නම්හි අප්පිකා[1] නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ.

806. එහි මාතලි අම්හෙපි භිය්‍යො භිය්‍යො මහෙමසෙ,
තථාගතස්ස ධාතුයො සුඛො පුඤ්ඤනමුච්චයො.

807. තිට්ඨන්තෙ නිබ්බුතෙ චාපි සමෙ චිත්තෙ සමං ඵලං,
චෙතොපණිධිහෙතුහි සත්තා ගච්ඡන්ති සුග්ගතිං.

808. බහුන්නං[2] වත අත්ථාය උප්පජ්ජන්ති තථාගතා,
යත්ථ කාරං කරිත්වාන සග්ගං ගච්ඡන්ති දායකා,ති.

පීත විමානං.

## 4. 10

809. ඔභාසයිත්වා පඨවිං සදෙවකං
අතිරොචසි චන්දිමසූරියා විය
සිරියා ච වණ්ණෙන යසෙන තෙජසා
බ්‍රහ්මා ව දෙවෙ තිදසෙ සඉන්දකෙ.

810. පුච්ඡාමි තං උප්පලමාලධාරිණි
ආවෙළිනි කඤ්චන සන්නිභත්තචෙ
අලඞ්කතෙ උත්තමවත්ථධාරිණි
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං.

811. කිං ත්වං පුරෙ කම්මමකාසි අත්තනා
මනුස්සභූතා පුරිමාය ජාතියා
දානං සුචිණ්ණං අථ සීලසඤ්ඤමං
කෙනූපපන්නා සුගතිං යසස්සිනී.
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵල’න්ති.

812. ඉදානි භන්තෙ ඉමමෙව ගාමං
පිණ්ඩාය අම්හාක ඝරං උපාගමී
තතො තෙ උච්ඡුස්ස අදාසිං ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියා.

1. අප්පකා – මජ්සං.
2. බහුනං – මජ්සං.

804. මාතලී, අසිරිමත් වූ විසිතුරු වූ මේ කර්මඵලය බලව, දියයුත්ත ස්වල්ප විසින් නමුත් දෙනලද්දේ ද (එහි) පින මහත්ඵල ඇත්තේ වේ.

805. තථාගත සම්බුදුන් කෙරෙහි හෝ උන්වහන්සේගේ සව්වන් කෙරෙහි හෝ සිත පහන් කල්හි දෙන දක්ෂිණා තොමෝ ස්වල්ප වූවා නම් නො වේ.

806. මාතලී, එව අපිදු තථාගතයන් වහන්සේගේ ධාතූන් වඩ වඩාත් පුදමු. පින් රැස්කිරීම සැප වේ.

807. ධරමාන බුදුරදුන් කෙරෙහි ද පිරිනිවි බුදුරදුන් කෙරෙහි ද සමසිත් ඇති කල්හි සම විපාක වේ. ඒ එසේ මැ යි, චිත්තප්‍රණිධිය හෙතුකොටගෙන සත්ත්වයෝ සුගතියට යෙත්.

808. යමකු කෙරෙහි පූජා සත්කාර කොට දයකයෝ සුගතියට යෙත් ද, (ඒ) තථාගතවරයෝ එකාන්තයෙන් ම බොහෝදෙනාට වැඩ පිණිස උපදිත්.

**පීතවිමාන යි.**

## 4. 10

809. (එම්බා දෙව්දුව තෝ) සඳ හිරු මෙන් අහස පොළොව එකලු කොට අතිශයින් බබළහි. ශොභාවෙන් ද ශරීර වර්‍ණයෙන් ද පරිවාරයෙන් ද ස්වකීය අනුභාවයෙන් ද ඉන්‍ද්‍රයා සහිත තව්තිසා වැසි දෙවියන් ඉක්මවා බබළන බ්‍රහ්මයා මෙනි.

810. උපුල්මල් දරන රුවන්මුවා මලින් නැගුණු රැළි ඇති රන්වන් සිවි ඇති උතුම් වත් දරන සැරසුණු සොඳුරු දෙව්දුව, මා වඳනෙහි. (ඒ) තෝ කවරැයි විචාරමි.

811. තෝ පෙර අත්බැව්හි මිනිස්දුවක් වූවා කිනම කර්මයක් කෙළෙහි ද? මැනවින් දන් දෙනලදද ද? නැතහොත් සිල් රක්නා ලද ද? කුමකින් යසස් ඇතිව සුගතියෙහි උපන්නී වෙහි ද? (එම්බා) දෙව්දුව, විචාරනලද්දී මේ විපාකය කවර කර්මයක්හුගේ දූ යි කියව.

812. වහන්ස, මෙකල්හි (භික්ෂුනමක්) පිඬු පිණිස මේ ගමෙහි අප ගෙට එළඹියේ ය. ඉක්බිති උන්වහන්සේට පහන් සිතැත්ති ඉමහත් ප්‍රීතියෙන් උක්දඬුකඩක් පිදුවෙමි.

813. සස්සු ච පච්ඡා අනුයුඤ්ජතෙ මමං
කහං නු උච්ඡු වධකෙ අවාකිරි
න ඡඩ්ඩිතං නො පන ඛාදිතං මයා
සන්තස්ස භික්ඛුස්ස සයං අදාසහං.

814. තුය්හංනවිදං ඉස්සරියං අථො මම
ඉතිස්සා[1] සස්සු පරිභාසතෙ මමං
ලෙඩ්ඩුං ගහෙත්වා පහාරං අදාසි මෙ
තතො චුතා කාලකතාම්හි දෙවතා.

815. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
දෙවෙහි සද්ධිං පරිචාරයාමහං
මොදාමහං කාමගුණෙහි පඤ්චහි.

816. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
දෙවින්දගුත්තා තිදසෙහි රක්ඛිතා
සමප්පිතා කාමගුණෙහි පඤ්චහි

817. එතාදිසං පුඤ්ඤඵලං අනප්පකං
මහාවිපාකා මම උච්ඡුදක්ඛිණා
දෙවෙහි සද්ධිං පරිචාරයාමහං
මොදාමහං කාමගුණෙහි පඤ්චහි.

818. එතාදිසං පුඤ්ඤඵලං අනප්පකං
මහාජුතිකා මම උච්ඡුදක්ඛිණා
දෙවින්දගුත්තා තිදසෙහි රක්ඛිතා
සහස්සනෙත්තොරිව[2] නන්දනෙ වනෙ.

819. තුවඤ්ච භන්තෙ අනුකම්පකං විදුං
උපෙච්ච වන්දිං කුසලඤ්ච පුච්ඡිසං
තතො තෙ උච්ඡුස්ස අදාසිං ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියාති.

උච්ඡු විමානං.

## 4. 11

820. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

821. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

1. ඉතිස්ස - PTS
2. සහස්සනෙත්තොරිය – කම්බො

813. පසුව නැන්දණියෝ "යෙහෙළිය, උක්දඬුකඩ කොහි දැමුවෙහි ද" යි මා විචාළහ. එය මා විසින් බැහැර නො දමන ලද. නො ද අනුභව කරන ලදි. මම සන්සුන් කෙලෙස් ඇති භික්ෂුනමක්හට පිදුවෙමි.

814. ගෙහි මේ අධිපතිභාවය තිගේ ද, නැතහොත් මාගේ දැ යි මෙසේ නැන්දණියෝ මට පරිභව කළහ. නැවත කැටක් ගෙන මට පහර දුන්හ. කලුරියකළා වූ මම එයින් සැව දෙව්දුවක් වූවා වෙමි.

815. මා විසින් ඒ කුශලකර්මය පමණක් කරන ලදී. තමා විසින් (කරන ලද) ඒ කුශලකර්මය කරණ කොටගෙන ම (මේ) සැප විඳිමි. මම දෙවියන් සමග හැසිරෙමි. මම පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

816. මා විසින් ඒ කුශල කර්මය පමණක් කරන ලද. තමා විසින් (කරන ලද) ඒ කුශල කර්මය කරණ කොට ගෙන (මේ) සැප විඳිමි. සක් දෙවිඳුන් විසින් ගොපිත වූ තව්තිසා වැසි දෙවියන් විසින් රක්නා ලද මම පස්කම් ගුණයෙන් යුක්ත වූවා වෙමි.

817. මාගේ උක්දඬු පූජාව මහත් විපාක ඇත්ති ය. එයින් මෙබඳු අනල්ප වූ පුණ්‍යඵලයෙක් වෙයි. මම දෙවියන් සමග හැසිරෙමි. මම පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

818. ඒ මාගේ උක්දඬුපූජාව මහත් අනුභාව ඇත්තිය. මෙබඳු අනල්ප වූ පුණ්‍යඵලයෙක් වෙයි. සක්දෙවිඳුන් විසින් ගොපිත වූ තව්තිසාවැසි දෙවියන් විසින් රක්නා ලද මම නඳුන් වෙනෙහි සක්දෙව්රජු මෙන් (ප්‍රීත වෙමි.)

819. වහන්ස, මම කාරුණික වූ නුවණැත්තා වූ ඒ ඔබ වෙත පැමිණ වැන්දෙමි. නිරොග බව ද විචාළෙමි. ඉක්බිති පහන්සිත් ඇති මම ඉමහත් ප්‍රීතියෙන් ඔබ වහන්සේට උක්දඬුකඩක් පූජා කෙළෙමි.

උච්ඡුවිමාන යි.

## 4. 11

820. (එම්බා) දෙව්දුව, යම්බඳුවූ තෝ මනා රුසිරෙන් සියලු දිගුන් බබුළුවන්නී දවහත් තරුව සේ සිටිනෙහි.

821. කවර හෙතුවකින් තිට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තිගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත්ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තිට පහළ වෙත් ද?.

822. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ,
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී’ති.

823. සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

824. අහං මනුස්සෙසු මනුස්සභූතා
දිස්වාන සමණෙ සීලවන්තෙ
පාදානි වන්දිත්ව මනං පසාදයිං
විත්තාමහං අඤ්ජලිකං අකාසිං.

825. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

826. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී’ති.

වන්දන විමානං.

## 4. 12

827. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
හත්ථෙ පාදෙ ච[1] විග්ගය්හ නච්චසි සුප්පවාදිතෙ.

828. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්ද නිච්ඡරන්ති සවනීයා මනොරමා.

829. තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුචිගන්ධා මනොරමා.

830. විවත්තමානා කායෙන යා වෙණීසු පිළන්ධනා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා.

831. වටංසකා වාතධූතා වාතෙන සම්පකම්පිතා,
තෙසං සුයති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා.

832. යාපි තෙ සිරස්මිං මාලා සුචිගන්ධා මනොරමා,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛො මඤ්ජූසකො යථා.

833. ඝායසෙ තං සුචිගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති.

1. හත්ථපාදෙ ච – මජසං.

822. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූවා කවර පිනක් කෙළෙහි ද? තීගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙහි ද?.

823. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙව්දූතොමෝ තුටු සිත් ඇත්තී මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවසූවා ය.

824. (වහන්ස) මම පෙර මිනිසුන් අතර මිනිස් දූවක් වූවා සිල්වත් මහණුන් දැක පා වැඳ සිත පැහැදවීමි. තුටුසිත් ඇති මම ඇඳිලි ද කෙළෙමි.

825. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

826. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් දූවක් වූ මම යම්කිසි පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තී වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**වන්‍දන විමාන යි.**

## 4. 12

827. (එම්බා) දෙව්දුව යම්බඳු වූ නෝ මනා රුසිරෙන් යුක්තව මනහර වැයුම් පවත්නා කල්හි අත් පා විවිධාකාරයෙන් ගෙන නටන්නෙහි.

828. නටන්නා වූ ඒ තීගේ අඟපසඟින් හැම ලෙසින් කන්කලු මනරම් දිව්‍යමය ශබ්දයෝ නික්මෙත්.

829. නටන්නා වූ ඒ තීගේ අඟපසඟින් පිරිසුදු සුවඳැති මනරම් වූ දිව්‍යමය ගන්‍ධයෝ හැම ලෙසින් හමත්.

830. (තීගේ) ශරීරය සැලෙන කල්හි කෙස් වෙණියෙහි යම් පළඳනාවෝ වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරුනද සේ ඇසේ.

831. මද සුළඟින් සැලෙන සුළඟින් වෙසෙසින් සැලෙන මුදුන් මල්කඩහු වෙත් ද, ඔවුන්ගේ ශබ්දය පසඟතුරුනද සේ ඇසේ.

832. තීගේ හිසෙහි පිවිතුරු සුවඳැති මනරම් වූ යම් මල්දමෙක් වේ ද එහි සුවඳ (සුපිපි) මඤ්ජුසක වෘක්ෂය සේ සියලු දිගුන් පැතිර හමයි.

833. ඒ පිවිතුරු සුවඳ ආඝ්‍රාණය කෙරෙහි, ඒ දිව්‍යමය වූ රූපය දකිහි. (එම්බා) දෙව්දුව, මා විසින් විචාරන ලද්දී මේ විපාකය කිනම් කර්මයක්හුගේ දූ යි කියව.

834. දාසී අහං පුරෙ ආසිං ගයායං බ්‍රාහ්මණස්සහං,
අප්පපුඤ්ඤා අලක්ඛිකා රජ්ජුමාලාති මං විදූං[1].

835. අක්කොසානං වධානං ච තජ්ජනාය ච උක්කතා,[2]
කුටං ගහෙත්වා නික්ඛම්ම ගච්ඡිං[3] උදකහාරියා.

836. විපථෙ කුටං නික්ඛිපිත්වා වනසණ්ඩං උපාගමිං,
ඉධෙවාහං මරිස්සාමි කො අත්ථො[4] ජීවිතෙන මෙ.

837. දළ්හං පාසං කරිත්වාන ආසුම්භිත්වාන[5] පාදපෙ,
තතො දිසා විලොකෙසිං කො නු ඛො වනමස්සිතො.

838. තත්ථද්දසාසිං සම්බුද්ධං සබ්බලොකහිතං මුනිං,
නිසින්නං රුක්ඛමූලස්මිං ඣායන්තමකුතොභයං.

839. තස්සා මෙ අහු සංවෙගො අබ්භුතො ලොමහංසනො,
කො නු ඛො වනමස්සිතො මනුස්සො උදාහු දෙවතා.

840. පාසාදිකං පසාදනීයං වනා නිබ්බානමාගතං,
දිස්වා මනො මෙ පසීදි නායං යාදිස කීදිසො.

841. ගුත්තින්ද්‍රියො ඣානරතො අබ්භිග්ගතමානසො,
හිතො සබ්බස්ස ලොකස්ස බුද්ධො සො[6]යං භවිස්සති.

842. භයභෙරවො දුරාසදො සීහොව ගුහමස්සිතො,
දුල්ලභායං දස්සනාය පුප්ඵං උදුම්බරං යථා.

843. සො මං මුදූහි වාචාහි ආලපිත්වා තථාගතො,
රජ්ජුමාලෙති මං අවොච[7] සරණං ගච්ඡ තථාගතං.

844. තාහං ගිරං සුණිත්වාන නෙලං අත්ථවතිං සුචිං,
සණ්හං මුදුං ච වග්ගුං ච සබ්බසොකාපනූදනං.

845. කල්ලචිත්තං ච මං ඤත්වා පසන්නං සුද්ධමානසං,
හිතො සබ්බස්ස ලොකස්ස අනුසාසි තථාගතො.

846. ඉදං දුක්ඛන්ති මං අවොච අයං දුක්ඛස්ස සම්භවො,
අයං නිරොධො[8] මග්ගො ච අඤ්ජසො අමතොගධො.

847. අනුකම්පකස්ස කුසලස්ස ඔවාදම්හි අහං ඨිතා,
අජ්ඣගා අමතං සන්තිං නිබ්බාන[9] පදමච්චුතං.

---

1. මං විදූ – සයා, PTS
2. උග්ගතා – මජසං.
3. අගච්ඡිං – මජසං. ආගච්ඡිං – සයා,
4. කිංවත්ථොපි – සයා.
5. ආලම්බිත්වාන – මජසං.
6. බුද්ධො අයං – මජසං.
7. මං වොච – මජසං.
8. දුක්ඛනිරොධො – මජසං, දුක්ඛනිරොධො ච, – සයා.
9. නිබ්බානං – මජසං;

834. මම පෙර ගයාවෙහි එක්තරා බමුණකුගේ දසියක් වීමි. ඒ මා පින්නැති කාලකණ්ණි රජ්ජුමාලා යැ යි (අන්‍යයෝ) දත්හ.

835. ආක්‍රොශයන්ගේ ද වධයන්ගේ ද තර්ජනයෙන් උපන් දෙම්නසින් කළය ගෙන දිය ගෙනෙන්නියක මෙන් නික්ම ගියෙමි.

836. මම මෙහි ම මැරෙන්නෙමි. මාගේ ජීවිතයෙන් කම් කිමැ යි මඟින් බැහැර කළය තබා වන ලැහැබකට පිවිසියෙමි.

837. මළපුඩුව දැඩි කොට ගසෙක එල්වා තබා ඉක්බිති වනය ඇසුරු කළ කවරෙක් ඇත් දෝ යි දිගුන් බැලිමි.

838. එහි රුක්මුල වැඩහුන් ධ්‍යාන කරනසුලු නිර්භය වූ සියලු ලොවට හිතැති මුනීන්ද්‍ර වූ සම්බුදුරජුන් දුටුයෙමි.

839. ඒ මට ලොමුදහගන්වන අද්භූත වූ සංවෙගයෙක් හටගත්තේය. වනය ඇසුරු කළෝ කවරෙක් ද, මිනිසෙක් හෝ දෙවියෙක් හෝ වේ දෝ යි.

840. පැහැදීම එළවන පැහැදියයුතු (කෙලෙස්) වනයෙන් නික්ම නිවනට පැමිණි උන්වහන්සේ දැක මේ තෙමේ එසේ මෙසේ වූවෙක් නො වේ යයි මාගේ සිත පහන් වී.

841. ඒ මේ තෙමේ දැමුණු ඉඳුරන් ඇති දැහැන්හි ඇලුණු නිවනෙහි බැසගත් සිත් ඇති මුළුලොවට හිත වූ බුද්ධ නම් වන්නේ ය.

842. මෙ තෙමේ ගුහාව ඇසුරු කළ සිංහයකු සේ බිය දනවන සුලු ය. ළංවිය නො හැකි ය. දිඹුල්මල් මෙන් දැකීමට දුර්ලභ ය.

843. ඒ තථාගත තෙමේ මුදුවදනින් **රජ්ජුමාලා** යි මා අමතා තථාගතයන් සරණ යවයි මට වදළේ ය.

844. මම නිදෙස් වූ අර්ථවත් පිරිසුදු නො රළු මොළොක් මිහිරි සියලු ශොක දුරු කරන ඒ වචනය අසා,

845. භාවනාකර්මයට යොග්‍ය වූ සිත් ඇති (එහෙයින් ම) පහන් වූ පිරිසුදු සිත් ඇති මා දැන සියලු ලොකයට හිත වූ තථාගත තෙමේ (මට) අනුශාසනා කෙළේ යි.

846. මේ දුඃඛ යයි ද, මේ දුඃඛසමුදය යි ද මේ දුඃඛනිරොධ යයි ද මේ අන්තද්වය වර්ජිත වූ නිර්වාණගාමිනී ප්‍රතිපදසඞ්ඛ්‍යාත මාර්ග යයි ද මට වදළේ යි.

847. මම දක්ෂ වූ කාරුණික වූ බුදුරජුන්ගේ අවවාදයෙහි පිහිටියෙමි නිත්‍ය වූ සියලු දුක් සන්සිඳීම වූ ච්‍යුති රහිත වූ නිර්වාණපදය අවබොධ කෙළෙමි.

848. සාහං අවට්ඨිතා පෙමා දස්සනෙ අවිකම්පිනී,
මූලජාතාය සද්ධාය ධීතා බුද්ධස්ස ඔරසා.

849. සාහං රමාමි කීළාමි මොදාමි අකුතොභයා,
දිබ්බං මාලං ධාරයාමි පිවාමි මධුමද්දවං.

850. සට්ඨිං තුරියසහස්සානි[1] පටිබොධං කරොන්ති මෙ,
ආළම්බො ගග්ගරො භීමො සාධුවාදී ච සංසයො.

851. පොක්ඛරො ච සුඵස්සො ච වීණා මොක්ඛා ච නාරියො,
නන්දා චෙව සුනන්දා ච සොණදින්නා සුචිම්හිතා.

852. අලම්බුසා මිස්සකෙසී ච පුණ්ඩරීකාතිචාරුණී,[2]
එණීඵස්සා සුඵස්සා ච සුභද්දා[3] මුදුවාදිනී.

853. එතා චඤ්ඤා ච සෙය්‍යසා අච්ඡරානං පබොධිකා,
තා මං කාලෙනුපාගන්ත්වා අභිභාසන්ති දෙවතා.

854. හන්ද නච්චාම ගායාම හන්ද තං රමයාමසෙ
නයිදං අකතපුඤ්ඤානං කතපුඤ්ඤානමෙවිදං
අසොකං නන්දනං රම්මං තිදසානං මහාවනං

855. සුඛං අකතපුඤ්ඤානං ඉධ නත්‍ථි පරත්‍ථ ච,
සුඛං ච කතපුඤ්ඤානං ඉධ චෙව පරත්‍ථ ච.

856. තෙසං සහව්‍යකාමානං කත්තබ්බං කුසලං බහුං,
කතපුඤ්ඤා හි මොදන්ති සග්ගෙ භොගසමඞ්ගිනො.

857. බහූනං වත අත්‍ථාය උප්පජ්ජන්ති තථාගතා
දක්ඛිණෙය්‍යා මනුස්සානං පුඤ්ඤක්ඛෙත්තානමාකරා
යත්‍ථ කාරං කරිත්වාන සග්ගෙ මොදන්ති දායකාති.

රජ්ජුමාලා විමානං.

## මඤ්ජෙට්ඨක වග්ගො චතුත්‍ථො.

**තස්සුද්දානං:-**

මඤ්ජෙට්ඨා පභස්සරා නාගා අලොමා කඤ්ජිකදායිකා
විහාරචතුරිත්‍ථම්බා පීතුච්ඡු වන්දනරජ්ජුමාලා
වග්ගො තෙන පවුච්චතීති.

ඉත්‍ථිවිමානං සමත්තං.

1. සට්ඨීතුරියසහස්සානි - මජ්සං.
2. පුණ්ඩරීකාතිදරුණී - මජ්සං,
3. සමසාදද - ස්‍යා. PTS.
4. සෙය්‍යාසෙ - සී.

848. ඒ මම සම්‍යග්දර්ශනයෙහි නො සැලෙන සුලු වූ නො සෙල්විය හැකි දැඩි පෙම් ඇති හටගත් මුල් ඇති සැදැහැයෙන් යුක්ත වැ බුදුරජුන්ගේ ඖරස පුත්‍රියක් වීමි.

849. ඒ මම දැන් නො බිය වූයෙමි මාර්ගඵලරතියෙන් රමණය කරමි. කාමගුණයෙන් ක්‍රීඩා කරමි. එදෙකින් සතුටු වෙමි. දිවමල් දරමි. මධුමද්දව නම් ගහපැන් බොමි.

850. සැටදහසක් තූර්‍ය්‍යයෝ මා පුබුදුවති. එසේ ම ආළම්බ යැ ගග්ගර යැ භීම යැ සාධුවාදී යැ සංසය යැ.

851. පොක්ඛර යැ සුඵස්ස යැ යන දිව්‍යපුත්‍රයෝ ද, වීණා යැ මොක්ඛා යැ යන දිව්‍යස්ත්‍රීහු ද, නන්ද යැ සුනන්ද යැ සොණදින්නා යැ සුචිම්හිතා යැ යන.

852. අළම්බුසා යැ මිස්සකෙසී යැ පුණ්ඩරීකා යැ අතිචාරුණී යැ එණිඵස්සා යැ සුඵස්සා යැ සුභද්ද යැ මුදුවාදිනී යැ යන

853. තෙල අප්සරාවෝ ද, අප්සරාවන් අතුරෙහි සංගීතයෙහි අතිශයින් පැසසියයුතු වූ පුබුදු කරවන අන්‍ය වූ අප්සරාවෝ ද සුදුසු කල්හි මා වෙත පැමිණ මෙසේ කියත්.

954. හොඳයි නටමු, ගයමු, තී සතුටු කරවමු, මේ දෙව්විමන පින් නො කළවුනට නො ලැබේ. තව්තිසා වැසි දෙවියන්ගේ ශොක දුරු කරන මනරම් වූ නන්දන මහාවනය පින් කළවුනට ම ලැබේ.

855. පින් නො කළවුන්ට මෙ ලොව හා පරලොව සැපයෙක් නැත. පින් කළවුන්ට ම මෙලොව හා පරලොව සැප ලැබේ.

856. ඒ තව්තිසාවැසි දෙවියන් හා සහභාවයට යනු කැමැත්තන් විසින් බොහෝ කුසල් කළයුතු වේ. කළ පිනැත්තෝ ම ස්වර්ගයෙහි පස්කම් සැපතින් යුක්ත වූවාහු සතුටු වෙත්.

857. යමකු කෙරෙහි පූජා සත්කාර කොට දයකයෝ සුගතියට යෙත් ද, මිනිසුන්ගේ දක්ෂිණාවට සුදුසුවූ පින්කෙත් වූ ආයාචකයන්ට ආකර වූ (ඒ) තථාගතවරයෝ එකැතින් ම බොහෝ දෙනාට වැඩ පිණිස උපදිත්.

**රජ්ජුමාලාවිමාන යි.**

## සිවුවන මඤ්ජෙට්ඨක වර්ග යි.

**එහි නාමාවලිය:–**

මඤ්ජෙට්ඨ ය, පභස්සර ය, නාග ය, අලොමා ය, කඤ්ජිකදායිකා ය, විහාර ය, චතුරිත්ථි ය, අම්බ ය, පීත ය, උච්ඡු ය, වන්දන ය, රජ්ජුමාලා යි එයින් වර්ගය කියනු ලැබේ.

**ස්ත්‍රී විමාන නිමි.**

## 5. 1

858. කො මෙ වන්දති පාදනි ඉද්ධියා යසසා ජලං,
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසාති.

859. මණ්ඩූකොහං පුරෙ ආසිං උදකෙ වාරිගොචරො,
තව ධම්මං සුණන්තස්ස අවධී වච්ඡපාලකො.

860. මුහුත්තං චිත්තප්පසාදස්ස ඉද්ධිං පස්ස යසඤ්ච මෙ,
අනුභාවං ච මෙ පස්ස වණ්ණං පස්ස ජුතිඤ්ච මෙ.

861. යෙ ච තෙ දීඝමද්ධානං ධම්මං අස්සොසුං ගොතම,
පත්තා තෙ අචලට්ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙති.

**මණ්ඩූකදෙවපුත්තවිමානං.**

## 5. 2

862. චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං.

863. තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතිං ව[1] ආගතන්ති.

864. උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ
අපාරුතං ද්වාරං[2] අදනසීලෙ
නෙස්සාම තං යත්ථ ථුනන්ති දුග්ගතා
සමජ්ජතා[3] නෙරයිකා දුක්ඛෙන.

865. ඉච්චෙව[4] වත්වාන යමස්ස දූතා
තෙ ද්වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතං
පක්කාමයුං දෙවගණස්ස සන්තිකෙති.

866. ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
ව්‍යම්හං සුභං කඤ්චනජාලඡන්නං
කස්සෙතමාකිණ්ණජනං විමානං
සූරියස්ස රංසීරිව ජොතමානං

867. නාරීගණා චන්දනසාරලිත්තා[5]
උභතො විමානං උපසොභයන්ති
තං දිස්සති සූරියසමානවණ්ණං
කො මොදති සග්ගපත්තො විමානෙති.

1. ඤාතීව – මජසං,
2. අපාරුත ද්වාරෙ – මජසං.
   අපාරුත ද්වාරං – PTS
3. සමප්පිතා – සී.
4. ඉච්චෙවං – සයා,
5. චන්දනසාරානුලිත්තා – සයා.

## 5. 1

858. දිව ඉදුහයෙන් හා යසසින් හා බබළමින් මනහර රුසිරෙන් සියලු දිගුන් බබුළුවමින් කවරෙක් මාගේ පා වඳී ද?

859. මම පෙර අත්බැව්හි දියෙහි උපන්නෙම් දියෙහි හැසිරෙන මැඩියෙක් වූයෙමි. ඔබ වහන්සේගේ ධර්මය අසද්දී ගොපල්ලෙක් (මා) මැරීය.

860. මොහොතක් සිත පැහැදුණු මාගේ ඍද්ධිය ද යසස ද බලනු මැනැවි. මාගේ අනුභාවය ද බලනු මැනවි. මාගේ ශරීර වර්ණය හා පැතිරෙන ප්‍රභාව ද බලනු මැනැවි.

861. ගෞතමයන් වහන්ස, යම් කෙනෙක් ඔබවහන්සේගේ ධර්මය දිගු කලක් ඇසුවාහු ද ඔහු යම් තැනෙක ගොස් ශොක නොකරත් ද, ඒ අචලස්ථානයට පැමිණියාහු ය.

**මණ්ඩූක දෙවපුත්ත විමාන යි.**

## 5. 2

862. බොහෝ කලක් නොරට විසූ දුර සිට සැපසේ පැමිණි පුරුෂයකු දක නෑ මිතුරු සුහදයෝ ඒ පැමිණියහු (යම්සේ) සතුටින් පිළිගනිත් ද,

863. එසේම කළ පිනැති මෙලොවින් පරලොව ගිය පුහුලා ද පැමිණි ප්‍රිය නෑයකු මෙන් පුණ්‍යයෝ තුමූ පිළිගනිත්.

864. සුපවිටු දහම් ඇති නො දෙනසුලුවූ රෙවතිය, නැගී සිටුව දෙර නො වසන ලදි. දුගතියට ගියාවූ නිරා දුකින් යුක්ත වූ නෙරයිකයෝ යම් තැනක (පව නො ගෙවෙන තුරු දැඩි දුක් විඳිමින්) තතනත් ද, එහි ති පමුණු වන්නෙමු.

865. යමදූත වූ ලේවන් ඇස් ඇති මහත් වූ ඒ යක්‍ෂයෝ මෙසේ කියා වෙන වෙන ම දැතින් රේවතිය අල්වාගෙන (තව්තිසා වැසි) දෙව්ගණයා වෙත පැමිණ වූහ.

866. හිරු රැස් බඳු පැහැ ඇති මනහර වූ පැහැසර වූ යහපත් වූ කසුන් දැලින් ගැවසුණු ජනයාගෙන් පිරුණු හිරුරැස් මෙන් බබළන විසීමට රිසි මේ විමානය කවරක්හුගේ ද?

867. සඳුන්හර සුවඳින් අලෙව්දුන් සිරුරු ඇති දිව්‍ය ස්ත්‍රී සමූහයෝ විමන් (ඇතුළත පිටත) දෙපස හොබවත්. හිරුට සමාන පැහැ ඇති ඒ විමන පෙනේ. දෙව්ලොව පැමිණි කවරෙක් (මේ) විමනෙහි සතුටු වේ ද?

868. බාරාණසියං නන්දියො නාමාසි උපාසකො
අමච්ඡරී දානපතී වදඤ්ඤූ
තස්සෙතමාකිණ්ණජනං විමානං
සූරියස්ස රංසීරිව ජොතමානං.

869. නාරිගණා චන්දනසාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති
තං දිස්සති සූරියසමානවණ්ණං
සො මොදති සග්ගපත්තො විමානෙති.

870. නන්දියස්සාහං භරියා
අගාරිනී සබ්බකුලස්ස ඉස්සරා
භත්තුවිමානෙ රමිස්සාමි දානහං
න පත්ථයෙ නිරයං දස්සනායාති.

871. එසො තෙ නිරයො සුපාපධම්මෙ
පුඤ්ඤං තයා අකතං ජීවලොකෙ
න හි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහබ්‍යතන්ති.

872. කින්නු ගූථඤ්ච මුත්තඤ්ච අසුචි[1] පතිදිස්සති,
දුග්ගන්ධං කිමිදං මීළ්හං කිමෙතං උපවායතීති.

873. එස සංසවකො නාම ගම්භීරො සතපොරිසො,
යත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙති.

874. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං.
කෙන සංසවකො ලද්ධො ගම්භීරො සතපොරිසොති.

875. සමණෙ බ්‍රාහ්මණෙචාපි අඤ්ඤෙවාපි වනිබ්බකෙ,
මුසාවාදෙන වඤ්චෙසි තං පාපං පකතං තයා.

876. තෙන සංසවකො ලද්ධො ගම්භීරො සතපොරිසො,
තත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙ.

877. හත්ථෙපි ඡින්දන්ති අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්ති අථොපි නාසං
අථොපි කාකොළගණා සමෙච්ච
සඞ්ගම්ම ඛාදන්ති විඵන්දමානන්ති.

878. සාධු ඛො මං පටිනෙථ කාහාමි කුසලං බහුං
දානෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච
යං කත්වා සුඛිතා හොන්ති න ච පච්ඡානුතප්පරෙති.

1. අසුචිං - සීමු.

868. බරණැසැ නො මසුරු දනපති වූ වචන දන්නාවූ නන්දිය නම් උපාසකයෙක් විය. ගැවසුණු ජනයා ඇති හිරු රැස් මෙන් බබළන මේ විමන ඔහුගේ ය.

869. සඳුන්හර සුවඳින් අලෙව්දුන් සිරුරු ඇති (දිව්‍යස්ත්‍රීසමූහයෝ) විමන් (ඇතුළත පිටත) දෙපස හොබවත්. හිරුට සමාන පැහැ ඇති ඒ විමන පෙනේ. දෙව්ලොව පැමිණි හෙතෙමේ මේ විමනෙහි සතුටුවේ.

870. ගෘහිණී වූ සියලු කුලයට ඉසුරුවූ (මම ඒ නන්දියගේ බිරිය වෙමි. එහෙයින් හිමි විමනෙහි දූන්) මම සිත් අලවමි. නිරය දුක්මට නො පතමි.

871. සුපවිටු දහම් ඇත්තිය. මෙල තිගේ නිරය ය. තී විසින් මනුලොව දී පිනක් නො කරන ලද. මසුරුවූ අනුන් කුපිත කරවන්නාවූ පවිටු දහම් ඇත්තේ දෙවියන්ගේ සහභාවය නො ලබයි.

872. කිමෙක් ද? මල මූත්‍ර හා අසුචි දක්නා ලැබෙයි. මේ දුගඳ කුමක්ද? මේ කිනම් අසූචි ගඳෙක් හමාද?

873. රේවතිය, තී දහසක් හවුරුදු යම් තැනෙක පැසෙහි ද, මේ ශතපුරුෂප්‍රමාණ ගැඹුරු වූ සංසවක නම් නිරයයි.

874. කිම කයින් වචනයෙන් සිතින් නපුරක් කරන ලද ද? කවර හෙයකින් ශතපුරුෂප්‍රමාණ ගැඹුරු වූ සංසවක නම් නිරය ලබන ලද ද?

875. මහණුන් ද බමුණන් ද සෙසු යාචකයන් ද මුසාවාදයෙන් වඤ්චා කෙළෙහිය. තී විසින් ඒ පාපය කරන ලදී.

876. රේවතිය, එහෙයින් ශතපුරුෂප්‍රමාණ ගැඹුරු වූ සංසවක නිරය ලබන ලද. තී එහි දහසක් හව්රුදු පැසෙහි.

877. අත් ද සිඳිති. යළි පා ද සිඳිති. කන් ද සිඳිති. යළි නැහැය ද සිඳිති. යළි වනකවුඩුමුළුහු එකට එක්රැස්ව සලමින් මස් (විදගෙන) කත්.

878. යම් කුශලයක් කොට සුවපත් වෙත් ද, නො ද පසුතැවෙත් ද, දනයෙන් ද යහපත් පැවැත්මෙන් ද ශීලසංයමයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද, බොහෝ පින් කරන්නෙමි. (එහෙයින්) මා පෙරළා මනුලොවට ගෙන යනු මැනවි.

879 පුරෙ තුවං පමජ්ජිත්වා ඉදානි පරිදෙවසි,
සයං කතානං කම්මානං විපාකං අනුභොස්සසීති.

880. කො දෙවලොකතො මනුස්සලොකං,
ගන්ත්වාන පුට්ඨො මෙ එවං වදෙය්‍ය
නික්ඛිත්තදණ්ඩෙසු දදාථ දානං
අච්ඡාදනං සයන[1]මථන්නපානං
න හි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහබ්‍යතං.

881. සාහං නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං
වදඤ්ඤූ සීලසම්පන්නා කාහාමි කුසලං බහුං
දානෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච.

882. ආරාමානි ච රොපිස්සං දුග්ගෙ සඞ්කමනානි ච,
පපඤ්ච උදපානඤ්ච විප්පසන්නෙන චෙතසා.

883. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

884. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
න ච දානෙ පමජ්ජිස්සං සාමං දිට්ඨමිදං මයාති.

885. ඉච්චෙවං විප්පලපන්තිං ඵන්දමානං තතො තතො,
ඛිපිංසු නිරයෙ ඝොරෙ උද්ධපාදං අවංසිරන්ති.

886. අහං පුරෙ මච්ඡරිනී අහොසිං
පරිභාසිකා සමණබ්‍රාහ්මණානං
විතථෙන ච සාමිකං වඤ්චයිත්වා
පච්චාමහං නිරයෙ ඝොරරූපෙති.

රෙවතීවිමානං.

## 5. 3

887. යො වදතං පවරො මනුජෙසු
සක්‍යමුනී භගවා කතකිච්චො
පාරගතො බලවීරියසමඞ්ගී
තං සුගතං සරණත්ථමුපෙහි.

888. රාගවිරාගමනෙජමසොකං
ධම්මමසඞ්ඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිමං සරණත්ථමුපෙහි

1. සෙය්‍ය – මජසං.

879. තෝ පෙර පමා වී දූන් විලාප කියමින් හඬනෙහි තමා කළ කර්මයට අනුරූප විපාක විඳින්නෙහිය.

880. දෙව් ලොවින් මිනිස් ලොවට ගොස් මවිසින් විචාරන ලද කවරෙක් මසුරු වූ කිපෙනසුළු වූ පවිටු දහම් ඇත්තේ දෙවියන්ගේ සහභාවය නො ලබයි, බඹා තබන ලද දඬු ඇත්තවුන් කෙරෙහි දන් දෙව වත් දෙව සෙනසුන් දෙව අහර පැන් දෙවයි මෙසේ මට කියන්නේ ද,

881. ඒ මම ඒකාන්තයෙන් ම මෙලොවින් සැව මිනිසත් බව ලබා වචන දන්නී ශීලයෙන් යුක්ත වූවා දනයෙන් ද සම පැවැත්මෙන් ද ශීලසංයමයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද බොහෝ පින් කරන්නෙමි.

882. වෙසෙසින් පහන් සිතින් දුර්ගමස්ථානයන්හි හේදඬු ද, පැන් හල් ද, ළිං ද, අරම් වතු වැවීම ද කරන්නෙමි.

883. මම පක්ෂය පිළිබඳ තුදුස්වක ද පසළොස්වක ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය ද යන දිනයන්හි අටඟින් යුතු,

884. පෙහෙවස් වසන්නෙමි. හැමකල්හි සිල්හි සංවෘත වූ මම දනයෙහි පමා නො වන්නෙමි. මෙය මා විසින් තමා ම දක්නා ලදී.

885. මෙසේ නන් දෙඩවන ඔබ මොබ සැලෙන රේවතිය ගෙන පා උඩුකුරු කොට හිස යටිකුරු කොට ඝොර වූ සංසවක නිරයෙහි හෙලුහ.

886. මම පෙර මහණබමුණන්ට බැණවදින සුලුවූ මසුරුලියක් වීමි. මුසවායෙන් සැමියා ද රවටා මේ ගොරබිරම් සැහැවි ඇති (සංසවක) නිරයෙහි පැසෙමි.

**රේවතී විමාන යි.**

## 5. 3

887. මිනිසුන් අතර වාදීන්ගෙන් ශ්‍රෙෂ්ඨ වූ ශාක්‍යමුනීන්ද්‍ර වූ භාග්‍යවත් වූ කළ කිස ඇති නිවනට පැමිණි කායබල ඥාණ බලයෙන් හා ප්‍රධන් වීර්‍ය්‍යයෙන් යුක්ත වූ යමෙක් වේද, ඒ සුගතයන් වහන්සේ වෙත පිහිට පිණිස එළඹෙව.

888. රාගය දුරුකරන්නා වූ තෘෂ්ණා රහිත වූ ශොක රහිත වූ අප්‍රතිකූල වූ මේ මාර්ගඵල නිර්‍වාණධර්මය ද (සියලු කල්හි) මිහිරිවූ ප්‍රගුණ වූ මැනැවින් බෙදූ මේ පර්‍ය්‍යාප්ති ධර්මය ද පිහිට පිණිස එළඹෙව.

889. යත්ථ ච දින්නමහප්ඵලමාහු
චතුසු සුචීසු පුරිසයුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ
සඞ්ඝමිමං සරණත්ථමුපෙහීති.

890. න තථා තපති නභස්මිං[1] සූරියො
චන්දො ච න භාසති න ඵුස්සො
යථා අතුලමිදං මහප්පභාසං
කො නු ත්වං තිදිවා මහිං උපගා.

891. ජිනාති ච[2] රංසි පභඞ්කරස්ස
සාධිකං[3] වීසති යොජනානි ආභා
රත්තිම්පි ච යථා දිවං කරොති
පරිසුද්ධං විමලං සුභං විමානං.

892. බහු පදුම විචිත්ත පුණ්ඩරීකං
වොකිණ්ණං කුසුමෙහි නෙකචිත්තං
අරජවිරජහෙමජාලඡන්නං
ආකාසෙ තපති යථාපි සූරියො.

893. රත්තම්බරපීතවාසසාහි
අගරුපියඞ්ගුචන්දනුස්සදහි
කඤ්චනතනුසන්නිභත්තචාහි
පරිපූරං ගගනංව තාරකාහි

894. නරනාරියො බහුකෙත්ථනෙකවණ්ණා
කුසුමවිභුසිතා භරණෙත්ථ සුමනා
අනිලපමුඤ්චිතා පවන්ති සුරභිං
තපනීයවිතතා සුවණ්ණච්ඡදනා[4].

895. කිස්ස සමදමස්ස[5] අයං විපාකො
කෙනාසි කම්මඵලෙනිධූපපන්නා
යථා ච තෙ අධිගතමිදං විමානං
තදනුපදං අවචාසි ඉඞ්ඝ පුට්ඨාති

896. යමිධපථෙ[6] සමෙච්ච මාණවෙන
සත්ථානුසාසි අනුකම්පමානො
තව රතනවරස්ස ධම්මං සුත්වා
කරිස්සාමීති ච බ්‍රවිත්ථ ජනො.

---

1. නභෙ – මජසං.
2. ජිනාති – මජසං,
3. සාධික – මජසං,
4. සුවණ්ණජනනා – මජසං.
5. සංයමස්ස – මජසං.
6. සයමිධපථෙ – මජසං.

889. යම් ආර්‍ය්‍යසඞ්ඝරත්නයක් කෙරෙහි දෙන ලද්ද මහත් ඵලැයි කීහු ද? පිරිසිදු පුරුෂයුග සතරෙක්හි වූ සිවුසස් හා නිවන් ප්‍රත්‍යක්‍ෂ විසින් දක්නා වූ ඒ පුද්ගලයෝ අටදෙනෙකි, මේ සඞ්ඝයා පිහිට පිණිස එළඹෙව.

890. මහත්සේ ප්‍රාභාස්වර වූ නිරුපම වූ මේ විමන යම්සේ අහසෙහි බබළා ද හිරු ද එසේ නො ද බබළයි. සඳුද නො ද බබළයි, ඵුස නැකැත් තරුව ද නො ද බබළයි. දෙව්ලොවින් මිහිබට තෝ කවරෙහි?

891. (ඒ විමනෙහි) රශ්මිය අයිරා විසි යොදුනක් පැතිරැ හිරු එළිය පවා සිඳලයි. පිරිසිදු විමල් යහපත් (ඒ) විමන රැය ද දහවල මෙන් කෙරෙයි.

892. බොහෝ හෙලපියුම් හා විසිතුරු රන්පියුම් ඇති නන් වැදෑරුම් මලින් ගැවසුණු නන්වැදෑරුම් මල්කම් හා ලිය කමින් විසිතුරු වූ පිරිසිදු නිදෙස් කසුන් දැලින් වැසුණු (විමානය) අහසෙහි හිරුමෙන් බබළයි.

893. රතුවත් කහවත් ඇති අලෙව්දුන් අගිල් පුවඟු සඳුන් ඇඟි කසුන් වැනි සියුම් සිවි ඇති දිව්‍ය ස්ත්‍රීන්ගෙන් පිරුණු මේ විමානය තාරකාවන්ගෙන් පිරුණු අහස මෙනි.

894. මේ විමන්හි නන්වන්වූ දිව කුසුමින් සැරසූ දිව අබරණ ඇති සතුටු සිත් ඇති රන්කෙඳිවලින් ගැවසූ කෙශරවනා ඇති රන් අබරණ පැළඳි දිව්‍ය පුරුෂ ස්ත්‍රීහු බොහෝ වෙත්. මෙහි මඳ සුළඟින් සැලෙන ස්වර්ණමය පුෂ්පයෝ සුවඳ විහිදුවත්.

895. මේ විපාකය තෙපේ කිනම (කායාදි) සංයමයක්හුගේ කිනම් (ඉන්ද්‍රිය දමනාදි) දමයක්හුගේ කිනම් කර්‍මයක්හුගේ ඵල විසින් මෙහි උපන්නේ ද? තා විසින් මේ විමන යම්සේ ලබන ලද ද? විචාරන ලද තෝ මා ඇසූ කරුණට සුදුසු කොට කියව.

896. මේ මහමඟ බමුණු කුමරකු හමුව ශාස්තෘන් වහන්සේ යමකුට අනුග්‍රහ කරනුවෝ අනුශාසනා කළසේක්ද, ඒ උතුම් රත්න වූ ඔබවහන්සේගේ ධර්‍මය අසා පිළිපදින්නෙමියි ඡත්තමාණවක තෙමේ කියේය

897. ජිනවරපවරං[1] උපෙහි[2] සරණං
ධම්මඤ්චාපි තථෙව භික්ඛුසඞ්ඝං
නොති පඨමං අවොචාහං[3] භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

898. මා ච පාණවධං විවිධං චරස්සු අසුචිං
න හි පාණෙසු අසඤ්ඤතං අවණ්ණයිංසු සප්පඤ්ඤා
නොති පඨමං අවොචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

899. මා ච පරජනස්ස රක්ඛිතම්පි
ආදාතබ්බමමඤ්ඤිත්ථ[4] අදින්නං
නොති පඨමං අවොචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

900. මා ච පරජනස්ස රක්ඛිතායො
පරභරියා අගමා අනරියමෙතං
නොති පඨමං අවොචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

901. මා ච විතථං අඤ්ඤථා අභාණි
නහි මුසාවාදං අවණ්ණයිංසු සප්පඤ්ඤා
නොති පඨමං අවොචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

902. යෙන ච පුරිසස්ස අපෙති සඤ්ඤා
තං මජ්ජං පරිවජ්ජයස්සු සබ්බං
නො ච පඨමං අවොචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙවකාසිං.

903. සාහං ඉධ පඤ්චසික්ඛා කරිත්වා
පටිපජ්ජිත්වා තථාගතස්ස ධම්මෙ
ද්වෙපථමගමාසිං චොරමජ්ඣෙ
තෙ මං තත්ථ වධිංසු භොගහෙතු.

904. එත්තකමිදං අනුස්සරාමි කුසලං
තතො පරං න මෙ විජ්ජති අඤ්ඤං
තෙන සුචරිතෙන කම්මුනාහං
උප්පන්නා[5] තිදිවෙසු කාමකාමී.

905. පස්ස ඛණමුහුත්තං සඤ්ඤමස්ස
අනුධම්මපටිපත්තියා විපාකං
ජලමිව යසසා සමෙක්ඛමානා
බහුකා මං පිහයන්ති හීනකම්මා.

1. ජින පවරං – සයා,
2. උපෙමි – බහුසු.
3. අවොචහං – මජසං.
4. ආදාතබ්බමමඤ්ඤිකො – මජසං.
5. උපපන්නා – බහුසු.

897. වහන්ස, (සරණාගමනය දනිහි දැයි ඇසූවිට) මම පළමු කොට නො දනිමියි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි. අත්‍යුත්තම වූ බුදුරදුන් ද එසේම ධර්මය ද සඞ්ඝයා ද පිහිට කොට යමි.

898. අපවිත්‍ර නා නා විධ ප්‍රාණවධය ද නො කරව. පණ්ඩිතයෝ ප්‍රාණීන් කෙරෙහි අසංයමය නො ම වැණූහ. වහන්ස, මම පළමු කොට (පන්සිල් දනිහිදැයි ඇසූවිට) නො දනිමියි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

899. මෙරමා විසින් රක්නා ලද නුදුන් දෙය ගතයුතු යයි නො සිතව. වහන්ස, මම පළමු කොට (පන්සිල් දනිහිදැයි ඇසූවිට) නො දනිමියි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

900. මෙරමා විසින් රක්නා ලද පරඹුවන් කරා නොයව මෙය අනාර්‍ය්‍යය. වහන්ස, මම පළමුකොට (පන්සිල් දනිහි දැයි ඇසූවිට) නො දනිමි යි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

901. අසත්‍යය අසත්‍ය යයි හඟිමින් බොරු නො කියව. පණ්ඩිතයෝ බොරු බස නො වැණූහ. මම පළමු කොට (පන්සිල් දනිහිදැයි ඇසූවිට) නො දනිමියි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

902. යම් සුරා පානයකින් පුරුෂයාගේ සංඥාව පහවේ ද, ඒ සියලු රහමෙර දුරුකරව. වහන්ස, මම පළමු කොට (පන්සිල් දනිහිදැයි ඇසූවිට) නො දනිමියි කියෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේ ම කෙළෙමි.

903. ඒ මම මෙහි පන්සිල් ශික්ෂා පදයන් විගහන්සේගේ ධර්මයෙහි පිළිපැද සොරුන්ගේ මධ්‍යයෙයි දෙමංසන්ධියකට පැමිණියෙමි. එහිදී භොග හෙතුවෙන් සොරු මා මැරූහ.

904. මෙ පමණක් වූ මේ කුශලය සිහි කරමි, එයින් මත්තෙහි අන් පිනෙක් මට නැත්තේ ය. මම ඒ පින්කමින් දෙව්ලොවෙහි රිසි යම්සුව ඇතියෙමි (මේ) දෙව්ලොවෙහි උපන්මි.

905. ඇසිල්ලක් රැකි ශීලයෙහි ද දහම් අනුව පිළිපැදීමෙහි ද විපාකය බැලූව මැනවි. යසසින් දිලියෙන්නකු බඳුවූ මා දක්නා මට වඩා හීන සම්පත් ඇති බොහෝ දෙනා (අපිත් කෙසේ නම් මොහු බඳු වන්නමෝ දැයි) පතත්.

906. පස්ස කතිපයාය දෙසනාය
සුගතිං චම්හි ගතො සුඛඤ්ච පත්තො
යෙ ච තෙ සතතං සුණන්ති ධම්මං
මඤ්ඤෙ තෙ අමතං ඵුසන්ති ඛෙමං

907. අප්පම්පි[1] කතං මහාවිපාකං
විපුලං හොති තථාගතස්ස ධම්මෙ
පස්ස කතපුඤ්ඤතාය ඡත්තො
ඔභාසෙති පථවිං යථාපි සුරියො

908. කිමිදං කුසලං කිමාචරෙම
ඉච්චෙකෙහි සමෙච්ච මන්තයන්ති
තෙ මයං පුනරෙව ලද්ධමානුසත්තං
පටිපන්නා විහරෙමු සීලවන්තො.

909. බහුකාරො අනුකම්පකො ච සත්ථා
ඉති මෙ සති අගමා දිවාදිවස්ස
ස්වාහං උපගතොම්හි සච්චනාමං
අනුකම්පස්සු පුනපි සුණොම[2] ධම්මං

910. යෙ චිධ[3] පජහන්ති කාමරාගං
භවරාගානුසයං පහාය මොහං
න ච තෙ පුන උපෙන්ති[4] ගබ්භසෙය්‍යං
පරිනිබ්බානගතා හි සීතිභූතාති.

ඡත්තමාණවකවිමානං.

## 5. 4

911. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතා[5] සුභා.

912. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

913. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

---

1. අප්පකම්පි – කත්ථචි.
2. සුණොමු – මජසං,
3. යෙධ – ස්‍යා. PTS
4. පුනමුපෙන්ති – මජසං.
5. රුචිරත්ථතා – ස්‍යා, රුචිකත්ථතා, PTS

906. ස්වල්ප වූ දෙශනාවෙකින් සුගතියට ද ගියෙමි. සැපයට ද පැමිණියෙමි වෙමි. බැලුව මැනවි, යම් කෙනෙක් දිනපතා ඔබවහන්සේගේ දහම් අසත් නම් ඔහු හැම උවදුරින් මිදුණු අමාමහ නිවන පහසත් යයි සිතමි.

907. බුදු රජුන්ගේ අවවාදයෙහි (පිහිටා) කළ මඳ පිනද මහත් විපාක ඇත්තේ මහත් ඵල වේ. බැලුව මැනවි. කළ පිනැති බැවින් ඡත්තමානවක තෙමේ හිරු පොළොව මෙන් දෙව්ලොව බබුළුවයි.

908. කුසල් නම් වූ මෙ දැය කෙබඳු ද? කෙසේ හෝ කරමු ද? ඒ අපි නැවත මිනිසත් බව ලබා සිල්වත්ව දහම් පිළිපන්නමෝ වසන්නෙමුයි මෙසේ ඇතැම් දෙවි කෙනෙක් එක්රැස්ව සාකච්ඡා කෙරෙත්.

909. මට ශාස්තෲන් වහන්සේ බොහෝ උපකාර ඇත්සේක. අනුකම්පා කරන සේක. මා ඇතිකල්හි ඉතා දහවල්හි මෙසේ වැඩිසේක. ඒ මම සත්‍ය නම් ඇත්තහු කරා පැමිණියෙමි වෙමි. අනුකම්පා කළ මැනැවි. නැවත ද බණ අසමිහයි කියේ ය.

910. මේ සස්නෙහි යම් කෙනෙක් කාමරාගානුසය දුරලද්ද, මොහය ප්‍රහීණ කිරීමෙන් භවරාගානුසයයන් දුරලද්ද, පිරිනිවන් පැඑහෙයින් ම නිවී සැපාහුණු ඒ රහත්හු තුමූ නැවැත ගැබ හෝනාබවට නො පැමිණෙත්.

ඡත්ත මාණවක විමාන යි.

## 5. 4

911. ඉතා උස් වූ පියුම්රා මිණිඇයෙන් කළ වැම් ඇති මේ විමානය හාත්පස දෙළොස් යොදුනක් තැන වෙරළු මිණියෙන් කළ වැම් ඇති රුවන් පෝරු ඇතුරු බිම් ඇති උදර වූ යහපත් වූ කුළු ගෙවල් සත් සියයෙක් වෙයි.

912. එහි තෝ සිටිනෙහි ය. පානය කරන්නෙහි ය. අනුභව කරන්නෙහි ය. දිව්‍ය වීණාවෝ ද මිහිරිසේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

913. කවර හෙතුවකින් තට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනකින්) තට පහළ වෙත්ද?

914. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

915. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

916. සතිං සමුප්පාදකරො[1] ද්වාරෙ කක්කටකො ඨිතො,
නිට්ඨිතො ජාතරූපස්ස සොභති දසපාදකො.

917. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

918. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

කක්කටකරසදායකවිමානං.

## 5. 5

919. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

920. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

921. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

922. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

923. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්සකම්මස්සිදං ඵලං.

1. සති සමුප්පාදකරො – මජසං.

914. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය තා විචාරමි. මිනිස් වූයේ කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇති වෙහි ද?

915. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍ය ඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවසී ය.

916. රුවනින් නිමවනලද (දෙපසින්) දස පයක් ඇති මෙනම් කුශලයෙන් මේ සම්පත් ලදැයි සිහි උපදවන්නා වූ රන් කකුළුවෙක් දොරටුවෙහි (එල්බ) සිටියේ බබළයි.

917. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

918. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස මිනිස්වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**කක්කටකරස දයක විමාන යි.**

## 5. 5

919. ඉතා උස් වූ පියුම්රා මිණිඇයෙන් කළ වැඹ ඇති මේ විමානය හාත්පස දෙළොස් යොදුනක් තැන වෙරළුමිණියෙන් කළ ටැඹ ඇති රුවන් පෝරු ඇතුරු බිම ඇති උදාර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙයි.

920. එහි ඔබ සිටිනෙහි ය, පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය, දිව්‍ය වීණාවෝ ද මිහිරිසේ වාදනය වෙත්. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරිහු ද රඟ දක්වත්.

921. කවර හෙතුවකින් තට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නාවූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනකින්) තට පහළ වෙත්ද?

922. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය, තා විචාරමි. මිනිස් වූයේ කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තේ වෙහි ද?

923. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍ය ඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවැසීය.

924. දිබ්බං මමං වස්සසහස්සමායු
වාචාභිගීතං මනසා පවත්තිතං
එත්තාවතා ඨස්සති පුඤ්ඤකම්මො
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො.

925. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

926. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දවාරපාලකවිමානං.

## 5. 6

927. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

928. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

929. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

930. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

931. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්සකම්මස්සිදං ඵලං.

932. කරණීයානි පුඤ්ඤානි පණ්ඩිතෙන විජානතා,
සම්මග්ගතෙසු බුද්ධෙසු යත්ථ දින්නං මහප්ඵලං.

924. මාගේ ආයුෂය දිව්‍යමය වූ වර්ෂ සහස්‍රයෙකි. වචනයෙන් පිළිසඳර කරන ලදී. සිතින් පැහැදීම පවත්වන ලදී. මෙ පමණකින් කළ පින් ඇත්තේ දිව්‍ය වූ කාමයන්ගෙන් යුක්තවූයේ වාසය කරන්නේ යි.

925. ඒ පිනෙන් මාගේ සිරිරි පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

926. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුව යි.

දොරපාලක විමාන යි.

## 5. 6

927. ඉතා උස් වූ පියුපරාමිණි ඇයෙන් කළ ටැම් ඇති මෙ විමානය හාත්පස දොළොස් යොදුනක් තැන වෙරළුම්ණියෙන් කළ ටැම් ඇති රුවන් පෝරු ඇතුරු බිම් ඇති උදර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙයි.

928. එහි ඔබ යිවිනෙහි ය, පානය කරන්නෙහිය, අනුභව කරන්නෙහි ය, දිව්‍ය වීණාවෝ ද මිහිරිසේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙත්. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

929. කවර හෙතුවකින් තට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නාවූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනකින්) තට පහළ වෙත් ද?

930. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය, තා විචාරමි. මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙහි ද?

931. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවසී ය:

932. (තමහට හිතාහිත) දන්නා වූ ප්‍රාඥයා විසින් යම් තැනෙක දුන් දෙය මහත් ඵල වේ ද, ඒ මනාව පිළිපන් බුදුවරුන් කෙරෙහි පින් කළ යුතු ය.

933. අත්ථාය වත මෙ බුද්ධො අරඤ්ඤා ගාමමාගතො,
තත්ථ චිත්තං පසාදෙත්වා තාවතිංසූපගො අහං[1]

934. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

935. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

කරණීයවිමානං.

## 5. 7

936. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

937. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

938. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

939. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

940. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්සකම්මස්සිදං ඵලං.

941. කරණීයානි පුඤ්ඤානි පණ්ඩිතෙන විජානතා,
සම්මග්ගතෙසු භික්ඛුසු යත්ථ දින්නං මහප්ඵලං.

---

1. අහුං - සීමු.

933. බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් මට වැඩ පිණිස වනයෙන් (දෙව්රම් වෙහෙරින්) ගමට වැඩීසේක. උන් වහන්සේ කෙරෙහි සිත පහදවා තව්තිසා දෙව්ලොවට (උත්පත්ති විසින්) එළඹියෙම් වෙමි.

934. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

935. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද, සියලු දිගුන් බබුළුවයි.

**කරණීයවිමාන යි.**

## 5. 7

936. ඉතා උස් වූ පියුම්රා මිණිඇටයෙන් කළ ටැම් ඇති මේ විමානය හාත්පස දෙළොස් යොදුනක් තැන වෙරළුමිණියෙන් කළ ටැම් ඇති රුවන්පෝරු ඇතුරූ බිම්ඇති උදාර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙයි.

937. එහි ඔබ සිටිනෙහි ය, පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය, දිව්‍ය වීණාවෝ ද මිහිරියේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරිහු ද රඟ දක්වත්.

938. කවර හෙතුවකින් තට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනකින්) තට පහළ වෙත් ද?

939. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය තා විචාරමි. මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇතිවෙහි ද?

940. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවසීය.

941. (තමහට හිතාහිත) දන්නාවූ ප්‍රාඥයා විසින් යම් තැනෙක දුන් දෙය මහත්ඵල වේද, ඒ මනාව පිළිපන් භික්ෂූන් කෙරෙහි පින් කළ යුතු ය.

942. අත්ථාය වත මෙ භික්ඛු අරඤ්ඤා ගාමමාගතො,
තත්ථ චිත්තං පසාදෙත්වා තාවතිංසොපගො අහං.

943. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

944. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතියකරණීයවිමානං.

## 5. 8

945. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

946. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණ ඡන්නා.

947. කෙන තෙ තාදිසො වණ්ණො
කෙන තෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච තෙ භොගා
යෙ කෙචි මනසො පියා.

948. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

949. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

950. යං දදන්ති න තං හොති
යඤ්ඤෙව දජ්ජා තඤ්ඤෙව සෙය්‍යො
සූචි දින්නා සූචිමෙව සෙය්‍යො.

942. භික්ෂූන් වහන්සේ ඒකාන්තයෙන් මට වැඩ පිණිස වනයෙන් ගමට වැඩිසේක. උන්වහන්සේ කෙරෙහි සිත පහදවා තව්තිසා දෙව්ලොවට (උත්පත්ති විසින්) එළඹියෙම් වෙමි.

943. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි, ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

944. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ද්විතීය කරණිය විමාන යි.**

## 5. 8

945. ඉතා උස් වූ බියුම්රා මිණිඇයෙන් කළ වැම් ඇති මේ විමානය හාත්පස දෙළොස් යොදුනක් තැන වෙරළුමිණියෙන් කළ වැම් ඇති රුවන්පෝරු ඇතුරු බිම් ඇති උදාර වූ යහපත් වූ කුළු ගෙවල්හු සත් සියයෙක් වෙත්.

946. එහි ඔබ සිටිනෙහිය. පානය කරන්නෙහිය. අනුභව කරන්නෙහිය. දිව්‍ය වීණාවෝ ද මිහිරිසේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙත්. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරිහු ද රඟ දක්වත්.

947. කවර හෙතුවකින් තට මෙබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිණකින් තාගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන්නාවූ යම්කිසි සම්පත්තිහු වෙත ද, ඒ සම්පත්තිහු (කවර පිනකින්) තට පහළ වෙත් ද?

948. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය, තා විචාරමි. මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් දිලියෙන පුණ්‍යර්ද්ධි ඇති වෙහි ද?

949. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම්කිසි කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවසීය.

950. යම්බඳු දෑයක් දේ නම් එයට එබඳු වූ ම ඵලය නො ලැබෙයි. (විද්‍යමාන වූ) යම් කිසිවක් ම දේ නම් ඒ (නිවැරදි දෑය) දීම ම උතුම් වෙයි. ම විසින් (චීවරකර්මය පිණිස) හිදියෙක් දෙනලදි. ඒ දානය ම (මට) උතුම් විය.

951. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

952. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

සූචිවිමානං.

## 5. 9

953. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතා සුභා.

954. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

955. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

956. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

957. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති.

958. අහං මනුස්සෙසු මනුස්සභූතො
පුරිමාය ජාතියා මනුස්සලොකෙ.

959. අද්දසං විරජං භික්ඛුං විප්පසන්නමනාවිලං,
තස්ස අදාසහං සූචිං පසන්නො සෙහි පාණිහි.

951. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත්ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

952. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

සූචිවිමාන යි.

## 5. 9

953. ඉතා උස්වූ පියුම්රා මිණිඇයෙන් කළ වැට ඇති මේ විමානය හාත්පස දෙළොස් යොදුනක් නැග වෙරළුමිණියෙන් කළ ටැම් ඇති රුවන්පෝරු ඇතුරු බිම් ඇති උදර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙයි.

954. එහි (තෝ) සිටිනෙහි ය, පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය, දිව්‍ය වීණාවෝ ද මිහිරිසේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ පස්කම් ගුණයෝ වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

955. කවර හෙතුවකින් තට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද? ඒ සම්පත්තිහු (කවර පිනකින්) තට පහළ වෙත් ද?

956. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය, තා විචාරමි. මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තී වෙහි ද?

957. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවසී ය.

958. මම පෙර අත්බැව්හි මිනිස්ලොවැ මිනිසුන් අතර මිනිස් වූයෙමි.

959. පහ වූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ නො කැළඹුණු සිත් ඇති භික්ෂු නමක් දිටිමි. උන්වහන්සේට පහන් වූයෙම සියතින් හිදියක් පිදුවෙමි.

960. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

961. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

දුතියසූචිවිමානං.

## 5. 10

962. සුසුක්කඛන්ධං අභිරුය්හ නාගං
අකාචිතං දන්තිං බලිං මහාජවං
අභිරුය්හ ගජවරං[1] සුකප්පිතං
ඉධාගමා වෙහායසමන්තළික්ඛෙ.

963. නාගස්ස දන්තෙසු දුවෙසු නිම්මිතා
අච්ඡොදිකා[2] පද්මිනියො සුඵුල්ලා
පදුමෙසු ච තූරියගණා පවජ්ජරෙ
ඉමා ච නච්චන්ති මනොහරායො.

964. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

965. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

966. අට්ඨෙව මුත්තපුප්ඵානි කස්සපස්ස මහෙසිනො[3]
ථූපස්මිං අභිරොපෙසිං පසන්නො සෙහි පාණිහි.

967. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

968. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

නාගවිමානං.

1. ගජංවරං – සයා.
2. අච්ඡොදකා – මජසං.
3. භගවතො – සයා,

960. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

961. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**ද්විතිය සූචිවිමාන යි.**

## 5. 10

962. (දිව්‍ය පුත්‍රය) ඉතා සුදු කඳක් ඇති මහත් දළ ඇති නිදෙස් වූ බල ඇති මහාජව ඇති මොනවට සැරසූ නැග යාමට සුදුසු වූ උතුම් ඇතකු පිට නැගී අහසින් මෙහි පැමිණියෙහි.

963. ඇත්රජුගේ දෙදළෙහි පැහැදි දිය ඇති සුපිපි පියුම ඇති දෙපොකුණෙක් මැවිණ. පියුම් මත පසඟතුරු මුළුහු වැයෙති. මේ මනහර දෙවඟනෝ ද නටත්.

964. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය (තෝ) දිව්‍යර්ද්ධියට පැමිණියෙහි මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇති වෙහි ද?

965. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවැසී ය.

966. පහන් සිත් ඇති මම නවුයෙන් ගිලිහුණු මල් අටක් සියතින් කාශ්‍යප බුදුරදුන්ගේ සෑයෙහි පිදුවෙමි.

967. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

968. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**නාගවිමාන යි.**

## 5. 11

969. මහන්තං නාගං අභිරුය්හ සබ්බසෙතං ගජුත්තමං
වනා වනං අනුපරියාසි නාරීගණපුරක්ඛතො
ඔභාසෙන්තො දිසා සබ්බා ඔසධී විය තාරකා.

970. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

971. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

972. සො දෙවපුත්තො අත්තමනො වඞ්ගීසෙනෙව පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

973. අහං මනුස්සෙසු මනුස්සභූතො
උපාසකො චක්ඛුමතො අහොසිං
පාණාතිපාතා විරතො අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං.

974. අමජ්ජපො නො ච මුසා අභාණිං
සකෙන දාරෙන ච තුට්ඨො අහොසිං.
අන්නං ච පානං ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං.

975. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

976. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**දුතියනාගවිමානං.**

## 5. 12

977. කො නු දිබ්බෙන යානෙන සබ්බසෙතෙන හත්ථිනා,
තුරියතාළිත නිග්ඝොසො අන්තලික්ඛෙ මහීයති.

978. දෙවනානුසි ගන්ධබ්බො ආදු[1] සක්කො පුරින්දදො,
අජානන්තා තං පුච්ඡාම කථං ජානෙමු තං මයන්ති.

---

1. අදු – මජ්සං.

## 5. 11

969. සියල්ල සුදු වූ ඇතුනට උතුම් වූ මහත් ඇතකු පිට නැගී ස්ත්‍රී සමූහයා විසින් පිරිවරන ලද්දේ දවහත් තරුව මෙන් සියලු දිගුන් බබුළුවමින් වනයෙන් වනයට යෙහි.

970. කවර හෙතුවකින් තට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනකින් තාගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මනවඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද? ඒ සම්පත්තිහු (කවර පිනකින්) තට පහළ වෙත් ද?

971. මහත් අනුභාව ඇති දිව්‍යපුත්‍රය තා විචාරමි. මිනිස් වූයෙහි කවර පිනක් කෙළෙහි ද? තාගේ මේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙහි වෙහි ද?

972. වඞ්ගීස තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැයි පැන විචාරන ලද්දේ (මෙසේ) පැවැසීය.

973. මම මිනිසුන් අතර මිනිස් වූයෙම් පසැස් ඇති බුදුරදුන්ගේ උපාසකයෙක් වීමි. පණිවායෙන් දුරුවූයෙම් වෙමි. ලොකයෙහි නුදුන් දෙය හැම ලෙසින් දුරුකෙළෙමි.

974. මත්පැන් නො බීමි. බොරු නො කීමි. සිය බිරිය සමගම සතුටුවූයෙම් වෙමි. පහන් සිත් ඇත්තෙම් අහර ද පැන් ද සකස් කොට මහදන් දුනිමි.

975. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

976. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

ද්විතිය නාගවිමාන යි.

## 5. 12

977. (එම්බා දිව්‍යපුත්‍රය) සර්වධවල වූ දිව්‍යමය වූ හස්ති-වාහනයෙකින් පැමිණියා වූ කවරෙක් අහසෙහි තූර්‍යවාදනඝොෂා ඇති ව පුදනු ලැබේ ද?

978. දෙවියෙක් වෙහි ද? ගන්ධර්වයෙක් වෙහි ද? නැතහොත් පුරින්දද නම් ශක්‍රයා වෙහි ද? එය නො දන්නමෝ තා විචාරමු. අපි එය කෙසේ දනිමු ද?

979. නහි දෙවො න ගන්ධබ්බො නාපි සක්කො පුරින්දදො,
සුධම්මා නාම යෙ දෙවා තෙසං අඤ්ඤතරො අහන්ති.

980. පුච්ඡාම දෙවං සුධම්මං[1] පුථුං කත්වාන අඤ්ජලිං,
කිං කත්වා මානුසෙ කම්මං සුධම්මං උපපජ්ජතීති.

981. උච්ඡාගාරං තිණාගාරං වත්ථාගාරඤ්ච යො දදෙ,
තිණ්ණමඤ්ඤතරං දත්වා සුධම්මං උපපජ්ජතීති.

තතියනාගවිමානං.

## 5. 13

982. දළ්හධම්මා නිසාරස්ස ධනුං ඔලුබ්භ තිට්ඨසි,
ඛත්තියො නු සි රාජඤ්ඤො ආදූ ලුද්දො වනෙ චරොසි.[2]

983. අස්සකාධිපස්සාහං භන්තෙ පුත්තො වනෙ චරො,
නාමං මෙ භික්ඛු තෙ බ්‍රූමි සුජාතො ඉති මං විදුං.[3]

984. මිගෙ ගවෙසමානොහං ඔගාහන්තො බ්‍රහාවනං,
මිගං තඤ්චෙව[4] නාද්දක්ඛිං තඤ්ච දිස්වා ඨිතො අහන්ති.

985. ස්වාගතං තෙ මහාපුඤ්ඤ අථො තෙ අදුරාගතං,
එත්තො උදකමාදාය පාදෙ පක්ඛාලයස්සු තෙ.

986. ඉදම්පි පානියං සීතං ආභතං ගිරිගබ්භරා,
රාජපුත්ත තතො පිත්වා සන්ථතස්මිං උපාවිසාති.

987. කල්‍යාණී වත තෙ වාචා සවණීයා මහාමුනි,
නෙලා අත්ථවති[5] වග්ගු මන්ත්වා[6] අත්ථංච භාසසෙ[7]

988. කා තෙ රති වනෙ විහරතො
ඉසිනිසභ වදෙහි පුට්ඨො
තව වචනපථං නිසාමයිත්වා
අත්ථධම්මපදං සමාචරෙමසෙති.

---

1. දෙවසුධම්මං – ස්‍යා.
2. චනාචරොති, – ස්‍යා,
3. විදූ, – මජසං.
4. මිගංගවෙසච්ච – ස්‍යා,
5. නෙලා අත්ථවති, – මජසං
6. මන්තා, – ස්‍යා ක, ක.
7. භාසසි – මජසං.

979. දෙවි නො වෙමි. ගන්ධර්ව නො වෙමි. පුරින්දද නම් ශක්‍ර ද නො වෙමි. සුධර්ම නම් යම් දෙවි කෙනෙක් වෙත් ද, මම ඔවුන් අතුරු එක්තරා එකෙක්මි.

980. (එම්බා දිව්‍යපුත්‍රය) සුධර්ම නම් දෙවි වූ තාහට සකසා ඇඳිලි බැඳ විචාරමි. මිනිස් ලොවැ කිනම් කර්මයක් කොට සුධර්ම නම් දිව්‍ය නිකායයෙහි උපදී ද?

981. යමෙක් උක්ගෙයක් තණගෙයක් පිළිගෙයක් දෙන්නේ ද, හෙතෙමේ මේ තුන් ගෙයින් එක්තරාවක් දී සුධර්ම නම් දිව්‍ය නිකායයෙහි උපදී.

තෘතීය නාගවිමාන යි.

## 5. 13

982. මනා රුක්හරයෙන් කළ දැඩි දුන්නක් ගත්තෙහි? එහි (එක් කෙළවරක්) ඔබා ගෙන සිටිනෙහි, ඒ තෝ කැත්රජකුමරෙක් වෙහි ද? නැතහොත් වෙනෙහි හැසිරෙන වැද්දෙක් වෙහි ද?

983. වහන්ස වෙනෙහි හැසිරෙන මම අස්සකරට රජුගේ පුත්‍රයෙමි. මහණ ඔබට මාගේ නම කියමි. සුජාත යැයි මා දනිත්.

984. මම මුවන් සොයන්නෙම් මහවලැ වැදුනෙම් මුවකු නො දිටිමි. මම ඔබ ම දැක සිටියෙම් වෙමි.

985. මහ පිනැත්ත තාගේ මේ පැමිණීම මනා පැමිණීමෙකි. තව ද තාගේ පැමිණීම නො මනා පැමිණීමෙක් නො වෙයි. මෙතැනින් දිය ගෙන තාගේ පා දෙවා ගනුව.

986. ගිරිලෙනෙන් ගෙනෙන ලද මේ පැන් ද ඉතා සිහිල් ය. රාජපුත්‍රය එයින් පැන් බී (මේ) ඇතිරියෙහි හිඳුව.

987. මහර්ෂින් වහන්ස ඒකාන්තයෙන් ම ඔබ වහන්සේගේ වචනය යහපත් ය. ඇසිය යුතු ය. නිදෙස් ය. අරුත් සහිත ය. මිහිරි ය. අරුත් දැන කියන්නෙහි ය.

988. ඍෂි ශ්‍රෙෂ්ඨය වෙනෙහි වසන ඔබ වහන්සේට කිනම් ඇල්මෙක් දැ යි පූළුවුස්නා ලදුයේ කියනු මැනවි. ඔබ වහන්සේගේ වදන් මග අසා අර්ථ ධර්ම පද සඞ්ඛ්‍යාත ශීලාදි ධර්මකොට්ඨාසයෙහි (අපිදු) පිළිපදිම්හ.

989. අහිංසා සබ්බපාණීනං කුමාරම්හාක රුච්චති.
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරති.

990. ආරති සමචරියා ච බාහුසච්චං කතඤ්ඤුතා,
දිට්ඨෙව ධම්මෙ පාසංසා ධම්මා එතෙ පසංසියාති.

991. සත්තියෙ මරණං තුය්හං ඔරං මාසෙහි පඤ්චහි,
රාජපුත්ත විජානාහි අත්තානං පරිමොචයාති.

992. කතමං ස්වාහං ජනපදං ගන්ත්වා කිං කම්මං කිඤ්ච පොරිසං,
කාය වා පන විජ්ජාය භවෙය්‍යං අජරාමරොති.

993. න විජ්ජතෙ සො පදෙසො කම්මං විජ්ජා ච පොරිසං,
යත්ථ ගන්ත්වා භවෙ මච්චො රාජපුත්තාජරාමරො.

994. මහද්ධනා මහාභොගා රට්ඨවන්තොපි ඛත්තියා,
පහූතධනධඤ්ඤාසෙ න තෙපි අජරාමරා.[1]

995. යදි තෙ සුතා අන්ධක වෙණ්ඩුපුත්තා,[2]
සූරා වීරා වික්කන්තප්පහාරිනො.
තෙපි ආයුක්ඛයං පත්තා
විද්ධස්තා සස්සතිසමා.

996. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාලපුක්කුසා,
යෙ චෙවඤ්ඤෙ ච ජාතියා තෙපිනො අජරාමරා.

997. යෙ මන්තං පරිවත්තෙන්ති ඡළඞ්ගං බ්‍රහ්මචින්තිතං,
එතෙ චඤ්ඤෙ ච විජ්ජාය තෙපි නො අජරාමරා.

998. ඉසයො චාපි යෙ සන්තා සඤ්ඤතත්තා තපස්සිනො,
සරීරං තෙපි කාලෙන විජහන්ති තපස්සිනො.

999. භාවිතත්තාපි අරහන්තො කතකිච්චා අනාසවා,
නික්ඛිපන්ති ඉමං දෙහං පුඤ්ඤපාපපරික්ඛයාති.

1000. සුභාසිතා අත්ථවතී ගාථායො තෙ මහාමුනි,
නිජ්ඣත්තොම්හි[3] සුභාසිතෙන තුවඤ්ච මෙ සරණං භවාහි.

---

1. තෙපි නො අජරාමරා – මජසං.
2. වෙණ්ඩුපුත්තා – මජසං.
අන්ධකවෙණ්ඩපුත්තා – සයා.
3. නිජ්ඣත්තොම්හි – මජසං.

989. (පින්වත්) කුමාරය සියලු සතුන්ට හිංසා නො කිරීම සොරකමින් මිසහසරින් රහමෙරින් වැළකීම අපට රුස්නේ වෙයි.

990. (මෙකී පව්කමින්) වැළකීම ද (කාය සමනාදින්ගේ වශයෙන්) සමව හැසිරීම ද ඇසූ පිරූ තැන් ඇති බව ද කළගුණ දන්නා බව ද යන පැසසිය යුතු මේ දහම් මෙලොව ම (නුවණැත්තන් විසින්) පැසසිය යුතු වේ.

991. රාජපුත්‍රය පස්මසකින් මොබ නුදුරෙහි තාගේ මරණය දනුව. (එහෙයින්) තමා (අපාය දුකින්) මුදව.

992. ඒ මම කවර දනව්වකට ගොස් කිනම් කර්මයක් කිනම් පුරුෂකායර්‍යයක් කොට කවර නම් හෝ විද්‍යාවකින් ජරාමරණ නැත්තෙම් වන්නෙම් දැ යි.

993. රාජපුත්‍රය සත්ව තෙමේ යම් තැනකට ගොස් ජරාමරණ නැත්තේ වේ ද, එබඳු ප්‍රදේශයෙක් එබඳු කර්මයෙක් එබඳු විද්‍යාවෙක් එබඳු පුරුෂකායර්‍යයෙක් විද්‍යමාන නො වේ.

994. මහත් ධන ඇති මහත් භොග ඇති රාෂ්ට්‍රාධිපති වූ බොහෝ ධනධාන්‍ය ඇති ක්ෂත්‍රියයෝ වෙත් ද, ඔහු ද ජරාමරණ නැතියෝ නො වෙත්.

995. ඉදින් සූර වූ වීර වූ වික්‍රමයෙන් සතුරන්ට පහර දෙන සුලු අන්ධක වෙණ්හු පුත්‍රයයි ප්‍රසිද්ධ වූ (කුල පරපුරෙන්) චන්ද්‍රසූර්‍යයාදීන් බඳු වූ ඒ ඔහු ද ආයුක්ෂයට පැමිණියාහු නටහ.

996. යම් ක්ෂත්‍රිය කෙනෙක් බ්‍රාහ්මණ කෙනෙක් වෛශ්‍ය කෙනෙක් ශුද්‍ර කෙනෙක් චණ්ඩාල කෙනෙක් පුක්කුස කෙනෙක් වෙත් ද ඔහු ද අන්හු ද වෙත් නම් ඒ හැමදෙන ද ජාතියෙන් ජරා මරණ නැතියෝ නො වෙත්.

997. යම් කෙනෙක් අට්ඨකාදි ඍෂීන් විසින් නුවණැසින් දුටු (කල්පව්‍යාකරණාදි) අඞ්ග සයෙන් යුක්ත වූ වේදය පිරිවහත් ද, මොහු ද අන්හු ද වෙත් නම් ඒ හැමදෙන ද විද්‍යාවෙන් ජරාමරණ නැතියෝ නො වෙත්.

998. ශාන්ත කායවාග්කර්ම ඇති සංයත වූ සිත් ඇති තපස් ඇසුරු කළ යම් ඍෂි කෙනෙකුත් වෙත් ද, ඒ තපස්විහු ද සුදුසු කල්හි ශරීරය හැර දමත්.

999. වැඩූ සිත් ඇති සිව් මගින් කළ කිස ඇති ආස්‍රව රහිත වූ රහත්හු ද පින් පව් ගෙවාලීමෙන් මේ සිරුර බහා තබත්.

1000. මහා මුනිවරය ඔබ විසින් මොනවට දෙසන ලද ගාථාවෝ අර්ථ සහිතයහ. (ඒ) මනා දෙසුමෙන් ධර්මසංඥාවට පැමිණියෙම් වෙමි. ඔබ වහන්සේ ද මට පිහිටවන සේක්වා.

1001. මා මං ත්වං සරණං ගච්ඡ තමෙව සරණං වජ,
සක්‍යපුත්තං මහාවීරං යමහං සරණං ගතොති.

1002. කතරස්මිං සො ජනපදෙ සත්ථා තුම්හාක මාරිස,
අහම්පි දට්ඨුං ගච්ඡිස්සං ජිනං අප්පටිපුග්ගලන්ති.

1003. පුරත්ථිමස්මිං ජනපදෙ ඔක්කාකකුලසම්භවො.
තත්ථාසි පුරිසාජඤ්ඤො සො ච ඛො පරිනිබ්බුතොති.

1004. සචෙ හි බුද්ධො තිට්ඨෙය්‍ය සත්ථා තුම්හාක මාරිස;
යොජනානි සහස්සානි ගච්ඡෙය්‍යං[1] පයිරුපාසිතුං.

1005. යතො ච ඛො[2] පරිනිබ්බුතො සත්ථා තුම්හාක මාරිස,
නිබ්බුතම්පි[3] මහාවීරං ගච්ඡාමි සරණං අහං.

1006. උපෙමි සරණං බුද්ධං ධම්මඤ්චාපි අනුත්තරං;
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං.

1007. පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දරෙන ච හොමි තුට්ඨොති

1008. සහස්සරංසීව යථා මහප්පභො
දිසං යථාභාති නභෙ අනුක්කමං
තථප්පකාරො[4] තවයං[5] මහාරථො
සමන්තතො යොජනසත්තමායතො.

1009. සුවණ්ණපට්ටෙහි සමන්තමොත්ථටො
උරස්ස මුත්තාහි මණීහි චිත්තිතො
ලෙඛා සුවණ්ණස්ස ච රූපියස්ස ච
සොභෙන්ති වෙළුරියමයා සුනිම්මිතා.

1010. සීසඤ්චිදං වෙළුරියස්ස නිම්මිතං
යුගඤ්චිදං ලොහිතකාය චිත්තිතං
යුත්තා සුවණ්ණස්ස ච රූපියස්ස ච
සොභන්ති අස්සා ච පිමෙ මනොජවා[6].

---

1. ගච්ඡෙ - සයා, ඉ.,
ගච්ඡෙය්‍යුං - මජසං.
2. යතො ඛො - PTS
3. පරිනිබ්බුතං - සයා.
4. තථාපකාරො - මජසං.
5. තවායං - මජසං.
6. අස්සා ච ඉමෙ මනොජවා - මජසං.

1001. (එම්බා කුමාරය) තෝ මා නහමක් සරණ යව. මම ශාක්‍යපුත්‍ර වූ යම් මහාවීරයක්හු සරණ කොට ගියෙම් ද, උන් වහන්සේ ම සරණ කොට යව.

1002. නිදුකාණෙනි ඔබ වහන්සේගේ ඒ ශාස්තෘ තෙමේ කවර දනව්වෙකැ වේ ද, මම ද අප්‍රතිපුද්ගල වූ (ඒ) බුදුරදුන් දකින්නට යන්නෙමි.

1003. (පින්වත) ඔක්කාකකුලයෙහි උපන් ඒ පුරුෂ ශ්‍රේෂ්ඨ තෙමේ එහි පෙරදිග දනව්වෙහි විය. හෙ තෙමේත් පිරිනිවියේ වෙයි.

1004. නිදුකාණෙනි ඉදින් ඔබගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වැඩ සිටින සේක් නම් ඇසුරු කිරීම පිණිස යොදුන් දහසක් වුව ද යන්නෙමි.

1005. නිදුකාණෙනි යම් හෙයකින් වනාහි ඔබගේ ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේක් ද, මම ඒ පිරිනිවියා වූ ද මහාවීරයන් වහන්සේ සරණ කොට යෙමි.

1006. මම බුදුන් සරණ කොට යෙමි. නරදෙවයන් වහන්සේගේ අනුත්තර වූ ධර්මය ද සඞ්ඝයා ද සරණ කොට යෙමි.

1007. (ඒ මම) පණිවායෙන් වහා දුරුවෙමි. ලොවැ නුදුන් දෙය ගැන්ම දුරලමි. මත්පැන් නො බොන්නෙම් වෙමි. මුසවා නො කියමි. සිය බිරියගෙන් ම තුටු වෙමි.

1008. යම් සේ මහත් කැලුම් ඇති හිරු අහසෙහි රිසි රිසි දිගට යන්නේ බබළා ද, හාත්පසින් සත් යොදුනක් වටවූ තාගේ මේ මහාරථය එබඳු වේ.

1009. (හේ) හාත්පසින් රන්පටින් වැසුණේ වෙයි. එහි වියගස මුල මුතු මැණික් වලින් විසිතුරු කරන ලද්දේ වෙයි. රන්රිදී පටයන්හි මොනවට කළ වෙරළුම්ණිමුවා මල්කම් ලියකම් ඈ රේඛාවෝ රිය හොබවත්.

1010. මේ රියහිස වෙරළුම්ණියෙන් කරනලදී, මේ වියගහ රතු මැණිකෙන් විසිතුරු කරනලදී. සිතට රිසි ගමන් ඇති මේ අශ්වයෝ ද රනින් හා රිදියෙන් හා කළ රැහැනින් බැඳුණාහු හොබිත්.

1011. සො තිට්ඨසි හෙමරථෙ අධිට්ඨිතො
දෙවානමින්දොව සහස්සවාහනො
පුච්ඡාමි තාහං යසවන්ත කොවිදං
කථං තයා ලද්ධො අයං උළාරොති.

1012. සුජාතො නාමහං භන්ත රාජපුත්තො පුරෙ අහුං,
ත්වඤ්ච මං අනුකම්පාය සඤ්ඤමස්මිං නිවෙසයි.

1013. ඛීණායුකඤ්ච මං ඤත්වා සරීරං පාදසි සත්ථුනො,
ඉමං සුජාත පූජෙහි තං තෙ අත්ථාය හෙහිති.

1014. තාහං ගන්ධෙහි මාලෙහි පූජයිත්වා සමුය්‍යුතො,
පහාය මානුසං දෙහං උපපන්නොම්හි නන්දනං.

1015. නන්දනොපවනෙ[1] රම්මෙ නානාදිජගණායුතෙ,
රමාමි නච්චගීතෙහි අච්ඡරාහි පුරක්ඛතොති.

චූළරථවිමානං.

## 5. 14

1016. සහස්සයුත්තං හයවාහනං සුභං
ආරුය්හිමං සන්දනං නෙකචිත්තං
උය්‍යානභූමිං අභිතො අනුක්කමං
පුරින්දදො භූතපතීව වාසවො

1017. සොවණ්ණමයා තෙ රථකුබ්බරා උභො
ඵලෙහි[2] අංසෙහි අතීව සඞ්ගතා[3]
සුජාතගුම්බා නරවීර නිට්ඨිතා
විරොචති පණ්ණරසෙව චන්දො

1018. සුවණ්ණජාලාවතතො[4] රථො අයං
බහූහි නා නා රතනෙහි චිත්තිතො
සුනන්දිඝොසො ච සුභස්සරො ච
විරොචති චාමරහත්ථබාහුහි

1019. ඉමා ච නාභ්‍යො මනසාභිනිම්මිතා
රථස්ස පාදන්තර මජ්ඣභූසිතා
ඉමා ච නාභ්‍යො[5] සතරාජි චිත්තිතා
සතෙරතා විජ්ජුරිවප්පභාසරෙ

---

1. නන්දනෙ ච වනෙ, – මජසං.
නන්දනා පවනෙ, – සයා.
2. ඵලෙහි – මජසං. PTS
3. සඞ්ගතො – සීමු.
4. සුවණ්ණජාලා විතතො – ඛපට්.
5. නාභෙය්‍යා – PTS

1011. දහසක් අසුන් යෙදූ විජයොත් රිය අරා සිටි සක්දෙවිඳු මෙන් ඒ තෝ ද රන්රියෙහි සිටිනෙහි, යසස් ඇත්ත තා විසින් මේ මහත් යසස කෙසේ ලබන ලද දැයි මම දක්‍ෂ වූ තා විචාරමි.

1012. වහන්ස මම පෙර සුජාත නම් රාජපුත්‍රයෙක් වීමි. ඔබ වහන්සේත් අනුකම්පාවෙන් කුශල ධර්ම සඞ්ඛ්‍යාත සංයමයෙහි මා පිහිටුවූ සේක.

1013. මා පිරිහිගිය ආයු ඇතියෙකැයි දැන සුජාත මෙය පුදව, එය තා හට වැඩ පිණිස වන්නේයයි ශාස්තෘන් වහන්සේගේ ශාරීරික ධාතු දුන්සේක.

1014. මම මැනැවින් යෙදුණෙමි. ඒ ධාතුන් ගඳින් මලින් පුද මිනිස් සිරුර හැරපියා නඳුන් වෙනෙහි උපන්මි.

1015. නන්වැදැරුම් පක්ෂි සමූහයාගෙන් යුත් මනරම් වූ නඳුනුයනෙහි නෘත්‍යගීතයෙන් හා දිව්‍යප්සරාවන්ගෙන් හා පෙරවූ කරන ලද්දෙම් සිත් අලවා වෙසෙමි.

චූළරථ විමාන යි.

## 5. 14

1016. දහසක් අසුන් යෙදූ සොඳුරුවූ නන් අයුරින් විසිතුරු කරණ ලද මේ රියට නැඟ උයන්බිම සමීපයට යන්නා වූ (තෝ) භූත පති වූ පුරින්දද නම් සක්දෙවිඳු මෙන් (බබළහි.)

1017. තාගේ රන්මය රිය දෙපස වේදිකාවෝ පිල්කඩ තෙලෙහි පිහිටි යට දෙකොනින් පෙදෙසින් මොනවට ගැනී සිටියහ. මොනොවට පිහිටුවන ලද වැළ් සමූහයෝ සිප් ඇදුරන් විසින් නිමවන ලද්දවුන් වැනියහ. (මෙබඳු පිල්කඩ ඇති බැවින් තාගේ මේ රථය) පුණුරැසි සඳමෙන් බබළා.

1018. මේ රිය රන් දැලින් වසන ලද්දේ ය. බොහෝ වූ නන් රුවනින් විසිතුරු කරන ලද්දේ ය. කන්කලු හඬ ඇත්තේ ය. මොනොවට බබළන සුලු ය. සෙමර ගත් අත් ඇති දෙවියන් කරණ කොට ගෙන අතිශයින් බබළයි.

1019. මේ රිය සක්නැබහු ද සිතින් මවන ලද්දවුන් වැනියහ. රියසක් පිළිබඳ අනන්තයෙහි වූ නිම් වළලුයෙන් ද අරයන් පිළිබඳ නන් රුවනින් බබළන අකුරින් ද සරසන ලද නන්වන් නොයෙක් සියගණන් රොදින් විසිතුරු බවට පැමිණි මේ නැබහු ද සතෙරත සඞ්ඛ්‍යාත විද්‍යුල්ලතා මෙන් බබළත්.

1020. අනෙකචිත්තාවතතො රථො අයං
පුථූ ච නෙමී ච සහස්සරංසිකො
තෙසං සරො සූයති[1] වග්ගුරූපො
පඤ්චඞ්ගිකං තුරියමිවප්පවාදිතං

1021. සිරස්මිං චිත්තං මණිචන්දකප්පිතං
සද විසුද්ධං රුචිරං පභස්සරං
සුවණ්ණරාජීහි අතීව සඞ්ගතං
වෙළුරියරාජීව අතීව සොභති

1022. ඉමෙ ච වාළී මණිචන්දකප්පිතා
ආරොහකම්බූ සුජවා බ්‍රහූපමා
බ්‍රහා මහන්තා බලිනො මහාජවා
මනො තවඤ්ඤාය තථෙව සිංසරෙ

1023. ඉමෙ ච සබ්බෙ සහිතා චතුක්කමා
මනො තවඤ්ඤාය තථෙව සිංසරෙ
සමං වහන්ති මුදුකා අනුද්ධතා
ආමොදමානා තුරගානමුත්තමා

1024. ධුනන්ති වග්ගන්ති පතන්ති[2] චම්බරෙ
අබ්භුද්ධුනන්තා සුකතෙ පිළන්ධනෙ
තෙසං සරො සූයති වග්ගුරූපො
පඤ්චඞ්ගිකං තුරියමිවප්පවාදිතං

1025. රථස්ස ඝොසො අපිළන්ධනාන ච[3]
ඛුරස්ස නාදෙ අභිහිංසනාය[4] ච
ඝොසො සුවග්ගු සමිතස්ස සූයති
ගන්ධබ්බතුරියානි විචිත්‍රසංවනෙ[5]

1026. රථෙ ඨිතා තා මිගමන්දලොචනා
ආළාරපම්හා හසිතා පියංවදා
වෙළුරියජාලාවතතා තනුච්ඡවා
සදෙව ගන්ධබ්බ සුරග්ගපූජිතා

1027. තා රත්තරත්තම්බර පීතවාසසා
විසාලනෙත්තා අභිරත්තලොචනා
කුලෙ සුජාතා සුතනූ සුචිම්හිතා
රථෙ ඨිතා පඤ්ජලිකා උපට්ඨිතා

1. සූයන්ති – මජසං.
2. පවත්තන්ති PTS.
3. අපිළන්ධනානිච – සිමු
4. අභිසංසනාමච – PTS.
අභිහෙසනායච – කජ්චි.
5. ගන්ධබ්බතුරියාන ච චිත්‍රසංවනෙ – කජ්චි

1020. මේ රිය නන්වැදැරුම් ලියකම් ඈ විසිතුරුවලින් ගැවසී ගත්තේ ය. මහත් වූ නිම් වල්ල ද නොයෙක් රැස් ද ඇත්තේ ය. එල්බෙන කිංකිණි දැල් ඇති ඒ මනහර වූ නාදය වැයූ පසඟතුරු තෝම්න්ගේ නද සේ ඇසේ.

1021. මෙහි රියහිස විසිතුරු ය. සඳමඬල වැනි මැණික් ඔබ්බන ලද්දේ ය. හැම කල්හි පිරිසිදු ය. සිත්කලු ය. පැහැසර ය. සුවර්ණ රේඛාවන්ගෙන් යුක්ත ය. වෙරළුම්ණි රොදක් සේ අතිශයින් හොබී.

1022. මිණිමුවා සඳැස් ලකුණින් ඔවිදුනාලද ආරොහ පරිණාහයෙන් යුක්ත වූ සොභන ගමන් ඇති තම පමණට වඩා අධික ව පෙනෙන්නා වූ වැඩුණු සියලු අඟපසඟ ඇති මහත් ඉදුහ ඇත්තා වූ බලවත් වූ ශීඝ්‍ර ගමන් වෙග ඇති මේ අශ්වයෝත් ඔබගේ සිත දැන සිතට අනුකූල ව ම පවතිත්.

1023. මේ සියලු අශ්වයෝ ද සමාන ජව ඇත්තාහු සතර පයින් යන්නාහු තාගේ සිත දැන එසේ ම පවතිත්. මොළොක් සැහැවි ඇති නො කැලඹිලි ඇති සතුට පවසන උතුම් අස්හු සමව රිය උසුලත්.

1024. මොනවට කළ (ක්‍ෂුද්‍රක ඝණ්ටාදි) අශ්වාලඞ්කාරයන් අධික ව සලන අස්හු (කිසි විටෙකැ සෙමෙර බර ද කෙසුරු බර ද වලග ද) වෙසෙසින් සලත්. (කිසි විටෙකැ පියෙන් පිය තබා) යෙත්. (කිසි විටෙකැ) අහස්හි පැන යෙත්. ඔවුන්ගේ මනොඥ වූ ස්වරය වයන ලද පසඟතුරු නද සේ ඇසේ.

1025. රිය හඬ ද පළඳනා හඬ ද කුර ගැටෙන හඬ ද (වරින් වර අසුන් පැවැත් වූ) හෙසාරවය ද ප්‍රමුදිත වූ දෙවියන්ගේ ඝොෂය ද චිත්‍රලතා වනයෙහි ගන්ධර්වදිව්‍යපුත්‍රයන්ගේ පඤ්චාඞ්ගික තූර්‍යනාදය මෙන් ඉමිහිරි ව ඇසේ.

1026. රියෙහි සිටි මේ දෙවඟනෝ මුවපොල්ලන්ට බඳු මුදු සිනිඳු ඇස් ඇතියාහු ඝන වූ ඇස්පිහාටු ඇතියාහු සිනා මුහුණු ඇතියාහු ප්‍රිය වදන් ඇතියාහු වෙරළුම්ණි දැලින් වැසූ සිරුරු ඇතියාහු සියුම්සිවි ඇතියාහු සියලු කල්හි ම ගඳඹ දෙවියන්ගෙන් හා සෙසු අගදෙවියන්ගෙන් හා ලද පිදුම් ඇතියාහු වෙත්.

1027. ඇලුම් දනවන සැහැවි ඇති රතු රන්වන් සළු දරන විසල් නෙත් ඇති වෙසෙසින් රත්වන් රොදින් හොබනා තුවන් ඇති උසස් දෙවනිකායෙහි උපන් සොඳුරු සිරුරු ඇති මනා මදහස පහළ කරන රියෙහි සිටි ඔහු බඳදිලි ඇති වැ එළඹ සිටියාහු ය.

1028. තා කම්බුකෙයූරධරා සුවාසසා
සුමජ්ඣිමා ඌරුථනූපපන්නා
වට්ටඞ්ගුලියො සුමුඛා සුදස්සනා
රථෙ ඨිතා පඤ්ජලිකා උපට්ඨිතා

1029. අඤ්ඤා සුවෙණී සුසු මිස්සකෙසියො
සමං විභත්තාහි පභස්සරාහි ච
අනුබ්බතා තා තව මානසෙ රතා
රථෙ ඨිතා පඤ්ජලිකා උපට්ඨිතා

1030. ආවෙළිනියො පදුමුප්පලච්ඡදා
අලඞ්කතා චන්දනසාරවාසිතා[1]
අනුබ්බතා තා තව මානසෙ රතා
රථෙ ඨිතා පඤ්ජලිකා උපට්ඨිතා

1031. තා මාලිනියො පදුමුප්පලච්ඡදා
අලඞ්කතා චන්දනසාරවාසිතා
අනුබ්බතා තා තව මානසෙ රතා
රථෙ ඨිතා පඤ්ජලිකා උපට්ඨිතා

1032. කණ්ඨෙසු තෙ යානි පිළන්ධනානි
හත්ථෙසු පාදෙසු තථෙව සීසෙ
ඔභාසයන්ති දස සබ්බසො දිසා
අබ්භුද්දයං සාරදිකොව භානුමා

1033. වාතස්ස වෙගෙන ච සම්පකම්පිතා
භුජෙසු මාලා අපිළන්ධනානි ච
මුඤ්චන්ති ඝොසං රුචිරං සුචිං සුභං
සබ්බෙහි විඤ්ඤූහි සුතබ්බරූපං

1034. උය්‍යානභූම්‍යා ච දුවද්ධතො[2] ඨිතා
රථා ච නාගා තුරියානි චස්සරො
තමෙව දෙවින්ද පමොදයන්ති
වීණා යථා පොක්ඛරපත්තබාහුභි

1035. ඉමාසු වීණාසු බහූසු වග්ගූසු
මනුඤ්ඤරූපාසු හදයෙරිතං පති[3]
පවජ්ජමානාසු අතීව අච්ඡරා
භමන්ති කඤ්ඤා පදුමෙසු සික්ඛිතා

---

1. චන්දනසාරවොසිතා – සයා PTS.
2. දුහත්ථතො – PTS.
3. පීතිං – මජසං
හදයෙරිතංපීතිං – සයා

1028. රන්මුවා අඟුපළඳනා දරන මනාසළු හැඳි සිහිනිඟ ඇති පිරිපුන් වටොර හා පියයුරු ඇති කෙමෙන් දිගු වට ඇඟිලි ඇති සොඳුරු මුව ඇති මනා දකුම් ඇති රියෙහි සිටි ඔහු බඳුදිලි ඇති ව එළඹ සිටියාහු ය.

1029. සොඳුරු වෙණි ඇති සමසේ බෙදීගිය පැහැසර රන් කෙඳියෙන් මුසු කෙහෙ ඇති අනුගත පැවැතුම් ඇති ඔබගේ සිත්හි ඇලිගිය තරුණ වූ ඒ ඇතැම් සුරඟනෝ රියෙහි සිටියෝ බඳුදිලි ඇති ව එළඹ සිටියාහු ය.

1030. පියුමුපුලින් සැදුම් ලත් රැළි දිම් ඇති දිවසඳුනෙන් අලෙව් දුන් අලඞ්කෘත වූ අනුගත පැවතුම් ඇති ඔබගේ සිත්හි ඇලිගිය රියෙහි සිටි ඔහු බඳුදිලි ඇති වැ එළඹ සිටියාහු ය.

1031. පියුමුපුලින් සැදුම්ලත් දිව සඳුනෙන් අලෙව් දුන් පුෂ්පමාලා ඇති අලඞ්කෘත වූ අනුගත පැවැතුම් ඇති ඔබගේ සිත්හි ඇලිගිය රියෙහි සිටි ඔහු බඳුදිලි ඇති ව එළඹ සිටියාහු ය.

1032. ඔබගේ ගෙලෙහි දු අත්හි දු පාහි දු එසේ ම හිසෙහි දු යම් පළඳනාවෝ වෙත් ද, ඔහු උදු වූ සරාහිරු මෙන් හාත්පසින් දසදිගුන් බබුළුවත්.

1033. වායු වෙගයෙන් ද ප්‍රකම්පිත වූ බාහුයෙහි මල්දම් ද පළඳනාවෝ ද සියලු ගඳෙව් සිප් දන්නවුන් විසින් ඇසිය යුතු වූ රුචිර වූ අමිශ්‍ර වූ මනොඥ වූ නාදය විහිදුවත්.

1034. දිව්‍යපුත්‍රය උයන්බිම දෙපස සිටියා වූ රියහඬ ගජහඬ තුරුහඬහු සුශික්ෂිත බැවින් ඉතා මනහර වූ වීණා වාදකයාගේ අතින් වාදනය කරන ලද වීණාව මෙන් තා ම ප්‍රමොදයට පමුණුවත්.

1035. කන්කලු වූ මනහර වූ බොහෝ වූ මේ වීණාවන් හෘදයඞ්ගම කොට ප්‍රීතියෙන් වයනු ලබන කල්හි මොනවට හික්මුණු දිව්‍ය කන්‍යාවෝ පියුම්වල (රඟපාමින්) හැසිරෙත්.

1036. යද ච ගීතානි ච වාදිතානි ච
නච්චානි චෙමානි[1] සමෙන්ති එකතො
අථෙත්ථ නච්චන්ති අථෙත්ථ අච්ඡරා
ඔභාසයන්ති උභතො වරිත්ථියො

1037. සො මොදසි තුරියගණප්පබොධනො
මහීයමානො වජිරාවුධොරිව[2]
ඉමාසු වීණාසු බහූසු වග්ගුසු
මනුඤ්ඤරූපාසු හදයෙරිතං පති

1038. කිං ත්වං පුරෙ කම්මමකාසි අත්තනා
මනුස්සභූතො පුරිමාය ජාතියා
උපොසථං කං[3] වා තුවං උපාවසි
කං ධම්මචරියං වතමාභිරොචයි[4]

1039. නයිදං අප්පස්ස[5] කතස්ස කම්මුනො
පුබ්බෙ සුචිණ්ණස්ස උපොසථස්ස වා
ඉද්ධානුභාවො විපුලො අයං තව
යං දෙවසඞ්ඝං අභිරොචසෙ භුසං

1040. දානස්ස තෙ ඉදං ඵලං අථො සීලස්ස වා පන,
අථො අඤ්ජලිකම්මස්ස තං මෙ අක්ඛාහි පුච්ඡිතොති

1041. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

1042. ජිතින්ද්‍රියං බුද්ධමනොමනික්කමං
නරුත්තමං කස්සපමග්ගපුග්ගලං
අවාපුරං තං අමතස්ස ද්වාරං
දෙවාතිදෙවං සතපුඤ්ඤලක්ඛණං

1043. තමද්දසං කුඤ්ජරමොඝතිණ්ණං
සුවණ්ණසිඞ්ගීනදබිම්බසාදිසං
දිස්වාන තං ඛිප්පමහුං සුචීමනො
තමෙව දිස්වාන සුභාසිතද්ධජං

1044. තමන්නපානං[6] අථවාපි චීවරං
සුචිං පණීතං රසසා උපෙතං
පුප්ඵාභිකිණ්ණම්හි සකෙ නිවෙසනෙ
පතිට්ඨපෙසිං ස අසඞ්ගමානසො

1. නච්චානි විමානි – මජසං
2. වජිරාවුධොව – සිමු.
3. කිංච – සයා
4. අභිරාධයි – කත්ථචි
5. නයිදමප්පසස – මජසං.
6. තමන්නපානං – මජසං

1036. යම් විටෙකැ මේ ගීතයෝ ද වාදිතයෝ ද නෘත්‍යයෝ ද එකට එකතු වෙත් ද, එකල්හි තෙල රියෙහි ඇතැම් අප්සරා කෙනෙක් නටති. යළි තෙල රියෙහි දෙපස සිටි උතුම් දිව්‍යස්ත්‍රීහු (වස්ත්‍රාභරණාදියෙන් දිගුන්) බබුළුවත්.

1037. කන්කලු වූ මනහර වූ බොහෝ වූ මේ වීණාවන් හෘදයඞ්ගම කොට ප්‍රීතියෙන් (වයනු ලබන කල්හි) ඒ තෝ දිව්‍යතූර්‍ය්‍ය සමූහයෙන් කළ තුටු පිබිදීම් ඇති පූදනු ලබන්නා වූ ශක්‍රයා මෙන් සතුටු වෙහි.

1038. තෝ පෙර මිනිස් වූයෙහි පෙර අත්බැව්හි කිනම් කර්මයක් කෙළෙහි ද? තෝ කවර පෙහෙවසක් හෝ විසූයෙහි ද? කවර ධර්මචර්‍ය්‍යාවක් කවර ව්‍රතයක් රුචි කෙළෙහි ද?

1039. යම් හෙයෙකින් දෙව සමූහයා අතිශයින් මැඩගෙන බබළහි ද? මේ තාගේ මහත් වූ ඍද්ධ්‍යනුභාවයෙකි. මේ විපාකය පෙර කරනලද අල්ප කර්මයක්හුගේ හෝ පෙර පුරුදු කළ අල්ප වූ උපොසථයක්හුගේ හෝ නො වේ.

1040. තාගේ මේ විපාකය දනයක්හුගේ හෝ නොහොත් ශීලයක්හුගේ හෝ නොහොත් අඤ්ජලි කර්මයක්හුගේ හෝ වේ ද? මා විසින් විචාරන ලදුයෙහි එය මට කියව.

1041. මේ විපාකය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද සතුටු සිත් ඇති ඒ දෙව්පුත් තෙමේ (මෙසේ) පැවැසී ය.

1042 – 1043. දිනන ලද ඉඳුරන් ඇති පරිපූර්ණ වීර්‍ය්‍ය ඇති නර ශ්‍රේෂ්ඨ වූ අග්‍ර පුද්ගල වූ දෙවියන්ට දෙව් වූ සියපින් ලකුණෙන් යුත් නිවනට දොර විවෘත කරන්නා වූ; හස්තිරාජයක්හු හා සමාන වූ චතුරොඝය තරණය කළා වූ සිඞගිසුවර්ණ ජාම්බොනදසුවර්ණ රූපයක් බඳු වූ ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දුටුයෙමි. දැක වහා පිරිසිදු සිත් ඇත්තෙම් වීමි. ධර්මධ්වජ වූ ඒ බුදුරජාණන් වහන්සේ දැක,

1044. නො ලැගුණු සිත් ඇති ඒ මම මලින් ගැවැසුණු සිය නිටසෙහි උන්වහන්සේ විෂයෙහි පවිත්‍ර වූ ප්‍රණීත වූ රසයෙන් යුක්ත වූ ආහාරපාන ද යළි සිවුරු ද පිළිගැන්වීමි.

1045. තමන්නපානෙන ච චීවරෙන ච
ඛජ්ජෙන භොජ්ජෙන ච සායනෙන ච
සන්තප්පයිත්වා ද්විපදානමුත්තමං
සො සග්ගසො දෙවපුරෙ රමාමහං

1046. එතෙනුපායෙන ඉමං නිරග්ගළං
යඤ්ඤං යජිත්වා තිවිධං විසුද්ධං
පහායහං මානුසකං සමුස්සයං
ඉන්දූපමො[1] දෙවපුරෙ රමාමහං

1047. ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච
පණීතරූපං අභිකඞ්ඛතා මුනි
අන්නඤ්ච පානඤ්ච බහුං සුසඞ්ඛතං
පතිට්ඨපෙතබ්බමසඞ්ගමානසෙ

1048. නයිමස්මිං ලොකෙ පරස්මිං[2] වා පන
බුද්ධෙන සෙට්ඨොව සමොව විජ්ජති
ආහුනෙය්‍යානං පරමාහුතිං ගතො
පුඤ්ඤත්ථිකානං විපුලඵලෙ සිනන්ති

මහාරථවිමානං.

මහාරථවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:-

මණ්ඩූකො රෙවති ඡත්තො කක්කටො ද්වාරපාලකො
ද්වෙ කරණීයා ද්වෙ සූචි තයො නාගා ච ද්වෙ රථා
පුරිසානං පඨමො වග්ගො පවුච්චතී ති.

භාණවාරො තතියො.

1. ඉන්දසමො - සයා,
2. නයිමස්මිං වා ලොකෙ පරස්මිං - කම්බො

1045. ඒ ද්විපදෝත්තම වූ සර්වඥයන් වහන්සේ ආහාරපානයෙන් ද චීවරයෙන් ද ඛාද්‍යයෙන් ද භොජ්‍යයෙන් ද රස විඳගන්නා දෑයින් ද සතප්වා ඒ මම සවර්ගයක් පාසා දෙවපුරසඞ්ඛ්‍යාත සුදර්ශන මහා නගරයෙහි සිත් අලවා වෙසෙමි.

1046. මෙ නයින් විශුද්ධ වූ ත්‍රිවිධ වූ නිරවුල් වූ මෙ මහදන් දී මම ඒ මිනිස් සිරුර පියා දෙව්ලොව ශක්‍රයා මෙන් සිත් අලවා වෙසෙමි.

1047. මුනිවරය, ප්‍රණීත වූ ආයුෂය වර්ණය සුඛය බලය යන මේ කැමැත්තහු විසින් බොහෝ වූ මනාව පිළියෙළ කරනලද අහර ද පැන් ද නො ඇලුණු සිත් ඇති බුදුන් විෂයෙහි පිළිගැන්විය යුතු යි.

1048. මෙලොවැ හෝ පරලොවැ හෝ පිනෙන් ප්‍රයොජන ඇති මහත් වූ පින්පල කැමතියනට ආහවනීයයන් අතුරෙහි පරම ආහවනීය භාවයට පැමිණි බුදුරජ තෙමෙ ම ශ්‍රෙෂ්ඨ වේ. බුදුන් හා සමයෙකුදු විද්‍යමාන නො වේ.

මහාරථවිමාන යි.

## පස්වන මහාරථවර්ග යි.

**එහි උද්දානය මෙසේ යි:-**

මණ්ඩුක යැ රෙවතී යැ ඡත්ත (මාණවක) යැ කක්කටරසදායක යැ ද්වාරපාලක යැ කරණීය දෙක යැ සූචිදෙක යැ නාග තුන යැ රථදෙක යැ යි පුරුෂ විමානයන් පිළිබඳ ප්‍රථම වර්ගය කියනු ලැබේ.

## තෙවැනි බණවර නිමි.

# 6. පායාසි වග්ගො

## 6. 1

1049. යථා වනං චිත්තලතං පභාසති
උය්‍යානසෙට්ඨං තිදසානමුත්තමං
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1050. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1051. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1052. අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
ඔපානභූතා ඝරමාවසිම්හ
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදම්හ

1053. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1054. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

අගාරියවිමානං.

## 6. 2

1055. යථා වනං චිත්තලතං පභාසති
උය්‍යානසෙට්ඨං තිදසානමුත්තමං
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1056. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති

# 6. පායාසි වර්ගය

## 6. 1

1049. (එම්බා දිව්‍යපුත්‍රය) තව්තිසා දෙව්යනට උතුම් වූ උයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ චිත්‍රලතාවනය යම්සේ බබළා ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටි.

1050. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1051. මේ පුණ්‍යඵලය කවර කර්මයක්හුගේ දැයි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටු සිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1052. (වහන්ස) මම ද (මාගේ) බිරිය ද මිනිස්ලොවැ පැන් පොකුණක් බඳුව ගිහිගෙයි විසුම්හ. (සඞ්ඝයා විෂයෙහි) පහන් සිත් ඇති ව අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් පිදුම්හ.

1053. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මිත වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1054. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**අගාරියවිමාන යි.**

## 6. 2

1055. (එම්බා දිව්‍යපුත්‍රය) තව්තිසා දෙව්යනට උතුම් වූ උයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ චිත්‍රලතා වනය යම්සේ බබළා ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1056. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1057. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1058. අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
ඔපානභූතා ඝරමාවසිම්හ
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදම්හ

1059. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1060. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

**දුතියඅගාරියවිමානං.**

## 6. 3

1061. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො සොළස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා

1062. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බා ච කඤ්ඤා තිදසචරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති

1063. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1064. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1065. ඵලදායි ඵලං විපුලං ලභති
දදමුජ්ජුගතෙසු[1] පසන්නමානසො
සො හි මොදති[2] සග්ගගතො තිදිවෙ
අනුභොති ච පුඤ්ඤඵලං විපුලං
තථෙවාහං[3] මහාමුනි අදසිං චතුරො ඵලෙ

1. දදමුජුගතෙසු – මජසං.
2. පමොදති – මජසං.
3. තවෙවාහං – මජසං.

1057. මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1058. (වහන්ස) මම ද (මාගේ) බිරිය ද මිනිස්ලොවැ පැන් පොකුණක් බඳුව ගිහිගෙයි විසුම්හ. (සඞ්ඝයා විෂයෙහි) පහන් සිත් ඇති ව අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් පිදුම්හ.

1059. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1060. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

දුතිය අගාරියවිමාන යි

## 6. 3

1061. ඉතා උස්වූ පියුම්රාමිණි ආදියෙන් කළ වැම් ඇති මේ විමානය හාත්පසින් සොළොස් යොදුනෙකි. වෙරළුමිණියෙන් කළ වැම් ඇති රුවන් පෝරු අතුළ බිම් ඇති උදර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙත්.

1062. එහි (තෝ) සිටිනෙහි ය, පානය කරනෙහි ය, අනුභව කරනෙහි ය, දිව්‍යවීණාවෝ ද මිහිරි සේ වාදනය වෙති. සුසැටක් පමණ වූ පුහුණුවූ සොඳුරු සැහැවි ඇති දෙව්ලොව සුවසේ හැසිරෙන්නා වූ උදර වූ දිව්‍ය-කන්‍යාවෝ ද නටති ගයති ප්‍රමොද වෙත්.

1063. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද, තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1064. මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1065. (වහන්ස) පහන්සිත් ඇති ඍජුමාර්ගයට පැමිණියා වූ ආර්‍ය්‍ය පුද්ගලයන් විෂයෙහි පලතුරු දන්දෙන පුද්ගල තෙමේ මහත් පුණ්‍යඵලය ලබයි. හෙතෙමේ (උත්පත්ති විසින්) දෙව්ලොව ගියේ තව්තිසා භවනෙහි සතුටු වෙයි. එහි දී (මා මෙන්) මහත් පින්පල ද අනුභව කරයි. මහා මුනිවරයෙනි එසේම මම ද ඵල සතරක් දුනිමි.

1066. තස්මාහි ඵලං අලමෙව දාතුං
නිච්චං මනුස්සෙන සුඛත්ථිකෙන
දිබ්බානි වා පත්ථයතා සුඛානි
මනුස්සසොභග්ගතමිච්ඡතා වා

1067. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1068. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

ඵලදායකවිමානං.

## 6. 4

1069. චන්දො යථා විගතවලාහකෙ නභෙ
ඔභාසයං ගච්ඡති අන්තලික්ඛෙ
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1070. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1071. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1072. අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
උපස්සයං අරහතො අදම්හ
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදම්හ

1073. තෙන මෙ තාදිසො වණ්ණො
තෙන මෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා
යෙ කෙචි මනසො පියා

1074. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

පඨමඋපස්සයදායකවිමානං.

1066. එහෙයින් ම දිව්‍යසැපත් පතන්නා වූ හෝ මිනිස් සැපත් කැමැත්තා වූ හෝ සැප කැමැති මිනිසා විසින් නිතර ඵල දානය කරන්නට සුදුසු ම ය.

1067. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි, ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1068. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

ඵලදායකවිමාන යි.

## 6. 4

1069. (එම්බා දිව්‍යපුත්‍රය) පහවූ වලාකුළු ඇති නුබකුසැ චන්ද්‍රයා යම්සේ අහසේ බබළමින් යේ ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1070. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලිසෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1071. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ ද යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1072. මම ද (මාගේ) බිරිය ද මිනිස් ලොවැ (එක්තරා) රහත් නමකට සෙනසුනක් පිදුම්හ. පැහැදුණු සිත් ඇත්තමෝ අහර ද පැන් ද සකසා මහත් දානයක් පිදුම්හ.

1373. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1074. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

පඨම උපස්සයදායකවිමාන යි.

## 6. 5

1075. සුරියො යථා විගතවලාහකෙ නභෙ
ඔභාසයං ගච්ඡති අන්තලික්ඛෙ
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1076. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1077. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1078. අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
උපස්සයං අරහතො අදම්හ
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදම්හ

1079. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1080. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

**දුතිය උපස්සයදායකවිමානං.**

## 6. 6

1081. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා සුභා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා

1082. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1083. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

## 6. 5

1075. (එම්බා දිව්‍යපුත්‍රය) පහවූ වලාකුළු ඇති නුබකුසැ අන්තරීක්ෂයෙහි හිරු යම්සේ බබළමින් යේ ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1076. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1077. මුගලන් තෙරුන් විසින් මේ පුණ්‍යඵලය කවර කර්‍මයක්-හුගේ දැ යි පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1078. (වහන්ස) මම ද (මාගේ) බිරිය ද මිනිස්ලොවැ (එක්තරා) රහත් නමකට සෙනසුනක් පිදූම්හ. (එමෙන් ම) පහන් සිතැත්තාහු අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් පිදූම්හ.

1079. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

1080. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලුදිගුන් බබුළුවයි.

**දුතිය උපස්සයදායකවිමාන යි.**

## 6. 6

1081. ඉතා උස්වූ පියුම්රාමිණි ආදියෙන් කළ ටැම් ඇති මේ විමානය හාත්පසින් දෙළොස් යොදුනෙකි. වෙරළුමිණියෙන් කළ ටැම් ඇති රුවන් පෝරු අතුළ බිම් ඇති උදරවූ යහපත්වූ කුළුගෙවල් සත් සියයෙක් වෙත්.

1082. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තේ වෙහි ද?

1083. මුගලන් තෙරුන් විසින් මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි විචාරන ලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1084. අහං මනුස්සෙසු මනුස්සභූතො
දිස්වාන භික්ඛුං තසිතං කිලන්තං
එකාහං භික්ඛං පටිපාදයිස්සං
සමඞ්ගිභත්තෙන තදා අකාසිං

1085. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1086. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

භික්ඛාදායකවිමානං.

## 6. 7

1087. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො සොළස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා

1088. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බා ච කඤ්ඤා තිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති

1089. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1090. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

1091. අහං මනුස්සෙසු මනුස්සභූතො
අහොසිං යවපාලකො
අද්දසං විරජං භික්ඛුං
විප්පසන්නමනාවිලං

1092. තස්ස අදාසහං භාගං පසන්නො සෙහි පාණිහි,
කුම්මාසපිණ්ඩං දත්වාන මොදාමි නන්දනෙ වනෙ

1084. (වහන්ස) මම මිනිසුන් අතර මිනිසෙක් වූයෙම් හටගත් පවස් ඇති ක්ලාන්ත වූ එක් මහණකු දැක (මා සඳහා පිළියෙළ වූ) එක බතක් පිදීමි. එකල්හි (ඔහු) බතින් යුතුවූවකු කෙළෙමි.

1085. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1086. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

භික්ඛාදයක විමානයි.

## 6. 7

1087. ඉතා උස්වූ පියුම්රාමිණි ආදියෙන් කළ වැමි ඇති මේ විමානය හාත්පසින් සොළොස් යොදුනෙකි. වෛරූම්ණියෙන් කළ වැම් ඇති රුවන්පෝරු ඇතුරු බිම් ඇති උදර වූ යහපත් වූ කුළුගෙවල් සත්සියයෙක් වෙත්.

1088. එහි (තෝ) සිටිනෙහි ය. පානය කරනෙහි ය, අනුභව කරනෙහි ය, දිව්‍ය වීණාවෝ ද මිහිරි සේ වාදනය වෙති, සූ සැටක් පමණ වූ පුහුණු වූ සොඳුරු සැහැවි ඇති දෙව්ලොව සුවසේ හැසිරෙන්නා වූ උදර වූ දිව්‍යකන්‍යාවෝ ද නටති ගයති ප්‍රමොද වෙත්.

1089. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයෙහි කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1090. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හු ගේ දෑ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටු සිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1091. (වහන්ස) මම මිනිසුන් අතුරෙහි මිනිසෙක් වූයෙම් යව පල්ලෙක් වීමි. (එකල්හි) පහවූ රාගාදි රජස් ඇති වෙසෙසින් පහන් වූ කෙලෙස් කිලුටෙන් නො කැළඹුණු සිත් ඇති පැවිද්දකු දුටිමි.

1092. මම පහන් වූයෙම් කොමුපිඩු කොටසක් උන්වහන්සේට සියතින් පිදීමි. (ඒ කොමුපිඩු) පිදීමෙන් නඳුන්වෙනෙහි සතුටු වෙමි.

1093. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1094. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

**යවපාලකවිමානං.**

## 6. 8

1095. අලඞ්කතො මල්‍යධරො සුවත්ථො
සුකුණ්ඩලී කප්පිතකෙසමස්සු
ආමුත්තහත්ථාභරණො යසස්සී
දිබ්බෙ විමානම්හි යථාසි[1] චන්දිමා

1096. දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බා ච කඤ්ඤා තිදසචරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති

1097. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1098. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1099. අහං මනුස්සෙසු මනුස්සභූතො
දිස්වාන සමණෙ සීලවන්තෙ
සම්පන්නවිජ්ජාචරණෙ යසස්සී
බහුස්සුතෙ තණ්හක්ඛයූපපන්නෙ
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1100. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1101. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

**පඨමකුණ්ඩලීවිමානං.**

1. යථාපි – මජසං,

1093. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1094. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

යවපාලකවිමාන යි.

## 6. 8

1095. (එම්බා දිව්‍යපුත්‍රය) අලඞ්කෘත වූ දිවමලින් බරවූ මනාවස්ත්‍ර ඇති ශොභන කුණ්ඩලාභරණ ඇති අන්දම් තබන ලද කෙස්රැවුළු ඇති පැළඳි අත් අබරණ ඇති පිරිවර ඇති (තෝ) දිව විමන්හි සඳ මෙන් බබළන්නෙහි.

1096. (එහි) දිව්‍යවීණාවෝ මිහිරි සේ වාදනය වෙති. සූසැටක් පමණ වූ පුහුණු වූ සොඳුරු සැහැවි ඇති දෙව්ලොව සුවසේ හැසිරෙන්නා වූ උදර වූ දිව්‍ය කන්‍යාවෝ ද නටති ගයති ප්‍රමෝද වෙත්.

1097. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1098. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටු සිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1099. (වහන්ස) මම මිනිසුන් අතුරෙහි මනුෂ්‍ය වූයෙම් සිල්වත් විද්‍යා හා චරණ ධර්මයන්ගෙන් යුත් පිරිවර ඇති බහුශ්‍රැත වූ තෘෂ්ණාක්ෂය කළ ශ්‍රමණයන් දැක පහන් සිතැත්තෙම් අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් දුනිමි.

1100. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1101. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

පඨමකුණ්ඩලීවිමාන යි.

## 6. 9

1102. අලඞ්කතො මල්‍යධරො සුවත්ථො
සුකුණ්ඩලී කප්පිතකෙසමස්සු
ආමුත්තහත්ථාභරණො යසස්සී
දිබ්බෙ විමානම්හි යථාසි චන්දිමා

1103. දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බා ච කඤ්ඤා තිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති

1104. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1105. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1106. අහං මනුස්සෙසු මනුස්සභූතො
දිස්වාන සමණෙ සාධුරූපෙ
සම්පන්නවිජ්ජාචරණෙ යසස්සී
බහුස්සුතෙ සීලවතූපපන්නෙ[1]
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1107. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1108. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

දුතියකුණ්ඩලීවිමානං.

---

1. සීලවතෙන පසන්නෙ – සීමු
ඛණ්ණාසවව්‍යූපපන්නෙ – ස්‍යා

## 6. 9

1102. (එම්බා දිව්‍යපුත්‍රය) අලඞ්කෘත වූ දිව්මලින් බර වූ මනාවස්ත්‍ර ඇති ශොභන කුණ්ඩලාභරණ ඇති අන්දම් තබනලද කෙස් රැවුළු ඇති පැළඳි අත් අබරණ ඇති පිරිවර ඇත්තා වූ (තෝ) දිව්විමන්හි සඳ මෙන් බබළන්නෙහි.

1103. (එහි) දිව්‍ය වීණාවෝ මිහිරි සේ වාදනය වෙති. සූසැටක් පමණ වූ පුහුණු වූ සොඳුරු සැහැවි ඇති දෙව්ලොව සුවසේ හැසිරෙන්නා වූ උදර වූ දිව්‍යකන්‍යාවෝ ද නටති, ගයති, ප්‍රමෝද වෙත්.

1104. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? නාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1105. මුගලන් තෙරුන් විසින් මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1106. (වහන්ස) මම මිනිසුන් අතුරෙහි මනුෂ්‍ය වූයෙම් මනා පියෙව් ඇති විද්‍යා හා චරණධර්මයන්ගෙන් යුක්ත වූ පිරිවර ඇති බහුශ්‍රැත වූ ශීලව්‍රත සමන්වාගත වූ ශ්‍රමණයන් දැක, පහන් සිතැත්තෙම් අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් දුනිමි.

1107. ඒ පිනෙන් මාගේ සිරුරුපැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තීහු මට පහළ වෙත්.

1108. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**දුතියකුණ්ඩලීවිමාන යි.**

## 6. 10

1109. යා දෙවරාජස්ස සභා සුධම්මා
යත්ථච්ඡති දෙවසඞ්ඝො සමග්ගො
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1110. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1111. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලන්ති

1112. අහං මනුස්සෙසු මනුස්සභූතො
රඤ්ඤො පායාසිස්ස අහොසිං මාණවො
ලද්ධා ධනං සංවිභාගං අකාසිං
පියා ච මෙ සීලවන්තො අහෙසුං
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1113. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා

1114. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

උත්තරවිමානං[1].

**පායාසි වග්ගො ඡට්ඨො.**

**තස්සුද්දානං:–**

ද්වෙ අගාරිනො ඵලදායී ද්වෙ උපස්සයදායී භික්ඛාදායී
යවපාලකො චෙව ද්වෙ කුණ්ඩලිනො පායාසීති
පුරිසානං දුතියො වග්ගො පවුච්චතීති.

1. පායාස විමානං – මජසං.

## 6. 10

1109. (එම්බා දෙවපුත්‍රය) යම් තැනෙක දිව්‍යසමූහයා එක්ව හිඳී ද, ඒ සක්දෙව් රජුගේ යම් සුධර්මා නම් සභාවක් වෙයි ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1110. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුත් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි ද?

1111. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමෙ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1112. මම මිනිසුන් අතුරෙහි මනුෂ්‍ය වූයෙමි. පායාසි රජුගේ මාණවකයෙක් වීමි. (එකලැ) ධනය ලබා සංවිභාග කෙළෙමි. මට සිල්වත්හු ද ප්‍රියවූහ. (උන්වහන්සේට) පහන් සිතැත්තෙම් අහර ද පැන් ද සකස් කොට මහත් දනයක් දුනිමි.

1113. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1114. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුත් බබුළුවයි.

**උත්තරවිමාන යි.**

## සවන පායාසිවර්ග යි.

**එහි උද්දනය:–**

අගාරිය දෙකයැ ඵලදයක යැ උපස්සය දෙක යැ භික්ඛාදයක යැ යවපාලක යැ කුණ්ඩලී දෙක යැ (උත්තර) පායාසි යැ යි මෙසේ පුරුෂවිමාන පිළිබඳ දෙවෙනි වර්ගය කියනු ලැබේ.

# 7. සුනික්ඛිත්තවග්ගො

## 7. 1

1115. යථා වනං චිත්තලතං පභාසති
උය්‍යානසෙට්ඨං තිදසානමුත්තමං
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1116. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති

1117. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1118. අහං මනුස්සෙසු මනුස්සභූතො
දළිද්දො අතාණො කපණො කම්මකරො අහොසිං
ජිණ්ණෙ ච මාතාපිතරො අභරිං[1]
පියා ච මෙ සීලවන්තො අහෙසුං
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1119. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

1120. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**චිත්තලතාවිමානං.**

## 7. 2

1121. යථා වනං නන්දනං චිත්තලතං[2] පභාසති
උය්‍යානසෙට්ඨං තිදසානමුත්තමං
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

1122. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණොච තෙ සබ්බදිසා පභාසතීති

---

1. අභාරිං – මජසං.
2. නන්දනං – මජසං.

# 7. සුනික්ඛිත්තවර්ගය

## 7. 1

1115. (එම්බා දෙවපුත්‍රය) තව්තිසා දෙවියනට උතුම් වූ උයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ චිත්‍රලතා වනය යම්සේ බබළා ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1116. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1117. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවසී ය.

1118. මම (පෙර) මිනිසුන් අතර මිනිසෙක් වූයෙමි. දිළිඳු වූ අසරණ වූ බැගෑපත් වූ කම්කරුවෙක් වීමි. (ඒ මම) ජරාවෙන් දුර්වල වූ මාගේ මවුපියන් පොෂණය කෙළෙමි. සිල්වත්හු ද මට ප්‍රියවූහ. පහන් සිතැතියෙම් අහර ද පැන් ද සකස් කොට මහාදනයක් දුනිමි.

1119. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1120. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**චිත්‍රලතාවිමාන යි.**

## 7. 2

1121. (එම්බා දෙවපුත්‍රය) තව්තිසා දෙවියනට උතුම් වූ උයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ නන්‍දනවනය හා චිත්‍රලතාවනය යම්සේ බබළා ද, එබඳු වූ තාගේ මේ විමානය අහසෙහි බබළමින් සිටී.

1122. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1123. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

1124. අහං මනුස්සෙසු මනුස්සභූතො
දළිද්දො අතාණො කපණො කම්මකරො අහොසිං
ජිණ්ණෙ ච මාතාපිතරො අභරිං
පියා ච මෙ සීලවන්තො අහෙසුං
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1125. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

1126. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

**නන්දනවිමානං.**

## 7. 3

1127. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතා සුභා

1128. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා

1129. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

1130. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1131. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

1123. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවසී ය.

1124. මම (පෙර) මිනිසුන් අතුරෙහි මිනිස් වූයෙම් දිළිඳු වූ අසරණ වූ බැගෑපත් වූ කම්කරුවෙක් වීමි. (ඒ මම) ජරාවෙන් දුර්වල වූ මාගේ මවුපියන් පොෂණය කෙළෙමි. සිල්වත්හු ද මට ප්‍රියවූහ. පහන් සිතැතියෙම් අහර ද පැන් ද සකස් කොට මහාදනයක් දුන්මි.

1125. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන සම්පත්තිහු මට පහළ වෙත්.

1126. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

නන්දනවිමාන යි.

## 7. 3

1127. (එම්බා දිව්‍යපුත්‍රය) ඉතා උස්වූ පියුම්රාමිණි ආදියෙන් කළ ටැම් ඇති මේ විමානය හාත්පසින් දොළොස් යොදුනෙකි. වෙරළුමිණි ආදියෙන් කළ ටැම් ඇති රුවන්පෝරු ඇතුරූ බිම් ඇති උදර වූ යහපත් වූ කුළුගෙවල් සත් සියයෙක් වෙත්.

1128. එහි (තෝ) සිටින්නෙහි ය, පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය, දිව්‍යවීණාවෝ ද මිහිරි සේ වාදනය වෙත්. මෙහි දිව්‍යමය වූ රසයෝ ද පස්කම් ගුණයෝ ද වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

1129. කවර හෙතුවකින් තට එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තාගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තට පහළ වෙත් ද,

1130. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1131. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1132. අහං මනුස්සෙසු මනුස්සභූතො
විවනෙ පථෙ චඞ්කමනං[1] අකාසිං
ආරාමරුක්ඛානි ච රොපයිස්සං
පියා ච මෙ සීලවන්තො අහෙසුං
අන්නං ච පානං ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං

1133. තෙන මෙ තාදිසො වණ්ණො
තෙන මෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා
යෙ කෙචි මනසො පියා

1134. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමකාසි පුඤ්ඤං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

මණිථූණවිමානං.

## 7, 4

1135. සොවණ්ණමයෙ පබ්බතස්මිං විමානං සබ්බතො පභං
හෙමජාලකපච්ඡන්නං[2] කිඞ්කිණිජාල[3]කප්පිතං

1136. අට්ඨංසා සුකතා ථම්භා සබ්බෙ වෙළුරියාමයා
එකමෙකාය අංසියා රතනා සත්ත නිම්මිතා

1137. වෙළුරියසුවණ්ණස්ස ඵලිකා රූපියස්ස ච
මසාරගල්ලමුත්තාහි ලොහිතඞ්ගමණීහි ච

1138. චිත්රා මනොරමා භූමි න තත්ථුද්ධංසතී රජො
ගොපාණසීගණා පීතා කූටං ධාරෙන්ති නිම්මිතා

1139. සොපානානි ච චත්තාරි නිම්මිතා චතුරො දිසා
නානා රතනගබ්භෙහි ආදිච්චොව විරොචති

1140. වෙදියා[4] චතස්සො තත්ථ විභත්තා භාගසො මිතා,
දද්දල්ලමානා ආභන්ති සමන්තා චතුරො දිසා

1141. තස්මිං විමානෙ පවරෙ දෙවපුත්තො මහප්පභො
අතිරොචති වණ්ණෙන උදයන්තොව භානුමා[5]

---

1. සඞ්කමනං – මජ්සං.
2. හෙමජාල පටිච්ඡන්නං – මජ්සං.
3. කිංකිණිකජාල – P.T.S
කිංකණිකජාල – සතා.
4. වෙදිකා, – P.T.S
5. භාණුමා – මජ්සං, සීමු.

1132. (වහන්ස) මම (පෙර) මිනිසුන් අතුරෙහි මනුෂ්‍ය වූයෙම් වන මගෙකැ සක්මනක් කෙළෙමි. එහි ආරාමයක් කොට ගස් ද රොපණය කෙළෙමි. සිල්වත්හු ද මට ප්‍රියවූහ. පහන් සිතැත්තෙම් අහර ද පැන් ද සකස් කොට මහා දනයක් දුනිමි.

1133. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය ද එබඳු වෙයි. ඒ පිණෙන් මාගේ සම්පත්හු මෙහි සමෘද්ධ වෙති. මන වඩන යම්කිසි සම්පත්හු වෙත් ද, ඒ සම්පත්හු මට පහළ වෙත්.

1134. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මිනිස් වූ මම යම් පිනක් කෙළෙම ද, (එය) ඔබට කියමි. එයින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

මණිථූණවිමාන යි.

## 7. 4

1135. (එම්බා දෙවපුත්‍රය) රුවන්දූලින් සැරසූ කිකිණිදැල් ඇති හාත්පසින් බබළන (මේ) විමානය රන්පවුවෙකැ පිහිටියේ වෙයි.

1136. අටැස් වූ සුදුපැහැති සියලු ටැම්හු වෛරෑඩිමිණියෙන් මොනවට කරන ලදහ. (ඒ ටැම්හි) එක් එක් කොටස සත් රුවනින් නිමවන ලදී.

1137–1138. වෛරෑඩිමිණියෙන් හා රනින් ද පළිඟුයෙන් හා රිදියෙන් ද මැසිරිගලින් හා මුතුයෙන් ද රතුමිණියෙන් ද විසිතුරු වූ සිත්කලු භූමිය වෙයි. එහි ධූලි නො නගියි. නිර්මිත වූ රන්වන් වූ ගොනැස් සමූහයෝ (සත්රුවන් මුවා) කැණිමඩල දරත්.

1139. සිවු දිගුහි හිණි සතරෙක් මවන ලදි. නොයෙක් රුවනින් කළ ගබඩාවන් කරණකොට ගෙන (මේ විමන) හිරුමෙන් බබළයි.

1140. එහි සිවු දිගුහි අවට අතිශයින් දීප්තිමත් වූ කොටස් වශයෙන් පමණට බෙදූ සිවු වෙදිකාවෝ බබළත්.

1141. ඒ උතුම් විමන්හි සිටින උදවන හිරුමෙන් මහත් කැලුම් ඇති දෙව්පුත් වූ (තෝ) සිරුරු පැහැයෙන් අතිශයින් බබළති.

1142. දානස්ස තෙ ඉදං ඵලං අථො සීලස්ස වා පන
අථො අඤ්ජලිකම්මස්ස තං මෙ අක්ඛාහි පුච්ඡිතො ති.

1143. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1144. අහං අන්ධකවින්දස්මිං බුද්ධස්සාදිච්චබන්ධුනො
විහාරං සත්ථු කාරෙසිං පසන්නො සෙහි පාණිහි

1145. තත්ථ ගන්ධඤ්ච මාලඤ්ච පච්චග්ඝඤ්ච[1] විලෙපනං
විහාරං සත්ථුනො දසිං[2] විප්පසන්නෙන චෙතසා

1146. තෙන මය්හමිදං ලද්ධං වසං වත්තෙමි නන්දනෙ
නන්දනෙ පවනෙ[3] රම්මෙ නානාදිජගණායුතෙ
රමාමි නච්චගීතෙහි අච්ඡරාහි පුරක්ඛතොති.

සුවණ්ණවිමානං.

## 7. 5

1147. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා

1148. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා

1149. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා

1150. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1151. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිද ඵලං

1. පච්චග්ඝඤ්ච – සීමු. ප.
2. සත්ථු අදසිං – මජසං.
3. නන්දනෙ ච වනෙ – මජසං.

1142. (එම්බා දිව්‍යපුත්‍රය) තාගේ මේ පුණ්‍යඵලය දනයක්හුගේ ද, නැතහොත් සීලයක්හුගේ ද, නැතහොත් අඤ්ජලිකර්මයක්හුගේ ද යි මා විසින් විචාරන ලදුයෙහි එය මට කියව.

1143. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ ද යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවැසී ය.

1144. (වහන්ස) මම (පෙර) අන්‍ධකවින්‍ද නම් රටෙහි සූර්‍ය්‍යබන්ධු වූ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේට පහන් සිතැතියෙම් සියතින් (ඒ ඒ කිස කරමින්) විහාරයක් කරවූයෙමි.

1145. ඒ අන්‍ධකවින්‍ද රටෙහි (මම) වෙසෙසින් පහන් සිතින් ශාස්තෲන් වහන්සේට අභිනව සුවඳ ද මල්ද විලෙවුන් ද විහාරය ද පූජා කෙළෙමි.

1146. ඒ පිනෙන් මා විසින් මේ විපාකය ලබනලදී. නඳුන් වෙනෙහි අනුන් අභිභවා වෙසෙමි. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරනලද මම නොයෙක් පක්ෂි සමූහයාගෙන් යුක්ත වූ සිත්කලු වූ නඳුන් වෙනෙහි ගී නැටුම්වලින් සිත් අලවා වෙසෙමි.

සුවණ්ණවිමාන යි.

## 7. 5

1147. (එම්බා දිව්‍යපුත්‍රය) ඉතා උස්වූ පියුම්රාමිණි ආදියෙන් කළ ටැම් ඇති මේ විමානය හාත්පසින් දෙළොස් යොදුනෙකි. වෙරළුමිණියෙන් කළ ටැම් ඇති උදර වූ යහපත් වූ කූළුගෙවල් සත්සියයෙක් වෙත්.

1148. (තෝ) එහි සිටින්නෙහි ය. පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය. දිව්‍යවීණාවෝ ද මිහිරි සේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ රසයෝ ද පස්කම් ගුණයෝ ද වෙති. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

1149. කවර හෙතුවකින් තොපට එබඳු සිරුරු පැහැයෙක් වීද? කවර පිනෙකින් තොපගේ සුචරිතඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තීහු වෙත් ද, ඒ සම්පත්තීහු (කවර පිනෙකින්) තොපට පහළ වෙත් ද.

1150. (තෝ) දෙවර්සියට පැමිණියෙහි, මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයේ කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කවර පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තේ වෙහි ද?

1151. මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ ද යි මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ (මෙසේ) පැවසී ය.

1152. ගිම්හානං පච්ඡිමෙ මාසෙ පතපන්තෙ[1] දිවාකරෙ[2]
පරෙසං භතකො පොසො අම්බාරාමමසිඤ්චති[3]

1153. අථ තෙනාගමා භික්ඛු සාරිපුත්තොති විස්සුතො
කිලන්තරූපො කායෙන අකිලන්තොව චෙතසා

1154. තඤ්ච දිස්වාන ආයන්තං අවොචං අම්බසිඤ්චකො'
සාධු තං භන්තෙ න්හාපෙය්‍යං යං මමස්ස සුඛාවහං

1155. තස්ස මෙ අනුකම්පාය නික්ඛිපි පත්තචීවරං
නිසීදි රුක්ඛමූලස්මිං ඡායාය එකචීවරො

1156. තඤ්ච අච්ඡෙන වාරිනා පසන්නමානසො නරො
න්හාපයී රුක්ඛමූලස්මිං ඡායාය එකචීවරං

1157. අම්බො ච සිත්තො සමණො ච න්හාපිතො
මයා ච පුඤ්ඤං පසුතං අනප්පකං
ඉති සො පීතියා කායං සබ්බං ඵරති අත්තනො

1158. තදෙව එත්තකං කම්මං අකාසිං තාය ජාතියා
පහාය මානුසං දෙහං උපපන්නොම්හි නන්දනං

1159. නන්දනෙ පවනෙ රම්මෙ නානාදිජගණායුතෙ
රමාමි නච්චගීතෙහි අච්ඡරාහි පුරක්ඛතොති.

අම්බවිමානං.

## 7. 6

1160. දිස්වාන දෙවං පටිපුච්ඡි භික්ඛු
උච්චෙ විමානම්හි චිරට්ඨිතිකෙ
ආමුත්තහත්ථාභරණං යසස්සිං[4]
දිබ්බෙ විමානම්හි යථාපි චන්දිමා.

1161. අලඞ්කතො මාලභාරී[5] සුවත්ථො
සුකුණ්ඩලී කප්පිතකෙසමස්සු
ආමුත්තහත්ථාභරණො යසස්සී
දිබ්බෙ විමානම්හි යථාපි චන්දිමා.

---

1. පතාපන්තෙ – ස්‍යා.
2. දිවංකරෙ – මජසං. ස්‍යා.
3. අසිඤ්චථ-පු.
4. ආමුත්තහත්ථාභරණෙ යසස්සි – ස්‍යා.
5. මල්‍යධරෙ – මජසං.

1152. ගිමන් කලැ පැසුළුමසැහි හෙවත් ඇසළමසැ හිරු අතිශයින් දිලෙන කල්හි අනුනට බැළමෙහෙ කොට ජීවත්වන්නා වූ පුරුෂයෙක් අඹවනයකට දිය ඉසී.

1153. එකල්හි ඒ දිශායෙන් කයින් කලාන්ත වූ සිතින් කලාන්ත නොවූ ශාරිපුත්‍ර යැයි ප්‍රසිද්ධවූ මහරහතුන් වහන්සේ වැඩමකළසේක.

1154. අඹවනයට දිය ඉසින්නා වූ (ඒ මම) එන්නා වූ උන් වහන්සේ දැක, "වහන්ස, යම් හෙයකින් ඔබ වහන්සේ සනහවන්නෙම් නම් යෙහෙක. එය මට සැප එළවන්නේ ය"යි කීවෙමි.

1155. (එසඳ උන් වහන්සේ) ඒ මට අනුකම්පා පිණිස පාසිවුරු බහා තැබූහ. එක් සිවුරෙන් යුක්ත ව රුක්මුල සෙවණෙහි වැඩහුන් සේක.

1156. පහන් සිතැති මම රුක්මුල සෙවණෙහි වැඩහුන් එක් සිවුරෙන් යුත් උන් වහන්සේ පිරිසිදු දියෙන් නැහැවීමි.

1157. මා විසින් අඹගස ද දියෙන් ඉසින ලදි. ශ්‍රමණයන් වහන්සේ ද සනහවන ලදහ. ස්වල්ප නොවූ පින් ද රැස්කරනලද්දූ යි හෙ තෙමේ තමාගේ මුළුසිරුර ප්‍රීතියෙන් පැතිරැවී.

1158. (මම) ඒ ජාතියෙහි එපමණක් ම වූ පින්කම් කෙළෙමි. (ඒ පින්කමින්) මිනිස් සිරුර හැර (මේ) නඳුනුයනට පැමිණියෙම් වෙමි.

1159. දිව්‍යාප්සරාවන් විසින් පිරිවරන ලද (ඒ මම) නොයෙක් පක්ෂිසමූහයන්ගෙන් යුක්ත වූ සිත්කලූ වූ නඳුන්වෙනෙහි ගී නැටුම් වලින් සිත් අලවා වෙසෙමි.

**අම්බවිමාන යි.**

## 7. 6

1160. (සිය) දෙව්විමන්හි සඳදෙව්පුත් යම්සේ බබළා ද, එසේ (බබළන) උස් වූ බොහෝකල් පවත්නා වූ විමානයෙහි පැළඳි අත් අබරණ ඇති පිරිවර ඇති දෙවියකු දැක මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ (මෙසේ) විචාළ සේක.

1161. (එම්බා දෙවපුත්‍රය,) අලඞ්කෘත වූ මල්මාලා දරන්නා වූ මනාවත් ඇති මනා කොඬොල් ඇති සැරැහූ කෙස්රැවුළු ඇති පැළඳි අත් අබරණ ඇති පිරිවර ඇත්තා වූ (තෝ) මේ දෙව්විමන්හි චන්ද්‍රයා මෙන් (බබළහි.)

1162. දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බා ච කඤ්ඤා තිදසචරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති

1163. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1164. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං

1165. අහං මනුස්සෙසු මනුස්සභූතො
සඞ්ගම්ම රක්ඛිස්සං පරෙසං ධෙනුයො
තතො ච ආගා සමණො මමන්තිකෙ
ගාවො ච මාසෙ අගමංසු ඛාදිතුං

1166. ද්වයජ්ජ කිච්චං උභයඤ්ච කාරියං
ඉච්චෙවහං භන්තෙ තදා විචින්තයිං
තතො ච සඤ්ඤං පටිලද්ධ යොනිසො
දදාමි භන්තෙති ඛිපිං අනන්තකං

1167. සො මාසඛෙත්තං තුරිතො අවාසරිං
පුරා අයං භඤ්ජති[1] යස්සිදං ධනං
තතො ච කණ්හො උරගො මහාවිසො
අදංසි පාදෙ තුරිතස්ස මෙ සතො

1168. ස්වාහං අට්ටොම්හි දුක්ඛෙන පීළිතො
භික්ඛු ච තං සාමං මුඤ්චිත්වා නන්තකං[2]
අහාසි කුම්මාසං මමානුකම්පයා[3]
තතො චුතො කාලකතොම්හි දෙවතා

1169. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
තයා හි භන්තෙ අනුකම්පිතො භුසං
කතඤ්ඤුතාය අභිවාදයාමි තං

---

1. භුඤ්ජති – සීමු.
2. මුඤ්චිත්වා අනන්තකං – ස්‍යා.
3. මමානුකම්පියා – ඉක.
මමානුකම්පාය – ස්‍යා.

1162. (එහි) දිව්‍යවීණාවෝ මිහිරි සේ වාදනය වෙති. සූ සැටක් පමණ වූ පුහුණු වූ සොඳුරු සැහැවි ඇති දෙව්ලොවැ සුවසේ හැසිරෙන්නා වූ උදර වූ දිව්‍යකන්‍යාවෝ ද නටති, ගයති, ප්‍රමොද වෙත්.

1163. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයෙහි කිනම පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙහි වෙහි ද?

1164. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දූ යි (මෙසේ) පැවැසී ය.

1165. (වහන්ස) මම (පෙර) මිනිසුන් අතර මනුෂ්‍ය වූයෙම අනුන්ගේ දෙනුන් එක්රැස් කොට රක්කෙමි. එකල්හි මහණෙක් මා වෙතට පැමිණියේ ය. ගවයෝ ද මැකෙත කන්නට ගියහ.

1166. වහන්ස, එකල්හි මම (මා විසින්) කළයුතු වූ කිස දෙකක් ඇතැ යි සිතීමි. වහන්ස, ඉක්බිති නුවණින් ධර්මසංඥාව පිළිලැබ (කොමුපිඩු) දෙමි යි රෙදිකඩ බැහැර කෙළෙමි.

1167. මෙ ගවසමූහය තෙමේ යමක්හුගේ මේ මාෂශස්‍යය මඩනෝ ද, ඒ (මම) එයට පෙර යුහුසුලු වූයෙම් මැකෙතට පැමිණියෙමි. එහි වෙගයෙන් ගිය මාගේ පය මහාවිෂ ඇති කෘෂ්ණසර්පයෙක් දෂ්ට කෙළේ ය.

1168. ඒ මම සර්පවිෂයෙන් උපද්‍රැත වූයෙම් මරණදුකින් පෙළුණෙමි වෙමි. මහණ ද මට අනුකම්පා පිණිස තෙමේ ම ඒ රෙදිකඩ මුද කොමුපිඩු වැළඳී ය. (මම) කලුරිය කෙළෙම් ඒ මිනිසත් බවෙන් චුත ව දෙවියෙක් වෙමි.

1169. මා විසින් ඒ කුශලකර්මය ම කරන ලදි. වහන්ස, ඔබ-විසින් බොහෝසේ අනුකම්පා කරනු ලැබූ මම ඒ කර්මයෙන් සැප ද විඳිමි. කළගුණ දන්නා බැවින් ඔබ වහන්සේ වඳිමි.

1170. සදෙවකෙ ලොකෙ සමාරකෙ ච
අඤ්ඤො මුනී නත්ථි තයානුකම්පකො
තයා හි භන්තෙ අනුකම්පිතො භුසං
කතඤ්ඤුතාය අභිවාදයාමි තං

1171. ඉමස්මිං ලොකෙ පරස්මිං වා පන
අඤ්ඤො මුනී නත්ථි තයානුකම්පකො
තයා හි භන්තෙ අනුකම්පිතො භුසං
කතඤ්ඤුතාය අභිවාදයාමි තන්ති.

**ගොපාල විමානං.**

## 7. 7

1172. පුණ්ණමාසෙ යථා චන්දො නක්ඛත්තපරිවාරිතො,
සමන්තා අනුපරියාති තාරකාධිපතී සසී.

1173. තථූපමං ඉදං ව්‍යම්හං දිබ්බං දෙවපුරම්හි ච,
අතිරොචති වණ්ණෙන උදයන්තොව රංසිමා.

1174. වෙළුරියසුවණ්ණස්ස ඵලිකා රූපියස්ස ච,
මසාරගල්ලමුත්තාහි ලොහිතඞ්කමණීහි ච.

1175. චිත්‍රා මනොරමා භූමි වෙළුරියස්ස සන්ථතා,
කූටාගාරා සුභා රම්මා පාසාදො තෙ සුමාපිතො.

1176. රම්මා ච තෙ පොක්ඛරණී පුථුලොමනිසෙවිතා,
අච්ඡොදිකා විප්පසන්නා සොණ්ණවාලුකසන්ථතා.

1177. නානාපදුම සඤ්ඡන්නා පුණ්ඩරීකසමොතතා[1]
සුරභිං සම්පවායන්ති මනුඤ්ඤා මාලුතෙරිතා.

1178. තස්සා තෙ උභතො පස්සෙ වනගුම්බා සුමාපිතා,
උපෙතා පුප්ඵරුක්ඛෙහි ඵලරුක්ඛෙහි චූභයං.

1179. සොවණ්ණපාදෙ පල්ලඞ්කෙ මුදුකෙ චොලසන්ථතෙ,[2]
නිසින්නං දෙවරාජංව උපතිට්ඨන්ති අච්ඡරා.

1180. සබ්බාභරණසඤ්ඡන්නා නානාමාලා විභූසිතා,
රමෙන්ති තං මහිද්ධිකං වසවත්තීව මොදසි.

1181. භෙරිසඞ්ඛමුදිඞ්ගාහි වීණාහි පණවෙහි ච,
රමසි රතිසම්පන්නො නච්චගීතෙ සුවාදිතෙ.

---

1. පුණ්ඩරීක සමොගතා – සයා,
2. ගොණකත්ථතෙ, -- මජ්සං.

1170. දෙවියන් සහිත වූ මරුන් සහිත වූ ලොකයෙහි ඔබ වහන්සේ හා සම වූ අනුකම්පා ඇති අන්‍ය වූ මුනිවරයෙක් නැත. වහන්ස, ඔබ වහන්සේ විසින් අතිශයින් අනුකම්පා කරනු ලැබූ (මම) කළගුණ දන්නා බැවින් ඔබ වඳිමි.

1171. මෙලොව ද පරලොව ද ඔබ වහන්සේ හා සම වූ අනුකම්පා ඇති අන්‍ය වූ මුනිවරයෙක් නැත. වහන්ස, ඔබ වහන්සේ විසින් අතිශයින් අනුකම්පා කරනු ලැබූ මම කළගුණ දන්නා බැවින් ඔබ වඳිමි.

ගොපාලවිමාන යි.

## 7. 7

1172. තාරකාවන්ට අධිපති වූ සස ලකුණු ඇත්තා වූ තාරකාවන් විසින් පිරිවරන ලද පුරපසළොස්වක් හි චන්ද්‍රයා සම්සේ හාත්පස වටා ඇවිදී ද,

1173. එබඳු වූ මේ දිව්‍යවිමානය ද උදගිරුමෙන් දෙව්ලොවැ පැහැයෙන් අතිශයින් බබළයි.

1174-1175. වෛරෙඩ්මිණියෙන් හා රතින් ද පළිඟුයෙන් හා රිදියෙන් ද මැසිරිගලින් හා මුතුයෙන් ද රතුමිණියෙන් ද විසිතුරු වූ සිත්කලු භූමිය වෙයි. වෛරෙඩ්මිණියෙන් අතුරන ලද වෙයි. සිත්කලු වූ යහපත් වූ කුළු ගෙවල් ද වෙයි. මෙසෙයින් තාගේ පහය මැනවින් මැවුණේ වේ.

1176-77. දිව්මසුන් විසින් සෙවුනා ලද නිර්මල ජලය ඇති වෙසෙසින් පහන් වූ රුවන්වැලි ඇතුරූ නොයෙක් පියුමෙන් ගැවැසීගත් හෙළ පියුමෙන් හාත්පස පැතුරුණු පවනින් කම්පිත වූ මනරම් වූ තාගේ පොකුණු මනා සුවඳ වහනය කෙරේ.

1178. තාගේ ඒ පොකුණු දෙපස මල්රුකින් හා පලරුකින් යුක්තවූ වනලැහැබ්හු මවනලදහ.

1179. රන්වන් පා ඇති දිවසළු අතුළ මොළොක් වූ පලහෙහි සක්දෙව් රජු මෙන් හුන්නා වූ තා වෙත දිව්‍යාප්සරාවෝ එළඹ සිටිත්.

1180. සියලු අබරණින් වැසුණු නන්වන් මලින් සැරැහුණු ඒ දිව්‍යාප්සරාවෝ මහත් සෘද්ධි ඇති තා සතුටු කරවත්. (ඒ තෝ) වසවත් දෙව්රජහු මෙන් සතුටු වෙහි.

1181. දෙවරතියෙන් යුක්ත වූ (තෝ) බෙර සක් මිහිඟුයෙන් ද වීණායෙන් හා පණාබෙරින් ද නැටුම් ගැයුම් මැනවින් පවත්නා කල්හි සිත් අලවා වෙසෙහි.

1182. දිබ්බා තෙ විවිධා රූපා දිබ්බා සද්ද අථො රසා,
ගන්ධා ච තෙ අධිප්පෙතා ඵොට්ඨබ්බා ච මනොරමා.

1183. තස්මිං විමානෙ පවරෙ දෙවපුත්ත මහප්පභො,
අතිරොචසි වණ්ණෙන උදයන්තොව භානුමා.

1184. දානස්ස තෙ ඉදං ඵලං අථො සීලස්ස වා පන,
අථො අඤ්ජලිකම්මස්ස තං මෙ අක්ඛාහි පුච්ඡිතොති.

1185. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1186. අහං කපිලවත්ථුස්මිං සාකියානං පුරුත්තමෙ,
සුද්ධොදනස්ස පුත්තස්ස කණ්ඨකො සහජො අහං.

1187. යදා සො අඩ්ඪරත්තායං බොධාය මභිනික්ඛමි,
සො මං මුදූහි පාණීහි ජාලතම්බනඛෙහි[1] ච.

1188. සත්ථිං ආකොටයිත්වාන වහ සම්මාති ච බ්‍රවී,
අහං ලොකං තාරයිස්සං පත්තො සම්බොධිමුත්තමං.

1189. තං මෙ ගිරං සුණන්තස්ස හාසො මෙ විපුලො අහු,
උදග්ගචිත්තො සුමනො අභිසිංසිං[2] තදා අහං.

1190. අභිරූළ්හඤ්ච මං ඤත්වා සක්‍යපුත්තං මහායසං,
උදග්ගචිත්තො මුදිතො වහිස්සං පුරිසුත්තමං

1191. පරෙසං විජිතං ගන්ත්වා උග්ගතස්මිං දිවාකරෙ,
මමං ඡන්නඤ්ච ඔහාය අනපෙක්ඛො සො අපක්කමි.

1192. තස්ස තම්බනඛෙ පාදෙ ජිව්හාය පරිලෙහිසං,
ගච්ඡන්තඤ්ච මහාවීරං රුදමානො උදික්ඛිසං.

1193. අදස්සනෙනහං තස්ස සක්‍යපුත්තස්ස සිරීමතො,
අලත්ථං ගරුකාබාධං ඛිප්පං මෙ මරණං අහු.

1194. තස්සෙව අනුභාවෙන විමානං ආවසාමිදං,
සබ්බකාමගුණොපෙතං දිබ්බං දෙවපුරම්හි ච

1195. යඤ්ච මෙ අහුවා හාසො සද්දං සුත්වාන බොධියා,
තෙනෙව කුසලමූලෙන ඵුසිස්සං ආසවක්ඛයං.

1. ජාලිතම්බනඛෙහි - මජසං.
2. අභිසීසිං - මජසං.

1182. තා විසින් කැමතිවන ලද මනරම් වූ නන්වැදෑරුම් වූ දිව්‍යමය රූපයෝ ද දිව්‍යමය ශබ්දයෝ ද නැවත දිව්‍යමය රසයෝ ද දිව්‍යමය සුගන්ධයෝ ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෝ ද තට ඇත්තාහ.

1183. (එම්බා) දෙව පුත්‍රය, (තෝ) ඒ උතුම් දෙව්විමනෙහි උදුහිරු මෙන් මහත් ප්‍රභා ඇති වැ පැහැයෙන් අතිශයින් බබළන්නෙහි.

1184. (එම්බා දෙවපුත්‍රය,) තාගේ මේ පුණ්‍යඵලය දනයක්හුගේ ද? නැතහොත් සීලයක්හුගේ ද නැතහොත් අඤ්ජලිකර්මයක්හුගේ දැ යි මා විසින් විචාරන ලදුයෙහි එය මට කියව.

1185. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දිව්‍යපුත්‍ර තෙමේ තුටු සිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසී ය.

1186. (වහන්ස) මම (පෙර) ශාක්‍යයන්ගේ උතුම් වූ පුරය වූ කපිල වාස්තුයෙහි සුද්ධොදන රජුගේ පුත්‍රයාගේ සහජ වූ කණ්ඨක අශ්වයා වීමි.

1187–88. යම් කලෙක ඒ සිද්ධාර්ථකුමාර තෙමේ බුදුබව ලැබීම පිණිස මැදියම නික්මුණේ ද එකල්හි හෙතෙමේ ජාලහස්ත ලකුණෙන් යුත් තඹවන් නිය ඇති මොළොක් අත් කලවෙහි සන් කොට යහළුව මම උතුම් බුදුබවට පැමිණියෙම් ලොකයා (සසරින්) එතෙර කරන්නෙමි. එහෙයින් මා උසුලාගෙන යව යි කී ය.

1189. මා ඒ වචනය අසත් ම මට මහත් වූ සතුටෙක් විය. එකල්හි ඔදවැඩිසිත් ඇත්තා වූ එසේ ම සතුටුසිත් ඇත්තා වූ මම එය ආදරයෙන් පිළිගතිමි.

1190. මහායසස් ඇති ශාක්‍යපුත්‍ර වූ ඒ සිද්ධාර්ථ කුමාරයන් මා පිට නැඟී හුන්නහු දැන ඔදවැඩි සිතැති වැ සොම්නස් වැ ඒ පුරුෂොත්තමයා උසුලාගෙන ගියෙමි.

1191. ඒ සිද්ධාර්ත්ථ කුමාර තෙමේ අන්‍ය රජුන්ගේ දෙශයකට ගොස් හිරු උදා වූ කල්හි මා ද ඡන්න (අසරුවා) ද හැර බලාපොරොත්තු රහිත ව බැහැර ගියේ ය.

1192. (මම) ඒ සිද්ධාර්ථ කුමාරයන්ගේ තඹවන් නිය ඇති පායුවල දිවින් ලෙවීමි. යන්නා වූ ඒ මහාවීරයන් දෙස හඬමින් බලා සිටියෙමි.

1193. ශ්‍රීමත් වූ ඒ ශාක්‍යපුත්‍රයන්ගේ නො දැක්මෙන් (මම) මාරණාන්තික රොගයකට පැමිණියෙමි. එයින් වහා මාගේ මරණය විය.

1194. ඒ පුණ්‍යකර්මයාගේ අනුභාවයෙන් (මම) තව්තිසා භවනයෙහි සියලු කම් සැපතින් යුක්ත වූ මේ විමානයෙහි වසමි.

1195. බුදුවීම පිළිබඳ යම් ශබ්දයක් අසා මට හර්ෂයෙක් වී ද, ඒ කුසලමූලයෙන් ම නිවනට ද පැමිණෙන්නෙමි.

1196. සචෙ හි ගන්ත්වා ගච්ඡෙය්‍යාසි සත්ථු බුද්ධස්ස සන්තිකෙ,
මමා පි නං වචනෙන සිරසා වජ්ජාසි වන්දනං.

1197. අහම්පි දට්ඨුං ගච්ඡිස්සං ජිනං අප්පටිපුග්ගලං,
දුල්ලභං දස්සනං හොති ලොකනාථාන තාදිනන්ති.

1198. සො කතඤ්ඤූ කතවෙදී සත්ථාරං උපසඞ්කමි,
සුත්වා ගිරං චක්ඛුමතො ධම්මචක්ඛුං විසොධයි.

1199. විසොධෙත්වා දිට්ඨිගතං විචිකිච්ඡං වතානි ච
වන්දිත්වා සත්ථුනො පාදෙ තත්ථෙවන්තරධායථාති.

කන්ථක විමානං.

## 7. 8

1200. අනෙකවණ්ණං දරසොකනාසනං
විමානමාරුය්හ අනෙකචිත්තං
පරිවාරිතො අච්ඡරාසංගණෙන
සුනිම්මිතො භූතපතීව මොදසි.

1201. සමස්සමො නත්ථි කුතොපනුත්තරො,
යසෙන පුඤ්ඤෙන ච ඉද්ධියා ච.

1202. සබ්බෙ ච දෙවා තිදසගණා සමෙච්ච
තං තං නමස්සන්ති සසිංව දෙවා
ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති.

1203. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1204. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1205. අහං භදන්තෙ අහුවාසිං[1] පුබ්බෙ
සුමෙධනාමස්ස ජිනස්ස සාවකො
පුථුජ්ජනො අනවබොධොහමස්මිං[2]
සො සත්තවස්සානි පරිබ්බජිස්සහං.[3]

---

1. අහුවාසි, – මජසං.
2. අනානුබොධො හමාසිං, – මජසං.
3. පබ්බජිස්සං – ස්‍යා,
පබ්බජිස්සාහං PTS

1196. වහන්ස, ඉදින් ශාස්තෘ වූ බුදුන් වෙත යන්නහු නම් උන්වහන්සේට මාගේ වචනයෙන් ද මස්තකයෙන් මාගේ වැඳීම සැලකරනු මැනැවි.

1197. සමාන පුද්ගලයෙක් නැත්තා වූ පස්මරුන් දිනූ බුදුරජාණන් වහන්සේ දැකීමට මම ද යන්නෙමි. තාදී ගුණ ඇති ලොවට පිහිට වූ බුදුවරුන්ගේ දැකීම දුර්ලභ වෙයි.

1198. කළ ගුණ දන්නා වූ ඒ දිව්‍යපුත්‍ර තෙමේ බුදුන් වෙත එළඹියේ ය. හෙ තෙමේ පැනැස් ඇති බුදුන්ගේ ධර්මය අසා දහම් ඇස (සොවාන් මග) පිරිසිදු කෙළේ ය.

1199. ඒ දිව්‍යපුත්‍ර තෙමේ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස-යන් (ත්‍රිවිධ සංයොජනයන්) නසා බුදුරදුන්ගේ සිරිපා වැඳ එහි ම අතුරු දහන් වී ය.

**කන්ථක විමාන යි.**

## 7. 8

1200. නොයෙක් පැහැ ඇති පරිදහයන් හා ශොක නසන්නා වූ නොයෙක් ලෙසින් විසිතුරු වූ විමානයට නැඟී දිව්‍යාප්සරා සමූහයා විසින් පිරිවරන ලදුයේ සුනිර්මිත දිව්‍යරාජයා මෙන් සතුටු වෙහි.

1201. යසසින් පිනෙන් හා ඉද්ධියෙන් ඔබ හා සමාන වූවෙක් නැත. ඔබට ශ්‍රෙෂ්ඨ වූයෙක් කොයින් ද?

1202. සියලු තිදස් වැසි දෙවසමූහයෝ එක් ව දෙව් මිනිසුන් චන්ද්‍රයාට මෙන් ඒ ඔබට වඳිත්. නාගේ මේ දිව්‍යාප්සරාවෝ ද හාත්පසින් නටති, ගයති, ප්‍රමුදිත වෙත්.

1203. (තෝ) දෙවර්ධියට පැමිණියෙහි. මහත් අනුභාව ඇත්තෙහි. මනුෂ්‍ය වූයෙහි කිනම් පිනක් කෙළෙහි ද? නාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි, කිනම් පිනෙකින් මෙසේ දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙහි ද?

1204. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නා ලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටු සිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්මයක්හුගේ දැ යි (මෙසේ) පැවැසී ය.

1205. වහන්ස, මම පෙර සුමෙධ නම් වූ ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වූයෙමි. මම අධිගම රහිත වූ පෘථග්ජනයෙක් වූයෙමි. ඒ මම සත් වසක් පැවිදි ගුණ මාත්‍රයෙන් හැසුරුණෙමි.

1206. සචාහං සුමෙධස්ස ජිනස්ස සත්ථුනො
පරිනිබ්බුතස්සාසතිණ්ණස්ස තාදිනො
රතනුච්චයං හෙමජාලෙන ඡන්නං
වන්දිත්වා ථූපස්මිං මනං පසාදයිං.

1207. න මාසි දනං න ච මත්ථි දතුං
පරෙ ච ඛො තත්ථ සමාදපෙසිං
පූජෙථ නං පූජනීයස්ස ධාතුං
එවං කිර සග්ගමිතො ගමිස්සථ.

1208. තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච දිබ්බං අනුභොමි අත්තනා
මොදමහං තිදසගණස්ස මජ්ඣෙ
න තස්ස පුඤ්ඤස්ස ඛයම්පි අජ්ඣගන්ති.[1]

අනෙක වණ්ණ විමානං.

## 7. 9

1209. අලඞ්කතො මට්ටකුණ්ඩලී
මාලාධාරී හරිචන්දනුස්සදෙ
බාහාපග්ගය්හ කන්දසි
වනමජ්ඣෙ කිං දුක්ඛිතො තුවන්ති.

1210. සොවණ්ණමයො පභස්සරො
උප්පන්නො රථපඤ්ජරො මම
තස්ස චක්කයුගං න වින්දාමි
තෙන දුක්ඛෙන ජහිස්සං[2] ජීවිතන්ති.

1211. සොවණ්ණමයං මණිමයං
ලොහිතඞ්කමයං[3] අථ රූපියාමයං
ආචික්ඛ මෙ භද්ද මාණව
චක්කයුගං පටිලාභයාමි[4] තෙති.

1212. සො මාණවො තස්ස පාවදි
චන්දසූරියා උභයෙත්ථ දිස්සරෙ
සොවණ්ණමයො රථො මම
තෙන චක්කයුගෙන සොභතීති.

1. අජ්ඣගුන්ති, – මජ්සං.
අජ්ඣගාති, – PTS.
2. ජහාමි – මජ්සං.
ජහිස්සාමි – ස්‍යා–PTS.
3. ලොහිතකමයං – මජ්සං.
ලොහිතඞ්ගමයං – ස්‍යා.
ලොහමයං – කත්ථචි.
4. පටිපාදයාමි – මජ්සං.

1206. ඒ මම පිරිනිවියා වූ චතුරොඝය තරණය කළා වූ තාදී ගුණ ඇති පස්මරුන් දිනූ සුමෙධ නම් ශාස්තෘන් වහන්සේගේ හාත්පසින් කසුන් දැලින් වැසි රුවනින් කළ ධාතුචෛත්‍යයට වැඳ එහි සිත පැහැදවීමි.

1207. මා විසින් දෙනලද දනයෙක් නම් නො වී ය. දෙන්නට මට දෙය්‍යවස්තුවෙකුදු නැත. පිදියයුත්තහුගේ ධාතූන් පුදවූ. මෙසේ මෙලොවින් ච්‍යුත ව ස්වර්ගයට යන්නහු යයි එහි අනුන් සමාදන් කරවූයෙමි.

1208. මාවිසින් ඒ කුසල කර්මය කරන ලදී. (එහි විපාක විසින්) මම දිව සැපත් අනුභව කරමි. තිදස් වැසි දෙවගණයා මැද මම සතුටු වෙමි. ඒ පුණ්‍යයාගේ ක්‍ෂයට ද නො පැමිණියෙමි.

**අනෙකවණ්ණ විමාන යි.**

## 7. 9

1209. අලඞ්කෘත වූයෙහි මටකොඩොල් ඇතියෙහි මල්බර ඇතියෙහි රන්වන් සඳුන් ඇතියෙහි වනමැද දෙ අත් බැඳගෙන හඬනෙහි. තෝ කුමක් හෙයින් දුකට පැමිණියෙහි ද?

1210. රන්මුවා වූ පැහැ විහිදෙන රිය මැදිරියෙක් මට උපන. එයට සක් යුවළක් නො ලබමි. ඒ දුකින් දිවි හරින්නෙමි.

1211. සොඳුරු මාණවකය, මට කියව. රන්මුවා වූ හෝ මිණිමුවා වූ හෝ රන්මිණිමුවා වූ හෝ වැළි රිදීමුවා වූ හෝ සක් යුවළක් තට ලබාදෙමි.

1212. ඒ මාණවක තෙමෙ ඔහුට මෙසේ කී ය. මෙහි සඳ හිරු දෙදෙන පැනෙත්, මාගේ රන්මුවා රිය ඒ සක් යුවළින් හොබී.

1213. බාලො ඛො ත්වමසි මාණව
යො ත්වං පත්ථයසෙ අපත්ථියං
මඤ්ඤාමි තුවං මරිස්සසි
නහි ත්වං ලච්ඡසි චන්දසුරියෙති.

1214. ගමනාගමනම්පි දිස්සති
වණ්ණධාතු උභයත්ථ වීථියා
පෙතො පන කාලකතො න දිස්සති
කොනිධ කන්දතං බාල්‍යතරොති.

1215. සච්චං ඛො වදෙසි මාණව
අහමෙව කන්දතං බාල්‍යතරො
චන්දං විය දාරකො රුදං
පෙතං කාලකතාභිපත්ථයන්ති.

1216. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

1217. අබ්බහී[1] වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

1218. ස්වාහං අබ්බූළ්හ සල්ලොස්මි සීතිභූතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදාමි තව සුත්වාන මාණවාති.

1219. දෙවතානුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයන්ති.

1220. යඤ්ච කන්දසි යඤ්ච රොදසි
පුත්තං ආළාහනෙ සයං දහිත්වා
ස්වාහං කුසලං කරිත්වා කම්මං
තිදසානං සහබ්‍යතං පත්තොති.[2]

1221. අප්පං වා බහුං වා නාද්දසාම
දානං දදන්තස්ස සකෙ අගාරෙ
උපොසථකම්මං වා තාදිසං
කෙන කම්මෙන ගතොසි දෙවලොකන්ති.

1222. ආබාධිකොහං දුක්ඛිතො ගිලානො
ආතුරරූපොම්හි සකෙ නිවෙසනෙ
බුද්ධං විගතරජං විතිණ්ණකඞ්ඛං
අද්දක්ඛිං සුගතං අනොමපඤ්ඤං.

1. අබ්බූළ්හං – සයා,
2. ගතොති – මජසං.

1213. මාණවකය, යම්බඳු වූ තෝ නො පැතියයුත්තක් පතනෙහි ද? ඒ තෝ බාලයෙක් ම වෙහි. තෝ මැරෙන්නෙහි යයි හඟිමි. තෝ සඳ හිරු දෙදෙනා නො මැ ලබන්නෙහි ය.

1214. මේ අහසෙහි යාම ඊම් පෙනෙයි. පැහැ සටහන් ද පෙනෙයි. උභය වීථීහු ද පෙනෙත්. කලුරිය කළ පරලොව ගිය පුද්ගලයා නො පෙනෙයි. මෙහි වලප්නවුන් අතුරෙන් කවරෙක් නම් ඉතා අඥාන වෙයි ද?

1215. මාණවකය, සැබවක් ම කියහි. සඳ ඉල්ලා හඬන දරුවකු මෙන් කලුරිය කළ පරලොව ගිය නැනැත්තහු පතන මම් ම වලප්නවුන් අතුරෙන් ඉතා අඥාන වෙමි.

1216. ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් ඇවිලගත්තකු වූ ම මා දියෙන් ඉසින්නක්හු මෙන් හැම කාය චිත්ත දරථ එකැතින් නිවුයෙහි ය.

1217. යමෙක් සොවින් මඩනා ලද මාගේ පුත්‍රශොකය දුරු කෙළේ ද හෙතෙම මාගේ හෘදය ඇසුරු කළ ශොක නැමති හුල උපුලේ ය.

1218. මාණවකය, ඒ මම තාගේ අනුසස්නා අසා ඉදුරූ හුල් ඇතියෙම් වෙමි, සිහිල් වූයෙම් වෙමි, නිවියෙම් වෙමි, ශොක නො කරමි, නො හඬමි.

1219. දෙවියෙක් හෝ වෙහි ද? ගඳඹෙක් හෝ වෙහි ද? නොහොත් පුරින්දද නම් වූ සක්දෙව්රද වෙහි ද තෝ කවරෙක් හෝ වෙහි ද කවරකුගේ පුතෙක් හෝ වෙහි ද? අපි එ කරුණ කෙසේ දනුමෝ ද?

1220. තෙමේ පුතා සොහොනෙහි දවා යමකු සඳහා හඬනෙහි ද? යමකු සඳහා වලප්නෙහි ද? (තා පුත්) ඒ මම කුසල් කම් කොට දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමි.

1221. සියගෙයි දී ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ දනක් දෙනු නො දුටුම්හ. එබඳු පෙහෙවස් විසීමක් හෝ අන් පින් කමක් හෝ නො දුටුම්හ. කිනම් කර්මයෙකින් දෙව්ලොවට ගියෙහි ද?

1222. මම සිය නිවෙස්හි උපන්රොග ඇතියෙම් දුකට පැමිණියෙම් දැඩිගිලන්බැව් ඇතියෙම් ආතුරස්වභාව ඇතියෙම් වෙමි. (එකල්හි) සිවුසස් දනගත් පහවූ කෙලෙස් ඇති දුරු කළ සැක ඇති. අලාමක නුවණ ඇති සුගතයන් වහන්සේ දුටුවෙමි.

1223. ස්වාහං මුදිතමනො පසන්නචිත්තො
අඤ්ජලිං අකරිං තථාගතස්ස
තාහං කුසලං කරිත්වාන කම්මං
තිදසානං සහව්‍යතං පත්තොති.

1224. අච්ඡරියං වත අබ්භුතං
අඤ්ජලිකම්මස්ස අයමීදිසො විපාකො
අහම්පි මුදිතමනො පසන්නචිත්තො
අජ්ජෙව බුද්ධං සරණං වජාමීති.

1225. අජ්ජෙව බුද්ධං සරණං වජාහි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩඵුල්ලානි සමාදියස්සු.

1226. පාණාතිපාතා විරමස්සු ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු
අමජ්ජපො මා ච මුසා භණාහි
සකෙන දාරෙන ච හොහි තුට්ඨොති.

1227. අත්ථකාමොසි මෙ යක්ඛ හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං ත්වංසි ආචරියො මමාති.

1228. උපෙමි සරණං බුද්ධං ධම්මඤ්චාපි අනුත්තරං,
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං.

1229. පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දාරෙන ච හොමි තුට්ඨොති.

මට්ටකුණ්ඩලී විමානං.

## 7. 10

1230. සුණොථ යක්ඛස්ස ච වාණිජාන ච
සමාගමො යත්ථ තදා අහොසි
යථා කථං ඉතරීතරෙන චාපි
සුභාසිතං තඤ්ච සුණොථ සබ්බෙ.

1231. යො සො අහු රාජා පායාසි නාමො[1]
භුම්මානං සහව්‍යගතො යසස්සී
සො මොදමානොව සකෙ විමානෙ
අමානුසො මානුසෙ අජ්ඣභාසීති.

1. පායාසි නාම — මජ්සං.

1223. ඒ මම සතුටු සිත් ඇතියෙම් පහන් සිත් ඇතියෙම් තථාගතයන්ට ඇදිලි කෙළෙමි. මම එ කුශලකර්මය කොට දෙවියන්ගේ සහබවට පැමිණියෙමි.

1224. අඤ්ජලිකර්මයාගේ මෙබඳු මේ විපාකය එකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. එකාන්තයෙන් විස්මයෙකි. මමත් සතුටුසිත් ඇතියෙම් පහන්සිත් ඇතියෙම් අද ම බුදුන් සරණ යෙමි.

1225. අද ම පහන් සිත් ඇතියෙහි බුදුන් ද ධර්‍මය ද සඞ්ඝයා ද සරණ කොට යව. එසේ ම සිකපද පස ද නො කඩ කොට නො පලුදු කොට සමාදන් වෙව.

1226. පණිවායෙන් වහා වෙන් වෙව. ලොවැ (හිමියන්) නුදුන් දෙය දුරු කරව. රහමෙර නො බොන්නෙක් වෙව. බොරු නො කියව. සිය අඹු සමග තුටු වෙව.

1227. යක්ෂය, තෝ මට වැඩ කැමැති වෙහි. දෙවිය, සුව කැමති වෙහි. තෝ මට ඇදුරු වෙහි. මම තාගේ වචනය කරමි.

1228. මම අනුත්තර වූ බුදුන් සරණ කොට යෙමි. නරදෙවිහුගේ දහම් ද සඟුන් ද සරණ කොට යෙමි.

1229. පණිවායෙන් වහා වෙන් වෙමි. ලොවැ නුදුන් දෙය දුරු කරමි. රහමෙර නො බොනුයෙම් වෙමි. බොරු ද නො කියමි. සිය අඹුව සමග තුටු වෙමි.

මට්ටකුණ්ඩලී විමාන යි.

## 7. 10

1230. (සෙරිස්සක නම්) දෙවපුත්‍රයාගේ ද වෙළඳුන්ගේ ද ඒ ගමන කාලයෙහි යම් වැලිකතරක දී එක්විමෙක් වී ද, එය අසවු. එකල්හි ඔවුනොවුන් විසින් කරන ලද සුභාෂිත වචනය යම් සේ වේ ද, තෙපි හැම දෙන එය ද අසවු.

1231. (සෙතව්‍ය නුවර) පායාසි නම් යම් ඒ රජෙක් වී ද, බූමාටු දෙවියන් ගේ සහභාවයට පැමිණි පිරිවර ඇති ඒ දෙව්පුත් තෙමේ සිය විමන්හි සතුටු වෙමින් මිනිසුන්ට (මෙසේ) කියේ ය.

1232. වඞ්කෙ අරඤ්ඤෙ අමනුස්සට්ඨානෙ
කන්තාරෙ අප්පොදකෙ අප්පභක්ඛෙ
සුදුග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ
වඞ්කං භයං නට්ඨමනා මනුස්සා.

1233. නයිධ ඵලා මූලමයා ච සන්ති
උපාදානං නත්ථි කුතො ඉධ භක්ඛො
අඤ්ඤත්‍ර පංසූහි ච වාලුකාහි ච
තතාහි[1] උණ්හාහි ච දරුණාහි ච.

1234. උජ්ජඞ්ගලං තත්තමිවං කපාලං
අනායසං පරලොකෙන තුල්‍යං
ලුද්දනමාවාසමිදං පුරාණං
භූමිප්පදෙසො අභිසත්තරූපො.

1235. අථ තුම්හෙ කෙන[2] වණ්ණෙන
කිමාසමානා ඉමං පදෙසං හි
අනුප්පවිට්ඨා සහසා සමෙච්ච
ලොභා භයා අථවා සම්පමූළ්හාති.

1236. මගධෙසු අඞ්ගෙසු ච සත්ථවාහා
ආරොපයිත්වා[3] පණියං පුථුත්තං
තෙ යාමසෙ සින්ධුසොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා.

1237. දිවා පිපාසං නධිවාසයන්තා
යොග්ගානුකම්පඤ්ච සමෙක්ඛමානා
එතෙන වෙගෙන ආයාම සබ්බෙ
රත්තිං මග්ගං පටිපන්නා විකාලෙ.

1238. තෙ දුප්පයාතා අපරද්ධමග්ගා
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ
සුදුග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ
දිසං න ජානාම පමූළ්හචිත්තා.

1239. ඉදඤ්ච දිස්වාන අදිට්ඨපුබ්බං
විමානසෙට්ඨඤ්ච තවඤ්ච යක්ඛ
තතුත්තරිං ජීවිතමාසමානා
දිස්වා පතීතා සුමනා උදග්ගාති.

1. තථාහි - මජසං.
2. කෙනු - සයා.
3. ආරොපයිස්සං - සිමු.

1232. අමනුෂ්‍යයන්ට වාසස්ථාන වූ සැක සහිත වූ වනයෙහි නිරුදක වූ අහර නැති දුකසේ යායුතු වූ මේ වනාන්තරයෙහි වැලිකතර මැද සැකයෙන් බියට පත් ව මංමුළා වූ මිනිසුනි,

1233. මේ වැලිකතරෙහි ඵල ද අල ද නැත්තේය. ගිනි ඵලවන දර ද නැත. රළු වූ තැවුණා වූ උණුවැලි හා පස් හැර අහරෙක් නම් මෙහි කොයින් ලැබේ ද,

1234. රළු වූ තද පස් ඇති රත් කබලක් වැනි සැපතක් නැති නරකය බඳු වූ බොහෝ කල් පටන් පිශාච (ලුද්දක) යන්ට වාසස්ථාන වූ මේ ප්‍රදෙශය ඍෂීන් විසින් ශාපකරන ලද්දක් බඳු වූයේ ය.

1235. තවද, තෙපි කුමක් නිසා කවරක් බලාපොරොත්තුවෙන් නො විමසා එකතු ව මේ පෙදෙසට පිවිසියාහු ද? ලොභයෙන් පැමිණියාහු ද? නොහොත් බියෙකින් පැමිණියාහු ද? නැතහොත් මං මුළාවූවාහු ද?

1236. (එම්බා දෙවපුත්‍රය,) අපි මගද දෙරට සාත්වාහක වූ ඒ අපි ගැල්හි බොහෝ විකිණියයුතු බඩු පුරාගෙන ලාභාපෙක්ෂා ඇති ව වැඩි ධනාශා ඇති ව සින්ධුසොවීර දෙශයට යම්හ.

1237. දවල් පවස නො ඉවසිය හැකි ව ගොනුන්ට හා මිනිසුන්ට එසු බලන්නමෝ මේ වේගයෙන් පැමිණියම්හ. ඒ අපි සියලු දෙන රෑ නොකල්හි මාර්ගයට පිළිපන්නමෝ වෙමු.

1238. නො මග පැමිණියා වූ වැරැදූ ගිය මඟ ඇත්තා වූ අන්ධයන් මෙන් ආකුල වූ නැසුණා වූ වනයෙහි අතිශයින් මුළා වූ සිත් ඇති ඒ අපි මේ දුර්ගම වූ වැලිකතර මැද යායුතු දිශාව නො දනුම්හ.

1239. (එම්බා) දෙවපුත්‍රය, පෙර නො දුටු විරූ මේ උතුම් විමන ද තා ද දුක මෙතැන් පටන් දිවි ලබම්හ යි සිතා ප්‍රීති වූවමෝ සොම්නස් සිතැත්තමෝ ඔද වැඩි සිතැත්තමෝ වෙමු.

1240. පාරං සමුද්දස්ස ඉදඤ්ච වණ්ණුං[1]
වෙත්තාචරං[2] සඞ්කුපථඤ්ච මග්ගං
නදියො පන පබ්බතානඤ්ච දුග්ගා
පුථුද්දිසා ගච්ඡථ භොගහෙතු.

1241. පක්ඛන්දියාන විජිතං පරෙසං
වෙරජ්ජකෙ මානුසෙ පෙක්ඛමානා
යං වො සුතං වා අථවාපි දිට්ඨං
අච්ඡෙරකං තං වො සුණොම තාතාති.

1242. ඉතොපි අච්ඡෙරතරං කුමාර
න නො සුතං වා අථවාපි දිට්ඨං
අතීතමානුස්සකමෙව සබ්බං
දිස්වා න තප්පාම අනොමවණ්ණං.

1243. වෙහාසයං පොක්ඛරඤ්ඤො සවන්ති
පහූතමාල්‍යා[3] බහු පුණ්ඩරීකා
දුමා විමෙ[4] නිච්චඵලූපපන්නා
අතීව ගන්ධා සුරභිං පවායන්ති.

1244. වෙළුරියත්ථම්භා සතමුස්සිතාසෙ
සිලාපවාළස්ස ච ආයතංසා
මසාරගල්ලා සහලොහිතඞ්කා
ථම්භා විමෙ[5] ජොතිරසාමයාසෙ.

1245. සහස්සත්ථම්භං අතුලානුභාවං
තෙසූපරි සාධුමිදං විමානං
රතනන්තරං කඤ්චනවෙදිමිස්සං
තපනීයපට්ටෙහි ච සාධු ඡන්නං.

1246. ජම්බොනදුත්තත්තමිදං සුමට්ඨො
පාසාදසොපාන ඵලූපපන්නො
දළ්හො ච වග්ගු සුමුඛො සුසංගතො[6]
අතීව නිජ්ඣානඛමො මනුඤ්ඤො.

1247. රතනන්තරස්මිං බහු අන්නපානං
පරිවාරිතො අච්ඡරාසංගණෙන
මුරජ[7] ආළම්බර තූරියසුඝුට්ඨො
අභිවන්දිතොසි ථුතිවන්දනාය.

---

1. ඉමඤ්චවණ්ණුං – මජසං, සයා.
2. වෙත්තං පරං – සයා.
3. පහූතමල්‍යා – සයා.
4. දුමා ච තෙ – සයා.
5. ථම්භා ඉමෙ – මජසං.
6. දළ්හො ච වග්ගු ච සුසංගපතා – මජසං.
7. මුරජ – මජසං.

1240. (එම්බා පින්වත්නි,) මුහුදෙන් එතෙර ද මෙබඳු වැලිකතරෙහි ද වේවැල් බැඳ යායුතු මාර්ගවල ද කණු සිටුවා යායුතු මාර්ගවල ද නදී පර්වතාදි දුර්ගම ප්‍රදෙශවල ද වස්තු හෙතුවෙන් තෙපි නොයෙක් දිගට යන්නහු ය.

1241. අන් රජවරුන්ගේ විජිතයන්ට පැමිණ නොයෙක් රටවල මිනිසුන් දකිමින් තොප විසින් යමක් අසන ලද්දේ ද, තවද යමක් දක්නා ලද ද දරුවෙනි, ඒ ආශ්චර්‍ය්‍යය තොප වෙතින් අසම්හ.

1242. (එම්බා) දෙවකුමාරය, මානුෂික වූ සියලු ඉසුරු සම්පත් ඉක්ම ගිය මේ සැපතට වඩා අතිශය ආශ්චර්‍ය්‍ය වූවක් අප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ නො වෙයි. තවද, ඒ අලාමක වර්ණය දක තෘප්තියට නො පැමිණියම්හ.

1243. බොහෝ වූ හෙළ පියුම් ඈ මලින් ගැවසීගත් පොකුණු අහසෙහි ගලාබසිත්. ඵලයෙන් ගැවසීගත් අතිශය සුවඳවත් වූ මේ වෘක්ෂයෝ ද සුවඳ වහනය කෙරෙත්.

1244. සියක් රියන් පමණ උස් වූ දීර්ඝායු ඇති වෙරළුමිණියෙන් පබළුයෙන් කළ ස්තම්භයෝ ද මැසිරිගලින් හා රතුමිණියෙන් කළ ස්තම්භයෝ ද යන මොහු ජ්‍යොතිෂ්මත් වූවාහු ය.

1245. දහස් ගණන් ටැම් ඇති අතුල්‍ය වූ අනුභාව ඇති රනින් ගැවසුණු කසුන්මුවා වෙදිකාවෙන් යුත් රන්පටින් මනාව වසන ලද තාගේ මේ සුන්දර විමානය ඒ ස්තම්භමස්තකයෙහි පිහිටියේ වෙයි.

1246. මේ විමන අතිශයින් ඔප් නැගූ දඹරනින් බබළන්නේ ය. එහි සුමට වූ ප්‍රාසාද සොපාන ඵලකයෙන් යුත් ස්ථිර වූ මනොඥ වූ මනාව සංගත වූ ප්‍රාසාද අවයව තෙමේ ඉතා දක්මකලු වූයේ මනරම් වේ.

1247. මේ රුවන් විමන ඇතුළත බොහෝ ආහාරපාන ඇත්තේ ය. දිව්‍යාප්සරා සමූහයා විසින් පිරිවරන ලද්දෙහි. මිහිඟු බෙර පනාබෙර තූර්‍ය්‍යනාදයෙන් නිති පැවති ඝොෂ ඇත්තෙහි. ස්තුතිගීතිකායෙන් අභිවාදන කරන ලදුයෙහි.

1248. සො මොදසි නාරිගණප්පබොධනො
විමානපාසාදවරෙ මනොරමෙ
අචින්තියො සබ්බගුණූපපන්නො
රාජා යථා වෙස්සවණො නළිනියා

1249. දෙවො නු ආසි උදවාසි යක්ඛො
උදහු දෙවින්දො මනුස්සභූතො
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
ආචික්ඛ කො නාම තුවංසි යක්ඛාති.

1250. සෙරිස්සකො[1] නාම අහම්පි යක්ඛො
කන්තාරියො වණ්ණුපථම්හි ගුත්තො
ඉමං පදෙසං අභිපාලයාමි
වාවටකරො[2] වෙස්සවණස්ස රඤ්ඤොති.

1251. අධිච්ච ලද්ධං පරිණාමජං තෙ
සයං කතං උදහු දෙවෙහි දින්නං
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං මනුඤ්ඤන්ති,

1252. නාධිච්චලද්ධං න පරිණාමජං මෙ
න සයං කතං න හි දෙවෙහි දින්නං
සකෙහි කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං මනුඤ්ඤන්ති.

4253. කිං තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං විමානන්ති.

1254. මම[3] පායාසීති අහූ සමඤ්ඤා
රජ්ජං යදා කාරයිං කොසලානං
නත්ථිකදිට්ඨී කදරියො පාපධම්මො
උච්ඡෙදවාදී ච තදා අහොසිං.

1255. සමණො ච බො ආසි කුමාරකස්සපො
බහුස්සුතො චිත්තකථී උළාරො
සො මෙ තදා ධම්මකථං අකාසි[4]
දිට්ඨිවිසූකානි විනොදයී මෙ.

1. සෙරිසකො – මජසං.
2. වචනකරො – මජසං.
3. මමං – මජසං.
4. අභාසි – මජසං.

1248. ඒ වෙසවුණු රජ තෙමේ නලිනී නම් ක්‍රීඩාස්ථානයෙහි යම්සේ ද, එසේ ඒ තෝ ද නාරිගණයා විසින් ප්‍රබොධිත වූයෙහි. නො සිතිය හැකි අනුභාව ඇතියෙහි, සියලු ගුණයෙන් යුක්ත වූයෙහි. මනරම් වූ ඒ උතුම් විමන් පහයෙහි සතුටු වෙහි.

1249. තෝ දෙවියෙක් වෙහි ද? නොහොත් යක්‍ෂයෙක් වෙහි ද? නොහොත් සක්දෙවිඳු වෙහි ද? මිනිස් දැ ඇතියෙහි ද? (එම්බා) දෙවපුත්‍රය, තෝ කිනම් වෙහි දැ යි මෙ සාර්‍ථවාහක වෙළෙන්දෝ විචාරති. කියනු මැනැවි.

1250. (එම්බා වෙළඳුනි,) කතරෙහි නියුක්ත වූ වැලි කතරෙහි ආරක්‍ෂක වූ මම සෙරිස්සක නම් යක්‍ෂයා වෙමි. වෙසවුණු රජුගේ වචනය කරන්නෙමි මේ ප්‍රදෙශය පාලනය කරමි.

1251. (එම්බා දිව්‍යපුත්‍රය,) තාගේ සම්පත්තිය අහෙතුක ව ලද ද? කාල පරිණාමයෙන් ලද ද? තමා විසින් ම නිපදවූවක් ද? නොහොත් දෙවියන් විසින් හෝ දෙන ලද්දක් ද, මනොඥ වූ මේ සැපත තා විසින් කෙසේ ලද දැ යි සාර්‍ථවාහක වෙළෙන්දෝ තා විචාරත්. එය කියනු මැනැවි.

1252. (වෙළඳුනි,) මාගේ මේ සැපත අහෙතුක ව ලද්දක් නො වේ. කාල පරිණාමයෙන් ලද්දක් නො වේ. තමා විසින් නිපදවන ලද්දක් හෝ නො වෙයි. දෙවියන් විසින් දෙන ලද්දක් නො වේ මැ යි. අලාමක ස්වකීය පුණ්‍යකර්‍ම කරණ කොටගෙන මා විසින් මේ මනොඥ සැපත ලබන ලදී.

1253. (එම්බා දෙවපුත්‍රය,) (ඒ) තාගේ ව්‍රත සමාදනය කුමක් ද? (තාගේ) උතුම් හැසිරීම කුමක් ද? මේ විපාකය කවර නම් කුශල කර්‍මයක්හු ගේ ද? මේ විමන තා විසින් කෙසේ ලබන ලද දැ යි සත්වා වෙළෙන්දෝ ඔහු විචාරති.

1254. යම් කලෙක කොසොල් රට රජය කරවීම ද, (ඒ) මට පායාසිරාජන්‍යය යි නමෙක් විය. එකල්හි මම නාස්තිකදෘෂ්ටි ඇති තද මසුරු වූ ලමු සැහැවි ඇති උච්ඡෙදවාදියෙම් වීමි.

1255. එකල්හි බහුශ්‍රුත වූ චිත්‍රකථික වූ උදර වූ කුමාරකස්සප නම් ශ්‍රමණ කෙනෙක් වූහ. උන් වහන්සේ මට බණ වදළ සේක. මාගේ දෘෂ්ටීහු ද දුරු කළ සේක.

1256. තාහං තස්ස ධම්මකථං සුණිත්වා
උපාසකත්තං පටිවෙදයිස්සං
පාණාතිපාතා විරතො අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං.
අමජ්ජපො නො ච මුසා අභාණිං
සකෙන දරෙන ච අහොසිං[1] තුට්ඨො.

1257. තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො
තෙහෙව කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං විමානන්ති.

1258. සච්චං කිරාහංසු නරා සපඤ්ඤා
අනඤ්ඤථා වචනං පණ්ඩිතානං
යහිං යහිං ගච්ඡති පුඤ්ඤකම්මො
තහිං තහිං මොදති කාමකාමී.

1259. යහිං යහිං සොකපරිද්දවො ච
වධො ච බන්ධො ච පරික්කිලෙසො
තහිං තහිං ගච්ඡති පාපකම්මො
න මුච්චති දුග්ගතියා කදචීති.

1260. සම්මූළ්හරූපොව ජනො අහොසි
අස්මිං මුහුත්තෙන කලලීකතොව
ජනස්සිමස්ස තුය්හඤ්ච කුමාර
අප්පච්චයො කෙන නු ඛො අහොසීති.

1261. ඉමෙ සිරීසූපවනා ච[2] තාතා
දිබ්බා[3] ගන්ධා සුරභිං[4] සම්පවන්ති
තෙ සම්පවායන්ති ඉමං විමානං
දිවා ච රත්තො ච තමං නිහන්ත්වා.

1262. ඉමෙසං ච ඛො වස්සසතච්චයෙන
සිපාටිකා ඵලති එකමෙකා
මානුස්සකං වස්සසතං අතීතං
යදග්ගෙ කායම්හි ඉධූපපන්නො.

1263. දිස්වානහං වස්සසතානි පඤ්ච
අස්මිං විමානෙ ඨත්වාන තාතා
ආයුක්ඛයා පුඤ්ඤක්ඛයා චවිස්සං
තෙනෙව සොකෙන පමුච්ඡිතොස්මීති[5].

---

1. අහොසි – මජසං.
2. ඉමෙ ච සිරිසවනා – මජසං.
ඉමෙහි සිරිසවනා ච – PTS
3. දිබ්බා ච – PTS
4. සුරභී – මජසං,
5. සමුච්ඡිතොස්මීති – PTS

1256. මම උන්වහන්සේ ගේ ඒ ධර්මකථාව අසා උපාසකත්වය ගිවිස්සෙමි. පණිවායෙන් දුරු වූයෙම් වීමි. ලොවැ නුදුන් දෙය දුරු කෙළෙමි. රහමෙර නො බොනුයෙම් වීමි. බොරු නො ද කීමි. සිය අඹුව හා තුටු වීමි.

1257. ඒ මාගේ ව්‍රතසමාදානය යි. ඒ (මාගේ) උතුම් හැසිරීම යි. මේ ඒ කුශලකර්මයාගේ විපාක යි. ඒ අලාමක වූ කුශලකර්මයන් කරණකොට ගෙන මා විසින් මේ විමානය ලබන ලදී.

1258. කළ පින් ඇති පුද්ගලයා යම් යම් තැනක යේ නම් ඒ ඒ තන්හි කැමැති සම්පත් ඇති ව සතුටු වේ යයි. නුවණැති මනුෂ්‍යයෝ සැබවක් ම කීවාහු ය. පණ්ඩිතයන්ගේ වචනය වෙනස් නො වේ.

1259. අකුසල් කළ පුද්ගල තෙමේ යම් යම් තැනෙක (ඉපදීම් වශයෙන්) යේ ද, (හෙ තෙමේ) ඒ ඒ තන්හි සෝ වැලැපුම් ඇතියේ වද විඳුම් ඇතියේ අවැඩ දනවීම් ඇතියේ කිසිකලෙකත් දුගතියෙන් නො මිදෙයි.

1260. දිව්‍යජන තෙමේ මේ මොහොතෙහි කැළඹුණකු මෙන් ද හැමතින් මුළා වූ සැහැවි ඇතියකු මෙන් ද විය. කුමාරය, මේ පිරිවර ජනයාගේ ද තාගේ ද මේ දෙම්නස කුමක් නිසා වී ද?

1261. දරුවෙනි, මහරිරුක් වනයෙන් මේ දිවගඳහු හමති. ඒ දිව-ගඳහු දව රෑ අඳුර නසා මේ විමානයට හමත්.

1262. මේ මහරිරුක්හි එක් එක් මල් පෙති හවුරුදු සියයක්හුගේ ඇවෑමෙන් පැසී වැටෙ යි. යම් දිනක පටන් මේ දිව්‍ය ආත්මයෙහි උපන්නෙම් වෙම ද? (එතැන් පටන්) මිනිස් සියවසරෙක් ඉක්මිණි.

1263. දරුවෙනි, මේ විමන්හි මම පන්සිය වසරක් සිට ආයු හා පින් පිරිහීමෙන් ච්‍යුත වන්නෙමි යි දැක ඒ ශොකයෙන් ම අතිශයින් මුසපත් වීමි.

1264. කථං නු සොචෙය්‍ය තථාවිධො සො
ලද්ධා විමානං අතුලං චිරාය
යෙ චාපි ඛො ඉත්තරමුපපන්නා
තෙ නූන සොචෙය්‍යුං පරිත්තපුඤ්ඤා'ති.

1265. අනුච්ඡවිං ඔවදියඤ්ච මෙ තං
යං මං තුම්හෙ පෙය්‍යවාචං වදෙථ
තුම්හෙ ච ඛො තාතා මයානුගුත්තා
යෙනිච්ඡකං තෙන පලෙථ සොත්ථිනා'ති.

1266. ගන්ත්වා මයං සින්ධු සොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා
යථා පයොගා පරිපුණ්ණචාගා
කාහාම සෙරිස්සමහං උළාරන්ති.

1267. මා චෙව සෙරිස්සමහං අකත්ථ
සබ්බඤ්ච වො භවිස්සති යං වදෙථ
පාපානි කම්මානි විවජ්ජයාථ
ධම්මානුයොගඤ්ච අධිට්ඨහාථාති.

1268. උපාසකො අත්ථි ඉමම්හි සඞ්ඝෙ
බහුස්සුතො සීලවතූපපන්නො
සද්ධො ච චාගී ච සුපෙසලො ච
විචක්ඛණො සන්තුසිතො මුතීමා.

1269. සඤ්ජානමානො න මුසා භණෙය්‍ය
පරූපඝාතාය න චෙතයෙය්‍ය
වෙභූතිකං පෙසුණං නො කරෙය්‍ය
සණ්හඤ්ච වාචං සඛිලං භණෙය්‍ය.

1270. සගාරවො සප්පතිස්සො විනීතො
අපාපකො අධිසීලෙ විසුද්ධො
සො මාතරං පිතරං චාපි ජන්තු
ධම්මෙන පොසෙති අරියවුත්ති.

1271. මඤ්ඤෙ සො මාතාපිතුන්නං කාරණා
භොගානි පරියෙසති න අත්තහෙතු
මාතාපිතුන්නඤ්ච යො අච්චයෙන
නෙක්ඛම්මපොණො චරිස්සති බ්‍රහ්මචරියං.

1272. උජූ අවඞ්කො අසඨො අමායො
න ලෙසකප්පෙන ච වොහරෙය්‍ය
සො තාදිසො සුකතකම්මකාරී[1]
ධම්මෙ ඨිතො කින්ති ලභෙථ දුක්ඛං.

1. සුකතකම්මකාරි-මජසං.

1264. (එම්බා දෙවපුත්‍රය,) චිරායුෂ්ක වූ අතුල්‍ය වූ මේ විමානය ලැබූ එබඳු වූ තෝ කෙසේ නම් ශොක කරන්නෙහි ද? මඳ ආයු ඇති ව උපන් මඳ පිනැති යම් කෙනෙක් වෙත් නම් ඔහු ඒකාන්තයෙන් ශොක කරන්නාහු ය.

1265. (එම්බා) දරුවෙනි, මා පිළිබැඳි ඒ සුදුසු ප්‍රිය වූ අවවාද වචනයක් යම් හෙයෙකින් මට කියහු ද? ඒ තෙපි ද මා විසින් රක්ෂිත වූවාහු යම් ඒ කැමැති තැනකට සැපසේ යවූ.

1266. ධනය බලාපොරොත්තු වූ එහි වැඩීම ප්‍රාර්ථනා කරන්නා වූ අපි සින්ධු සොවීර භූමිප්‍රදෙශයට ගොස් ප්‍රතිඥා පරිදි වූවාහු පිරිපුන් ත්‍යාග ඇත්තාහු උදාර වූ **සෙරිසසක** පූජාවක් කරන්නෙමු.

1267. **සෙරිස්ස**කපූජා නො කරවූ. යමක් තෙපි කියවූ ද? (ඒ) සියල්ල එසේ ම වන්නේ ය. පව්කම් හරිවූ. දහම් අනුව හැසිරීම ඉටා ගනිවූ. (මේ **සෙරිස්ස**ක පූජා යි.)

1268. මේ සත්ත්ව සමූහයා අතුරෙහි බහුශ්‍රැත වූ ශීලව්‍රතයෙන් යුක්ත වූ සැදැහැති ත්‍යාගවත් සුපෙසල වූ විචක්‍ෂණ වූ ප්‍රීතිමත් වූ කම්පල දැනීමේ නුවණ ඇති උපාසකයෙක් ඇත.

1269. දැන දැන බොරු නො කියන්නේ ය. පරපණ නැසීම පිණිස නො සිතන්නේ ය. සමගි වූවන් වෙන් කරන පිසුනු බස් නො කියන්නේ ය. සියුම් මෙළෙක් බස් කියන්නේ ය.

1270. ගෞරව සහිත වූ කීකරු සැහැවි ඇති භික්මුණු පව් නොකරන්නා වූ (උපාසකයන් විසින් රැකියයුතු) අධිශීලයෙහි පිරිසිදු වූ තිදෙස් පැවතුම් ඇති ඒ සත්ත්ව තෙමේ මව ද පියා ද දැහැමෙන් පොෂණය කරයි.

1271. තිවනට නැමුණු යමෙක් මවු පියන්ගේ ඇවැමෙන් ශාසන බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙන්නේ ද, හෙතෙමේ මවුපියන් නිසා භොග සොයයි. තමා පිණිස නො සොයති සිතමි.

1272. ඍජු වූ අවංක වූ අසඨ වූ අමායාවී වූ හෙතෙමේ කපටිය ලෙසයෙන් (මායා සාඨෙය්‍ය විසින්) වචන නො කියන්නේ ය. එබඳු යහපත් කම් කරන ධර්මයෙහි පිහිටි පුද්ගල තෙමේ කෙසේ නම් දුකක් ලබන්නේ ද?

1273. තං කාරණා පාතුකතොම්හි අත්තනා
තස්මා ධම්මං පස්සථ වාණිජාසෙ
අඤ්ඤත්‍ර තෙනීහ භස්මී[1] භවෙථ
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ
තං ඛිප්පමානෙන ලහුං පරෙන
සුඛො භවෙ සප්පුරිසෙන සඞ්ගමොති.

1274. කිං නාම සො කිඤ්ච කරොති කම්මං
කිං නාමධෙය්‍යං කිං පන තස්ස ගොත්තං
මයම්පි නං දට්ඨුකාමම්හ යක්ඛ
යස්සානුකම්පාය ඉධාගතොසි
ලාභා හි තස්ස යස්ස තුවං පිහෙසීති.

1275. යො කප්පකො සම්භව නාමධෙය්‍යො
උපාසකො කොච්ඡඵලූපජීවී[2]
ජානාථ නං තුම්හාකං පෙසියො සො
මා ඛො නං හීළිත්ථ සුපෙසලො සොති.

1276. ජානාමසෙ යං ත්වං වදෙසි යක්ඛ
න ඛො නං ජානාම ස ඊදිසොති
මයම්පි නං පූජයිස්සාම යක්ඛ
සුත්වා[3] තුය්හං වචනං උළාරන්ති.

1277. යෙ කෙචිමස්මිං සත්ථෙ මනුස්සා
දහරා මහන්තා අථවාපි මජ්ඣිමා
සබ්බෙව තෙ ආලම්බන්තු විමානං
පස්සන්තු පුඤ්ඤාන ඵලං කදරියාති.

1278. තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
තං කප්පකං තත්ථ පුරක්ඛිපිත්වා[4]
සබ්බෙව තෙ ආලම්බිංසු විමානං
මසක්කසාරං විය වාසවස්ස.

1279. තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිංසු
පාණාතිපාතා විරතා අහෙසුං
ලොකෙ අදින්නං පරිවජ්ජයිංසු.

1280. අමජ්ජපා නො ච මුසා භණිංසු
සකෙන දාරෙන ච අහෙසුං තුට්ඨා
තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිත්වා
පක්කාමි සත්ථො අනුමොදමානො
යක්ඛිද්ධියා අනුමතො පුනප්පුනං.

---

1. භස්මී – ස්‍යා.
2. කොච්ඡභණ්ඩූපජීවී – සී.
3. සුත්වාන – මජසං.
4. පුරක්ඛත්වා – මජසං.

1273. ඒ උපාසකයා හෙතුකොට (තොප ඉදිරියෙහි) මම තෙමේ ම පහළ වූයෙමි. එහෙයින් වෙළෙඳුනි, ධර්මය දකිවු. ඒ උපාසකයා හැර මෙහි (ආවාහු නම්) තෙපි අන්‍යයා විසින් පීඩා කිරීම කරණ කොට මේ මරු කතර අන්ධයන් මෙන් ආකුල වූවාහු විනාශයට පත් වූවාහු වහා අළු වන්නාහු ය. එකාන්තයෙන් සත්පුරුෂ සඞ්ගමය සැප වේ.

1274. (එම්බා) දෙව පුත්‍රය, හෙතෙමේ කිනම් ඇත්තේ ද? කිනම් කර්ම කරයි ද? (මවුපියන් විසින් ඔහුට) තැබූ නම කුමක් ද? ඔහුගේ ගොත්‍රය කුමක් ද? අපි දු ඔහු දක්නා කැමතියම්හ. ඒ එසේ මැ යි. තෝ යමකුට අනුකම්පාවෙන් මෙහි පැමිණියෙහි ද, යමෙකුට ප්‍රිය කෙරෙහි ද? ඔහුගේ (පැමිණීම) ලාභයෙක් මැ යි.

1275. කොස්සෙන් හා පනාවෙන් ජීවත්වනසුලු වූ තොපගේ ඒ සෙවක වූ සුපෙසල උපාසක වූ ප්‍රසිද්ධ වූ සම්භව නම් කරනැවැමියෙක් වේ ද, ඔහු දකිවු. ඔහු පහත් කොට නො සිතවු.

1276. (එම්බා) දෙව පුත්‍රය, යමකු සඳහා තෙපි කියවු ද, අපි ඔහු දනුම්හ. හෙතෙමේ ගුණවශයෙන් මෙබඳු යයි ඔහු නො දනුම්හ, දෙවපුත්‍රය තාගේ උදර වූ වචනය අසා අපි දු ඔහු පුදන්නෙමු.

1277. මේ වෙළඳමුළෙහි හෙවත් තවලමෙහි තරුණ වූ මහලු වූ තවද මැදුම් වූ යම්කිසි මසුරු මිනිස්සු වෙත් ද, ඒ සියල්ලෝ ම මේ විමනට නගිත්වා. පින්පල බලත්වා.

1278. එහි ඒ සියලු දෙන ම 'මම පෙරටු වෙමි, මම පෙරටු වෙමි' යි එහි ඒ කරනැවැමියා පෙරටු කොට (උත්සාහවත් වූහ.) ඒ සියල්ලෝ ම තව්තිසා භවනයට මෙන් ඒ විමානයට නැංගාහු ය.

1279. එහි ඒ සියලු දෙන ම 'මම පෙරටු වෙමි, මම පෙරටු වෙමි' යි උත්සුක වෙමින් උවසු බව ගිවිස්සාහු ය. පණිවායෙන් දුරු වූහ. ලොව නුදුන් දෑ ගැන්ම දුරු කළාහු ය.

1280. මත්පැන් නො පූහ. බොරු නො බිණූහ. සිය අඹුව හා තුටු වූහ. එහි සියලු දෙන ම 'මම පෙරටු වෙමි, මම පෙරටු වෙමි' යි උත්සුක ව උවසු බව ගිවිස්වා ඒ වෙළඳමුළ ඒ දෙව්පුත් විසින් අනුමත වූයේ දිව්‍යර්ධියෙන් නැවත නැවතත් අනුමෝදන් වනුයේ කැමැති තැනට ගියේ ය.

1281. ගන්ත්වාන තෙ සින්ධුසොවීරභූමිං
ධනත්ථිකා උද්දයං[1] පත්ථයානා
යථා පයොගා පරිපුණ්ණලාභා
පච්චාගමුං පාටලිපුත්තමක්ඛතං.

1282. ගන්ත්වාන තෙ සඝරං සොත්ථිවන්තො
පුත්තෙහි දාරෙහි සමඞ්ගිභූතා
ආනන්දී විත්තා[2] සුමනා පතීතා
අකංසු සෙරිස්සමහං උළාරං.

1283. සෙරිස්සකං තෙ පරිවෙණං මාපයිංසු
එතාදිසා සප්පුරිසාන සෙවනා
මහත්ථිකා ධම්මගුණාන සෙවනා
එකස්ස අත්ථාය උපාසකස්ස
සබ්බෙව සත්තා සුඛිතා[3] අහෙසුන්ති.

සෙරිස්සකවිමානං.

## 7. 11

1284. උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදස යොජනානි
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා

1285. තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගුං
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා.

1286. කෙන තෙ තාදිසො වණ්ණො
කෙන තෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච තෙ භොගා
යෙ කෙචි මනසො පියා

1287. පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

1. උදයං - PTS
2. ආනන්දචිත්තා - ස්‍යා.
3. සුඛිනො - PTS

1281. ධනාර්ථිවූ අධික ලාභාශා ඇත්තා වූ ඔවුහු සින්ධු සෞවීර භූමියට ගොස් සිතැඟි පරිදි වෙළඳම් කොට පිරිපුන් ලාභ ඇත්තෝ යළි නිරුපද්‍රැත වැ පැළලුප් නුවරට ආවාහු ය.

1282. ඔවුහු නිර්භය වූවාහු සිය ගෙවලට ගොස් අඹුදරුවන් හා එක් වූවාහු මුදිත වූවාහු තුටු වූවාහු සොම්නස් වූවාහු අධික සොම්නස් ඇත්තාහු උදාර වූ සෙරිස්සක නම් උත්සව පූජාවක් කළහ.

1283. ඔවුහු සෙරිස්සක නම් පිරිවෙනක් ද තැනූහ. එක ම උපාසකයකු නිසා සියලු සත්ත්වයෝ සුවපත් වූවාහු ය. සත්පුරුෂයන්ගේ සෙවනය මෙබඳු ය. ධර්මධර ගුණවතුන්ගේ සෙවනය මෙබඳු මහත් වැඩ ඇත්තේ යි.

සෙරිස්සක විමාන යි.

## 7 – 11

1284. (එම්බා දෙවපුත්‍රය) ඉතා උස් වූ පියුම්රාමිණි ආදියෙන් කළ වැම් ඇති මේ විමානය හාත්පසින් දොළොස් යොදුනෙකි. වෙරළු මිණියෙන් කළ වැම් ඇති රන්පෝරු අතුළ බිම් ඇති උදාර වූ යහපත් වූ කුළු ගෙවල් සත් සියයෙක් වෙයි.

1285. එහි තෝ සිටිනෙහි ය. පානය කරන්නෙහි ය, අනුභව කරන්නෙහි ය. දිව්‍යවීණාවෝ ද මිහිරි සේ වාදනය වෙති. මෙහි දිව්‍යමය වූ රසයෝ ද පස්කම් ගුණයෝ ද වෙත්. ස්වර්ණාභරණයෙන් විභූෂිත වූ නාරීහු ද රඟ දක්වත්.

1286. කවර හෙතුවකින් තාගේ එබඳු සිරුරු පැහැයෙක් වී ද? කවර පිනෙකින් තාගේ සුචරිත ඵලය මෙහි සමෘද්ධ වේ ද? මන වඩන්නා වූ යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු (කවර පිනෙකින්) තට පහළ වෙත් ද?

1287. මහත් අනුභාව ඇති දෙවපුත්‍රය, තා විචාරමි. මනුෂ්‍ය වූයෙහි කිනම් පිනක් කෙළෙහි ද? තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. කිනම් පිනෙකින් මෙබඳු දිලියෙන පුණ්‍යර්ද්ධි ඇත්තෙහි.

1288\. සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං.

1289\. දුන්නික්ඛිත්තං මාලං සුනික්ඛිපිත්වා
පතිට්ඨපෙත්වා සුගතස්ස ථූපෙ
මහිද්ධිකො චම්හි මහානුභාවො
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො.

1290\. තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

1291\. අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතො යමහං අකාසිං
තෙනම්හි එවං ජලිතානුභාවො
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

සුනික්ඛිත්තවිමානං.

## සුනික්ඛිත්තවග්ගො සත්තමො.

තස්සුද්දානං :–

ද්වෙ දළිද්ද ද්වෙ විහාරා[1] භතකො ගොපාලකණ්ඩකා[2]
අනෙකවණ්ණා මට්ටකුණ්ඩලී සෙරිස්සකො සුනික්ඛිත්තං
පුරිසානං තතියො වග්ගොති.[3]

භාණවාරං චතුත්ථං.

## විමානවත්ථු නිට්ඨිතං.

1. වන විහාරා – මජ්ජසං.
2. ගොපාලකණ්ඩකො – මජ්ජසං.
3. තතියො වග්ගො පවුච්චතීති – මජ්ජසං.

1288. මුගලන් තෙරුන් විසින් පුළුවුස්නාලද ඒ දෙවපුත්‍ර තෙමේ තුටුසිත් ඇත්තේ මේ පුණ්‍යඵලය යම් කවර කර්‍මයක්හුගේ දැ යි විචාරන ලදුයේ (මෙසේ) පැවසී ය.

1289. (වහන්ස) මම කසුප් බුදුන්ගේ ධාතුචෛත්‍යයෙහි මැනැවින් නොතබන ලද මල් සකසා දකුම්කලු කොට තබා බුදුගුණ සිත්හි පිහිටුවීමෙන් මහත් සෘද්ධි ඇත්තෙම් මහත් ආනුභාව ඇත්තෙම් දිව්‍යමය වූ කාමගුණයෙන් යුක්ත වූයෙම් වෙමි.

1290. ඒ පිනෙන් මාගේ සිරුරු පැහැය එබඳු වෙයි. ඒ පිනෙන් මාගේ සම්පත්තිය මෙහි සමෘද්ධ වෙයි. මන වඩන යම්කිසි සම්පත්තිහු වෙත් ද, ඒ සම්පත්තිහු මට පහළ වෙත්.

1291. මහත් අනුභාව ඇති ශ්‍රමණයන් වහන්ස, මම මනුෂ්‍ය වූයෙම් යම් පිනක් කෙළෙම් ද, (එය) ඔබට කියමි. ඒ පිනෙන් මෙබඳු දිලියෙන පුණ්‍යර්ධි ඇත්තෙම් වෙමි. මාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

**සූතිකඛිත්තවිමාන යි.**

## සත්වන සූතිකඛිත්ත වර්‍ග යි.

**එහි උදානය:–**

දළිද්ද (විත්තලතා යැ–නන්දන යි) දෙක යැ, විහාර (මණිථූණ යැ සුවණ්ණයැ යි) දෙක යැ හතක (අම්බවිමාන) ගොපල යැ කන්ථක යැ අනෙක වණ්ණ යැ මට්ටකුණ්ඩලී යැ සෙරිස්සක යැ සූතිකඛිත්ත යැ යි පුරුෂ විමාන පිළිබඳ තුන්වැනි වර්‍ග යි.

**සතරවෙනි බණවර යි.**

## විමාන වස්තු නිමියේ යි.

# විමානවත්ථුපාළි

## ගාථාදිපාද සූචි

# විමානවත්ථුපාළි

## සඤ්ඤානාමානුක්කමණිකා

# විමානවත්ථුපාළි

## විසෙසපදානුක්කමණිකා

# සුත්තන්තපිටකෙ

## ඛුද්දකනිකායො

# පෙතවත්ථුපාළි

# සූත්‍රාන්තපිටකයෙහි

## ඛුද්දකනිකායාන්තර්ගත

# පෙතවත්ථුපාළි

(සිංහලානුවාදය)

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTENTS

පිටු

# සංස්කාරක නිවේදනය

පෙතවත්‍ථු පාළිය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සත්විසිවන (27) ග්‍රන්ථය වශයෙන් සලකන ලද්දේය. ඛුද්දක නිකායෙහි ලා සඞ්ගීත වූ පෙතවත්‍ථු පාළිය ඒ නිකායෙහි සත්වැනි ග්‍රන්ථය වශයෙන් සඞ්ගීත වැ ඇත.

සම්බුද්ධ මඞ්ගල (බුද්ධජයන්ති) උත්සවය නිමිති කොටගෙන ත්‍රිපිටක පාළිය සියබසට නඟාලීමේ සත් ක්‍රියාව සපුරාලීම සඳහා 'පෙතවත්‍ථු පාළිය' රාජකීය පණ්ඩිත **කොටගම වාචිස්සර** ස්ථවිරයන් වහන්සේට පවරාදෙන ලද්දේ විය. එහෙත් උන් වහන්සේ අතින් එ මැ පරිවර්තනය යථාකාලයෙහි නිසි පරිදි ඉටු නො වූයෙන් ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි ශාස්ත්‍රාගමධර මහතෙරවරුන් විසින් පාඨශොධන පූර්වක වැ නවතායෙන් සිංහල අනුවාදය සපුරා ලියන ලද්දේය. 'පෙතවත්‍ථු පාළිය' ගෙන විමර්ශ පූර්වක වූ පරිපූර්ණ සංඥාපනය ද, ව්‍යක්ත ලෙඛකයාණ කෙනකුන් වන හිඟුල මාකඬවර රේවත පරිවෙණාධිපති රාජකීයපණ්ඩිත **කරහම්පිටිගොඩ සුමනසාර** ස්ථවිරයන් වහන්සේ විසින් ලියන ලද්දේය.

ත්‍රිපිටක ග්‍රන්ථ ප්‍රකාශනයෙහි අනුග්‍රාහක වූ **අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන** ජනාධිපති උතුමාණන් හා ගරු අග්‍රාමාත්‍ය තැන්පත් **ආර්. ප්‍රේමදාස** මැතිතුමාණන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තැන්පත් ඊ. **ඇල්. බී. හුරුල්ලේ** මැතිතුමාණන් හා එම අමාත්‍යාංශයෙහි සියලු මහතුන් ද විශෙෂයෙන් මෙම ත්‍රිපිටක ග්‍රන්ථාවලිය ඉක්මනින් මුද්‍රණයට පමුණුවා අවසාන කළ යුතු යැ යි කත්තුකම්‍යතා ඡන්දය උපදවා ක්‍රියා කරන අතිරේක ලේකම් තැන්පත් **සෝමපාල ජයවර්ධන** මහතාණන් ද කෘතඥතායෙන් සඳහන් කරම්හ.

තවද ත්‍රිපිටක ධර්ම ප්‍රවර්තක වූ සත්ක්‍රියා මාර්ගයෙහි ආරම්භක **ලංකා බෞද්ධ මණ්ඩලයෙහි** සියලු මැ සත්පුරුෂයන් ද සිහිපත් කෙරෙමින් මුද්‍රණ කාර්‍යයෙහි නියුක්ත **තිසර මුද්‍රණාලයාධිකාරීන්** ඇතුළු මේ සඳහා සහාය දක්වන හැම කෙනකුන්ට මැ ශාසනායුවර්ධන කුශල හෙතුයෙන් ලොව් ලොවුතුරු සුව අත්වේවා'යි ආශංසනය කරම්හ.

මේවගට, ශාසනශාසනොදයකාරී,
**ලබුගම ලඞ්කානන්ද**
මහානායකස්ථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

1982 පෙබරවාරි 4 වැනි දින
(ජාතික නිදහස අනුස්මරණ දින)
ත්‍රිපිටක කාර්යාලයේ දී යැ.
115, විජේරාම මාවත
කොළඹ 7.

# සංඥාපන

සුත්තන්තපිටකයෙහි ඛුද්දකනිකාය පර්‍යාපන්න වූ 'පෙතවත්ථු' නවාඞ්ගශාස්තෘශාසනයෙහි ගාථාඞ්ගයෙහි සඞ්ගෘහීත වෙයි. ප්‍රෙත-ප්‍රෙතීන් විසින් පූර්වජන්මයෙහි කරනලද ප්‍රෙත්‍යභාවයට හෙතුභූත වූ කර්ම 'පෙතවත්ථු' නම් වෙයි. පාළියෙහි 'පෙත' ශබ්දය එනාම් සත්ත්ව-නිකායයෙහි දු ළිය පරලොව ගිය සත්ත්වයන් කෙරෙහි දු වැටෙයි. මෙහි ඒ දෙඅරුත් මැ යෙදෙයි. 'වත්ථු' ශබ්දය කාරණපර්‍යාය යි. තත්ප්‍රකාශක පර්‍යාප්තිධර්මය මෙහි 'පෙතවත්ථු' යි කියනු ලැබෙ. ඒ ඒ ප්‍රෙතවස්තු අත්ථොත්පත්ති විසිනැ පෘච්ඡාවිසර්ජන විසිනැ' යි ද්විවිධ වෙයි. අත්ථොත්පත්ති වස්තු භාග්‍යවතුන් වහන්සේ මැ විසින් ඒ ඒ කරුණෙහි ලා දෙශිත යැ. පෘච්ඡාවිසර්ජන වස්තු නම්: නාරද ආදි තෙරවරුන් විසින් පුළුවුස්නාලදු වැ ඒ ඒ ප්‍රෙත-ප්‍රෙතීන් විසින් කරනලද ආත්මභාවප්‍රකාශන යි. ඒ මැ තෙරවරුන් විසින් ආරොචිත වැ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ කර්මඵල ප්‍රත්‍යක්ෂ කරවන පිණිස සිව්පිරිස් මැද දෙසන ලද වන බැවින් ඒ දෙවැදෑරුම් කථා මැ භාග්‍යවතුන් වහන්සේ ගේ ආහච්ච දෙසනා මැ වේ.

'පෙතවත්ථු' ප්‍රමාණ විසින් සතර බණවරෙක් පමණ වෙයි. වර්ග විසින් උරග වර්ග යැ උබ්බරී වර්ග යැ චූළවර්ග යැ මහාවර්ග යැ යි වර්ග සතරෙකින් පරිමිත යැ. එහි ප්‍රථම වර්ගයෙහි වස්තු දෙළොසෙකැ ද්විතීයවර්ගයෙහි තෙළෙසෙකැ තෘතීයවර්ගයෙහි දසයෙකැ චතුර්ථ වර්ගයෙහි සොළොසෙකැ යි එක්පනස් වස්තුයෙකින් සමන්වාගත වේ.

'විමානවත්ථු' සෙයින් මැ 'පෙතවත්ථු' ද මිනිසුන් පව්කමින් මුද පින්කමට යොමු කරවන ජනකාන්ත කථාසඞ්ග්‍රහයෙකි. එහෙයින් මැ ධරමාන බුදුන් දවස පටන් මෙතෙක් ජනජීවිතයෙන් වෙන් නොකළ-හැකි සේ දැඩි ලෙස බැඳීසිටුනේ යි. මිහිඳු මහරහතුන් වහන්සේ මේ දිවයිනට වැඩ දෙවනපියතිස් රජගෙහි දී අනුලාදෙවී ආදි පන්සියයක් ඇතොවුරන් ප්‍රමුඛ පිරිසට දෙසූ ප්‍රථමදෙශනා 'විමානවත්ථු' 'පෙතවත්ථු' දෙසනා බව මහාවංසයෙහි සඳහන් වෙයි.

මානවසමාජයෙහි සුලභ වැ දක්නාලැබෙන ප්‍රාණඝාත, අදත්තාදන, පරදරසෙවන, මෘෂාවාද, පිසුනවචන, පරුෂවචන ආදි පව්කම්හි ආදීනව එබඳු පව්කමින් දුක්විඳුනවුන්ගේ මුවින් මැ ප්‍රකාශ වීම ශ්‍රාවකයන් දුසිරිතින් බැහැරවීමට ඉවහල් වෙයි. ගෘහජීවිතයෙහි සුලභ වූ ප්‍රියවිප්‍රයොග-දුඃඛය ජීවිතය පිළිබඳ තත්ත්වාවබොධය උදකර සන්හිඳුවාලන හෘදයඞ්ගම වූ ආදර්ශකථා රාශියක් මෙහි ඇත. මසුරුමලෙහි ආදීනව ද ත්‍යාගයෙහි ආනිසංස ද ප්‍රකාශිත වූ, මිනිසුන් යහමගට යොමු කරවන කථා මෙහි සුලභ යි.

බුද්ධකාලීන භාරතසමාජයෙහි නැඟුණු කථා මෙන් මැ ඈත අතීතය හා සම්බන්ධ කථා ද සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු බිහි වූ කථා ද ප්‍රෙතවස්තුයෙහි දක්නාලැබෙයි. බුදුන් පිරිනිවි නොබෝකල්හි

නැඟි **උත්තරමාතු පෙතවත්‍ථු** (2. 10) දෙවැනි සඞ්ගායනා අවස්ථායෙහි සඞ්ගීතියට නඟන ලද්දේ යැ. **ධාතුවිවණ්ණපෙතවත්‍ථු** (3. 10) ද්විතීය සඞ්ගීතියෙහි සංග්‍රහ වී. **නන්‍දකපෙතවත්‍ථු** (4. 3) තෘතියසඞ්ගීතියෙහි සඞ්ගෘහීත යි. බුද්ධකාලීනකථා සමකාලීන භාරතීයසමාජ තතු විමසනුවනට බෙහෙවින් අගනේ යැ. ප්‍රෙතනිකායෙහි උපන්නෝ ද වෛමානික ප්‍රෙත වැ ඉපැද සුවදුක් මුසු වැ විඳින්නෝ ද දෙව් වැ උපන්නෝ ද මිනිස් වැ උපන්නෝ ද ප්‍රෙතවස්තුයෙහි වෙති. එ මතු නොවැ ප්‍රෙතචරිත නොසඳහන් ප්‍රෙතවස්තු ද ඇත. ඔවුනතුරෙන් කිහිපයක් සැකෙවින් දක්වාලම්හ:

**ගොණපෙතවත්‍ථු** (2. 8)

"සැවැත්නුවර කෙළෙඹියෙක් පියා මළ සොවින් උමතු වැ හැසිරෙමින් දුටුදුටුවන් අතින් 'තම පියා දක්නාලද දැ'යි විචාරයි. සෝවන් වනුවට පින් ඇති ඒ කෙළෙඹී අලුයමැ ලොව බලන බුදුන්ගේ නුවණැස්හි පෙනෙයි, බුදුහු ඔහුගේ ගෙදොරට වැඩියහ. හෙ 'බුදුන් වැඩියහ'යි අසා අසුන් පනවා වඩාහිඳුවා එකත්පස් වැ හිඳ සවාමීනි, මාගේ පියා ගිය තැන් දන්නාසේක් දැ?'යි ඇසී. එබසට බුදුහු 'මේ අත්බැව්හි පියා ද, අතීත පියා දැ,'යි පුළුවුත්හ. 'මට පියවරු බොහෝ ලැ' යි ශොක සන්හිඳුවාගත් කෙළෙඹී බණ අසා සෝවන් වී.''

මේ කථායෙහි පියා මළ පුවත මිස ඔහුගේ ප්‍රෙතාචරිතය නැත. 'ගොණපෙතවත්‍ථුව' මේ නිමිත්තෙන් දම්සභායෙහි වදළ අතීත සිද්ධියකි. එහි දූ ප්‍රෙතාචරිතයෙක් නො කියැවෙයි. ඒ මෙසේ යි.

"අතීතයෙහි බරණැස්නුවර ගැහැවියෙක් පියා මළ සොවින් දවස් පතා සොහොනට ගොස් චිතකය ප්‍රදක්ෂිණා කරමින් ළෙහි අත් පැහැරැ වැලපෙයි. ශොක සන්හිඳුවන උපායක් සිතූ ඔහු පුත් 'සුජාත. මාණවක පිටිනුවර මළ ගොනකු දැක තෘණ හා පැන් ගෙන එතැනට පැමිණැ 'ජීවත් ගොනකුට' මෙන් 'කව බොව' යි කියමින් රැඳී සිටී. මිනිස්සු එපවත් පියාට දැන්වූහ. හෙ වහා දිව ගොස් 'කිම පුතා උමතුයෙහි ද? මළ ගොනුට කුමට තණ පැන් දේ දැ'යි පිළිවිත. ඒ ඇසූ 'සුජාත' මොහුගේ හිස, කඳ, පා, වලග ඇත. මොහු නැඟීසිටිනු ඇතැ යි කී, 'මළ ගොනු නඟාලීමට වෙහෙසෙන තෙපි මූඪයෙකැ'යි ගැහැවි කී. 'හිස, කඳ, පා, වලග තුබූ සෙයින් මැ ඇති ගොනු නඟාසිටුවීමට වෙහෙසෙන මම මූඪයෙම් නම් මියගිය නොපෙනෙන මුත්තණුවන් නිසා වෙහෙසෙන තෙපි මූඪ නො වවු දැ යි පුතුගේ ප්‍රශ්නයෙන් පියාගේ ශොක සන්හින.''

මේ කථාව් ගොනු මිය පරලොව යැම පමණක් ගෙන 'ගොණ-පෙතවත්‍ථු'යි නම් කරයි. ප්‍රෙතචරිතයක් නැත ද මරණය පිළිබඳ යථාවබෝධයෙන් ප්‍රියවිප්‍රයොගයෙන් තැවෙනුවන් සනහන්නට අගනා කථායෙකි.

**උරගපෙතවත්‍ථු** (1-12)

මේ කථාව ද එකදෙශයෙකින් 'ගොණපෙතවත්‍ථුව' හා සමාන වෙයි. එහි පුතු මළ සොවින් තැවෙන පියකුට බුදුහු අතීත කථාවක් වදරති. ප්‍රෙතයා දෙවියෙකි. කථාව සැකෙවින් මෙසේ යැ:

එක් මැ කුලයෙහි මව්, පිය, දූ, පුත්, ලෙහෙලි යන හැම දෙන මරණසති වඩති. දිනක් පියා පුතු හා සමග කෙතට යයි. පියා කුඹුර සාද්දී පුතා වනාත ගිනිලයි. රුක්බිලයක හුන් කළුනයෙක් ගින්නෙන් තැවී කුපිත වැ පැන පුතු දෂ්ට කරයි. විෂවෙගයෙන් පුතා මැරී දෙව් වැ උපදී. පියා මගියකු අත කියායවා ගෙහි සියලු දෙනා කැඳවාගෙනැ නිශොක වැ පුතු ආදහන කරයි. එතැනට වෙස්වළා පැමිණි දෙව්පුත් ඔවුන් ප්‍රියවිප්‍රයොගයෙන් ශොක නොවන කාරණා වෙන් වෙන් වැ විමසයි. ඔවුන්ගේ පිළිතුරු ප්‍රියවිප්‍රයොග දුකින් වැලැපෙනවුන්ගේ දුක්ගිනි නිවන සිහිල් දියඇලි බඳු වේ.

**කණ්හ පෙතවත්‍ථු** (2. 6)

මෙ වූකලි වෙනස් ස්වරූපයෙකින් සිටුනා යට කී ගණයෙහි මැ කථායෙකි. මළ පුතු ගැන සොවින පියකු සනහනු පිණිස බුදුන් වදළ අතීත සිද්ධියක් කණ්හපෙතවත්‍ථුයෙහි දක්වෙයි. 'සැවැත්නුවර උවසුවෙක් පුතු මළ සොවින් තැවී ආහාරපාන නොගෙන කර්මාන්ත ගැන නොතකා බුද්ධොපසථානයට ද නොගොස් ගෙහි මැ සිටියි. බුදුහු එහි වැඩැ කරුණු විමසා පැරැණි නුවණැතියෝ නුවණැතියන්ගේ බස් අසා මළ පුතු ගැන ශොක නො කළහ'යි අතීත කථාවක් වදරති. ඒ යැ කණ්හපෙතවත්‍ථු.

'කණ්හ' යනු වාසුදෙවගේ ගොත්‍රනාමය වෙයි. වෛදිකසාහිත්‍යයෙහි ශ්‍රී කෘෂ්ණ යැ. වාසුදෙව උත්තරභාරතයෙහි ද්වාරවතී නගරයෙහි දසබෑ රජුන්ගේ දෙටුසොහොයුරු වෙයි. හෙ පුතු මළ සොවින් තැවෙයි. කනිටුබෑ ඝතපණ්ඩිත ඔහුට ඉතා ප්‍රියමනාප යැ. පුත්‍ර ශොකයෙන් වැලැපෙන දෙටුබෑයා සනහන උපායක් සිතූ ඝතපණ්ඩිත උමතු වෙසක් ගෙනැ හඳහාවා ඉල්ලා හඬයි. වාසුදෙව ඔහු කරා ගොස් 'නෙපි නොපැතියයුත්තක් පතව, හඳහාවා නො ලැබියහෙන්නෙකැ'යි කියයි. එය එසේ මැ දනිවු නම් මළ පුතු නිසා කුමට හඬවු දැ?යි ඝතපණ්ඩිත අසයි. කරුණු වැටහුණු ඔහුගේ ශොක සන්හින. මෙහි වර්තමාන කථායෙහි හෝ අතීත කථායෙහි හෝ ප්‍රෙතචරිතයක් සඳහන් නො වේ. ශොකාකුල කුලුපග උවසුවන්ගේ සෝදුක් සන්හිඳුවාලන්නට බුදුරදුන් අනාරාධිත වැ සෙවණ්ණාවෙන් වැඩි අයුරු මේ කථා කිහිපයෙහි සැලැකියැයුතු කරුණෙකි.

මෙහි අතීතකථායෙහි සඳහන් දසබෑරජහු නම් වාසුදෙව යැ බලදෙව යැ චන්ද්‍රදෙව යැ සූර්‍යදෙව යැ අග්නිදෙව යැ වරුණදෙව යැ අජ්ජුන යැ පජ්ජුන යැ ඝතපණ්ඩිත යැ අඞ්කුර යැ යන මොහු යි. අඞ්කුරපෙතවත්‍ථුයෙහි ඔවුන් පිළිබඳ තවද විස්තර දක්නා ලැබේ. උත්තරමධුරාපුර 'මහාසාගර' රජ ඔවුන්ගේ මුත්තණුවෝ යැ. ඔහු පුත් 'උපසාගර' පියරජ යැ. උත්තරාපථයෙහි කංසභොගයෙහි 'අසිතඤ්ජන' නුවර 'මහාකංස' රජුගේ දුහිතෘ 'දෙවිගබ්භා' මවුබිසෝ යැ. 'අඤ්ජනදෙවී' දෙටුසොහොයුරී යැ. වෛදික දෙවිවරුන් විමසීනයෙහි ලා 'කණ්හ-පෙතවත්‍ථු' ද 'අඞ්කුරපෙතවත්‍ථු' ද අගනා කථා දෙකෙකි.

**අඞ්කුරපෙතවත්‍ථු** (2. 9)

මේ කථාව කිහිප අයුරෙකින් අගය කළ හැකි වෙයි. නමින් 'අඞ්කුරපෙතවත්‍ථු' වුව ද 'අඞ්කුර' ප්‍රෙතයෙක් නො වෙයි. මේ වස්තුයෙහි ප්‍රධාන පුද්ගලයා ඝන්නාලියෙකි. 'අඞ්කුර' මේ කථාව හා සම්බන්ධ

වනුයේ ඉතා දුරිනි. හෙ ද්වාරවතියෙහි දසබෑ රජුන් කෙරෙහි හැමට බාල වෙයි. පියරජුගේ ඇවෑමෙන් දසබෑයෝ එක් වැ රාජ්‍යය බෙදු ගනිති. ඔවුනට දෙටුබුහුත 'අඤ්ජනදෙවී' විසමෘත වෙයි. 'අඞ්කුර' තමා සතු භාගය ඇයට දී තෙමේ වෙළඳාමට බසී. ඔහුට හිතවැඩ පසස්නා භාණ්ඩාගාරදසයෙක් ඇත. උහු කෙරෙහි පසන් අඞ්කුර කුලදුවක් ගෙනවුත් ආවාහ කොට දින. ඇය ගැබිනි අවස්ථායෙහි දසයා මළේ යැ. පුතු උපන් කලැ පියාගේ බත්වැටුප් ඔහට දින. වියපත් කල්හි උහුගේ 'දස' 'අදස' භාවය ගැන රජකුලෙහි විවාදයෙක් වී. 'මව නිදස් බැවින් පුත්‍ර ද නිදස් වෙයි.' යනු තීරණ විය. එහෙත් එයින් ලජ්ජාවට පත් හෙ පලාගොස් හෙරුව නුවර සන්නාලිකම්න් යැපුනේ යැ. එනුවර 'අසයහ' නම් සිටුවරයෙක් දුගීමගීයාචකයනට දන්වැටක් තැබී. සන්නාලි තෙම එතැනට පැමිණියවුනට දන්හලට යන මඟ පෙන්වා ඒ පිනින් උත්තරාපථයෙහි වැලිකතරෙක්හි රුක්විමනෙකැ සිතුපැතු සම්පත් ලබන අනුහා ඇති රුක්දෙව් වැ උපන. අසයහ සිටුහුගේ දනයෙහි අනාදරයෙන් කටයුතු කළ සෙවකයෙක් ද ඒ අසල මැ ප්‍රෙතයොනියෙහි උපන. දිනක් ගැල් පන්සියයක් ගෙනැ වෙළඳාමෙහි යන 'අඞ්කුර' මංමුළා වැ රුක්සෙවණට ආයේ යැ. රුක්දෙව් ඔහු හැඳිනගෙනැ සිතුපැතු සම්පතින් ගැල්සාත්තුවෙහි හැමට උවටන් කළේ ය. එහි වූ ආත්මාර්ථකාමී බමුණෙක් රුක්දෙවියන්ගේ අනුභාවය දැකැ මන්ත්‍රබලයෙන් ඔහු බැඳගෙන නගරයට ගෙනගොස් රිසිසේ සම්පත් ලබමහ'යි අඞ්කුරහට කී යැ. 'සෙවණ දුන් රුක්හි අත්තක් බිඳීම පවා මිත්‍රද්‍රොහි පව්කමෙකැ'යි කියා අඞ්කුර ඔහුගේ අදහස ප්‍රතික්ෂෙප කෙළේ යැ. 'වැඩෙක් වේ නම් සෙවණ දුන් රුක්හි අතු පමණක් නො වැ කඳ ද සිඳුව, මුලිනුදු උපුරව'යි බමුණු උවදෙස් දින. මෙබස් අසාසිටි රුක්දෙව් බමුණාට දඬුවම් කෙළේ යැ. පසු වැ අඞ්කුරගේ අයැදුමින් ඔහු මුදලී. අඞ්කුරගේ ගෙහි සම්පත් පුරා දන් දීමට මෙහෙයැවී.

මව්පියන්ගේ ධනයට කලහ කරන දරුවන් ඇති ලොවෙකැ අඞ්කුර තමා සතු රජය දෙටුසොහොයුරියට දී වෙළඳාමට බස්නා සැටි, තමාට සෙවා කළ වහලකුට සමානාත්මතායෙන් සඞ්ග්‍රහ කරන අයුරු, ඔහු නිසා උපන් පුතු සකාරණ වැ වහල් බැවින් මුදලන අයුරු, සතුටු සිතින් දන්හලට මඟපෙන්වීම පමණින් ලද සැපත්, අනාදරසෙවායෙහි ආදීනව, කළගුණ සැලකීමේ අගය, මිත්‍රද්‍රොහී වීමේ ආදීනව ආදි මේ කථායෙහි මතු වී පෙනෙන චරිතාඞ්ග මිනිසුන් යහමඟට යොමු කරවීමෙහි ලා අතිශයොපකාරී වේ.

**කුමාරපෙතවත්ථු (3. 5)**

මේ වූකලි මිනිසත්බැවින් ච්‍යුත වැ මිනිසත්බැව්හි මැ උපන් එකකු පිළිබඳ කථායෙකි. සැවැත්නුවර දැහැමි උවසු පිරිසක් එක් වැ නුවර මැද අලඞ්කාර මණ්ඩපයක් කරවා බුදුපාමොක් මහසඟුන් පවරා මහදනක් පැවැත්වූහ. එක් මසුරු මිනිසෙක් එය නොඉවසනුයේ 'මේ මුඩුමහණුන්ට කුමට දෙත් ද? කසළගොඩෙහි ලූව මෙයට වඩා මැනැවැ'යි නොසතුටෙන් කී. එයින් සංවෙගයට පැමිණි උවසුවෝ එපවත් ඔහුගේ මවට දන්වා බුදුන් සඟුන් සමා කරව යි කීහ. ඔයිත් පුතු සමග වෙහෙරට ගොස් කළවරද කියා සමාව ගෙන බුදුපාමොක් මහසඟන පවරා ගෙට වඩා සත්දවසක් යාගුදනයක් පැවැත්වූ යැ.

නොබෝකල්හි මියගිය පිත නුවර ගණිකාවකගේ කුස පිළිසිඳ ගත. ගණිකා තොමෝ ඔහු උපන් කෙණෙහි ම මියන්නට අමුසොහොනෙහි දමවූ. අලුයමැ ලොව බලන බුදුහු ඔහු පින් ඇති සේ දැකැ හිරු උදවන වේලෙහි සොහොනට වැඩියහ. බුදුන් වඩනේ කරුණක් ඇතැ'යි මහජනයා ද එහි රැස්වූහ. බුදුහු රැස්වූ පිරිසට කුමරු පෙන්වා මෙ කුමර අලාමක පුරුෂයෙකැ, හොගහෙතුයෙන් මෙනුවර අග්‍රකුල ඇති වන්නේ යැ යි වදළහ. එනුවර අසූකෙළක් ධන ඇති සිටුවරයෙක් කුමරු ගෙනගොස් පුත්‍රස්ථානයෙහි ලා වැඩූයේ යැ. සිටුහුගේ අයාමෙන් සියලු සැපත් කුමරු සතු වී.

මෙසේ නානා සවරූපයෙන් සිටුනා ආදර්ශවත් කථායෙන් සැරසීගත් පෙතවත්ථු මිනිසුන් දුසිරිතින් මිදී සුසිරිතට යොමු වීමට හෙතුභූත වෙමින් ජනජීවිත හා දැඩි ලෙස බැඳී ජනකාන්ත ධර්මකථාසඞ්ග්‍රහයක් වශයෙන් පවතී.

**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.**

**කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර**

රේවත පිරිවෙන
මාකඩවර,
හිඟුල.
1982. 2. 4 දින.

# ශුද්ධාශුද්ධදර්ශනය

| පිටුව | පේළිය | ශුද්ධ | අශුද්ධ |
|---|---|---|---|
| 14 | 11 | සමිද්ධිනී | සමි ධිනී |
| 24 | 17 | විපුලා | විපලා |
| ,, | 21 | සීතා | නතා |
| 35 | 12 | සිටුහු | සි ටිහි |
| 50 | 3 | යාවනෙත්ථ | යාවනෙත්ථ |
| ,, | 25 | හොතතුං | හොතතුං |
| 64 | 19 | බහුකම්පි | බ...... |
| 67 | 10 | හිමවත් | හිමවන් |
| 68 | 33 | නානාසරගණා | නානාසරගණා |
| 69 | 25 | සිත්කලු | සිත්කළු |
| ,, | 30 | සෙලවුණු | සෙළවුණු |
| 74 | 12 | අබබූළහසල්ලා | අබබූළහසලෙලා |
| ,, | ,, | සීතීභූතා | සීතීභූතො |
| 88 | 33 | ජෙතවනෙ | තෙතවනෙ |
| 101 | 9 | ජනයා | ඡනයා |
| 110 | 33 | ඛිඩ්ඩප්පීකො | ඛිඩ්ඩ්ප්පීකො |
| 130 | 15 | ජන්තු | ජතතු |
| 139 | 6 | අනුකම්පා | අනුනුම්පා |
| 155 | 22 | නග්නහු | නග්නතහු |

## ඛුද්දකනිකායෙ

# පෙතවත්ථුපාළි - විසයසූචි

### 1. උරගවග්ගො 2-21



### 2. උබ්බරිවග්ගො 22-75

## 3. චූළවග්ගො 76–99



## 4. මහාවග්ගො 100–161

සුත්තන්තපිටකෙ

# පෙතවත්ථුපාළි

# සුත්තන්තපිටකෙ

# පෙතවත්ථුපාළි

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## උරගවග්ගො පඨමො

### 1. 1

1. ඛෙත්තූපමා අරහන්තො දායකා කස්සකූපමා,
බීජූපමං දෙය්‍යධම්මං එත්තො නිබ්බත්තතෙ ඵලං

2. එතං බීජං කසී ඛෙත්තං පෙතානං දායකස්ස ච,
තං පෙතා පරිභුඤ්ජන්ති දාතා පුඤ්ඤෙන වඩ්ඪති.

3. ඉධෙව කුසලං කත්වා පෙතෙ ච පටිපූජිය
සග්ගඤ්ච කමිට්ඨානං කම්මං කත්වාන භද්දක’න්ති.

ඛෙත්තූපමපෙතවත්ථු පඨමං.

### 1. 2

4. කායො තෙ සබ්බසොවණ්ණො සබ්බා ඔභාසතෙ දිසා,
මුඛං තෙ සූකරස්සෙව කිං කම්මමකරි පුරෙති.

5. කායෙන සඤ්ඤතො ආසිං වාචායාසිමසඤ්ඤතො,[1]
තෙන මෙ තාදිසො වණ්ණො යථා පස්සසි නාරද.

6. තං ත්‍යාහං[2] නාරද බ්‍රූමි සාමං දිට්ඨමිදං තයා,
මාකාසි මුඛසා පාපං මා ඛො සූකරමුඛො අහු’ති.

සූකරමුඛපෙතවත්ථු දුතියං.

---

1. වාචායාසිං අසඤ්ඤතො - සිමු ii ස්‍යා.
2. තාහං - ප.

# සූත්‍රාන්තපිටකයෙහි

# ප්‍රෙතවස්තුපාලි

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

## 1. උරගවර්ගය

### 1. 1

1. රහත්හු කෙත වැනියහ. දායකයෝ ගොවියන් වැන්නාහ. දෙයධර්මය (දානවස්තුව) බිජුවට වැනි ය. මේ කරුණු තුන හෙතු කොට ගෙන කුසල ඵලය උපදියි.

2. (යථොක්ත දෙයධර්ම සඞ්ඛ්‍යාත) බීජය ද, (එහි වැපිරීම් නැමැති) ගොවිකම ද රහත් නැමැති කෙත ද, යන මේ කරුණු තුන පරලොව ගියවුන්ට ද, දායකයන්ට ද උපකාර පිණිස වේ. පරලොව ගිය අය දන් දීමෙන් ලද ඒ විපාකය විඳිත්. දායකයා පිනින් වැඩෙයි.

3. (මෙ) මෙලොවැ මැ කුසල් කොට ප්‍රෙතයන් ද පුදා (ප්‍රාප්තිදාන වශයෙන්) යහපත් කුසල් කොට දෙව්ලොවට පැමිණේ.

**ඛෙත්තූපම ප්‍රෙතවස්තු යි.**

### 1. 2

(නාරද තෙරණුවෝ මෙසේ පිළිවිසිති:)

4. තාගේ මුළුසිරුර රන්වන් ය. සියලු දිග් බබුළුවයි. තාගේ මුව හූරුමුව වැන්න. තෝ පෙර කිනම් පව්කමක් කෙළෙහි ද?

(ප්‍රෙතයා මෙසේ පිළිතුරු දෙයි)

5. මම කයින් සංවර වූයෙමි. වචනයෙන් අසංවර වූයෙමි. නාරදයෙනි, ඔබ දක්නා පරිදි ශරීරවර්ණයක් මට වූයේ එහෙයිනි.

6. නාරදයෙනි, ඔබ විසින් ම මෙ සිරුර දක්නාලද, එහෙයින් මම ඔබට මෙය (අවවාද වශයෙන්) කියමි: මුවින් පවක් නො කරව. හූරුමුව ඇත්තෙක් නො වව.

**සූකරමුඛ ප්‍රෙතවස්තු යි.**

## 1. 3

7. දිබ්බං සුභං ධාරෙසි වණ්ණධාතුං
වෙහායසං තිට්ඨසි අන්තලික්ඛෙ,
මුඛඤ්ච තෙ කිමයො පූතිගන්ධං
ඛාදන්ති කිං කම්මමකාසි පුබ්බෙති?.

8. සමණො අහං පාපො[1] දුට්ඨවාචො
තපස්සිරූපො මුඛසා අසඤ්ඤතො,
ලද්ධා ච මෙ තපසා වණ්ණධාතු
මුඛඤ්ච මෙ පෙසුනියෙන පූති.

9. තයිදං තයා නාරද සාමං දිට්ඨං
අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං,
මා පෙසුනං මා ච මුසා අභාණි
යක්ඛො තුවං හොහිසි කාමකාමී'ති.

පූතිමුඛපෙතවත්ථු තතියං.

## 1. 4

10. යං කිඤ්චාරම්මණං කත්වා දජ්ජා දානං අමච්ඡරී,
පුබ්බපෙතෙ ච ආරබ්භ අථවා වත්ථු දෙවතා.

11. චත්තාරො ච මහාරාජෙ ලොකපාලෙ යසස්සිනො,
කුවෙරං ධතරට්ඨං ච විරූපක්ඛං විරූළ්හකං,
තෙ චෙව පූජිතා හොන්ති දායකා ච අනිප්ඵලා.

12: න හි රුණ්ණං ව සොකො වා යා චඤ්ඤා පරිදෙවනා,
න තං පෙතස්ස අත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො.

13. අයඤ්ච ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පතී'ති.

පිට්ඨධීතලිකපෙතවත්ථු චතුත්ථං.

1. පාපොති – මජසං.

## 1. 3

(නාරද තෙරණුවෝ මෙසේ විචාරති:)

7. තෝ දෙව්සිරුරට බඳු යහපත් සිරුරුපැහැ ඇත්තෙහි, අහසෙහි සිටින්නෙහි, එහෙත් පණුවෝ දුගඳ හමන තාගේ මුඛය සිදුරු කොට කති. පෙරදූයෙහි (තෝ) කවර කර්මයක් කෙළෙහි ද?

(ප්‍රේතයා මෙසේ පිළිතුරු දෙයි)

8. මම පෙර දුෂ්ටවචනයෙන් යුත් වාග්ද්වාරයෙන් අසංවර වූ ශ්‍රමණවේශධාරී පව්ටුමහණෙක් වීමි. බඹසර බෙලෙන් මාගේ ශරීර වර්ණය ලද. පිසුනුබසින් මා මුව දුගඳ විය.

9. නාරදයෙනි, ඔබ තමන් විසින් ම මා සිරුර දක්නා ලද. කාරුණික නිපුණ වූ බුද්ධාදි උත්තමයෝ යමක් ප්‍රකාශ කළාහු නම් මම එය ම ඔබට කියමි. පිසුනුබස් නො කියන්න. මුසවා ද නො බණින්න. එකල්හි ඔබ කැමති සැප විඳිනා දෙව් වන්නහු යි.

**පූතිමුඛ ප්‍රේතවස්තු යි.**

## 1. 4

10. නොමසුරු තැනැත්තේ යම්කිසිවක් අරමුණු කොට දන් දෙන්නේ ය. පෙර කලුරිය කළවුන් හෝ නැතහොත් ගෙවතු ආදියට අරක් ගත් දෙවියන් ඇරබැ හෝ දන් දෙන්නේ ය.

11. වෛශ්‍රවණ ය, ධෘතරාෂ්ට්‍ර ය, විරූපාක්ෂ ය, විරූඪ්ය යන යශස්වී ලොකපාලක සිවුවරම් දෙවියන් අරබයා හෝ දන් දෙයි. ඔවුහු ද පුදන ලද්දෝ වෙත්. දයකයෝ ද නිෂ්ඵල නො වන්නෝ වෙත්.

12. මළවුන් සඳහා හැඬීමක් ශෝකයක් හෝ එයින් අන්‍ය වූ විලාප කිමක් හෝ නො කළයුතු ය. කලුරිය කළවුන්ට ඒ ඇඬීම් ආදිය ප්‍රයොජනය පිණිස නො වෙයි. එහෙත් එසේ කරන මඳ නුවණැති නෑයෝ ද සිටිත්.

13. දයකයා විසින් දුන් මේ දනය සඞ්ඝයා කෙරෙහි මනාව පිහිටියේ ය. මෙ ප්‍රේතයාහට බොහෝ කලක් මුළුල්ලෙහි හිත පිණිස (දනවිපාකය) එකෙණෙහි ම පැමිණේ.

**පිට්ඨධීතලික ප්‍රේතවස්තු යි.**

## 1. 5

14. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිඞ්ඝාටකෙසු ච,
ද්වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං.

15. පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ,
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා.

16. එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා,
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං.
ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො,

17. තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා.
පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ,

18. චිරං ජීවන්තු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ.
අම්හාකඤ්ච කතා පූජා දයකා ච අතිප්ඵලා,

19. න හි තත්ථ කසි අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති.
වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං,
ඉතො දින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං.

20. උන්නමෙ උදකං වට්ඨං[1] යථා නින්නං පවත්තති,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

21. යථා වාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

22. අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං.

23. න හි රුණ්ණං ව සොකො වා යා චඤ්ඤා පරිදෙවනා,
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො.

24. අයඤ්ච ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති.

25. සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතාන පූජා ච කතා උළාරා,
බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පක'න්ති.

**තිරොකුඩ්ඩපෙතවත්ථු පඤ්චමං.**

1. වුට්ඨං – මජසං.

## 1. 5

14. (ප්‍රෙතයෝ) සිය මුල් ගෙවලට පැමිණ ගෘහප්‍රාකාර භිත්තීන්හි පිටත ද තුන්මං සතරමං සන්ධිවල ද ගෘහවල දොරබායෙහි ද සිටිති.

15. බොහෝ ආහාරපානවර්ග හා කෑ යුතු බීදියයුතු දේ දනය සඳහා පිළියෙළ කළ ද ඒ ප්‍රෙතයන්ගේ අකුශල කර්ම හෙතුවෙන් කිසි-වෙක් ඔවුන් සිහි නො කරයි.

16. නෑයන් අතුරෙන් ඒ ප්‍රෙතයනට අනුකම්පා කරන දූපුත් ආදි යම් නෑ කෙනෙක් වෙද්ද, ඔවුහු පිරිසිදු ව ප්‍රණීත වූ කැප වූ පැන් සහ බොජුන් සුදුසු කලැ පිරිනමත්. ''මෙ පින ඥාතිප්‍රෙතයනට පැමිණේවා. ඒ ඥාති ප්‍රෙතයෝ සුවපත් වෙත්වා''යි පින් දෙත්.

17. ඒ ඥාතිප්‍රෙතයෝ ද ඒ ඒ තැන් වලින් අවුත් රැස් වූවාහු වෙති. බොහෝ වූ ආහාරපාන දනවිෂයෙහි පිදූ කල්හි එහි පින් මෙසේ සකසා අනුමෝදන් වෙත්.

18. ''යම් නෑයන් නිසා අපි මේ සම්පත් ලබමෝ නම් ඒ නෑයෝ බොහෝ කල් ජීවත් වෙත්වා.'' අපට ද පූජා පවත්වන ලද. දයකයෝ ද යහපත් විපාක ඇත්තෝ වෙත්.

19. ඒ ප්‍රෙතලොකයෙහි ගොවිකමෙක් නැත. ගවයන් රැකීමෙක් ද නැත. (ඔවුනට සම්පත් ලැබෙන) එවැනි වෙළඳාමෙක් ද නැත. ගැනීම් විකිණීම් සඞ්ඛ්‍යාත මුදලින් කෙරෙන ගනු දෙනුවෙක් ද නැත. කලුරිය කළ ප්‍රෙතයෝ මෙලොවින් දූන් පිනින් එහි යැපෙති.

20. උස්තැන වැටුණු වැසිදිය යම්සේ පහත් තැන කරා පැමිණේ ද එමෙන් ම මේ මිනිස්ලොවින් දුන් පින ඒ ප්‍රෙතයන්ට පැමිණේ.

21. යම්සේ පිරුණු මහානදීහු සාගරය පුරවත් ද, එසේ ම මෙයින් දෙනලද පින ප්‍රෙතයනට පැමිණේ.

22. ''මට මේ දෙය දුන්නේ ය, මාගේ මෙනම කටයුත්ත කෙළේ ය, අසවල් අය මාගේ නෑයෝ ය, මිතුරෝ ය, යහළුවෝ''යි පෙර කළ උපකාරය සිහි කරටින් ප්‍රෙතයන්ට පින් දෙන්නේ ය.

23. හැඬීම හෝ ශොක කිරීම හෝ යම් අනික් විලාප කීමෙක් හෝ වේ ද, ඒ හැඬීම් ආදිය ප්‍රෙතයනට හිත පිණිස නො වේ. (එහෙත්) එබඳු අවිඥ වූ නෑයෝ ද සිටිත්.

24. සඞ්ඝයා විෂයෙහි දෙන ලද මේ දක්ෂිණාව මැනැවින් පිහිටියා ය. බොහෝ කලක් මුළුල්ලෙහි ඒ ප්‍රෙතයාට හිත පිණිස එකෙණෙහි ම එය පැමිණේ.

25. මේ දක්වන ලද්දේ නෑයන් විසින් ඉටු කළයුතු ඒ ඥාතිධර්මය යි. ප්‍රෙතයනට මහත් වූ පූජාවක් ද කරන ලද ඒ භික්ෂූනට බලය ද දෙන ලද තොප විසිතුදු මහත් පිනක් රැස් කරන ලදී.

**තිරොකුඩ්ඩ ප්‍රෙතවස්තු යි.**

## 1. 6

26. නග්ගා දුබ්බණ්ණරූපාසි දුග්ගන්ධා පූති වායසි,
මක්ඛිකා පරිකිණ්ණාව කා නු ත්වං ඉධ තිට්ඨසී’?ති.

27. අහං භදන්තෙ පෙතීම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

28. කාලෙන පඤ්ච පුත්තානි සායං පඤ්ච පුනාපරෙ,
විජායිත්වාන ඛාදමි තෙපි නා හොන්ති මෙ අලං.

29. පරිඩය්හති ධූමායති ඛුදාය[1] හදයං මම,
පානීයං න ලභෙ පාතුං පස්ස මං බ්‍යසනං ගත’න්ති.

30. කිං නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පුත්තමංසානි ඛාදසී’ති.

31. සපත්ති මෙ ගබ්භිනී ආසි තස්සා පාපං අචෙතයිං,
සාහං පදුට්ඨමනසා අකරිං ගබ්භපාතනං.

32. තස්සා ද්වෙමාසිකො ගබ්භො ලොහිතඤ්ඤෙව පග්ඝරි,
තදස්සා මාතා කුපිතා මය්හං ඤාතී සමානයි.

33. සපථඤ්ච මං කාරෙසි පරිභාසාපයී ච මං,
සාහං ඝොරඤ්ච සපථං මුසාවාදං අභාසිසං:
පුත්තමංසානි ඛාදමි සචෙ තං පකතං මයා.

34. තස්ස කම්මස්ස විපාකෙන මුසාවාදස්ස චූභයං,
පුත්තමංසානි ඛාදමි පුබ්බලොහිතමක්ඛිතා’ති.

පඤ්චපුත්තඛාදකපෙතවත්ථු ඡට්ඨමං.

## 1. 7

35. නග්ගා දුබ්බණ්ණරූපාසි දුග්ගන්ධා පූති වායසි,
මක්ඛිකාපරිකිණ්ණාව කා නු ත්වං ඉධ තිට්ඨසී?’ති.

1. ඛුද්දය – කත්ථචි.

## 1. 6

(සඟ තෙරහු පුළුවුස්ති:)

26. තෝ නග්න යැ. විරූප වූ පිළිකුල්කටයුතු රූපයෙන් යුක්ත යැ. තිගේ දුගඳ සිරුරෙන් කුණු ගඳ හමයි. හාත්පස මැස්සන් ගෙන් ගැවසී-ගත් සිරුරු ඇතියා ව, මෙහි සිටිනා තෝ කවරහු ද?

(ප්‍රෙතිය පිළිතුරු දෙයි.)

27. වහන්ස, දුකට පැමිණියා වූ මම යමලොකයෙහි උපන් ප්‍රෙතියක් මි. පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියා වෙමි.

28. උදයකාලයෙහි පුතුන් පස් දෙනකුන් ද නැවත සවස අනෙක් පස් දෙනකුන් ද වදු කමි. ඒ දසදරුවෝ පවා මට බඩසායට නො සෑහෙත්.

29. මා හද සයින් දැවෙයි, දුමයි. බොන්නට පැන් නො ලැබේ. විපතට පැමිණි මා බලව.

(තෙරහු යළි විචාරති:)

30. කයින් ද වචනයෙන් ද සිතින් ද කවර පවක් කරන ලද ද? කවර කර්මයක විපාකයෙන් දරුමස් කන්නහු ද?

(ප්‍රෙතිය පිළිතුරු දෙයි.)

31. මාගේ සපත්නී (සැමියාගේ අනෙක් බිරිඳ) ගර්භනී වූවා ය. ඇය කෙරෙහි මම පාපකර්මයක් කිරීමට සිතුවමු. ඒ මම දූෂිත වූ සිතින් ඇයගේ ගැබ හෙළුමු.

32. ඇයගේ දෙමස් වූ ගැබ ලෙය ම වී වැගුරුණේ ය. එකල ඇගේ මව මට කිපී නෑයන් රැස් කරවූ.

33. ඕ මා ලවා සපථ කරවූ ය. මා බියෙන් තැති ගැන්වූවා ය. ඒ මම ඉදින් මා ඒ ගර්භපාතනය කළා නම් මම පුත්‍රමාංස කන එකියක් මැ''යි දරුණු සපථ කොට බොරුබස් කීමි.

34. ඒ කර්මය සහ මුසාවාදය යන දෙක්හි ම විපාකයෙන් පූයාවෙන් සහ ලෙයින් වැකුණු සිරුරු ඇතිව දරුමස් කමි.

**පඤ්චපුත්‍රඛාදක ප්‍රෙතවස්තු යි.**

## 1. 7

(සඟතෙරහු මෙසේ විචාරති:)

35. නග්න වෙහි පිළිකුල් කටයුතු රූපයෙන් යුක්ත වෙහි. තිගේ දුගඳ සිරුරින් කුණුගඳ හමයි. මැස්සන්ගෙන් ගැවසුණු සිරුරු ඇත්තව. මෙහි සිටිනා තෝ කවර?

36. අහං භදන්තෙ පෙතීම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

37. කාලෙන සත්ත පුත්තානි සායං සත්ත පුනාපරෙ,
විජායිත්වාන ඛාදමි තෙපි නා හොන්ති මෙ අලං.

38. පරිඩය්හති ධූමායති ඛුද්‍ය හදයං මම,
නිබ්බුතිං නාධිගච්ඡාමි අග්ගිදඩ්ඪව ආතපෙ'ති.

39. කිං නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පුත්තමංසානි ඛාදසී?ති.

40. අහු මය්හං දුවෙ පුත්තා උභො සම්පත්තයොබ්බනා,
සාහං පුත්තබලූපෙතා සාමිකං අතිමඤ්ඤිසං.

41. තතො මෙ සාමිකො කුද්ධො සපත්තිං අඤ්ඤමානයි,
සා ච ගබ්භං අලභිත්ථ තස්සා පාපං අචෙතයිං.

42. සාහං පදුට්ඨමනසා අකරිං ගබ්භපාතනං,
තස්සා තෙමාසිකො ගබ්භො පූතිලොහිතකො පති.

43. තදස්සා මාතා කුපිතා මය්හං ඤාතී සමානයි,
සපථඤ්ච මං කාරෙසි පරිභාසාපයී ච මං.

44. සාහං ඝොරඤ්ච සපථං මුසාවාදං අභාසිසං,
පුත්තමංසානි ඛාදමි සචෙ තං පකතං මයා.

45. තස්ස කම්මස්ස විපාකෙන මුසාවාදස්ස චූභයං,
පුත්තමංසානි ඛාදමි පුබ්බලොහිතමක්ඛිතා'ති.

සත්තපුත්තඛාදකපෙතවත්ථු සත්තමං.

## 1. 8

46. කිං නු උම්මත්තරූපොව ලායිත්වා හරිතං තිණං,
ඛාද ඛාදාති ලපසි ගතසත්තං ජරග්ගවං.

47. න හි අන්නෙන පානෙන මතො ගොණො සමුට්ඨහෙ,
ත්වංසි බාලො ච දුම්මෙධො යථා තඤ්ඤො ච දුම්මතී'ති.

(ප්‍රේතිය පිළිතුරු දෙයි.)

36. වහන්ස, දුකට පත් මම යමලොව උපන් ප්‍රේතියක්මු. පව්කම් කොට මෙලොවින් ප්‍රේතලොකයට ගියමු.

37. උදයෙහි පුතුන් සත්දෙනකුන් ද නැවත සවස අනෙක් සත් දෙනකුන් ද වදු කමි. ඔවුහු ද මට නො සෑහෙත්.

38. මා හද සයින් දැවෙයි, දුමයි. අව්වෙහි ගින්නෙන් දැවෙන්නක මෙන් නිවීමක් නො ලබමි.

39. (තෙරහු:) කය - වචනය - සිත යන තිදෙරින් ති කළ දුෂ්ට කර්මය කුමක් ද? කිනම් කර්මයක විපාකයෙන් පුත්‍රමාංශ කන්නවු ද?

40. (ප්‍රේතිය:) පෙර මට පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. දෙදෙන ම පිරිපුන් යොවුන් වයස් ඇති වූහ. පුත්‍රබලයෙන් යුත් මම සැමියා අභිභවා (යටත් කොට) සිතුවමු.

41. එහෙයින් සැමියා මට කිපී අන් සපත්නියක (දෙවන බිරිඳක) ගෙනාවේ ය. ඕ ද දරුගැබක් ලැබුවා. මම ඇයට පාපකර්මයක් (කිරීමට) සිතුවමු.

42. ඒ මම දුෂ්ට සිතින් ඇගේ ගැබ හෙළුමු. ඇගේ තෙමස් වූ ගැබ කුණුලෙයක් ව වැටිණි.

43. එකල ඇගේ මව මට කිපියා නෑයන් රැස්කරවූ ය. මා ලවා දිව්රීම ද කරවූ ය. මා බියෙන් තැති ගැන්වූ ය.

44. ඒ මම ''මා එය කළා නම් මම පුත්‍රමාංශ කනු වෙම්වා''යි මෙසේ දරුණු සපථ කොට මුසවා කීමු.

45. ඒ පාපකර්මයාගේ ද මුසාවාදයේ ද විපාකයෙන් පූයාවෙන් සහ ලෙයින් තැවරුණු සිරුරු ඇත්තී මෙසේ දරුමස් කමි.

සත්තපුත්‍රඛාදක ප්‍රේතවස්තු යි.

## 1. 8

(මළ ගොනා වෙනුවෙන් හඬන පුතුට පියා මෙසේ කියයි.)

46. කිම උමතු ගති ඇත්තකු මෙන් නිල් තණ කපා ගෙනවුත් පණ ගිය මහලු ගොනකුට ''කව කව''යි කියන්නෙහි ද?

47. මළ ගොනා ආහාරපානයෙන් නො ම නැගිටිනේ ය. යම්සේ අන් මෝඩයෙක් ප්‍රලාප කියයි ද එසේම තෝ ද නුවණ නැති මෝඩයෙක් වෙහි.

48. ඉමෙ පාද ඉදං සීසං අයං කායො සවාලධී.
නෙත්තා තථෙව තිට්ඨන්ති අයං ගොණො සමුට්ඨහෙ.

49. නාය්‍යකස්ස හත්ථපාද කායො සීසඤ්ච දිස්සති,
රුදං මත්තිකථූපස්මිං න නු ත්වඤ්ඤෙව දුම්මතී’ති.

50. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

51. අබ්බූළ්හං වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පිතුසොකං අපානුදි.

52. ස්වාහං අබ්බූළ්හසල්ලොස්මි සීතිභූතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදාමි තව සුත්වාන මාණව.

53. එවං කරොන්ති සප්පඤ්ඤා යෙ හොන්ති අනුකම්පකා,
විනිවත්තයන්ති සොකම්හා සුජාතො පිතරං යථා’ති.

ගොණපෙතවත්ථු අට්ඨමං.

## 1. 9

54. ගූථඤ්ච මුත්තං රුහිරඤ්ච පුබ්බං
පරිභුඤ්ජති කිස්ස[2] අයං විපාකො,
අයන්නු කිං කම්මමකාසි නාරී
යා සබ්බද ලොහිතපුබ්බභක්ඛා.

55. නවානි වත්ථානි සුභානි චෙව
මුදූනි සුද්ධානි ච ලොමසානි,
දින්නානි මිස්සා කිතකා භවන්ති
අයන්නු කිං කම්මමකාසි නාරී’ති.

56. භරියා මමෙසා අහූ භදන්තෙ
අදායිකා මච්ඡරිණී කදරියා,
සා මං දදන්තං සමණබ්‍රාහ්මණානං
අක්කොසති පරිභාසති ච.

57. ගූථඤ්ච මුත්තං රුහිරඤ්ච පුබ්බං
පරිභුඤ්ජ ත්වං අසුචිං සබ්බකාලං,
එතඤ්ච තෙ පරලොකස්මිං හොතු
වත්ථා ච තෙ කිතකසමා භවන්තු,
එතාදිසං දුච්චරිතං චරිත්වා
ඉධාගතා චිරරත්තාය ඛාදතී’ති.

මහාපෙසකාරපෙතවත්ථු නවමං.

(පුතා මෙසේ කියයි:)

48. මේ පාදයෝ යැ, මේ හිස යැ, මේ වලග සහිත කය යැ, මේ නෙත්‍රයෝ යැ. (මේ සියලු අංගයෝ) පෙර මෙන් එසේ ම පවතිත්. (එහෙයින්) මේ ගොනා නැගිටින්නේ ය.

49. මුත්තණුවන්ගේ අත්පා ද කය ද හිස ද නො පෙනේ. (උන්ගේ ඇට බහා) මැටියෙන් කළ සෑයට හඬන තෙපි ම මෝඩ නොවන්නහු ද?

(එවිට පියා මෙසේ කියයි)

50. ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් සෝගින්නෙන් ඇවිලෙන්නා වූ ම මාගේ සියලු චිත්තදහය දිය ඉසින්නකු මෙන් නිවන්නේ ය.

51. යම් කුමරෙක් සොවින් පෙළුණු මාගේ පිතෘශොකය පහ කෙළේ ද, ඔහු විසින් මා හද ඇසුරු කළ සෝ හුල එකාන්තයෙන් උදුරන ලද.

52. ඒ මම උදුරා දැමූ සොක නැමැති හුල් ඇත්තෙම් වෙමි. සිහිල් වූයෙම් වෙමි. නිවුණෙම් වෙමි. තරුණය, තොපගේ වචන අසා මම ශොක නො කරමි, නො හඬමි.

53. යම්සේ සුජාතකුමරා පියා සොවින් මුදදූයේ ද එසේ ම නැණවත් අනුකම්පාකාරී යම් කෙනෙක් වෙත් නම් ඔවුහ ද මෙසේ කරත්, සොවින් මුදත්.

**ගොණප්‍රෙතවස්තු යි.**

## 1. 9

(ප්‍රෙතිය දුටු මහණ දෙවියාගෙන් මෙසේ පුළුවුසී)

54. මේ ස්ත්‍රිය අශුචි සහ මූත්‍ර ද ලේ සහ සැරව ද අනුභව කරයි. මේ කිනම් කර්‍මයක විපාකයක් ද යම ප්‍රෙතියක් හැම කල්හි ලේ හා සැරව අනුභව කරන්නී ද මේ ස්ත්‍රිය පෙර කිනම් කර්‍මයක් කළා ද?

55. මැයට දුන් යහපත් වූ ද මොළොක් වූ ද පිරිසිදු වූ ද සුවපහස් ඇත්තා වූ ද අභිනව වස්ත්‍ර ලොහවස්ත්‍ර සමාන ය, මේ ස්ත්‍රිය පෙර කවර කර්‍මයක් කළා ද?

(දෙවියා පිළිතුරු දෙයි)

56. වහන්ස, මෝ මාගේ බිරිඳ වූ ය, ඕ නො දෙනසුලු ය, මසුරු ය. තද මසුරු වූ ය. මහණ බමුණනට දන්දෙන මට ඕ මෙසේ අක්‍රොශ කළා ය, පරිභව ද කළා ය.

57. මේ දානය තොපට පරලොව දී අශුචි ද, මූත්‍ර ද, රුධිර ද, පූයා ද වේවා, මේ වස්ත්‍ර තොපට ලොහවස්ත්‍ර වේවා, තෙපි සැමදු ම අශුචි අනුභව කරව, මෙබඳු වූ වාග්දුශ්චරිත කොට මේ ප්‍රෙතලොකයට පැමිණ අශුචි ආදිය කයි.

**මහාපෙසකාර ප්‍රෙතවස්තු යි.**

## 1. 10

58. කා නු අන්තොවිමානස්මිං තිට්ඨන්ති නූපනික්ඛමි,
උපනික්ඛමස්සු භද්දෙ ත්වං පස්සාම තං මහිද්ධික’න්ති.

59. අට්ටීයාමි හරායාමි නග්ගා නික්ඛමිතුං බහි,
කෙසෙහම්හි පටිච්ඡන්නා පුඤ්ඤං මෙ අප්පකං කත’න්ති.

60. හන්දුත්තරීයං දදමි තෙ ඉමං දුස්සං නිවාසය
ඉමං දුස්සං නිවාසෙත්වා බහි නික්ඛම සොභනෙ:
උපනික්ඛමස්සු භද්දෙ ත්වං පස්සාම තං බහිට්ඨිත’න්ති.

61. හත්ථෙන හත්ථෙ තෙ දින්නං න මය්හං උපකප්පති,
එසෙත්ථුපාසකො සද්ධො සම්මා සම්බුද්ධසාවකො.

62. එතං අච්ඡාදයිත්වාන මම දක්ඛිණමාදිස,
අථාහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී’ති.

63. තං ච තෙ නහාපයිත්වාන විලිම්පිත්වාන[1] වාණිජා,
වත්ථෙහච්ඡාදයිත්වාන තස්සා දක්ඛිණමාදිසුං.

64. සමනන්තරා නුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,
භොජනච්ඡාදනපානීයං දක්ඛිණාය ඉදං ඵලං.

65. තතො සුද්ධා සුචිවසනා කාසිකුත්තමධාරිණී,
හසන්ති විමානා නික්ඛමි දක්ඛිණාය ඉදං ඵලන්ති’.

66. සුචිත්තරූපං රුචිරං විමානං තෙ පභාසති,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵල’න්ති.

67. භික්ඛුනො චරමානස්ස දොණිනිම්මජ්ජනං අහං,
අදාසිං උජුභූතස්ස විප්පසන්නෙන චෙතසා

68. තස්ස කම්මස්ස කුසලස්ස විපාකං දීඝමන්තරං,
අනුභොමි විමානස්මිං තඤ්ච දානි පරිත්තකං.

69. උද්ධං චතූහි මාසෙහි කාලකිරියා භවිස්සති,
එකන්තං කටුකං ඝොරං නිරයං පපතිස්සහං.

1. විලිම්පෙත්වාන – මජසං.

# 1. 10

(ප්‍රධාන වෙළෙඳා ප්‍රෙතියගෙන් මෙසේ විචාරයි.)

58. විමන තුළ සිටින්නී කවර ස්ත්‍රියක් ද, කවර ස්ත්‍රියක් විමනින් නො නික්මෙයි ද, සොඳුර තෝ එළියට එව, මහත් සෘද්ධි ඇති තී දකියැටියම්හ.

(ප්‍රෙතිය:)

59. නග්න ව පිටතට එන්ට දුක් වෙමි. ලජ්ජිත වෙමි. හිසකෙස් වලින් වැසුණු සිරුරු ඇති වෙමි. මා විසින් සුළු පිනක් කරන ලද.

(වෙළෙඳා)

60. මනා යැ, එසේ නම් තිට මගේ උතුරු සළුව දෙමි. මෙ සළුව හැඳ ගනුව, සොඳුර මෙ සළුව හැඳගෙන පිටතට එව, සොඳුර, පිටත සිටි තී දකිනු කැමැති වෙමි. එහෙයින් තෝ පිටතට නික්මෙව.

61. (ඔබ) අතින් (මා) අතට දුන් දෙය මට පරිභොගයට නුසුදුසු ය. සම්මා සම්බුද්ධශ්‍රාවක වූ මෙ සැදැහැවත් උපාසක තෙමේ මෙහි ඇත.

62. (මට දෙන වස්ත්‍රයෙන්) මේ උපාසකයා හඳවා (එයින් ලද) පින මට දෙව. එකල මම හැම යැපතින් සමෘද්ධ ව සුවපත් වෙමි.

63. ඒ වෙළෙඳෝ ඒ උවසුවා නහවා සුවඳ ගල්වා වස්ත්‍ර යුගළයෙකින් හඳවා ඒ ප්‍රෙතියට එහි පින් (දක්ෂිණාව) දුන්හ.

64. ඇයට පින් දෙනු අනතුරු ව ම එහි විපාකය උපන. දිව්‍යමය ආහාරපාන වස්ත්‍ර ද උපන මෙ දනඵල වෙයි.

65. ඉක්බිති පිරිසිදු සිරුරු ඇති, හැඳගත් පවිත්‍ර වස්ත්‍ර ඇති, කසීසළු වලටත් වඩා උතුම් වස්ත්‍ර දරමින් (ඕ) සිනාසෙමින් විමනින් නික්මුණු. මේ දනඵල යි.

(ඇය දුටු වෙළෙඳෝ මෙසේ පුළුවුත්හ).

66. තොපගේ විමානය සිතුවම් කළ රූ ඇතියේ සිත්කළු වූයේ බබළයි. දේවිය, අප විසින් විචාරන ලද තෙපි කියව, මේ කවර කර්‍මයක විපාකයෙක් ද?

67. (ඕ මෙසේ කියයි) පිඬු පිණිස හැසිරෙන සෘජුගුණයුත් මහණක්හට මම පහන් සිතින් තෙල් මුසු මුරුවටක් දුනිමි.

68. මෙ විමනෙහි දී ඒ කුශල කර්‍මයෙහි විපාකය දිගු කලක් මුළුල්ලෙහි විඳිමි. ඒ පිනෙහි විපාකය ද දැන් අල්පාවශිෂ්ට ව ඇත.

69. සිවුමසෙකින් මතුයෙහි මාගේ කාලක්‍රියා වෙයි. අනතුරුව මම ඒකාන්ත කටුක වූ දරුණු වූ අවීචිමහානිරයෙහි වැටෙන්නෙමි.

70. චතුක්කණ්ණං චතුද්වාරං විභත්තං භාගසො මිතං,
අයොපාකාරපරියන්තං අයසා පටිකුජ්ජිතං.

71. තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

72. තත්ථාහං දීඝමද්ධානං දුක්ඛං වෙදිස්සං වෙදනං,
ඵලඤ්ච පාපකම්මස්ස තස්මා සොචාමහං භුස'න්ති.

ඛල්ලාටියපෙතවත්ථු දසමං.

## 1. 11

73. පුරතොව සෙතෙන පලෙති හත්ථිනා
මජ්ඣෙ පන අස්සතරීරථෙන,
පච්ඡා ච කඤ්ඤා සිවිකාය නීයති
ඔභාසයන්ති දස සබ්බසො[1] දිසා.

74. තුම්හෙ පන මුග්ගරහත්ථපාණිනො
රුදම්මුඛා ඡින්නපභින්නගත්තා,
මනුස්සභූතා කිමකත්ථ පාපං
යෙනඤ්ඤමඤ්ඤස්ස පිවාථ ලොහිත'න්ති.

75. පුරතොව යො ගච්ඡති කුඤ්ජරෙන
සෙතෙන නාගෙන චතුක්කමෙන,
අම්හාක පුත්තො අහු ජෙට්ඨකො සො[2]
දානානි දත්වාන සුඛී පමොදති.

76. යො සො මජ්ඣෙ අස්සතරී රථෙන
චතුබ්භි යුත්තෙන සුවග්ගිතෙන,
අම්හාක පුත්තො අහු මජ්ඣිමො සො
අමච්ඡරී දානපතී විරොචති.

77. යා සා ච පච්ඡා සිවිකාය නීයති
නාරී සපඤ්ඤා මිගමන්දලොචනා,
අම්හාක ධීතා අහු සා කනිට්ඨා
භාගඩ්ඪභාගෙන සුඛී පමොදති.

78. එතෙ ච දානානි අදංසු පුබ්බෙ
පසන්නචිත්තා සමණබ්‍රාහ්මණානං,
මයම්පන මච්ඡරිනො අහුම්හා
පරිභාසකා සමණබ්‍රාහ්මණානං.
එතෙ පදත්වා පරිචාරයන්ති
මයඤ්ච සුස්සාම නළොව ඡින්නො'ති.

---

1. සබ්බතො - මජසං. 2. අහුජෙට්ඨපොසො - මජසං.

70. එහි කොන් සතරකි. දෙර සතරෙකි. ඒ කොටස් වශයෙන් මොනොවට බෙදන ලද ය. පමණ කරන ලද ය. අයොමය පවුරෙකින් වට කරන ලද ය. යපියෙනකින් වසන ලදී.

71. ඒ අවීචිනිරයෙහි ජ්වලිත වූ තෙජසින් යුක්ත වූ අයොමයභූමිය හැම කල්හි හාත්පස සියක් යොදුන් පැතිර සිටියි.

72. මම ඒ මහානිරයෙහි දිගුකලක් දුක්වෙදනා විඳිමි. පවකම්හි එල ද විඳිමි. එහෙයින් මම බෙහෙවින් ශොක කරමි යි.

**බල්ලාටිය ප්‍රේතවස්තු යි.**

## 1. 11

(තෙරණුවෝ ප්‍රෙතයන් ගෙන් මෙසේ පිළිවිසිති.)

73. පෙරටුව සුදු ඇත්වාහනයෙන් එක් දෙව්පුතෙක් යයි. යළි මධ්‍යයෙහි වෙළඹුන් යෙදූ රියෙන් අන් දෙවියෙක් යයි. පසුපස දිව්‍ය කන්‍යාවක් හාත්පස දසදිගුන් බබළවමින් සිවිකාවකින් ගෙන යනු ලබයි.

74. තෙපි වනාහි මුගුරුගත් අත් ඇති ව, හඬන මුහුණු ඇති ව, බිඳුණු වෙසෙසින් බිඳුණු සිරුරු ඇති ව යන්නවු ය. යම් පවකමෙකින් උනුන් ගේ ලේ බොන්නවු නම් (තෙපි) මිනිස් වූවාහු කවර පවකමක් කළහු ද?

(ප්‍රෙතයෝ පිළිතුරු දෙති.)

75. යමෙක් ඉදිරියෙහි ම සිවුපා ඇති සුදු ඇත්වාහනයෙකින් යේ ද, හේ අපගේ දෙටු පුතා විය. දන් දී සුවපත් වැ සතුටු වෙයි.

76. යම් දෙවියෙක් මධ්‍යයෙහි සොඳුරු ගමන් ඇති වෙළඹුන් සිවුදෙනකුන් යෙදූ අස්රියෙකින් ගමන් කෙරේ ද, හේ අපගේ මැදුම් පුතා විය. නොමසුරු දනපතියෙක් වූ හේ දූන් බබළයි.

77. මුවැත්තියක මෙන් මදලස බැලුම් ඇති පැනවත් වූ යම් දෙවඟනක් හැමට ම පසු වැ සිවි ගෙයෙකින් ගෙනයනු ලබා ද, ඕ අපගේ කනිටු දියණි වූ. තමා ලද කොටසින් අඩක් දී සුඛිත ව සතුටු වෙයි.

78. තුලුහු පෙර පහන්සිත් ඇති වැ මහණ බමුණනට දන් දුන්හ. අපි වනාහි මහණබමුණනට පිරිහෙළා කථාකරන මසුරෝ වූම්හ. තුලුහු දන් දී දිව්සිරින් ඉඳුරන් පිණවත්. අපි වැලිත් ආතපයෙහි ලූ බටගසක් මෙන් (සයින්) වියළෙම්හ.

79. කිං තුම්හාකං භොජනං කිං සයනං
කථංසු[1] යාපෙථ සුපාපධම්මිනො,
පහූතභොගෙසු අනප්පකෙසු
සුඛං විරාධාය[2] දුක්ඛං පත්තා'ති.

80. අඤ්ඤමඤ්ඤං වධිත්වාන පිවාම පුබ්බලොහිතං
බහුං පීත්වා න ධාතා හොම නච්ඡාදිම්හසෙ මයං.

81. ඉච්චෙව මච්චා පරිදෙවයන්ති
අදායකා පෙච්ච යමස්ස ඨායිනො,
යෙ තෙ විදිත්වා[3] අධිගම්ම භොගෙ
න භුඤ්ජරෙ නාපි කරොන්ති පුඤ්ඤං.

82. තෙ ඛුප්පිපාසූපගතා පරත්ථ
පෙතා චිරං ඣායරෙ ඩය්හමානා,
කම්මානි කත්වාන දුඛුද්‍රයානි
අනුභොන්ති දුක්ඛං කටුකප්ඵලානි.

83. ඉත්තරං හි ධනං ධඤ්ඤං ඉත්තරං ඉධ ජීවිතං,
ඉත්තරං ඉත්තරතො ඤත්වා දීපං කයිරාථ පණ්ඩිතො.

84. යෙ තෙ එවං පජානන්ති නරා ධම්මස්ස කොවිදා
තෙ දානෙ නප්පමජ්ජන්ති සුත්වා අරහතං වචො'ති.

**නාගපෙතවත්ථු එකාදසමං.**

## 1. 12

85. උරගොව තචං ජිණ්ණං හිත්වා ගච්ඡති සංතනුං,
එවං සරීරෙ නිබ්භොගෙ පෙතෙ කාලකතෙ සති.

86. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න රොදාමි[4] ගතො සො තස්ස යා ගතී'ති.

87. අනව්හිතො[5] තතො ආග නානුඤ්ඤාතො ඉතො ගතො,
යථාගතො තථාගතො කා තත්ථ පරිදෙවනා.

---

1. කථඤ්ච - මජසං.
2. විරාගාය - සයා.
3. විදිච්ච - මජසං.
4. එවං න සොචාමි - මජසං.
5. අනබ්භිතො - මජසං.

79. තොපගේ ආහාරය කුමක් ද? තොපගේ ශයනය කෙබඳු ද? අතිශය පාපධර්‍මී ඇති තෙපි කෙසේ යැපෙහු ද? අනල්ප වූ මහත් භොග ඇති කල්හි සැප වරදවා ගෙන අද දුකට පැමිණියහු ය.

(ප්‍රෙතයෝ පිළිතුරු දෙති:)

80. අපි ඔවුනොවුනට හිංසා කොටගෙන ලෙහෙ සැරව පානය කරම්හ. බොහෝ පානය කොටත් තෘප්ත නො වම්හ. නොරුස්නමෝ වම්හ.

81. මෙපරිද්දෙන් ම නොදෙනසුලු මනුෂ්‍යයෝ පරලොව ප්‍රෙතලොකයෙහි සිටින්නාහ, වැලපෙත්. යම් මනුෂ්‍ය කෙනෙක් ''භොගයෙන් මතු සැපත් සැලසෙති''යි දැන භොගයන් ලැබ අප මෙන් ම නොවළඳා සිටිත්, නො ද පින් කෙරෙත්.

82. ඒ ප්‍රෙතයෝ දුක් එළවන කටුකඵල ඇති පව්කම් කොට පරලොව්හි සාපිපාසායෙන් මඩනා ලද්දහු (දුකින්) දැවෙමින් බොහෝ කලක් තැවෙත්. දුක් අනුභව කෙරෙත්.

83. ධන, ධාන්‍ය ක්ෂණික ය. මෙලොව ජීවිතය ද ක්ෂණික ය. වැඩිකල් නොපවතින දේ ක්ෂණික යි නුවණින් දනත් නුවණැත්තේ තමහට ප්‍රතිෂ්ඨාව කරන්නේ ය.

84. ධර්‍මයෙහි දක්ෂ වූ යම් මනුෂ්‍ය කෙනෙක් මේ මෙසේ දනිත් ද, ඔහු රහතුන්ගේ වචන අසා දන් දීමෙහි නො පමා වෙත්.

**නාග ප්‍රෙතවස්තු යි.**

## 1. 12

(බමුණා මළපුතු වෙනුවෙන් ශොක නො කිරීමේ හෙතු දක්වයි:)

85. යම්සේ සර්පයා දිරූ සැව සියසිරුරින් හැර පියා යේ ද, එසේ ම ශරීරය නිෂ්ප්‍රයොජන ව ආයුෂාදිය පහ වැ කලුරිය කළ කල්හි සත්ත්වයා සිය සිරුර හැරපියා යෙයි.

86. දවනු ලබන සිරුර නෑයන්ගේ හැඬීම නො දනී. එහෙයින් මළ පුතු නිමිති කොට නො හඬමි. ඔහුගේ යම් ගමනෙක් වී ද, හේ ඒ ගමන ගියේ ය.

(බැමිණි ද මළපුතු වෙනුවෙන් නො හඬන කරුණ කියයි:)

87. හේ නො කැඳවන ලද්දේ පරලොවින් මෙහි ආයේ යැ. නො අනුදන්නා ලද්දේ මෙලොවින් ගියේ ය. යම්සේ ආයේ ද එසේ ගියේ ය. එහි ලා කවර හැඬීමෙක් ද?

88. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න රොදාමි ගතො සො තස්ස යා ගතී'ති.

89. සචෙ රොදෙ කිසා අස්සං තත්ථ මෙ කිං ඵලං සියා,
ඤාතිමිත්තසුහජ්ජානං භිය්‍යො නො අරතී සියා.

90. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න රොදාමි ගතො සො තස්ස යා ගතී'ති.

91. යථාපි දාරකො චන්දං ගච්ඡන්තමනුරොදති,
එවං සම්පදමෙවෙතං යො පෙතමනුසොචති.

92. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න රොදාමි ගතො සො තස්ස යා ගතී'ති.

93. යථාපි බ්‍රහ්මෙ උදකුම්භො භින්නො අප්පටිසන්ධියො,
එවං සම්පදමෙවෙතං යො පෙතමනුසොචති.

94. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න රොදාමි ගතො සො තස්ස යා ගතී'ති.

**උරගපෙතවත්ථු ද්වාදසමං.**

## උරගවග්ගො පඨමො නිට්ඨිතො.

**තස්සුද්දානං:**

ඛෙත්තඤ්ච සූකරං පූති පිට්ඨඤ්චාපි තිරොකුඩ්ඩං,
පඤ්චාපි සත්තපුත්තඤ්ච ගොණඤ්ච පෙසකාරකං,
තථා බල්ලාටියං නාගං උරගඤ්චෙව ද්වාදසාති.

88. දැවෙන මළසිරුර නෑයන්ගේ විලාපය නො දනී. එහෙයින් තෙල පුතු ගැන නො හඬමි. ඔහුට කර්මානුරූප යම් ගතියක් වී ද, හේ ඒ ගමන ගියේ ය.

(මළහුගේ නැගෙණියෝ ද මෙසේ කියති:)

89. ඉදින් මම හඬනෙම් නම් කෘශ වෙමි. ඒ හැඬීමෙහි මට කවර ඵලයක් වේ ද, අපගේ ඥාති මිත්‍රසුහෘදයනට බෙහෙවින් නො ඇල්ම වන්නේ ය.

90. දැවෙන සිරුර නෑයන්ගේ හැඬීම නො දනී. එහෙයින් මම මොහු ගැන නො හඬමි. ඔහුගේ කර්මය පරිදි යම් ගතියක් වී නම් හේ ඒ ගමන ගියේ ය.

(ඔහුගේ බිරිඳ ද මෙසේ කියයි:)

91. යම්සේ බාල දරුවෙක් අහස්හි ගමන් කරන සඳට අඬා ද යමෙක් මළහු සඳහා ශොක කෙරේ නම් ඒ කරුණ මෙබඳු ම ය.

92. දැවෙන්නේ නෑයන්ගේ හැඬීම නො දනී. එහෙයින් මම මොහුට නො හඬමි. ඔහුට කර්ම වූ පරිදි යම් ගතියෙක් වී නම් හේ ඒ ගමන ගියේය.

(දසිය ද මෙසේ කියයි:)

93. පින්වත් බමුණ, යම්සේ බිඳුණු දිය කළය නැවත සන්ධි කළ නො හැකි වේ ද, යමෙක් මළහු සඳහා ශොක කෙරේ නම් ඒ කරුණත් මෙබඳු ම යැ.

94. දැවෙන්නේ නෑයන්ගේ විලාපය නො දනී. එහෙයින් මම මොහුට නො හඬමි. ඔහුට කර්ම වූ පරිදි යම් ගතියෙක් වී නම් හේ ඒ ගමන ගියේ ය.

**උරග ප්‍රේතවස්තු යි.**

## උරගවර්ගය නිමි.

**එහි උද්දානය:**

ඛෙත්තූපම ප්‍රේතවස්තු යැ. සූකරමුඛ ප්‍රේතවස්තු යැ, පූතිමුඛ ප්‍රේතවස්තු යැ, පිට්ඨධීතලික ප්‍රේතවස්තු යැ, තිරොකුඩ්ඩ ප්‍රේතවස්තු යැ, පඤ්චපුත්තඛාදක ප්‍රේතවස්තු යැ, සත්තපුත්තඛාදක ප්‍රේතවස්තු යැ, ගොණ ප්‍රේතවස්තු යැ, මහාපෙසකාර ප්‍රේතවස්තු යැ, ඛල්ලාටිය ප්‍රේතවස්තු යැ නාග ප්‍රේතවස්තු යැ, උරග ප්‍රේතවස්තු යැ යි උරගවර්ගයෙහි ප්‍රේතවස්තු දෙළසෙකි.

# 2. උබ්බරිවග්ගො

## 2. 1

95. නග්ගා දුබ්බණ්ණරූපාසි කිසා ධමනිසන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ කා නු ත්වං ඉධ තිට්ඨසී'?ති.

96. අහං භදන්තෙ පෙතීම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා'ති.

97. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතා?'ති.

98. අනුකම්පකා මය්හං නාහෙසුං භන්තෙ
පිතා ච මාතා අථවාපි ඤාතකා,
යෙ මං නියොජෙය්‍යුං දදහි දානං
පසන්නචිත්තා සමණබ්‍රාහ්මණානං.

99. ඉතො අහං වස්සසතානි පඤ්ච
යං එවරූපා විචරාමි නග්ගා,
ඛුදාය තණ්හාය ච ඛජ්ජමානා
පාපස්ස කම්මස්ස ඵලං මමෙදං.

100. වන්දාමි තං අය්‍ය පසන්නචිත්තා
අනුකම්ප මං ධීර[1] මහානුභාව,
දත්වා ච මෙ ආදිස්ස යං හි කිඤ්චි
මොචෙහි මං දුග්ගතියා භදන්තෙති.

101. සාධූති සො පටිස්සුත්වා සාරිපුත්තොනුකම්පකො,
භික්ඛූනං ආලොපං දත්වා පාණිමත්තඤ්ච චොළකං;
ථාලකස්ස ච පානීයං තස්සා දක්ඛිණමාදිසි.

102. සමනන්තරානුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,[2]
භොජනච්ඡාදනපානීයං දක්ඛිණාය ඉදං ඵලං.

103. තතො සුද්ධා සුචිවසනා කාසිකුත්තමධාරිනී,
විචිත්තවත්ථාභරණා සාරිපුත්තමුපසඞ්කමී'ති.

104. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

---

1. වීර - මජසං.
2. උපපජ්ජථ - සීමු ii.

# 2. උබ්බරී වර්ගය

## 2. 1

(සැරියුත් තෙරහු සංසාර මොචක ප්‍රෙතියගෙන් මෙසේ පුළුවුස්ති:)

95. තෝ නග්න වෙහි, දුර්වර්ණ වූ, කෘශ වූ, ඉල්පුණු නහරින් යුත් සිරුරු ඇත්තෙහි යැ. ඉල්පුණු ඉළ ඇටින් සහ සිහින් සිරුරින් යුතු ව මෙහි සිටින තෝ කවරක් වෙහි?

(ප්‍රෙතිය මෙසේ කියයි:)

96. ස්වාමීනි මම දුකට පත්, යමලොව උපන් ප්‍රෙතියක්මු. පවකම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියා වෙමි.

(තෙරහු විචාරති:)

97. කය, වචන, සිත යන තිදෙරින් තී විසින් කුමන පවක් කරන ලද ද? කිනම් කර්‍මයක විපාකයෙන් හෝ මෙලොවින් ප්‍රෙතලොකයට ගියා වෙහි ද?

(ප්‍රෙතිය පිළිතුරු දෙයි:)

98. ස්වාමීනි යම් කෙනෙක් පහන්සිතින් යුතු ව මහණබමුණනට "දන් දෙව"යි කියා මා මෙහෙයවත් නම් එබඳු වූ මට හිතැති පියෙක් හෝ මවක් හෝ අනෙක් නෑ කෙනෙක් හෝ මට නො වූහ.

99. එසේ පින් නො කළ හෙයින් මෙබඳු වූ ප්‍රෙතියක් වැ එතැන් පටන් නග්න වැ සාපිපාසායෙන් පෙළෙමින් අවුරුදු පන්සියයක් හැසිරෙමි. මාගේ පාපකර්‍මයෙහි මේ විපාකය වෙයි.

100. ආයුෂ්‍යයන් වහන්ස, මම පහන්සිත් ඇති වැ ඔබ වඳිමි. මහත් අනුභාව ඇති ධීරයන් වහන්ස, මට අනුකම්පා කරන සේක්වා. යම් කිසිවක් දන් දී එහි පින් මට දෙන සේක්වා, වහන්ස, මා මේ දුගතියෙන් මුදන සේක්වා.

101. කාරුණික වූ ඒ සැරියුත් තෙරහු 'මැනවැ'යි කියා ඇයට පිළිවදන් දී බත්පිඩක් ද රියනක පමණ පිළිකඩක් ද, එක පැන්තලියක් ද මහණක්හට දන්දී ඇයට ප්‍රාප්තිදනය කළහ.

102. ඒ පින්දීමට අනතුරු ව ම ඒ දනයෙහි විපාක උපන. එනම්: පිණිබොජුන් ද මනහරපිළි ද නන්වැදෑරුම් පානවර්ග ද ලැබිණි. මේ ප්‍රාප්තිදනයෙහි විපාක යි.

103. ඉක්බිති ස්නානයෙන් පිරිසිදු සිරුරු ඇති හන් සුදුපිළි ඇති කසීසළුවලට ද වඩා උතුම් වස්ත්‍ර ධරන විසිතුරු වස්ත්‍රාභරණ ඇති ඕ තොමෝ සැරියුත්තෙරුන් කරා එළැඹියා ය.

104. දෙව්දුව, යම්බඳු තෝ මනහර වූ ශරීරවර්ණයෙන් දවහත් තරුව මෙන් දසදිගුන් බබුළුවමින් මෙහි සිටිහි ද?

105. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා?.

106. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී'?ති

107. උප්පණ්ඩුකිං කිසං ඡාතං නග්ගං ආපතිතච්ඡවිං[1]
මුනි කාරුණිකො ලොකෙ තං මමද්දක්ඛි දුක්ඛිතං.

108. භික්ඛූනං ආලොපං දත්වා පාණිමත්තඤ්ච චොළකං,
ථාලකස්ස ච පානීයං මම දක්ඛිණමාදිසි.

109. ආලොපස්ස ඵලං පස්ස භත්තං වස්සසතං දස,
භුඤ්ජාමි කාමකාමිනී අනෙකරසබ්‍යඤ්ජනං

110. පාණිමත්තස්ස චොළස්ස විපාකං පස්ස යාදිසං,
යාවතා නන්දරාජස්ස විජිතස්මිං පටිච්ඡද.

111. තතො බහුතරා භන්තෙ වත්ථානච්ඡාදනානි මෙ,
කොසෙය්‍යකම්බලීයානි ඛොමකප්පාසිකානි ච,

112. විපලා ච මහග්ඝා ච තෙපාකාසෙව ලම්බරෙ,
සාහං තං පරිදහාමි යං යං හි මනසො පියං.

113. ථාලකස්ස ච පානීයං විපාකං පස්ස යාදිසං,
ගම්භීරා චතුරස්සා ච පොක්ඛරඤ්ඤො සුනිම්මිතා.

114. සාතොදකා[2] සුප්පතිත්ථා නතා අප්පටිගන්ධියා,
පදුමුප්පලසඤ්ඡන්නා වාරිකිඤ්ජක්ඛපූරිතා.

115. සාහං රමාමි කීළාමි මොදමි අකුතොභයා,
මුනිං කාරුණිකං ලොකෙ භන්තෙ වන්දිතුමාගතා'ති.

සංසාරමොචකපෙතවත්ථු පඨමං.

1. සම්පතිතච්ඡවි - මජසං.
2. සෙතොදකා - සීමු.

105. කවර හෙතුවකින් තිගේ එවැනි වර්ණයෙක් වී ද? කිනම් හෙතුවකින් තිගේ මෙහි සුචරිත ඵල සමෘද්ධියක් වී ද? මනවඩන යම්කිසි භොග කෙනෙක් තිට උපදිත් නම් ඒ කුමන හෙතුවකින් ද?

106. මහත් අනුභාව ඇති දෙව්දුව, තී විචාරමි. මිනිස් වූ (කල) තෝ කිනම් පිනක් කළවු ද? කවර පිනක හෙතුවෙන් මෙසේ දිලියෙන අනුභාව ඇත්තී වෙහි ද? තිගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

(ඕ මෙසේ පිළිතුරු දෙයි)

107. ලොවැ කුළුණුගුණයුත් සැරියුත්තෙරහු පඬුවන් වූ කෘශ වූ බඩසයින් පෙළුණු, නග්න වූ, සුන්බුන්සිරුරුසිවි ඇති, දුගතියැ උපන් මා දුටහ.

108. පිඬක් පමණ අහර ද, රියනක් පමණ පිළී ද, තලියක් පමණ පැන් ද මහණුන්ට දන් දී (එ තෙරහු) එහි පින මට දුන්හ.

109. බත්පිඬුයෙහි විපාකය බලව, අනූන් විසින් පවා කැමති විය යුතු වූ කම්සැපතින් යුතු වැ දහසක් හවුරුදු මුළුල්ලෙහි නොයෙක් රසමසවුළෙන් යුත් බත් වළඳමි.

110. රියනක් පමණ පිළීයෙහි යම්බඳු විපාකයෙක් වී නම් එ ද බලනු මැන. නන්දරජුගේ විජිතයෙහි යම් පමණ පිළී වේ නම්,

111. වහන්ස, මට කොසෙයයවස්ත්‍ර හා කම්බිලි ද, කොමුපිළී හා කපුපිළී ද යන හඳනා පොරෝනා පිළී එයට වඩා බොහෝ අධික ය.

112. මහත් වූ ද මාහැඟි වූ ද ඒ පිළී අහසෙහි ම එල්බෙයි. ඒ මම යම් යම් පිළී මගේ සිතට ප්‍රිය නම් එය ම හැඳ පෙරෙවැ ගනිමි.

113. පැන්තලියෙහි යම්බඳු විපාකයෙක් වී නම් එ ද බලව. ගැඹුරු සතරැස් පොකුණු (එතිසා) මැවිණි.

114. එය පහන්දියෙන් හා වැල්ලෙන් ගැවසීගත්තේ ය. යහපත් තොටින් හා සිහිල්දියෙන් යුක්ත යැ. සුවඳැති රත්පියුමින් හා හෙළ පියුමින් ගැවසී පවතී. මල්රේණුයෙන් යුත් දියෙන් පිරුණේය.

115. ඕ මම කිසිවකිනුත් බිය නැත්තී රමණය කරමි, ක්‍රීඩා කරමි, සතුටු වෙමි. ලොවැ කුළුණැති මුනිවරයකු වූ ඔබ වැඳීමට මෙහි ආමි.

**සංසාරමොචක ප්‍රෙතවස්තු යි.**

## 2. 2.

116. නග්ගා දුබ්බණ්ණරූපාසි කිසා ධමනිසන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ කා නු ත්වං ඉධ තිට්ඨසී'ති.

117. අහං තෙ සකියා මාතා පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු,
උප්පන්නා පෙත්තිවිසයං ඛුප්පිපාසසමප්පිතා.

118. ඡඩ්ඩිතං ඛිපිතං ඛෙළං සිඞ්ඝාණිකං සිලෙසුමං,
වසඤ්ච ඩය්හමානානං විජාතානඤ්ච ලොහිතං.

119. වණිතානඤ්ච යං ඝානසීසච්ඡින්නාන ලොහිතං
ඛුදපරෙතා භුඤ්ජාමි ඉත්ථිපුරිසනිස්සිතං.

120. පුබ්බලොහිතභක්ඛාස්මි[1] පසූනං මානුසාන ච,
අලෙනා අනගාරා ච නීලමඤ්ච පරායනා.

121. දෙහි පුත්තක මෙ දානං දත්වාන උද්දිසාහි[2] මෙ,
අප්පෙව නාම මුච්චෙය්‍යං පුබ්බලොහිතභොජනා.

122. මාතුයා වචනං සුත්වා උපතිස්සොනුකම්පකො,
ආමන්තයී මොග්ගල්ලානං අනුරුද්ධඤ්ච කප්පිනං.

123. චතස්සො කුටියො කත්වා සඞ්ඝෙ චාතුද්දිසෙ අදා,
කුටියො අන්නපානඤ්ච මාතු දක්ඛිණමාදිසි.

124. සමනන්තරානුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,
භොජනං පානීයං වත්ථං දක්ඛිණාය ඉදං ඵලං.

125. තතො සුද්ධා සුචිවසනා කාසිකුත්තමධාරිණී,
විචිත්තවත්ථාභරණා කොලිතං උපසඞ්කමි.

126. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

127. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

1. පුබ්බලොහිතං භක්ඛාමි – මජසං.
2. අන්වාදිසාහි – මජසං.

## 2. 2

(සැරියුත් තෙරහු ප්‍රෙතියගෙන් මෙසේ විචාරති:)

116. තෝ නග්න යැ. දුර්වර්ණ වූ, කෘශ වූ, ඉල්පුණු නහරින් යුත් සිරුරු ඇතියාව, ඉල්පුණු ඉළ ඇටින් හා සිරුරින් යුතු ව මෙහි සිටින තෝ කවරක් වෙහි ද?

(ප්‍රෙතිය පිළිතුරු දෙයි:)

117–119. මම මින් පෙර ජාතිවල (අනෙක් පස්වන ජාතියෙහි) ඔබගේ (ස්වකීය) වැදූ මව වීමි. ප්‍රෙතලොකයෙහි උපන් මම බඩසයින් පෙළුණා වෙමි. වමනයෙන් හා කිවිසීමෙන් හටගත් මල ද, කෙළ – සොටු හා සෙම ද, දවන මළසිරුරුවල වුරුණුතෙල හා වැදූස්ත්‍රීන්ගේ ලේ ද, වණ ඇත්තවුන්ගේ, නාසය ... හිස කැපූවන්ගේ යම් ලෙයක් වේ නම් එය ද ස්ත්‍රී ... පුරුෂ ශරීර ආශ්‍රිත දේ ද, සාගින්නෙන් මඩනා ලද මම අනුභව කරමි.

120. සිවුපාවුන්ගේ ද මිනිසුන්ගේ ද පූයා හා ලේ අනුභව කරන්නි පිහිටක් නැති ව වාසස්ථානයක් නැති ව සොහොන්යහන ම පිහිට කොට වෙසෙමි.

121. පුතණුවනි, මා සඳහා දනක් දුන මැනවි, දන් දී මට පින් දුන මැනවි. ලේ සැරව බිදීමෙන් මිදෙන්නෙම් නම් ඉතා යෙහෙක.

122. කාරුණික වූ උපතිස් තෙරහු මවගේ වචන අසා මොග්ගල්ලාන අනුරුද්ධ ... කප්පින යන තෙරවරුන් ඇමතූහ. (නිමන්ත්‍රණය කළහ)

123. සිවුකිළියක් කොට සිවුදිගින් වඩනා සඟනට ඒ කිළි ද ආහාර පාන ද දුන්හ. මවට දක්ෂිණාව (පින්) දුන්හ.

124. පින්දීමට අනතුරු ව මැ එහි විපාකය උපන. දිව්‍යමය ආහාරපාන හා වස්ත්‍ර පහළ විය. මේ දක්ෂිණායෙහි ඵලය යි.

125. ඉක්බිති ඕ විසිතුරු සුදුපිළී ඇති වැ උතුම් කසීසළු දරමින් විචිත්‍ර වස්ත්‍රාභරණ ඇත්තී කොලිත තෙරුන් වෙත එළැඹියා ය.

(මුගලන් තෙරහු මෙසේ විචාරති:)

126. දෙව්දුව, යම්බඳු තෝ ඉනා මනහර ශරීරවර්ණයෙන් දවහත් තරුව මෙන් සියලු දසදිගුන් බබුළුවමින් සිටිහි.

127. කවර හෙතුවකින් තීගේ එවැනි ශරීරවර්ණයෙක් වී ද? කිනම් හෙතුවකින් තීගේ මෙහි සුචරිතඵල සමෘද්ධියක් වී ද? මනවඩන යම්කිසි භොග කෙනෙක් වෙත් නම් ඒ භොගයෝ තිට උපදිත්.

128. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං:
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති.

129. සාරිපුත්තස්සහං මාතා පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු,
උපපන්නා පෙත්තිවිසයං ඛුප්පිපාසසමප්පිතා.

130. ඡඩ්ඩිතං ඛිපිතං ඛෙළං සිඞ්ඝාණිකං සිලෙසුමං,
වසඤ්ච ඩය්හමානානං විජාතානඤ්ච ලොහිතං.

131. වණිතානඤ්ච යං ඝානසීසච්ඡින්නාන ලොහිතං,
ඛුදාපරෙතා භුඤ්ජාමි ඉත්ථිපුරිසනිස්සිතං.

132. පුබ්බලොහිතභක්ඛාස්මි පසූනං මානුසාන ච,
අලෙනා අනගාරා ච නීලමඤ්ච පරායනා.

133. සාරිපුත්තස්ස දානෙන මොදාමි අකුතොභයා,
මුනිං කාරුණිකං ලොකෙ වන්දිතුමාගතා'ති.

**සාරිපුත්තත්ථෙරස්ස මාතුපෙතවත්ථු දුතියං.**

## 2. 3

134. නග්ගා දුබ්බණ්ණරූපාසි කිසා ධමනිසන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ කා නු ත්වං ඉධ තිට්ඨසි?.

135. අහං මත්තා තුවං තිස්සා සපත්තී තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතාති.

136. කිං නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතා?.

137. චණ්ඩී ච ඵරුසා චාසිං ඉස්සුකී මච්ඡරී සඨා,[1]
තාහං දුරුත්තං වත්වාන පෙතලොකමිතො ගතා.

1. සඨී – සිමු ii.

128. මහත් අනුභාව ඇති දෙව්දුව, තීගෙන් විචාරමි. මිනිස් වූ (කල) තෝ කිනම් පිනක් කළහු ද? කවර පිනක හෙතුවෙන් මෙසේ දිලිසෙන අනුභාව ඇත්තී වෙහි ද? තීගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

129. මම මින් පෙර අනෙක් පස්වන ජාතියෙහි සැරියුත් තෙරුන්ගේ මව වීමි. ප්‍රෙතලොකයෙහි උපන් මම බඩසයින් පෙළුණී වෙමි.

130. වමනයෙන් හා කිවිසීමෙන් හටගත් මල ද, කෙළ – සොටු හා හා සෙම ද. දවන මළසිරුරුවල වුරුණුතෙල හා වැදූ ස්ත්‍රීන්ගේ ලෙයද

131. වණ ඇත්තවුන්ගේ, කැපූ නාස හා හිස් ඇත්තවුන්ගේ යම් ලෙයෙක් වී නම් එය ද, ස්ත්‍රී පුරුෂ ශරීර ආශ්‍රිත දෙය ද, සාගින්නෙන් මඩනා ලද මම අනුභව කරමි.

132. සිවුපාවුන්ගේ ද, මිනිසුන්ගේ ද පූයා හා ලේ අනුභව කරන්නී පිළිසරණක් නැති වැ වාසස්ථානයක් නැති වැ සොහොන් යහන ම පිහිට කොට වෙසෙමි.

133. සැරියුත් තෙරුන්ගේ දනය නිසා සතුටු වෙමි. ස්වාමීනි කෙලෙසිනුත් බිය නැති මම ලොකයෙහි කාරුණික වූ ඔබ වැඳීමට මෙහි පැමිණියා වෙමි.

**ශාරීපුත්‍රස්ථවිරමාතෘප්‍රෙත වස්තු යි.**

## 2. 3

(ප්‍රෙතිය දුටු තිස්සාවෝ විචාරති:)

134. තෝ නග්නය යැ, විවර්ණ රූ ඇත්තිය, කෘශ ය, නහර ඉල්පුණු සිරුරු ඇත්තී ය. ඉල්පුණු ඉළ ඇටින් හා සිහින් සිරුරින් යුතු වැ මෙහි සිටින තෝ කවර යැ?

(ප්‍රෙතිය පිළිවදන් දෙයි:)

135. මම මත්තා ය, ඔබ තිස්සා යැ, පෙර මම ඔබ හා එක ම හිමියකු ඇති ව (සපත්නී ව) සිටියමු. පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියමු.

(තිස්සාවෝ පුළුවුස්නී:)

136. කා විසි මුනි තිදෙරින් තී කළ පව කුමක් ද? කිනම් පවක විපාකයෙන් මෙලොවින් ප්‍රෙතලොකයට ගියවු ද?

(ප්‍රෙතිය:)

137. මම ක්‍රොධ කරන, පරුෂ බස් තෙපලන, ඊර්ෂ්‍යා කරන, මසුරු සිත් ඇති, කෛරාටික ගති ඇත්තියක් වූමු. මම ඒ නපුරු වචන කථා-කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියමු.

138. සබ්බං[1] අහම්පි ජානාමි යථා ත්වං චණ්ඩිකා අහු,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි කෙනාසි පංසුකුණ්ඨිතා[2].

139. සීසං නහාතා ත්වං ආසි සුචිවත්ථා අලඞ්කතා,
අහඤ්ච ඛො තං අධිමත්තං සමලඞ්කතතරා තයා.

140. තස්සා මෙ පෙක්ඛමානාය සාමිකෙන සමන්තයි,
තතො මෙ ඉස්සා විපුලා කොධො මෙ සමජායථ.

141. තතො පංසුං ගහෙත්වාන පංසුනා තං හි ඔකිරිං,
තස්ස කම්මවිපාකෙන තෙනම්හි පංසුකුණ්ඨිතා.

142. සබ්බං අහම්පි ජානාමි පංසුනා මං ත්වමොකිරි,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි කෙන ඛජ්ජසි කච්ඡුයා.

143. භෙසජ්ජහාරි උභයො වනන්තං අගම්හසෙ,
ත්වඤ්ච භෙසජ්ජමාහරි අහඤ්ච කපිකච්ඡුනො.

144. තස්සා ත්‍යාජානමානාය සෙය්‍යං ත්‍යාහං සමොකිරිං,
තස්ස කම්මවිපාකෙන තෙන ඛජ්ජාමි කච්ඡුයා.

145. සබ්බං අහම්පි ජානාමි සෙය්‍යං මෙ ත්වං සමොකිරි,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි කෙනාසි නග්ගියා තුවං.

146. සහායානං සමයො ආසි ඤාතීනං සමිතී අහු,
ත්වඤ්ච ආමන්තිතා ආසි සසාමිනී නො ච ඛො අහං.

147. තස්සා ත්‍යාජානමානාය දුස්සන්ත්‍යාහං අපානුදිං,
තස්ස කම්මවිපාකෙන තෙනම්හි නග්ගියා අහං.

1. සච්චං – මජසං.
2. කුටයීතා – සිමු i.

(තිස්සාවෝ:)

138. යම්සේ තෝ කිපෙන්නියක් වූ ද, ඒ සියල්ල මමත් දනිමි. තීගෙන් අන් කරුණක් විචාරමි. කවර පව්කමෙකින් පසින් ගැවසුණු සිරුරු ඇති වූ ද?

(ප්‍රෙතිය:)

139. තෝ හිස් සෝද නා පිරිසිදු වස්ත්‍ර හැඳ සැරසුණි යැ. මම ද තිට වඩා ඉතා වැඩියෙන් සැරසුණුමු.

140. ඒ මා බලා සිටිය දී ම තෝ ස්වාමියා සමඟ කථා කළහු යැ. ඒ හෙතුයෙන් මාගේ ඊෂ්‍ර්‍යාව මහත් විය. මට ක්‍රොධ උපන.

141. එහෙයින් මම පස් ගෙන එයින් තිට දමාගැසූමු. ඒ පව්කම්හි විපාකය නිසා පසින් ගැවසුණු සිරුරු ඇති වූමු.

(තිස්සාවෝ:)

142. තෝ මට පසින් දමාගැසූ යැ. ඒ සියල්ල මම ද දනිමි. මම අනිකක් ද තීගෙන් විචාරමි. කුමක් නිසා කැසීම් රොගයකින් පෙළෙවු ද?

(ප්‍රෙතිය:)

143. අපි දෙදෙන ම බෙහෙත් ගෙනෙන්නමෝ වනයට ගියම්හ. තෝ බෙහෙත් ගෙන ආවහු යැ. මම වනාහි කසඹිලියා ගෙඩි ගෙන ආමු.

144. ඒ තී නො දන්නා කල මැ තිගේ ඇඳෙහි මම කසඹිලියා ගෙඩි විසුරුවා හළමු. ඒ පව්කම්හි විපාකයෙන් කැසීම් රොගයෙන් පීඩිත වූමු.

(තිස්සාවෝ:)

145. තෝ මගේ ඇඳෙහි එය විසුළහු නම් ඒ සියල්ල මම දනිමි. අනික් කරුණක් ද තීගෙන් විචාරමි. කවර කරුණෙකින් තෝ නග්න වූවහු ද?

(ප්‍රෙතිය:)

146. (එකල) මිත්‍රයන්ගේ සමාගමයෙක් විය. නෑයන්ගේ රැස්වීමෙක් විය. සැමියා සහිත වූ තෝ ද කැඳවන ලදහු යැ. මම වනාහි නො කැඳවන ලදුමු.

147. ඒ තී නො දන්නා කල ම (නො දැනුවත්ව ම) තිගේ වස්ත්‍රයක් මම සොරා ගතුමු. ඒ අකුශල කර්‍ම විපාකයෙන් මම නග්න වූමු.

148. සබ්බං[1] අහම්පි ජානාමි දුස්සං මෙ ත්වං අපානුදි,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි කෙනාසි ගූථගන්ධිනී.

149. තව ගන්ධඤ්ච මාලඤ්ච පච්චග්ඝඤ්ච විලෙපනං.
ගූථකූපෙ අතාරෙසිං තං පාපං පකතං මයා;
තස්ස කම්මවිපාකෙන තෙනම්හි ගූථගන්ධිනී.

150. සබ්බං අහම්පි ජානාමි තං පාපං පකතං තයා,
අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි කෙනාසි දුග්ගතා තුවං.

151. උභින්නං සමකං ආසි යං ගෙහෙ විජ්ජතෙ ධනං,
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකාසිමත්තනො,
තස්ස කම්මවිපාකෙන තෙනම්හි දුග්ගතා අහං.

152. තදෙව මං ත්වං අවච පාපකම්මං නිසෙවසි
න හි පාපෙහි කම්මෙහි සුලභා හොති සුග්ගති.

153. වාමතො ත්වං මං පච්චෙසි අථොපි මං උසූයසි
පස්ස පාපානං කම්මානං විපාකො හොති යාදිසො.

154. තෙ ඝරදාසියො ආසුං තානෙවාභරණානි මෙ,
තෙ චඤ්ඤෙ පරිවාරෙන්ති න භොගා හොන්ති සස්සතා.

155. ඉදානි භූතස්ස පිතා ආපණා ගෙහමෙහිති,
අප්පෙව තෙ දදෙ කිඤ්චි මා සු තාව ඉතො අගා.

156. නග්ගා දුබ්බණ්ණරූපාසි කිසා ධමනිසන්ථතා,
කොපීනමෙතං ඉත්ථීනං මා මං භූතපිතාද්දස,

157. හන්ද කිං තාහං දම්මි කිං වා ච තෙ කරොම්‍යහං,
යෙන ත්වං සුඛිතා අස්ස සබ්බකාමසමිද්ධිනී.

1. සච්චං - මජ්ස.

(තිස්සාවෝ:)

148. තෝ මාගේ වස්ත්‍රයක් සොරාගතු නම් ඒ සියල්ල මම ද දනිමි. අනිකක් ද තිගෙන් විචාරමි. කුමක් හෙයින් (තෝ) අසූචි ගඳ ඇතියහු ද?

(ප්‍රෙතිය:)

149. තිගේ සුවඳවර්ග ද, මල්මාලාවක් ද, මාහැඟි විලෙවුන් ද අසූචිවළෙක දැමූමු. මා විසින් ඒ පව කරන ලද. ඒ පවුකම්හි විපාකයෙන් අසූචි ගඳැති සිරුරු ඇති වෙමි.

(තිස්සාවෝ:)

150. තී විසින් කරන ලද ඒ සියලු පාපය මම ද දනිමි. අනිකක් ද තිගෙන් අසමි. කුමන කර්මයෙකින් තෝ දුගී වූහු ද?

(ප්‍රෙතිය:)

151. ගෙහි යම් ධනයක් වේ ද, එය අප දෙදෙනාට සමාන විය. මෙසේ දනවස්තු ඇති කල්හිත්, තමහට පිහිට වූ පිනක් නො කළමු. ඒ කර්මවිපාකයෙන් මම දුගී වූමු.

152. ඒ කාලයෙහි ම තෝ මට මෙසේ කීහු. තෝ පව්කම් ම කරහි. පව්කමින් සුගතිය සුලභ නො වේ ම ය.

(තිස්සා:)

153. තෝ මා විරුද්ධකාරියක වශයෙන් සැලැකුහු. වැලිත් තෝ මට ඊර්ෂ්‍යා කළහු. පව්කම්වල යම්බඳු විපාකයක් වේ නම් එය බලව.

154. තිගේ ගෙයි දසියෝ ද ඒ ආභරණයෝ ද වූහ. (තී විසින් පෙර පරිභොග කරන ලද) ඔවුන් (දැන්) අන්‍යයෝ පරිභොග කෙරෙත්. සම්පත් වූකලි ශාශ්වත නො ම වෙත්.

155. දැන් භූත නම් වූ මපුතුගේ පියා (මා සැමියා) සල්පිළින් ගෙදර එයි. තිට කිසිවක් දෙන්නේ නම් මැනැවි. ඒ තාක් මෙතැනින් නො යව.

(ප්‍රෙතිය:)

156. මම නග්න වූ, දුර්වර්ණ වූ කෘශ වූ ඉල්පුණු නහර ඇති වෙමි. මෙය ස්ත්‍රීනට ලජ්ජාවට කරුණෙකි. භූතගේ පියා මා නො දකීවා.

(තිස්සා:)

157. එසේ වී නම් යමෙකින් තෝ සියලු කම්සැපතින් සමෘද්ධ වැ සුවපත් වෙහි ද එබඳු කුමක් මම තිට දෙම් ද? මම තිට කිනම් උපකාරයක් කරම් ද?

158. චත්තාරො භික්ඛූ සඞ්ඝතො චත්තාරො පුන පුග්ගලා.
අට්ඨ භික්ඛූ භොජයිත්වා මම දක්ඛිණමාදිස,
තදහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී.

159. සාධූති සා පටිස්සුත්වා භොජයිත්වාට්ඨ භික්ඛවො,
වත්ථෙහච්ඡාදයිත්වාන තස්සා දක්ඛිණමාදිසි.

160. සමනන්තරානුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,
භොජනච්ඡාදනපානීයං දක්ඛිණාය ඉදං ඵලං

161. තතො සුද්ධා සුචිවසනා කාසිකුත්තමධාරිණී,
විචිත්තවත්ථාභරණා සපත්තිං උපසඞ්කමි.

162. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

163. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

164. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී?ති.

165. අහං මත්තා තුවං තිස්සා සපත්ති තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

166. තව දින්නෙන දානෙන මොදාමි අකුතො භයා,
චිරං ජීවාහි භගිනි සහ සබ්බෙහි ඤාතිභි.

167. අසොකං විරජං ඨානං ආවාසං වසවත්තිනං,
ඉධ ධම්මං චරිත්වාන දානං දත්වාන සොභනෙ.
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං,
අනින්දිතා සග්ගමුපෙහි ඨානන්ති.

මත්තාපෙතවත්ථු තතියං.

(ප්‍රෙතිය:)

158. භික්ෂු සඞ්ඝයා කෙරෙන් සඞ්ඝ වශයෙන් සිවුනමක් ද නැවත පුද්ගල වශයෙන් භික්ෂුහු සතරනමක් දැ යි මෙසේ භික්ෂූන් අටනමක් වළඳවා මට පින් දෙව. එකල මම සියලු කැමති සැපතින් සමෘද්ධ වැ සුවපත් වෙමි.

159. ඕ (තිස්සා) තොමෝ යහපතැයි පිළිවදන් දී භික්ෂූන් අට නමක් වළඳවා වස්ත්‍රවලින් හඳවා (පූජාකොට) ඇට පින් දුන.

160. පින්පෙත් දීමෙන් අනතුරු ව ම (එහි) විපාකය උපන. දිව බොජුන් පිළී සහ පැන් ද උපන. මේ දක්ෂිණාවේ (පින්දීමේ) ඵලයි.

161. ඉක්බිති ඕ විසිතුරු සුදු පිළී ඇති ව උතුම් කසී සළු දරමින් විචිත්‍ර වස්ත්‍රාභරණ ඇත්තී සපත්නිය වූ තිස්සාවන් වෙත එළැඹුණු.

(තිස්සා:)

162. දෙව්දුව, යම්බඳු තෙපි ඉතා මනහර ශරීරවර්ණයෙන් දවහත් තරුව මෙන් සියලු දසදිගුන් බබුළුවමින් සිටිහි.

163. කවර හෙතුවකින් තොපගේ එවැනි ශරීරවර්ණයෙක් වී ද? කිනම් හෙතුවකින් මෙහි තොපගේ සුචරිතඵල සමෘද්ධිය වී ද? මනවඩන යම්කිසි භොග කෙනෙක් තොපට උපදිත් නම් ඒ කුමන හෙතුවකින් ද?

164. මහත් අනුභාව ඇති දෙව්දුව, තොප විචාරමි. මිනිස් වූ (කල) තෙපි කිනම් පිනක් කළහු ද? කවර පිනක හෙතුවෙන් මෙසේ දිලියෙන අනුභාව ඇතියවු ද? තොපගේ සිරුරුපැහැය ද සියලු දිගුන් බබුළුවා දැයි.

(දෙව්දුව:)

165. මම මත්තා නමු. තෙපි තිස්සා නම් වූවහු. පෙර මම තොපගේ සපත්නී වූමු. පව්කම් කොට මෙලොවින් ප්‍රෙත ලොකයට ගියා වෙමි.

166. තොප දුන් දනයෙන් කිසිවකිනුත් බිය නැති වැ සතුටු වෙමි. නැගණියනි, සියලු නෑයන් සමග බොහෝ කලක් ජීවත්වෙව.

167. ශොභන තැනැත්තියෙනි, මුල් සහිත මසුරු මල දුරුකොට මෙලොව දී ධර්මයෙහි හැසිර දන් දී ශොක රහිත රජස් නැති දිව්‍යස්ථානය වූ තමා වසයෙහි පවත්නවුනට නිවාස වූ දෙව්ලොවට අගර්හිත වූවා පැමිණෙව.

**තුන්වැනි මත්තා ප්‍රෙත වස්තුව යි.**

## 2. 4

168. කාළී දුබ්බණ්ණරූපාසි ඵරුසා භීරුදස්සනා,
පිඞ්ගලාසි කළාරාසි න තං මඤ්ඤාමි මානුසින්ති.

169. අහං නන්දා නන්දසෙන[1] භරියා තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතාති.

170. කිං නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතා.

171. චණ්ඩී ඵරුසවාචා ච තයි චාසිං අගාරවා,[2]
තාහං දුරුත්තං වත්වාන පෙතලොකමිතො ගතා.

172. හන්දුත්තරියං දදමි තෙ ඉමං දුස්සං නිවාසය,
ඉමං දුස්සං නිවාසෙත්වා එහි නෙස්සාමි තං ඝරං.

173. වත්ථඤ්ච අන්නපානඤ්ච ලච්ඡසි ත්වං ඝරං ගතා,
පුත්තෙ ච තෙ පස්සිස්සසි සුණිසායො ච දක්ඛසි.

174. හත්ථෙන හත්ථෙ තෙ දින්නං න මය්හං උපකප්පති,
භික්ඛූ ච සීලසම්පන්නෙ වීතරාගෙ බහුස්සුතෙ.

175. තප්පෙහි අන්නපානෙන මම දක්ඛිණමාදිස,
තදහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී.

176. සාධූති සො පටිස්සුත්වා දානං විපුලමාකිරි,
අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච.

177. ඡත්තං ගන්ධඤ්ච මාලඤ්ච විවිධා ච උපාගතා,
භික්ඛූ ච සීලසම්පන්නෙ වීතරාගෙ බහුස්සුතෙ;
තප්පෙත්වා අන්නපානෙන තස්සා දක්ඛිණමාදිසි.

178. සමනන්තරානුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,
භොජනච්ඡාදනපානීයං දක්ඛිණාය ඉදං ඵලං.

179. තතො සුද්ධා සුචිවසනා කාසිකුත්තමධාරිනී,
විචිත්තවත්ථාභරණා සාමිකං උපසඞ්කමි.

---

1. නන්දිසෙන – මජසං.
2. චණ්ඩී ච ඵරුසා චාසිං තයි චාපි අගාරවා – මජසං.

## 2. 4

(නන්දසේන උපාසක මෙසේ විචාරයි:)

168. කළු වූ දුර්වර්ණ සිරුරු පැහැති කැකුළු සිරුරැති (තෙපි) බියකරු පෙනිම් ඇතියාව, පිඟුවන් ඇස් ඇතියාව, කළුදත් ඇතියාව, තොප මනුෂ්‍ය ස්ත්‍රියකැ යි නො හඟිමි.

(ප්‍රෙතිය:)

169. නන්දසේන, මම පෙර ඔබගේ නන්ද නමැති බිරිඳ වීමි. පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියා වෙමි.

(නන්දසේන:)

170. කා විසි මුනි තිදෙරින් කිනම් පවක් තොප කරන ලද ද? කිනම් කර්‍මයක විපාකයෙන් තෙපි මෙලොවින් ප්‍රෙතලොකයට ගියහු ද?

(ප්‍රෙතිය:)

171. මම චණ්ඩ වැ පරුෂවචන ඇති වූමු. ඔබ කෙරෙහි ද ගරු සරු නො වූමු. ඒ මම නපුරු බස් බැණ මෙලොවින් ප්‍රෙනලොකයට ගියා වෙමි.

(නන්දසේන:)

172 එසේ නම් තොපට උතුරුසළුව දෙමි. මේ සළුව හැඳ ගනුව. මෙය හැඳ ගෙන එව. මම තොප ගෙදරට පමුණුවමි.

173. ගෙට ගිය තෙපි වස්ත්‍ර ද ආහාරපාන ද ලබන්නාව. තෙපි තිගේ පුත්‍රයන් ද බලන්නාව. යෙහෙළණියන් ද දක්නාව.

(ප්‍රෙතිය:)

174–175. යුෂ්මත්හුගේ අතින් මා අතට දෙන ලද්ද මට නො පැමිණෙයි. සිල්වත් වූ වීතරාග වූ බහුශ්‍රැත වූ භික්ෂූන් ආහාරපානයෙන් තර්පණය කරව. (එහි) පින මට දෙව. එකල මම සියලු කම්සැපතින් සමෘද්ධ වූවා සුවපත් වෙමි.

176–177. හේ මැනැවැයි පිළිතුරු දී මහාදනයක් පැවැත් වී. ආහාර ද පානවර්ග ද කෑ යුතු දෑ ද වස්ත්‍රසෙනාසන ද ඡත්‍ර ද සුවඳ ද මල් ද විවිධ උපාහන ද පුද සිල්වත් වීතරාග බහුශ්‍රැත භික්ෂූන් ආහාරපානයෙන් සතප්වා (එහි) පින ඇට දුන්නේ ය.

178. පින් දීමට අනතුරුව (එහි) විපාකය ඇයට පහළ විය. භොජන ද වස්ත්‍ර හා පියයුතු දෑ ද (උපන) දක්ෂිණායෙහි මේ ඵලයි.

179. ඉක්බිති ඕ විසිතුරු සුදුපිළී ඇති වැ උතුම් කසීසළු දරමින් විචිත්‍ර වස්ත්‍රාභරණ ඇත්තී හිමියා වෙත එළැඹියා ය.

180. අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

181. කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධමිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

182. පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

183. අහං නන්ද නන්දසෙන[1] භරියා තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

184. තව දින්නෙන දනෙන මොදමි අකුතො භයා,
චිරං ජීවාහි[2] ගහපති සහ සබ්බෙහි ඤාතිභි.

185. අසොකං විරජං ඨානං ආවාසං වසවත්තිනං,
ඉධ ධම්මං චරිත්වාන දනං දත්වාන ගහපති.
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං,
අනින්දිතො සග්ගමුපෙහි ඨාන'න්ති

නන්දපෙතවත්ථු චතුත්ථං.

## 2. 5

186. අලඞ්කතො මට්ඨකුණ්ඩලී
මාලාධාරී[3] හරිචන්දනුස්සදො,
බාහා පග්ගය්හ කන්දසි
වනමජ්ඣෙ කිං දුක්ඛිතො තුවන්ති?

187. සොවණ්ණමයො පභස්සරො
උප්පන්නො රථපඤ්ජරො මම,
තස්ස චක්කයුගං න වින්දමි
තෙන දුක්ඛෙන ජහිස්සං[4] ජීවිතන්ති.

188. සොවණ්ණමයං මණිමයං
ලොහිතඞ්කමයං අථ රූපියාමයං,
ආචික්ඛ මෙ භද්දමාණව
චක්කයුගං පටිලාභයාමි තෙති.

1. නන්දිසෙන – මජසං.
2. ජීව – සීමු, මජසං.
3. මාලාභාරී – මජසං.
4. ජහාමි – ධ. අ, මජසං.

(නන්දසේන:)

180. දෙව්දුව, යම්බඳු තෙපි ඉතා මනහර ශරීරවර්ණයෙන් දවහත් තරුව මෙන් සියලු දසදිගුන් බබුළුවමින් සිටුහු.

181. කුමකින් තොපගේ මෙවැනි සිරුරුපැහැයෙක් වී ද? කුමකින් තොපගේ මෙහි සමෘද්ධියක් වී ද? මනවඩන යම්කිසි භොග කෙනෙක් වෙත් නම් ඒ භොගයෝ තොපට උපදිත්.

182. මහත් අනුභාව ඇති දෙව්දුව, තොප විචාරමි. මිනිස්වූ (කල) තෙපි කිනම් පිනක් කළවු ද? කවර පිනක හෙතුවෙන් මෙසේ දිලියෙන අනුභාව ඇතියවු ද? තොපගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි.

(දෙව් දූ:)

183. නන්දසේන මම නන්ද වෙමි. පෙර ජාතියෙහි භවත්හුගේ බිරිඳ වූමු. පව්කම් කොට මෙලොවින් ප්‍රෙත ලොකයට ගියමු.

184. භවත්හු විසින් දෙන ලද දනයෙන් කිසිවකිනුත් බිය නැති ව සතුටු වෙමි. ගෘහපතිය, (භවත්) සියලු නෑයන් සමග දිගු කලක් ජීවත් වව.

185. ගෘහපතියෙනි, ලොබ දෙස මුල් සහිත මසුරුමල දුරු කොට මෙලොව දී දහම්හි හැසිර දන් දී ශොක රහිත රජස් නැති දිව්‍යස්ථානය වූ සියවසයෙහි පවත්වනුවනට නිවාස වූ දෙව්ලොවට අගර්හිත වූයේ පැමිණෙව.

නන්ද ප්‍රෙතවස්තුව යි.

## 2. 5

(අදින්නපුබ්බක:)

186. අබරණින් සැරසුණු මට වූ කොඩොල් ඇති මල්දම් දරන රත්සඳුනෙන් අලෙවූ දුන් සිරුරැති තෙපි දෙඅත් හිස බැඳගෙන හඬවු මෙ වනමැද කුමක් හෙයින් තෝ දුඃඛිත වවූ ද?

(මට්ටකුණ්ඩලී:)

187. රන්මුවා පැහැසර රියමැදිරියක් මට උපන. ඒ රියමැදිරියට සක්යුවළක් නො ලබමි. ඒ දුකින් මම දිවි හරනෙමි.

(අදින්නපුබ්බක:)

188. සොඳුරු තරුණය, මට කියව, මම තට රන්මුවා වූ හෝ මිණිමුවා වූ හෝ ලොහිතඩකාමාණිකාමය වූ හෝ වැළිත් රිදීමුවා වූ හෝ සක්යුවළක් ලබා දෙමි.

189. සො මාණවො තස්ස පාවදි
චන්දසුරියා උභයෙත්ථ දිස්සරෙ,
සොවණ්ණමයො රථො මම
තෙන චක්කයුගෙන සොභතීති.

190. බාලො ඛො ත්වමසි මාණව
යො ත්වං පත්ථයසෙ අපත්ථියං,
මඤ්ඤාමි තුවං මරිස්සසි
න හි ත්වං ලච්ඡසි චන්දසුරියෙති.

191. ගමනාගමනම්පි දිස්සති
වණ්ණධාතු උභයෙත්ථ වීථියො,
පෙතො පන කාලකතො න දිස්සති
කොනිධ කන්දතං බාල්‍යතරොති.

192. සච්චං ඛො වදෙසි මාණව
අහමෙව කන්දතං බාල්‍යතරො
චන්දං විය දරකො රුදං
පෙතං කාලකතාභිපත්ථයං.

193. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

194. අබ්බහී වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

195. ස්වාහං අබ්බූළ්හසල්ලොස්මි සීතිභූතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදාමි තව සුත්වාන මාණව.

196. දෙවතානුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.

197. යඤ්ච කන්දසි යඤ්ච රොදසි
පුත්තං ආළාහනෙ සයං දහිත්වා,
ස්වාහං කුසලං කරිත්වා කම්මං
තිදසානං සහබ්‍යතං පත්තො.

198. අප්පං වා බහුං වා නාද්දසාම[1]
දානං දදන්තස්ස සකෙ අගාරෙ,
උපොසථකම්මං වා තාදිසං
කෙන කම්මෙන ගතොසි දෙවලොකන්ති.

---
1 නාද්දසං – ධ.

189. ඒ තරුණයා ඔහුට මෙසේ කී: මේ අහස්හි සඳහිරු දෙදෙන පෙනෙති. මගේ රන්මුවා රිය ඒ සක්යුවළින් හොබනේ වෙයි.

(අදින්න පුබ්බක:)

190. තරුණය, යම්බඳු තෙපි නො පැතිය යුත්තක් පතනහු ද, ඒ තෝ බාලයෙක් ම වවූ තොප මැරෙති යි සිතමි. තෙපි සඳහිරු දෙදෙන නො ම ලබනහු.

(මට්ටකුණ්ඩලී:)

191. (බමුණ, මේ සඳහිරු දෙදෙනාගේ) ගමනාගමනය ද පැහැ සටහන් හා ගමනවීථි දෙක ද පෙනේ. කලුරිය කළ පරලොව ගිය තැනැත්තේ වූ කලි නො පෙනේ. මෙ තැන හඬන අප දෙදෙනා අතුරෙන් කවරෙක් බාලතර වේ ද?

(අදින්න පුබ්බක:)

192. තරුණය, තෙපි සැබවක් ම කියවූ සඳට අඬන දරුවකු මෙන් මියැ පරලොව ගියහු පතමින් අඬන මම මැ, හඬන අප දෙදෙනා අතුරෙන් වඩා බාල බැව් ඇත්තෙමි.

193. ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් මා හද ඇවිල ගත් සියලු සෝ ගින්න තෙපි දිය ඉසින්නකු මෙන් නිවූවහු ය.

194. යමෙක් සොවින් මැඩුණු මාගේ පුත්‍ර ශොකය දුරු කෙළේ ද, ඒ තෙපි මා හද ඇසුරු කළ සෝ හුල උදුළහු.

195. ඒ මම උදුළ සෝහුල් ඇතියෙමි, සිහිල් වූයෙමි, නිවුණෙමි වෙමි. තරුණය, තොප බස් අසා මම ශොක නො කරමි, නො හඬමි.

196. තෙපි දෙවියෙක් වහු ද, ගඳඹෙක් වහු ද? නැතහොත් පුරින්දද නම් වූ සක්දෙව් වහු ද? තෙපි කවරහු ද? කාගේ හෝ පුතෙක් වහු ද?

(මට්ටකුණ්ඩලී:)

197. තෙපි පුතු සොහොනෙහි දවා යම් පුතකු ඇරබ තෙමේ ම සොවිහුද, යමකු ඇරබ හඬවු ද, ඒ මම කුසල කර්මයක් කොට දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමි.

(අදින්නපුබ්බක:)

198. සිය ගෙහි දී (දන්) දෙන (තොපගේ) ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ දනක් හෝ එබඳු පොහෝකමක් හෝ මම නො දිටිමි. කවර කර්මයෙකින් තෙපි දෙව්ලොව ගියහු ද?

199. ආබාධිකොහං දුක්ඛිතො බාළහගිලානො[1]
ආතුරරූපොම්හි සකෙ නිවෙසනෙ,
බුද්ධං විගතරජං විතිණ්ණකඞ්ඛං
අද්දක්ඛිං සුගතං අනොමපඤ්ඤං.

200. ස්වාහං මුදිතමනො පසන්නචිත්තො
අඤ්ජලිං අකරිං තථාගතස්ස,
තාහං කුසලං කරිත්වා කම්මං
තිදසානං සහව්‍යතං පත්තො.

201. අච්ඡරියං වත අබ්භුතං
අඤ්ජලිකම්මස්ස අයමීදිසො විපාකො,
අහම්පි මුදිතමනො පසන්නචිත්තො
අජ්ජෙව බුද්ධං සරණං වජාමි.

202. අජ්ජෙව බුද්ධං සරණං වජාහි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො,
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩඵුල්ලානි සමාදියස්සු.

203. පාණාතිපාතා විරමස්සු ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු,
අමජ්ජපො මා ච මුසා භණාහි
සකෙන දාරෙන ච හොහි තුට්ඨො.

204. අත්ථකාමොසි මෙ යක්ඛ හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං ත්වංසි ආචරියො මම.

205. උපෙමි සරණං බුද්ධං ධම්මඤ්චාපි අනුත්තරං,
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං.

206. පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දාරෙන ච හොමි තුට්ඨොති.

මට්ඨකුණ්ඩලීපෙතවත්ථු පඤ්චමං.

## 2. 6

207. උට්ඨෙහි කණ්හ කිං සෙසි කො අත්ථො සුපනෙන තෙ,
යො ච තුය්හං සකො භාතා හදයං චක්ඛු ච දක්ඛිණං,
තස්ස වාතා බලීයන්ති සසං ජප්පති කෙසව,

1. ගිලානො - මජසං.

(මට්ටකුණ්ඩලී:)

199. (බමුණ:) මම සිය නිවෙස්හි පෙළීම් ඇතියෙම් දුක්ඛිත වූයෙම් දැඩිගිලන් ඇතියෙම් ආතුර ස්වභාව ඇතියෙම් වීමි. ඒ මම පහවූ රාගාදි රජස් ඇති දුරු කළ සැක ඇති, සොභන ගමන් ඇති, අලාමක නුවණ ඇත් බුදුන් දුටුයෙමි.

200. ඒ මම සතුටුසිත් ඇතියෙම් පහන් සිත් ඇතියෙම් තථාගතයන් වහන්සේට ඇඳිලි බැඳ වැන්දෙමි. මම ඒ පින්කම කොට දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමි.

(අදින්නපුබ්බක:)

201. ආශ්චර්‍ය්‍යයෙකි, පුදුමයෙකි, එකැතියෙන් ම අඤ්ජලිකර්මයේ මෙ බඳු විපාකයෙකැ. මමත් ප්‍රමුදිත සිතැති ව ප්‍රසන්න සිතැති ව අද ම බුදුන් සරණ යෙමි.

(මට්ටකුණ්ඩලී:)

202. පහන් සිතැති ව අද ම බුදුන් ද ධර්මය ද සඞ්ඝයා ද සරණ යව. එසේ ම ශික්ෂා පද පස ද නො කඩකොට සපුරා සමාදන් වෙව.

203. වහා පණිවායෙන් වෙන් වෙව. ලොවැ නුදුන්දෙය (ගැන්ම) දුරු කරව. මත්පැන් නො බොව, බොරු නො කියව, සිය අඹුවගෙන් ම තුටු වෙව.

(අදින්නපුබ්බක)

204. යක්ෂය, තෙපි මට වැඩ කැමැත්තහු, දෙවිය, තෙපි මට හිත කැමැතියහු. මම තාගේ වචනය පිළිපදිමි. තෙපි මාගේ ඇදුරු වවු.

205. මම අනුත්තර වූ බුදුන් ද ධර්මය ද සරණයෙමි. මම නර දෙව්හුගේ සඞ්ඝයා ද සරණ යෙමි.

206. පණිවායෙන් වහා වෙන් වෙමි. ලොවැ නුදුන්දය (ගැනීම) දුරු කරමි. මද්‍යපයෙක් නො වෙමි. බොරු ද නො කියමි. සිය බිරියගෙන් ම තුටු වෙමි.

**මට්ටකුණ්ඩලී ප්‍රෙතවස්තුව යි.**

## 2. 6

(ඇමති:)

207. කෘෂ්ණ රජතුමනි, නැගිටින්න. කුමක් හෙයින් නිදවූ ද? තොපගේ නිදීමෙහි කවර අර්ත්ථයෙක් ද? තොපගේ හෘදය (වැනි) වූ ද, දකුණැස (වැනි) වූ ද සිය සොහොවුරු වූ යම් සතපණ්ඩිතයෙක් වී ද ඔහුගේ (උමතු) වාතයෝ බලවත් වූහ. කෙසව රජතුමනි, තොප සොහොවුරු ''සාවකු දෙව''යි තන්දෙඩයි.

208. තස්ස තං වචනං සුත්වා රොහිණෙය්‍යස්ස කෙසවො
තරමානරූපො උට්ඨාසි භාතුසොකෙන අට්ටිතො.

209. කින්නු උම්මත්තරූපොව කෙවලං ද්වාරකං ඉමං,
සසො සසොති ලපසි කීදිසං සසමිච්ඡසි.

210. සොවණ්ණමයං මණිමයං ලොහමයං අථ රූපියාමයං,[1]
සඞ්ඛසිලාපවාළමයං කාරයිස්සාමි තෙ සසං.

211. සන්ති අඤ්ඤෙපි සසකා අරඤ්ඤෙ වනගොචරා,[2]
තෙපි තෙ ආනයිස්සාම කීදිසං සසමිච්ඡසි.

212. නාහමෙතෙ සසෙ ඉච්ඡෙ යෙ සසා පථවිනිස්සිතා[3]
චන්දතො සසමිච්ඡාමි තං මෙ ආහර කෙසව.

213. සො නූන මධුරං ඤාති ජීවිතං විජහිස්සසි,
අපත්ථියං පත්ථයසි චන්දතො සසමිච්ඡසි.

214. එවඤ්චෙ කණ්හ ජානාසි යථඤ්ඤමනුසාසසි,
කස්මා පුරෙ මතං පුත්තං අජ්ජාපි අනුසොචසි.

215. යෙ න ලබ්භා මනුස්සෙන අමනුස්සෙන වා පන,
ජාතො මෙ මා මරී පුත්තො කුතො ලබ්භා අලබ්භියං,

216. න මන්තා මූලභෙසජ්ජා ඔසධෙහි ධනෙන වා,
සක්කා ආනයිතුං කණ්හ යං පෙතමනුසොචසි.

217. මහද්ධනා මහාභොගා රට්ඨවන්තොපි ඛත්තියා;
පහූතධනධඤ්ඤා යෙ තෙපි නො අජරාමරා.

218. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාලපුක්කුසා,
එතෙ චඤ්ඤෙ ච ජාතියා තෙපි නො අජරාමරා.

219. යෙ මන්තං පරිවත්තෙන්ති ඡළඞ්ගං බ්‍රහ්මචින්තිතං
එතෙ චඤ්ඤෙ ච ජාතියා තෙපි නො අජරාමරා.

1. රූපියමයං – මජ්සං,
2. අරඤ්ඤවනගොචරා – මජ්සං.
3. පථවිස්සිතා – සීමු.

208. කෙසව රජ රොහිණෙයය ඇමතිගේ එබස් අසා සෝවුරු සොවින් පෙළුණේ වෙළෙවි සැහැවි ඇතියේ නැගිට්ටේය.

209. කිමෙක් ද? උමතු ගති ඇතියකු සේ මේ මුළු ද්වාරවතී නුවර (ඇවිදිමින්) "සාවෙක්", "සාවෙක්"යි කියමින් නන්දෙඩවූ. තෙපි කෙබඳු සාවකු කැමැත්තහු ද?

210. රන්මුවා වූ ද, මිණිමුවා වූ ද, ලෝමුවා වූද, යළි රිදීමුවා වූ ද, සක්–සිලා–පබළුමුවා වූ ද සාවකු තොපට කරවන්නෙමි.

211. වනය ගොදුරුකිම් කොට වෙසෙන වෙනත් සාවෝ ද වල්හි ඇත්තාහ. තොපට ඔවුනුදු ගෙනෙමි. තෙපි කෙබඳු සාවකු කැමැතියහු ද?

(ඝතපණ්ඩිත:)

212. කෙසව, පොළොව ඇසුරු කරන යම් සාවෝ වෙත් නම් මම ඒ සාවුන් නො කැමැත්තෙමි. සඳමඬලින් සාවා කැමැත්තෙමි. මට ඒ සාවා ගෙන දෙව.

(කෙසව:)

213. මලණුවෙනි, ඒ තෙපි සඳින් සාවකු කැමැත්තහු නම් එකාන්තයෙන් නො පැතියයුත්තක් පතහු තෙපි මිහිරි දිවිය හරනහු ය.

(ඝතපණ්ඩිත:)

214. කෘෂ්ණය, තෙපි යම්සේ අන්‍යයක්හට අනුසාසනය කරවු ද ඒ අනුශාසනය එසේ ම දනිවු නම් කුමක් නිසා පෙර මළ පුතු වෙනුවෙන් අදත් ශොක කරවු ද?

215. මිනිසකු විසින් හෝ දෙවියකු විසින් හෝ යමක් නො ලැබිය හැකි වේ නම්, මාගේ උපන් පුතා නො මැරේවා යන නො ලැබිය හැකි වූ එය කෙසේ ලැබිය හැකි ද?

216. කෘෂ්ණය, පරලොව ගිය යම් පුතකු අනුව ශොක කරවු නම් ඒ පුතු ගෙන ඊමට මන්ත්‍රයෙකින් හෝ මුල් බෙහෙදෙකින් හෝ නන් වැදැරුම් වූ ඔසුවලින් හෝ ධනයෙන් හෝ නො හැකි වේ.

217. මහත් ධන ඇති, මහත් සම්පත් ඇති, රට ඇති බොහෝ ධන ධාන්‍ය ඇති යම් රජවරු වෙත් නම් ඔහු ද අජරාමර නො වෙත්.

218. ක්ෂත්‍රියයෝ ය බ්‍රාහ්මණයෝ ය වෛශ්‍යයෝ ය ශුද්‍රයෝ ය සැඬොල් පුප්සඬුවෝ ය යන මොහු ද මෙයින් අන්‍යයෝ වෙත් නම් ඔහු ද තම ජාතිය නිමිත්තෙන් අජරාමර නො වෙත්.

219. යම කෙනෙක් බ්‍රහ්මයා විසින් (බමුණන්ට) කියන ලද සඅඟින් යුත් වෙදය පිරිවහත් ද වෙදඥානයෙන් යුත් මොහු ද අන්‍යයෝ ද යන සියල්ලෝ ම අජරාමර නො වෙත්.

220. ඉසයො වාපි යෙ සන්තා සඤ්ඤතත්තා තපස්සිනො,
සරීරං තෙපි කාලෙන විජහන්ති තපස්සිනො.

221. භාවිතත්තා අරහන්තො කතකිච්චා අනාසවා,
නික්ඛිපන්ති ඉමං දෙහං පුඤ්ඤපාපපරික්ඛයා.

222. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

223. අබ්බූළ්හං වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

224. ස්වාහං අබ්බූළ්හසල්ලොස්මි සීතිභූතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදමි තව සුත්වාන භාතික[1].

225. එවං කරොන්ති සප්පඤ්ඤා යෙ හොන්ති අනුකම්පකා,
විනිවත්තයන්ති සොකම්හා ඝතො ජෙට්ඨංව භාතරං,

226. යස්ස එතාදිසා හොන්ති අමච්චා පරිචාරකා,
සුභාසිතෙන අන්වෙන්ති ඝතො ජෙට්ඨංව භාතරන්ති.

කණ්හපෙතවත්ථු ඡට්ඨං.

## 2. 7

227. නග්ගො දුබ්බණ්ණරූපොසි කිසො ධමනිසන්ථතො,
උප්ඵාසුලිකො කිසිකො කො නු ත්වමසි මාරිස.

228. අහං භදන්තෙ පෙතොම්හි දුග්ගතො යමලොකිකො,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතො

229. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං
කිස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතො.

1. භාසිතං-සී.

220. කයවචන දෙකින් සන්සුන් වූ සංයතසිත් ඇති , තපොගුණ යුත් යම් මුනිවරයෝ වෙත් ද රාගාදි පව් තවන ඔහු ද සුදුසු කල්හි සිරුර හැර දමත්.

221. භාවිතසිත් ඇති කොට නිමවූ සිවුමග කිස ඇති ආස්‍රව රහිත මහරහත්හු පින්පව් ගෙවීමෙන් මේ සිරුර බහා තබති.

(කෙසව:)

222. ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් මා හද ඇවිලගත් සියලු සෝ ගින්න තෙපි දිය ඉසින්නකු මෙන් නිවූවහු ය.

223. සොවින් පෙළුණු මාගේ පුත්‍රශොකය යමෙක් දුරුකෙළේ ද ඒ තෙපි මා හද ඇසුරු කළ සෝ හුල උදුළහු ය.

224. ඒ මම උදුළ සෝහුල් ඇතියෙමි, සිහිල් වූයෙම් වෙමි, නිවුණෙම් වෙමි, සොහොවුර, තොපගේ වදන් අසා මම ශෝක නො කරමි, නො හඬමි.

225. සතපණ්ඩිත යම්සේ දෙටුබෑයා පුත්‍රශොකයෙන් මුදා ලූයේ ද, එසේ ම නැණවත් කුළුණැති යම් කෙනෙක් වෙත් නම් ඔහු ද මෙසේ කරත්.

226. සතපණ්ඩිත යම්සේ දෙටුබෑයා සුභාෂිතයෙන් ශොක රහිත බවට පැමිණවූයේ ද එසේ යමෙකුට මෙබඳු නැණවත් ඇමතියෝ ද සෙවකයෝ ද වෙත් නම් ඔහු ද මෙබඳු වෙත්.

**කෘෂ්ණ ප්‍රෙතවස්තුව යි.**

## 2. 7

(වෙළෙඳෝ ධනපාල ප්‍රෙතයා දැක මෙසේ විචාරති:)

227. නිදුකාණෙනි, තෙපි නග්නවූ ය. විවර්ණ රූ ඇතියහු ය, කෘශ ය, නහර ඉල්පුණු සිරුරු ඇතියහු ය. ඉල්පුණු ඉළ ඇති කෘශ වූ තෙපි කවරහු ද?

(ධනපාල ප්‍රෙතයා:)

228. පින්වත්නි, මම ප්‍රෙතලොකයෙහි උපන් දුකට පත් ප්‍රෙතයෙක්මි. පව්කම් කොට මෙලොවින් ප්‍රෙත ලොකයට ගියෙම් වෙමි.

(වෙළෙඳෝ:)

229. කාවිසිමුනි තිදෙරින් තොප කිනම් පවක් කරන ලද ද? කවර කර්මයක විපාකයෙන් (තෙපි) මෙලොවින් ප්‍රෙත ලොකයට ගියවු ද?

230. නගරං අත්ථි දසන්නානං එරකච්ඡන්තිවිස්සුතං,
තත්ථ සෙට්ඨී පුරෙ ආසිං ධනපාලොති මං විදූ.

231. අසීති සකටවාහානං හිරඤ්ඤස්ස අහොසි මෙ,
පහූතං මෙ ජාතරූපං මුත්තා වෙළුරියා බහූ.

232. තාව මහද්ධනස්සාපි න මෙ දතුං පියං අහු,
පිදහිත්වා ද්වාරං භුඤ්ජාමි මා මං යාචනකාද්දසුං.

233. අස්සද්ධො මච්ඡරී චාසිං කදරියො පරිභාසකො,
දදන්තානං කරොන්තානං වාරයිස්සං බහුජ්ජනං.

234. විපාකො නත්ථි දනස්ස සඤ්ඤමස්ස කුතො ඵලං,
පොක්ඛරඤ්ඤූදපානා ආරාමානි ච රොපිතෙ.

235. පපායො ච විනාසෙසිං දුග්ගෙ සඞ්කමනානි ච,
ස්වාහං අකතකල්‍යාණො කතපාපො තතො චුතො.

236. උපපන්නො පෙත්තිවිසයං ඛුප්පිපාසාසමප්පිතො,
පඤ්චපණ්ණාසවස්සානි යතො කාලකතො අහං.

237. නාභිජානාමි භුත්තං වා පීතං වා පන පානීයං,
යො සංයමො සො විනාසො යො විනාසො සො සංයමො.

238. පෙතා හි කිර ජානන්ති යො සංයමො සො විනාසො,
අහං පුරෙ සංයමිස්සං නාදසිං බහුකෙ ධනෙ.

239. සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකාසිමත්තනො,
සොහං පච්ඡානුතප්පාමි අත්තකම්මඵලූපගො.

240. උද්ධං චතූහි මාසෙහි කාලකිරියා භවිස්සති.
එකන්තං කටුකං ඝොරං නිරයං පපතිස්සහං.

241. චතුක්කණ්ණං චතුද්වාරං විභත්තං භාගසො මිතං,
අයොපාකාරපරියන්තං අයසා පටිකුජ්ජිතං.

242. තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා.
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

(ධනපාල:)

230. **දසන්න** රටවැසියන්ගේ **එරකච්ඡ** යි ප්‍රසිද්ධ නුවරෙක් ඇත. මම ඉකුත් අත්බැව්හි එහි සිටුවරයෙක් වීමි. මිනිස්සු මා "**ධනපාල** සිටු" යයි දත්හ.

231–232. මට අමුරන් පිරූ ගැල්බර අසූවක් විය. එසේ ම මට රන් ද විය. මුතු ද වෛරෑමිණි ද බොහෝ විය. එපමණ මහත් ධනය ඇත්තාවූ ද මට දන්දීමට කැමැත්තක් නො වීය. "යදියෝ මා නො දකිත්වා"යි දොර වසා ගෙන අහර බුදිමි.

233. මම සැදැහැ නැති, මසුරුගති ඇති, තද මසුරෙක් ද මෙරමාහට පරිභව කරන්නෙක් ද වීමි. දන් දෙන්නවුන්, පින්කරන්නවුන් බොහෝ දෙන එයින් වළකාලීමි.

234–235. දීමේ විපාකයෙක් නැත. සිල්රැකීමෙ ඵලයක් කොයින් වේ ද යි කීයෙමි. පැන් පොකුණු හා ළිං ද උයන්වතු ද පැන් හල් ද දුර්ගයන්හි කළ ඒ දඬු ද වනසාලීමි. ඒ මම නොකළ පින් ඇතියෙම් කළ පව් ඇතියෙම් එතැනින් චුත වූයෙමි.

236. ප්‍රේත ලොකයට පැමිණියෙම් සාපිපාසා දෙකින් මඩනා ලද්දේ වෙමි. යම් දිනක මම කලුරිය කෙළෙම් ද (එදින පටන්) පස් පනස් වසක් මුළුල්ලෙහි, කෑ අහරක් ගැන හෝ පූ පැනක් ගැන නො දනිමි.

237. අදන සංඛ්‍යාත යම් සංයමයක් වී ද, එය විනාශය යි. (ප්‍රේත යොනියෙහි ඉපදවීම් සංඛ්‍යාත) යම් විනාශයක් වී ද, එය (අදන යයි කියනු ලබන) සංයමය යි.

238. (දෙයධර්මාපරිත්‍යාග සංඛ්‍යාත) "යම් සංයමයෙක් වේ ද එය විනාශ ය"යි ප්‍රෙතයෝ ම දනිත්. මම පෙර ධනය ඇති කල්හිත් දීමෙන් වැළකී සිටියෙමි. දන් නො දිනිමි.

239. දනවස්තු ඇති කලැ ද තමහට පිහිටක් නො කෙළෙමි. ඒ මම තම පව්කම් පලයට පැමිණියෙම (දූන්) පසුතැවිලි වෙමි.

240. සිවුමසෙකින් මතුයෙහි (මාගේ) කාලක්‍රියාව වන්නේ ය. (එකලැ) මම එකැතියෙන් කැකුළු වූ දරුණු වූ මහානිරයට වැටෙමි.

241. (එහි) කොන් සතරෙක, දොරටු සතරෙක ප්‍රමාණ කරන ලදුව කොටස් වශයෙන් බෙදන ලද යපවුරෙකින් වට කරන ලද යපියනෙකින් වසන ලදී.

242. ඒ නිරයේ අයොමයභූමිය ගින්නෙන් දිලියෙයි. මහගිනි දැලින් යුතු වෙයි. ඒ (ගින්න) හාත්පසැ යොදුන් සියයක් තැන පැතිර හැම කල්හි සිටියි.

243. තත්ථාහං දීඝමද්ධානං දුක්ඛං වෙදිස්සං වෙදනං,
ඵලං පාපස්ස කම්මස්ස තස්මා සොචාමහං භුසං.

244. තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා,
මාකත්ථ පාපකං කම්මං ආවි වා යදි වා රහො.

245. සචෙ තං පාපකං කම්මං කරිස්සථ කරොථ වා,
න වො දුක්ඛා පමුත්‍යත්ථි උප්පච්චාපි පලායතං.

246. මත්තෙය්‍යා හොථ පෙත්තෙය්‍යා කුලෙ ජෙට්ඨාපචායකා,
සාමඤ්ඤා හොථ බ්‍රහ්මඤ්ඤා එවං සග්ගං ගමිස්සථා'ති.

ධනපාලපෙතවත්ථු සත්තමං.

## 2. 8

247. නග්ගො කිසො පබ්බජිතොසි භන්තෙ,
රත්තිං කුහිං ගච්ඡසි කිස්ස හෙතු[1],
ආචික්ඛ මෙ තං අපි සක්කුණෙමු
සබ්බෙන විත්තං පටිපාදයෙ තුවං.

248. බාරාණසීනගරං දූරඝුට්ඨං
තත්ථාහං ගහපති අඩ්ඪකො දීනො,
අදාතා ගෙධිතමනො ආමිසස්මිං
දුස්සීල්‍යෙන යමවිසයම්හි පත්තො.

249. සො සූචිකාය කිලමිතො තෙහි
තෙනෙව ඤාතීසු යාමි ආමිසහෙතුං,
අදානසීලා න ච සද්දහන්ති
දානඵලං හොති පරම්හි ලොකෙ.

250. ධීතා ච මය්හං ලපතෙ අභික්ඛණං
දස්සාමි දානං පිතූනං පිතාමහානං,
උපක්ඛටං පරිවිසයන්ති බ්‍රාහ්මණෙ
යාමය්හං අන්ධකවින්දං භොත්තුං'ති.

251. තමවොච රාජා අනුභවියාන තම්පි
එය්‍යාසි ඛිප්පං අහමපි කරිස්සං පූජං,
ආචික්ඛ මෙ තං යදි අත්ථි හෙතු
සද්ධායිතං හෙතුවචො සුණොම.

1. කිස්සචකඛ හෙතු – කස්ථි.

243. මම ඒ නිරයෙහි දිගු කලක් දුක් විඳිමි. මේ පව්කමැ එලයි. එයින් මම වැඩියක් ශොක කරමි.

244. එහෙයින් මම තොපට කියමි. තොපට යහපතක් වේවා. මෙහි යම්පමණ දෙනෙක් රැස්වූහු ද ඒ තෙපි ප්‍රකට ව හෝ නොහොත් රහසැ හෝ පව්කමක් නො කරවු.

245. ඉදින් තෙපි ඒ පව්කම් මතු කරන්නවු නම් හෝ දැන් කරවු නම් හෝ අහසට නැග පලායන්නා වූ ද ඒ තොපට දුකින් මිදීමෙක් නම් නැත.

246. මවට හිතවූවෝ පියාට හිතවූවෝ කුල දෙටුවන් පුදන්නෝ වවු. ශ්‍රමණයන් පුදන්නෝ බ්‍රාහ්මණයන් පුදන්නෝ වවු. මෙසේ කරන තෙපි සුගතියට යවයි.

**ධනපාල ප්‍රෙතවස්තුව යි.**

## 2. 8

(අජාසත් රජ ප්‍රෙතයා දැක:)

247. වහන්ස, තෙපි නග්න වූ කෘශ වූ පැවිද්දෙක් වවු. කුමක් සඳහා මේ රෑ කොහි යවු ද? ඒ කරුණ මට කියවු. මට හැකි නම් තොපට හැමදෙයින් වස්තුව සපයමි.

(ප්‍රෙතයා:)

248. සියලුතන්හි පතළ බරණැස් නම් නුවරෙක් ඇත. එහි මම මහත් සම්පත් ඇති, පහත් සිත් ඇති, දන් නොදෙනසුලු කාමාමිෂයෙහි ගිජුසිත් ඇති ගැහැවියෙක් වීමි. දුසිල්බව නිසා ප්‍රෙතලොකයට පැමිණියෙමි.

249. ඒ මම ඒ පව්කම නිසා ඉදිකටුවලින් විදින්නාක් වැනි සාගින්නෙන් පෙළුණෙම් වෙමි. එහෙයින් ම අහරක් පතා නෑයන් වෙත යමි. දන් නො දෙන සුලු අය (මා මෙන්) පරලොවැදී දනයෙහි විපාකයෙක් ඇතැ යි නො අදහත්.

250. මාගේ දියැණියෝ ද ‘‘මවුපියනට හා මුතුන් මීමුතුනට ද දන් දෙමි’’යි නිතර කථා කරති. පිළියෙළ කරන ලද්ද බමුණන් වළඳවති. මම අනුභවයට අන්ධකවින්දයට යමි.

251. රජ තෙමේ ඒ ප්‍රෙතයාට මෙසේ කීය. ඒ අහර ද වළඳා වහා එව. මම ද පූජාවක් කරමි. ඉදින් යම් කරුණක් ඇත් නම්, ඇදහිය යුතු වූ ඒ සහෙතුක වචනය මට කියව. මම එය අසමි.

252. තථාති වත්වා අගමාසි තත්ථ
භුංඤ්ජිසු භත්තං න ච පන දක්ඛිණාරහා,
පච්චාගමි රාජගහං පුනාපරං
පාතුරහොසි පුරතො ජනාධිපස්ස

253. දිස්වාන පෙතං පුනරෙව ආගතං
රාජා අවොච අහමපි කිං දදමි,
ආචික්ඛ මෙ තං යදි අත්ථි හෙතු
යෙන තුවං චිරතරං පීණිතො සියාති.

254. බුද්ධඤ්ච සඞ්ඝං පරිවිසියාන රාජ
අන්නෙන පානෙනපි චීවරෙන.
තං දක්ඛිණං ආදිස මෙ හිතාය
එවං අහං චිරතරං පීණිතො සියා.

255. තතො ච රාජා නිපතිත්වා තාවදෙ
දානං සහත්ථා අතුලං දදිත්වා සඞ්ඝෙ,
ආරොචයී පකතිං තථාගතස්ස
තස්ස ච පෙතස්ස දක්ඛිණං ආදිසිත්ථ.

256. සො පූජිතො අතිවිය සොභමානො
පාතුරහොසි පුරතො ජනාධිපස්ස,
යක්ඛොහමස්මි පරමිද්ධිපත්තො
න මය්හමිද්ධිසමසදිසා මනුස්සා.[1]

257. පස්සානුභාවං අපරිමිතං මමයිදං
තයානුද්දිට්ඨං අතුලං දදිත්වා සඞ්ඝෙ,[2]
සන්තප්පිතො සතතං සද බහූහි
යාම්‍යහං සුඛිතො මනුස්සදෙවා'ති.

චූලසෙට්ඨිපෙතවත්ථු අට්ඨමං.

භාණවාරං පඨමං.

## 2. 9

258. යස්ස අත්ථාය ගච්ඡාම කම්බොජං ධනහාරකා,
අයං කාමදදො යක්ඛො ඉමං යක්ඛං නයාමසෙ.

259. ඉමං යක්ඛං ගහෙත්වාන සාධුකෙන පසය්හ වා,
යානං ආරොපයිත්වාන ඛිප්පං ගච්ඡාම ද්වාරකන්ති.

260. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදුබ්භො හි පාපකො.

1. න මය්හමත්ථි සමා සදිසා මානුසා – මජසං.
2. තයානුසිට්ඨං අතුලං දත්වා සඞ්ඝෙ – මජසං.

252. "එසේයැ" යි කියා (හේ) දන්දෙන තැනට ගියේය. බමුණෝ **බත් වැළඳූහ. එය** දක්ෂිණාර්හයෝ නො ම වැළඳූහ. නැවත හේ දෙවන වර රජගහ නුවරට පෙරළා පැමිණියේ ය. රජු ඉදිරියෙහි පහළ විය.

253. රජ තෙමේ නැවත පැමිණි ඒ ප්‍රේතයා දැක "යම් හෙතුවකින් තෙපි ඉතා දිගුකලක් තෘප්ත වවු ද. ඉදින් එබඳු හෙතුවක් ඇත් නම් එය මට කියවු මම ද කිසිවක් දෙමි" යි කී ය.

(ප්‍රේතයා:)

254. රජතුමනි, බුදුන් ද සඟන ද ආහාරයෙන් හා පානයෙන් ද වළඳවා සිවුරින් පුද ඒ පින මට හිත පිණිස දුන මැනවි. එසේ කළ කලැ මම චිරකලක් තෘප්ත වෙමි.

255. එබසට අනතුරුව රජ තෙමේ එකෙණෙහි ම පහයෙන් නික්මැ මහත් දනක් සියතින් සඟනට දී ඒ සියලු පුවත බුදුන්ට කී ය. ඒ ප්‍රේතයාට ද පින් දුන්නේ ය.

256. මෙසේ පුදන ලද ඒ ප්‍රේතයා දෙව්සිරින් අතිශයින් වොරජමින් රජු ඉදිරියෙහි පහළ විය. (මෙසේද කී ය:) මම පරම්සුරට පත් දෙවියෙක්මි. මගේ ඉසුරට සම ඉසුරු ඇති මිනිස්සු නැත්තාහ.

257. මාගේ මේ අපරිමිත අනුභාවය බලන්න. තොප විසින් සඟනට මහදන් දී මට පින් දෙන ලද. නරදෙවය, හැම කල්හි බොහෝ දනවස්තුයෙන් නිතර තෘප්ත කරන ලද මම සුවපත් වූයෙමි යන්නෙමි.

**චුල්ලසෙට්ඨි ප්‍රේතවස්තුව යි.**

## පළමුවන බණවර නිමි.

## 2. 9

(වෙළඳ බමුණා අංකුර වෙළෙඳහට මෙසේ කියයි:)

258. වෙළෙඳාමෙන් ධනය රැස්කරන අපි යමක් සඳහා කාම්බොජ රටට යන්නමෝ ද (ඒ කරුණ මෙහි දී ම සිදු වෙයි) මේ දෙවියා කැමති සම්පත් දෙන්නෙකි. (එහෙයින්) අපි මොහු ගෙන යමු.

259. කැමැත්තෙන් හෝ බලාත්කාරයෙන් හෝ මේ දෙවියා අල්වා යානයක නංවාගෙන වහා ද්වාරවතී නගරයට යමු.

(අංකුර)

260. යම් ගසක සෙවණෙහි (යමෙක්) හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේ ද (හේ) ඒ ගසේ අත්තක් නො බිඳින්නේ ය. මිත්‍රද්‍රොහය ලාමක ය.

261. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
ඛන්ධම්පි තස්ස ඡින්දෙය්‍ය අත්ථො චෙ තාදිසො සියා'ති.

262. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස පත්තං භින්දෙය්‍ය මිත්තදුබ්භො හි පාපකො'ති.

263. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
සමූලම්පි තං අබ්බුහෙය්‍ය අත්ථො චෙ තාදිසො සියා'ති.

264. යස්සෙකරත්තිම්පි ඝරෙ වසෙය්‍ය
යත්ථන්නපානං පුරිසො ලභෙථ,
න තස්ස පාපං මනසාපි චින්තයෙ
කතඤ්ඤුතා සප්පුරිසෙහි වණ්ණිතා.

265. යස්සෙකරත්තිම්පි ඝරෙ වසෙය්‍ය
අන්නෙන පානෙන උපට්ඨිතො සියා,
න තස්ස පාපං මනසාපි චින්තයෙ[1]
අදුබ්භපාණී දහතෙ මිත්තදුබ්භිං.

266. යො පුබ්බෙ කතකල්‍යාණො පච්ඡා පාපෙන හිංසති,
අල්ලපාණිහතො පොසො න සො භද්‍රානි පස්සතී'ති

267. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො'ති.

268. නාහං දෙවෙන වා මනුස්සෙන වා
ඉස්සරියෙන වාහං න සුප්පසය්හො,
යක්ඛොහමස්මි පරමිද්ධිපත්තො
දූරඞ්ගමො වණ්ණබලූපපන්නො'ති.

269. පාණි තෙ සබ්බසොවණ්ණො පඤ්චධාරො මධුස්සවො,
නානා රසා පග්ඝරන්ති මඤ්ඤෙහං තං පුරින්දදන්ති.

1. චෙතයෙ – සී.

(බමුණා:)

261. (යමෙක්) යම් ගස් සෙවණෙකැ හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේ ද, ඉදින් ඔහුට එබඳු වැඩෙක් වේ නම් හේ ඒ ගසේ කඳ ද සිඳින්නේය.

(අංකුර:)

262. (යමෙක්) යම් ගස් සෙවණෙකැ හිඳිනේ හෝ නිදන්නේ හෝ වේ නම් හේ ඒ ගසේ කොළයකුදු නො බිඳින්නේ ය. මිත්‍රද්‍රොහය ලාමක ය.

(බමුණා:)

263. (යමෙක්) යම් ගස් සෙවණෙකැ හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේ නම් ඉදින් ඔහුට එබඳු වැඩෙක් වේ නම් හේ ඒ ගස සහමුලින් ම උදුරන්නේ ය.

(අංකුර:)

264. (යමෙක්) යම් පුද්ගලයකුගේ ගෙයි එක් රැයක් හෝ වෙසේ ද, යමකු සමීපයෙහි යම් පුරුෂයෙක් ආහාරපාන හෝ (යම්කිසි බොදුනක් හෝ) ලබන්නේ ද ඒ පුද්ගලයාට නපුරක් සිතිනුදු නො සිතන්නේ ය. කෘතඥභාවය වනාහි බුද්ධාදි උතුමන් විසින් වර්ණිත ද එහෙයිනි.

265. (යමෙක්) එකරැයක් හෝ යමකුගේ ගෙහි වසන්නේ වේ ද, ආහාරයෙන් පානයෙන් උපස්ථාන හෝ කරන ලද වේ ද හේ ඔහුට සිතින් හෝ නපුරක් නො සිතන්නේය. අහිංසක අත් ඇත්තේ ඒ මිත්‍රද්‍රොහී පුද්ගලයා වනසයි.

266. යමෙක් (යම් පුද්ගලයකු විසින්) පෙර කරන ලද උපකාර ඇත්තේ පසු කලෙක ඒ උපකාර කළහු නපුරු ක්‍රියාවකින් පෙළා නම් (අල්ලපාණි) උපකාරකයා නසනලද ඒ පුරුෂ තෙමේ යහපත නො දකී.

267. යමෙක් තමාට ද්‍වෙෂ නො කරන ලද (රාගාදී) කෙලෙස් නැති පිරිසිදු සිත් ඇති මිනිසකුට ද්‍වෙෂ කරයි ද ඒ පාප කර්මය (තෙමේ) උඩු සුළඟට දමනලද සියුම් රජස් මෙන් ඒ නුවණ නැති ඔහු වෙත ම (විපාක වශයෙන්) ආපසු එයි.

(යක්ෂයා:)

268. මම දෙවියකු විසින් හෝ මිනිසකු විසින් හෝ නො මැඩලිය හෙමි. ආධිපත්‍යයෙකින් හෝ නො මැඩලිය හෙමි. මම උතුම් සෘද්ධියට පැමිණි වහා ඉතා දුරයනු සමත් රූසපුවෙන් ද, සිරුරු බෙලෙන් ද යුතු යක්ෂයෙම් වෙමි.

269. තොපගේ දකුණත හැමලෙසින් රත්වනැ. මිහිරිරස වැහෙන ධාරාපසක් ඇත්තේ ය. ඉන් නොයෙක් රස වැගිරෙයි. තොප සක් දෙවිඳු යයි මම සිතමි.

270. නම්හි දෙවො න ගන්ධබ්බො නපි සක්කො පුරින්දදො
පෙතං මං අඞ්කුර ජානාහි හෙරුවම්හා ඉධාගතන්ති.

271. කිංසීලො කිංසමාචාරො හෙරුවස්මිං පුරෙ තුවං,
කෙන තෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣතී'ති

272. තුන්නවායො පුරෙ ආසිං හෙරුවස්මිං තදා අහං,
සුකිච්ඡවුත්ති කපණො න මෙ විජ්ජති දාතවෙ.

273. ආවෙසනඤ්ච[1] මෙ ආසි අසය්හස්ස උපන්තිකෙ,
සද්ධස්ස දානපතිනො කතපුඤ්ඤස්ස ලජ්ජිනො.

274. තත්‍ථ යාචනකා යන්ති නානාගොත්තා වණිබ්බකා,
තෙ ච මං තත්‍ථ පුච්ඡන්ති අසය්හස්ස නිවෙසනං.

275. කත්‍ථ ගච්ඡාම භද්දං වො කත්‍ථ දානං පදීයති,
තෙසාහං පුට්ඨො වක්ඛාමි අසය්හස්ස නිවෙසනං.

276. පග්ගය්හ දක්ඛිණං බාහුං එත්‍ථ ගච්ඡථ භද්දං වො,
එත්‍ථ දානං පදීයති අසය්හස්ස නිවෙසනෙ.

277. තෙන පාණි කාමදදො තෙන පාණි මධුස්සවො,
තෙන මෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣතී'ති.

278. න කිර ත්වං අදා දානං සකපාණීහි කස්සචි,
පරස්ස දානං අනුමොදමානො පාණිං පග්ගය්හ පාවදි.

279. තෙන පාණි කාමදදො තෙන පාණි මධුස්සවො,
තෙන තෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති.

280. යො සො දානමදා භන්තෙ පසන්නො සකපාණිහි,
සො හිත්වා මානුසං දෙහං කින්නු සො දිසතං ගතො'ති

1. නිවෙසනඤ්ච – මජසං.

(දෙව්ඳු:)

270. මම ප්‍රසිද්ධ දෙවියෙක් ද නො වෙමි. ගඳබෙක් ද පුරඳුරු නම් වූ සක්දෙවිඳු ද නො වෙමි. පින්වත් අංකුරය. ''හෙරුව නුවරින් මැරී අවුත් මෙහි උපන් ප්‍රෙතයෙක්මි''යි මා දනුව.

(අංකුර:)

271. පෙර හෙරුව නුවර දී තෙපි කෙබඳු සිල් ඇති වූහු ද? කෙබඳු දනසීලාදි කුසල පැවතුම් ඇති වූහු ද? කෙබඳු ශ්‍රෙෂ්ඨ චය්‍ය්‍යාවකින් තොපගේ අත්හි පින්පලය නිපයේ ද?

(දෙව්ඳු:)

272. පෙර මම හෙරුව නුවර සන්නාලියෙක් වීමි. ඉතා දුකසේ දිවිපැවැතුම් ඇති බැගෑපත් කෙනෙක් වීමි. දන්දීම සඳහා මට කිසිවක් නැති විය.

273. සැදැහැති දන්පතියකු වූ කළපින් ඇති පවට පිළිකුල් කරන අසය්හ සිටුහුගේ ගේ සමීපයෙහි මාගේ ගෙය ද විය.

274. නොයෙක් කුලවල උපන් සිඟන්නෝ ද. ගුණ කියා ඉල්ලන්නෝ ද එතැනට පැමිණෙත්. ඔහු එහි දී අසය්හ සිටුහුගේ ගෙය මාගෙන් විචාරත්.

275. තොපට යහපතක් වේවා. කොතැන්හි දන් දෙනු ලැබේ ද? අපි දන් ලැබීමට කොහි යමු ද? මෙසේ (ඔවුන් විසින්) විචාරන ලද මම අසය්හ සිටුහුගේ ගෙය ඔවුන්ට කියමි.

276. ''අසය්හ සිටුහුගේ මේ නිවසෙහි දන්දෙනු ලැබේ. මෙතැනට යවු, තොපට යහපතක් වේවා''යි මම දකුණ'ත දිගුකොට කීවෙමි.

277. ඒ පුණ්‍ය කර්ම හෙතුයෙන් මාගේ අත කැමැති සම්පත් දෙන්නේ වෙයි. ඒ හෙතුයෙන් මාගේ අත ඉෂ්ටවස්තු වගුරුවන්නේ වෙයි. මාගේ ඒ උතුම් හැසිරීම හෙතුයෙන් මා අත්හි පින්පල පහළ වේ.

(අංකුර:)

278. තෙපි වූ කලි සිය අතින් කිසිවකුට දනක් නුදුන්නාව. අනෙකකුගේ දනය අනුමෝදන් වෙමින් අත දිගු කොට කීවහු වනැ.

279. ඒ හෙතුයෙන් තොපගේ අත කැමැති සම්පත් දෙන්නේ වෙයි. ඒ හෙතුයෙන් තොප අත ඉෂ්ටවස්තු ප්‍රසව කරන්නේ වෙයි. තොපගේ ඒ බ්‍රහ්මචය්‍ය්‍යායෙන් අත්හි පුණ්‍ය ඵලය පහළ වෙයි.

280. පින්වත යම් අසය්හ නම් සිටුවරයෙක් පහන් සිතැතිව සියතින් දන් දුන්නේ ද, හේ මිනිස් සිරුර හැර පියා කවර දෙසකට ගියේ වේ ද?

281. නාහං පජානාමි අසය්හසාහිනො
අඞ්ගිරසස්ස ගතිං ආගතිං වා
සුතඤ්ච මෙ වෙස්සවණස්ස සන්තිකෙ
සක්කස්ස සහව්‍යතං ගතො අසය්හො'ති.

282. අලමෙව කාතුං කල්‍යාණං දානං දාතුං යථාරහං,
පාණිං කාමදදං දිස්වා කො පුඤ්ඤං න කරිස්සති.

283. සො හි නූන ඉතො ගන්ත්වා අනුප්පත්වාන ද්වාරකං,
දානං පට්ඨාපයිස්සාමි යං මමස්ස සුඛාවහං.

284. දස්සාමන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච,
පපඤ්ච උදපානඤ්ච දුග්ගෙ සඞ්කමනානි ච.

285. කෙන තෙ අඞ්ගුලි කුණ්ඨා මුඛඤ්ච කුණ්ඩලීකතං,
අක්ඛීනි ච පග්ඝරන්ති කිං පාපං පකතං තයා'ති.

286. අඞ්ගිරසස්ස ගහපතිනො සද්ධස්ස ඝරමෙසිනො,
තස්සාහං දානවිස්සග්ගෙ දානෙ අධිකතො අහුං.

287. තත්ථ යාචනකෙ දිස්වා ආගතෙ භොජනත්ථිකෙ,
එකමන්තං අපක්කම්ම අකාසිං කුණ්ඩලීමුඛං.

288. තෙන මෙ අඞ්ගුලි කුණ්ඨා මුඛඤ්ච කුණ්ඩලීකතං,
අක්ඛීනි ච පග්ඝරන්ති තං පාපං පකතං මයා'ති.

289. ධම්මෙන තෙ කාපුරිස මුඛඤ්ච කුණ්ඩලීකතං,
අක්ඛීනි ච පග්ඝරන්ති,
යං ත්වං පරස්ස දානස්ස අකාසි කුණ්ඩලීමුඛන්ති.

290. කථං හි දානං දදමානො කරෙය්‍ය පරපත්තියං,
අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි වා'ති.

291. සො හි නූන ඉතො ගන්ත්වා අනුප්පත්වාන ද්වාරකං,
දානං පට්ඨාපයිස්සාමි යං මමස්ස සුඛාවහං.

292. දස්සාමන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච,
පපඤ්ච උදපානඤ්ච දුග්ගෙ සඞ්කමනානි වා.'ති

281. අන්‍යයන් විසින් ඉවසිය නොහැකි පරිත්‍යාගාදිය ඉවසන, සිරුරින් රැස් විහිදෙන අසය්හ සිටුහුගේ පරලොව ගමන හෝ යළි මෙලොවට ආගමනය මම නොදනිමි. වැළිත් අසය්හ සිටුතුමා ශක්‍රයාගේ සහභාවයට ගියේ යැ යි මා විසින් වෙසවුණු සමීපයෙහි දී අසන ලද.

(අංකුර:)

282. කිසියම් පිනක් කරන්නට සුදුසු ම ය, ශක්ති පරිදි දනක් දෙන්නට සුදුසු ම ය. කැමති සම්පත් දෙන අත දැක (මා වැනි) කවරෙක් නම් පිනක් නො කරන්නේ ද?

283. ඒ මම මේ වැලිකතරින් ඉවත් වැ ගොස් ද්වාරවතී නුවරට පැමිණ යම් පිනක් මට සැප එලවනුයේ වේ නම් ඒ දනමය පින පවත්වන්නෙමි.

284. අහර හා පැන් ද පිළී සහ සෙනසුන් ද දෙමි. පැන්හල් හා ළිං ද දුර්ගයන්හි හේ දඬු ද පිහිටුවන්නෙමි.

(අංකුර වෙනත් ප්‍රෙතයකු දැක මෙසේ විචාරයි:)

285. කුමක් නිසා තොපගේ ඇඟිලි කුණුව වකුටු වී ද? මුහුණ කොඩොලක් මෙන් විකාර වූයේ ද? ඇසින් කබ වැහෙන්නේ ද? තොප විසින් කිනම් පවක් කරන ලද ද?

286. සිරුරෙන් රැස් විහිදෙන, ගැහැවියෙක් වූ, සැදැහැති, ගිහිගෙයි වසන, ඒ අසය්හ සිටුහුගේ දන්දෙන තැන දන් දීමෙහි අයිකාරී වශයෙන් මම පත්කරන ලද වෙමි.

287. එහි අහර පිණිස පැමිණි යදියන් දැක මම එකත් පසෙකට ඉවත් වැ මුහුණ හැකිළවූයෙමි.

288. එහෙයින් මගේ ඇඟිලි වකුටු විය. මුහුණ ද හැකුළුණේ විය. ඇසින් කඳුළු වැගිරේ. ඒ පව මා විසින් කරන ලද.

(අංකුර:)

289. නින්දිත පුරුෂය, තොපි යම් හෙයෙකින් මෙරමාගේ දනට මුව හැකිළවීම් කළහු ද, එහෙයින් ධර්මය අනුව තොපගේ මුහුණ හැකිළිණි. ඇස් ද කඳුළු වගුරයි.

290. ආහාර පාන ද කෑයුතු දෑ ද පිළී හා සෙනසුන් ද දෙන පුරුෂ කෙසෙයින් මෙරමා ලවා සිදු කටයුත්තක් කරන්නේ ද.

291. ඒ මම මෙයින් ගොස් ද්වාරවතී නුවරට පැමිණ මෙලොව පරලොව සැප උපදවන මහදන් පවත්වන්නෙමි.

292. ආහාර පාන ද පිළී හා සෙනසුන් ද පැන්සල් සහ දිය පොකුණු ද දුර්ගමස්ථානයෙහි හේ දඬු පාලම් ද කරවා දෙන්නෙමි.

293. තතො හි සො නිවත්තිත්වා අනුප්පත්වාන ද්වාරකං,
දානං පට්ඨාපයි අඞ්කුරො යං තුමස්ස සුඛාවහං.

294. අද අන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච,
පපඤ්ච උදපානඤ්ච විප්පසන්නෙන චෙතසා.

295. කො ඡාතො කො ච තසිතො කො වත්ථං පරිවස්සති,
කස්ස සන්තානි යොග්ගානි ඉතො යොජෙන්තු වාහනං.

296. කො ඡත්තිච්ඡති ගන්ධඤ්ච කො මාලං කො උපාහනං'
ඉතිස්සු තත්ථ ඝොසෙන්ති කප්පකා සූදමාගධා;
සද සායඤ්ච පාතො ච අඞ්කුරස්ස නිවෙසනෙ'ති.

297. සුඛං සුපති අඞ්කුරො ඉති ජානාති මං ජනො,
දුක්ඛං සුපාමි සින්ධක යං න පස්සාමි යාචකෙ.

298. සුඛං සුපති අඞ්කුරො ඉති ජානාති මං ජනො,
දුක්ඛං සුපාමි සින්ධක අප්පකෙසු වණිබ්බකෙ.

299. සක්කො චෙ තෙ වරං දජ්ජා තාවතිංසානමිස්සරො,
කිස්ස සබ්බස්ස ලොකස්ස වරමානො වරං වරෙ'ති.

300. සක්කො චෙ මෙ වරං දජ්ජා තාවතිංසානමිස්සරො,
කාලුට්ඨිතස්ස මෙ සතො සූරියස්සුග්ගමනං පති.
දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං සීලවන්තා ච යාචකා,

301. දදතො මෙ න ඛීයෙථ දත්වා නානුතපෙය්‍යහං,
දදං චිත්තං පසාදෙය්‍යං එවං සක්කං[1] වරං වරෙ'ති.

302. න සබ්බවිත්තානි පරෙ පවෙච්ඡෙ
දදෙය්‍ය දානඤ්ච ධනඤ්ච රක්ඛෙ,
තස්මා හි දානා ධනමෙව සෙය්‍යො
අතිප්පදානෙන කුලා න හොන්ති.

303. අදානමතිදානඤ්ච නප්පසංසන්ති පණ්ඩිතා
තස්මා හි දානා ධනමෙව සෙය්‍යො,
සමෙන වත්තෙය්‍ය සධීරධම්මො'ති.

1. එතං සක්ක – මජසං.

293. ඒ අංකුර තෙමේ ඒ මරුකතරින් පෙරළා නික්මැ ද්වාරවතී නුවරට පැමිණ යම් දනක් තමහට සැප එළවා නම් ඒ මහදන් පැවැත්වී ය.

294. පහන් සිතින් යුතු වැ අහර හා පැන් ද, පිළි සහ සෙනසුන් ද පැන්හල් සහ දියපොකුණු ද දුන්නේ ය.

295. කවරෙක් බඩසා ඇත්තේ ද කවරෙක් පවස් ඇත්තේ ද කවරෙක් පිළී වැළඳගන්නේ වේ ද කවරෙකු ගේ රියෙහි ගොන්නු විඩාවට පැමිණියාහු ද මේ වාහන සමූහයෙන් කැමැති වාහනයක් යොදු ගනිත්වා.

296. කවරෙක් කුඩ කැමැත්තේ ද කවරෙක් ගඳ – මල් කැමැත්තේ ද කවරෙක් වහන් කැමැත්තේ දැ යි මෙසේ කියමින් ඒ අඞ්කුරගේ නිවසෙහි කපුවෝ ද අරක්කැමියෝ ද සුවඳ දෙන්නෝ ද හැම දු උදය-සවස සොභා කෙරෙති.

(අඞ්කුර සින්ධකට කියයි)

297. අඞ්කුර සැපසේ නිදති යි මහජන තෙමේ මා (ගැන) දනියි. සින්ධකය, යම් හෙයෙකින් මම යදියන් නො දක්නෙම් ද. එහෙයින් (මම) දුකසේ නිදමි.

298. අඞ්කුර සැපසේ නිදති යි ජන තෙමේ මා දනියි. ගුණ කියමින් යදිනවුන් (දන්සැලෙහි) මද වූකල්හි සින්ධකය මම දුකසේ නිදමි.

(සින්ධක:)

299. තව්තිසා වැසි දෙවියන්ට ද සියලු ලොකයාට ද ප්‍රධාන වූ ශක්‍ර තෙමේ තොපට වරයක් දෙන්නේ නම් වර කැමැති වූ තෙපි කිනම් වරයක් අයදිනහු ද?

300–301. ඉදින් තව්තිසා වැසියනට ඉසුරුවූ සක්දෙවිඳු මට වරයක් දෙන්නේ නම් මෙබඳු වරයක් සක්දෙවිඳුගෙන් පතමි. එනම්: අලුයම නැගී සිටි මට හිරු උදවන වේලෙහි ම දිව්‍යමය ආහාරයෝ පහළ වෙත්වා. යදියෝ සිල්වත් වෙත්වා. දන්දෙන මාගේ දනවස්තුව නො ගෙවේවා. දන් දී මම පසුතැවිලි නො වෙම්වා. දන්දෙමින් සිත පහදවම්වා යනු යි.

(නීති ශාස්ත්‍රයෙහි නිපුණ සොණක:)

302. සියලු වස්තුපකරණයෙන් අන්හට නො දෙන්නේ ය. දන් ද දෙන්නේ ය, ධනය ද රක්නේ ය. එහෙයින් දන් දීමට වඩා ධනය ම උතුම් වෙයි. අධික දනයෙන් කුලයෝ නො පවතිත්.

303. නුවණැත්තෝ අදනයත් අතිදනයත් නො පසසත්, එහෙයින් දනයට වඩා ධනය ම උතුම් වෙයි. දීම් නො දීම් දෙක්හි සම ලෙස පවත්-නේ ය, එය වූ කලි නැණැතියන් ගිය මග යි.

304. අහො වතාරෙ අහමෙව දජ්ජං
සන්තා හි මං සප්පුරිසා භජෙය්‍යුං,
මෙසොව නිත්‍යානභිපූරයන්තො[1]
සන්තප්පයෙ සබ්බවණිබ්බකානං.

305. යස්ස යාචනකෙ දිස්වා මුඛවණ්ණො පසීදති,
දත්වා අත්තමනො හොති තං ඝරං වසතො සුඛං.

306. යස්ස යාචනකෙ දිස්වා මුඛවණ්ණො පසීදති,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස[2] සම්පදා.

307. පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා'ති.

308. සට්ඨිවාහසහස්සානි අඞ්කුරස්ස නිවෙසනෙ,
භොජනං දීයතෙ නිච්චං යඤ්ඤපෙක්ඛස්ස ජන්තුනො.

309. තිසහස්සානි සූදා හි ආමුත්තමණිකුණ්ඩලා,
අඞ්කුරං උපජීවන්ති දානෙ යඤ්ඤස්ස ව්‍යාවටා.

310. සට්ඨිපුරිසසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
අඞ්කුරස්ස මහාදානෙ කට්ඨං ඵාලෙන්ති මාණවා.

311. සොළසිත්ථිසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
අඞ්කුරස්ස මහාදානෙ විධා පිණ්ඩෙන්ති නාරියො.

312. සොළසිත්ථිසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
අඞ්කුරස්ස මහාදානෙ දබ්බිගාහා උපට්ඨිතා.

313. බහුං බහූනං පාදාසි චිරං පාදාසි ඛත්තියො,
සක්කච්චඤ්ච සහත්ථා ච චිත්තීකත්වා පුනප්පුනං.

314. බහූ මාසෙ ච පක්ඛෙ ච උතුසංවච්ඡරානි ච,
මහාදානං පවත්තෙසි අඞ්කුරො දීඝමන්තරං.

315. එවං දත්වා යජිත්වා ච අඞ්කුරො දීඝමන්තරං,
සො හිත්වා මානුසං දෙහං තාවතිංසූපගො අහූ'ති.

316. කටච්ඡුභික්ඛං දත්වාන අනුරුද්ධස්ස ඉන්දකො,
සො හිත්වා මානුසං දෙහං තාවතිංසූපගො අහූ.

317. දසහි ඨානෙහි අඞ්කුරං ඉන්දකො අතිරොචති,
රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ ඵොට්ඨබ්බෙ ච මනොරමෙ.

318. ආයුනා යසසා චෙව වණ්ණෙන ච සුඛෙන ච,
ආධිපච්චෙන අඞ්කුරං ඉන්දකො අතිරොචතී'ති.

1. නිත්‍යං පටිපූරයන්තො – මජසං.
2. පුඤ්ඤස්ස – සී. මු. ප.

304. (අංකුර:) භවත, සොනකය, මම දන් දෙන්නෙම් ම යැ. සන්හුන් තිදෙර ඇති සත්පුරුෂයෝ මා ඇසුරු කෙරෙත්වා. පහත්බිම් මනා ලෙස පුරවමින් වසින මහාමේඝයක් මෙන් සියලු යදිදනන්ගේ මන දෙළ සන්තර්පණය කෙරෙම්වා.

305. යදියන් දූක යමෙකුගේ මුඛවර්ණය පැහැපත් වේ ද, යමෙක් දන් දී සතුටු සිතැති වේ ද, ඒ ගෙය (එහි) වසන්නහුට සැප වේ.

306. යදියන් දූක යමකුගේ මුඛවර්ණය පහදී ද, දන් දී යමෙක් තුටු සිත් ඇති වේ ද, මෝ දනය පිළිබඳ සම්පත්තියි.

307. දන් දීමෙන් පෙර ම සතුටු සිත් ඇත්තේ වේ ද, දන් දෙන විටත් සිත පහදවන්නේ වේ ද, දන් දී අවසන්හිත් සතුටු සිත් ඇත්තේ වේ ද, මෝ දනයාගේ සම්පත් වේ.

308. දන් දීමෙහි ම අදහස් ඇති අඞ්කුර රජුගේ නිවෙසෙහි ගැල් සැටදහසක අහර නිතර සත්ත්වවර්ගයාට දෙනුලැබේ.

309. මහායාග යැ යි නම් කරනු ලැබූ මේ දනයෙහි යෙදී සිටි නොයෙක් මිණිකොඬොල් පැළඳි තුන්දහසක් පමණ අරක්කැමියෝ අංකුර රජු නිසා ජීවත් වෙත්.

310. පළන් මිණි කොඬොල් ඇති සැට දහසක් තරුණ පුරුෂයෝ ඒ අංකුර රජුගේ මහාදනයෙහි දර පළත්.

311. අංකුර රජුගේ මහාදනයෙහි සව්ලකරින් සැරසුණු සොළොස් දහසක් අඟනෝ කුළුබඩු අඹරා පිඩු කරත්.

312. අඞ්කුර රජුගේ මහදනගැ සව්ලකරින් සැරසුණු සොළොස් දහසක් අඟනෝ හැඳිගත් අත් ඇතිව එළඹ සිටියෝ වෙත්.

313. එ රජ නන් දනහට බොහෝ කලක් බොහෝ දන් දුන්නේ ය. සකස් කොට ද සියතින් ද ගරුබුහුමන් පෙරදූරි කොට පුනපුනා දුන්නේය.

314. අංකුර තෙමේ බොහෝ මාසගණනක් මුළුල්ලෙහි ද බොහෝ පක්ෂ ගණනක් මුළුල්ලෙහි ද බොහෝ ඍතු මුළුල්ලෙහි ද බොහෝ අවුරුදු මුළුල්ලෙහි ද දිගුකලක් මහදන් දුන්නේ ය.

315. මෙසේ අඞ්කුර දිගුකලක් දන් දී මහායාග කොට මිනිස් සිරුර හැරපියා තව්තිසා දෙව්ලොවට ගියේ ය.

316. ඒ ඉන්දක තරුණයා අනුරුත් තෙරුන්හට සැන්දක් පමණ බත් දී මිනිසත් බව හැරපියා තව්තිසා දෙව්ලොවට ගියේ ය.

317-318. ඉන්දක දෙවිඳු අඞ්කුර දෙව්පුතුට වඩා දස කරුණෙකින් අධික වැ බබළයි. මනහර වූ රූපයෙන් ද ශබ්දයෙ න් ද රසයෙන් ද සුව-දින් ද පහසින් ද ආයුෂයෙන් ද පරිවාර සම්පත්ත්යෙන් ද සිරුරු පැහැ-යෙන් ද සැපයෙන් ද ඉසුරෙන් ද ඉන්දක අඞ්කුර පසුබා බබළයි.

319. මහාදානං තයා දින්නං අඞ්කුරො දීඝමන්තරං;
අතිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකෙ'ති.

320. තාවතිංසෙ යදා බුද්ධො සිලායං පණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තකමූලම්හි විහාසි පුරිසුත්තමො.

321. දසසු ලොකධාතූසු සන්නිපතිත්වාන දෙවතා,
පයිරුපාසන්ති සම්බුද්ධං වසන්තං නගමුද්ධනි,

322. න කොචි දෙවො වණ්ණෙන සම්බුද්ධං අතිරොචති,
සබ්බෙ දෙවෙ අධිග්ගය්හ සම්බුද්ධොව විරොචති.

323. යොජනානි දස ද්වෙ ච අඞ්කුරොයං තදා අහු;
අවිදූරෙව බුද්ධස්ස ඉන්දකො අතිරොචති.

324. ඔලොකෙත්වාන සම්බුද්ධො අඞ්කුරඤ්චාපි ඉන්දකං,
දක්ඛිණෙය්‍යං පභාවෙන්තො ඉදං වචනමබ්‍රවි.

325. මහාදානං තයා දින්නං අඞ්කුරො දීඝමන්තරං,
අතිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකෙ.

326. චොදිතො භාවිතත්තෙන අඞ්කුරො ඉදමබ්‍රවි,
කිං මය්හං තෙන දානෙන දක්ඛිණෙය්‍යෙන සුඤ්ඤතං.

327. අයං සො ඉන්දකො යක්ඛො දජ්ජා දානං පරිත්තකං,
අතිරොචති අම්හෙහි චන්දො තාරාගණෙ යථා.

328. උජ්ජඞ්ගලෙ යථා ඛෙත්තෙ බීජං බහුකම්පි[1] රොපිතං,
න විපුලං ඵලං හොති නපි තොසෙති කස්සකං.

329. තථෙව දානං බහුකං දුස්සීලෙසු පතිට්ඨිතං,
න විපුලං ඵලං හොති නපි තොසෙති දායකං.

330. යථාපි භද්දකෙ ඛෙත්තෙ බීජං අප්පම්පි රොපිතං,
සම්මා ධාරං පවෙච්ඡන්තෙ ඵලං තොසෙති කස්සකං.

331. තථෙව සීලවන්තෙසු ගුණවන්තෙසු තාදිසු,
අප්පකම්පි කතං කාරං පුඤ්ඤං හොති මහප්ඵල'න්ති.

332. විචෙය්‍ය දානං දාතබ්බං යත්ථ දින්නං මහප්ඵලං,
විචෙය්‍ය දානං දත්වාන සග්ගං ගච්ඡන්ති දායකා.

333. විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ'ති.

**අඞ්කුරපෙතවත්ථු නවමං.**

---

1. බහුම්පි - මජසං,
2. හිමවන්තාව මජසං,

(බුදුහු:)

319. අඞ්කුරය, තොප විසින් දිගුකලක් මහදන් දෙන ලද. තෙපි දූන් ඉතා දුර සිටිනහු, මා වෙත එවු.

320. යම් කලෙක පුරුෂොත්තම වූ බුදුහු තව්තිසා දෙව්ලොවැ පරසතුරුක්මුලැ පඬු ඇඹුල් සලස්නෙහි වුසූහු ද,

321. දසදහසක් ලොධාහි දෙවියෝ රැස් වැ මෙර මුදුනෙහි වසන සම්බුදුන් ඇසුරු කෙරෙත්.

322. කිසි දෙවිකෙනෙක් සිරුරු පැහැයෙන් බුදුනට වඩා නො බබළති. බුදුහු ම සියලු දෙවියන් අබිබවා බබළති.

323. මෙ අංකුර එකලැ දෙළොස් යොදනක් පමණ දුර විය. ඉන්දක වූකලි බුදුන්හට නුදුරු තැන ම අධික වැ බබළයි.

324–325. බුදුහු අඞ්කුර ද ඉන්දක ද බලා දන් පිළිගැනීමට සුදුස්සා පැහැදිලි කෙරෙමින් මෙ වචන කීහු: අඞ්කුරය, තොප විසින් දිගුකලක් මහදන් දෙන ලද. තෙපි ඉතා දුර සිටිනහු. මා වෙත එවු.

326. භාවිත යිත් ඇති බුදුන් විසින් මෙහෙයුම් ලද අඞ්කුර මේ වචනය කී ය: දක්ෂිණාර්හයන්ගෙන් හිස් වූ මාගේ දනයෙන් කවර ප්‍රයොජන ද?

327. ඒ මෙ ඉන්දක දෙව්පිත් සුලු දනක් දී තරුගණ මැද සඳ මෙන් අප අබිබවා බබළයි.

328. යම් සේ ඉතා තදබිම ඇති කෙතෙහි වපුළ බිජුවට බොහෝ වුව ද මහත්ඵල නො වේ ද, එය කස්සකයා නො ම සතුටු කෙරේ ද,

329. එසේ ම දුශ්ශීලයන් කෙරෙහි පිහිටුවන ලද මහාදනය මහඹු ඵල දෙන්නේ නො වේ. එය කස්සකයා නො ම සතුටු කෙරේ.

330. යම්සේ යහපත් කෙතෙකැ වපුළ බිජුවට අල්ප වුව ද වැසි දහර මොනොවට පවත්නා කලැ ඵලය (අස්වැන්න) ගොවියා සතුටු කෙරේ ද?

331. එසේ ම ධ්‍යානාදි ගුණවත් තාදි (නොසෙල්වෙන) ලක්ෂණ-යෙන් යුත් සිල්වතුන් කෙරෙහි කරන ලද පුණ්‍යොපකාරය ස්වල්ප වුව ද මහත් ඵල ඇත්තේ වෙයි.

332. යමකු විෂයෙහි දෙන දන මහත්ඵල වේ නම් එබඳු පින්කෙත නුවණින් පිරික්සා දියයුතු ය. දයකයෝ නුවණින් පිරික්සා දන් දී සුගතියට යෙති.

333. මෙ මිනිස් ලොවැ දන් පිළිගැනීමට සුදුසු යම් පුද්ගලයෝ වෙත් ද ඔවුන් නුවණින් පිරික්සා දන් දීම බුදුන් විසින් පසස්නා ලද. යහපත් කෙතෙහි වපුළ බිජුවට යම්සේ ද, එසේ ම මේ දක්ෂිණාර්හයන් විෂයෙහි දූන් දන ද මහත්ඵල වේ.

අඞ්කුර ප්‍රෙත වස්තුව යි.

## 2. 10

334. දිවාවිහාරගතං භික්ඛුං ගඞ්ගාතීරෙ නිසින්නකං,
තං පෙති උපසඞ්කම්ම දුබ්බණ්ණා භීරුදස්සනා.

335. කෙසා චස්සා අතිදීඝා යාව භූමාවලම්බරෙ,
කෙසෙහි සා පටිච්ඡන්නා සමණං එතදබ්‍රවී.

336. පඤ්චපණ්ණාසවස්සානි යතො කාලකතා අහං,
නාභිජානාමි භුත්තං වා පීතං වා පන පානියං;
දෙහි ත්වං පානීයං භන්තෙ තසිතා පානීයාය මෙ'ති.

337. අයං සීතොදිකා ගඞ්ගා හිමවන්තතො සන්දති,
පිව එත්තො ගහෙත්වාන කිං මං යාචසි පානීයං.

338. සචාහං භන්තෙ ගඞ්ගාය සයං ගණ්හාමි පානියං,
ලොහිතං මෙ පරිවත්තති තස්මා යාචාමි පානීයං.

339. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ගඞ්ගා තෙ හොති ලොහිතන්ති,

340. පුත්තො මෙ උත්තරො නාම සද්ධො ආසි උපාසකො,
සො මය්හං අකාමාය සමණානං පවෙච්ඡති.

341. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
තමහං පරිභාසාමි මච්ඡෙරෙන උපද්දුතා.

342. යං ත්වං මය්හං අකාමාය සමණානං පවෙච්ඡසි,
චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං.

343. එතං තෙ පරලොකස්මිං ලොහිතං හොතු උත්තරං,
තස්ස කම්ම විපාකෙන ගඞ්ගා මෙ හොති ලොහිත'න්ති.

**උත්තරමාතුපෙතවත්ථු දසමං.**

## 2. 11

344. අහං පුරෙ පබ්බජිතස්ස භික්ඛුනො
සුත්තං අදසිං උපගම්ම යාචිතා,
තස්ස විපාකො විපුලඵලූපලබ්භති
බහූ ච මෙ උපපජ්ජරෙ වත්ථකොටියො.

## 2 . 10

334. විවර්ණ වූ බියකරු දකුම් ඇති ප්‍රේති දිවාවිහරණයේ යෙදී ගංතෙර හුන් ඒ භික්ෂූහු වෙත එළැඹියා.

335. ඇගේ කෙස් වැටිය ද ඉතා දිග ය. බිම දක්වා එල්බෙයි. කෙහෙයෙන් පිළිසන් වූ ඕ මහණහට මේ වචනය කීවා.

336. වහන්ස, මම යම්දවසක කලුරිය කළා වෙම් නම් එතැන් සිට පස්පනස් වසරක් මුළුල්ලෙහි අනුභව කළ අහරක් හෝ පූ පැනක් නො දනිමි. පවසින් පෙළුණෙමි. පැන් පිණිස (ඇවිදිනා) මට නෙපි පැනක් දෙවු.

(භික්ෂු:)

337. සිහිල් දිය ඇති මේ ගඟ හිමවත් පව්වෙන් ගලා බසී. මේ ගඟින් දිය ගෙන පානය කරව, කුමක් හෙයින් මා (ගෙන්) පැන් යදිහි ද?

(ප්‍රේති:)

338. වහන්ස, ඉදින් මම ගඟෙහි පැන් තොමෝ ම ගන්නෙම් නම් එය මට ලෙයට පෙරළෙයි. එහෙයින් (තොප) පැන් යදිමි.

(භික්ෂු:)

339. කයින් වචනයෙන් සිතින් කිනම් පවක් කරන ලද ද? කිනම් පවකමක විපාකයෙන් ගඟ (දිය) තිට ලේ වෙයි ද?

(ප්‍රේති:)

340–341. මාගේ උත්තර නම් පුත් සැදැහැවත් උපාසකයෙක් විය. හේ මාගේ නො කැමැත්තෙන් මහණුන්හට සිවුරු ද පිණ්ඩපාතය ද සෙනසුන් සහ ගිලන් පස ද දෙයි. මසුරුකමින් පෙළුණු මම ඔහුට මෙසේ පරිභව කෙරෙමි:

342. යට හෙයෙකින් නෙපි මාගේ නො කැමැත්තෙන් මහණුන්හට සිවුරු පිණ්ඩපාත ප්‍රත්‍යය සෙනසුන් දෙවු ද?

343. "උත්තරය, මේ සියල්ල ම තොපට පරලොව දී ලේ වේවා" යනුයි. ඒ පවකමහි විපාකයෙන් ගඟ දිය මට ලේ වෙයි.

**උත්තරමාතෘ ප්‍රෙතවස්තුයි.**

## 2 . 11

344. පෙර මා වෙත අවුත් (නූල්) ඉල්ලූ පැවිදි වූ කෙලෙසුන් සුන් (එක් පසේ බුදුවරයකුට) මට නූල් දිනිමි. ඒ දන්හි මහත් ඵලය දූන් ලැබේ. බොහෝ වූ වස්ත්‍ර යුගළයෝ මට උපදිති.

345. පුප්ඵාභිකිණ්ණං රමිතං විමානං
අනෙකචිත්තං නරනාරිසෙවිතං,
සාහං භුඤ්ජාමි ච පාරුපාමි ච
පහූතවිත්තා[1] න ච තාව ඛීයති.

346. තස්සෙව කම්මස්ස විපාකමන්වයා
සුඛඤ්ච සාතඤ්ච ඉධූපලබ්භති,
සාහං ගන්ත්වා පුනරෙව මානුසං
කාහාමි පුඤ්ඤානි නයය්‍යපුත්ත මං.

347. සත්ත තුවං වස්සසතා ඉධාගතා
ජිණ්ණා ච වුද්ධා ච තහිං භවිස්සසි,
සබ්බෙව තෙ කාලකතා ච ඤාතකා
කිං තත්ථ ගන්ත්වාන ඉතො කරිස්සසි.

348. සත්තෙව වස්සානි ඉධාගතාය මෙ
දිබ්බඤ්ච සුඛඤ්ච සමප්පිතාය,
සාහං ගන්ත්වා පුනරෙව මානුසං
කාහාමි පුඤ්ඤානි නයය්‍යපුත්ත මනති.

349. සො තං ගහෙත්වාන පසය්හ බාහායං
පච්චානයිත්වාන ථෙරිං සුදුබ්බලං,
වදෙසි අඤ්ඤම්පි ජනං ඉධාගතං
කරොථ පුඤ්ඤානි සුඛූපලබ්භති.

350. දිට්ඨා මයා අකතෙන සාධුනා
පෙතා විහඤ්ඤන්ති තථෙව මානුසා,
කම්මඤ්ච කත්වා සුඛවෙදනීයං
දෙවා මනුස්සා ච[2] සුඛෙ ඨිතා[3] පජාති.

සුත්තපෙතවත්ථු එකාදසමං.

## 2. 12

351. සොවණ්ණ සොපානඵලකා සොවණ්ණ[4] වාලුකසන්ථතා
තත්ථ සොගන්ධියා වග්ගු සුචිගන්ධා මනොරමා.

352. නානා රුක්ඛෙහි සඤ්ඡන්නා නානාගන්ධසමෙරිතා,
නානාපදුමසඤ්ඡන්නා පුණ්ඩරිකසමොතතා.[5]

353. සුරභී සම්පවායන්ති මනුඤ්ඤා මාලුතෙරිතා,
හංසා කොඤ්චාභිරුද චක්කවාකාභිකූජිතා.

354. නානා දිජගණාකිණ්ණා නානාසරගණායුතා,
නානාඵලධරා රුක්ඛා නානාපුප්ඵධරා වනා

1. පහූතවත්ථා – සී.
2. මනුස්සා – මජ්සං.
3. සුඛෙඨිතා – පු.
4. සොණ්ණ – සීමු i
5. සමොගතා–සීමු ii ප.

345. මලින් ගැවසුණු මනහර, නොයෙක් චිත්‍ර ඇති, නරනාරීන් විසින් සෙවුනා ලද දෙව්විමන ඒ මම පරිභොග කරමි. කැමැති පිළියක් පොරොවාගනිමි. බොහෝ සම්පත් ඇත්තී වෙමි. ඒ ධනය ද නො පිරිහෙයි.

346. ඒ සුත්‍රදානමය පිනෙහි හෙතුවෙන් සුඛ විපාක වූ මෙ මිහිරි සුවය මෙ විමනෙහි දී ලැබේ. නැවතත් මිනිස් ලොවට ගොස් ඒ මම පින් කරන්නෙමි. ස්වාමිපුත්‍රය, මා එහි පමුණුවන්න.

347. තෙපි සත්සියවසෙකින් මතුයෙහි මෙහි ආවවූ ය. (කර්මානු භාවයෙන් තරුණ ලෙසින් මෙතෙක් කල් සිටි තොප මිනිස් ලොවට ගියහොත්) ජරායෙන් දුදුරු වැ එහි දී මහලු වන්නවූ ය. නොපගේ සියලු ම නෑයෝ ද කලුරිය කළහ. මෙතැනින් එහි ගොස් තෙපි කුමක් කරන්න වූ ද?

348. ස්වාමිපුත්‍රය, මෙහි පැමිණි දෙව් සැපත් වැළඳූ මට සත්වසක් ඉක්මියේ යයි හඟිමි. ඒ මම නැවතත් මිනිස් ලොවට ගොස් පින් කරන්නෙමි. මා (මිනිස් ලොවට) පමුණුවන්න.

349. ඒ විමාන ප්‍රෙත තෙමෙ මහලු වූ ඉතා දුබල වූ ඒ ස්ත්‍රිය අතින් අල්වා ගෙන බලාත්කාරයෙන් මෙන් ගමට පමුණුවා මෙසේ කී ය; ''පින් කරවු සුව ලැබේ''යි මෙතැන පැමිණි අනෙක් ජනයාට ද කියව.

350. රැස් නො කළ කුශලකර්මයන් හෙතුකොට ගෙන, ප්‍රෙතයෝ ද එසේම මනුෂ්‍යයෝ ද වෙහෙසෙත්. සුව විපාක දෙන පින්කම් කොට සැපතෙහි පිහිටි දෙව් වූත් මනුෂ්‍ය වූත් ප්‍රජා නොමෙර් මා විසින් දක්නා ලදු.

**සුත්ත ප්‍රෙත වස්තු යි.**

## 2. 12

351. ඒ පොකුණෙහි රනින් කළ හිණිපෙති හා පෝරු ද ඇත්තේ ය. රන්මුවා වැල්ලෙන් යුක්ත ය. මනහර වූ සුවඳැති සිත්කළු වූ හෙල්මැලි ඇත.

352. ඒ පොකුණ වටින් නොයෙක් රුක්වලින් ගැවසීගත්තේ ය. අවට නන්වැදැරුම් සුවඳ සුළං හමන්නේ ය. නොයෙක් රතුපුල්වලින් වැසුණු දියතලා ඇත්තේ ය. හෙළපියුමින් ද මොනොවට වැසී පවතී.

353. මනහර සුළඟින් සෙළවුණු සුවඳ හමයි. හංසයන් සහ කොස්ලිහිණියන් විසින් කරන ලද මනහර නාද ඇත්තේ ය. සක්වා ලිහිණියන් විසින් කරන ලද ශබ්ද ඇත්තේ ය.

354. නොයෙක් පක්ෂිසමූහයාගෙන් ගැවසීගත්තේ ය. නානාවිධ වූ පක්ෂිනාද සමූහයෙන් යුක්ත ය. නොයෙක් ඵල දරනගස් අවට ඇත්තේ ය. නොයෙක් සුවඳින් යුත් මල්දරන වනයෝ ද ඇත.

355. න මනුස්සෙසු ඊදිසං නගරං යාදිසං ඉදං
පාසාද බහුකා තුය්හං සොවණ්ණරූපියාමයා

356. දද්දල්ලමානා ආභන්ති[1] සමන්තා චතුරො දිසා,
පඤ්චදසිසතා තුය්හං යා තෙමා[2] පරිචාරිකා.

357. තා කම්බුකෙයූරධරා[3] කඤ්චනාවෙළ[4] භූසිතා,
පල්ලඞ්කා බහුකා තුය්හං සොවණ්ණරූපියාමයා.

358. කාදලිමිගසඤ්ඡන්නා සජ්ජා ගොනකසන්ථතා,
යත්ථ ත්වං වාසූපගතා සබ්බකාමසමිද්ධිනී

359. සම්පත්තායඩ්ඪරත්තාය තතො උට්ඨාය ගච්ඡසි,
උය්‍යානභූමිං ගන්ත්වාන පොක්ඛරඤ්ඤා සමන්තතො.

360. තස්සා තීරෙ තුවං ඨාසි හරිතෙ සද්දලෙ සුභෙ,
තතො තෙ කණ්ණමුණ්ඩො සුනඛො අඞ්ගමඞ්ගානි ඛාදති.

361. යදා ච ඛායිතා ආසි අට්ඨිසඞ්ඛලිකා කතා,
ඔගාහසි පොක්ඛරණිං හොති කායො යථා පුරෙ.

362. තතො ත්වං අඞ්ගපච්චඞ්ගී සුචාරුපියදස්සනා,
වත්ථෙන පාරුපිත්වාන ආයාසි මම සන්තිකං.

363. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන කණ්ණමුණ්ඩො ච සුනඛො.
අඞ්ගමඞ්ගානි ඛාදති

364. කිම්බිලායං ගහපති සද්ධො ආසි උපාසකො,
තස්සාහං භරියා ආසිං දුස්සීලා අතිචාරිණී.

365. සො මං අතිචරමානාය සාමිකො එතදබ්‍රවී,
නෙතං ඡන්නං නප්පතිරූපං යං ත්වං අතිචරාසි මං.

366. සාහං ඝොරඤ්ච සපථං මුසාවාදම භාසිසං,
නාහං තං අතිචරාමි කායෙන උද චෙතසා.

367. සචාහං තං අතිචරාමි කායෙන උද චෙතසා,
අයං කණ්ණමුණ්ඩො[5] සුනඛො අඞ්ගමඞ්ගානි ඛාදතු.

1. ආභෙන්ති – සීමු. i, ප.
2. යාවෙමා – සීමු ii
3. කාකම්බුකෙයූරධරා – සීමු ii, ප.
4. කඤ්චකාවෙල – සීමු ii, ප.
5. කණ්ණමුණ්ඩාච – සීමු, i,

355–356–357–358 මේ නුවර යම්බඳු වී නම් මෙබඳු නුවරක් මිනිසුන් කෙරෙහි නැත. තිගේ රන්රිදීමුවා බොහෝ ප්‍රාසාදයෝ අවට සිවුදික්හි ඉතාම බබළමින් හොබවත්. නිට වත්පිළිවෙත් කරන යථ වෙ පන් සියයක් දසියෝ වෙත් ද, ඔහු සක්වළලුවලින් හා අඟුපලඳනාවෙන් සැර යුණාහු ය. රන්මුවා මුදුන්මල්කඩින් සැරසුණු කෙස් ඇත්තාහු ය. සියලු කම්සැපතින් සපිරුණු තෝ යම් යහනක විසීමට යවූ නම් කෙසෙල්මුව සම හා දික් ලොම කොඳුපිළී අතුරා සරසන ලද එබඳු වූ රන්රිදී මුවා වූ අසුන් නිට බොහෝ වෙයි.

359–360. අඩරය පැමිණිකල තෝ ඒ පලඟින් නැගිට උයන් බිමට යවූ, එසේ ගොස් හාත්පසැ නිල් වූ ළාතණ ඇති මනහර වූ ඒ පොකුණු තෙර තෙපි සිටිවූ. එයට පසු කන් මුඩු බල්ලෙක් තිගේ අඟපසඟ කාදමයි.

361. යම් කලෙකැ සුනඛයා විසින් කන ලද්දී ඇටසැකිල්ල පමණක් ඉතිරි කරන ලද්දී තෙපි පොකුණට බස්නවූ. අසිරියෙකි! ශරීරය පෙර මෙන් ඇති වෙයි.

362. ඉන් පසු පිරිපුන් අඟපසඟ ඇති මනරම් පියකරුඳුකුම ඇති තෙපි පිළියක් පෙරවගෙන මා ළඟට එන්නවූ ය.

363. කයින් වචනයෙන් සිතින් කවර පාපයක් කරන ලද ද? කිනම් පචක විපාකයෙන් කන් මුඩු බල්ලෙක් තිගේ අඟපසඟ කා ද?

364. කිම්බිලා නුවර ගැහැවියෙක් සැදැහැවත් උවසුවෙක් විය. ඔහුට මම බිරිය වීමි. හිමියා ඉක්මැ පවත්නී දුසිල් වීමි.

365. මෙසේ හිමියා ඉක්මැ හැසිරෙන මට ඒ හිමි මෙබස් කී ය. යම් පහයෙකින් තෝ මා ඉක්මැ හැසිරෙහි නම් එය යුතු නො වේ. සුදුසු නො වේ.

366. ඒ මම දරුණු ලෙස දිවුරා මෙසේ බොරු කීවෙමි. ''මම කයින් හෝ සිතින් හෝ නොප ඉක්මවා නො හැසිරෙමි.''

367. ඉදින් මම කයින් හෝ සිතින් හෝ තොප ඉකුම්වා හැසිරෙම් නම් කන් මුඩු මේ බල්ලා මා අඟ පසඟ කා දමාවා.

368. තස්ස කම්මස්ස විපාකං මුසාවාදස්ස චූභයං,
සත්තවස්සසතානි ච[1] අනුභූතං යතො හි මෙ,
කණ්ණමුණ්ඩා ච සුනඛො අඞ්ගමඞ්ගානි ඛාදති.

369. ත්වඤ්ච දෙව බහුකාරො අත්ථාය මෙ ඉධාගතො,
සුමුත්තාහං කණ්ණමුණ්ඩස්ස අසොකා අකුතොභයා.

370. තාහං දෙව නමස්සාමි යාචාමි පඤ්ජලීකතා,
භුඤ්ජ අමානුසෙ කාමෙ රම දෙව මයා සහ.

371. භුත්වා අමානුසෙ කාමෙ[2] රමිතොම්හි තයා සහ,
තාහං සුභගෙ යාචාමි ඛිප්පං පටිනයාහි ම'න්ති.

කණ්ණමුණ්ඩපෙතවත්ථු ද්වාදසමං.

## 2. 13

372. අහු රාජා බ්‍රහ්මදත්තො පඤ්චාලානං රථෙසභො,
අහොරත්තානමච්චයා රාජා කාලඞ්කරී තද.[3]

373. තස්ස ආළාහනං ගන්ත්වා භරියා[4] කන්දති උබ්බරි,
බ්‍රහ්මදත්තං අපස්සන්තී බ්‍රහ්මදත්තාති කන්දති.

374. ඉසී[5] ච තත්ථ ආගච්ඡි සම්පන්නචරණො මුනි,
සො ච තත්ථ අපුච්ඡිත්ථ යෙ තත්ථ සුසමාගතා.

375. කස්ස චිදං ආළාහනං නානාගන්ධසමෙරිතං,
කස්සායං කන්දති භරියා ඉතො දූරගතං පතිං.

376. බ්‍රහ්මදත්තං අපස්සන්තී බ්‍රහ්මදත්තාති කන්දති,
තෙ ච තත්ථ වියාකංසු යෙ තත්ථ සුසමාගතා.

377. බ්‍රහ්මදත්තස්ස භද්දන්තෙ බ්‍රහ්මදත්තස්ස මාරිස,
තස්ස ඉදං ආළාහනං නානාගන්ධසමෙරිතං.

378. තස්සායං කන්දති භරියා ඉතො දූරගතං පතිං,
බ්‍රහ්මදත්තං අපස්සන්තී බ්‍රහ්මදත්තාති කන්දති.

379. ඡළාසීති සහස්සානි බ්‍රහ්මදත්තස්සනාමකා,[6]
ඉමස්මිං ආළාහනෙ දඩ්ඪා තෙසං කං අනුසොචසි.

380. යො රාජා චූළනීපුත්තො පඤ්චාලානං රථෙසභො,
තං භන්තෙ අනුසොචාමි භත්තාරං සබ්බකාමදං.

381. සබ්බෙවහෙසුං රාජානො බ්‍රහ්මදත්තස්සනාමකා,
සබ්බෙව චූළනීපුත්තා පඤ්චාලානං රථෙසභා.

---

1. සත්තෙව වස්සසතානි – සීමු i
2. භුත්වා අමානුසා කාමා – සීමු. i
3. කාලමකුබ්බථ – මජසං.
4. භරියං – සීමු. i
5. ඉසි – සීමු. i
6. බ්‍රහ්මදත්තස්ස නාමකා – සීමු. i, සීමු. ii, ප.

368. ඒ දරුණු දිවිරීම් කර්‍මයාගේ ද මෘෂාවාද කර්‍මයාගේ ද විපාකය අවුරුදු හත්සියයක් මුළුල්ලෙහි විඳින ලද. ඒ පවින් ම මගේ අඟපසඟ කන්සුන් බල්ලා කාදමයි.

369. රජතුමනි, තෙපි මට බොහෝ උපකාර වූවහු ය. මට හිත පිණිස මෙහි ආවහු ය. කන් මුඩු බලුගෙන් මම මිදුණී වෙමි. මම දැන් ශොක නැත්තී බිය නැත්තී වෙමි.

370. දෙවයිනි, මම නොප වඳිමි. බැඳිලි ව නොපගෙන් මෙසේ යදිමි. ''රජතුමනි, නොමිනිස් වූ පස්කම් සැප විඳින්න. මා හා රමණය කරන්න.''

371. සොඳුර, නි හා නොමිනිස් සැප විඳ රමණය කෙළෙම් වෙමි. දැන් මා මගේ නුවරට ම වහා පමුණුවා ලවයි මම තිගෙන් යදිමි.

**කර්ණමුණ්ඩ ප්‍රෙතවස්තු යි.**

## 2. 13

372. පඤ්චාල රට වැසියනට ඉසුරු වූ බඹදත් නම් රජෙක් විය. ඒ රජ තෙමේ බොහෝ කලක් ඇවෑමෙන් කලුරිය කෙළේ ය.

373. එකල ඒ රජුගේ උබ්බරී නම් බිසවු රජු දැවූ තැනට ගොස් හඬයි. බඹදත් රජු නො දක්නා ඕ ''බඹදත් කොහි දැ''යි (කියමින්) හඬයි.

374. සරණ දහමින් හෙබි මුනිවරයකු වූ තවුසෙක් එතැනට පැමිණියේ ය. එතැන යම් මිනිස්සු රැස්වූවාහු ද, ඔවුන්ගෙන් ඒ තවුසා එහි දී මෙසේ විචාළේ ය:

375–376 නොයෙක් සුවඳ වහනය වන මේ සොහොන කවරකු ගේ ද? මේ බිරිඳ කවරකුට හඬා ද? (මිනිස්සු මෙසේ කියති:) මේ මිනිස් ලොවින් දුර වූ පරලොවට ගිය සිය හිමියා වන බඹදත් රජු නො දක්නී ''බඹදත් බඹදත්''යි මෝ හඬා යයි එහි රැස්වූ යම් කෙනෙක් වූහු නම් ඔව්හු එහි දී පැවසූහ.

377. නිදුකාණන් වහන්ස, බඹදත් රජුට යහපතක් ම වේවා. මේ නොයෙක් සුවඳ හමන සොහොන ඒ බඹදත් රජුගේ වෙයි.

378. ඒ රජුගේ මේ බිරිඳ ඔහු ගැන හඬයි. මේ මිනිස් ලොවින් දුර වූ පරලොවට ගිය සිය හිමි බඹදත් රජ නො දක්නී ''බඹදත් බඹදත්''යි වැලපෙයි.

379. බඹදත් යන නම් ඇති සයාසූදහසක් දෙනා මේ සොහොනෙහි දවන ලදහ. ඔවුනතුරෙන් කවරකු සඳහා තෙපි හඬවූ ද?

380. වහන්ස, චූලනී රජුගේ පුත් වූ පඤ්චාල රටට ඉසුරු වූ යම් රජෙක් වී ද, සියලු කැමති දැ දෙන ඒ හිමියා සඳහා මම සෝක කරමි.

381. සියලු ම රජවරු බඹදත් යන නම් ඇත්තෝ වූහ. සියල්ලෝ ම චූලනීපුත්‍රයෝ වූහ. සියල්ලෝ ම පඤ්චාල රටෙහි අධිපතියෝ වූහ.

382. සබ්බසං අනුපුබ්බෙන මහෙසිත්තමකාරයි,
තස්මා පුරිමකෙ හිත්වා පච්ඡිමං අනුසොචසි.

383. ආතුමෙ ඉත්ථිභූතාය දීඝරත්තාය මාරිස,
යස්සා මෙ ඉත්ථිභූතාය සංසාරෙ බහු භාසසි.

384. අහු ඉත්ථී අහු පුරිසො පසුයොනිම්පි ආගමා,
එවමෙතං අතීතානං පරියන්තො න දිස්සති.

385. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

386. අබ්බූළ්හං වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතාය පතිසොකං අපානුදි.

387. සාහං අබ්බූළ්හසල්ලාස්මි සීතිභූතාස්මි නිබ්බුතා,
න සොචාමි න රොදාමි තව සුත්වා මහාමුනි.

388. තස්ස තං වචනං සුත්වා සමණස්ස සුභාසිතං,
පත්තචීවරමාදාය පබ්බජි අනගාරියං.

389. සා ච පබ්බජිතා සන්තා අගාරස්මානගාරියං,
මෙත්තං චිත්තං අභාවෙසි බ්‍රහ්මලොකූපපත්තියා.

390. ගාමා ගාමං විචරන්තී නිගමෙ රාජධානියො,
උරුවෙලා නාම සො ගාමො යත්ථ කාලමකුබ්බථ.

391. මෙත්තචිත්තං ආභාවෙත්වා බ්‍රහ්මලොකූපපත්තියා,
ඉත්ථිචිත්තං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගා අහූ'ති.

උබ්බරිපෙතවත්ථු තෙරසමං.

**උබ්බරිවග්ගො දුතියො.**

**තස්සුද්දානං :**

පණ්ඩුමාතා ච පිතා ච නන්ද කුණ්ඩලිනෙඝටො.
දෙව සෙට්ඨී තුණ්ණවායො ච:
විහාරසුත්ත සොපාණ උබ්බරී'ති.

382. සියලු ම රජුන්ට තෙපි පිළිවෙළින් අගමෙහෙසි බව කළවු ය. කුමක් හෙයින් පළමු රජුන් හැර පසු ව ඇති වූ රජු සඳහා ශොක කරවු ද?

383. නිදුකාණන් වහන්ස, තමා ස්ත්‍රියක වූ කලහි දිගුකලක් මුළුල්ලෙහි ස්ත්‍රියක් ම වේ ද? යමබඳු වූ ස්ත්‍රීභාවයට පැමිණි මට සසර බොහෝ ජාති වී යයි තෙපි කියන්නහු ද?

384. තෙපි ස්ත්‍රියක් ද වූවහු. පුරුෂයෙක් ද වූවහු. තිරිසන් අත් බවට ද පැමිණියහු. මෙසේ ඉකුත් අත්බව් හි කෙළවරක් නො පෙනෙයි.

385. ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් මා හද ඇවිළගත් සියලු සෝගින්න තෙපි දිය ඉසින්නාකු මෙන් නිවූවහු ය.

386. යම් තවුසෙක් මා හද ඇසුරු කළ සෝහුල එකාන්තයෙන් උදුරා දැමී ද සොවින් පෙළුණු මාගේ ගිවී පිළිබඳ සෝදුක පහ කෙළේ ද.

387. මහාමුනින් වහන්ස, ඒ මම උපුළ සෝහුල් ඇතියෙම් සිහිල් වූවා වෙමි, නිවුණා වෙමි. තොපගේ ඔවදන් අසා මම දැන් ශෝක නො කරමි, නො හඬමි.

388. ඒ තවුසාගේ මැනැවින් දෙසූ ඒ වදන් අසා ඕ පා සිවුරු ගෙන අනගාරික වූ සස්නෙහි පැවිදිවූවා ය.

389. ඕ මෙසේ ගිහිගෙන් නික්ම අනාගාරිය සඞ්ඛ්‍යාත සස්නෙහි පැවිදි වූවා බඹලොව ඉපදීම පිණිස මෙත්සිත වැඩුවා ය.

390. ගමින් ගමට යෙමින් නියම්ගමක් පාසා ද රාජධානියක් පාසා ද සැරිසරන්නී උරුවෙල් නම් වූ ඒ ගම යම් තැනෙක් හි ද එහි දී කලුරිය කළා ය.

391. ඕ බඹලොව ඉපදීම සඳහා මෙත්සිත් වඩා ස්ත්‍රීභාවයෙහි සිත දුරු කොට බඹලොවට පැමිණියා වූය.

**උබ්බරි ප්‍රෙතවස්තු යි.**

## දෙවැනි උබ්බරි වර්ග යි.

**එහි උද්දානය:**

පඨුවන් සංසාර මොචක ප්‍රෙතියගේ වස්තුව ද, සැරියුත් තෙරුන්ගේ මාතෘ ප්‍රෙත වස්තුව ද, භූතගේ පියා අයත් කිරිදක වූ මත්තා නම් ප්‍රෙතිය ගේ වස්තුව ද, නන්ද ප්‍රෙතියගේ වස්තුව ද, මට්ටකුණ්ඩලී ප්‍රෙතවස්තුව ද, සතපණ්ඩිත පුවත ඇතුළත් කණ්හ ප්‍රෙතවස්තුව ද, ධනපාල – චූලසෙට්ඨි දෙදෙනාගේ ප්‍රෙතවස්තු දෙක ද, කලින් තුනාකම් කළ අංකුර ප්‍රෙතවස්තු ව ද, දිවාවිහාරගත භික්ෂුහට හමු වූ උත්තර මාතෘ ප්‍රෙතියගේ වස්තුව ද, සුත්ත ප්‍රෙතවස්තුව ද, මනා හිණිපෙති ඇති විල අසල හුන් කර්ණමුණ්ඩ ප්‍රෙතියගේ වස්තුව හා උබ්බරි ප්‍රෙතවස්තුව ද යන තෙළෙස උබ්බරිවර්ග යෙහි ඇතුළත් වේ.

## 3. 1

392. අභිජ්ජමානෙ වාරිම්හි ගඞ්ගාය ඉධ ගච්ඡසි,
නග්ගො පුබ්බද්ධපෙතොව මාලාධාරී[1] අලඞ්කතො.
කුහිං ගමිස්සසි පෙත කත්ථ වාසො භවිස්සති'ති.

393. චුන්දට්ඨිකං[2] ගමිස්සාමි පෙතො සො ඉති භාසති
අන්තරෙ වාසභගාමං බාරාණසියා[3] ච සන්තිකෙ.

394. තඤ්ච දිස්වා මහාමත්තො කොලියො ඉති විස්සුතො,
සත්තුං භත්තඤ්ච පෙතස්ස පීතකඤ්ච යුගං අද.

395. නාවාය තිට්ඨමානාය කප්පකස්ස අදාපයි,
කප්පකස්ස පදින්නම්හි ඨානෙ පෙතස්සුදිස්සථ.[4]

396. තතො සුවත්ථවසනො මාලාධාරී අලඞ්කතො,
ඨානෙ ඨිතස්ස පෙතස්ස දක්ඛිණා උපකප්පථ,
තස්මා දජ්ජෙථ පෙතානං අනුකම්පාය පුනප්පුනං.

397. සාතුන්නවසනා එකෙ අඤ්ඤෙ කෙසනිවාසනා.
පෙතා භත්තාය ගච්ඡන්ති පක්කමන්ති දිසොදිසං.

398. දූරෙ එකෙ පධාවිත්වා අලද්ධා විනිවත්තරෙ,
ඡාතා පමුච්ඡිතා භන්තා භූමියං පටිසුම්භිතා.

399. කෙචි තත්ථ පපතිත්වා භූමියං පටිසුම්භිතා,
පුබ්බෙ අකතකල්‍යාණා අග්ගිදඩ්ඪාව ආතපෙ.

400. මයං පුබ්බෙ පාපධම්මා ඝරණී කුලමාතරො,
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකම්හ අත්තනො.

401. පහූතං අන්නපානම්පි අපිස්සු අවකිරීයති,
සම්මග්ගතෙ පබ්බජිතෙ න ච කිඤ්චි අදම්හසෙ

402. අකම්මකාමා අලසා සාදුකාමා මහග්ඝසා,
ආලොපපිණ්ඩදාතාරො පටිග්ගහෙ පරිභාසිම්හසෙ.

---

1. මාලධාරී මජ්ඣං. මාලභාරී – කත්ථචි.
2. චුන්දට්ඨියං – කත්ථචි චුන්දවයීයං – මජ්ඣං.
3. බාරාණසිං – මජ්ඣං.
4. පෙතස්ස දිස්සථ – මජ්ඣං.
5. කෙසනිවාසිනො – ස්‍යා.
6. කෙ ච – මජ්ඣං.

## 3. 1

(කොලිය මහාමාත්‍ර:)

392. ප්‍රෙතය, තෝ මෙහි ගඞ්ගානදියෙහි නො බිඳෙන ජලයෙහි යෙහි. නග්න වූ තෝ ශරීරයෙහි පූර්වාර්ධයෙන් ප්‍රෙත නො වන්නකු හෙවත් දෙවියකු මෙන් වෙහි. මල්මාලා දරමින් ලකළ හිස් ඇත්තෙහි. තෝ කොහි යෙහි ද? තාගේ වාසය කොහි ද?

393. ඒ ප්‍රෙතයා මෙසේ කීයයි: වාසභ ගමට ද බරණැසට ද අතරෙහි වූ බරණැස අසල චුන්දත්ථික නම් ගමට යන්නෙමි.

394. කොලිය යි ප්‍රසිද්ධ ඒ මහාමාත්‍රයා ඔහු දැක අත්සුණු ද, බත් ද රන්වන් පිළිසඟළක් ද ප්‍රෙතයා උදෙසා දුන්නේ ය.

395. නැව් නවතා තිබෙන කලහි නැහැවි උවසුවකුහට හේ ඒවා දුන්නේ ය. කරනැවැමියාට දුන් කල්හි එකෙණෙහි ම ප්‍රෙත ශරීරයෙහි ද හඳනා පොරෝනා වස්ත්‍ර පහළ විය.

396. ඉක්බිති ඒ ප්‍රෙතයා මොනොවට හැඳගත් පිළී ඇතියේ මල්දම් දරනුයේ අලංකෘත විය. දක්ෂිණාර්හ ස්ථානයෙහි සිටි මේ දක්ෂිණාව යම් හෙයෙකින් ඒ ප්‍රෙතයාට ලැබුණේ ද එහෙයින් ප්‍රෙතයන් කෙරෙහි අනුකම්පායෙන් පුන පුනා පින්පෙත් දියයුතු ය.

397. සමහර ප්‍රෙතයෝ සුන්බුන් වැරහැලි ඇඳ සිටියහ. සමහරු කෙස්වලින් විළි වසා සිටියහ. ප්‍රෙතයෝ බත් සඳහා යති. එක් දිගෙකින් අනික් දිගකට යෙත්.

398. ඇතැම්හු අහර යදහා දුවැ ගොස් කිසි අහරක් හෝ පැනක් නො ලැබැ ම නවතිත්. ඔහු බඩසා ඇතියාහු මුසපත් වූවාහු භ්‍රාන්ත වැ බිමැ වියළී වැද හෙති

399. සමහරු ඒ ගියතැන්හි ප්‍රතිමුඛ කොට මෙහෙයන ලද්දවුන් මෙන් බිම වැටුණාහු වෙත්. ඔහු පෙර අත්බව්හි කුසල් නො කළාහු අව්වෙහි ලූ ගින්නෙන් දැවුණවුන් මෙන් බඩයයින් මහදුක් විඳිත්.

400. "අපි පෙර ඊර්ෂ්‍යාදි ලාමක ස්වභාවය ඇති ගෘහිණියන් වැ කුලමවුවරු වීමු. එසේ වූ අපි දෙයධර්මයන් ඇති කල්හි තමන්හට ප්‍රතිෂ්ඨාවක් නො කළම්හ.

401. බොහෝ වූ ආහාරපාන ද යහවනු ලැබීය. සුපිළිපන් පැවිද්දන්ට ද කිසි දැයක් නුදුනුම්හ.

402. අපි කුසල් දහම නො කටැටිවන්නමෝ අලසවූවමෝ මිහිරිඳුය කැමැත්තමෝ බොහෝ අනුභව කරන්නමෝ බත් පිඩෙක් පමණ දෙන්නමෝ ප්‍රතිග්‍රාහකයනට අවමන් කෙළෙමු.

403. තෙ සරා තා ච දසියො තානෙවාභරණානි නො,
තෙ අඤ්ඤෙ පරිචාරෙන්ති මයං දුක්ඛස්ස භාගිනො.

404. වෙණී වා අවඤ්ඤා හොන්ති රථකාරී ච දුබ්භිකා,
චණ්ඩාලි කපණා හොන්ති නහාපිකා[1] ච පුනප්පුනං.

405. යානි යානි නිහීනානි කුලානි කපණානි ච,
තෙසු තෙසෙව ජායන්ති එසා මච්ඡරිනො ගති.

406. පුබ්බෙච[2] කතකල්‍යාණා දායකා වීතමච්ඡරා,
සග්ගං තෙ පරිපූරෙන්ති ඔභාසෙන්ති ච නන්දනං.

407. වෙජයන්තෙ ච පාසාදෙ රමිත්වා කාමකාමිනො.
උච්චාකුලෙසු ජායන්ති සභොගෙසු තතො චුතා.

408. කූටාගාරෙ ච පාසාදෙ පල්ලඞ්කෙ ගොණකත්ථතෙ,
වීජිතඞ්ගා[3] මොරහත්ථෙහි කුලෙ ජාතා යසස්සිනො.

409. අඞ්කතො අඞ්කං ගච්ඡන්ති මාලාධාරී අලඞ්කතා,
ධාතියො උපතිට්ඨන්ති සායං පාතං සුඛෙසිනො.

410. නයිදං අකතපුඤ්ඤානං කතපුඤ්ඤානමෙවිදං,
අසොකං නන්දනං රම්මං තිදසානං මහාවනං.

411. සුඛං අකතපුඤ්ඤානං ඉධ නත්ථි පරත්ථ ච,
සුඛඤ්ච කතපුඤ්ඤානං ඉධ චෙව පරත්ථ ච,

412. තෙසං සහබ්‍යකාමානං කත්තබ්බං කුසලං බහුං,
කතපුඤ්ඤා හි මොදන්ති සග්ගෙ භොගසමඞ්ගිනො’ති.

අභිජ්ජමානපෙතවත්ථු පඨමං.

## 3. 2

413. කුණ්ඩිනගරියො[4] ථෙරො සානුවාසි නිවාසිනො,
පොට්ඨපාදෙති නාමෙන සමණො භාවිතින්ද්‍රියො.

414. තස්ස මාතා පිතා භාතා දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතා.

1. කප්පකා – මජසං.
2. පුබ්බෙ ච – මජසං.
3. බීජිතඞ්ගා – මජසං.
4. කුණ්ඩිනාගරියො – සීමු. i

403. අපගේ ඒ ගෙවල් ද ඒ දසිහු ද ඒ ආභරණ ද දැන් අපට නැත. ඒ ගෘහාදිය අන්හු පරිභොග කෙරෙත්. අපි දුකට ගිවි වූම්හ.

404. නින්දනීය වූ නළකරු වැ හෝ සොමමර වැ හෝ උපදිත්. මිත්‍රද්‍රොහි ද හෝ වෙත්. චණ්ඩාල කුල ඇති වැ හෝ ඉතා දිළිඳු වැ උපදිත්. නැහැව් වැ හෝ යළි යළි උපදිත්.

405. ඉතා දිළිඳු යම් යම පහත් කුලයෙෝ වෙත් නම් ඒ ඒ කුලයන්හි මැ උපදිත්. මෙ මසුරුසිනැතියහුගේ ස්වභාවයි.

406. පූර්වයෙහි වූකලි කළ කුසල් ඇති දුරුකළ මසුරු මල ඇති දයකයෝ වෙත් නම් ඔහු ස්වර්ග ලොකය පුරවති. නඳුනුයන ද බබුළුවත්.

407. විජයොත් පහයෙහි රමණය කොට කැමැති පරිදි කම් සැප විඳින ඔහු ඉන් සැවැ මහසැපත් ඇති උසස් කුලයන්හි උපදිත්.

408. මෙසේ උසස් කුලයන්හි උපන්නාහු කුළුගෙහි ද, පහයෙහි ද දික්ලොම් ඇති කොඳු පලස් අතුළ පලඟෙහි ද මොනරපිළින් යුත් වල්විදුනා වෙන් පවන් සලනුලබන සිරුරින් යුතු ව යසපිරිවරින් රමණය කරත්.

409. ඔහු මල්මාලා දරන්නාහු අලංකෘත වූවෝ ඇකයෙන් ඇකයට යත්. සැප පතන්නා වූ නිරිඹවූවරු උදේ සවස ඔවුනට උවැටන් කරත්.

410. ශොකරහිත වූ රම්‍ය වූ දෙවියන්ගේ මහවනය වූ මේ නඳුනුයන, පින් නො කළවුනට නො වේ. මෙය පින්කළවුනට ම ලැබිය හැකි ය.

411. පින් නොකළවුන්ට මෙලොව ද පරලොව ද සැපයක් නැත. පින් කළවුන්ට මෙලොවත් පරලොවත් සැප ම ලැබේ.

412. ඒ දෙවියන් හා යහභාවය කැමැතියන් විසින් බොහෝ කුසල කළයුතුයි. කළ පින් ඇතියාහු කම්සැපතින් යුතු වැ ස්වර්ගයෙහි සතුටු වෙති.

**අභිජ්ජමාන ප්‍රෙතවස්තු යි.**

## 3. 2

413. කුණ්ඩි නගරයෙහි උපන් සානුවාසී පව්වෙහි වෙසෙන නමින් පොට්ඨපාද නම වූ මහණ වැඩූ සද්ධාදි ඉන්ද්‍රිය ඇති (රහත්) ශ්‍රමණ කෙනෙකි.

414. උන්වහන්සේගේ මව ද පියා ද සොහොවුරා ද අගතියට ගියාහු යමලොව උපන්නාහු වෙත්. ඔහු පව්කම් කොට මෙලොවින් ප්‍රෙත ලොකයට ගියාහු වෙත්.

415. තෙ දුග්ගතා සූචිකට්ටා කිලන්තා නග්ගිනො කිසා,
උත්තසන්තා මහාතාසා න දස්සෙන්ති කුරූරිනො.

416. තස්ස භාතා විතරිත්වා නග්ගො එකපථෙකකො,
චතුකුණ්ඩිකො භවිත්වාන ථෙරස්ස දස්සයී තුමං.

417. ථෙරො චාමනසී කත්වා තුණ්හීභූතො අපක්කමි,
සො ච විඤ්ඤාපයී ථෙරං භාතා පෙතගතො අහං.

418. මාතා පිතා ච තෙ භන්තෙ දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතා.

419. තෙ දුග්ගතා සූචිකට්ටා කිලන්තා නග්ගිනො කිසා,
උත්තසන්තා[1] මහාතාසා[2] න දස්සෙන්ති කුරූරිනො.

420. අනුකම්පස්සු කාරුණිකො දත්වා අන්වාදිසාහි නො,
තව දින්නෙන දානෙන යාපෙස්සන්ති කුරූරිනො.

421. ථෙරො චරිත්වා පිණ්ඩාය භික්ඛූ අඤ්ඤෙ ච ද්වාදස,
එකජ්ඣං සන්නිපතිංසු භත්තවිස්සග්ගකාරණා.

422. ථෙරො සබ්බෙව තෙ ආහ යථා ලද්ධං දදථ මෙ,
සඞ්ඝභත්තං කරිස්සාමි අනුකම්පාය ඤාතිනං.

423. නිය්‍යාතයිංසු ථෙරස්ස ථෙරො සඞ්ඝං නිමන්තයී,
දත්වා අන්වාදිසි ථෙරො මාතු පිතු ච භාතුනො.

424. ඉදං මෙ ඤාතිනං හොතු සුඛිතා හොන්තු ඤාතයො,
සමනන්තරානුද්දිට්ඨෙ භොජනං උදපජ්ජථ.

425. සුචිං පණීතං සම්පන්නං අනෙකරසබ්‍යඤ්ජනං,
තතො උද්දිසයී භාතා වණ්ණවා බලවා සුඛී.

426. පහූතං භොජනං භන්තෙ පස්ස නග්ගාම්හසෙ මයං,
තථා භන්තෙ පරක්කම යථා වත්ථං ලභාමසෙ.

1. ඔත්තප්පන්තා - ස්‍යා.
2. මහත්තාසා - මජසං.

415. දුගතියට ගිය, හිදිකටුවැනි රළු වස්ත්‍රාදියෙන් පෙළුණු, ක්ලාන්ත වූ ගත හා සිතැති, නග්න වූ කෘශ සිරුරු ඇති බියෙන් තැති ගන්නා වූ හටගත් මහත් බිය ඇති, දරුණු පව් කළ ඒ ප්‍රෙතයෝ සිය සිරුරු නො දක්වත්.

416. උන්වහන්සේගේ සොහොයුරු තෙමේ බිය දුරු කොට නග්න වැ එකපදික මාර්ගයෙහි හුදෙකලා වැ චතුකුණ්ඩික වැ (දෙදණ දෙඅත යන සිවු අඟින් යන්නෙක් වැ) තෙරුන්ට තමා දැක්වී.

417. තෙරහු ද ඒ නො මෙනෙහි කොට මෙන් තුෂ්ණිම්භූත ව වැඩියහ. ඒ ප්‍රෙතයා ද ''මම ඔබ වහන්සේගේ සොහොයුරා වෙමි''යි තෙරුනට තමා දැන්වීය.

418. වහන්ස, ඔබ වහන්සේගේ මව ද පියා ද දුකට පත්වූවාහු යමලොවට ගියාහු ය. ඔහු පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියාහු ය.

419. දුගතියට ගිය, හිදිකටු වැනි රළු වස්ත්‍රාදියෙන් පෙළුණු, ක්ලාන්ත වූ ගත හා සිතැති, නග්න වූ, කෘශ ශරීර ඇති බියෙන් තැතිගන්නා වූ හටගත් මහත් බිය ඇති, දරුණු පව් කළ ඒ ප්‍රෙතයෝ සිය සිරුරු නො දක්වත්.

420. කාරුණික වූ ඔබ වහන්සේ අනුකම්පා කරන සේක්වා. දන් දී අපට පින් පමුණුවන සේක්වා, කෲරකම් ඇති ඔහු ඔබ වහන්සේ දුන් දනින් යැපෙන්නාහු ය.

421. තෙරහු ද අනෙක් භික්ෂූහු දෙළොස් නමක් ද පිඬු පිණිස හැසිර බත්කිස සඳහා එක් තැනකට රැස්වූහ.

422. සානුවාසී තෙරහු අන් තෙරුනට මෙසේ කීහ: ඔබ වහන්සේ ලැබූ යම් දැයක් වේ නම් එය මට දෙන්න. නෑයනට අනුකම්පා පිණිස සඟබතක් කරන්නෙමි.

423. (උන්වහන්සේ ද තමන් ලද දැය) තෙරුනට පවරා දුන්හ. තෙරහු සංඝයා නිමන්ත්‍රණය කළහ. දන් දී මවට ද පියාට ද සොහොයුරාට ද මෙසේ පින්පෙත් දුන්හ.

424–425. ''මේ පින මාගේ නෑයනට වේවා, (එ පිනෙන්) නෑයෝ සුවපත් වෙත්වා''යි පින් දීමට අනතුරුව ම නෑයනට පිරිසිදු වූ, ප්‍රණීත වූ, මිහිරි වූ නොයෙක් රසමසවුලෙන් යුත් දිව බොජුන් පහළ විය. ඉක්බිති ඔබගේ සොහොවුරා වර්ණවත් වැ බලවත් වැ සුවපත් වැ තමා දැක්වී ය.

426. ''වහන්ස, බලන සේක්වා, බොහෝ දිවබොජුන් ලදුමහ. එහෙත් අපි නග්න වම්හ. වහන්ස, අපි වස්ත්‍ර ලබමෝ නම් එබඳු උත්සාහයක් කරනසේක්වා.''

427. ථෙරො සඞ්ඝාරකූටමහා උච්චිනිත්වානනන්තකෙ,
පිලොතිකං පටං කත්වා සඞ්ඝෙ චාතුද්දිසෙ අද.

428. දත්වා අන්වාදිසි ථෙරො මාතු පිතු ච භාතුනො,
ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො.

429. සමනන්තරානුද්දිට්ඨෙ වත්ථානි උදපජ්ජිසුං[1],
තතො සුවත්ථවසනො ථෙරස්ස දස්සයීතු මං.

430. යාවතා නන්දරාජස්ස විජිතස්මිං පටිච්ඡද,
තතො බහුතරා භන්තෙ වත්ථානච්ඡාදනානි නො.

431. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
විපුලා ච මහග්ඝා ච තෙපාකාසෙව ලම්බරෙ.

432. තෙ මයං පරිදහාම යං යං හි මනසො පියං,
තථා භන්තෙ පරක්කම යථා ගෙහං[2] ලභාමසෙ.

433. ථෙරො පණ්ණකුටිං කත්වා සඞ්ඝෙ චාතුද්දිසෙ අද,
දත්වා අන්වාදිසි ථෙරො මාතු පිතු ච භාතුනො.

434. ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො,
සමනන්තරානුද්දිට්ඨෙ ඝරානි උදපජ්ජිසුං.

435. කූටාගාරනිවෙසනා විභත්තා භාගසො මිතා,
න මනුස්සෙසු ඊදිසා යාදිසා නො ඝරා ඉධ.

436. අපි දිබ්බෙසු යාදිසා තාදිසා නො ඝරා ඉධ,
දද්දල්ලමානා ආභන්ති සමන්තා චතුරො දිසා.

437. තථා භන්තෙ පරක්කම යථා පානං[2] ලභාමසෙ,
ථෙරො කරකං පූරෙත්වා සඞ්ඝෙ චාතුද්දිසෙ අද.

438. දත්වා අන්වාදිසි ථෙරො මාතු පිතු ච භාතුනො,
ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො.

439. සමනන්තරානුද්දිට්ඨෙ පානීයං උදපජ්ජථ,[3]
ගම්භීරා චතුරස්සා ච පොක්ඛරඤ්ඤො සුනිම්මිතා.

440. සීතොදිකා සුපතිත්ථා සීතා අප්පටිගන්ධියා,
පදුමුප්පලසඤ්ඡන්නා වාරිකිඤ්ජක්ඛපූරිතා.

1. උදපජ්ජිංසු – සිමු. i
2. පානිය – මජසං.
3. උපජ්ජථ – මජසං.

427. තෙරහු කසළගොඩින් ඉවත ලූ රෙදි කැබලි අවුළාගෙන රෙදි කැබැලිවලින් සිවුරක් කොට සිවුදිගින් වැඩි සඟනට දුන්හ.

428–429. එසේ දී තෙරහු එහි පින මවට ද පියාට ද සොහොවුරාට ද මෙසේ අනුමෝදන් කළහ: "මේ පින මාගේ නෑයනට වේවා එයින් නෑයෝ සුවපත් වෙත්වා"යි. පින් දීමට අනතුරුවැ ම නෑයනට වස්ත්‍ර උපන. ඉක්බිති පිරිසිදු වස්ත්‍රයෙන් සැරසුණු ප්‍රේතයා තෙරුනට තමා දැක්වී ය.

430. වහන්ස, නන්දරජහුගේ රටෙහි යම්තාක් වස්ත්‍රයෝ වෙත් ද, අප හඳනා පිළී එයටත් වඩා බොහෝ වේ.

431. කොසෙය්‍යවස්ත්‍ර හා කම්බිලි ද කොමුපිළී හා කපුපිළී ද යන මහත් වූ ද මාහැඟි වූ ද ඒ වස්ත්‍රයෝ අහසෙහි ම එල්බෙති.

432. යම් යම් වතක් (අපගේ) සිතට ප්‍රියවී නම් අපි ඒ වස්ත්‍ර ම හඳිම්හ. යම් හෙයෙකින් අපට ගෙයක් ලැබේ නම් එවැනි උත්සාහයක් කරන සේක්වා.

433. තෙරහු කොළ සෙවිලිකළ කුටියක් කොට සිවුදිගින් වැඩි සඟනට දුන්හ. (එසේ) දන් දී (එහි පින) තෙරහු මවුට ද පියාට ද සොහොයුරාට ද මෙසේ අනුමෝදන් කළහ.

434. "මාගේ මේ පින නෑයනට වේවා, නෑයෝ සුවපත් වෙත්වා"යි පින් දීමට අනතුරුව ම ඔවුනට නිවෙස් උපන.

435. මේ ප්‍රේතලොකයෙහි අපට යම්බඳු ආයත චතුරස්‍රාදීන් විභාග කරන ලද, කොටස් විසින් පිරිසිඳුනා ලද, කූටාගාර වූ ද තදනා වූ ද නිවෙසන සංඛ්‍යාත ගෘහයෝ ඇද්ද මෙබඳු ගෘහයෝ මිනිස් ලොවෙහි නැත.

436. දෙව්ලෝහි යම්බඳු පහයෝ වෙත් නම්, මේ ප්‍රේත ලොකයෙහි අපගේ එබඳු ගෘහයෝ ඉතා දිලිසෙමින් අවට සිව්දිගුන් බබුළුවත්.

437. වහන්ස, යම්සේ අපට පැන් ලැබේ නම් එබඳු උත්සාහයක් කරන්න. තෙරහු ඬබරාව පුරවා පැන් ගෙන සිවුදිගින් වැඩි සඟනට දුන්හ.

438. තෙරහු දන් දී එහි පින් මවුපියනට ද සොහොයුරාට ද, මෙසේ දුන්හ. "මේ පින මාගේ නෑයනට වේවා. නෑයෝ සුවපත් වෙත්වා"යි.

439. පින් දෙනු සමග ම (ප්‍රේතයනට) පැන් උපන. ගම්භීර වූ, චතුරස්‍ර වූ පුෂ්කරණීහු ද මොනොවට මැවුණාහ.

(කෙබඳු පොකුණු ද යත්:)

440. පහන් දිය ඇති, මනා තොට ඇති, සිහිල් වූ, සුවඳැති පියුමු-පුලෙන් ගැවසීගත්, මල්රේණු යුත් දියෙන් පිරුණු පොකුණු ය.

441. තත්ථ නහාත්වා පිවිත්වා ච ථෙරස්ස පටිදස්සයුං,
පහූතං පානියං භන්තෙ පාදා දුක්ඛං ඵලන්ති නො.

442. ආහිණ්ඩමානා ඛඤ්ජාම සක්ඛරෙ කුසකණ්ටකෙ,
තථා භන්තෙ පරස්සම යථා යානං ලභාමසෙ.

443. ථෙරො සිපාටිකං ලද්ධා සඞ්ඝෙ චාතුද්දිසෙ අදා,
දත්වා අන්වාදිසි ථෙරො මාතු පිතු ච භාතුනො.

444. ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො,
සමනන්තරානුද්දිට්ඨෙ පෙතා රථේනමාගමුං.

445. අනුකම්පිතම්හ භද්දන්තෙ භත්තේනච්ඡාදනෙන ච,
ඝරෙන පානදානෙන යානදානෙන චූභයං;
මුනිං කාරුණිකං ලොකෙ භන්තෙ වන්දිතුමාගතා'ති.

**සානුවාසී පෙතවත්ථු දුතියං.**

## 3. 3

446. වෙළුරියථම්භං රුචිරං පභස්සරං
විමානමාරුය්හ අනෙකචිත්තං,
තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
පථද්ධනි[1] පණ්ණරසෙව චන්දිමා[2]

447. වණ්ණෝපි තෙ කනකස්ස සන්නිභො
උත්තත්තරූපො භුසදස්සනීයො,
පල්ලඞ්කසෙට්ඨෙ අතුලෙ නිසින්නා
එකා තුවං නත්ථි ච තුය්හ සාමිකො.

448. ඉමා ච තෙ පොක්ඛරණියො සමන්තා
පහූතමාලා බහුපුණ්ඩරීකා,
සුවණ්ණචුණ්ණෙහි සමන්තමොත්ථතා
න තත්ථ පඞ්කො පණකො ච විජ්ජති.

449. හංසා චිමෙ දස්සනීයා මනොරමා
උදකස්මිං අනුපරියන්ති සබ්බදා,
සමය්‍ය වග්ගුපනදන්ති සබ්බෙ
බින්දුස්සරා දුන්දුභීනංව ඝොසො.

450. දද්දල්ලමානා යසසා යසස්සිනී
නාවාය ච ත්වං අවලම්බ තිට්ඨසි,
ආළාරපම්හෙ හසිතෙ පියංවදෙ
සබ්බඞ්ගකල්‍යාණි භුසං විරොචසි.

---

1. සමන්තකතො – සීමු. 1
2. චන්දෙ – සීමු. 1

441. එහි නහා පැන් බී තෙරුනට තමන් දැක්වූහ. (මෙසේ ද කීහ:) වහන්ස, බොහෝ වූ දිව පැන් ලැබිණ. අපගේ පාදයෝ දුකින් පැළෙත්.

442. වහන්ස, කුසකටු ඇති බොරළුකැට පොළොවෙහි ඇවිදින අපි කොරගසමින් යම්හ. යම් සේ අපි යානයක් ලබමු නම් එබඳු උත්සාහයක් කරන්න.

443. තෙරහු එක්පටවහන් සඟළක් ලැබ සිවුදිග සඟනට දුන්හ. එය දී එහි පින තෙරහු මවුට ද පියාට ද සොහොවුරාට ද මෙසේ අනුමෝදන් කළහ.

444. "මේ පින මගේ නෑයනට වේවා, නෑයෝ සුවපත් වෙත්වා"යි පින්දීම හා සමඟ ම ප්‍රෙතයෝ රියෙන් පැමිණියහ.

445. වහන්ස, ඔබ වහන්සේට යහපතක් වේවා, බත් දීමෙන් හා පිළීදීමෙන් ද ගෙවල් දීමෙන් සහ පැන් දීමෙන් ද යාන දීමෙන් හා යටකී බත් ආදි සිවුපසය දීමෙන් ද (අපි) අනුකම්පා කරන ලද්දම්හ. වහන්ස, ලොවැ කුළුණැති භික්ෂුවරයකු වූ ඔබ වහන්සේ වඳින්නට ආම්හ.

**සානුවාසී ප්‍රෙතවස්තු යි.**

## 3. 3

446. මහත් අනුභාව ඇති දේවිය, වෙරළුමිණි මුවා ටැම් ඇති මනරම් වූ පැහැ විහිදෙන, නොයෙක් සිතියම් ඇති විමනට නැඟී, ගුවන්තෙලෙහි පසළොස්වක්හි පුන් සඳ මෙන් ඒ විමනෙහි (තෝ) වෙසෙහි.

447. තිගේ සිරුරුපැහැය ද රන් බඳු වෙයි. උත්තප්ත ස්වර්ණයක් සෙයින් අතිශයින් දැකුම්කලු වෙයි. තෝ මහඟු පලඟෙක හුදෙකලාව හිඳිනෙහි ය. තිට සැමියෙක් නැත්තේ ද වෙයි.

448. තිගේ මේ පොකුණු හාත්පස බොහෝ මල් ඇත්තේ ය. බොහෝ හෙළපියුම් ඇත්තේ ය. රන්වැල්ලෙන් හාත්පස ගැවසී ගත්තේය. එහි මඩ හෝ දියසෙවෙල් නො පෙනේ.

449. දැකුම්කලු මනරම් මේ හංසයෝ ද හැමකල්හි දියෙහි ඔබ මොබ හැසිරෙත්. සියල්ලෝ ම එක් ව බින්දු ස්වරයෙන් යුතු ව මිහිඟුබෙර හඬක් මෙන් මිහිරි කොට නාද කෙරෙති.

450. යශස්විනිය, තෝ දිව්‍යර්ධියෙන් අතිශයින් දිලියෙමින් රුවන් නැවක එල්බ සිටිනෙහි. වෙළුණු නිල් වූ දික් වූ බැම ඇති සිනහ මුසු මුව ඇති ප්‍රියවචන කියන මනරම් සියලු අඟපසඟ ඇති දෙවඟන, තෝ අතිශයින් බබලහි.

451. ඉදං විමානං විරජං සමෙ ඨිතං
උය්‍යානවන්තං රතිනන්දිවඩ්ඪනං,
ඉච්ඡාමහං නාරි අනොමදස්සනෙ
තයා සහ නන්දනෙ ඉධ මොදිතුං.

452. කරොහි කම්මං ඉධ වෙදනීයං
චිත්තඤ්ච තෙ ඉධ නිහිතං භවතු;
කත්වාන කම්මං ඉධ වෙදනීයං
එවං ලච්ඡසි කාමකාමිනිං,

453. සාධූති සො තස්සා පටිස්සුණිත්වා
අකාසි කම්මං තහිං වෙදනීයං,
කත්වාන කම්මං තහිං වෙදනීයං
උපපජ්ජි සො මාණවො තස්සා සහව්‍යත’න්ති.

**රථකාරපෙතවත්ථු තතියං.**

**භාණවාරං දුතියං.**

## 3. 4

454. භුසානි එකො සාලිං පුනාපරො
අයඤ්ච නාරී සකමංසලොහිතං;
තුවඤ්ච ගූථං අසුචිං අකන්තිකං
පරිභුඤ්ජසි කිස්ස අයං විපාකො

455. අයං පුරෙ මාතරං හිංසෙසි[1] අයං පන කූටවාණිජො,
අයං මංසානි ඛාදිත්වා මුසාවාදෙන වඤ්චෙසි.[2]

456. අහං මනුස්සෙසු මනුස්සභූතා අගාරිණී සබ්බකුලස්ස ඉස්සරා,
සන්තෙසු පරිගුය්හාමි මා ච කිඤ්චි ඉතො අදං.

457. මුසාවාදෙන ඡාදෙමි නත්ථි එතං මම ගෙහෙ
සචෙ සන්තං නිගුය්හාමි ගූථො මෙ හොතු භොජනං.

458. තස්ස කම්මස්ස විපාකෙන මුසාවාදස්ස චූභයං,
සුගන්ධිසාලිනො භත්තං ගූථං මෙ පරිවත්තති.

459. අවඤ්ඣානි ච කම්මානි න හි කම්මං විනස්සති;
දුග්ගන්ධං කිමිජං මීළ්හං භුඤ්ජාමි ච පිවාමි චා’ති.

**භුසපෙතවත්ථු චතුත්ථං.**

1. හිංසති – සීමු. ii, ප.
2. වඤ්චෙති – සීමු. ii, ප.

451. මේ විමන ධූලි රහිත යැ, සමබිමැ පිහිටියේ යැ. ඇල්ම ද සතුට ද වඩන්නේ ය. ප්‍රියංකර උයනින් යුක්ත ය. අලාමක දැකුම් ඇති ස්ත්‍රිය, ති සමඟ මේ විමනෙහි හෝ සතුටු උපදවන උයනෙහි අභිරමණය කරන්නට කැමැත්තෙමි.

452. මෙ දෙව්විමනෙහි සැපවිපාක විඳීමට සුදුසු වූ පින්කමක් කරව. තොපගේ සිත ද මෙහි එලවන ලද (නමනලද) වේවා. මෙසේ මෙහි සැපවිඳීමට සුදුසු කුශලකර්‍මයක් කොට ''කම්සුව කැමැති මා ලබව''යි.

453. ඒ තරුණයා ''මැනවැ''යි ඇයට පිළිවදන් දී එහි විපාක විඳීමට සුදුසු පින්කම් කෙළේ ය. එහි සැපවිඳීමට සුදුසු පින්කම් කොට හේ ඒ දෙවඟනගේ සහභාවයට පැමිණියේ යි.

**රථකාර ප්‍රෙතවස්තු යි.**

## දෙවන බණවර යි.

## 3. 4

454. ''එකෙක් (ගිනිගත්) හැල්වී බොල් හිස විසුරුවා ගනී. යළි අනෙකා මුගුරෙකින් සියහිස බිඳගනී. මේ ස්ත්‍රිය ද සිය මස් ලේ අනුභව කරයි. තෝ ද අපිරිසිදු වූ පිළිකුල් කටයුතු වූ අශුචි අනුභව කරහි. මේ කවර පවක විපාකයක් වේ දැ''යි.

455. මෙතෙම පෙර අත්බැව්හි දී මවට හිංසා කෙළේ ය. මේ (දෙවැන්නා) වූ කලී හොර වෙළෙඳෙකි. මෝ තොමෝ මස් කා මුසවායෙන් වඤ්චා කළාය.

456. ''මම මිනිස්ලොවැ මනුෂ්‍යස්ත්‍රියක් වැ සියලු කුලයට අධිපති වූ ගෘහිණියක් වූමු. ඉල්වූ දේ ඇති කල්හිත් සැඟවූමු. මෙයින් කිසිවකුත් නුදුන්මු.

457. ඒ මාගේ ගෙයි නැතැ යි බොරුවෙන් සැඟවූමු. ''ඉදින් මම ගෙහි ඇති දේ නැතැ යි සැඟවූමු නම් මාගේ අහර අශුචි වේවා''යි සපථ කළමු.

458. ඒ කර්‍මය සහ මෘෂාවාදය යන දෙක්හි ම විපාකයෙන් සුවඳහැල් සාලේ බත මට අශුචි බවට පෙරළෙයි.

459. කර්‍මයෝ වඳ නො වෙත් (විපාක දෙත්) ම ය. සහෙතුක වැ රැස්කළ කර්‍මය විපාක නො දී නො වැනසේ දුගඳ වූ පණුවන් හටගත් අශුචි මම කමි. එසේ ම බොමි.

**භුස ප්‍රෙතවස්තු යි.**

## 3. 5

460. අච්ඡෙරරූපං සුගතස්ස ඤාණං
සත්ථා යථා පුග්ගලං බ්‍යාකාසි.
උස්සන්නපුඤ්ඤාපි භවන්ති හෙකෙ
පරිත්තපුඤ්ඤාපි භවන්ති හෙකෙ.

461. අයං කුමාරො සීවථිකාය ඡඩ්ඩිතො
අඞ්ගුට්ඨස්නෙහෙන යාපෙති රත්තිං,
න යක්ඛභූතා න සිරිංසපා[1] වා
විහෙඨයෙය්‍යුං කතපුඤ්ඤං කුමාරං.

462. සුනඛාපිමස්ස පලිහිංසු පාදෙ
ධඞ්කා සිගාලා පරිවත්තයන්ති,
ගබ්භාසයං පක්ඛිගණා හරන්ති
කාකා පන අක්ඛිමලං හරන්ති.

463. න යිමස්ස රක්ඛං විදහිංසු කෙචි
න ඔසධං සාසපධූපනං වා,
නක්ඛත්තයොගම්පි න අග්ගහෙසුං
න සබ්බධඤ්ඤානිපි ආකිරිංසු.

464. එතාදිසං උත්තමකිච්ඡපත්තං
රත්තාභතං සීවථිකාය ඡඩ්ඩිතං,
නොනීතපිණ්ඩං ව පවෙධමානං
සසංසයං ජීවිතසාවසෙසං.

465. තමද්දසා දෙවමනුස්සපූජිතො
දිස්වා ච තං බ්‍යාකරි භූරිපඤ්ඤො,
අයං කුමාරො නගරස්සිමස්ස
අග්ගකුලිනො භවිස්සති භොගතො[2] ච.

466. කිස්ස වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
එතාදිසං ව්‍යසනං පාපුණිත්වා
තං තාදිසං පච්චනුභොස්සතිද්ධිං.

467. බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස[3]
පූජං අකාසි ජනතා උළාරං,
තත්‍රස්ස චිත්තස්සහු[4] අඤ්ඤථත්තං
වාචං අභාසි ඵරුසං අසබ්භං.

468. සො තං විතක්කං පටිවිනොදයිත්වා.[5]
පීතිං පසාදං පටිලද්ධා පච්ඡා,
තථාගතං ජෙතවනෙ වසන්තං
යාගුයා උපට්ඨාසි සත්තරත්තං.

---

1. සරිසපා – මජසං.
2. භොගවා – සීමු i
3. සඞ්ඝස්ස – මජසං.
4. චිත්තස්ස – සීමු i
5. විනොදයිත්වා – මජසං.
පවිනොදයිත්වා – සීමු i

## 3. 5

460. ''සමහර පුහුලෝ උත්සන්න කුසල ඇත්තෝ වෙත්. සමහරු සුළුපින් ඇත්තෝ වෙත්''යයි ශාස්තෲන් වහන්සේ යම්සේ පුද්ගලයකු ප්‍රකාශ කළ සේක් ද, සුගතයන් වහන්සේගේ ඒ නුවණ ආශ්චර්‍ය්‍ය ජනක ය.

461. සොහොනෙහි දමූ මේ කුමරා ඇඟිල්ලෙන් වැගුරුණු කිරෙන් රාත්‍රියෙහි යැපෙයි. කළ පින් ඇති (මේ) කුමරු යක්ෂයෝ හෝ සර්පයෝ නො පෙළන්නාහ.

462. සුනඛයෝ ද මොහුගේ දෙපා දිවින් ලෙවූහ. කවුඩෝ ද සිවල්ලු ද මොහු ඔබමොබ පෙරළත්. පක්ෂිගණයා ගැබ්මල ඉවත්කරති. කපුටෝ වනාහි ඇස්මල දුරු කෙරෙත්.

463. කිසි මිනිස් කෙනෙක් මෙ කුමරහට රැකවරණ නො කළහ. බෙහෙත් හෝ අබදුම් දීම හෝ නො කළහ. ඔහු උපන් නකත් යොග ද නො ගත්හ. (රැකවරණය සඳහා) හැල් ආදී සියලු ධාන්‍ය ද නො විසුරූහ.

464–465. රාත්‍රියෙහි ගෙනයන ලදු ව සොහොනෙහි දමූ අතිශයින් දුකට පත් වූ වෙඩරු පිඩක් වැනි වූ වෙව්ලන, ජීවත්වේ ද නො වේ ද යි සැක කටයුතු වූ ජීවිතය පමණක් ඉතිරි වූ මෙබඳු වූ ඒ කුමරා දෙව්මිනිසුන් විසින් පුදන ලද මහත්ප්‍රඥා ඇති බුදුහු දුටහ. ඔහු දැක ද ''මේ කුමරා භොග සම්පත් වශයෙන් ද මෙනුවර උසස් කුලවතෙක් වන්නේ ය''යි පැවසූහ.

466. මේ කුමරුගේ ව්‍රතසමාදානය කුමක් ද? බ්‍රහ්මචර්‍යය හෝ කුමක් ද? මේ මොනොවට පුරුදු කළ කෙබඳු ව්‍රතයක විපාකයක් ද? මෙබඳු වූ විපතකට පැමිණ පෙරකී එබඳු දිව්‍යසම්පත් කෙසේ වළඳන්නේ ද?

467. ජනසමූහයා බුදුපාමොක් මහසඟනට මහත් පූජාවක් කළහ. එහි දී මොහුගේ සිතට විපිළිසරක් ඇති විය. මේ පුද්ගල බුදුපාමොක් සඟනට නො සැබි රළුවදන් කී ය.

468. පසුව හේ ඒ විතර්ක සිතිවිල්ල දුරු කොට ප්‍රීතිය හා ප්‍රසාදය උපදවාගෙන දෙව්රමැ වසන බුදුනට සත්දිනක් උවටැන් කෙළේ ය.

469. තස්ස වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
එතාදිසං බ්‍යසනං පාපුණිත්වා
තං තාදිසං පච්චනුභොස්සතිද්ධිං.

470. ඨත්වාන සො වස්සසතං ඉධෙව
සබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො,
කායස්ස භෙද අභිසම්පරායං
සහව්‍යතං ගච්ඡති වාසවස්සා'ති.

**කුමාරපෙතවත්ථු පඤ්චමං.**

## 3. 6

471. නග්ගා දුබ්බණ්ණරූපාසි කිසා ධමනිසන්ථතා,
උපඵාසුලිකෙ කිසිකෙ කානු ත්වං ඉධ තිට්ඨසි?

472. අහං භදන්තෙ පෙතීම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

473. කිනනු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පෙතලොකං ඉතො ගතා.

474. අනාවටෙසු තිත්ථෙසු විචිනිං අඩ්ඪමාසකං,
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකාසිමත්තනො.

475. නදිං උපෙමි තසිතා රිත්තකා පරිවත්තති,
ඡායං උපෙමි උණ්හෙසු ආතපො පරිවත්තති.

476. අග්ගිවණ්ණො ච මෙ වාතො දහන්තො උපවායති;
එතඤ්ච භන්තෙ අරහාමි අඤ්ඤඤ්ච පාපකං තතො.

477. ගන්ත්වාන හත්ථිනිපුරං වජ්ජෙසි මය්හ මාතරං,
ධීතා ච තෙ මයා දිට්ඨා දුග්ගතා යමලොකිකා.

478. පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතා,
අත්ථි ච මෙ එත්ථ නික්ඛිත්තං අනක්ඛාතඤ්ච තං මයා.

469. ඒ වනාහි මොහුගේ ව්‍රත සමාදනය ද බ්‍රහ්මචය‍ර්‍ය්‍ය ද විය. මෙබඳු විපතකට පැමිණත් එබඳු වූ ඒ දිවසැපත් නැවත වළඳන්නේ ය යන මෙය මොනවට සිදු කරන ලද ඒ කර්මයාගේ විපාක යි.

470. ඒ කුමර මේ මනුලොව අවුරුදු සියයක් කල් සියලු කම් සැපතින් යුක්ත ව සිට කය බිඳීමෙන් හෙවත් මරණින් පසු පුනර්භවයෙහි දී සක් දෙවිඳුගේ (පුතකු වී) සහබවට යන්නේ ය.

**කුමාර ප්‍රෙතවස්තුව යි.**

## 3. 6

471. තෝ නග්න යැ. දුර්වර්ණ රූප ඇතියහු කෘශ වෙහි, ඉල්පුණු නහර ඇතියහු, උස් වැ මතු වූ ඉළ ඇති කෘශ වූ මෙහි සිටින තෝ කවරහු ද?

472. ස්වාමීනි, මම යමලොවැ උපන් දුකට පත් ප්‍රෙතියක්මු. පව්කම් කොටැ මෙලොවින් ප්‍රෙතලොකයට ගියා වමු.

473. එම්බල ප්‍රෙතිය, කය වචන සිත යන තිදෙරින් තී විසින් කිනම් පවක් කරන ලද ද, කිනම් පව්කමක විවායෙන් මෙලොවින් ප්‍රේත ලෝකයට ගියහු ද?

474. කිසිවකු විසින් අනාවෘත තීර්ත්ථයන්හි අඩමස්සක් පමණ සෙවීමි. (නොහොත්) කිසිවකු විසින් එළැඹීම නො වැළැක්වූ, පුණ්‍ය තීර්ථ බඳු මහණ බමුණන් ඇති කල්හි, ඔවුනට කිසිවක් නොදී, අඩමස්සක් රැස් කෙළෙමි. දන්දීමට දේ ඇති කල්හිත් තමහට පිහිට වූ පිනක් නො කෙළෙමි.

475. ඒ මම පවසින් යුතු ව ගඟට එළැඹියෙම් නම් ගඟ දියෙන් හිස් ව (වාලුකමාත්‍ර බවට) පෙරළේ. උෂ්ණ කාලයන්හි සෙවණකට එළැඹියෙම් නම් අව්ව පෙරළා එයි.

476. සුළඟ ද ගිනි සෙයින් ම මා සිරුර දවමින් හමයි. වහන්ස, තෙල පිපාසාදි දුකට ද එයට වඩා දරුණු අනික් දුකකට ද මම නිස්සෙමි.

477–478. හත්ථිනිපුරයට ගොස් මාගේ මවට මෙසේ කියව: ''තීගේ දියණියෝ පව්කම කොට මෙලොවින් (චුත වැ) ප්‍රෙතලොකයට ගියාහු දුක්පත් ව යමලොව වසන්නාහු මා විසින් දක්නා ලදහ. එහි මා විසින් සුරක්ෂිත කොට තබනලද වස්තුව ඇති. එය මා විසින් කිසිවකුට නො කියන ලද ද වෙයි.

479. චත්තාරි සතසහස්සානි පල්ලඞ්කස්ස ච හෙට්ඨතො,
තතො මෙ දානං දදතු[1] තස්සා ච හොතු ජීවිකා.

480. දානං දත්වා ච මෙ මාතා දක්ඛිණං අනුදිස්සතු,[2]
තදහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී.

481. සාධූති සො පටිස්සුත්වා ගන්ත්වාන හත්ථිනිං පුරං
අවොච තස්සා මාතරං,
ධීතා ච තෙ මයා දිට්ඨා දුග්ගතා යමලොකිකා.

482. පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතා,
සා මං තත්ථ සමාදපෙසි වජ්ජෙසි මය්හ මාතරං.

483. ධීතා ච තෙ මයා දිට්ඨා දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතා.

484. අත්ථි ච මෙ එත්ථ නික්ඛිත්තං අනක්ඛාතඤ්ච තං මයා,
චත්තාරි සතසහස්සානි පල්ලඞ්කස්ස ච හෙට්ඨතො;
තතො මෙ දානං දදතු තස්සා ච හොතු ජීවිකා.

485. දානං දත්වාන මෙ මාතා දක්ඛිණං අනුදිස්සතු,[3]
තදහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී.

486. තතො හි සා දානමදා දත්වා ච තස්සා දක්ඛිණමාදිසි,
පෙතී ච සුඛිතා ආසි සරීරං චාරුදස්සන'න්ති.

**සෙරිණීපෙතවත්ථු ඡට්ඨං.**

## 3. 7

487. නරනාරිපුරක්ඛතො යුවා රජනීයෙහි කාමගුණෙහි සොභසි,
දිවසං අනුභොසි කාරණං කිමකාසි පුරිමාය ජාතියා.

488. අහං රාජගහෙ රම්මෙ රමණීයෙ ගිරිබ්බජෙ,
මිගලුද්දො පුරෙ ආසිං ලොහිතපාණී දාරුණො,

489. අවිරොධකරෙසු පාණිසු පුථුසත්තෙසු පදුට්ඨමානසො,
විචරිං අතිදාරුණො සදා[4] පරහිංසාය රතො අසඤ්ඤතො.

490. තස්ස මෙ සහායො සුහදො[5] සද්ධො ආසි උපාසකො,
සොපි මං අනුකම්පන්තො නිවාරෙසි පුනප්පුනං.

1. දදන්තු – සිමු ii
2. ආදිස්සතු මෙ – සිමු ii
අනුදිස්සති – සිමු i
3. අනුදිච්ඡතු – මජසං. අනවාදිස්සතු – සයා
4. සද – මජසං.
5. සුහදයො – මජසං.

479. පලඟ යට සාරලක්ෂයක් ධනය ඇත. ඒ වස්තුවෙන් මා උදෙසා දන් දේවා. මගේ මවගේ ද ජීවිකාව වේවා.

480. මගේ මව දන් දී එහි පින් මට පමුණුවාවා. එකල මම සියලු කම්සැපතින් සමෘද්ධ ව සුවපත් වන්නෙමි.

481. හේ ''මැනවැ''යි පිළිවදන් දී හත්පිනිපුරයට ගොස් ඇයගේ මවට මෙසේ කී ය. යමලොව ඉපිද දුකට පත් වූ තොපගේ දූ මා විසින් දක්නා ලදූ.

482. පව් කම් කොට මෙලොවින් සැව ප්‍රෙත ලොකයට ගියා වූ ඕ තොමෝ ''මාගේ මවට කියව''යි, එකරුණෙහි මා සමාදන් කරවූ ය.

483. දුකට පත්වූ, යමලොව උපන්; තොපගේ දූ මා විසින් දක්නා ලදූ. ඕ (තොමෝ) පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියා ය.

484. ''මා මෙහි තැන්පත් කළ ධනය ඇත. එය මවිසින් කිසිවකුට ද නො කියන ලද පලඟ යට සාරලක්ෂයක් වස්තුව ඇත. එයින් මා උදෙසා දන් දේවා. මැණියන්ගේ ජීවිකාව ද වේවා.

485. මගේ මව දන් දී එහි පින මට අනුමෝදන් කෙරේවා. එකල මම සියලු කම්සැපතින් දියුණු වැ සුවපත් වන්නෙමි.

486. ඉක්බිති ඇගේ මව දන් දුන්නා ය. දන් දී එහි පින ඒ ප්‍රෙතියට අනුමෝදන් කළා ය. ඒ ප්‍රෙතිය ද සුවපත් වූවා ය. ඇගේ සිරුර දැකුම්කලු විය.

**සෙරිණී ප්‍රෙතවස්තු යි.**

## 3. 7

487. දෙව්පුත් දෙව්දූන් විසින් පිරිවරන ලද තරුණ වූ තෙපි සිත්කලු වූ පස්කම් සැපතින් යුතු වැ (රාත්‍රියෙහි) බබළන්නහු ය. එහෙත් දවල් කාලයෙහි නොයෙක් කම්කටොලු විඳින්නහු ය. තෙපි පෙරදැහි කිනම් පවක් කළහු ද?

488. මම අතීතජාතියෙහි රම්‍ය වූ සිත් පිනවන ගිරිව්‍රජ නම වූ රජගහ නුවර ලෙයින් තෙත් අත් ඇති දරුණු වූ මුවවැද්දෙක් වීමි.

489. එකල ඉතා දරුණු වූ පරහිංසාවෙහි ඇලුණු නො දමුණු මම කිසිවකුට හිංසාවක් නැති ප්‍රාණිසංඛ්‍යාත වූ බොහෝ සාමුව ආදි සතුන් කෙරෙහි දුෂ්ට සිතින් යුක්ත වැ හැසුරුණෙමි.

490. ඒ මට යහපත් සිත් ඇති සැදැහැවත් උවසුවෙක් යහළු ව සිටියේ ය. හේ මට අනුකම්පා කෙරෙමින් පුන පුනා මා පවින් වැළැක්වී ය.

491. මාකාසි පාපකං කම්මං මා තාත දුග්ගතිං අගා,
සචෙ ඉච්ඡසි පෙච්ච සුඛං විරම පාණවධා අසංයමා.

492. තස්සාහං වචනං සුත්වා සුඛකාමිස්ස හිතානුකම්පිනො,
නාකාසිං සකලානුසාසනිං චිරපාපාභිරතො අබුද්ධිමා.

493. සො මං පුන භූරිසුමෙධසො අනුකම්පාය සංයමෙ නිවෙසයි,
සචෙ දිවා හනසි පාණිනො අථ තෙ රත්තිං භවතු සඤ්ඤමො.

494. ස්වාහං දිවා හනිත්වා[1] පාණිනො විරතො රත්තිමහොසිං සඤ්ඤතො,
රත්තාහං පරිවාරෙමි දිවා ඛජ්ජාමි දුග්ගතො.

495. තස්ස කම්මස්ස කුසලස්ස අනුභොමි රත්තිං අමානුසිං,
දිවා පටිහතාව කුක්කුරා උපධාවන්ති සමන්තා ඛාදිතුං.

496. යෙ ච තෙ සතතානුයොගිනො ධුවං පයුත්තා සුගතස්ස සාසනෙ,
මඤ්ඤාමි තෙ අමතමෙව කෙවලං අධිගච්ඡන්ති පදං අසඞ්ඛත'න්ති.

මිගලුද්දකපෙතවත්ථු සත්තමං.

## 3. 8

497. කුටාගාරෙ ච පාසාදෙ පල්ලඞ්කෙ ගොණකත්ථකෙ,
පඤ්චඞ්ගිකෙන තුරියෙන රමසි සුප්පවාදිතෙ,

498. තතො රත්‍යා ව්‍යවසානෙ සුරියස්සුග්ගමනම්පති,
අපවිද්ධො සුසානස්මිං බහුදුක්ඛං නිගච්ඡසි.

499. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසි.

500. අහං රාජගහෙ රම්මෙ රමණීයෙ ගිරිබ්බජෙ,
මගලුද්දො පුරෙ ආසිං ලුද්දො චාසිමසඤ්ඤතො.

501. තස්ස මෙ සහායො සුහද්දො සද්ධො ආසි උපාසකො,
තස්ස කුලූපගො භික්ඛු ආසි ගොතමසාවකො.

502. සොපි මං අනුකම්පන්තො නිවාරෙසි පුනප්පුනං,
මාකාසි පාපකං කම්මං මා තාත දුග්ගතිං අගා.

1. හනිත්වා, – මජසං.

491. දරුව, පව්කම් නො කරව, දුගතියට නො යව, පරලෙව්හි දී සුව කැමැත්තෙහි නම් දුශ්ශීල්‍ය වූ ප්‍රාණවධයෙන් වෙන් වෙව.

492. බොහෝ කල් පවෙහි ඇලුණු බුද්ධි නැති මම සුව කැමැති හිතානුකම්පා ඇති ඔහුගේ වචනය අසා ඒ සියලු අනුශාසනය නො කෙළෙමි.

493. පුළුල් නුවණ ඇති ඒ උවසු තෙම යළිත් අනුකම්පායෙන් මා සුචරිතයෙහි පිහිටුවිය. ''ඉදින් තෙපි දහවල්හි සතුන් මරන්නහු නම් වැළි රාත්‍රියෙහි තොපගේ සංවරය වේ වා''යි.

494. ඒ මම දහවල්හි සතුන් නසා රයෙහි පණිවායෙන් වෙන් ව සංයත වීමි. එහෙයින් මම රයෙහි දිවසැප විඳිමි. දහවල්හි දුකට පත් වැ දුකින් පෙළෙමි.

495. ඒ කුශලකර්‍මයෙහි විපාකයෙන් රාත්‍රියෙහි දිවසැප වළඳමි. දහවල්හි සුනඛයෝ බද්ධ වෛර ඇත්තවුන් මෙන් මා සපා කැමට හාත්පසින් දිවැ එත්.

496. යම් පුරුෂ කෙනෙක් බුදු සස්නෙහි ස්ථිරවශයෙන් අධිශීලාදියෙහි යෙදී නිරතුරු භාවනාදියෙහි යුක්ත වෙත් ද, ඔහු හුදෙක් අසංස්කෘත පද නම් වූ නිවනට පැමිණෙති මම සිතමි.

**මිගලුද්දක ප්‍රෙතවස්තු යි.**

## 3. 8

497. දෙව්මුවා කුළුගෙහි හා පහයෙහි ද දික්ලොම් ඇති කොඳු පලස් අතුළ පලඟෙහි පසඟතුරුයෙන් මැනැවින් වැයෙද්දී තෝ රමණය කෙරෙහි.

498. ඉන්පසු රය අවසන්හි හිරු උද වූ කල්හි සොහොනෙහි දමන ලදුවැ බොහෝ දුකට පැමිණෙහි.

499. කා විසි මුනි තිදෙරින් තා විසින් කිනම් පවක් කරන ලද ද? කිනම් පව්කමක විවායෙන් (තෝ) මේ දුකට පැමිණියෙහි ද?

500. මම පෙරදූයෙහි රම්‍ය වූ සිත්කලු වූ ගිරිව්‍රජ නම් වූ රජගහ නුවර දරුණු වූ අසංවර ඇති මුවවැද්දෙක් වීමි.

501. ඒ මට හිතවත් වූ සැදැහැති උවසුවෙක් මිතුරු විය. ගෞතම ශ්‍රාවක වූ භික්ෂුනමක් ඒ උවසුවාගේ කුලුපගයෙක් විය.

502. ඒ භික්ෂුනම ද මට අනුකම්පා කරන්නේ දරුව පව්කම් නො කරව, දුගතියට නො යවයි පුනපුනා මා පවින් වැළකී ය.

503. සචෙ ඉච්ඡසි පෙච්ච සුඛං විරම පාණවධා අසංයමා,
තස්සාහං වචනං සුත්වා සුඛකාමස්ස හිතානුකම්පිනො.

504. නාකාසිං සකලානුසාසනිං චිරපාපාභිරතො අබුද්ධිමා,
සො මං පුන භූරිසුමෙධසො අනුකම්පාය සංයමෙ නිවෙසයි.

505. සචෙ දිවා හනසි පාණිනො අථ තෙ රත්තිං භවතු සංයමො.
ස්වාහං දිවා හන්ත්වා පාණිනො විරතො රත්තිමහොසිං සංයතො.

506. රත්තාහං පරිචාරෙමි දිවා ඛජ්ජාමි දුග්ගතො,
තස්ස කම්මස්ස කුසලස්ස අනුභොමි රත්තිං අමානුසිං;
දිවා පටිහතාව කුක්කුරා උපධාවන්ති සමන්තා ඛාදිතුං.

507. යෙ ච තෙ සතතානුයොගිනො ධුවයුත්තා සුගතස්ස සාසනෙ,
මඤ්ඤාමි තෙ අමතමෙව කෙවලං අධිගච්ඡන්ති
පදං අසඞ්ඛත'න්ති,

දුතිය මිගලුද්දකපෙතවත්ථු අට්ඨමං.

## 3. 9

508. මාලී කිරිටී කෙයූරී ගත්තා තෙ චන්දනුස්සද,
පසන්නමුඛවණ්ණොසි සුරියවණ්ණොව සොභසි.

509. අමානුසා පාරිසජ්ජා යෙ තෙමෙ පරිචාරකා,
දසකඤ්ඤාසහස්සානි යා තෙමා පරිචාරකා.

510. තා කම්බුකෙයූර ධරා කඤ්චනාවෙලභූසිතා,
මහානුභාවොසි තුවං ලොමහංසනරූපවා;
පිට්ඨිමංසානි අත්තනො සාමං උක්කච්ච ඛාදසි.

511. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පිට්ඨිමංසානි අත්තනො සාමං
උක්කච්ච ඛාදසි.

512. අත්තනොහං අනත්ථාය ජීවලොකෙ අචාරිසං,
පෙසුඤ්ඤමුසාවාදෙන නිකතිවඤ්චනාය ච.

513. තත්ථාහං පරිසං ගන්ත්වා සච්චකාලෙ උපට්ඨිතෙ,
අත්ථං ධම්මං නිරංකත්වා[1] අධම්මමනුවත්තිසං.

1. නිරාකත්වා - සිමු

503. "ඉදින් පරලොවැ සැප කැමැත්තෙහි නම් අසංයම වූ ප්‍රාණ වධයෙන් වෙන් වෙව." මාගේ සැපය කැමැති වූ මට හිතවත් වැ අනුකම්පා කරන ඒ භික්ෂූහුගේ වචනය අසා.

504. බොහෝ කලක් පව්කම්හි ඇලුණු අනුවණ වූ මම ඒ භික්ෂූහුගේ සියලු ම අනුශාසනය නො කෙළෙමි. පුළුල් නුවණ ඇති ඒ භික්ෂූ මට අනුකම්පායෙන් යළිත් මා සංවරයෙහි පිහිටුවී ය.

505. "ඉදින් දහවල්හි සතුන් නසන්නෙහි නම් ඉක්බිති රාත්‍රියෙහි තාගේ සංවරය වේවා," ඒ මම දහවල් සතුන් නසා රාත්‍රියෙහි පවින් වැළැකුණෙමි සංවර වීමි.

506. රැයෙහි මම දිවසැප විඳිමි. දහවල්හි දුකට පත් වැ ජරදුක් විඳිමි. ඒ කුශලකර්මයාගේ විපාකය නිසා රැයෙහි දෙව් සැප විඳිමි. දවහල්හි බද්ධවෛර ඇත්තවුන් මෙන් සුනඛයෝ මා කැමට හාත්පසින් දිවැ එත්.

507. යම් කෙනෙක් වනාහි බුදුසස්නෙහි අධිශීලාදියෙහි නිතර දැඩි සේ යෙදෙත් ද ඔහු හුදෙක් ලොව් සැප හා මුසු නොවූ අසංස්කෘත පද නම් වූ නිවනට ම පැමිණෙත් යයි සිතමි.

දෙවැනි මිගලුද්දක ප්‍රෙතවස්තු යි.

## 3. 9

508. තෙපි දිවමල් දරන හිස්වෙළුමින් යුත්, අඟුපළඳනා ඇතියහු ශරීරාවයවයෝ ගැල්වූ සඳුන් විලෙවුන් ඇත්තාහු ය. තෙපි ප්‍රසන්න වූ මුඛවර්ණ ඇතියවු. ලහිරු මෙන් පැහැයෙන් බබළන්නහු ය.

509. (තොපගේ) යම් මේ උපස්ථායක කෙනෙක් වෙත් ද, ඔවුහු දිව්‍යපර්ෂද්හි වූවෝ වෙති. තොපගේ යම් මේ උපස්ථායිකා කෙනෙක් වෙත් ද ඔවුහු දිව්‍ය කන්‍යාවෝ දසදහසෙකි.

510. ඔවුහු සක්වළලු හා අඟුපළඳනා දරති. රන්මුවා මුදුන් මල් කඩින් සැරසුණෝ වෙත්. තෙපි ලොමුදහ ගන්වන පියවි ඇතියහු, මහත් අනුභාව ඇතියවූ. ඒ තෙපි තමාගේ පිටුමස් තෙමේ ම කඩා කන්නහු ය.

511. "තා විසින් කයින් වචනයෙන් මනසින් කිනම් පවක් කරන ලද ද? කිනම් පව්කමක විපාකයෙන් තමාගේ පිටුමස් තෙමේ ම කඩා ගෙන කන්නෙහි ද"යි.

512. මම, මිනිස් ලොවැ සිටිය දී කේලාම් කීමෙන් සහ බොරු කීමෙන් ද කපටිභාවයෙන් සහ වඤ්චාවෙන් ද අවැඩ පිණිස ම හැසුරුණෙමි.

513. එහි දී මම පිරිස්මැදට ගොස් ඇත්ත කියන්නට සුදුසු කාලය පැමිණි විට හිතකර කාරණය හැර දමා අධර්මය අනුව ගියෙමි.

514. එවං සො ඛාදතත්තානං යො හොති පිට්ඨිමංසිකො,
යථාහං අජ්ජ ඛාදමි පිට්ඨිමංසානි අත්තනො,

515. තයිදං තයා නාරද සාමං දිට්ඨං
අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං,
මා පෙසුනං මා ච මුසා අභාණි
මා ඛොසි පිට්ඨිමංසිකො තුව'න්ති.

කූටවිනිච්ඡයිකපෙතවත්ථු නවමං.

## 3. 10

516. අන්තලික්ඛස්මිං තිට්ඨන්තො දුග්ගන්ධො පූති වායසි,
මුඛඤ්ච තෙ කිමයො පූතිගන්ධං ඛාදන්ති කිං කම්ම මකාසි පුබ්බෙ

517. තතො සත්ථං ගහෙත්වාන ඔක්කන්තන්ති පුනප්පුනං.
ඛාරෙන පරිප්ඵොසිත්වා ඔක්කන්තන්ති පුනප්පුනං.

518. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසීති.

519. අහං රාජගහෙ රම්මෙ රමණීයෙ ගිරිබ්බජෙ,
ඉස්සරො ධනධඤ්ඤස්ස සුපහූතස්ස මාරිස.

520. තස්සායං මෙ හරියා ච ධීතා ච සුණිසා ච මෙ,
තා මාලං උප්පලඤ්චාපි පච්චග්ඝඤ්ච විලෙපනං
ථූපං හරන්තියො වාරෙසිං තං පාපං පකතං මයා.

521. ඡළාසීතිසහස්සානි මයං පච්චත්තවෙදනං,
ථූපපූජං විවණ්ණෙත්වා පච්චාම නිරයෙ භුසං.

522. යෙ ච ඛො ථූපපූජාය වත්තන්තෙ අරහතො මහෙ.
ආදීනවං පකාසෙන්ති විවෙචයෙථ[1] නෙ තතො.

523. ඉමා ච පස්ස ආයන්තියො මාලාධාරී අලඞ්කතා,
මාලාවිපාකං අනුභොන්ති[2] සමිද්ධා තා යසස්සිනියො.

524. තඤ්ච දිස්වාන අච්ඡෙරං අබ්භුතං ලොමහංසනං,
නමො කරොන්ති සප්පඤ්ඤා වන්දන්ති තං මහාමුනිං.

525. සො හි නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
ථූපපූජං කරිස්සාමි අප්පමත්තො පුනප්පුනන්ති'.

ධාතුවිවණ්ණකපෙතවත්ථු දසමං.

## චූළවග්ගො තතියො.

තස්සුද්දානං :–

අභිජ්ජමානො කොණ්ඩඤ්ඤො රථකාරී භුසෙන ච,
කුමරො ගණිකා චෙව ද්වෙ ලුද්ද පිට්ඨපූජයො;
වග්ගො තෙන පවුච්චතී'ති.

1. විවෙචයෙථ – මජසං.
2. අනුභොන්තියො – මජසං.

514. යම්සේ අද මම මාගේ ම පිටුමස් කම් ද, එසේ ම යමෙක් අනුන් පිටුමස් කන්නේ හෙවත් අනභිමුඛයෙහි අනුනට නින්ද කරන්නේ වේ ද, හේ මෙසේ ම තමා කයි.

515. නාරද හිමියෙනි, තොප විසින් මාගේ රූපය තමන් ම දක්නා ලද, කුළුණැති පරවැඩෙහි සමත්, බුදු පසේ බුදු ආදි උතුමෝ යම් අවවාදයක් වදළාහු නම් එය ම මම තොපට කියමි. පිසුනුබස් හෝ මුසවා නො කියන්න. එසේ කොට මා මෙන් පිටුමස් කන්නකු නො වන්න.

**නවවැනි කූටවිනිච්ඡයික ප්‍රෙතවස්තු යි.**

## 3. 10

516. අහසෙහි සිටින තෝ කුණු වූ දුගඳ හමහි. දුගඳැති තාගේ මුහුණ ද පණුවෝ කති. පෙර අත්බව්හි තෝ කිනම් පවක් කෙළෙහි ද?

517. එයින් මතු මුවාත් ඇති අවි ගෙන (පව්කමින් මෙහෙයවන ලද සත්ත්වයෝ) (තාගේ මුව) පුනපුනා කපත්. ක්ෂාර ජලයෙන් ඉස ඉස නැවත නැවතත් කපත්.

518. කයින් වචනයෙන් මනසින් කිනම් පවක් කරන ලද ද? කිනම් පව්කමක විපාකයෙන් මේ දුකට පැමිණියෙහි ද?

519. නිදුකාණන් වහන්ස, මම රම්‍ය වූ සිත්කලු වූ ගිරිව්‍රජ නම් වූ රජගහ නුවර ඉතා බොහෝ වූ ධනධාන්‍යයට අධිපතියෙක් වීමි.

520. ඒ මාගේ (පෙර අත්බැව්හි) මෝ බිරිඳ යැ මෝ දියැණි යැ මෝ මාගේ යෙහෙළි යැ. ඔවුන් මල් ද උපුල් ද අලුත් විලෙවුන් ද සෑ පුදට ගෙන යනුවන් මම වැළැක්වීමි. මා විසින් ඒ පව්කම් කරන ලද.

521 ගණනින් සයාසූදහසක් පමණ වූ අපි මෙසේ සෑපුදෙහි නුගුණ කියා වෙන් වෙන් වැ විඳිනු ලබන මහත් දුක් ඇති වැ නිරය වැනි ප්‍රෙත ලොකයෙහි දැඩි දුක් විඳිමු.

522. අර්හත් වූ සම්බුදුන්ගේ සෑපුද පිළිබඳ උළෙල පවත්නා කල්හි යම් කෙනෙක් එහි දෙස් කියත් නම් ඔවුහු ඒ පිනෙන් බැහැර වෙත් යැ යි දැනගන්න.

523. දිවමල් දරමින්, මනා ලෙස සැරසුණු, මල් පිදීමේ විපාකය විඳිමින් අහසින් එන මේ දෙවඟනන් ද බලව. පිරිවර ඇති ඔහු දෙව් සැපතින් සමෘද්ධයහ.

524. ආශ්චර්‍ය්‍ය වූ අද්භූත වූ, ලොමුදහ ගන්වන ඒ මහත් විපාක විශෙෂය දැක පැනවත්හු ඒ මහාමුනිවරයා නමස්කාර කරති, වඳිති.

525. ඒ මම මෙයින් චුත වැ ගොස් මිනිසත් බව ලැබ නො පමා වූයෙම් පුනපුනා සෑපුද කරන්නෙමි.

**ධාතුවිවණ්ණක ප්‍රෙතවස්තු යි.**

**තුන්වැනි සූළුවග යි.**

**එහි උද්දානය :**

අභිජ්ජමාන ප්‍රෙතවස්තුව ද කුණ්ඩී නුවර විසූ සානුවාසී තෙරුන් දුටු ප්‍රෙතයන්ගේ වස්තුව ද රථකාර සහ භුස ප්‍රෙත වස්තුව ද සෙරිණී නම් ගණිකා ප්‍රෙතියගේ වස්තුව ද මිගලුද්දක ප්‍රෙතවස්තු දෙක ද පිටමස් කන කූට විනිශ්චයික ප්‍රෙතයාගේ සහ චෛත්‍ය පූජාවෙහි දෙස් කී ධාතුවිවණ්ණක ප්‍රෙතයාගේ වස්තුව ද යන මෙයින් සමන්විත හෙයින් මෙය චූළවග්ග යි කියනු ලැබේ.

## 4. 1

526. වෙසාලී නාම නගරත්ථි වජ්ජීනං
තත්ථ අහු ලිච්ඡවි අම්බසක්ඛරො,
දිස්වාන පෙතං නගරස්ස බාහිරං
තත්ථෙව පුච්ඡිත්ථ තං කාරණත්ථිකො.

527. සෙය්‍යා නිසජ්ජා නයිමස්ස අත්ථි
අභික්කමො නත්ථි පටික්කමො වා[1],
අසිතපීතඛායිතවත්ථභොගා
පරිචාරිකා සාපි[2] ඉමස්ස නත්ථි

528. යෙ ඤාතකා දිට්ඨසුතා සුහජ්ජා
අනුකම්පකා යස්ස පුබ්බෙ අහෙසුං[3],
දට්ඨුම්පි තෙ දනි න තං ලභන්ති
විරාධිතත්තො[4] හි ජනෙන තෙන.

529. න ඔග්ගතත්තස්ස භවන්ති මිත්තා
ජහන්ති මිත්තා විකලං විදිත්වා,
අත්ථඤ්ච දිස්වා පරිවාරයන්ති
බහූ ච මිත්තා උග්ගතත්තස්ස හොන්ති.

530. නිහීනත්තො සබ්බභොගෙහි කිච්ඡො
සම්මක්ඛිතො සම්පරිභින්නගත්තො,
උස්සාවබින්දූව පලිප්පමානො[5]
අජ්ජ සුවෙ ජීවිතස්සූපරොධො.

531. එතාදිසං උත්තමකිච්ඡපත්තං
උත්තාසිතං පුචිමන්දස්ස සූලෙ,
අථ ත්වං කෙන වණ්ණෙන වදෙසි යක්ඛ
ජීව භො ජීවිතමෙව සෙය්‍යොති.

532. සාලොහිතො එස අහොසි මය්හං
අහං සරාමි පුරිමාය ජාතියා,
දිස්වා ච මෙ කාරුඤ්ඤමහොසි රාජ
මා පාපධම්මො නිරයං පතායං.

533. ඉතො චුතො ලිච්ඡවි එස පොසො
සත්තුස්සදං නිරයං ඝොරරූපං,
උපපජ්ජති දුක්කතකම්මකාරී
මහාභිතාපං කටුකං භයානකං

1. පටික්කමො ච - මජ්සං.
2. පරිහරණා - පු., පරිචාරණා - කෙචි.
3. අහෙසුං පුබ්බෙ - මජ්සං.
4. විරාජිතත්තා - මජ්සං.
5. පලිම්පමානො - මජ්සං.

## 4. 1

526. වැදැරජුන්ගේ විශාලා නම් නුවරෙක් ඇත. එහි ''අම්බසක්ඛර'' නම් ලිච්ඡවි රජෙක් විය. හේ නුවරින් පිටත ප්‍රේතයකු දැක කරුණු දැනගනු කැමැත්තේ එතැන දී ම ඒ ප්‍රේතයාගෙන් මෙසේ ඇසී ය:

527. මොහුට ශයනය කිරීමක් ද හිඳීමක් ද නැත. ඉදිරිගමනක් හෝ ආපසු ගමනක් හෝ නැත. ආහාර පාන ඛාද්‍ය වස්ත්‍ර පරිභොග යන යම් පරිහරණයක් වේ නම් එ ද මොහුට නැත.

528. මොහුට පෙර අනුකම්පා කළ යම් නෑකෙනෙක් ද දුටුවා වූත් ඇසුවාවූත් යම් මිතුරු කෙනෙක් ද වූහු නම් ඔහු ද දැන් මොහු දක්නටවත් නො ලබත්. ඒ සියලු ජනයා විසින් හැර දැමූ අත්බවක් ඇත්තේ ම ය.

529. ධනහීනයාට මිතුරෝ නැත. මිතුරෝ භොගවිනාශ වූ පුරුෂයා ද අත්හැර යෙත්. මිතුරෝ ධනය දැක ඒ ධනවතා පිරිවරා ගනිත්. ධනයෙන් උසස්වූවහුට මිතුරෝ බොහෝ වෙත්.

530. සියලු සැපතින් පිරිහුණු ආත්මභාවයක් ඇති, දුකට පැමිණි, ලෙයින් වැකුණු සිරුරින් යුත්, හුලින් බිඳුණු ගතින් යුත්, (මොහුගේ) ජීවිතයාගේ නිරොධය තණ අග රැඳුණු පිනි බිඳක් මෙන් අද හෝ හෙට වන්නේ ය.

531. එම්බල යක්ෂය, මෙබඳු දැඩිදුකට පත් වැ, කොසඹහුලෙහි නංවන ලද්දහුට ''පින්වත, ජීවත්වෙව, ජීවිතය ම තට ශ්‍රෙෂ්ඨ යයි කුමක් නිසා තෝ කියහි ද?

532. (පින්වත් රජතුමනි) මේ පුරුෂයා මාගේ සහලේනෑයෙක් විය. මම පෙරජාතිය සිහි කරමි. මොහු දැක, ''පව්ගති ඇති මේ පුරුෂයා අපායෙහි නොවැටේවා''යි මට කරුණාවක් උපන.

533. ලිච්ඡවි රජතුමනි, පව්කම් කළ මේ පුරුෂයා මෙලොවින් චුත වැ ගොස් පාපකාරී ජනයන්ගෙන් නොහොත් සත්වැදෑරුම් වධ-බන්ධනයන්ගෙන් පිරුණු, දරුණු ස්වභාව ඇති, මහත් දුකින් යුත්, කටුක වූ, භයානක වූ මහානිරයෙහි උපදින්නේ ය.

534. අනෙකභාගෙන ගුණෙන සෙය්‍යො
අයමෙව සූලො නිරයෙන තෙන,
එකන්තදුක්ඛං කටුකං භයානකං
එකන්තතිප්පං නිරයං පතායං.

535. ඉදඤ්ච සුත්වා වචනං මමෙසො
දුක්ඛූපනීතො විජහෙය්‍ය පාණං,
තස්මා අහං සන්තිකෙ න භණාමි
මා මෙ කතො ජීවිතස්සූපරොධො.

536. අඤ්ඤාතො එසො පුරිසස්ස අත්ථො
අඤ්ඤම්පි ඉච්ඡාමසෙ පුච්ඡිතුං තුවං,
ඔකාසකම්මං සචෙ නො කරොසි
පුච්ඡාම් තං න ච නො කුජ්ඣිතබ්බං.

537. අද්ධා පටිඤ්ඤා මෙ තද අහු
නාචික්ඛනා අප්පසන්නස්ස හොති,
අකාමා සද්ධෙය්‍යවචොති කත්වා
පුච්ඡස්සු මං කාමං යථා විසය්හං

538. යං කිඤ්චාහං චක්ඛුනා පස්සිස්සාමි
සබ්බම්පි තාහං අභිසද්දහෙය්‍යං,
දිස්වාන තං නොපි චෙ සද්දහෙය්‍යං
කරෙය්‍යාසි මෙ යක්ඛ නියස්සකම්මං.

539. සච්චප්පටිඤ්ඤා තව මෙසා හොතු
සුත්වාන ධම්මං ලභ සුප්පසාදං,
අඤ්ඤත්ථිකො නො ච පදුට්ඨචිත්තො
යං තෙ සුතං අසුතං චාපි ධම්මං
සබ්බං ආචික්ඛිස්සං යථා පජානං

540. සෙතෙන අස්සෙන අලඞ්කතෙන
උපයාසි සූලාවුතකස්ස සන්තිකෙ,
යානං ඉදං අබ්භුතං දස්සනෙය්‍යං
කිස්සෙතං කම්මස්ස අයං විපාකො.

541. වෙසාලියා තස්ස නගරස්ස මජ්ඣෙ
චික්ඛල්ලමග්ගෙ නරකං අහොසි,
ගොසීසමෙකාහං පසන්නචිත්තො
සෙතං ගහෙත්වා නරකස්මිං නික්ඛිපිං.

1. පරිඤ්ඤාතමෙ තං – මජ්සං.

534. මෙතෙමේ එකාන්තදුක් වූ කටුක වූ බිය උපදවන,නියත මහාදුක් ඇති මහානිරයෙහි වැටෙන්නේ ය. ඔහුට ඒ මහානිරයට වඩා නොයෙක් ගුණයෙන් මේ හුල ම උතුම් වෙයි.

535. මේ තෙමේ මාගේ මේ වදන් අසා දුකට පැමිණියේ ප්‍රාණය හරින්නේ ය. එහෙයින් මා විසින් මොහුගේ ජීවිත නිරොධයක් නොකරන ලද්දේ වේවයි සිතා එය මම මොහු ඉදිරියෙහි නො කියමි.

536. මේ පුරුෂයා පිළිබඳ ඒ කාරණය මා විසින් දනගන්නා ලද. ඉදින් තෝ අපට අවසර දෙන්නෙහි නම් අනෙක් ප්‍රශ්නයක් ද අසන්නට කැමැත්තෙමු. එය ද විචාරමි. (ඒ ගැන) අපට නො කිපිය යුතු යි.

537. එද (අපේ ප්‍රථම දර්ශනයෙහි) එකාන්තයෙන් මාගේ ප්‍රතිඥා-වක් විය. (එනම්) අප්‍රසන්නයාහට නො කිය යුතුය යනු යි. දන් වූ කලි මම තොපගේ නො කැමැත්තෙන් ඇදහිය යුතු වචන ඇත්තෙක් වීමි. එහෙයින් තෙපි මාගෙන් කැමැති සේ විචාරව. මම එය හැකි පමණින් ඔබට කියන්නෙමි.

538. යක්ෂය, මම යම්කිසිවක් ඇසින් දක්නෙම් ද ඒ සියල්ල ම මම අදහන්නෙමි, ඉදින් ඇසින් දක එය නො අදහන්නෙම් නම් මට නිග්‍රහ කර්‍මය කරව.

539. ඔබතුමාගේ මේ ප්‍රතිඥාව මට සැබෑ වේවා. දනගනු කැමැති ව ප්‍රදුෂ්‍ය වූ සිතින් තොර වැ මා කියන ධර්‍මය අසා ප්‍රසාදය ලබන්න. ඔබතුමන් විසින් අසන ලද්ද වූ ද, නො අසන ලද්ද වූ ද යම් ධර්‍මයක් වේ ද, ඒ සියල්ල දන්නා සැටියෙන් කියන්නෙමි.

540. තෙපි ශ්වෙතවර්ණ අශ්වයානයෙකින් හුල උන්නහු සමීපයට පැමිණෙවු ය. මේ යානය අද්භූත ය. දකුම්කලු ය. මේ කිනම් කර්‍ම-යක විපාකයක් ද?

541. විශාලා නම් ඒ නගරමධ්‍යයෙහි මඩසහිත මාර්ගයෙහි නරාවළක් විය. මම පහන් සිතැතියෙම් සුදු වූ එක් ගවහිසක් ගෙන ඒ නරාවළෙහි බැහුයෙමි.

542. එතස්මිං පාදනි පතිට්ඨපෙත්වා
මයඤ්ච අඤ්ඤෙ ච අතික්කමිම්හ,
යානං ඉදං අබ්භුතං දස්සනෙය්‍යං
තස්සෙව කම්මස්ස අයං විපාකො.

543. වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති
ගන්ධො ච තෙ සබ්බදිසා පවායති,
යක්ඛිද්ධිපත්තොසි මහානුභාවො
නග්ගො චාසි කිස්ස අයං විපාකො.

544. අක්කොධනො නිච්චපසන්නචිත්තො
සණ්හාහි වාචාහි ජනං ලපෙමි,[1]
තස්සෙව කම්මස්ස අයං විපාකො
දිබ්බො මෙ වණ්ණො සතතං පභාසති.

545. යසඤ්ච කිත්තිඤ්ච ධම්මෙ ඨිතානං
දිස්වාන මන්තෙමි පසන්නචිත්තො,
තස්සෙව කම්මස්ස අයං විපාකො
දිබ්බො මෙ ගන්ධො සතතං පවායති.

546. සහායානං තිත්ථස්මිං නහායන්තානං[2]
ථලෙ ගහෙත්වා නිදහිස්ස දුස්සං,
ඛිඩ්ඩත්ථිකො නො ච පදුට්ඨචිත්තො
තෙනම්හි නග්ගො කසිරා ච වුත්ති

547. යො කීළමානො පකරොති පාපං
තස්සීදිසං[3] කම්මවිපාකමාහු
අකීළමානො පන යො කරොති
කිං තස්ස කම්මස්ස විපාකමාහු.

548. යෙ දුට්ඨසඞ්කප්පමනා මනුස්සා
කායෙන වාචාය ච සඞ්කිලිට්ඨා,
කායස්ස භෙදා අභිසම්පරායං
අසංසයං තෙ නිරයං උපෙන්ති.

549. අපරෙ පන සුගතිං ආසමානා
දානෙ රතා සංගහිතත්තභාවා,
කායස්ස භෙදා අභිසම්පරායං
අසංසයං තෙ සුගතිං උපෙන්ති.

1. උපෙමි – මජසං.
2. නහායන්තානං – මජසං.
3. තස්සෙදිසං – මජසං.

542. අපි ද සෙස්සෝ ද ඒ මතුයෙහි පා තබා ගමන් කෙළෙමු. මේ යානය අද්භූත යැ. දකුම්කලු යැ. ඒ කර්‍මයාගේ මෙ විපාක වෙයි.

543. යක්ෂය, තාගේ සිරුරු පැහැය ද සියලු දිගුන් බබුළුවයි. තාගේ ශරීර සුගන්ධය ද සියලු දිගුන් හමා යයි. දිව්‍ය ඍද්ධියට පැමිණි තෝ මහත් අනුභාව ඇත්තෙහි ය. යළි නිර්වස්ත්‍ර වෙහි. මේ කවර කර්‍මයක්හුගේ විපාක වේ ද?

544. (මම) ක්‍රොධ නොකරන්නෙමි නිති පහන්සිත් ඇතියෙමි සිලුටු බසින් ජනයාට කථා කෙරෙමි. ඒ පින්කමෙහි මේ විපාක වෙයි. දිව්‍යමය වූ මාගේ ශරීරවර්ණය නිතර බබළයි.

545. ධර්‍මයෙහි පිහිටියවුන්ගේ යශස ද කීර්තිය ද දක පහන් සිතැති-යෙමි එය ගුණවශයෙන් කියමි. ඒ කර්මයාගේ මේ විපාක වෙයි. මා සිරුරින් දිව්‍යමය ගන්ධය නිතර හමයි.

546. තොටෙහි නහන යහළුවන්ගේ වස්ත්‍ර ගොඩ සඟවා තැබුවෙමි. එය සිනහ පිණිස ය. ප්‍රදුෂ්ට සිතින් (පැහැරගන්නා අදහසින්) නො වේ. ඒ පවින් නග්න වූයෙමි. මාගේ දිවිපැවැත්ම ද දුක් සහිත විය.

547. යමෙක් කෙළි අදහස් පෙරදැරි ව පවක් කෙරේ නම් ඔහුට මෙබඳු කර්මවිපාකයක් වේ ය යි පණ්ඩිතයෝ කියති. යමෙක් කෙළි අදහසක් නොමැති ව දූෂිත සිතින් පව් කෙරේ නම් ඒ පාපකර්මයාගේ විපාකය කොපමණ කටුක වේ දැ යි (පණ්ඩිතයෝ) කීහු ද?

548. දූෂිත වූ චිත්තසංකල්පනා ඇති යම් මනුෂ්‍ය කෙනෙක් (ප්‍රාණ ඝාතාදියෙන්) කයින් හා වචනයෙන් කිලුටු වූවෝ වෙත් ද, ඔහු මරණින් මතු නිසැක ව ම නරකයට පැමිණෙත්.

549. සුගතිය පතන්නා වූ අන්‍යයෝ වූකලි, දීමෙහි ඇලුණු, සංග්‍රහ කරන ලද ආත්මභාව ඇත්තෝ වෙත් ද, ඔහු කායභෙදයෙන් පරලෙව්හි නිසැකව ම සුගතියට පැමිණෙත්.

550. තං කින්ති ජානෙය්‍යං අහං අවෙච්ච
කල්‍යාණපාපස්ස අයං විපාකො,
කිං වාහං දිස්වා අභිසද්දහෙය්‍යං
කො වාපි මං සද්දහාපෙය්‍ය එතං

551. දිස්වා ච සුත්වා වා[1] අභිසද්දහස්සු
කල්‍යාණපාපෙ උභයෙ අසන්තෙ
කල්‍යාණපාපස්ස අයං විපාකො,
සියා නු සත්තා සුගතා දුග්ගතා වා.

552. නො චෙත්ථ කම්මානි කරෙය්‍යුං මච්චා
කල්‍යාණපාපානි මනුස්සලොකෙ,
නාහෙසුං සත්තා සුගතා දුග්ගතා වා
හීනප්පණීතා ච මනුස්සලොකෙ.

553. යස්මා ච කම්මානි කරොන්ති මච්චා
කල්‍යාණපාපානි මනුස්සලොකෙ,
තස්මා හි සත්තා සුගතා දුග්ගතා වා
හීනප්පණීතා ච මනුස්සලොකෙ

554. ද්වයජ්ජ කම්මානං විපාකමාහු
සුඛස්ස දුක්ඛස්ස ච වෙදනීයං,
තා දෙවතායො පරිචාරයන්ති
පච්චන්ති[2] බාලා ද්වයතං අපස්සිනො.

555. නමත්ථි කම්මානි සයං කතානි
දත්වාපි මෙ නත්ථි සො ආදිසෙය්‍ය,
අච්ඡාදනං සයනමථන්නපානං
තෙනම්හි නග්ගො කසිරා ච වුත්ති.

556. සියා නු ඛො කාරණං කිඤ්චි යක්ඛ
අච්ඡාදනං යෙන තුවං ලභෙථ,
ආචික්ඛ මෙ තං යදත්ථි හෙතු
සද්ධායිතං හෙතු වචො සුණොම.

557. කප්පිතකො[3] නාම ඉධත්ථි භික්ඛු
ඣායී සුසීලො අරහා විමුත්තො.
ගුත්තින්ද්‍රියො සංවුතපාතිමොක්ඛො
සීතීභූතො උත්තමදිට්ඨිපත්තො.

558. සඛිලො වදඤ්ඤූ සුවචො සුමුඛො
ස්වාගමො සුප්පටිමුත්තකො ච,
පුඤ්ඤස්ස ඛෙත්තං අරණවිහාරී
දෙවමනුස්සානඤ්ච දක්ඛිණෙය්‍යො.

1. සුත්වා – සීමු i.
2. පච්චන්ති – සීමු i.
3. කප්පිතකො – මජසං.

550. තා විසින් පින්පව් පිළිබඳ යම් විපාකයක් කියන ලද ද, එය මම කෙසේ දැන අදහන්නෙම් ද? මම කිනම් නිදසුනක් දැක එය ප්‍රතිඥා කරන්නෙම් ද? යළි, කවර පණ්ඩිතයෙක් එය මට විශ්වාස කරවන්නේ ද?

551. කුශලාකුශල කර්‍මයාගේ විපාකය මේ යයි ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක හෝ අසා එය අදහවු. පින්පව් යන දෙවැදෑරුම් කර්‍මයන් නොමැති කල සත්ත්වයෝ සුගතියට හෝ ගියෝ ය. දුගතියට හෝ ගියෝ ය යි මෙය කෙසේ වන්නේ ද?

552. මේ මිනිස්ලොවැ මිනිස්සු පින්පව් නොකරන්නාහු නම්, සුගතියට හෝ දුගතියට ගිය සත්වයෝ නො වෙත්. මිනිස්ලොවැ උසස් පහත් අය ද නො වෙති.

553. යම් හෙයෙකින් මිනිස් ලොවැ මිනිස්සු පින්පව් කරන්නාහු ද එහෙයින් සුගතියට සහ දුගතියට ගිය සත්වයෝ ද වෙත්. මිනිස් ලොවැ උස්පහත් අය ද වෙත්.

554. සැප – දුක් විඳීමට සුදුසු වූ කුශලාකුශල කර්‍මයන්ගේ දෙවැදෑරුම් විපාකය දැන් කීහු. එනම්: පින්කළාහු දෙවියෝ වැ පසිඳුරන් පිණවත්. අඥානයෝ කුශලාකුශලයන්හි ඵල නො දක්නාහු පව්කම් කොට නිරයෙහි පැසෙත්.

555. තමා විසින් පෙර කළ පින්කම් ද මට නැත. යලි, වස්ත්‍ර ද සෙනසුන් ද ආහාරපාන ද (යමෙක්) දන් දී ඒ පින මට පමුණුවන්නේ නම් එබන්දෙක් ද මට නැත. එහෙයින් මම නග්න ද දුක් සහිත පැවතුම් ඇත්තෙම් ද වෙමි.

556. ප්‍රෙතය යම් හෙයෙකින් තෝ වස්ත්‍ර ලබන්නෙහි නම් එබඳු වූ කිසි කාරණයක් වන්නේ ද, ඉදින් එබඳු හෙතුවක් ඇත් නම් විශ්වාස කළ හැකි වූ ඒ හෙතුව මට කියව. ඒ හෙතු සහිත වචනය මම ශ්‍රවණය කරමි.

557. මේ සමීපයෙහි ධ්‍යාන කරන සුලු වූ සිල්වත් වූ කප්පිනක නම් රහත් භික්ෂුනමක් ඇත. හේ කෙලෙසුන්ගෙන් මිදුණේ ය. සංවෘත ඉන්ද්‍රිය ඇත්තේ ය. සුරක්ෂිත ප්‍රාතිමොක්ෂ ඇත්තේ ය. (ක්ලෙශ දරථාපගමයෙන්) සිහිල් ය. උතුම් සම්‍යග්දෘෂ්ටියෙන් යුක්ත ය.

558. මොළොක් ගුණ ඇති දන් දෙනසුලු මනා වචන ඇති නොහොත් කීකරු වූ යහපත් මුහුණක් ඇති මැනැවින් දත් ආගම ධර්‍මය ඇති පමණ දැන කථා කරන පින් කෙතක් වූ මෛත්‍රීවිහරණ ඇති ඒ මහණ දෙව්මිනිසුන් ගේ දක්ෂිණාවට සුදුස්සෙකි.

559. සන්තො විධූමො අනීඝො නිරාසො
මුත්තො විසල්ලො අමමො අවඞ්කො,
නිරූපධි සබ්බපපඤ්චඛීණො
තිස්සො විජ්ජා අනුප්පත්තො ජුතිමා.

560. අප්පඤ්ඤාතො දිස්වාපි න සුජානො
මුනීති නං වජ්ජිසු වොහරන්ති,
ජානන්ති තං යක්ඛභූතා අනෙජං
කල්‍යාණධම්මං විචරන්ති[1] ලොකෙ.

561. තස්ස තුවං එකං යුගං දුවෙ වා
මමුද්දිසිත්වාන සචෙ දදෙථ,
පටිග්ගහීතානි ච තානි අස්සු
මමඤ්ච පස්සෙථ සන්නද්ධදුස්සං.

562. කස්මිං පදෙසෙ සමණං වසන්තං
ගන්ත්වාන පස්සෙමු මයං ඉදනි,
සමජ්ජ[2] කඞ්ඛං විචිකිච්ඡිතඤ්ච
දිට්ඨිවිසූකානි ච කො විනොදයෙ.[3]

563. එසො නිසින්නො කපිනච්චනායං
පරිවාරිතො දෙවතාහි බහූහි.
ධම්මිං කථං භාසති සච්චනාමො
සකස්මිමාචෙරකෙ අප්පමත්තො.

564. තථාහං කස්සාමි ගන්ත්වා ඉදනි
අච්ඡාදයිස්සං සමණං යුගෙන,
පටිග්ගහීතානි ච තානි අස්සු
තුවඤ්ච පස්සෙමු සන්නද්ධදුස්සං.

565. මා අක්ඛණෙ පබ්බජිතං උපාගමි
සාධු වො ලිච්ඡවි නෙස ධම්මො,
තතො ච කාලෙ උපසඞ්කමිත්වා
තත්ථෙව පස්සාහි රහො නිසින්නං.

566. තථාති වත්වා අගමාසි තත්ථ
පරිවාරිතො දසගණෙන ලිච්ඡවි,
සො තං නගරං උපසඞ්කමිත්වා
වාසූපගච්ඡිත්ථ සකෙ නිවෙසනෙ.

1. විචරන්තං – සීමු i
2. යො මජ්ජ – මජ්සං.
3. විනොදෙය්‍ය මෙ – මජ්සං.

559 සන්හුන් කෙලෙස් ඇති, පහවූ මිථ්‍යාවිතර්ක ධූම ඇති, නිදුක් වූ, ආශා රහිත, සියලු භවදුකින් මිදුණු, පහවූ රාගාදිහුල් ඇති, මමත්වයෙන් තොර වූ, අවංක වූ, උපධි රහිත වූ, නැසූ සියලු ප්‍රපඤ්ච ඇති, ත්‍රිවිද්‍යාවට පිළිවෙළින් පැමිණි, ඥාන ද්‍යුතියෙන් දීප්තිමත් වූ,

560. අප්‍රකට වූ, දක ද ''මෙබඳු කෙනෙකැ''යි සුවසේ නො දත හැකි භික්ෂුනමකි හේ. වැදැරජුන් අතර මුනිවරයෙකැ යි කියනු ලැබේ. ලොකයෙහි යක්ෂ භූතයෝ ද තෘෂ්ණා රහිත වූ ශීලාදි යහපත් ගුණැති ඒ භික්ෂු නම ''රහත්'' යයි දනිත්. ගුණ කියමින් හැසිරෙත්.

561. තෙපි ඒ කප්පිනක මහතෙරුන්හට එක් පිළී සඟළක් හෝ දෙකක් හෝ මා උදෙසා දෙන්නේ නම් ඒ තෙරුන් විසින් ද ඒ පිළී පිළිගන්නා ලද්දේ නම් එවිට මනාව හැඳ පෙරවූ පිළී ඇති මා ද තෙපි දක්නහු ය.

562. කිනම් පෙදෙසක වසන ඒ මහණහු වෙත දැන් අපි ගොස් දක්නෙමු ද, ඒ කවරෙක් අපගේ සැකය ද විචිකිත්සාව හා මිථ්‍යාදෘෂ්ටි නැමැති හුල් ද දුරු කරන්නේ ද?

563. කපිනච්චනා නම් පෙදෙසෙහි වැඩහුන් සත්‍යනාම ඇති ස්වකීය ආචාර්‍ය්‍ය විනයෙහි නොපමා වූ ඒ කප්පිනක මහණ තෙමේ බොහෝ දෙවියන් විසින් පිරිවරන ලද්දේ දහැමි කථා කියයි.

564. ''මම එසේ කරන්නෙමි. දැන් ඒ මහණහු වෙත ගොස් උන්වහන්සේ පිළිසඟළකින් හඳවන්නෙමි. ඒ පිළී ඒ මහණ විසින් පිළිගන්නා ලද නම් පිළියෙන් සැරසුණු තා ද දක්නෙමු.

565. පින්වත් ලිච්ඡවි රජතුමනි, නුසුදුසු කලැ පැවිද්දහු වෙත නො එළඹෙන්නේ මැනැවි. නො කල්හි එළැඹීම රජුන් වූ තොපගේ ධර්‍මය නො වේ. එහෙයින් සුදුසුකල්හි එළඹැ එතන්හි මැ රහොගත වැ හුන් තෙරහු බලව.

566. ඒ ලිච්ඡවි රජතුමා ''එසේය''යි කියා දසගණයා විසින් පිරිවරන ලදුවැ එහි ගියේ ය. ඒ නුවරට පැමිණ සිය නිවසෙහි විසීමට එළැඹියේ ය.

567. තතො ච කාලෙ ගිහිකිච්චානි කත්වා
නහාත්වා පිවිත්වා ච ඛණං ලභිත්වා,
විචෙය්‍ය පෙළාතො යුගානි අට්ඨ
ගාහාපයී දසගණෙන ලිච්ඡවි.

568. සො තං පදෙසං උපසඞ්කමිත්වා
තමද්දසා සමණං සන්තචිත්තං,
පටික්කමන්තං ගොචරතො නිවත්තං
සීතීභූතං රුක්ඛමූලෙ නිසින්නං.

569. තමෙනං අවොච උපසඞ්කමිත්වා
අප්පාබාධං ඵාසුවිහාරඤ්ච පුච්ඡි,
වෙසාලියං ලිච්ඡවිහං භදන්තෙ
ජානන්ති මං ලිච්ඡවි අම්බසක්කරො.

570. ඉමානි මෙ අට්ඨයුගා සුභානි
පතිගණ්හ භන්තෙ පදද්මි තුය්හං.
තෙනෙව අත්ථෙන ඉධාගතොස්මි
යථා අහං අත්තමනො භවෙය්‍යං.

571. දූරතොව සමණා බ්‍රාහ්මණා ච
නිවෙසනං තෙ පරිවජ්ජයන්ති,
පත්තානි භිජ්ජන්ති ච තෙ නිවෙසනෙ
සඞ්ඝාටියො චාපි විපාටයන්ති.[1]

572. අථාපරෙ පාදකුඨාරිකාහි
අවංසිරා සමණා පාතයන්ති,
එතාදිසං පබ්බජිතා විහෙසං
තයා කතං සමණා පාපුණන්ති.

573. තිණෙන තෙලම්පි න ත්වං අදාසි
මූළ්හස්ස මග්ගම්පි න පාවදාසි,
අන්ධස්ස දණ්ඩං සයමාදියාසි
එතාදිසො කදරියො අසංවුතො[2]
අථ ත්වං කෙන වණ්ණෙන කිමෙව දිස්වා
අම්හෙහි සහ සංවිභාගං කරොසි,

574. පච්චෙමි භන්තෙ යං ත්වං වදෙසි
විහෙසයිං සමණෙ බ්‍රාහ්මණෙ ච,
ඛිඩ්ඩත්ථිකො නො ච පදුට්ඨචිත්තො
එතම්පි මෙ දුක්කටමෙව භන්තෙ.

1. විදාළයන්ති – මජසං.
2. අසංවුතො තුවං – මජසං.

567. ඉක්බිති ලිච්ඡවි රජ සුදුසු කාලයෙහි ගිහිකෘත්‍යයන් කොට දිය නා කා බී යහපත් මොහොතක් ලැබ පෙට්ටියෙන් පිළිසඟළ අටක් තෝරා ගෙන දසගණයා ලවා ගන්වා ගෙන ගියේ ය.

568. එරජ ඒ පෙදෙසට එළඹ සන්හුන් සිතැති පිණ්ඩපාතයෙන් පෙරළා එන, ගොදුරුගමින් නැවතුණු, සිහිල්වූ, රුක්මුල්හි හුන් ඒ මහණහු දිටි.

569. උන්වහන්සේ වෙත එළැඹ නිරොගබව ද ඵාසුවිහරණය ද විචාළේ ය. "වහන්ස, මම විශාලා මහනුවර ලිච්ඡවි රජ වෙමි. අම්බසක්ඛර නම් වූ ලිච්ඡවි රජ යයි ජනයෝ මා දනිත්"යයි කී ය.

570. වහන්ස, මනහර වූ මේ අට පිළිසඟළ පිළිගන්න. මම මෙය ඔබවහන්සේට දෙමි. යම්සේ මම සතුටු වෙම් ද ඒ කරුණෙන් ම මම මෙහි පැමිණියෙමි.

571. ශ්‍රමණයෝ ද බ්‍රාහ්මණයෝ ද තොපගේ නිවෙස දුරින් ම දුරු කරත්. තොපගේ ගේ සමීපයෙහි දී පාත්‍රයෝ බිඳෙත්, සඟළ සිවුරු ද ඉරාදමත්.

572. යළි පා නැමැති කෙටේරිවලින් සමහර මහණහු හිස යටිකුරු කොට හෙළනු ලැබෙති. පැවිදි වූ මහණහු තොප කළ මෙබඳු වෙහෙසට පැමිණෙත්.

573. තෙපි තණ අගින් තෙල් බිඳකුදු නුදුන්නහු ය. මංමුළා වූවකු හට මග දු නො කීවහු ය. අන්ධයාගේ සැරයටිය තුමූ ම පැහැර ගත්තහු ය. මෙබඳු තදමසුරු වූ නො හික්මුණු තෙපි යළි කවර ගුණයකින් කුමක් දුක අප සමග සංවිභාග කරහු ද?

574. වහන්ස, තෙපි යමක් කීවහු නම් මම එය පිළිගනිමි. ක්‍රීඩාසිත් ඇතිව දූෂිත සිතින් තොර වැ මම මහණ බමුණනට වෙහෙස කෙළෙමි. වහන්ස, මෙ ද මා කළ නපුරෙකි.

575. ඛිඩ්ඩාය යක්ඛො පසවිත්වා පාපං
වෙදෙති දුක්ඛං අසමත්තභොගී,
දහරො යුවා නග්ගනියස්ස භාගී
කිංසු තතො දුක්ඛතරස්ස හොති.

576. තං දිස්වා සංවෙගමලත්ථං භන්තෙ
තප්පච්චයා තාහං දදමි දානං,
පටිගණ්හ භන්තෙ වත්ථයුගානි අට්ඨ
යක්ඛස්සිමා ගච්ඡන්තු දක්ඛිණායො.

577. අද්ධා හි දානං බහුධා පසත්ථං
දදතො ච තෙ අක්ඛයධම්මමත්ථු,
පටිගණ්හාමි තෙ වත්ථයුගානි අට්ඨ
යක්ඛස්සිමා ගච්ඡන්තු දක්ඛිණායො.

578. තතො ච සො ආචමයිත්වා ලිච්ඡවි
ථෙරස්ස දත්වාන යුගානි අට්ඨ,
පටිග්ගහීතානි ච තානි චස්සු
යක්ඛඤ්ච පස්සෙථ සන්නද්ධදුස්සං.

579. තමද්දසා චන්දනසාරලිත්තං
ආජඤ්ඤමාරුළ්හමුළාරවණ්ණං,
අලඞ්කතං සාධු නිවත්ථදුස්සං
පරිවාරිතං යක්ඛමහිද්ධිපත්තං

580. සො තං දිස්වා අත්තමනො උදග්ගො
පහට්ඨචිත්තො ච සුභග්ගරූපො,
කම්මඤ්ච දිස්වාන මහාවිපාකං
සන්දිට්ඨිකං චක්ඛුනා සච්ඡිකත්වා.

581. තමෙනං අවොච උපසඞ්කමිත්වා
දස්සාමි දානං සමණබ්‍රාහ්මණානං,
න චාපි මෙ කිඤ්චි අදෙය්‍යමත්ථි
තුවං ච මෙ යක්ඛ බහූපකාරොති.

582. තුවං ච මෙ ලිච්ඡවි එකදෙසං
අදාසි දානානි අමොඝමෙතං,
ස්වාහං කරිස්සාමි තයා ච[1] සක්ඛිං
අමානුසො මානුසකෙන සද්ධින්ති.

1. තයා ච – මජසං.

575. කෙළිසිතින් පව් රැස් කොට එක් ප්‍රෙතයෙක් අසම්පූර්ණ භොග ඇත්තේ යෞවනයෙන් යුත් තරුණයෙක් වැ නග්නභාවයට ගිම් වැ දුක් විඳී. එයට වඩා ඉතා දුඃඛදුකක් මොහුට කෙසේ වේ ද?

576. වහන්ස, ඔහු දැක සංවෙගය ලදුයෙමි. එහෙයින් මම ඔබට මේ පිළි දන්දෙමි. වහන්ස, මේ පිළිසහළ අට පිළිගනු මැනව. මේ පින් ප්‍රෙතයාට පැමිණේවා.

577. දන්දීම එකාන්තයෙන් (බුද්ධාදීන් විසින්) නන් අයුරින් පසස්නා ලදී. දන්දෙන තොපගේ ධනය නොගෙවෙන සැහැවි ඇති වේවා. තොපගේ පිළිසහළ අට මම පිළිගනිමි. මේ පින් ප්‍රෙතයාහට පැමිණේවා.

578. ඉක්බිති ඒ ලිච්ඡවි රජ මුවසෝද ගෙන තෙරුන්ට ඒ පිළී සහළ අට පිරිනමා ''මේ පිළී ගනුලැබේවා, පිළී හැඳගත් ප්‍රෙතයා ද දක්නට ලැබේවා''යි කී.

579. රජ සඳුන්සුණු තවරගත් සිරුරු ඇති ආජානීය අසුපිට නැගි මනහර රුසපු ඇති මොනවට හැඳගත් වස්ත්‍රයෙන් සැරසුණු පිරිවර ජනයා විසින් පිරිවරන ලද මහත් දිව්‍යර්ධියට පැමිණි ඒ ප්‍රෙතයා දුටුවේ ය.

580. රජතෙම ඔහු දැක සතුටුසිත් ඇති ව, ඔදවැඩුණු සිත් ඇති ව, තුටුපහටුසිත් ඇති වැ, අතිශයින් සුන්දර ස්වරූප ඇති ව සාන්දෘෂ්ටික කර්‍මය ද කර්ම විපාකය ද සියැසින් පසක් කොට දැක,

581. ප්‍රෙතයා වෙත පැමිණ මෙසේ කී ය: ''මම මහණ බමුණනට දන් දෙන්නෙමි. මාගේ නො දියයුතු කිසි වස්තුවක් නැත. ප්‍රෙතය තෝ ද මට බොහෝ උපකාර වූයෙහි''යි.

582. ලිච්ඡවි රජතුමනි තෙපි ද මට සිවුපසයෙන් එක් කොටසක් වූ පිළී දන් දුන්නහු ය. ඒ දන හිස් නොවෙයි. ඒ අමනුෂ්‍ය වූ මම මනුෂ්‍ය වූ තොප හා සමග ම සාක්ෂ්‍ය කරන්නෙමි.

583. ගතී ච බන්ධූ ච පරායණඤ්ච
මිත්තො මමාසි අථ දෙවතාසි,
යාචාමහං[1] පඤ්ජලිකො භවිත්වා
ඉච්ඡාමි තං යක්ඛ පුනාපි දට්ඨුන්ති.

584. සචෙ තුවං අස්සද්ධො භවිස්සසි
කදරියරූපො විප්පටිපන්නචිත්තො,
තෙනෙව මං න ලච්ඡසි දස්සනාය
දිස්වා ච තං නොපි ච ආලපිස්සං.

585. සචෙ[2] තුවං භවිස්සසි ධම්මගාරවො
දානෙ රතො සඞ්ගහිතත්තභාවො,
ඔපානභූතො සමණබ්‍රාහ්මණානං
එවං මමං ලච්ඡසි දස්සනාය.

586. දිස්වා ච තං ආලපිස්සං භදන්ත
ඉමඤ්ච සූලතො ලහුං පමුඤ්ච,
යතො නිදානං අකරිම්හ සක්ඛිං
මඤ්ඤාම සූලාවුතකස්ස කාරණා.

587. තෙ අඤ්ඤමඤ්ඤං අකරිම්හ සක්ඛිං
අයඤ්ච සූලාවුතො[3] ලහුං පමුත්තො,
සක්කච්ච ධම්මානි සමාචරන්තො
මුච්චෙය්‍ය සො නිරයා ච තම්හා.

588. කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයං
කප්පිනකඤ්ච උපසඞ්කමිත්වා,
තෙනෙව සහ සංවිභජිත්ව කාලෙ
සයම්මුඛෙනූපනිසජ්ජ පුච්ඡ.

589. සො තෙ අක්ඛිස්සති එතමත්ථං
තමෙව භික්ඛුං උපසඞ්කමිත්වා,
පුච්ඡස්සු අඤ්ඤත්ථිකො නො ච පදුට්ඨචිත්තො
සො තෙ සුතං අසුතං චාපි ධම්මං,
සබ්බම්පි අක්ඛිස්සති යථා පජානං.

590. සො තත්ථ රහස්සං සමුල්ලපිත්වා
සක්ඛිං කරිත්වාන අමානුසෙන,
පක්කාමි සො ලිච්ඡවීනං සකාසං
අථ බ්‍රැවි පරිසං සන්නිසින්නං.

1. යාචාමි තං – මජ්සං.
2. සචෙ පන – මජ්සං.
3. සූලතො – මජ්සං.

583 යක්ෂය තෙපි මට යා යුතු තැන ද, නැයා ද, පිහිට ද, මිත්‍රයා ද වවූ. යළි මාගේ දේවතාවා ද වවූ. මම බැඳිලි ව අයදිමි. මම යළිත් තොප දක්මට කැමැත්තෙමි.

584. ඉදින් තෙපි සැදැහැ නැති වන්නහු නම් තදමසුරුගති ඇත්තහු නම් විපිළිපන් සිත් ඇත්තහු නම් ඒ හෙතුවෙන් ම මා දක්ම නොලබන්නහු ය. මම ද තෙපි දැකත් කථා නො කරන්නෙමි.

585. ඉදින් තෙපි කුශලධර්මයෙහි ගෞරව ඇති වන්නහු නම් දන්දීමෙහි ඇලුණහු සියදිවියෙහි යහපත සලසා ගත්තහු මහණ බමුණනට පැන්සැළක් මෙන් වන්නහු නම් එසේ වූ කල්හි තෙපි මා දක්නට ලබන්නහු ය.

586. වහන්ස, තොප දැක ද මම කථා කරන්නෙමි. තොපට යහපතක් වේවා, යමකු කරුණු කොට අපි සාක්ෂා කෙළෙමු ද, ඒ (අනෙකකු නොව) හුල සිටි පුරුෂයා වෙත පැමිණීම නිසා ය යි සිතම්හ. මේ පුරුෂයා ද වහා හුලින් මුදනු මැනව.

587. ඒ අපි දෙදෙන එකිනෙකා සාක්ෂා කෙළෙමු. මේ පුරුෂයාත් වහා මිදුණේ සකසා කුසල්දම් කරමින් ඒ නිරයෙන් ද මිදෙන්නේ ය.

588. අන් තැනක වින්ද යුතු වූ අකුශලකර්මයක් ද ඔහුට වන්නේ ය. ඔහු සමග ම සුදුසු කලැ කප්පිනක තෙරුන් කරා එළඹ සමීපයෙහි හිඳ දන් බෙදු දී හමුවෙහි ම විචාරවු.

589. උන් වහන්සේ තොපට මෙ කරුණ කියන්නාහ. ඒ මහණ වෙත ම එළඹ එය දනගනු කැමැති ව ප්‍රදූෂිත සිත් නැති ව විචාරවු. බොහෝ ඇසූපිරූ තැන් ඇති ඒ මහණ තොප විසින් පෙර අසන ලද්ද වූ ද නො අසන ලද්ද වූ ද සියලු කුසල දහම් තමා දත් පරිද්දෙන් කියන්නේ ය. (සුගතිගාමී වූ ධර්මය කියන්නේ ය)

590. ඒ රජතුමා එහි දී අමනුෂ්‍යයා සමඟ රහසින් කථා කොට සාක්ෂා කොට ගෙන ලිච්ඡවීන්ගේ සමීපයට ගියේ ය. යළි හේ රැස් ව හුන් ලිච්ඡවි පිරිසට මෙසේ කී ය.

591. සුණන්තු භොන්තො මම එකවාක්‍යං
වරං වරිස්සං ලභිස්සාමි අත්ථං,
සූලාවුතො පුරිසො ලුද්දකම්මො
පණිහිතදණ්ඩො අනුසත්තරූපො

592. එත්තාවතා වීසති රත්තිමත්තා
යතො ආවුතො නෙව ජීවති න මතො,
තාහං මොචයිස්සාමි දනි
යථාමති අනුජානාතු සඞ්ඝො.

593. එතඤ්ච අඤ්ඤඤ්ච ලහුං පමුඤ්ච
කො තං වදෙථ තථා කරොන්තං,
යථා පජානාසි තථා කරොහි
යථාමති අනුජානාති සඞ්ඝො.

594. සො තං පදෙසං උපසඞ්කමිත්වා
සූලාවුතං මොචයි ඛිප්පමෙව,
මා භායි සම්මාති ච තං අවොච
තිකිච්ඡකානඤ්ච උපට්ඨපෙසි.

595. කප්පිතකඤ්ච උපසඞ්කමිත්වා
තෙන සමං සංවිභජිත්වා කාලෙ,
සයම්මුබෙනුපත්සජ්ජ ලිච්ඡවි
තථෙව පුච්ඡිත්ථ නං කාරණත්ථිකො.

596. සූලාවුතො පුරිසො ලුද්දකම්මො
පණිහිතදණ්ඩො අනුසත්තරූපො,
එත්තාවතා වීසතිරත්තිමත්තා
යතො ආවුතො නෙව ජීවති න මතො.

597. සො මොචිතො ගන්ත්වා මයා ඉදනි
එතස්ස යක්ඛස්ස වචො හි භන්තෙ,
සියා නු ඛො කාරණං කිඤ්චිදෙව
යෙන සො නිරයං නො වජෙය්‍ය

598. ආචික්ඛ භන්තෙ යදි අත්ථි හෙතු
සද්ධායිතං හෙතු වචො සුණොම,
න තෙසං කම්මානං විනාසමත්ථි
අවෙදයිත්වා ඉධ බ්‍යන්තිභාවො.

591. පින්වත්නි, මාගේ එක් බසක් අසත්වා. මම තොපගෙන් වරයක් ඉල්වන්නෙමි. ඉල්වන ඒ වරය ලබන්නෙමි. රුදුරුකම් ඇති කළ දඬුවම් ඇති හුලැ හිඳුවනු ලැබූ පුරුෂ තෙමේ රජු කෙරෙහි ඇලුණු ස්වභාව ඇත්තෙකි.

592. හුල්හි හිඳුවූ ද පටන් මෙතෙක් විසිරැයක් පමණ ය. හේ නො ම ජීවත් වේ. මෙළේ ද නො ම වෙයි. මම දැන් කැමැති සේ ඔහු මුදන්නෙමි. සමූහයා අනුමත කෙරේවා.

593. මොහු ද රජඅණ ලද අනිකා ද වහා මු(ද)න්න. එසේ කරන තොපට කවරෙක් නම් ''එසේ නො කරව''යි කියන්නේ ද? යම් සේ තෙපි හඟි වූ නම් රිසිපරිදි එසේ කරවු. (මහජන) සමූහයා (එය) අනුමත කෙරෙයි.

594. ඒ රජතෙමේ එ පෙදෙසට ගොස් හුලැ හුන් පුරුෂයා වහාම මිදවී ය. ''මිත්‍රය, බිය නොව''යි ද ඔහුට කී ය. වෙදුන් ද ඔහු ළඟට එවී ය.

595. එකරුණ දැනගනු කැමති ලිච්ඡවි රජ තෙමේ ඔහු සමඟ සුදුසු කාලයෙහි කප්පිනක තෙරුන් කරා එළඹ දන් බෙද දී ඉදිරිපිට හිඳ ඔබගෙන් එසේ ම විචාළේ ය.

596. හුලැ හිඳුවන ලද කළ රුදුරුකම් ඇති විඳින ලද සිරුරු දඬුවම් ඇති මිනිස් තෙමේ රජුකෙරෙහි ඇලුම්ගති ඇත්තෙක. යම් දිනක හේ හුලැ හිඳුවන ලද නම් එද පටන් අද දක්වා විසිරැයක් පමණ ඉක්මැ ගියේ ය. හේ ජීවත් වන්නේත් මළේත් නො වේ.

597. වහන්ස, මා විසින් එහි ගොස් ඒ පුරුෂ තෙමේ දැන් නිදහස් කරන ලද. ප්‍රෙතයාගේ කීම නිසා මෙසේ කෙළෙමි. යම් හෙයෙකින් හේ නිරයට නො යන්නේ නම්, එබඳු කිසියම් මැ කාරණයක් ඇත්තේ ද?

598. වහන්ස, ඉදින් එබඳු කරුණක් ඇත් නම් කියනු මැනැවි. ඇදහිය හැකි සකාරණ වචනය ම අසමු. මෙලොවැ කළ ඒ කර්මයන්ගේ විපාක නො විඳ වැනසීමෙක් ගෙවීමෙක් නැත්තේ ද?

599. සචෙ ස ධම්මානි[1] සමාචරෙය්‍ය
සක්කච්ච රත්තින්දිවමප්පමත්තො
මුච්චෙය්‍ය සො නිරයා ච තම්හා
කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයන්ති.

600. අඤ්ඤාතො එසො පුරිසස්ස අත්ථො
මමම්පිදානි අනුකම්ප භන්තෙ,
අනුසාස මං ඔවද භූරිපඤ්ඤ
යථා අහං නො නිරයං වජෙය්‍යන්ති.

601. අජ්ජෙව බුද්ධං සරණං උපෙහි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො,
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩ ඵුල්ලානි සමාදියස්සු.

602. පාණාතිපාතා විරමස්සු ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු
අමජ්ජපො මා ච මුසා අභාණී
සකෙන දාරෙන ච හොහි තුට්ඨො,
ඉමඤ්ච අරියං අට්ඨඞ්ගවරෙනුපෙතා
සමාදියාහි කුසලං සුඛුද්‍රයං

603. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං
අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච,
දදූහි උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

604. භික්ඛූපි සීලසම්පන්නෙ වීතරාගෙ බහුස්සුතෙ
තප්පෙහි අන්නපානෙන සදා පුඤ්ඤං පවඩ්ඪති.

605. එවඤ්ච ධම්මානි සමාචරන්තො
සක්කච්ච රත්තින්දිවමප්පමත්තො,
මුච්චෙය්‍ය සො ත්වං නිරයා ච තම්හා
කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයන්ති.

606. අජ්ජ ච බුද්ධං සරණං උපෙමි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො,
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩඵුල්ලානි සමාදියාමි.

607. පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි,
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දාරෙන ච හොමි තුට්ඨො,
ඉමඤ්ච අරියං අට්ඨඞ්ග වරෙනුපෙතං,
සමාදියාමි කුසලං සුඛුද්‍රයං

1. කම්මානි – ප, සිමු ii

599. ඉදින් හේ දිවාරෑ දෙක්හි නොපමා වැ (පෙර කළ පව්කම් මඩනට සමත්) කුසල්දහම් හි මොනොවට හැසිරෙන්නේ ද, හේ නිරා දුකින් මිදෙන්නේ ය. අපරාපරියවෙදනීය කර්මය අන් භවයෙක වින්ද යුතු වන්නේ ය.

600. වහන්ස, (ඒ) මිනිසාගේ මෙකරුණ දන්නා ලද ය. මා කෙරෙහි ද දූන් අනුනුම්පා කරන්න. මහනුවණැති උතුමාණෙනි, යම් හෙයෙකින් මම නිරයට නො යම් ද එසෙයින් මට අනුශාසනා කරන්න.

601. (තෝ) පහන්සිත් ඇත්තෙහි අද ම බුදුන් සරණ යව, ධර්මය ද සංඝයා ද සරණ යව, එසෙයින් ම සිකපද පස නො සිඳ නො කඩ කොට සමාදන් වෙව.

602. වහා පණිවායෙන් වෙන් වෙව. ලෙව්හි නුදුන් දෑ ගැන්ම දුරු කරව. රහමෙර පානය නො කර. මුසවා ද නො කිය. ස්වදරසන්-තොෂයෙන් සතුටු වෙව. මේ උතුම් අටඟින් යුත් සුබවිපාක දෙන පිරිසුදු අනවද්‍ය ශීලය සමාදන් වෙව.

603. සිවුරු ය, පිණ්ඩපාත ය, ගිලන්පසය, (ආවාසාදි) සෙන-සුන් ය, ආහාරය, පානය, කෑයුතු දෑය, වස්ත්‍ර හා මඤ්චපීඨාදි සෙනසුන් ය යන මෙය වෙසෙසින් පහන් සිතින් ඍජුප්‍රතිපන්න සඟනට දෙව.

604. වීතරාගී බහුශ්‍රැත සීලසම්පන්න භික්ෂූන් ද ආහාරපානයෙන් තර්පණය කරව. (මේ පිළිවෙත) හැම ද පින් වඩනේ ය.

605. මෙසෙයින් දිවරෑ නොපමා වැ කුසල්දහම්හි හැසිරෙන තෝ නිරා දුකින් මිදෙන්නෙහි. පාපකර්මය (අපරාපර්‍ය්‍ය වශයෙන්) අන් තන්හි විඳිය යුතු වන්නේ ය.

606. අද ම පහන්සිත් ඇතියෙම් බුදුන් සරණ කොට එළඹෙමි. ධර්මය ද සංඝයා ද (සරණ කොට එළඹෙමි.) එසෙයින් ම සිකපද පස නො කඩ කොට සපුරා සමාදන් වෙමි.

607. මෙලොවැ වහා පණිවායෙන් වළකිමි, අයිනාදන දුරු කෙරෙමි. මත්පැන් නො බොන්නෙම් වෙමි. මුසවා නො ද බෙණෙමි, ස්වදරසන්තොෂයෙන් සතුටු වෙමි. මේ ආර්‍ය්‍ය වූ උතුම් අටඟින් යුත් සුබ විපාක දෙන නිරවද්‍ය වූ ශීලය සමාදන් වෙමි.

608. චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච.

609. භික්ඛූ පි සීලසම්පන්නෙ වීතරාගෙ බහුස්සුතෙ,
දදම්‍ි න විකම්පාමි බුද්ධානං සාසනෙ රතො.

610. එතාදිසො ලිච්ඡවි අම්බසක්ඛරො
වෙසාලියං අඤ්ඤතරො උපාසකො,
සද්ධො මුදුකාරකරො ච භික්ඛු
සඞ්ඝඤ්ච සක්කච්ච තදූ උපට්ඨහි.

611. සුලාවුතො ච අරොගො හුත්වා
සෙරී සුඛී පබ්බජ්ජං උපාගමි,
භික්ඛුඤ්ච ආගම්ම කප්පිනකුත්තමං
උභොපි සාමඤ්ඤඵලානි අජ්ඣගුං.

612. එතාදිසා සප්පුරිසාන සෙවනා
මහප්ඵලා හොති සතං විජානතං,
සුලාවුතො අග්ගඵලං අඵස්සයි
ඵලං කනිට්ඨං පන අම්බසක්ඛරො'ති.

**අම්බසක්ඛරපෙතවත්ථු පඨමං.**

## 4. 2

613. සුණොථ[1] යක්ඛස්ස ච වාණිජාන ච
සමාගමො යත්ථ තදූ අහොසි,
යථා කථං ඉතරීතරෙන චාපි
සුභාසිතං තඤ්ච සුණොථ[1] සබ්බෙ.

614. යො සො අහු රාජා පායාසි නාමො
භුම්මානං සහව්‍යගතො[2] යසස්සී,
සො මොදමානොව සකෙ විමානෙ
අමානුසො මානුසෙ අජ්ඣභාසීති.

615. වඞ්කෙ අරඤ්ඤෙ අමනුස්සට්ඨානෙ
කන්තාරෙ අප්පොදකෙ අප්පභක්ඛෙ,
සුදුග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ,
වඞ්කං භයා නට්ඨමනා මනුස්සා.

1. සුණොථ - සිමු ii මජ්සං.
2. සහබ්‍යා - මජ්සං.

608. සිවුරුද, පිණ්ඩපාතය ද, සෙනසුන් ද, ආහාරපානද කැයුතුදෑ ද වස්ත්‍ර...(ආවාසාදි) සෙනසුන් ද,

609. බුදුසසුන්හි ඇලුණු මම සිල්වත් වූ බොහෝ ඇසූ පිරුතැන් ඇති වීතරාගී වූ ශුක්ෂූන්ට දන් දෙමි. ඒ සිවුපසදන් කඩ නො කරමි.

610. මෙවැනි ඒ අම්බසක්ඛර නම් ලිච්ඡවිරජ එකලැ විසල්පුර සැදූහැවත් මොළොක් සිත් ඇති එක්තරා උවසුවෙක් වැ උපකාර කරන සුලු වූයේ බික්සඟනට සකසා උවටැන් කෙළේ ය.

611. හුලැ හිඳවූ මිනිසා ද නීරොග වැ සුව පත් වැ තමා කැමැති පරිදි හැසිරෙන්නේ උතුම් කප්පිනක තෙරුන් කරා එලඹැ පැවිදිවූයේ ය. මෙසේ ඒ දෙදෙනා ම ශ්‍රාමණ්‍ය ඵලයනට හෙවත් මගපලයනට පැමිණියහ.

612. සත්පුරුෂයන්ගේ මෙවැනි ආශ්‍රය කරුණු දන්නා සත්පුරුෂයනට මහත් ඵල ඇති වෙයි. හුලැ හුන් මිනිසා රහත්ඵලය ලබාගති. අම්බසක්ඛර රජ වනාහි සොවාන් විය.

**අම්බසක්ඛර ප්‍රෙතවස්තු යි.**

## 4. 2

613. එකලැ සෙරිස්සක දෙව්පුතුගේ ද වෙළෙඳුන්ගේ ද මරුකතර දී යම් එක්වීමෙක් වී ද එය අසවු. එතැන්හි දී ඔවුනොවුන් අතර ඇති වූ යම් කථාප්‍රවෘත්තියක් ඇති වී නම් එ ද තෙපි සියල්ලෝ ම අසවු.

614. සෙතව්‍යා නුවර යම් ඒ පායාසි නම් රජෙක් වී ද, හේ මැරී බුමාටු දෙවියන්ගේ සහභාවයට ගියේ යසපිරිවර ඇති වැ උපනි. ඒ සෙරිස්සක නම් දෙව්පුත් පිරිවර දෙවියන් සමඟ සතුටු වෙමින් තෙමේ නොමිනිස් වූයේ ම සිය විමනෙහි සිට වෙළඳ මිනිසුන් දැක මෙසේ කී ය.

615. සියදිවි ඇති වේ ද නැති වේ ද යි උපන් භය ඇති, නටුවා වූ සිත් ඇති (මංමුළා වූ) මිනිසුනි, ජීවිතය ගැන සැක උපදවන, වනයක මෙන් නිතර යක්බූපිසසුන් හැසිරෙන, (මිනිසුන්ට අගොචර වූ) සුවසේ යා නො හැකි, කනබොන දෑ කිසිත් නොමැති, අතිශයින් දුර්ගම වූ මේ මරුකතර මැද,

616. නයිධ ඵලා මූලමයා ච සන්ති
උපාදනං නත්ථි කුතො ඉධ භක්ඛා,
අඤ්ඤත්‍ර පංසූහි ච වාලුකාහි ච
තත්තාහි උණ්හාහි ච දරුණාහි ච.

617. උජ්ජඞ්ගලං තත්තමිවං කපාලං
අනායසං පරලොකෙන තුල්‍යං,
ලුද්දනමාවාසමිදං පුරාණං
භූමිප්පදෙසො අභිසත්තරූපො.

618. අථ තුම්හෙ කෙන වණ්ණෙන
කිමාසමානා ඉමං පදෙසං හි,
අනුප්පවිට්ඨා සහසා සමෙච්ච
ලොභා භයා අථවා සම්පමූළ්හා.

619. මගධෙසු අඞ්ගෙසු ච සත්ථවාහා
ආරොපයිත්වා පණියං පහූතං,
තෙ යාමසෙ සින්ධුසොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා

620. දිවා පිපාසං'නධිවාසයන්තා[1]
යොග්ගානුකම්පඤ්ච සමෙක්ඛමානා,
එතෙන වෙගෙන ආයාම සබ්බෙ
රත්තිං මග්ගං පටිපන්නා විකාලෙ.

621. තෙ දුප්පයාතා අපරද්ධමග්ගා
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ,
සුදුග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ
දිසං න ජානාම පමූළ්හචිත්තා.

622. ඉදඤ්ච දිස්වාන අදිට්ඨපුබ්බං
විමානසෙට්ඨඤ්ච තුවඤ්ච යක්ඛ,
තදුත්තරිං ජීවිතමාසමානා
දිස්වා පතීතා සුමනා උදග්ගාති.

623. පාරං සමුද්දස්ස ඉදඤ්ච වණ්ණුං
වෙත්තාචරං සඞ්කුපථඤ්ච මග්ගං,
නදියො පන පබ්බතානඤ්ච දුග්ගා
පුථුද්දිසා ගච්ඡථ භොගහෙතු.

624. පක්ඛන්දියාන විජිතං පරෙසං
වෙරජ්ජකෙ මානුසෙ පෙක්ඛමානා,
යං වො සුතං වා අථවාපි දිට්ඨං
අච්ඡෙරකං තං වො සුණොම තාතා.

2, පිපාසං අනධිවාසයන්තා – සිමු. ii

616. මේ මරුකතරෙහි (අඹ දඹ තල් ආ) ඵල ජාතියකුදු නැත. මුල්ජාතියකුදු නැත. දර ද නැත. රත් වූ උණු වූ හා දරුණු වූ පස් ද වැලි ද හැර අහරක් කොයින් ලැබේ ද?

617. රළු බොරළු සහිත නිරුදක බිම්පෙදෙසක් වූ රත්වූ යකබලක් වැනි වූ කිසි සැපතක් නැති නරකයක් වැනි වූ දිගුකලක පටන් දරුණු වූ පිසාචාදීන්ට ආවාසයක් වූ මේ භූමිප්‍රදෙශය (පුරාණ තවුසන් විසින්) ශාප දුන් තැනක් මෙනි.

618. එහෙයින් තෙපි කුමන කරුණෙකින් මේ පෙදෙසට ආවහු ද? කිනම් වස්තුවක් සොයා ආවහු ද? යම්කිසි වස්තු ලොභයෙකින් හෝ සතුරු බියෙකින් මෙහි ලාහෙලා එක් වැ ආවහු ද? නො එසේ නම් මං මුළා වූවහු ද?

619. අපි අඟුමගද දෙරටවැසි ගැල් සාත්තුවෝ වම්හ. බොහෝ වෙළඳ බඩු ගැල්හි පටවාගෙන වැඩිලාබ පතමින් සින්ධු සහ සෝවීර රටවලට වෙළඳාම පිණිස යන්නෙමු.

620. දිවාකල පවස නො ඉවසිය හැකි වූ අපි සියල්ලෝ ම රිය අදනා ගවයනට අනුකම්පා කරම්හ. දවල එක්තැනෙක ලැගුම් ගෙන මේ වෙගයෙන් ගමන් කරන්නමෝ රෑ නොකල්හි මහමඟට පිළිපන්නමෝ වම්හ.

621. ඒ නොමග ගියාවූ වැරදුණු මං ඇති (පැනැස නැති හෙයින්) අන්ධ වූ ඒ අපි (එහෙයින් මැ) ආකුල වූවෝ වම්හ. අතිශයින් දුර්ගම වූ වනයෙහි මේ මරුකතර මැද මුළා සිත් ඇතියමෝ යායුතු දිශාව නො දනුම්හ.

622. යක්ෂය, (දිව්‍යපුත්‍රය) පෙර නුදුටුවිරූ මේ උතුම් විමන ද ඔබ ද දැක මින් මතුයෙහි ද අපි දිවි ලබනු කැමති වැ සිටුම්හ. ඔබ දැක ප්‍රීතියෙන් ඔදවැඩුණු සිත් ඇත්තෝ ද වම්හ.

623. තෙපි (වස්තු සොයන්නෝ) මහමුහුදින් එතර ද මෙ වැනි මරු කතරවල ද වේවැල් අල්ලා යා යුතු මංවල ද කණු සිටුවා යා යුතු සංකුපථ නම් මංවලද ගංගා – පර්වත නිසා විෂම වූ භූමිවල ද ඒ වස්තු හෙතුවෙන් නොයෙක් දිග ඇවිදින්නහු ය.

624. එසේ අන් රටවලට පැමිණ එරට වැසි මිනිසුන් දක්මින් යන්නහු ය. එබඳු වූ තොප විසින් දුටු හෝ ඇසූ යම් අසිරිමත් කරුණෙක් ඇත් නම් එය අපට කියවු. දරුවෙනි අපි එය අසම්හ.

625. ඉතොපි අච්ඡෙරතරං කුමාර
න තො සුතං වා අථවාපි දිට්ඨං,
අතීතමානුස්සකමෙව සබ්බං
දිස්වාන තප්පාම අනොමවණ්ණං.

626. වෙහාසයං පොක්ඛරඤ්ඤො සවන්ති
පහූතමල්‍යා බහුපුණ්ඩරීකා,
දුමාචිමෙ නිච්චඵලූපපන්නා
අතීව ගන්ධා සුරභිං පවායන්ති.

627. වෙළුරියත්ථම්භා සතමුස්සිතාසෙ
සිලාප්පවාළස්ස ච ආයතංසා,
මසාරගල්ලා සහ ලොහිතඞ්කා
ථම්භා ඉමෙ ජොතිරසාමයාසෙ.

628. සහස්සත්ථම්භං අතුලානුභාවං
තෙසූපරි සාධුමිදං විමානං,
රතනන්තරං කඤ්චනවෙදිමිස්සං
තපනීයපට්ටෙහි ච සාධු ඡන්නං.

629. ජම්බොනදුත්තත්තමිදං සුමට්ඨො
පාසාදසොපානඵලූපපන්නො;
දළ්හො ච වග්ගු සුමුඛො සුසංගතො[1]
අතීව නිජ්ඣානඛමො මනුඤ්ඤො.

630. රතනන්තරස්මිං බහුඅන්නපානං
පරිවාරිතො අච්ඡරාසංගණෙන,
මුරජ්ජ[2] ආළම්බරතුරියසඞ්ඝුට්ඨො
අභිවන්දිතොසි ථුතිවන්දනාය.

631. සො මොදසි නාරිගණප්පබොධනො
විමානපාසාදවරෙ මනොරමෙ,
අචින්තියො සබ්බගුණූපපන්නො
රාජා යථා වෙස්සවණො නළින්‍යා.

632. දෙවො නු ආසි උද වාසි යක්ඛො
උදාහු දෙවින්දො මනුස්සභූතො,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
ආචික්ඛ කො නාම තුවංසි යක්ඛොති.

633. සෙරීස්සකො නාම අහම්හි යක්ඛො
කන්තාරියො වණ්ණුපථම්හි ගුත්තො,
ඉමං පදෙසං අභිපාලයාමි
වචනකරො වෙස්සවණස්ස රඤ්ඤො.

1. වග්ගු ච සුසංගතො ච - මජ්සං.
2. මුරජ - ම.ජ.ස.

625. පින්වත් දෙව්කුමර, හැම අයුරින් මිනිස් ඉසුරු ඉක්මැ ගිය ඔබගේ මේ ඉසුරට වඩා අප විසින් ඇසූවිරූ හෝ දුටුවිරූ හෝ පුදුමයක් නොමැත. අපි ඔබගේ මේ උසස් වූ සිරුරු සැපත හා විමන්සැපත දැක පිණායම්හ.

626. බොහෝ වූ මලින් ගැවසුණු බොහෝ හෙළපියුම් ඇති පොකුණු අහසේ ගලා බසී. (විමන්වට) මේ රුක් ද නිතර පලබර වැ පවතී. ඉතා මනහර වූ සුවඳ ද හමන්නේ ය.

627. (මේ පහයෙහි) වෛඩූර්ය මසාරගල්ල ලොහිතංක ශිලාප්‍ර-වාලාදියෙන් අටැස් සොළසැස් දෙතිසැස් වූ ද සියගණන් ටැම් නැගුණාහු වෙති. මේ ටැම් රශ්මියෙන් බබලයි.

628. ඒ ටැම් මතුයෙහි දහසක්ටැම් ඇති අසමාන වූ අනුභාවයෙන් යුත් මනහර වූ මේ විමන පිහිටා ඇත. මෙය සත් රුවනින් මනහර යැ. රන්මුවා වෙදිකායෙන් යුක්ත යැ. මත්තෙහි බබළන රන්පටින් මොනොවට වසන ලද්දේ යැ.

629. මේ (ඔබගේ) විමන ඔප්නැගූ දඹරනින් බබළන්නේ ය. (එහි ඒ ඒ පෙදෙස) මොනොවට මට කළ ප්‍රාසාදවලින් හා හිණිපෙළින් ද පුවරුයෙන් ද යුක්ත යැ. (මේ පහය) ස්ථිර යැ. මනහර යැ. මනාමුඛ (ද්වාර) ඇත්තේ යැ. එකිනෙකට ගැළපෙන අවයව ඇත්තේ යැ. අතිශයින් දර්ශනීය යැ. සිත්කලු යැ.

630. රුවන්මුවා මේ විමන තුළ ආහාරපාන බොහෝ වෙයි. අප්සරස් සමූහයා විසින් තෙපි පිරිවරන ලද්දාහු යැ. නිතර වැයෙන මිහිඟුබෙර ඈ පසඟතුරු ගොසින් එකනින්නාද වෙයි. නොයෙක් දෙවියන් විසින් තුතිගී කියා නමස්කාර කරන ලදහු යැ.

631. යම්සේ වෙසවුණු රජ නළිනී නම් පොකුණෙහි රමණය කෙරේ ද, එසේ මැ ඒ තෙපි ද නන්දෙවඟනන් විසින් පිරිවරන ලදු වැ ඔවුන් විසින් පුබුදුවමින් මනහර වූ උතුම් වූ මේ පහයෙහි නො සිතිය හැකි සියලු දෙව්සැපතින් යුතු වැ සතුටු වහු.

632. ඔබ දෙවියෙක් ද නො එසේ නම් යක්ෂයෙක් ද නොහොත් සක්දෙවිඳු ද එසේත් නො වේ නම් මනුෂ්‍යයෙක් දැ යි කියමින් ඒ සාර්ථවාහ වෙළෙන්දෝ 'යක්ෂය ඔබ කවරෙක් දැ යි අපට කියව'යි ඔහුගෙන් ප්‍රශ්න කරති.

633. වෙළඳුනි, මම වූ කලි මෙ මරුකතර බිම් පෙදෙසැ සැඟවී සිටින සෙරිස්සක නම් දිව්‍ය පුත්‍රයෙක්මි. වෙසවුණු රජුගේ අවවාදය පිළිපදින මම මේ පෙදෙස පාලනය කරමි.

634. අධිච්ච ලද්ධං පරිණාමජං තෙ
සයං කතං උදාහු දෙවෙහි දින්නං,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං මනුඤ්ඤන්ති.

635. නාධිච්ච ලද්ධං න පරිණාමජං මෙ
න සයං කතං නපි දෙවෙහි දින්නං,
සකෙහි කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං මනුඤ්ඤන්ති.

636. කින්තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං විමානන්ති.

637. මමං[1] පායාසීති අහු සමඤ්ඤා
රජ්ජං යදා කාරයිං කොසලානං,
නත්ථිකදිට්ඨි කදරියො පාපධම්මො
උච්ඡෙදවාදී ච තදා අහොසිං.

638. සමණො ච ඛො ආසි කුමාරකස්සපො
බහුස්සුතො චිත්තකථී උළාරො,
සො මෙ තදා ධම්මකථං අකාසි[2]
දිට්ඨිවිසූකානි විනොදයී මෙ.

639. තාහං තස්ස ධම්මකථං සුණිත්වා
උපාසකත්තං පටිවෙදයිස්සං,
පාණාතිපාතා විරතො අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං.
අමජ්ජපො නො ච මුසා අභාණිං
සකෙන දාරෙන ච අහොසිං[3] තුට්ඨො.

640. තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
තෙහෙව කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං විමානන්ති.

641. සච්චං කිරාහංසු නරා සපඤ්ඤා
අනඤ්ඤථා වචනං පණ්ඩිතානං,
යහිං යහිං ගච්ඡති පුඤ්ඤකම්මො
තහිං තහිං මොදති කාමකාමී.

1. මම - සිමු ii
2 අභාසි - මජසං.
3. අහොසි - මජසං.

634. පින්වත් දෙව්කුමර, තොපගේ මේ දෙව්ඉසුරු සැප ඉබේ පහළ වූවක් ද, නැතහොත් කිසි කෙනෙකුන් විසින් කලකට පමණක් දුන් දෙයක් ද, නො එසේ නම් තමන් විසින් මැ පහළ කර ගත් දෙයක් ද, එසේත් නැත් නම් දෙවියන් දෙන ලද ද. තොප විසින් මෙ මනොඥ සැපත කෙසේ ලද දු යි සාර්ථවාහ වෙළෙන්දෝ තොප විචාරත්.

635. මාගේ මේ ඉසුරු ඉබේ ලැබුණේ ද නො වේ. යම් කෙනකුන් විසින් දුන් දෙයක් ද නො වේ. මා විසින් උපදවන ලද්දක් ද නො වේ. දෙවියන් දෙන ලද්දකුත් නො වේ. පෙර මා කළ පින්බෙලෙන් මනහර වූ මේ පහය මට ලැබිණි.

636. ඔබගේ ව්‍රත සමාදනය කිමෙක් ද, ඔබගේ බ්‍රහ්මචර්යය හෝ කිමෙක් ද, මැනැවින් පුරුදු කළ කිනම් කර්මයක මේ විපාකයෙක් වේ ද, මේ විමන කෙසේ ලද දු යි ඒ සාර්ථවාහ වෙළෙන්දෝ තොප විචාරත්.

637. මම පෙර 'පායාසි' යන නමින් යුත් රාජන්‍යයෙක් වීමි. යම් කලෙක මම කොසොල්රට රාජ්‍යය කෙළෙම් ද, එකලැ මම නාස්තික දෘෂ්ටියෙන් යුත් මසුරු වූ ලාමක ස්වභාව ඇති උච්ඡෙදවාදියෙක් වීමි.

638. එකලැ කුමාරකාශ්‍යප නම් ශ්‍රමණ කෙනෙක් වූහ. උන් වහන්සේ බොහෝ ඇසූ පිරූතැන් ඇති විසිතුරු ලෙස කථාකරන උසස් නැණවත් කෙනෙකි. උන් වහන්සේ එකලැ මට ධර්ම කථාවක් කළහ. මගේ සියලු මිසදිටු ද පහකළහ.

639. මම උන්වහන්සේගේ ඒ දහම් අසා උපාසකත්වය ප්‍රකාශ කෙළෙමි. පණිවායෙන් වෙන් වූයෙක් වීමි. ලොවැ නුදුන් දෙය ගැනීම දුරු කෙළෙමි. මත්පැන් නොබොන්නෙක් වීමි. බොරු නො කීයෙමි. සිය බිරිඳගෙන් පමණක් සතුටු වීමි.

640. මාගේ ව්‍රතසමාදනය එය වේ. මාගේ බ්‍රහ්මචර්යය ද එය වේ. මැනැවින් පුරුදු කරන ලද ඒ කර්මයෙහි මේ විපාක යි. අලාමක වූ ඒ පුණ්‍යකර්ම හෙතුකොට ගෙන මා විසින් මේ විමන ලද.

641. නුවණැති මිනිස්සු යම් සත්‍යයක් කීහු නම්, ඒ පඬිවරුන්ගේ වචනය වෙනස් නො වේ. කළපින්කම් ඇත්තේ යම් යම් තැනෙකැ යේ නම් ඒ ඒ තන්හි කැමති සැප ලැබ සතුටු වෙයි.

642. යහිං යහිං සොකපරිද්දවො ච
වධො ච බන්ධො ච පරික්කිලෙසො,
තහිං තහිං ගච්ඡති පාපකම්මො
න මුච්චති දුග්ගතියා කදචීති.

643. සම්මූළ්හරූපො ච ජනො අහොසි
අස්මිං මුහුත්තෙ කලලීකතොව,
ජනස්සිමස්ස තුය්හඤ්ච කුමාර
අප්පච්චයො කෙන නු ඛො අහොසි.

644. ඉමෙ සිරීසූපවනා ච තාතා
දිබ්බා ගන්ධා සුරභිං[1] සම්පවන්ති,
තෙ සම්පවායන්ති ඉමං විමානං
දිවා ච රත්තො ච තමං නිහන්ත්වා[2]

645. ඉමෙසං ච ඛො වස්සසතච්චයෙන
සිපාටිකා ඵලති එකමෙකා,
මානුස්සකං වස්සසතං අතීතං
යදග්ගෙ කායම්හි ඉධූපපන්නො.

646. දිස්වානහං වස්සසතානි පඤ්ච
අස්මිං විමානෙ ඨත්වාන තාතා,
ආයුක්ඛයා පුඤ්ඤක්ඛයා චවිස්සං
තෙනෙව සොකෙන පමුච්ඡිතොස්මි,

647. කථං නු සොචෙය්‍ය තථාවිධො සො
ලද්ධා විමානං අතුලං චිරාය,
යෙචාපි ඛො ඉත්තරමුපපන්නා
තෙ නූන සොචෙය්‍යුං පරිත්තපුඤ්ඤා,

648. අනුච්ඡවිං ඔවදියඤ්ච මෙ තං
යං මං තුම්හෙ පෙය්‍යවාචං වදෙථ
තුම්හෙ ච ඛො තාතා මයානුගුත්තා
යෙනිච්ඡකං තෙන පලෙථ සොත්ථි,

649. ගන්ත්වා මයං සින්ධුසොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා,
යථා පයොගා පරිපුණ්ණචාගා
කාහාම සෙරීස්සමහං උළාරං.

1. සුරභි - මජසං.
2. නිහන්තං - ප
3. දිබ්බානි තං - මජසං.

642. යම් යම් තැනක ශොක කිරීම් හා විලාපකිරීම ද, වධ-බන්ධන හා විපත් ද වේ නම්, පව්කම ඇතියේ ඒ ඒ තැනට ම යෙයි. හේ කිසි-කලෙක දුගතියෙන් නො මිදේ.

643. පින්වත් දෙව්කුමර, තොපගේ පිරිවරජනයා ද මේ මොහො-තෙහි සොවින් මුළා වූ ස්වරූප ඇත්තේ ය. ඔවුන්ගේ සිත වඩදිය මෙන් කැලඹුණේ ය. මේ ජනයාගේත් තොපගේත් දෙම්නස කවර කරුණෙකින් ඇති වී ද.

644. මිතුරනි, මහරිළපවනයෙන් මෙ දිව්‍ය සුගන්ධයෝ හාත්පස හමා යති. එසේ හමන ඒ සුගන්ධයෝ මේ විමන සුවඳ ගන්වමින් දිවා රෑ දෙක්හි අඳුරු දුරු කරමින් හමත්.

645. අවුරුදු සියයක්හුගේ ඇවෑමෙන් මෙ මහරිගස්වල එකඑක මහරිගෙඩි පැසී ගිලිහී වැටේ. එයින් මිනිසුන් පිළිබඳ අවුරුදු සියයක් ඉක් මැ ගියේ යයි දනේ. යම් දිනක මම මෙහි උපන්නෙම් නම්,

646. එතැන් පටන් මම අවුරුදු පන්සියයක් මේ විමනෙහි සිට ආයු හා පින් ගෙවීමෙන් මින් ච්‍යුත වන්නෙමි යි දැක ඒ සොවින් මැ මුළාවට පත් වීමි.

647. එබඳු පින්වතෙක් අසමාන දෙව්විමනක් හා දීර්ඝ ආයුෂයක් ලැබ කෙසේ නම් ශොක කරන්නේ ද? යමෙක් වනාහි මන්දපුණ්‍ය වැ උපන්නාහු නම් මඳපිනැති ඔහු එකාන්තයෙන් ශොක කරන්නාහු යැ.

648. තෙපි යම් ප්‍රියවචනයක් මට කීහු නම් ඒ කීම තොපට සුදුසු වූවක් මැ යැ. මට එය අවවාදයක් ද වෙයි. ඒ අනුව මම පිළිපදිමි. යහළුවනි, තෙපි වූ කලි මවිසින් රක්නා ලද්දහු ය. යම් මගෙකින් තෙපි යන්නට කැමැත්තහු නම ඒ මගින් සැපසේ යවු.

649. දෙව්කුමර, ධනාර්ථී වූ අපි ධනවෘද්ධිය පතමින් සින්ධු-සෝවීර රටවලට ගොස් දුන් ඔබ කළ පිළින අනුව පිරිපුන් පරිත්‍යාග ඇතියමෝ මහත් වූ සෙරිස්සක නම් පූජාවක් කරන්නෙමු.

650. මා චෙව සෙරිස්සමහං අකත්ථ
සබ්බඤ්ච වො භවිස්සති යං වදෙථ,
පාපානි කම්මානි විවජ්ජයාථ
ධම්මානුයොගඤ්ච අධිට්ඨහාථ.

651. උපාසකො අත්ථි ඉමම්හි සඞ්ඝෙ
බහුස්සුතො සීලවතූපපන්නො,
සද්ධො ච චාගී ච සුපෙසලො ච
විචක්ඛණො සන්තුසිතො මතීමා.

652. සඤ්ජානමානො න මුසා භණෙය්‍ය
පරූපඝාතාය න චෙතයෙය්‍ය,
වෙභූතිකං පිසුනං නො කරෙය්‍ය
සණ්හඤ්ච වාචං සඛිලං භණෙය්‍ය.

653. සගාරවො සප්පතිස්සො විනීතො
අපාපකො අධිසීලෙ විසුද්ධො,
සො මාතරං පිතරඤ්චාපි ජන්තු
ධම්මෙන පොසෙති අරියවුත්ති.

654. මඤ්ඤෙ සො මාතාපිතූනං කාරණා
භොගානි පරියෙසති න අත්තහෙතු,
මාතාපිතූනඤ්ච යො අච්චයෙන
නෙක්ඛම්මපොනො චරිස්සති බ්‍රහ්මචරියං.

655. උජු අවඞ්කො අසඨො අමායො
න ලෙසකප්පෙන ච වොහරෙය්‍ය,
සො තාදිසො සුකතකම්මකාරී
ධම්මෙ ඨිතො කින්ති ලභෙථ දුක්ඛං.

656. තං කාරණා පාතුකතොම්හි අත්තනා.[1]
තස්මා ධම්මං[2] පස්සථ වාණිජාසෙ,
අඤ්ඤත්‍ර තෙනීහ භස්මීභවෙථ
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ.
තං ඛිප්පමානෙන ලහුං පරෙන
සුඛො හවෙ සප්පුරිසෙන සඞ්ගමො.

657. කිං නාම සො කිඤ්ච කරොති කම්මං
කිං නාමධෙය්‍යං කිං පන තස්ස ගොත්තං,
මයම්පි නං දට්ඨුකාමම්හ යක්ඛ
යස්සානුකම්පාය ඉධාගතොසි
ලාභා හි තස්ස යස්ස තුවං පිහෙසි.

658. යො කප්පකො සම්භවනාමධෙය්‍යො
උපාසකො කොච්ඡඵලූපජීවී,
ජානාථ නං කුම්භාකං පෙසියො සො
මා ඛො නං හීළිත්ථ[3] සුපෙසලො සො.

1. අත්තනො – මජසං.
2. තස්මා – මජසං.
3. මා ච ඛො හිලිත්ථ – මජසං.

650. වෙළෙඳුනි, සෙරිස්සක නම් උත්සවපූජාවක් නො කරවු. තෙපි යමක් කියවු නම් ඒ සියල්ල ම සිදු වන්නේ ය. පව් කම් දුරු කරවු. දනාදි කුසල් දහම්හි යෙදීමට ඉටා ගනිවු.

651. මෙ පිරිසෙහි උපාසකයෙක් ඇත. හේ බහුශ්‍රැත ය, ශීල–ව්‍රත යෙන් යුක්ත ය, ශ්‍රද්ධාවත් ය, පරිත්‍යාගශීලී ය, සුපෙශල ය, විචක්ෂණ ය, ලදදෙයින් තුටු වෙයි. කම්පල අදහන නුවණින් යුක්ත ය.

652. හේ දැන දැන බොරු නො කියන්නේ ය, අනුන් වැනසීමට නො සිතන්නේ ය, සමගි වූවන් වෙන් කරන පිසුනු නො කියන්නේ ය, මොළොක් සිලිටි වදන් තෙපලන්නේ ය.

653. ඒ උපාසක ගෞරව සහිත වූයේ සුවච වූයේ විනීත වූයේ අලාමක වූයේ උපාසක අධිශීලයෙන් විශුද්ධ ය. අරි පැවතුම ඇති හේ මව ද පියා ද දැහැමින් පෝෂණය කරයි.

654. ''ඒ උපාසක නමා හෙතු කොට නොව මාපියන් සඳහා ම වස්තු සොයති''යි සිතමි. හේ මාපියන් ඇවෑමෙන් නිවනට නැමුණු සිතැත්තේ සසුන් බඹසර හැසිරෙන්නේ ය.

655. ඍජු වූ අවංක වූ කපට නො වූ මායා රහිත ඒ උපාසක ලෙශයෙකින් හෝ රැවටීම් වචනයක් නො කියන්නේ ය. එබඳු වූ කුශලධර්ම කරන සුලු හේ කෙසේ නම් දුක් ලබන්නේ ද?

656. ඒ උපාසක නිසා ම තොප හමුවෙහි මම තෙමෙ ම ප්‍රකට කරන ලද වෙමි. (යම් හෙයකින් මම ධර්මය ගරුකරමින් තොපත් රකිම් ද,) එහෙයින් වෙළෙඳුනි, තෙපි ද ධර්මය ම බලවු. ඉදින් තෙපි ඒ උපාසක නැති වැ මෙහි පැමිණියහු නම් මෙ මරු කතර මං මුළා වැ පිළිසරණක් නැති වැ අලු වන්නහු ය. වැනසෙන්නහු ය, කිසිවකු විසින් යම් කිසිවක් කින්ද්‍රවශයෙන් කියද්දී හේ නො සැලී සිටී. එහෙයින් සත්පුරුෂයකු හා එක්වීම සැප වන්නේ ය.

657. දෙව් කුමර, යම් උවසුවකුට අනුකම්පායෙන් තෙපි මෙහි පැමිණියහු නම් අපි ද ඔහු දකිනු කැමැත්තෙමු. හේ කවරෙක් ද? කිනම් කර්මයක් කෙරේ ද? නම කුමක් ද? ඔහුගේ ගොත්‍රය හෝ කිම? තෙපි යමකුට ප්‍රිය කරවු නම් ඔහුට ලාභයෙක් මැ යැ.

658. සම්භව යන නමක් ඇති පණාට හා කතුර නිසා ජීවත් වන කරනැවැමියෙක් වූ යම් උපාසකයෙක් වේ ද, හේ තොපට වතාවත් කරන්නෙකැ යි ඔහු දනිවු. හේ සුපෙශලයෙකි. එහෙයින් ඔහුට අවමන් නො කරවු.

659. ජානාමසෙ යං ත්වං වදෙසි යක්ඛ
න ඛො නං ජානාම ස ඊදිසොති.
මයම්පි නං පූජයිස්සාම යක්ඛ
සුත්වාන තුය්හං වචනං උළාරං.

660. යෙ කෙචිමස්මිං සත්ථෙ මනුස්සා
දහරා මහන්තා අථවාපි මජ්ඣිමා
සබ්බෙව තෙ ආලම්බන්තු[1] විමානං
පස්සන්තු පුඤ්ඤාන ඵලං කදරියා.

661. තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
තං කප්පකං තත්ථ පුරක්ඛිපිත්වා,
සබ්බෙව තෙ ආලම්බිංසු විමානං
මසක්කසාරං විය වාසවස්ස.

662. තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිංසු,
පාණාතිපාතා විරතා අහෙසුං
ලොකෙ අදින්නං පරිවජ්ජයිංසු.
අමජ්ජපා නො ච මුසා භණිංසු
සකෙන දාරෙන ච අහෙසුං තුට්ඨා.

663. තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිත්වා,
පක්කාමි සත්ථො අනුමොදමානො
යක්ඛිද්ධියා අනුමතො පුනප්පුනං.

664. ගන්ත්වාන තෙ සින්ධුසොවීරභූමිං[2]
ධනත්ථිකා උද්දයං පත්ථයානා,
යථාපයොගා පරිපුණ්ණලාභා
පච්චාගමුං පාටලිපුත්තමක්ඛතං.

665. ගන්ත්වාන තෙ සඝරං සොත්ථිමන්තො
පුත්තෙහි දාරෙහි සමඞ්ගිභූතා,
ආනන්දී විත්තා සුමනා පතීතා
අකංසු සෙරිස්සමහං උළාරං.

666. සෙරිස්සකං තෙ පරිවෙණං මාපයිංසු
එතාදිසා සප්පුරිසාන සෙවනා,
මහත්ථිකා ධම්මගුණාන සෙවනා,
එකස්ස අත්ථාය උපාසකස්ස
සබ්බෙව සත්තා සුඛිතා අහෙසු'න්ති.

සෙරිස්සකපෙතවත්ථු දුතියං.

**භාණවාරං තතියං.**

---

1. ආරුහන්තු - මජසං.
2. සුවීරභූමිං - මජසං.

659. දෙව්කුමර, තෙපි යමකු (ගැන) කියහු නම්, අපි ඔහු දනිමු. (එහෙත්) ''හේ මෙබන්දෙකැ යි'' අපි ඔහු නො දත්තෙමු. දෙවිය, තොපගේ උදර වූ වචන අසා අපි දු ඔහුට බුහුමන් කරන්නෙමු.

660. මේ ගැල් සමූහයෙහි ළදරු වූ ද මහලු වූ ද මධ්‍යම වූ ද යම් මිනිස් කෙනෙක් වෙත් ද, ඔහු හැමදෙන ම මේ විමනට නගිත්වා. තද මසුරෝ පිනෙහි විපාක දකිත්වා.

661. එහි දී ඒ සියලු ම වෙළෙන්දෝ ''මම පළමු කොට'' ''මම පළමු කොට''යි ඒ කපුවා පෙරටු කොට ශක්‍රයාගේ-තව්තිසා භවනයට මෙන් (ඔහු හැම දෙන) දෙව්විමනට නැංගාහ.

662. එහි දී ඒ සියලු ම වෙළෙඳෝ ''මම පළමු කොට'' ''මම පළමු කොට''යි උපාසක බව දන්වා සිටියහ. ඔහු පණිවායෙන් දුරු වූහ. ලොවැ නුදුන් දෙය දුරු කළහ. මත්පැන් නො පූහ. බොරු නො කීහ. සිය බිරිඳගෙන් ම තුටු වූහ.

663. ඒ සියලුදෙන ම එහි දී ''මම පළමු කොට'' ''මම පළමු කොට''යි උපාසක බව නිවෙදනය කොට දෙවියාගේ අනුභාවයෙන් අනුමත වූ වෙළඳ පිරිස නැවත නැවත සතුටු වෙමින් ගියෝ ය.

664. ධනාර්ථී වූ ඔවුහු ධනවෘද්ධිය පතන්නාහු සින්ධු - සොවීර දෙශයට ගොස් අදහස් පරිදි කළ වෙළඳාම් ඇතියාහු පිරිපුන් ලාභ ඇතියාහු නිරුපද්‍රැත වැ පැළලුප් නුවරට පෙරළා ආවාහුය.

665. ඔහු සුවසේ සියගෙවලට ගොස් අඹුදරුවන් සමග එක් වූවාහු සතුටු සිත් ඇති වැ සෙරිස්සක නම් වූ මහත් පූජාවක් කළහ.

666. ඔවුහු සෙරිස්සක නම් පිරිවෙනක් (ආවාසයක්) ද කළාහු ය. සත්පුරුෂයන්ගේ සෙවනය මෙබඳු වෙයි. දහැමි ගුණයන් සෙවනය ද මහත්ඵලදයක වෙයි. එක උපාසකයකු නිසා සියලු සත්ත්වයෝ සුවපත් වූහ යි.

සෙරිස්සක ප්‍රෙතවස්තු යි.

4. 3.

667. රාජා පිඞ්ගලකො නාම සුරට්ඨානං අධිපති අහු,
මොරියානමුපට්ඨානං ගන්ත්වා සුරට්ඨං පුනරාගමා.

668. උණ්හෙ මජ්ඣන්තිකෙ කාලෙ රාජා පඞ්කං උපාගමි,
අද්දස මග්ගං රමණීයං පෙතානං වණ්ණනාපථං,[1]

669. සාරථිං ආමන්තයී රාජා අයං මග්ගො රමණීයො,
ඛෙමො සොවත්ථිකො සිවො ඉමිනා සාරථී යාහි[2]
සුරට්ඨානං සන්තිකෙ ඉතො.

670. තෙන පායාසි සොරට්ඨො සෙනාය චතුරඞ්ගිනියා.
උබ්බිග්ගරූපො පුරිසො සොරට්ඨං එතදබ්‍රවී.

671. කුම්මග්ගං පටිපන්නම්හා භිංසනං ලොමහංසනං
පුරතො පදිස්සති මග්ගො පච්ඡතො ච න දිස්සති.

672. කුම්මග්ගං පටිපන්නම්හා යමපුරිසාන සන්තිකෙ,
අමානුසො වායති ගන්ධො ඝොසො සූයති දාරුණො.

673. සංවිග්ගො රාජා සොරට්ඨො සාරථිං එතදබ්‍රවි,
කුම්මග්ගං පටිපන්නම්හා භිංසනං ලොමහංසනං,
පුරතො ච දිස්සති මග්ගො පච්ඡතො ච න දිස්සති.

674. කුම්මග්ගං පටිපන්නම්හා යමපුරිසාන සන්තිකෙ,
අමානුසො වායති ගන්ධො ඝොසො සූයති දාරුණො.

675. හත්ථික්ඛන්ධස්මා ආරුය්හ ඔලොකෙන්තො චතුද්දිසං,[3]
අද්දස නිග්‍රොධං රමණීයං[4] පාදපං ඡායාසම්පන්නං
නීලබ්භවණ්ණසදිසං මෙඝවණ්ණසිරීනිභං.

676. සාරථිං ආමන්තයී රාජා කිං එසො දිස්සති බ්‍රහා,
නීලබ්භවණ්ණසදිසො මෙඝවණ්ණ සිරීනිභො.

677. නිග්‍රොධො සො මහාරාජ පාදපො ඡායාසම්පන්නො,
නීලබ්භවණ්ණසදිසො මෙඝවණ්ණසිරීනිභො,

678. තෙන පායාසි සොරට්ඨො යෙන සො දිස්සති බ්‍රහා,
නීලබ්භවණ්ණසදිසො මෙඝවණ්ණසිරීනිභො.

679. හත්ථික්ඛන්ධතො ඔරුය්හ රාජා රුක්ඛං උපාගමි,
නිසීදි රුක්ඛමූලස්මිං සාමච්චො සපරිජ්ජනො.

---

1. වණ්ණනා පථං – මජසං.
2. යාම – මජසං.
3. චතුද්දිසා – මජසං.
4. අද්දස රුක්ඛං නිග්‍රොධං – මජසං.

# 4. 3

667. සුරට්ඨ ජනපදයට අධිපති වූ පිංගලක නම් රජෙක් විය. හේ මෞර්ය රාජයන්හට උවටැන් කිරීමට ගොස් යළි සුරට්ඨ දෙශයට ආයේ ය.

668. රජ තෙමෙ උණුසුම් වූ මද්දහන් වේලෙහි මටසිලුටු භූමියකට පැමිණියේ ය. හේ ප්‍රෙතයා විසින් මවන ලද සිත්කලු වූ මටසිලුටු මාර්ගය දුටුවේ ය.

669. රජ රියැදුරු අමතා මෙසේ කිය: "රියැදුර, මේ මඟ සිත්කලු ය. නිර්භය ය. සුව එළවන්නේ ය. උවදුරු රහිත ය, මේ මඟින් යව. මේ මඟින් (යන අපි) සුරට්ඨජනපදය සමීපයෙහි ම වෙමු.

670. සුරට්ඨ දෙශාධිපති රජ තෙමෙ සිවුරඟ සෙනඟ සමඟ ඒ මඟින් ගියේ ය. තැතිගත් ස්වභාව ඇති එක් පුරුෂයෙක් සුරට්ඨ රජුට මෙය කී ය:

671. 'බිය ජනක වූ ලොමුදහ ගන්වන්නා වූ නපුරු මඟකට අපි පිළිපන්නමහ. ඉදිරියෙහි මාර්ගය පෙනෙයි. එහෙත් පසුපස මාර්ගය නො පෙනෙයි.

672. ප්‍රෙතයන්ගේ සමීපයෙහි වූ නපුරු මඟට බැයගත්තෙමු. ප්‍රෙතයන්ගේ සිරුරුගඳ හමයි. ඉතා දරුණු (විලාප) ශබ්ද ඇසේ.

673. සංවෙගයට පැමිණි සුරට්ඨ රජ රියැදුරාට මෙසේ කී ය: (අපි) බියකරු වූ ලොමුදහ ගන්වන නපුරු මඟකට බැස ගත්තමහ. ඉදිරියෙහි මඟ පෙනේ. එහෙත් පසුපස මඟ නො පෙනේ.

674. අපි ප්‍රෙතයන්ගේ සමීපයෙහි වූ නපුරු මඟකට බැස ගතිමු. ප්‍රෙතයන් පිළිබඳ දුගඳ හමයි. දරුණු හඬ ද ඇසේ.

675. ඇතුපිට නැඟ සිවුදිග බලන හේ සිත්කලු සෙවණින් යුත් පැහැයෙන් නිල්වලාකුළක් බඳු වූ මේඝවර්ණ සටහන් ව හැඟෙන නුග රුකක් දිටි.

676. රජ තෙමෙ රියැදුරු ඇමතී ය: "මහත් වූ නිල්වලාකුළක් සමාන මේඝවර්ණ සටහන් ඇති තෙල කිමෙක් පෙනේ. ද යි?

677. මහරජතුමනි, මනහර සෙවණින් යුතු නිල්වලා සමාන පැහැ ඇති මේවන් සිරියෙන් හොබනා ඒ ගස නුගරුකෙකි.

678. යම් තැනෙක පැහැයෙන් නිල්වලාකුළක් බඳු මේඝවර්ණ සටහන් ඇති මහත් වූ ඒ ගස දක්නා ලැබේ ද, සුරට්ඨ රජ තෙමෙ එතන්හි ගියේ ය.

679. රජ තෙමේ ඇත්කඳින් බැස ගස වෙත එළැඹියේ ය. ඇමතියන් සහිත වූ පිරිවර ජනයා සහිත වූ (හේ) රුක්මුලැ හුන්නේ ය.

680. පූරං පානීයකරකං පූවෙ විත්තෙ ච අද්දස,
පුරිසො ච දෙවවණ්ණී සබ්බාභරණභූසිතො
උපසඞ්කමිත්වා රාජානං සොරට්ඨං එතදබ්‍රවි:

681. ස්වාගතං තෙ මහාරාජ අථො තෙ අදූරාගතං,
පිවතු දෙවො පානීයං පූවෙ ඛාද අරින්දම.

682. පිවිත්වා රාජා පානීයං සාමච්චො සපරිජ්ජනො,
පූවෙ ඛාදිත්වා ච පිත්වා ච සොරට්ඨො එතදබ්‍රවී:

683. දෙවතා නුසි ගන්ධබ්බො ආදූ[1] සක්කො පුරින්දදො,
අජානන්තා තං පුච්ඡාම කථං ජානෙමු තං මයං.

684. නම්හි දෙවො න ගන්ධබ්බො නපි[2] සක්කො පුරින්දදො,
පෙතො අහං මහාරාජ සුරට්ඨා ඉධමාගතො.

685. කිං සීලො කිං සමාචාරො සුරට්ඨස්මිං පුරෙ තුවං,
කෙන තෙ බ්‍රහ්මචරියෙන අනුභාවො[3] අයං තව?

686. තං සුණොහි මහාරාජ අරින්දම රට්ඨවඩ්ඪන.
අමච්චා පාරිසජ්ජා ච බ්‍රාහ්මණො ච පුරොහිතො.

687. සුරට්ඨස්මා අහං දෙව පුරිසො පාපචෙතසො
මිච්ඡාදිට්ඨි ච දුස්සීලො කදරියො පරිභාසකො

688. දදන්තානං කරොන්තානං වාරයිස්සං බහුජ්ජනං,
අඤ්ඤෙසං දදමානානං අන්තරායකරො අහං.

689. විපාකො නත්ථි දනස්ස සංයමස්ස කුතො ඵලං,
නත්ථි ආචරියො නාම අදන්තං කො දමෙස්සති.

690. සමතුල්‍යානි භූතානි කුතො ජෙට්ඨාපචායිකො,
නත්ථි බලං විරියං වා කුතො උට්ඨානපොරිසං.

691. නත්ථි දන ඵලං නාම න විසොධෙති වෙරිනං,
ලද්ධෙය්‍යං ලභතෙ මච්චො නියතිපරිණාමජා.

---

1. අදු – මජසං.
2. නම්හි – මජසං.
3. ආනුභාවො – සී. මු I, සී. මු II.

680. පිරුණු පැන්බඳුනක් ද මිහිරි වූ කැවුම් ද (රජ) දුටුවේ ය. දෙවියකු බඳු සියලු අබරණින් සැරසුණු පුරුෂයෙක් සුරට්ඨ රජු වෙත එළඹ මෙය කී ය:

681. මහරජ, ඔබට ස්වාගත යි. (මෙ යහපත් පැමිණීමෙකි.) නපුරු පැමිණීමෙක් නො වේ. රජ තෙමෙ පැන් පානය කෙරේවා, සතුරන් දමනය කරන රජතුමනි, කැවුම් බුදිනු මැන.

682. ඇමතියන් සහිත වූ පරිජනයා සහිත සුරට්ඨ රජ තෙමේ පැන් බී කැවුම් කා යළි පැන් බී මෙය කී ය:

683. (නෙපි) දෙවියෙක් හෝ වවු ද, ගඳඹෙක් හෝ වවු ද නොහොත් පුරින්දද නම් වූ ශක්‍ර හෝ වවු ද? නොප නොහඳුනන අපි නොප විචාරමු. අපි තොප කෙසේ දැනගනිමු ද?

684. මහරජ, දෙවියෙක් නො ම වෙමි. ගඳඹෙක් ද නො වෙමි. පුරින්දද නම් වූ ශක්‍ර ද නො වෙමි. මම සුරට්ඨ දෙශයෙන් මෙහි පැමිණි ප්‍රෙතයෙක්මි.

685. පෙර අත්බැව්හි තෙපි සුරට්ඨ දෙශයෙහි දී කෙබඳු සිල්වතෙක් කෙබඳු යහපත් පැවතුම් ඇතියෙක් වූහු ද? තොපගේ කවර උතුම් හැසිරී-මෙකින් තොපගේ මෙ අනුභාවය වී ද?

686. සතුරන් දමනය කරන, රට දියුණු කරන මහරජතුමනි, එය අසනු මැනවි. ඇමතියෝ ද පිරිසෙහි වූවෝ ද පෙරෙවි බමුණා ද මෙය අසත්වා.

687. දෙවයන් වහන්ස, සුරට්ඨදෙශයෙහි ආ මම පව්සිත් ඇති, මිසදිටු වූ දුශ්ශීල වූ මසුරු වූ මහණ බමුණනට නින්ද කරන පුරුෂයෙක් වීමි.

688. මම දන් දෙන්නන්ට ද උපකාර කරන්නන්ට ද අන්තරාය කරන්නෙක් ව මෙරමාහට දන් දෙන බොහෝ ජනයා (දනමය පිනින්) වැළැක්වීමි.

689. දනයේ විපාකයෙක් නැත. සීලයේ විපාකයෙක් කොයින් ද? ආචාරසමාචාරයෙහි හික්මවන ආචාර්‍ය්‍යයෙක් නැත. කවරෙක් දමනය නො වූ පුද්ගලයකු දමනය කරන්නේ ද? (නැත)

690. සත්වයෝ ඔවුනොවුන් හා සමසමයහ. එහෙයින් කුල දෙටු වන් පිදීමෙ පිනක් කොයින් ලැබේ ද? බලයක් හෝ වීර්‍ය්‍යයක් හෝ නැත. උට්ඨානවීර්‍ය්‍ය සංඛ්‍යාත පුරුෂ ධෛර්‍ය්‍යයක් කොයින් ද?

691. දනයෙහි විපාකයෙක් නම් නැත. වෛරවශයෙන් පව්කම් කළ පුද්ගලයා දනාදි පින් කිරීමෙන් පිරිසිදු නො වේ. සත්ත්ව තෙමෙ ලැබිය යුතු යම් සැපක් හෝ දුකක් ලබන්නේ ද එය (කම් කළ හෙයින් නොව) ඔහුගේ නියතියේ පරිණාමයෙන් වූවක් වශයෙන් ලබයි.

692. නත්ථි මාතා පිතා භාතා ලොකො නත්ථි ඉතො පරං,
නත්ථි දින්නං නත්ථි හුතං සුනිහිතම්පි න විජ්ජති.

693. යොපි හනෙය්‍ය පුරිසං පරස්ස ඡින්දතෙ සිරං,
න කොචි කිඤ්චි හනති සත්තන්නං විවරමන්තරෙ

694. අචෙජ්ජභෙජ්ජො ජීවො අට්ඨංසො ගුළපරිමණ්ඩලො,
යොජනානං සතං පඤ්ච කො ජීවං ඡෙත්තුමරහති.

695. යථා සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨෙන්තං පලායති,
එවමෙවම්පි සො ජීවො නිබ්බෙඨෙන්තො පලායති.

696. යථා ගාමතො නික්ඛම්ම අඤ්ඤං ගාමං පවිසති;
එවමෙවම්පි සො ජීවො අඤ්ඤං කායං පවිසති.

697. යථා ගෙහතො නික්ඛම්ම අඤ්ඤං ගෙහං පවිසති,
එවමෙවම්පි සො ජීවො අඤ්ඤං බොන්දිං[1] පවිසති.

698. චූළාසීතිමහාකප්පුනො සතසහස්සානිපි හි
යෙ බාලා යෙ ච පණ්ඩිතා,
සංසාරං ඛෙපයිත්වාන දුක්ඛස්සන්තං කරිස්සරෙ.

699. මිතානි සුඛදුක්ඛානි දොණෙහි පිටකෙහි ච,
ජිනො සබ්බං පජානාති සම්මූළ්හා ඉතරා පජා.

700. එවං දිට්ඨි පුරෙ ආසිං සම්මූළ්හො මොහපාරුතො,
මිච්ඡාදිට්ඨි ච දුස්සීලො කදරියො පරිභාසකො.

701. ඔරං මෙ ඡහි[2] මාසෙහි කාලකිරියා භවිස්සති,
එකන්තං කටුකං ඝොරං නිරයං පපතිස්සහං.

702. චතුක්කණ්ණං චතුද්වාරං විභත්තං භාගසො මිතං,
අයොපාකාර පරියන්තං අයසා පටිකුජ්ජිතං.

703. තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

1. බුන්දිං - මජසං.
2. ඔරෙන ඡහි - සී.

692. මව (කෙරෙහි) ද පියා (කෙරෙහි) ද සහොදරයා (කෙරෙහි) ද (මනා පිළිවෙතින් හෝ නො මනා පිළිවෙතින් විපාකයෙක් නැත. (මෙලොව සිටින්නහුට) පරලොවක් නැත. (පරලොව සිටින්නහුට) මෙලොවක් නැත. මහාදන විපාකයෙක් ද නැත. අතිථිසත්කාර ඵලයෙක් ද නැත. අනුගාමික නිධාන නම් වූ මහණ බමුණනට දෙන දන ඵල යෙක් ද නැත.

693 යමෙක් පුරුෂයකු නසන්නේ ද මෙරමාගේ හිස සිඳින්නේ ද හේ කිසිවකු නො නසයි. (පෘථිවි ආදි) සප්තකායයන්ගේ සිදුරු අතර අවිය ඇතුළුවනු විනා සත්වයා නො මැරෙයි.

694. සත්ත්වජීවය තෙමේ සිඳිය හැක්කක් හෝ බිඳිය හැක්කක් නො වේ. ඒ ජීවය අටැස් ද පන්දුවක් මෙන් පිරිමඬුලු ද (වටද) වේ. පන්සිය යොදුනක් උස් වෙයි. කවරෙක් ඒ (නිත්‍ය) ජීවය සිඳින්නට සුදුසු ද? සිඳිය හැකි කිසිවෙක් නැත.

695. යම්සේ වෙළීමෙන් කළ නූල්පන්දුවක් දමූ කල්හි එය වෙළුම් ලිහෙමින් ගමන් කෙරේ ද, එපරිද්දෙන් ම ඒ ජීවය තෙමේ (ආත්මභාව නැමති නූල් පන්දුව) වෙළුම් හරිමින් ගමන් කෙරේ.

696. යම්සේ යමෙක් (තමා) වසන ගමින් නික්ම අන්ගමකට පිවිසේ ද, එසේ ම ඒ ජීවය තෙමේ අන් සිරුරකට පිවිසේ.

697. යම්සේ යමෙක් තම ගෙයින් නික්මැ අන් ගෙයකට පිවිසේ ද, එරිද්දෙන් ම ඒ ජීවය අන් සිරුරකට පිවිසේ.

698. යම් බාල කෙනෙක් වෙත් නම්, යම් පණ්ඩිත කෙනෙක් වෙත් නම් (ඔහු හැම දෙන) මහාකල්ප සුවාසූලක්ෂයක් ම සසර ගෙවා දුක් කෙළවර කරන්නාහ.

699. සත්ත්වයන්ගේ සුවදුක් ද්‍රොණයන්ගෙන් හෝ පැසින් (මනින ලද්දක් මෙන්, එකි කල් පිරිසිඳීමෙන්) පමණ කරන ලදී. මේ සියල්ල ජිනභූමියෙහි සිටියේ ම දනියි. සෙසු ප්‍රජා තොමෝ අනිශයින් මූළා වූවා වෙයි.

700. මම පෙර මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වීමි. අතිශයින් මුළා වූ මොහයෙන් වැසුණු මිසදිටු වූ දුසිල් වූ තදමසුරු වූ මෙරමා පිරිහෙළන්-නෙක් වීමි.

701. (මහරජ) සමසෙකින් මොබ මාගේ කාලක්‍රියාව වන්නේ ය. ඒ මම එකැතියෙන් කටුක වූ දරුණු නිරාහි වැටෙන්නෙමි.

702. (ඒ නිරයේ) කොන් සතරෙක් ඇත. සිවුදොරෙක් ඇත. පමණ කොට කොටස් විසින් බෙදන ලද. ලොහො පවුරෙකින් වටකරන ලද. යපියනෙකින් වසන ලද.

703. ඒ මහානිරයේ ලොහොමුවා බිම (වෙයි.) ඇවිළගත් ගින්නෙන් යුතු වෙයි. හැම කල්හි (ඒ ගින්න) හාත්පසැ යොදුන් සියයක් පැතිර සිටී.

704. වස්සසතසහස්සානි[1] ඝොසො සූයති තාවදෙ
ලක්ඛො එසො මහාරාජ සතභාගවස්ස[2] කොටියො

705. කොටිසතසහස්සානි නිරයෙ පච්චරෙ ජනා,
මිච්ඡාදිට්ඨී ච දුස්සීලා යෙ ච අරියූපවාදිනො.

706. තත්ථාහං දීඝමද්ධානං දුක්ඛං වෙදිස්සං වෙදනං
ඵලං පාපස්ස කම්මස්ස තස්මා සොචාමහං භුසං

707. තං සුණොහි මහාරාජ අරින්දම රට්ඨවඩ්ඪන,
ධීතා මය්හං මහාරාජ උත්තරා භද්දමත්ථු තෙ.

708. කරොති භද්දකං කම්මං සීලෙසූපොසථෙ[3] රතා
සඤ්ඤතා සංවිභාගී ච වදඤ්ඤූ වීතමච්ඡරා.

709. අඛණ්ඩකාරී සික්ඛාය සුණ්හා පරකුලෙසු ච,
උපාසිකා සක්‍යමුනිනො සම්බුද්ධස්ස සිරිමතො,

710. භික්ඛු ච සීලසම්පන්නො ගාමං පිණ්ඩාය පාවිසි.
ඔක්ඛිත්තචක්ඛු සතිමා ගුත්තද්වාරො සුසංවුතො.

711. සපදානං චරමානො අගමා තං නිවෙසනං,
තමද්දස මහාරාජ උත්තරා භද්දමත්ථු තෙ.

712. පූරං පානියස්ස කරකං පූවෙ විත්තෙ ච සා අදා,
පිතා මෙ කාලකතො භන්තෙ තස්සෙතං උපකප්පතු,

713. සමනන්තරානුද්දිට්ඨෙ විපාකො උදපජ්ජථ,
භුඤ්ජාමි කාමකාමීහං රාජා වෙස්සවණො යථා.

714. තං සුණොහි මහාරාජ අරින්දම රට්ඨවඩ්ඪන,
සදෙවකස්ස ලොකස්ස බුද්ධො අග්ගො පවුච්චති,
තං බුද්ධං සරණං ගච්ඡ සපුත්තදාරො අරින්දම.

715. අට්ඨඞ්ගිකෙන මග්ගෙන ඵුසන්ති අමතං පදං,
තං ධම්මං සරණං ගච්ඡ සපුත්තදාරො අරින්දම.

716. චත්තාරො මග්ගපටිපන්නා[4] චත්තාරො ච ඵලෙ ඨිතා.
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො,
තං සඞ්ඝං සරණං ගච්ඡ සපුත්තදාරො අරින්දම.

---

1. වස්සානි සතසහස්සානි – සී. මු.
2. භාගස්ස – මජසං.
3. උපොසථෙ සීලෙ – මජසං.
4. චත්තාරො ච පටිපන්නා – මජසං.

704. හවුරුදු ලක්ෂයක් ඉක්මැ ගියකලැ එකෙණෙහි හඬෙක් ඇසෙයි. මහරජතුමනි, එහි ආයුප්‍රමාණය හවුරුදු කෙළ ලක්ෂයයක් වෙයි. මෙ එහි ආයුකාලය යි.

705. යම් සත්ත්ව කෙනෙක් කොටි ලක්ෂයක් හවුරුදු නිරයෙහි පැසෙත් නම් ඔහු මිසදිටුවෝ ද දුසිල්හු ද ආයෙර්‍යාපවාද කොළෝ ද වෙති.

706. මම ඒ මහානිරයෙහි බොහෝ කලක් මුළුලෙහි දුක් වෙදනා විඳින්නෙමි. පාපකර්‍මයාගේ මෙබඳු විපාකයෙක් ඇත. එහෙයින් මම බොහෝ සේ ශොක කරමි.

707. සතුරන් දමනය කරන රට දියුණු කරන මහරජතුමනි, එය අසනුමැන. ඔබට යහපතක් වේවා. මහරජ මාගේ උත්තරා නම් දුවක් ඇත.

708. ඕ පින්කම් කරයි. නිති සිල්හි හා පෙහෙවස්හි ද නිරත වෙයි. කායවාක් සංවරයෙන් යුක්ත ය. දන් බෙද දෙන්නී ය. මිහිරි තෙපුල ඇත්තී ය, පහවූ මසුරුමල ඇත්තී ය.

709. ඕ ශික්ෂා කඩ නො කරන්නී ය. අන්කුලයන් කෙරෙහි මෘදු වෙයි. සිරිමත් ශාක්‍යමුනි වූ සම්බුදුන්ගේ උපාසිකාවකි.

710. යටි හෙළු ඇස් ඇති සිහියෙන් යුත් රක්නා ලද සදොර ඇති මනා සංවරයෙන් යුත් සිල්වත් භික්ෂුනමක් පිඬු පිණිස වැඩියේ ය.

711. ගේ ගෙපිළිවෙළින් පිඬුවාහි හැසිරෙන්නෝ ඒ ගෙට ගියේ ය. මහරජ ඔබට යහපතක් වේවා, උත්තරා තොමෝ ඒ මහණ දුටුවා ය.

712. ඕ පැන් පිරුණු බඳුනක් ද, මිහිරි කැවුම් ද දුන්නා ය. "වහන්ස, මාගේ පියා මළේ ය. ඔහුට මෙ පින පැමිණේවා"යි (ද කී.)

713. පින්දීමට අනතුරුව ම (එහි) විපාකය (මට) ලැබිණි. වෙසවුණු රජු පරිද්දෙන් කම්සැප කැමති මම සැප වළඳමි.

714. සතුරන් දමනය කරන රටට වැඩ වඩන මහරජතුමනි, (එහෙයින්) මෙය අසන්න. සදෙවකලොකයාට බුදුහු අග්‍ර වෙති කියනු ලැබේ. අරින් දමනය කරන රජතුමනි, (තෙපි) ඒ බුදුහු සරණ යවු.

715. අරින්දම වූ රජතුමනි, අරි අටඟිමඟින් අමෘතපදය (නිවන) ස්පර්ශ කෙරෙති. අරින්දම වූ රජතුමනි, පුත්‍රදරාවන් සහිත (තෙපි) ඒ (අෂ්ටාංගිකමාර්ග) ධර්‍මය සරණ යවු.

716. මාර්ගප්‍රතිපන්න සිවුදෙන යැ ඵලයෙහි සිටි සිවුදෙන යැ යන මේ ආර්‍ය සංඝ තෙමෙ ඍජු වූයේ ය. ප්‍රඥාශීල දෙකින් යුක්ත යැ. අරින්දම රජතුමනි, (තෙපි) පුත්‍රදරාවන් සමග ඒ සංඝයා සරණ යවු.

717. පාණාතිපාතා විරමස්සු ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු,
අමජ්ජපො මා ච මුසා අභාණි
සකෙන දාරෙන ච හොහි තුට්ඨො.

718. අත්ථකාමොසි මෙ යක්ඛ හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං ත්වංසි ආචරියො මම.

719. උපෙමි බුද්ධං සරණං ධම්මඤ්චාපි අනුත්තරං,
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං.

720. පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි,
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දාරෙන ච හොමි තුට්ඨො.

721. ඔපුණාමි මහාවාතෙ නදියා වා සීඝගාමියා,
වමාමි පාපිකං දිට්ඨිං බුද්ධානං සාසනෙ රතො.

722. ඉදං වත්වාන සොරට්ඨො විරමිත්වා පාපදස්සනා,
නමො භගවතො කත්වා පාමොක්ඛා[1] රථමාරුහී'ති.

**නන්දක පෙතවත්ථු තතියං.**

## 4. 4.

723. උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ
අපාරුතං ද්වාරං[2] අදානසීලෙ,
නෙස්සාම තං යත්ථ ථුනන්ති දුග්ගතා.
සමප්පිතා නෙරයිකා දුක්ඛෙන.

724. ඉච්චෙව වත්වාන යමස්ස දූතා[2]
තෙ ද්වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා,
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතිං
පක්කාමයුං දෙවගණස්ස සන්තිකෙ.

725. ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
බ්‍යම්හං සුභං කඤ්චනජාලඡන්නං,
කස්සෙතමාකිණ්ණජනං විමානං
සූරියස්ස රංසීරිව ජොතමානං.

726. නාරීගණා චන්දනසාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති,
තං දිස්සති සූරියසමානවණ්ණං
කො මොදති සග්ගපත්තො විමානෙ.

---

1. පාමුඛො - මජසං.
2. අපාරුතද්වාරෙ - මජසං.
3. යක්ඛා ද්වෙ ලොහිතක්ඛා - මජසං.

717. වහා පරපණ නැසීමෙන් වළකින්න. ලෙව්හි අයිනාදන් දුරු කරන්න. මත්පැන් නො බොන්නෙක් වන්න. බොරු නො මැ කියන්න. සිය අඹුව හා සතුටු වන්න.

718. යක්ෂය, තෙපි මට වැඩ කැමැත්තහු, දෙවතාවෙනි, තෙපි මට හිත කැමැතියහු, මම තොපගේ වචනය කරමි. තෙපි මාගේ ඇදුරුහු වවු.

719. මම බුදුන් සරණ යෙමි. අනුත්තර ධර්මය ද (සරණයෙමි) නරදෙව වූ බුදුන්ගේ සංඝයා ද සරණ යෙමි.

720. වහා පණිවායෙන් වෙන් වෙමි. ලෙව්හි අයිනාදන් දුරු කරමි. මත්පැන් නො බොන්නෙක් වෙමි. බොරු ද නො කියමි. සිය අඹුව හා තුටු ද වෙමි.

721. යම් හෙයෙකින් බුදුවරුන්ගේ ශාසනයෙහි මම ඇලුණෙම් ද, එහෙයින් මහාවාතය හමන කල්හි බොල් මෙන් ශිඝ්‍රගාමී සැඩපහර ඇති නදියක තණ රොඩු මෙන් පවිටු මිසදිටු පිඹ හරිමි. වමනය කෙරෙමි.

722. සුරට්ඨ දෙශාධිපති රජ තෙමේ මෙය කියා පාපදෘෂ්ටියෙන් වැළකැ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට පෙරදිගට අභිමුඛ වැ රියට නැඟ ගියේ යි.

**නන්දක ප්‍රෙතවස්තු යි.**

## 4. 4

723. ඉතා පවිටුගති ඇති දන් නො දෙනසුලු වූ රෙවතිය, යම් තැනක දුගතියට ගිය නිරිසත්හු දුකින් යුක්ත වූවාහු තතනත් ද, නො වැසූ දෙර ඇති ඒ නිරයට තී ගෙන යන්නෙමු.

724. ලේවන් ඇස් ඇති මහත් වූ, යමයාගේ දූත වූ ඒ යකුන් දෙදෙන මෙසේ කියා රෙවතිය වෙන වෙන ම අත් අල්ලාගෙන දෙව සමූහයාගේ සමීපයට පැමිණවූහ.

725. හිරුමඬල මෙන් මනහර වූ පැහැ විහිදුවයා රන්දැලින් වැසූණු පිරිසිදු සත්රුවනින් විසිතුරු වූ දෙවහනප්ගෙන් ගැවසීගත් හිරුරැස් මෙන් බබලන මේ විමන කාගේ ද?

726. සඳුන්සුවඳ ගැල්වූ දෙවහනෝ විමන ඇතුළත හා පිටත හොබවති. ඒ විමන හිරුමඬල මෙන් පැහැපත් ව පෙනේ. ඒ විමන්හි සඟපත් කවර දෙවියෙක් දෙව්සැපතින් සතුටු වේ ද?

727. බාරාණසියං නන්දියො නාමුපාසකො[1]
අමච්ඡරී දනපති වදඤ්ඤූ,
තස්සෙතමාකිණ්ණජනං විමානං
සුරියස්ස රංසීරිව ජොතමානං.

728. නාරීගණා චන්දනසාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති,
තං දිස්සති සුරියසමානවණ්ණං
සො මොදති සග්ගපත්තො විමානෙ.

729. නන්දියස්සාහං භරියා
අගාරිනී සබ්බකුලස්ස ඉස්සරා,
භත්තුවිධානෙ රමිස්සාමි දනහං[2]
න පත්ථයෙ නිරයං දස්සනාය.

730. එසො[3] තෙ නිරයො සුපාපධම්ම
පුඤ්ඤං තයා අකතං ජීවලොකෙ,
න හි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං[4] ලභති සහව්‍යතං.

731. කින්නු ගූථඤ්ච මුත්තඤ්ච අසුචි පතිදිස්සති,
දුග්ගන්ධං කිමිදං මීළ්හං කිමෙතං උපවායති,

732. එස සංසවකො නාම ගම්භීරො සතපොරිසො,
යත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙ.

733. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කෙන සංසවකො ලද්ධො ගම්භීරො සතපොරිසො.

734. සමණෙ බ්‍රාහ්මණෙ චාපි අඤ්ඤෙ චාපි වණිබ්බකෙ,
මුසාවාදෙන වඤ්චෙසි තං පාපං පකතං තයා.

735. තෙන සංසවකො ලද්ධො ගම්භීරො සතපොරිසො,
තත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙ.

736. හත්ථෙපි ඡින්දන්ති අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්ති අථොපි නාසං,
අථොපි කාකොළගණා සමෙච්ච
සංගම්ම ඛාදන්ති විඵන්දමානං.

737. සාධු ඛො මං පටිනෙථ කාහාමි කුසලං බහුං,
දනෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච,
යං කත්වා සුඛිතා හොන්ති න ච පච්ඡානුතප්පරෙ.

1. නාමාසි උපාසකො – සීමු i.
2. දනිහං – මජසං.
3. එසො හි – මජසං.
4. සග්ගමගගානං – මජසං.

727. බරණැස නොමසුරු වූ දනපති වූ ප්‍රතිග්‍රාහකයන්ගේ බස් දන්නා වූ නන්දිය නම් උපාසකයෙක් විය. දෙවඟනන්ගෙන් ගැවසුණු හිරුරැස් මෙන් බබළන තෙල විමන ඔහුගේ ය.

728. සාර වූ සඳුන් සුවඳින් අලෙව් දුන් දෙවඟන සමූහයා තෙල විමන ඇතුළත හා පිටත හොබවති. ඒ විමන හිරු හා සම පැහැ ඇතිව පෙනේ. ඒ නන්දිය සගපත් වැ ඒ විමන්හි දෙව්සැපතින් සතුටු වේ.

729. මම නන්දියගේ බිරිඳ වීමි. සියලු කුලධනයට හිමි ගෘහිණියක් වීමි. දැන් මම මහිමියාගේ විමන්හි ඇලෙන්නෙමි. නිරය දක්නට පවා නො පතන්නෙමි.

730. ඉතා පව් ඇති තැනැත්තිය, තෙල නිරය තිට අයත් වෙයි. මිනිස් ලොව දී ති විසින් පින් නො කරන ලද. තදමසුරු; කිපෙනසුලු, පව්වූ ගති ඇති තැනැත්තේ දෙව්ලොව උපනුන්ගේ සහබව නො මැ ලබයි.

731. කිමැ අපවිත්‍ර වූ මල ද මූත්‍ර ද පැනෙයි. මෙ දුගඳ කිමැ? තෙල හමන අසුචි ගඳ කිමැ යි.

732. රෙවතිය, යමතැනක තෝ දහස්වසක් පැසෙන්නෙහි නම්, තෙලෙ බඹසියයක් පමණ ගැඹුරු වූ ඒ සංසවක නම් නිරය යි.

733. කයින් වචනයෙන් මනසින් මා කිනම් පවක් කරන ලද ද? කිනම් පවෙකින් බඹසියයක් පමණ ගැඹුරැති මේ සංසවක නිරය ලැබුණේ ද?

734. තෝ මහණුන් ද බමුණන් ද අන් යදියන් ද මුසාවාදයෙන් රැවටුවහු ය. ති ඒ පව කරන ලද.

735. ඒ පවින් බඹසියයක් ගැඹුරැති සංසව නරකය තිට ලැබුණි. එම්බල රෙවතිය, තෝ එහි දහසක් හවුරුදු පැසෙහු ය.

736. යමපල්ලෝ තිගේ අත් ද යළි පා ද සිඳිති. කන් ද යළි නැහැය ද සිඳිත්. යළි දහස් ගණන් කවුඩෝ ති වෙත අවුත් වටකොට ගෙන තිගේ මස් සල්ව සල්වා කති.

737. මා ආපසු (මනුලොවට) ගෙන යන්නහු නම් මැනවි. මම එහි දී බොහෝ පින් කරන්නෙමි. දනයෙන් ද දහම්හි හැසිරීමෙන් ද ශීලයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද (කල් ගෙවමි.) යමක් කොට සුවපත් වෙත් නම් පසුතැවිලි නො වෙත් නම් මම එබඳු පින් කරමි.

738. පුරෙ තුවං පමජ්ජිත්වා ඉදානි පරිදෙවසි,
සයං කතානං කම්මානං විපාකං අනුභොස්සසි.

739. කො දෙවලොකතො මනුස්සලොකං
ගන්ත්වාන පුට්ඨො මෙ එවං වදෙය්‍ය,
නික්ඛිත්තදණ්ඩෙසු දදාථ දානං
අච්ඡාදනං සයන[1] මථන්නපානං
න හි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහව්‍යතං.

740. සාහං නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නා කාහාමි කුසලං බහුං;
දානෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච.

741. ආරාමානි ච රොපිස්සං දුග්ගෙ සඞ්කමනානි ච,
පපඤ්ච උදපානඤ්ච විප්පසන්නෙන චෙතසා

742. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

743. උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා,
න ච දානෙ පමජ්ජිස්සං සාමං දිට්ඨමිදං මයා.

744. ඉච්චෙවං විප්පලපන්තිං ඵන්දමානං තතො තතො,
ඛිපිංසු නිරයෙ ඝොරෙ උද්ධපාදං අවංසිරං.

745. අහං පුරෙ මච්ඡරිනී අහොසිං
පරිභාසිකා සමණබ්‍රාහ්මණානං,
විතථෙන ච සාමිකං වඤ්චයිත්වා
පච්චාමහං නිරයෙ ඝොරරූපෙ'ති.

රෙවතිපෙතිවත්ථු චතුත්ථං.

## 4. 5

746. ඉදං මමං උච්ඡුවනං මහන්තං
නිබ්බත්තති පුඤ්ඤඵලං අනප්පකං,
තං දානි මෙ පරිභොගං න උපෙති[3]
ආචික්ඛ භන්තෙ කිස්ස අයං විපාකො.

747. හඤ්ඤාමි ඛජ්ජාමි ච වායමාමි
පරිසක්කාමි පරිභුඤ්ජිතුං කිඤ්චි,
ස්වාහං ඡින්නථාමො කපණො ලාලපාමි
කිස්ස කම්මස්ස අයං විපාකො.

---

1. සෙය්‍යා – සීමු ii
2. උද්ධං පාදං – මජ්සං.
3. නදානි මෙ තං පරිභොග මෙති – සීමු i.

738. තෝ පෙර (කුසල් නො කොට) පමා වැ දුන් හඬන්නහු ය. තමා කළ අකුසල්හි විපාකය විඳින්නහු ය.

739. දෙව්ලොවින් මිනිස් ලොවට ගිය, මා විසින් විචාරන ලද කවරෙක් මෙසේ කියා ද? බඟානැබූ දඬු ඇති සිල්වත්නට දන් දෙවූ. පිළි ද සෙනසුන් ද යළි අහර පැන් ද දෙවූ. තදමසුරු, කිපෙනසුලු පව්ගති ඇතියෙක් දෙව්ලොවට ගියවුන්ගේ සහවාසය නො ලබයි.

740. ඒ මම මෙයින් ච්‍යුත වැ ගොස් මිනිසත් බව ලැබ, යදියන්ගේ වදන් දන්නා සිල් ඇතියක් ව දනයෙන් ද මනා පැවැත්මෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද යුතු වැ බොහෝ කුසල් කරන්නෙමි.

741. පුෂ්පාරාම – ඵලාරාමයන් ද රොපණය කරන්නෙමි. දුර්ග මාර්ගයෙහි ඒදඬු පාලම් තනන්නෙමි. පහන් සිතින් යුතු වැ ළිං සහ පැන් පොකුණු ද පැන්තාලි ද කරවන්නෙමි.

742. පක්ෂය පිළිබඳ තුදුස්වක්ද ද පසළොස්වක්ද ද අටවක්ද ද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද අෂ්ටාංගයෙන් යුක්ත වූ,

743. පෙහෙවස් සමාදන් වෙමි. පන්සිල්හි නිතර සංවෘත වූ මම දනයෙහි පමා නො වන්නෙමි. මේ නිරාදූක මවිසින් තමන් ම දක්නා ලද යැ.

744. මෙසේ වැලපෙන ඔබැ මොබැ වැටෙමින් වෙවුලන රෙවතිය යමපල්ලෝ අල්වාගෙන පා උඩුකුරු කොට හිස යටිකුරු කොට දරුණු වූ නිරයෙහි හෙළූහ.

745. මම පෙර තදමසුරු තැනැත්තියක් වීමි. මහණ–බමුණනට අවමන් කරන්නියක් වීමි. බොරුවෙන් සැමියා රවටා දරුණු ස්වභාව ඇති තෙල සංසවක නිරයෙහි පැසෙමි.

**රෙවතී ප්‍රෙතවස්තු යි.**

## 4. 5

746. වහන්ස, අනල්ප කුසලවිපාකයක් වූ මේ මහත් උක්වනය මට පහළ වැ ඇත. එහෙත් දූන් එය මගේ පරිභොගයට නො පැමිණේ. මේ කිනම් පවක විපාකයෙක් දැ යි කියනු මැන.

747. ඒ මම යම්කිසි උක්ගසක් කෑමට වෑයම් කෙරෙම් ද, උත්සාහ දරම් ද එකල මම වෙහෙසට පැමිණෙමි. උක් පතින් කැපෙමි. ඒ මම සුන් වූ බල ඇතියෙම් බැගෑපත් වූයෙම් අතිශයින් වැලපෙමි. මේ කෙබඳු පවක විපාකයෙක් ද?

748. විසාතො චාහං පරිපතාමි ඡමායං
පරිවත්තාමි වාරිචරොව ඝම්මෙ,
රුදතො ච මෙ අස්සුකා නිග්ගලන්ති
ආචික්ඛ භන්තෙ කිස්ස අයං විපාකො.

749. ඡාතො කිලන්තො ච පිපාසිතො ච
සන්තාසිතො සාතසුඛං න වින්දෙ,
පුච්ඡාමි තං එතමත්ථං භදන්ත
කථන්නු උච්ඡුපරිභොගං ලභෙය්‍යං.

750. පුරෙ තුවං කම්මමකාසි අත්තනා
මනුස්සභූතො පුරිමාය ජාතියා,
අහං ච තං එතමත්ථං වදාමි
සුත්වාන ත්වං එතමත්ථං විජාන.

751. උච්ඡුං තුවං ඛාදමානො පයාතො
පුරිසො ච තෙ පිට්ඨිතො අන්වගච්ඡි,[1]
සො ච තං පච්චාසංසන්තො කථෙසි
තස්ස තුවං න කිඤ්චි ආලපිත්ථ.

752. සො ච තං අභණන්තං අයාචි
දෙහය්‍ය උච්ඡුන්ති ච තං අවොච,
තස්ස තුවං පිට්ඨිතො උච්ඡුං අදාසි
තස්සෙතං කම්මස්ස අයං විපාකො.

753. ඉඞ්ඝ තුවං පිට්ඨිතො ගණ්හ උච්ඡුං
ගහෙත්වාන ඛාදස්සු යාවදත්ථං,
තෙනෙව ත්වං අත්තමනො භවිස්සසි
හට්ඨො චුදග්ගො ච පමොදිතො ච.

754. ගන්ත්වාන සො පිට්ඨිතො අග්ගහෙසි
ගහෙත්වාන තං ඛාදි යාවදත්ථං,
තෙනෙව සො අත්තමනො අහොසි
හට්ඨො චුදග්ගො ච පමොදිතො චා'ති.

**උච්ඡුපෙතවත්ථු පඤ්චමං.**

## 4. 6

755. සාවත්ථි නාම නගරං හිමවන්තස්ස පස්සතො,
තත්ථ ආසුං ද්වෙ කුමාරා රාජපුත්තාති මෙ සුතං.

756. පමත්තා[2] රජනීයෙසු කාමස්සාදභිනන්දිනො,
පච්චුප්පන්නෙ සුඛෙ ගිද්ධා න තෙ පස්සිංසු නාගතං.

---

1. අනුගඤ්ඡිම – මජස .
2. සම්මත්තා – සීමු i.

748. තවද මම වෙහෙසට පැමිණියෙම් බිම වැටෙමි. අව්වෙන් රත් වූ පොළොවෙහි මසෙකු මෙන් පෙරළෙමි. හඬන්නා වූ මාගේ දෙනෙතින් කඳුළු ගලයි. වහන්ස, මේ කිනම් කර්‍මයක විපාකයෙක් දැ යි කියනු මැනවි.

749. මම බඩසයින් පෙළුණෙම් ක්ලාන්ත වූයෙමි. පවස් ඇතියෙම් අධික පිපාසා ඇතියෙම් මිහිරි සුවයක් නො ලබමි. වහන්ස, කෙසේ උක්රස පරිභොගයක් ලබම් ද යන මෙ කරුණ ඔබ විචාරමි.

750. තෙපි පෙර ජාතියෙහි මිනිස් වැ ඉපද තුමූ මැ පව් කමක් කළහු. මම තොපට මෙකරුණ කියමි. තෙපි මෙකරුණ අසා දැනගනිවු.

751. තෙපි උක්දණ්ඩක් කමින් ගියහු යැ. තොප පසුපසින් එක් පුරුෂයෙක් ද තොප අනුව ගියේ ය. හෙ ද උක්රසය කැමති වෙමින් තොපට කථා කෙළේ ය. තෙපි ඔහුට කිසිවක් නො කීවහු ය.

752. හෙ ද නොබණන තොප යැදි ය. ''ආයර්‍යය, උක් දණ්ඩක් දෙව''යි තොපට කී ය. තෙපි පිටුපසින් ඔහුට උක් දණ්ඩක් දුන්නහු යැ. ඒ කර්‍මයාගේ මේ විපාකය වෙයි.

753. එසේ නම් තෙපි පිටුපසින් උක්දඬු ගනිවු. රැගෙන ඇති තාක් කව. එයින් ම තෙපි සතුටු වන්නහු ය. පහටු වන්නහු ය. ඔදවැඩි සිත් ඇති වන්නහු ය. ප්‍රමුදිත ද වන්නහු ය.

754. ඒ ප්‍රෙතයා ද උක්කෙතට ගොස් පිටුපසින් උක්දඬු ගත්තේ ය. රැගෙන එය ඇති තාක් කෑවේ ය. එයින් ම හෙ සතුටු වූයේ ද පහටු වූයේ ද ඔදවැඩි සිතැත්තේ ද ප්‍රමුදිත වූයේ ද විය.

**උච්ඡු ප්‍රෙතවස්තු යි.**

## 4. 6

755. හිමවතැ එක් පසෙකැ සැවැත් නම් නුවරෙක් ඇත. එහි රජපුත් වූ කුමරුවෝ දෙදෙනෙක් වූහ යි මඩිසින් අසන ලද.

756. සිත් ඇලවියයුතු වූ කම්සැපෙහි ප්‍රමත්ත වූ කාමාස්වාදයෙන් සතුටු වනසුලු වූ වත්මන් සුවයෙහි ම ගිජු වූ ඔහු දෙදෙන අනාගත සුවයක් නො බැලූහ.

757. තෙ චුතා ච මනුස්සත්තා පරලොකං ඉතො ගතා.
තෙධ සොසෙන්ත්‍යාදිස්සන්තා පුබ්බෙ දුක්කටමත්තනො.

758. බහූසු වත සන්තෙසු දෙය්‍යධම්මෙ උපට්ඨිතෙ,
නාසක්ඛිම්හා ච අත්තානං පරිත්තං කාතුං සුඛාවහං.

759. කිං තතො පාපකං අස්ස යං නො රාජකුලා චුතා.
උපපන්නා[1] පෙත්තිවිසයං ඛුප්පිපාසාසමප්පිතා.

760. සාමිනො ඉධ හුත්වාන හොන්ති අස්සාමිනො තහිං,
චරන්ති[2] ඛුප්පිපාසාය මනුස්සා උන්නතොනතා.

761. එතමාදීනවං ඤත්වා ඉස්සරමදසම්භවං
පහාය ඉස්සරමදං භවෙ සග්ගගතො නරො;
කායස්ස භෙද සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී'ති.

**කුමාරපෙතවත්ථු ඡට්ඨං.**

## 4. 7

762. පුබ්බෙ කතානං කම්මානං විපාකො මථයෙ මනං,
රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ පොට්ඨබ්බෙ ච මනොරමෙ.

763. නච්චං ගීතං රතිං ඛිඩ්ඩං අනුභුත්වා අනප්පකං,
උය්‍යානෙ පරිචරිත්වාන[3] පවිසන්තො ගිරිබ්බජං.

764. ඉසිං සුනෙත්ත[4] මද්දක්ඛි අත්තදන්තං සමාහිතං
අප්පිච්ඡං හිරිසම්පන්නං උඤ්ඡෙ පත්තගතෙ රතං.

765. හත්ථික්ඛන්ධතො ඔරුය්හ ලද්ධා[5] භන්තෙති ච බ්‍රැවි,
තස්ස පත්තං ගහෙත්වාන උච්චං පග්ගය්හ ඛත්තියො.

766. ථණ්ඩිලෙ පත්තං භින්දිත්වා හසමානො අපක්කමි,
රඤ්ඤො කිතවස්සහං පුත්තො කිං මං භික්ඛු කරිස්සසි.

767. තස්ස කම්මස්ස ඵරුසස්ස විපාකො කටුකො අහු,
යං රාජපුත්තො වෙදෙසි නිරයම්හි සමප්පිතො.

768. ඡළෙව චතුරාසීති වස්සානි නහුතානි ච,
භුසං දුක්ඛං නිගච්ඡිත්ථො නිරයෙ කතකිබ්බිසො.

---

1. උපපන්නා – ප.
2. භමන්ති – මජසං.
3. පරිචරිත්වා – මජසං.
4. සුනීතං – මජසං.
5. ලද්ධං – මජසං.

757. ඔහු මේ මිනිසත් බැවින් චුත වැ පරලොවැ ප්‍රෙතලොකයට ගියහ. ඔහු තමන්ගේ පෙර අත්බැව්හි දුෂ්කෘතය (පාපකර්‍මය) දක නොපෙනෙන සිරුරින් යුතුව මෙ නුවර සමීපයෙහි සිට මෙසේ කැගසත්:

758. ''බොහෝ දක්ෂිණාර්හයන් ඇති කල්හි දු දනවස්තු එළඹ සිටි කල්හි දු තමනට සැප එළවන පිනක් කරන්නට එකාන්තයෙන් නොහැකි වූම්හ.

759. ''අපි යම් පව්කමෙකින් රාජකුලයෙන් චුත වැ ප්‍රෙත-ලොකයෙහි උපන්නමෝ සා පිපාසායෙන් මඩනා ලදුමෝ නම් එයට වඩා ලාමක වූ අන් කුමක් ඇත්තේ ද?

760. මේ මනුලොව දී පෙර යම් තැනක ස්වාමී වැ සිටියාහු ද? ඒ ප්‍රෙත ලොකයෙහි දී අස්වාමිහු වෙති. උසස් වැ සිටි ඒ මිනිස්සු පහත් වූවාහු සාපිපාසායෙන් යුතු වැ හැසිරෙත්.

761. මිනිස් තෙමේ ඉසුරුමදයෙන් හටගත් මේ ආදීනවය දන ඉසුරු මදය දුරු කොට (කුසලයෙහි ඇලුණේ) ස්වර්ග ගත වෙයි. නුවණැති (ඒ) පුරුෂ කාබුන් මරණින් මතු දෙව් ලොවට පැමිණේ.

**කුමාර ප්‍රෙතවස්තු යි.**

## 4. 7

762. පෙර දූයෙහි කළ පාපකර්‍මයාගේ විපාකය (අන්ධබාලයන්ගේ) සිත මනරම් වූ රූප...ශබ්ද...රස...ගන්ධ...ස්ප්‍රෂ්ටව්‍ය හෙතුයෙන් මැඩලයි.

763. බොහෝ වූ නැටුම් ගැයුම් කම්රති හා ක්‍රීඩා විඳ උයන්හි අභි රමණය කොටැ රජගහ නුවරට පිවිසෙන (රජපුත් තෙමේ)

764. දමුණු සිත් ඇති (අර්හත් ඵල සමාධියෙන්) සමාහිත වූ අපිස් වූ හිරි (ලජ්ජා) යෙන් යුත් පාත්‍රගත පිඩුවායෙන් (පමණක්) සතුටු වූ සුනෙත් නම් (පසේබුදු) මහර්ෂීහු දිටි.

765. (ඒ රජපුත්) ඇතුපිටින් බැස වහන්ස, (පිණ්ඩපාතය) ලද දූ යි විචාළේ ය. ඒ රජපුත් උන්වහන්සේගේ පාත්‍රය ගෙන ඔසවා,

766. තද බිම් පෙදෙසක පාත්‍රය ගටා බිඳ සිනාः සෙමින් මඳක් ඉවත් විය. (කුළුණු සිතින් බලන පසේබුදුනට මෙසේ කී). ''මහණ මම කිතව රජුගේ පුත් වෙමි. මට කුමක් කරන්නෙහි ද?''යි.

767. දරුණු වූ ඒ පාපකර්මයාගේ විපාකය කටුක විය. නිරයෙහි උපන් රාජපුත්‍ර යම් විපාකයක් වින්දේ ද, (එය මෙසේ ය:)

768. කළපව් ඇති (හේ) සයෙන් ගුණ කළ සුවාසූදහස් වූ නහුත ගණන් හවුරුදු මුළුල්ලෙහි නිරයෙහි බොහෝ දුකට පැමිණියේ ය.

769. උත්තානොපි ච පච්චිත්වා නිකුජ්ජො වාමදක්ඛිණො,
උද්ධංපාදො ඨිතො චෙව චිරං බාලො අපච්චථ

770. බහූනි වස්සසහස්සානි පූගානි නහුතානි ච,
භුසං දුක්ඛං නිගච්ඡිත්ථො නිරයෙ කතකිබ්බිසො.

771. එතාදිසං ඛො කටුකං අප්පදුට්ඨප්පදෙසිනං.
පච්චන්ති පාපකම්මන්තා ඉසිමාසජ්ජ සුබ්බතං.

772. සො තත්ථ බහුවස්සානි වෙදයිත්වා බහුං දුඛං,
ඛුප්පිපාසාහතො නාම පෙතො ආසි තතො චුතො.

773. එතමාදීනවං දිස්වා[1] ඉස්සරමදසම්භවං,
පහාය ඉස්සරමදං නිවාතමනුවත්තයෙ.

774. දිට්ඨෙව ධම්මෙ පාසංසො යො බුද්ධෙසු සගාරවො,
කායස්ස භෙද සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී’ති.

රාජපුත්තපෙතවත්ථු සත්තමං.

## 4. 8

775. ගූථකූපතො උග්ගන්ත්වා කො නු දීනො හි තිට්ඨසි,[2]
නිස්සංසයං පාපකම්මන්තො කින්නු සද්දහසෙ තුවං;

776. අහං භදන්ත පෙතොම්හි දුග්ගතො යමලොකිකො;
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතො.

777. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසි.

778. අහු ආවාසිකො මය්හං ඉස්සුකී කුලමච්ඡරී,
අජ්ඣාසිතො[3] මය්හං ඝරෙ කදරියො පරිභාසකො.

779. තස්සාහං වචනං සුත්වා භික්ඛවො පරිභාසිසං,
තස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතො.

780. අමිත්තො මිත්තවණ්ණෙන යො තෙ ආසි කුලූපකො,
කායස්ස භෙද දුප්පඤ්ඤො කින්නු පෙච්ච ගතිං ගතො.

781. තස්සෙවාහං පාපකම්මස්ස සීසෙ තිට්ඨාමි මත්ථකෙ,
සො ච පරවිසයං පත්තො මමෙව පරිචාරකො.

782. යං භදන්ත[4] හදන්තඤ්ඤෙ එතං මෙ හොති භොජනං,,
අහං ච ඛො යං හදමි එතං සො උපජීවතී’ති.

ගූථඛාදකපෙතවත්ථු අට්ඨමං.

1. ඤත්වා – මජසං.
2. දීනො පතිට්ඨසි – මජසං.
3. අජ්ඣා සිතො – සීමු i, සීමු ii.
4. හදන්තෙ – මජසං.

769. (ඒ) බාලයා තෙමේ උඩුකුරුව ද යටිකුරුව ද සිට වමැලයෙන් ද දකුණැලයෙන් ද සිට උඩුකුරුපා ඇති ව ද (කෙළින්) සිට ද බොහෝ කලක් පැසිණි.

770. කළපව් ඇති හේ නොයෙක් අවුරුදු දහස් ගණන් ද, හවුරුදු සමූහයන් ද, නහුතගණන් ද මුළුල්ලෙහි ඒ නිරයෙහි අතිශය දුඃඛයට පැමිණියේ ය.

771. කිපෙන්නවුන් කෙරෙහි නො කිපෙන මනා පැවතුම් ඇති මුනිවරයකුට ගැහැට කොට පව්කම් කරන්නෝ මෙබඳු කටුක දුක් (විඳිමින්) පැසෙත්.

772. ඒ රජපුත් ඒ නිරයෙහි බොහෝ හවුරුදු ගණන් බොහෝ දුක් විඳ එයින් චුත වූයේ සාපිපාසා දෙකින් මඩනා ලද ප්‍රෙතයෙක් විය.

773. යමෙක් ඉසුරුමදයෙන් හටගත් මේ ආදීනවය දැක ඉසුරු මදය හැර නිහතමානී වැ දිවි පවත්වා ද,

774. බුදුවරුන් කෙරෙහි ගෞරව සහිත වේ ද, ඒ පැනැති මිනිස් තෙමේ මේ අත්බැව්හි ම පැසසියයුතු වෙයි. කාබුන් මරණින් මතු දෙව්-ලොවට පැමිණෙයි.

**රාජපුත්‍ර ප්‍රෙතවස්තු යි.**

## 4. 8

775. අශුචි වළෙන් උඩට නැඟී බැගෑපත් වැ සිටුනා තෙපි කවරහු ද? පව්කම් ඇති තෙපි කවරහු දැ යි මම් කෙසේ නිසැක ව අදහම් ද?

776. ස්වාමීනි, මම පව්කම් කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගිය යමලොවට අයත් දුගී ප්‍රෙතයෙක්මි.

777. කයින් වචනයෙන් මනසින් තොප කිනම් පවක් කරන ලද ද? කවර පව්කමක විපාකයෙන් (තෙපි) මෙ දුකට පැමිණියහු ද?

778. ඊර්ෂ්‍යා කරනසුලු වූ, කුලයන් කෙරෙහි මසුරු වූ, තද මසු-රෙක් වූ සිල්වත්නට පරිභව කරන මාගේ ගෙහි ඇලුම් කළ, ආවාසික භික්ෂු නමක් මා කළ විහාරයෙහි විසී ය.

779. ඒ භික්ෂුහුගේ කීම් අසා මම සිල්වත් භික්ෂූන්ට නින්ද කෙළෙමි. ඒ කර්‍මයාගේ විපාකයෙන් මම මෙලොවින් චුත ව ප්‍රෙතලොකයට ගියෙමි.

780. තොපගේ මිත්‍රස්වරූපයෙන් කුලූපග වූ යම් අමිත්‍රයෙක් වී ද ඒ අඥාන තෙමේ කාබුන් මරණින් මතු පරලොවැ කිනම් ගතිය (උපත) කට පැමිණියේ ද?.

781. කළ පව්කම් ඇති ඒ ශ්‍රමණ ප්‍රෙතයාගේ හිස මුදුනෙහි මම දැන් සිටිමි. හෙ ද ප්‍රෙතලොකයට පැමිණියේ මාගේ මෙහෙ කරුවෙක් විය.

782. වහන්ස, සෙස්සෝ යම් වස්කිසක් කෙරෙත් නම් ඒ වස් (මල) මගේ භොජන වෙයි. මම් වනාහි යම් වස් කිසක් කෙරෙම් නම් ඒ වස් අනුභවයෙන් හේ ජීවත් වෙයි.

**ගූථඛාදක ප්‍රෙතවස්තු යි.**

## 4. 9

783. ගූථකූපතො උග්ගන්ත්වා කා නු දීනා හි තිට්ඨසි,
නිස්සංසයං පාපකම්මන්තා[1] කින්නු සද්දහසෙ තුවං.

784. අහං භද්දන්ත පෙතීම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

785. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසි.

786. අහු ආවාසිකො මය්හං ඉස්සුකී කුලමච්ඡරී,
අජ්ඣාසිතො මය්හං ඝරෙ කදරියො පරිභාසකො.

787. තස්සාහං වචනං සුත්වා භික්ඛවො පරිභාසිසං,
තස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතා.

788. අමිත්තො මිත්තවණ්ණෙන යො තෙ ආසි කුලූපකො,
කායස්ස භෙද දුප්පඤ්ඤො කින්නු පෙච්ච ගතිං ගතො.

789. තස්සෙවාහං පාපකම්මස්ස සීසෙ තිට්ඨාමි මත්ථකෙ,
සො ච පරවිසයං පත්තො මමෙව පරිචාරකො.

790. යං භද්දන්ත හදන්තඤ්ඤෙ එතං මෙ හොති භොජනං,
අහං ච ඛො යං හදමි එතං සො උපජීවතී'ති.

**ගූථඛාදකපෙතිවත්ථු නවමං.**

## 4. 10

791. නග්ගා දුබ්බණ්ණරූපාත්ථ කිසා ධමනිසන්ථතා[2],
උප්ඵාසුලිකා කිසිකා කෙ නු තුම්හෙත්ථ මාරිසා.

792. මයං භද්දන්ත[3] පෙතාම්හා දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකමිතො ගතා.

793. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන පෙතලොකමිතො ගතා.

---

1. කම්මන්ති – මජසං.
2. සණ්ඨිතා – මජසං.
3. භදන්තා – මජසං.

## 4. 9

783. අශුචිවළෙන් නැඟී බැගැපත් වැ සිටුනා තෝ කවරහු ද? පව්කම් ඇති තී කවරක් දූ යි මම් කෙසේ නිසැක වැ අදහම් ද?

784. ස්වාමීනි, මම් පව්කම් කොට මෙලොවින් ප්‍රේතලොකයට ගිය යමලොවට අයත් ප්‍රේතියක්මු,

785. කයින් වචනයෙන් මනසින් තී කිනම් පවක් කරන ලද ද? කවර පව්කමක විපාකයෙන් තෝ මේ දුකට පැමිණියහු ද?

786. ඊර්ෂ්‍යා කරනසුලු වූ කුලයන් කෙරෙහි මසුරු වූ තද මසුරෙක් වූ සිල්වත්නට පරිභව කරන මාගේ ගෙහි ඇලුම් කළ ආවාසික භික්ෂුනමක් මා කළ විහාරයෙහි විසී.

787. මම ඒ භික්ෂුහුගේ බස් අසා සිල්වත් භික්ෂූන්හට නින්ද කළමු. ඒ කර්‍මයාගේ විපාකයෙන් මම මෙලොවින් චුත වැ ප්‍රේත ලොකයට ගියමු.

788. තීගේ මිත්‍ර ස්වරූපයෙන් කුලුපග වූ යම් අමිත්‍රයෙක් වී ද, ඒ අඥාන තෙමේ කාබුන් මරණින් මතු පරලොවැ කිනම් ගතිය (උපත) කට පැමිණියේ ද?

789. කළ පව්කම් ඇති ඒ ශ්‍රමණ ප්‍රේතයාගේ හිස මතුයෙහි මම දූන් සිටිමි. හෙ ද ප්‍රේතලොකයට පැමිණියේ මාගේ මෙහෙකරුවෙක් වී.

790. වහන්ස, සෙස්සෝ යම් වස්කිසක් කෙරෙත් නම් ඒ වස් (මල) මාගේ හොජන වෙයි. මම් වනාහි යම් වස්කිසක් කරම් නම් ඒ වස් අනුභවයෙන් හේ ජීවත් වෙයි.

**ගුථඛාදක ප්‍රේතිවස්තු යි.**

## 4. 10

791. නිදුකාණෙනි, තෙපි නග්නනහු යැ, කෘශ යැ, ඉල්පුණු නහර සහ උස් වැ නැඟුණු ඉළ ඇට ඇත්තහු යැ දුර්වර්ණ වූ රූප ඇති ඉතා කෙට්ටු වූ තෙපි කවරහු ද?

792. ස්වාමීනි, අපි යමලොවැ උපන් දුගී වූ ප්‍රේතයෝ වෙමු. පව් කම් කොට මෙලොවින් ච්‍යුත වැ ප්‍රේතලොකයට ගියෝ වෙමු.

793. කයින් වචනයෙන් සිතින් කිනම් පව්කමක් (තොප විසින්) කරන ලද ද? කිනම් කර්‍මවිපාකයෙකින් මෙලොවින් ප්‍රේතලොකයට ගියහු ද?

794. අනාවටෙසු තිත්ථෙසු විචිනිම්හද්ධමාසකං,
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකම්හ අත්තනො.

795. නදිං උපෙම තසිතා රිත්තකා පරිවත්තති,
ඡායං උපෙම උණ්හෙසු ආතපො පරිවත්තති.

796. අග්ගිවණ්ණො ච නො වාතො දහන්තො උපවායති,
එතඤ්ච භන්තෙ[1] අරහාම අඤ්ඤඤ්ච පාපකං තතො.

797. අපි යොජනානි ගච්ඡාම ඡාතා ආහාරගෙධිනො,
අලද්ධාව නිවත්තාම අහො නො අප්පපුඤ්ඤතා.

798. ඡාතා පමුච්ඡිතා භන්තා භූමියං පටිසුම්භිතා,
උත්තානා පතිකිරාම අවකුජ්ජා පතාමසෙ.

799. තෙ ච තත්ථෙව පතිතා[2] භූමියං පටිසුම්භිතා,
උරං සීසඤ්ච ඝට්ටෙම අහො නො අප්පපුඤ්ඤතා.

800. එතඤ්ච භන්තෙ අරහාම අඤ්ඤඤ්ච පාපකං තතො,
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකම්හ අත්තනො.

801. තෙ හි නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නා කාහාම කුසලං බහු'න්ති.

**ගණපෙතවත්ථු දසමං.**

## 4. 11

802. දිට්ඨා තයා නිරයා තිරච්ඡානයොනි
පෙතා අසුරා අථවාපි මනුස්සා දෙවා[3]
සයමද්දස[4] කම්මවිපාකමත්තනො
නෙස්සාමි තං පාටලිපුත්තමක්ඛතං
තත්ථ ගන්ත්වා කුසලං කරොහි කම්මං.

803. අත්ථකාමොසි මෙ යක්ඛ හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං ත්වංසි ආචරියො මම.

804. දිට්ඨා මයා නිරයා තිරච්ඡානයොනි
පෙතා අසුරා අථවාපි මනුස්සා දෙවා
සයමද්දස කම්මවිපාකමත්තනො
කාහාමි පුඤ්ඤානි අනප්පකානී'ති.

**පාටලිපුත්තපෙතවත්ථු එකාදසමං.**

1. භදන්ත – මජසං.
2. තත්ථපපතිතා – මජසං.
3. අථ මානුසා දෙවා – මජසං.
4. අද්දසං – මජසං.

794. (කිසිවකු විසින්) නො නවත්වන ලද ගං–තළා ඈ දිය නහන තොටුපළවල (මිනිසුන්ට අමනක වැ ගිය දෑ ලැබීමේ ලොභයෙන් පෙළුණු සිතින්) අඩමසක් පමණ කල් අහර සොයා ඇවිද්දෙමු. (නොහොත් කිසිවකු විසින් නො වැළැක්වූ මහණ බමුණන් එලැඹ සිටිකල්හි මසුරු මලින් යුතුවැ අඩමස්සක් පමණවත් කිසිවකුට නො දෙමින් ධන රැස් කළම්හ) දියයුතු දනවස්තුව ඇති කල්හිත් තමනට පරලොව දී පිහිටවන පිනක් නො කළම්හ.

795. පවසින් පෙළුණු අපි නදියකට පැමිණෙමු නම ඒ නදී තොමෝ දියෙන් හිස් බවට පෙරළේ. උෂ්ණ කාලයෙහි සෙවණකට පැමිණෙමු නම් එතැනට අව්ව පෙරළේ.

796. ගිනිවන් වූ වාතය ද අප (සිරුරු) දවමින් හමයි. වහන්ස, මේ දුකට ද මෙයින් අන්‍ය වූ මෙයට වඩා දරුණු දුකකට ද (අපි) සුදුසු වම්හ.

797. (අපි) සාදුකින් පෙළෙන්නමෝ අහරෙහි ගිජු වැ නොයෙක් යොදුන් ගණන් අහර සොයා යම්හ. අහරක් නො ලබා මැ නවතිමු. අපගේ පින් නැති බව ආශ්චර්‍ය්‍ය යි.

798. වෙසෙසින් පෙළුණු, මුසපත් වූ, අපි භ්‍රාන්ත වූවාහු බිම ඇදවැටෙන්නෙමු. උඩුකුරු වැ වැටුණාහු විසුරුණු අවයව ඇත්තෙමු. එහෙයින් යටිකුරු වැ වැටෙමු.

799. ඒ ගිය ගිය තැන ම වැටුණා වූ ද, නැගී සිටීමට නොහැකි වැ බිමැ වැටුණා වූ ද ඒ අපි ළයට ද හිසට ද ගසා ගනිමු. අපේ පින් නැති බව අඳෝම යි,

800. වහන්ස, මේ දුකට ද මෙයට වඩා ලාමක වූ අනෙක් දුකකට ද අපි සුදුස්සම්හ. දෙයධර්මය ඇති කල්හිත් තමහට පිහිට වන පිනක් නො කෙළෙමු.

801. ඒ අපි මෙලොවින් ච්‍යුත වැ ගොස් මිනිස් ලොවැ උපතක් ලැබ යදියන්ගේ වදන් දන්නාසුලු වැ සීල සමපන්න වැ එකාන්තයෙන් බොහෝ කුසල් කරන්නෙමු.

**ගණප්‍රෙතවස්තු යි.**

## 4. 11

802. තොප විසින් නිරිසත්හු ද තිරිසන්හු ද ප්‍රෙතයෝ ද, අසුරයෝ ද, එසේ ම මිනිස්හු ද දෙවියෝ ද දක්නා ලද්දහු යැ. තෙපි තමන්ගේ පව්කම්හි විපාකය තුමූ ම දුටුවහු ය. මම තොප කිසිවකු විසින් නො දක්නා ලදුව පැළලුප් නුවරට පමුණුවන්නෙමි. තෙපි එහි ගොස් පින් කම් කරවු.

803. යක්ෂය, තෙපි මට වැඩ කැමැත්තහු. දෙවියෙනි; හිත කැමැත් තහු ය. තොපගේ වචනය කෙරෙමි, තෙපි මට ආචාර්‍ය්‍ය වවු.

804. මා විසින් නිරිසත්හු ද තිරිසන්හු ද ප්‍රෙතයෝ ද අසුරයෝ ද මනුෂ්‍යයෝ ද දෙවියෝ ද දක්නා ලදහ. තමාගේ කර්‍ම විපාකය මම මැ දිටිමි. බොහෝ පින් කරන්නෙමි.

**පාටලිපුත්ත ප්‍රෙතවස්තු යි.**

## 4. 12

805. අයඤ්ච තෙ පොක්ඛරණී සුරම්මා
සමා සුප්පතිත්ථා මහොදිකා ච,[1]
සුපුප්ඵිතා භමරගණානුකිණ්ණා
කථං තයා ලද්ධා අයං මනුඤ්ඤා.

806. ඉදඤ්ච තෙ අම්බවනං සුරම්මං
සබ්බොතුකං ධාරයතෙ ඵලානි,
සුපුප්ඵිතං භමරගණානුකිණ්ණං
කථං තයා ලද්ධමිදං විමානං.

807. අම්බපක්කොදකං යාගු සීතච්ඡායා මනොරමා,
ධීතරා දින්නදානෙන තෙන මෙ ඉධ ලබ්භති.

808. සන්දිට්ඨිකං කම්මං එවං පස්සථ
දානස්ස දමස්ස සංයමස්ස විපාකං,
දාසී අහං අය්‍යකුලෙසු හුත්වා
සුණිසා හොමි අගාරස්ස ච ඉස්සරා'ති.

**පොක්ඛරණීපෙතවත්ථු ද්වාදසමං.**

## 4. 13

809. යං දදාති න තං හොති දෙථෙව දානං දත්වා උභයං තරති,
උභයං තෙන දානෙන ගච්ඡති ජාගරථ මා පමජ්ජථා'ති.

**අම්බරුක්ඛපෙතවත්ථු තෙරසමං.**

## 4. 14

810. මයං භොගෙ සංහරිම්හා සමෙන විසමෙන ච,
තෙ අඤ්ඤෙ පරිභුඤ්ජන්ති මයං දුක්ඛස්ස භාගිනී'ති.

**භොගසංහරණපෙතවත්ථු චුද්දසමං.**

## 4. 15

811. සට්ඨිවස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

812. නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පටිදිස්සති,
තථා හි පකතං පාපං මම තුය්හං[2] ච මාරිස.

1. මහොදකා ච - මජසං.
2. තුය්හං මය්හං ච - මජසං.

## 4. 12

805. තොපගේ මේ පොකුණ ඉතා රමණීය යැ, සමතල යැ, මනා තොට ඇත්තේ යැ. බොහෝ දිය ඇත්තේ යැ. මොනවට පිපි මල් ඇත්තේ යැ. බමරකැලින් ගැවසී ගත්තේ ය. මේ මනහර පොකුණ තොප විසින් කෙසේ ලබන ලද ද?

806. තොපගේ මේ අඹඋයන ද මනරම් වෙයි. හැම සෘතුයෙහි සුව එළවන්නේ යැ. පල දරයි. මොනවට පිපිමල් ඇත්තේ ය. බමර ගණයාගෙන් ගැවසුණේ ය. තොප විසින් මේ විමන කෙසේ ලබන ලද දූ යි.

807. මාගේ දුව විසින් දෙන ලද ඒ දනහෙතුවෙන් ඉදුණු අඹ හා පැන් ද කැඳ සහ සිත්කලු සිහිල් සෙවණ ද මට ලැබේ.

808. දන්දීමෙහි ද ඉන්ද්‍රිය දමනයෙහි ද සීල සංවරයෙහි ද සාන්දෘෂ්ටික වූ කර්‍මයත් එහි විපාකත් මෙසේ බලවු. මම ස්වාමි කුලයෙහි දාසියක් වැ පසු වැ ඔහුගේ යෙහෙලියක් ද වීමි. දැන් මම ගෙදර අධිපති වෙමි.

**පොක්ඛරණී ප්‍රෙතවස්තු යි.**

## 4. 13

809. දායකයා යම් දෙයක් දේ ද, පරලොවැ එය ම විපාකවශයෙන් ලැබෙන්නේ නො වේ. එයට වඩා බොහෝ සැප සම්පත් ලැබේ. එහෙයින් දන් දෙන්නේ ම මැනවි. දන් දී දෙලොවැ ම දුක ඉක්මවයි. දෙලොවැ ම සැපයට පැමිණෙයි. (එහෙයින්) දන් දීමෙහි උත්සුක වවු. පමා නො වවු.

**අම්බරුක්ඛ ප්‍රෙතවස්තු යි.**

## 4. 14

810. අපි දැහැමින් ද නොදැහැමින් ද වස්තු සම්පත් රැස් කෙළෙමු. එහෙත් ඒ වස්තුව දැන් අන්‍යයෝ පරිභොග කෙරෙත්. අපි දුකට හිමි වූවෝ වෙමු.

**භොගසංහරණ ප්‍රෙතවස්තු යි.**

## 4. 15

811. ලොහොකුඹු නිරයෙහි පැසෙන අපට හැම අයුරින් සැට දහසක් අවුරුදු පිරුණේ ය. කවදා මෙදුක කෙළවර වන්නේ ද?

812. නිදුකාණෙනි, මාගේ ද තොපගේ ද දුක් විඳීමෙහි කෙළවරක් නැත. අවසානයක් කොයින් ද? අවසානයක් නො පෙනේ. ඒ එසේ මැ යි. මා විසින් ද තොප විසින් ද දරුණු පව්කමක් කරන ලදි.

813. දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්තෙ න දදම්හසෙ;
සන්තෙසු දෙය්‍යධම්මෙසු දීපං නාකම්හ අත්තනො.

814. සො හි[1] නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහු'න්ති.

සෙට්ඨිපුත්තපෙතවත්ථු පණ්ණරසමං.

## 4. 16

815. කින්නු උම්මත්තරූපො ව මිගො භන්තො ව ධාවසි,
නිස්සංසයං පාපකම්මන්තො කින්නු සද්දායසෙ තුවං.

816. අහං භද්දන්තෙ පෙතොම්හි දුග්ගතො යමලොකිකො,
පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතො ගතො.

817. සට්ඨිකූටසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ මය්හං නිපතන්ති තෙ භින්දන්ති ච[2] මත්ථකං.

818. කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසි.

819. සට්ඨිකූටසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ තුය්හං නිපතන්ති තෙ භින්දන්ති ච මත්ථකං.

820. අථද්දසාසිං සම්බුද්ධං සුනෙත්තං භාවිතින්ද්‍රියං,
නිසින්නං රුක්ඛමූලස්මිං ඣායන්තමකුතොභයං.

821. සාලිත්තකප්පහාරෙන භින්දිස්සං තස්ස මත්ථකං,
තස්ස කම්මවිපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡිසං.

822. සට්ඨිකූටසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ මය්හං නිපතන්ති තෙ භින්දන්ති ච මත්ථකං.

823. ධම්මෙන තෙ කාපුරිසා-
සට්ඨිකූටසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ තුය්හං නිපතන්ති තෙ භින්දන්ති ච මත්ථක'න්ති.

සට්ඨිකූටසහස්සපෙතවත්ථු සොළසමං.

### මහාවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:-

අම්බසක්ඛරො සෙරිස්සකො පිඞ්ගලො රෙවති උච්ඡුඛාදකා
ද්වෙ කුමාරා ද්වෙ ගූථඛාදකා ගණපාටලි පොක්ඛරඤ්ඤ අම්බරුක්ඛ-
භොගසංහාරා සෙට්ඨිපුත්ත සට්ඨිකූටා ඉති සොළසවත්ථූනි
තෙන පවුච්චතී'ති.

### පෙතවත්ථු පාළි සමත්තා.

1. සොහං - මජසං.
2. වොභින්දන්තෙව - ධම්මපදට්ඨකථා.

813. යමබඳු වූ අපි දනවස්තු ඇති කල්හිත් නුදුන්මෝ ද, ඒ අපි නින්දිත ජීවිතයක් ගත කෙළෙමු. දනවස්තු ඇති කල්හිත් තමාට පිහිටක් නො කෙළෙමු.

814. ඒ මම වනාහි මෙයින් සැවැ මේ නිරයෙන් ගොස් මිනිසත් බවක් ලබා ගෙන යදිවදන් දන්නෙම් ශීලයෙන් යුක්ත වූයෙම් බොහෝ කුසල් කරන්නෙමි.

**සෙට්ඨිපුත්ත ප්‍රෙතවස්තු යි.**

## 4. 16

815. උමතුගති ඇත්තකු මෙන් ද භ්‍රාන්ත වූ මුවකු මෙන් ද ඔබ මොබ දුවන්නෙහි නියැකව ම පවකමකි. කුමක් හෙයින් මහහඬ නගමින් හැසිරෙහි ද?

816. ස්වාමිනි, මම යමලොව උපන් දුකටපත් ප්‍රෙතයෙක්මි. පව්කම කොට මෙලොවින් ප්‍රෙතලොකයට ගියෙමි.

817. නොඅඩු වූ සැටදහසක් යකුළු හැමපසින් ම මාගේ හිසෙහි හෙයි. ඒ යකුළු මාගේ හිස් මුදුන බිඳී.

818. කයින් වචනයෙන් සිතින් තා විසින් කිනම පවක් කරන ලද ද? කිනම් කර්මවිපාකයෙකින් මේ දුකට පැමිණියෙහි ද?

819. පිරිපුන් සැටදහසක් යකුළු හැමපසින් ම තාගේ හිසෙහි හෙයි. ඒ යකුළු තාගේ මස්තකය බිඳියි.

820. වැඩූ ඉඳුරන් ඇති රුක්මුල වැඩහුන්, භාවනා කරන කිසි ලෙසෙකිනුත් බියක් නැති සුනෙත්‍ර නම් පසේබුදුන් දිටිමි.

821. මම අතකුරු ගැසීමෙන් උන්වහන්සේගේ හිස පැළුවෙමි. ඒ පව්කම්හි විපාකයෙන් මේ දුකට පැමිණියෙමි.

822. පිරිපුන් සැටදහසක් යකුළු මාගේ හිසෙහි හැම පසින් ම හෙයි. ඒ යකුළු මාගේ හිස්මුදුන බිඳී.

823. නින්දිත පුරුෂය තාගේ හිසෙහි නොඅඩු වූ සැටදහසක් යකුළු හැම පසින් ම හෙ ද එසේ ම ඒ යකුළු තාගේ හිස බිඳී ද, එය තාගේ කර්මයට අනුරූප ලෙස සිදුවන්නෙකි.

**සට්ඨිකූටසහස්ස ප්‍රෙතවස්තු යි.**

**සතර වැනි මහාවර්ග යි.**

**එහි උද්දනය:**

අම්බසක්ඛර යැ සෙරිස්සක යැ පිඞ්ගල යැ රෙවති යැ උච්ඡුඛාදක යැ කුමාර වස්තු දෙක යැ ගූථඛාදක වස්තු දෙක යැ ගණප්‍රෙත යැ පාටලිපුත්ත යැ පොක්ඛරණී යැ අම්බරුක්ඛ යැ භොග සංහරණ යැ සෙට්ඨිපුත්ත යැ සට්ඨිකූට යැ යි ප්‍රෙතවස්තු සොළසෙකි.

**ප්‍රෙතවස්තුපාළි නිමි.**

## පෙතවත්ථුපාළි

# ගාථාදිපාද සූචි

ග



ච



ඡ



ජ



ඨ



ඩ



ත

# පෙතවත්ථුපාළි

## සඤ්ඤානාම සූචි

# පෙතවත්ථුපාළි

## විසෙසපදානුක්කමණිකා

ව



ස



ස



හ

# බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

**ආරම්භය:**

ශ්‍රී සම්බුද්ධ වර්ෂ 2500 අනුස්මරණය කිරීමේ බුද්ධජයන්ති මහෝත්සවය සංවිධාන කොට පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් 1954 දී පත් කරන ලද ලංකා බෞද්ධ මණ්ඩලය මගිනි.

**සංස්කරණය:**

ලංකා බෞද්ධ මණ්ඩලය මගින් ආරම්භ කරන ලදුව දැනට සංස්කෘතික අමාත්‍යාංශයේ ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලය මගිනි.

**සැලැස්ම:**

සෑම ග්‍රන්ථයක ම වම් පස පිටුවේ පාලි පෙළ ද, දකුණු පස පිටුවේ සිංහල පරිවර්තනය ද යොද ඇත. සෑම ග්‍රන්ථයක් ම අඟල් $11 \times 7\frac{1}{2}$ ප්‍රමාණයේ පිටුවලින් සමන්විත වේ.

**ප්‍රකාශනය:**

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**විකිණීම:**

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

තැපැලෙන්: මුදල් එවා ලබාගැනීමට:

**ලේකම්,**
**සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**212, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.**

පැමිණ මිලට ගැනීමට:

**ජයන්ති පොත්හල,**
**135, ධර්මපාල මාවත, කොළඹ 7.**
**(විහාරමහාදේවි උද්‍යානය ඉදිරිපිට යි)**

# බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

| අංකය | ග්‍රන්ථ නාමය | | මුද්‍රණය | පිටු | රෙදි බැම්ම | කඩදාසි බැම්ම |
|---|---|---|---|---|---|---|
| 1. | පාරාජිකපාළි | | 1959 | 696 | 17.50 | 14.00 |
| 2. | i. පාචිත්තියපාළි | | 1981 | 604 | නැත | 105.00 |
| | ii. පාචිත්තියපාළි | | 1981 | 640 | නැත | 85.00 |
| 3. | මහාවග්ගපාළි | 1 | 1957 | 608 | විකිණී | විකිණී |
| 4. | ,, | 2 | 1957 | 458 | විකිණී | විකිණී |
| 5. | i චුල්ලවග්ගපාළි | 1 | 1976 | 442 | නැත | 30.00 |
| | ii ,, | 2 | අමුද්‍රිත | — | — | — |
| 6. | i පරිවාරපාළි | 1 | 1978 | 391 | නැත | 37.50 |
| | ii පරිවාරපාළි | 2 | 1979 | 342 | නැත | 57.50 |
| 7. | දීඝනිකාය | 1 | 1962 | 700 | විකිණී | 14.00 |
| 8. | ,, | 2 | 1976 | 600 | නැත | 45.00 |
| 9. | ,, | 3 | 1977 | 616 | නැත | 45.00 |
| 10. | මජ්ඣිමනිකාය | 1 | 1964 | 846 | 20.00 | විකිණී |
| 11. | ,, | 2 | 1973 | 800 | 60.00 | 55.00 |
| 12. | ,, | 3 | 1974 | 642 | 55.00 | 50.00 |
| 13. | සංයුත්තනිකාය | 1 | 1960 | 540 | විකිණී | විකිණී |
| 14. | ,, | 2 | 1962 | 512 | විකිණී | විකිණී |
| 15. | ,, | 3 | මුද්‍රණයෙහි | — | — | — |
| 16. | ,, | 4 | 1982 | — | නැත | — |
| 17. | ,, | 5 | මුද්‍රණයෙහි | — | — | — |
| 18. | අඞ්ගුත්තරනිකාය | 1 | 1960 | 672 | විකිණී | 12.00 |
| 19. | ,, | 2 | 1962 | 580 | විකිණී | 12.00 |
| 20. | ,, | 3 | 1968 | 506 | 20.00 | 18.00 |
| 21. | ,, | 4 | 1970 | 544 | 20.00 | 18.00 |
| 22. | ,, | 5 | 1977 | 589 | නැත | 45.00 |
| 23. | ,, | 6 | 1977 | 701 | නැත | 55.00 |
| 24. | ඛුද්දකපාඨ<br>ධම්මපද<br>උදාන<br>ඉතිවුත්තක | | 1960 | 628 | විකිණී | 12.00 |
| 25. | සුත්තනිපාත | | 1977 | 400 | නැත | 30.00 |
| 26.<br>27. | විමානවත්ථු<br>පෙතවත්ථු | | 1982 | — | — | — |

| අංකය | ග්‍රන්ථ නාමය | | මුද්‍රණය | පිටු | රෙදි බැම්ම | කඩදාසිබැම්ම |
|---|---|---|---|---|---|---|
| 28. | ථෙරගාථා | | 1972 | 362 | නැත | 15.00 |
| 29. | ථෙරිගාථා | | 1972 | 150 | නැත | විකිණී |
| 30. | ජාතකපාළි | 1 | අමුද්‍රිත | — | — | — |
| 31. | ,, | 2 | අමුද්‍රිත | — | — | — |
| 32. | ,, | 3 | අමුද්‍රිත | — | — | — |
| 33. | මහානිද්දෙසපාළි | | 1961 | 788 | 17.50 | 14.00 |
| 34. | චූලනිද්දෙසපාළි | | 1976 | 676 | නැත | 45.00 |
| 35. | i පටිසම්භිදාමග්ගපාළි | | 1971 | 562 | 20.00 | 18.00 |
| | ii ,, | | 1972 | 274 | 20.00 | 18.00 |
| 36. | අපදානපාළි | 1 | 1961 | 700 | 17.50 | 14.00 |
| 37. | ,, | 2 | 1977 | 443 | — | 50.00 |
| 38. | බුද්ධවංසපාළි }<br>චරියාපිටකපාළි } | | 1977 | 400 | නැත | 30.00 |
| 39. | නෙත්තිප්පකරණ | | 1982 | 334 | — | — |
| 40. | පෙටකොපදෙස | | අමුද්‍රිත | — | — | — |
| 41. | ධම්මසඞ්ගණිප්පකරණ | | 1973 | 579 | — | 50.00 |
| 42. | විභඞ්ගප්පකරණ | 1 | 1975 | 408 | — | 50.00 |
| 43. | ,, | 2 | 1975 | 342 | — | 50.00 |
| 44. | කථාවත්ථුප්පකරණ | 1 | 1967 | 622 | 15.00 | 12.00 |
| 45. | ,, | 2 | 1968 | 588 | 17.50 | 15.00 |
| 46. | ,, | 3 | 1969 | 554 | 20.00 | 18.00 |
| 47. | ධාතුකථාප්පකරණ }<br>පුග්ගලපඤ්ඤත්ති } | | 1976 | 452 | නැත | 30.00 |
| 48. | යමකප්පකරණ | 1 | අමුද්‍රිත | — | — | — |
| 49. | ,, | 2 | අමුද්‍රිත | — | — | — |
| 50. | පට්ඨානප්පකරණ | 1 | අමුද්‍රිත | — | — | — |
| 51. | ,, | 2 | අමුද්‍රිත | — | — | — |
| 52. | ,, | 3 | අමුද්‍රිත | — | — | — |

විකිණී = විකිණී අවසානයි.

නැත = රෙදි බැම්මෙ පොත් හද නැත.

සබ්බදානං ධම්මදානං ජිනාති

# ත්‍රිපිටක පොත් මුද්‍රණයට හවුල් වීමට ස්වර්ණමය අවස්ථාවක්

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීමේ මහා පින්කමට සහභාගි වීමට පරිත්‍යාගශීලී පින්වතුනට අගනා අවස්ථාවක් ලබා දීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය තීරණය කර තිබේ. මෙම ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය සඳහා වියදම් දැරීමට කැමැති පරිත්‍යාගශීලී පින්වතුනට තථාගත සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ දෙශනාව මුද්‍රණය කරවීමේ අති උතුම් පින්කමට සහභාගී වීමට ලැබීමට අමතරව පහත දැක්වෙන ප්‍රයොජන ද අත් වේ.

i. මුද්‍රණ වියදම් සඳහා මුදල් පරිත්‍යාග කරන පින්වතුන්ගේ නම් එම මුදල් වැය කොට මුද්‍රණය කරනු ලබන පොත්වල ඇතුළත් කරනු ලැබේ.

ii. මේ සඳහා පරිත්‍යාග කරන මුදල් සියලු බදු වලින් සම්පූර්ණයෙන් ම නිදහස් වේ.

ඒ සඳහා කළ යුතු වන්නේ මෙම මුදල් භාරගෙන **මධ්‍යම සංස්කෘතික අරමුදල** මගින් නිකුත් කරනු ලබන කුවිතාන්සිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම පමණකි.

iii. මුද්‍රණ වියදම් පරිත්‍යාග කරන පින්වතුනට තමන්ගේ වියදමින් මුද්‍රණය කරන පොතින් පිටපත් 500 ක් තම නෑදෑ හිතවතුන් අතර බෙද හැරීම සඳහා පිරිනමනු ලැබේ.

iv. මෙසේ පරිත්‍යාග කරන මුදලින් මුද්‍රණය කරනු ලබන පොත් ඉතා අඩු මුදලකට මිළ නියම කරනු ලබන බැවින් පොත් මිළදී ගන්නා සැම කෙනෙකුට ම පරිත්‍යාගය නිසා සහන මිළකට පොත් ලබා ගැනීමට පිළිවන් වේ.

v. මෙම පොත් විකුණා ලැබෙන මුදල් නැවතත් ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය සඳහා ම යොදවනු ලබන බැවින් පරිත්‍යාගයේ අගය ද ඉන් ලැබෙන පින ද තවත් වැඩි වේ.

02. සාමාන්‍යයෙන් ත්‍රිපිටක ග්‍රන්ථයක් ක්‍රවුන් 4 ප්‍රමාණයේ පිටු 600කින් පමණ සමන්විත වේ. එක් පොතක් මුද්‍රණය සඳහා දළ වශයෙන් රුපියල් ලක්ෂ $2\frac{1}{2}$ක් පමණ අවශ්‍ය ය. එම මුදල පොතේ පිටු ගණන අනුව පොතින් පොතට මඳ වශයෙන් වෙනස් වේ.

03. මේ සත් කෘත්‍යයට කරන සියලු පරිත්‍යාග පහත සඳහන් ලිපිනයට එවන ලෙස ඉල්ලමි. චැක්පත් මුදල් ඇණවුම් ආදිය **මධ්‍යම සංස්කෘතික අරමුදල** නමට ලියා එවීම මැනවි.

ලේකම්,
සංස්කෘතික අමාත්‍යාංශය,
212 බෞද්ධාලොක මාවත, කොළඹ 7.

1981 ඔක්තෝම්බර් 20.

මුද්‍රණය:
තිසර මුද්‍රණාලය, 135, දුටුගැමුණු වීදිය, දෙහිවල